ඊජිප්තු ශාපය



ඊජිප්තු ශාපය

"........ මගේ ශුද්ධ වූ සොහොන් ගැබට ඇතුළු වී මගේ නින්දට බාධා කරන්නන් සතුරන් විසින් පහර දීමෙන්,........ ගෝනුස්සා හෝ නාගයා දෂ්ඨ කිරීමෙන්, සිංහයාට හෝ කිඹුලාට ගොදුරුවීමෙන්, දියේ ගිලීමෙන් හෝ ගින්නට අසුවීමෙන් වහා ජීවිතක්ෂයට පත්වීම නිසැකයි!"

සමග **ආගන්තුකයා, රිදී කිණිස්ස, ඩොචෙස්ටර් බේදවාචකය, බ්‍රික්ස්ටන් අභිරහස**

ISBN 978-955-1262-22-8

මිල රු. 350/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

චන්දන මෙන්ඩිස්

ඊජිප්තු ශාපය

සහ

තවත් ෂර්ලොක් හෝම්ස් කථා

ඊජිප්තු ශාපය

සහ

තවත් ෂර්ලොක් හෝම්ස් කථා

චන්ද්‍රන මෙන්ඩිස්ගේ නිර්මාණ හා පරිවර්තන

නවකතා - නිශ්චල චංචල දේපළ All That Glitters

විද්‍යා ප්‍රබන්ධ - ජුරාසික් අඩයම

කෙටි කතා - චීන යෙහෙළිය

යොවුන් නවකථා - අබිරහස් දූපතේ නිධානය, නිල් දියමන්ති අභිරහස

පරිවර්තන (ෂර්ලොක් හෝම්ස් කථා)

බැස්කවිල් රුදුරු බල්ලා
සිව් රහස් සලකුණ
බිහිසුණු නිමිත්තය
මළගිය ඇත්තෝ සාක්ෂි දෙති
ලේ සලකුණ
අන්තරාය අඩවියක
මහ රෑආ මාරයා
ඉන්ද්‍රනීල මාණික්‍යය
දියමන්ති ඔටුන්න
ලෝහිත පරීක්ෂණය
ඔබෙන් සමුගනිමි
ෂර්ලොක් හෝම්ස් ආපසු එයි
පුද්ගලිකයි රහසිගතයි
චිරකිපුලාට එරෙහිව ෂර්ලොක් හෝම්ස්
භයානක මිනිසා
කළු ව්‍යාඝ්‍රයා
රතුවන හැඳි කත
ප්‍රදීපාගාරයේ වික්‍රමය
අබිරහස් දොස්තර
ගින්දර සමග සෙල්ලම්
සමුද්‍රයේ සටන
භීෂණයක්
රුසියානු ඔත්තුකාරයා
මර උගුල
ඊජිප්තු ශාපය

පරිවර්තන (අනෙක්)

සැඟවුණු ලොවේ සවාරියක්
ඇලන් ක්වාටමේන්ගේ වීරචාරිකාව
වියරු විද්‍යාඥයා
යකාගේ තවාතැන
හරිම පුදුමයි!
සිහිනයක රැඳි රහසක්
චාලි සහ අරුම පුදුම චොකලට් කම්හල
මෝරා
රහස් පරීක්ෂකයා අතුරුදන්
ගැටකපන පුංචා
ගිනිකන්දක් හරහා.......ලෝකය වටේ අසූ දවසකින්
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2008)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා II - සොඳුරු සිතුවම්
- (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2009)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා III - සඳ දියේ පාවී ගියා
- (රාජ්‍ය සම්මාන නිර්දේශිත - 2010)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා IV - මුතු ඇටය
- (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2011)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා V - කෝකිල මැදුර
- (රාජ්‍ය සම්මාන නිර්දේශිත - 2012)
ෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා VI - වීණා වාදකයා

ඊජිප්තු ශාපය

සහ

තවත් ෂර්ලොක් හෝම්ස් කථා

පරිවර්තනය

චන්දන මෙන්ඩිස්

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන
141/2, දූව පාර, බැද්දගාන, කෝට්ටේ

ඊජිප්තු ශාපය සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා

හිමිකම් ඇවිරිණි

© චන්දන මෙන්ඩිස් 2013

ISBN 978-955-1262-22-8

පළමු මුද්‍රණය - 2013

මෙම නිවේදනය වංචනික පොත් මුද්‍රණකරුවන් වෙතය.

2003 වර්ෂයේ අංක 360 F දරණ දේපළ හිමිකම් පනත අනුව ව්‍යාජ පොතක් මුද්‍රණය කිරීම, විකිණීම, වෙළඳසලක තබාගැනීම රුපියල් පන් ලක්ෂයක (රු: 500,000) දඩයක් හෝ මාස හයක සිර දඬුවමක් හෝ ඒ දෙකම දඬුවම් ලෙස ලැබිය හැකි වරදක් වන්නේය.

PERMISSION HAS NOT BEEN GRANTED TO ANY PERSONNEL OR COMPANY TO CONVERT, TRANSFER OR PUBLISH THIS BOOK ELECTRONICALLY OR AS AN E-BOOK. DISPLAY OF PAGES FOR PROMOTIONAL PURPOSES IS PERMITTED UP TO PAGE NO 14 ONLY. DISPLAY BEYOND THIS POINT IS A CRIMINAL OFFENCE AND IS STRICTLY PROHIBITED.

ANY PERSON OR WEBSITE DOING ANY UNAUTHORISED ACT IN RELATION TO THIS PUBLICATION MAY BE LIABLE TO CRIMINAL PROSECUTION AND CIVIL CLAIMS FOR DAMAGES, IN ACCORDANCE WITH THE PROVISIONS OF THE COPYRIGHT ACT 2003 (AS AMENDED)

පිටකවරයේ චිත්‍රය
බන්ධුල හරිශ්චන්ද්‍ර

පිටකවරය නිමැවුම
හා අක්ෂර සංයෝජනය
ප්‍රසාද් සමරසේකර

මුද්‍රණය
ජේ. එස්. යූ. ග්‍රැෆික් පුද්ගලික සමාගම
නො: 510, රාජගිරිය පාර,
රාජගිරිය.

ප්‍රකාශනය
චන්දන මෙන්ඩිස් ප්‍රකාශන
141/2, දුව පාර
බැද්දගාන, කෝට්ටේ

පටුන

ෂර්ලොක් හෝම්ස් සහ මගේ ජීවිතය

1. ඊජිප්තු ශාපය 13

2. රිදී කිණිස්ස 51

3. ඩෝචෙස්ටර් බේදවාචකය 87

4. බ්‍රික්ස්ටන් අභිරහස 138

5. ආගන්තුකයා 165

ෂර්ලොක් හෝම්ස් සමග දොස්තර වොට්සන්

ෂර්ලොක් හෝම්ස් සහ මගේ ජීවිතය

දෛවය විසින් අපේ ජීවිත හසුරුවන්නේ මොන තරම් පුදුමාකාර අන්දමකටද. ඒ ගැන මම බොහෝවිට කල්පනා කර ඇත්තෙමි. ඉදිරියේදී කෙනෙකු මුහුණ දෙන ඉරණම ගැන ඔහු කිසිවක් නොදනී. ඒ පිළිබඳව තීරණයක් ගැනීමට, ඔහුට ලැබෙන්නේ මොන තරම් සුළු අවස්ථාවක්ද. ඒ ගැන මා ඔබට කියන්නේ මගේම අත්දැකීම් වලිනි.

වෛද්‍යවරයෙකු ලෙස සුදුසුකම් ලබා, වෛද්‍ය විද්‍යාලයෙන් පිටවී කිසිදු රැකියාවක් නොකොට, මා ගත කළේ ඉතාමත් සුළු කාලයක් පමණි. යුද්ධ හමුදාවට සහකාර ශල්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීම ඒ වන විට ඇරඹී තිබිණ. ශල්‍ය වෛද්‍යවරයෙකුට, යුද පෙරමුණේ සේවයෙන් ලබාගත හැකි පුහුණුව හා අත්දැකීම් ඉතා ඉහළ බැව්, මගේ ඥාති සොහොයුරු ලෝරන්ස් විශ්වාස කළේය. මගේ අනාගතයට එය ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇතැයි ඔහු කීය. පස්වැනි නොදම්බලන්ඩ් පාබළ හමුදාවේ, සහකාර ශල්‍ය වෛද්‍ය තනතුරට මා අයදුම් කළේ, ලෝරන්ස් මට දුන් උපදෙස් අනුවය. මා රැකියාවට බැඳී තවත් මාසයකින් ඇෆ්ගනිස්ථානයේ යුද පෙරමුණට මා යවනු ඇතැයි, ඔහු කෙසේ අනුමාන කරන්නද? ඒ කුමක් නිසාද යත්, දෙවැනි ඇංග්ලෝ ඇෆ්ගන් සංග්‍රාමය නමින් හැඳින්වුණු සටන, ඒ වන විටත් ඇරඹී නොතිබිණි. නමුත් මයිවාන්ඩ්හි සටනේදී මිනීමරු ඝාසියකු එල්ල කළ වෙඩි පහරකින්, මා බරපතළ තුවාල ලබතැයි සිතන්නේ කෙලෙසද? එදා සටනේදී අපේ හමුදාවේ, බ්‍රිතාන්‍ය හා ඉන්දියානු භටයෝ නවසීයක් දෙනා ජීවිතක්ෂයට පත්වූහ. බරපතළ තුවාල ලබා මා බිම ඇද වැටුණු බව සැබෑය. එහෙත් මගේ සහායකයා වූ ජැක් මරේ මගේ ජීවිතය බේරා ගත්තේය. විටෙක මා සිය කර මත හොවාගෙන, විටෙක අශ්වයෙකුගේ කරමත, ඔහු බ්‍රිතාන්‍ය හමුදා පෙරමුණ වෙත සැතපුම් දෙකක දුරක් පැමිණ තිබුණේ, සතුරු ඝාසියන්ගේ පාලනය යටතේ තිබූ භූමිය මැදිනි.

ඒ අවුරුද්දේම සැප්තැම්බර් මාසයේදී කන්දහාර්හි සටනේදී, මරේ ජීවිතක්ෂයට පත්විය. ඒ අසා මම දැඩි ශෝකයකට පත්වීමි. තුවාල ලැබීම නිසා ආපසු එංගලන්තයට එවනු ලැබූ මට ලැබුණේ වැටුපෙන් අඩක් පමණි. ලන්ඩන් සමාජ ජීවිතයට එය ප්‍රමාණවත් නොවූ නිසා



ෂර්ලොක් හෝම්ස් සමඟ දොස්තර වොට්සන්

ෂර්ලොක් හෝම්ස් සහ මගේ ජීවිතය

දෛවය විසින් අපේ ජීවිත හසුරුවන්නේ මොන තරම් පුදුමාකාර අන්දමකටද. ඒ ගැන මම බොහෝවිට කල්පනා කර ඇත්තෙමි. ඉදිරියේදී කෙනෙකු මුහුණ දෙන ඉරණම ගැන ඔහු කිසිවක් නොදනී. ඒ පිළිබඳව තීරණයක් ගැනීමට, ඔහුට ලැබෙන්නේ මොන තරම් සුළු අවස්ථාවක්ද. ඒ ගැන මා ඔබට කියන්නේ මගේම අත්දැකීම් වලිනි.

වෛද්‍යවරයෙකු ලෙස සුදුසුකම් ලබා, වෛද්‍ය විද්‍යාලයෙන් පිටවී කිසිදු රැකියාවක් නොකොට, මා ගත කළේ ඉතාමත් සුළු කාලයක් පමණි. යුද්ධ හමුදාවට සහකාර ශල්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීම ඒ වන විට ඇරඹී තිබිණ. ශල්‍ය වෛද්‍යවරයෙකුට, යුද පෙරමුණේ සේවයෙන් ලබාගත හැකි පුහුණුව හා අත්දැකීම් ඉතා ඉහළ බැව්, මගේ ඥාති සොහොයුරු ලෝරන්ස් විශ්වාස කළේය. මගේ අනාගතයට එය ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇතැයි ඔහු කීය. පස්වැනි නොදම්බලන්ඩ් පාබළ හමුදාවේ, සහකාර ශල්‍ය වෛද්‍ය තනතුරට මා අයදුම් කළේ, ලෝරන්ස් මට දුන් උපදෙස් අනුවය. මා රැකියාවට බැඳී තවත් මාසයකින් ඇෆ්ගනිස්ථානයේ යුද පෙරමුණට මා යවනු ඇතැයි, ඔහු කෙසේ අනුමාන කරන්නද? ඒ කුමක් නිසාද යත්, දෙවැනි ඇංග්ලෝ ඇෆ්ගන් සංග්‍රාමය නමින් හැඳින්වුණු සටන, ඒ වන විටත් ඇරඹී නොතිබිණි. නමුත් මයිවාන්ඩ්හි සටනේදී මිනීමරු සාසියකු එල්ල කළ වෙඩි පහරකින්, මා බරපතළ තුවාල ලබතැයි සිතන්නේ කෙලෙසද? එදා සටනේදී අපේ හමුදාවේ, බ්‍රිතාන්‍ය හා ඉන්දියානු භටයෝ නවසීයක් දෙනා ජීවිතක්ෂයට පත්වූහ. බරපතළ තුවාල ලබා මා බිම ඇද වැටුණු බව සැබෑය. එහෙත් මගේ සහායකයා වූ ජැක් මරේ මගේ ජීවිතය බේරා ගත්තේය. විටෙක මා සිය කර මත හොවාගෙන, විටෙක අශ්වයෙකුගේ කරමත, ඔහු බ්‍රිතාන්‍ය හමුදා පෙරමුණ වෙත සැතපුම් දෙකක දුරක් පැමිණ තිබුණේ, සතුරු සාසියන්ගේ පාලනය යටතේ තිබූ භූමිය මැදිනි.

ඒ අවුරුද්දේම සැප්තැම්බර් මාසයේදී කන්දහාර්හි සටනේදී, මරේ ජීවිතක්ෂයට පත්විය. ඒ අසා මම දැඩි ශෝකයකට පත්වීමි. තුවාල ලැබීම නිසා ආපසු එංගලන්තයට එවනු ලැබූ මට ලැබුණේ වැටුපෙන් අඩක් පමණි. ලන්ඩන් සමාජ ජීවිතයට එය ප්‍රමාණවත් නොවූ නිසා

මා සිතමින් සිටියේ එංගලන්තයේ දකුණු දිග වෙරළ තීරයේ නගරයක පදිංචියට යාමටයි.

ඉක්මන් සුවයක් ලැබීමට මුහුදු සුළඟ මට වඩාත් යෝග්‍ය වනු ඇතැයි විශේෂඥ මතයක්ද පළවිය. කුලිය අඩු බෝඩිමක නවාතැන් ගතහැකි නම්, මේ ප්‍රශ්නය විසඳෙනු ඇතැයි මම කල්පනා කළෙමි. යූස්ටන් පාරේ බෝඩිමක කාමරයක් ඇති බව මට ආරංචි වූයේ මේ අතරය. එහි සිටි අනෙක් නේවාසිකයා, කොටස් වෙළෙඳපොළේ තැරැව්කරුවෙකි. ඔහු සමග කතාබහ කළෙමි. එම බෝඩිමේ ජීවිතය සතුටුදායක එකක් නොවන බව එවිට මට වැටහිණ. ජීවිතය බ්‍රයිටන්හි තරම් විනෝදජනක නොවුණත්, නවත් මුහුදුබඩ නගරයක් වූ හේස්ටිංග්ස් වෙත යාමටද මම සිතා බැලුවෙමි. ඒ එහිදී මගේ වියදම අඩකින් අඩුවන නිසයි. පෞද්ගලික බඩු බාහිරාදිය පෙට්ටිවල අසුරාගෙන හේස්ටිංග්ස් වෙත යාමට මම සූදානම් වුණෙමි.

සාන්ත බාතොලමියු රෝහලේදී මා සමග එකට සේවය කළ වෛද්‍යවරයෙකු වූ, ජෝජ් ස්ටැම්ෆඩ් මට හමුවූයේ මේ අතරය. එකල ඔහු මගේ සමීප මිතුරෙකු වූයේද නැත. කලින් දවසේ මැදියම් රැය ළංවන තුරු සාදයකට සහභාගි වීම නිසා, ස්ටැම්ෆඩ්ට තද හිස හැක්කුමක් වැළඳී තිබිණි. තමා රාජකාරි කළ රසායනාගාරයේ සේවයට නොගොස්, ඔහු එදින නිවාඩු ගෙන තිබුණේ එබැවිනි. තම බිරිඳගේ උපන්දිනය ළංවෙමින් තිබූ බැවින්, ඇයට දීමට ත්‍යාගයක් ගතයුතු බැව් එදා ඔහුට සිහිවිය. මේ සඳහා තමා යා යුත්තේ පෝල් හාඩිගේ ඔරියන්ටල් පැලස් නම් වෙළෙඳසලට බැව්, ස්ටැම්ෆඩ් හදිසියේ තීරණය කළේය. තෑග්ග මිලට ගෙන ගෙදර යනු වෙනුවට, ඔහුගේ දෙපා එසවුණේ ක්‍රයිටීරියන් අවන්හල දෙසටයි. එම අවන්හලේම සිටි මා එයින් පිටවීමට සූදානම් වෙද්දී, ස්ටැම්ෆඩ් මුහුණට මුහුණ හමුවීම මොන තරම් පුදුමාකාරද? එය මගේ අනාගතය තීරණය කළ ආශ්චර්යමත් සන්ධි ස්ථානයයි. එදා ඒ මොහොතේ මට ස්ටැම්ෆඩ් හමුනොවන්නට, මට කිසි දිනෙක ෂර්ලොක් හෝම්ස් හමු නොවන්නට ඉඩ තිබිණ!

නේවාසිකාගාරයක හවුලේ පදිංචි වීමට කෙනෙකු සොයන පුද්ගලයකු ගැන, එදා මට කීවේද ස්ටැම්ෆඩ්ය. එම තැනැත්තා තමා සේවය කළ රෝහලේ, රසායනික විශ්ලේෂකයකු විය යුතු යයි ස්ටැම්ෆඩ් විශ්වාස කළේය. ඔහු හෝම්ස්ට මා හඳුන්වා දුන්නේ එයින් පසුවය. ඒ දිනවල හෝම්ස් සිටියේ මිනිස් ලේ හඳුනාගැනීමට ම, සුවිශේෂ පරීක්ෂණයක යෙදෙමිනි. අපේ මුල් හමුවීම අමුතු එකක් වුවත් එය

අමතක නොවන එකකි. ඉදිරියේදී මට මුහුණ දීමට සිදුවන සමහර දේ ගැන සලකුණු, එදා මම දුටුවෙමි.

මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වූයේ එය නොවේද? ලේඛකයෙකු වීමට එදා මගේ සිතේ කිසිම බලාපොරොත්තුවක් නොවීය. මා අනාගතයේදී සුප්‍රකට ලේඛකයෙකු වන බව කවුරුන් හෝ කීවා නම්, එදා මං හඬනගා සිනාසෙන්නට ඉඩ තිබිණ. ෂර්ලොක් හෝම්ස් නම් මේ ශ්‍රේෂ්ඨ විද්වතාගේ වික්‍රමාන්විත අභිරහස් පරීක්ෂණ ගැන, මා ලියා ඇති ලේඛන සංඛ්‍යාව කොපමණද?

තමා සතු කුසලතා මගේ කථාන්තරවල අතිශයෝක්තියෙන් දක්වා ඇතැයි, හෝම්ස් කීවේ වරක් දෙවරක් නොවේ. තමා කළ විසඳීම මුලදීම පාඨකයා වෙත දැනුම් දීමට හැකියාව තිබුණත්, මා එසේ නොකළ බව ඔහුගේ තවත් චෝදනාවක් විය. කුතුහලයෙන් පිරුණු අද්භූත ලොවකට පාඨකයා ගෙන යාමේ අරමුණෙන් මා මුලදී සත්‍යය සැඟවූ බව ඔහු කීය. මා සිතන්නේ ඒ විවේචනය අසාධාරණ බවයි. මා ඔහු ආශ්‍රය කළ කාලයේ නම්, හෝම්ස් ප්‍රබන්ධ සාහිත්‍යය රසවිඳි බවක් මම කවදාවත් නුදුටුවෙමි. කෙසේ වෙතත් මා ස්ට්‍රැන්ඩ් සඟරාව හරහා පාඨකයන් වෙත ඉදිරිපත් කළ කථාන්තර හැටකින් පමණක්, ඔවුන්ගේ ප්‍රසාදය දිනා ගැනීමට මට හැකිවිය. මා ලියූ තවත් කථා රැසක්, අතිශය රහසිගත යයි නම් කොට, ට්‍රන්ක පෙට්ටියක එක් රැස් කිරීමට මට සිදුවිණි. ඒවා පාඨකයන් වෙත ඉදිරිපත් කිරීම කවදා සිදු කළ හැකිවේද යන්න දන්නේ දෙවියන් පමණි. ලෝකයේ බිහිවූ ප්‍රමුඛතම විශිෂ්ටතම අපරාධ පරීක්ෂකයාගේ වාර්තාකරු වීමට, මා තෝරාගනු ලැබීම දෛවෝපගත සිදුවීමකි. එහෙත් මා ඉහළින්ම අගය කරන්නේ, මේ ශ්‍රේෂ්ඨ මිනිසා සමග දීර්ඝ මිත්‍රත්වයක් පවත්වාගෙන යාමට මා ලැබූ භාග්‍යයයි.

රහස් පරීක්ෂක ජීවිතයෙන් විශ්‍රාම ගෙන ජීවිතයේ සැඳෑ සමය විශ්‍රාමයෙන් ගත කිරීමට, මගේ මිත්‍රයා තෝරා ගත්තේ සසෙක්ස් ප්‍රාන්තයේ ඈත පිටිසර ගමක් බැව් රහසක් නොවේ.

වෛද්‍යවරයෙකු ලෙස මා කළ සේවය අගයා, 1908 දී මහා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ එම්ප්‍රදෝරු සත්වැනි එඩ්වඩ් රාජෝත්තමයාණන් විසින්, මා වෙත පිරිනමන ලද Order of Merit සම්මානයෙන් පිදුම් ලැබීම; විවාහ දෙකකින් පසු දරුවන් තිදෙනෙකුගේ, මුණුබුරු මිණිබිරියන් සත්දෙනෙකුගේ ආදර ගෞරවයට පාත්‍රවීමට ලැබීම, කෙනෙකුට සෑහීමට පත්විය හැකි කරුණුය. එහෙත් මට එසේ නොවේ.

"වොට්සන්, සෙල්ලම පටන් අරගෙන!" යනුවෙන් හෝම්ස් පවසන ආකාරය මට තවමත් මැවී පෙනේ. බේකර් වීදිය හරහා සුළඟේ සෙමෙන් පාවී ආ ඝන මීදුම මැදින්, හමුදා රිවෝල්වරය අතැතිව, හෝම්ස් සමග ගිය යුගය යළි උදා නොවනු ඇත. ඇෆ්ගන් යුද්ධයෙන් මට ඉතිරි වූ එකම සිහිවටනය - ජසායිල උණ්ඩයෙන් ඇතිවූ තුවාලය, නැවත නැවතත් වේදනා ගෙන දෙයි.

මතකයෙන් ගිලිහී යමින් ඇති සිද්ධීන් යළි සිහිකරමින්, ඒවා සටහන් කිරීමට, මා මෙසේ පෑන අතට ගත්තේ ඇයි? ඒ මගේ දරුවන් වැනි තරුණ වෛද්‍ය විශේෂඥයන්ගේ ඉල්ලීම නිසයි. මේ ආකාරයෙන් මතක සටහන් ලිවීම, මනස සුවපත් කිරීමට එක් ප්‍රතිකාරයක් බව ඔවුහු පවසති.

අප බේකර් වීදියේ ජීවත්ව සිටි යුගයේ ඔහු යෙදුණු පරීක්ෂණ වලින් විශාල ප්‍රමාණයක්, ප්‍රසිද්ධියට පත් කිරීමට මට නොහැකි විය. ඊට හේතු වූයේ මා කලින් ද පවසා ඇති පරිදි, ප්‍රසිද්ධිය ගැන ඔහු දැක්වූ අකමැත්තය; පරීක්ෂණ වලට අදාළ සමහර පුද්ගලයන්, පාර්ශ්ව ජීවතුන් අතර සිටීමය.

එබැවින් මගේ සටහන් වලින් කොටසක් ට්‍රන්ක පෙට්ටියක දමා, චාරිංක්‍රොස්හි කොක්ස් සහ සමාගමේ සුරක්ෂිතාගාරයේ තැන්පත් කළෙමි. ඉදිරියේදී මා විසින් ලියනු ලබන ලිපිලේඛන සියල්ල තවත් ට්‍රන්ක පෙට්ටියක එකතු කරමි. එයද සුරක්ෂිතාගාරයට යවන මෙන්, මගේ දරුවෙකුට හෝ මුණුබුරෙකුට භාර කරන්නෙමි. සිහිකල්පනාව තිබියදී මා ඒ කටයුතු සම්පූර්ණ කළ යුතුය. වයෝවෘද්ධතා ව්‍යසනයට ගොදුරු වෙමින් ඇති මගේ මොළය සම්පූර්ණයෙන්ම විනාශ වීමට පෙර, මෙම කටයුතු සම්පූර්ණ කළ යුතුය.

දැන් කථා කළා ඇති. බේකර් වීදියේ 221 B හි අපේ නිවහනේ දොරටුව දැන් විවෘත කළ යුතුයි. තම පයිප්පය අතට ගෙන ඔහු බලා සිටින්නේ තරප්පු දහ හතක් ඉහළට නැග මා එතැනට ළඟා වෙන තුරුයි. "මගේ හිතවත් වොට්සන්.........!" ඔහු පවසන්නේ සුපුරුදු සිනාව මුවග රඳවාගෙනයි.

ජෝන්. එච්. වොට්සන්



ෂර්ලොක් හෝම්ස්

මෙම පොතේ ඇතුළත් වන්නේ පහත සඳහන් කථාවල පරිවර්තනය.

1. The Curse of the Pharaohs
2. The Adventure of the Silver coloured Dagger
3. The Tragedy at Dorchester
4. The Mystery of Brixton
5. The Adventure of the Uninvited Guest

ඊජිප්තු ශාපය

අප දෙදෙනාගේම මිත්‍රයෙකු වූ ස්ටැම්ෆඩ් විසින් මා ෂර්ලොක් හෝම්ස් මහතාට හඳුන්වා දුන් අවස්ථාව ඔබට මතක ඇතැයි සිතමි. සැන් බාතොලමියු රෝහලේ එම හමුවීමෙන් පසු, අවුරුදු තුනක පමණ කාලයක් අපි එක දිගට කාලය ගත කළෙමු. ඒ බේකර් වීදියේ නිවහනේ බැව් ඔබට අමුතුවෙන් කිව යුතු නැත. ඔහුගේ අභිරහස් පරීක්ෂණ හෝම්ස් වෙත යොමු වූ ආකාරයට මම ක්‍රමයෙන් හැඩ ගැසුණෙමි.

හෝම්ස් හමුවීම සඳහා කල්තබා සැලසුම් කර නොගත් අනුග්‍රාහකයෙකු, බොහෝ විට අප වෙත කැඳවාගෙන එන ලද්දේ හඩ්සන් මහත්මිය විසිනි. විටෙක ගැටලුවක් රැගෙන, උදව් ඉල්ලා, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් පරීක්ෂකයෙක්, පියගැට පෙළේ ශබ්ද නගමින් අප වෙත පැමිණියේය. විදුලිපුවතක් හෝ ලිපියක් මගින් හෝම්ස් කැඳවනු ලැබූ අවස්ථා ද බොහෝ විය. ෂර්ලොක් හෝම්ස් වෙත මා විසින් ද අවස්ථා දෙකක හෝ තුනක, ගැටලු ගෙන එනු ලැබූ බැව් සඳහන් කළ යුතුය. 1889 වසරේ අප්‍රේල් මාසයේ එක් සැඳෑවක, එවැනි අවස්ථාවක් උදාවූ බැව් මගේ සටහන් පොතේ සඳහන් වී ඇත. මේ සරේ ප්‍රාන්තයේ ස්ටෝක් මොරාන්හි දොස්තර ග්‍රයිම්ස්බි රොයිලොට් සම්බන්ධ පරීක්ෂණය අවසන් කළ දිනවල ම ය.

කෑම වේලේ වෙනසක් ඇවැසි වූ විට යාම සඳහා හෝම්ස් ප්‍රිය කළ එක් ස්ථානයක් වූයේ, ස්ට්‍රැන්ඩ්හි සිම්සන්ගේ අවන්හලයි. සංකීර්ණ ගැටලුවක් විසඳා ගැනීමට නොහැකිවුණු කල, කෑම නොකා නොබී, නිදිමරමින්, ගැටලුවට විසඳුමක් සෙවීම ඔහුගේ සිරිතය. දින කිහිපයක් හරි හැටි කෑමක් නොගෙන පරීක්ෂණවල යෙදී පරීක්ෂණය සාර්ථක වූ පසු, පෝෂ්‍යදායක කෑම වේලක් ඔහුට අවශ්‍ය විණි. ඒ සඳහා සිම්සන්ගේ අවන්හලට යා යුතු බැව් හෝම්ස් අවධාරණය කළේය. අප දෙදෙනා වෙනුවෙන් එහි උඩුමහලේ විශේෂ මේසයක් වෙන් කිරීමට, එහි අයිතිකරු සැමවිටම පියවර ගත්තේය. පහළින් පිහිටි වීදියත් ඈතින් ගලා ගිය තේම්ස් නදියත් දර්ශනය වන අයුරෙන්, විශාල ජනේලයක් සමීපයේ මෙම මේසය තබා තිබිණි. ඉතාලි වයින්, කුකුළුමස් මිශ්‍ර ලසඥ්ඥා, ස්විස් චීස්

සමග බේකන් ඔම්ලටයක් එදින ආහාරයට ගත්තෙමු. එය ගෙන අවසන් කළ පසු අප සූදානම් වූයේ අතුරුපස රසවිඳීමටයි. සෑම මේසයක්ම අනුග්‍රාහකයන්ගෙන් පිරී තිබූ බැවි, ඒ දෙස නෙත් යොමු කළ මම දුටුවෙමි. ඒ අතර එක් වරම මට දකින්නට ලැබුණේ මා හඳුනන මුහුණකි. මා දෙස බලා සිටි ඔහුගේ මුහුණට නැඟුණේ සතුටු සිනා රැල්ලකි. අතක් ඔසවා සතුටෙන් සංඥා කළ ඔහු, ඊළඟ මොහොතේ අප සිටි මේසය වෙත පැමිණියේය.

එක් ක්ෂණයකින් ඔහු හඳුනාගැනීමට මට හැකිවිණි. මා සමග එකට ඇෆ්ගනිස්ථානයේ යුද පෙරමුණේ සටන් කළ ඔහු මේජර් රැල්ෆ් ඕබ්‍රයන්ය. පස්වැනි නොදම්බලන්ඩ් පාබළ හමුදා රෙජිමේන්තුවේ සිටි අප දෙදෙනා, සටන් පෙරමුණට ගියේ එකට ම ය. හැඩිදැඩි සිරුරක් තිබූ ඔහුගේ කෙස් තද රතු පැහැති විය. එබැවින් මිතුරන් අතර ඔහු හැඳින්වුණේ "රස්ටි" යන නමිනි. උසින් අඩි හයහමාරක් පමණ වූ ඔහු, ඕනෑම සෙනගක් මැද කැපී පෙනෙන පුද්ගලයෙකු විය. එහෙත් මෙදින නම් ඔහු විශේෂයෙන් කැපී පෙනුණේ, හිස වටා බැඳ තිබූ වෙළුම් පටි නිසාය. ඔහු ළංවෙද්දී මම අසුනෙන් නැගී සිටියෙමි.

"දෙවියනේ! මගේ හිතවත් ජෝන් වොට්සන්!" ඔහු පැවසුවේ ඇතින්ම මා බදාගනිමිනි.

"රස්ටි! මගේ මිත්‍රයා!" මට කියවුණේ උස් හඬෙනි. "මේක හරි පුදුමාකාර හමුවීමක්. ඔබ ආපහු එංගලන්තයට ආ බවක් මං දැනගෙන හිටියේ නෑ. ඔබ දකින්න ලැබීම මොන තරම් සතුටක් ද? දැන් මගේ හිතවත්ම මිත්‍රයා....... ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔහු ඔබට හඳුන්වා දෙන්නද?"

"හඳුන්වාදීමක් උවමනා නෑ ජෝන්" රස්ටි කීය. "හෝම්ස් මහත්මයා. ඔබ හමුවෙන්න ලැබීම විශාල ගෞරවයක්. ඔබේ හපන්කම් ගැන කතා වොට්සන් නිරන්තරයෙන්ම ස්ට්‍රෑන්ඩ් සඟරාවට ලියනවානෙ. මං ඒවා කියවන්නෙ හරිම ආශාවෙන්. ඔබේ සූක්ෂම දෙනෙතට මේ වෙනකොටත් මාව හසුවෙලා ඇති. සැකයක් නෑ මගේ සම්පූර්ණ තොරතුරු, එකින් එක ඔබේ මනසේ දර්ශනය වෙනවා ඇති?"

"මේජර් ඕබ්‍රයන්" හෝම්ස් කීවේ ඔහුට උණුසුම් අයුරින් අතට අත දෙමිනි. "ඔබේ ජීවිතය සම්බන්ධව හැමදෙයක්ම මං දන්නවා කියල, මං කියන්න උත්සාහ කරන්නේ නෑ. නමුත් ඔබ තරුණ

කාලයේ ඉතාලි නෞකාවක සේවය කර ඇති බව මට කියන්න පුළුවනි"

"ඒ කොහොමද?"

"ඔබේ වම් මැණික් කටුවේ පච්ච කෙටූ සලකුණක් තියෙනවා. ඒ කිඳුරියක සහ ඉතාලියටම සුවිශේෂ කුරුසියක සලකුණෙන්"

"ඔබ නිවැරදියි. වෙන මොනවද?"

"ඔබ දීර්ඝ කාලයක් ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදුණු කෙනෙක්?"

"නිවැරදියි. වෙන මොනවද?"

"ඔබ මුල් කාලයේ වේග පන්දු යවන්නෙකුව ඉඳලා පසුව දකුණත් දඟ පන්දු යවන්නෙකු හැටියටයි ක්‍රීඩා කළේ"

"සහතික ඇත්ත!" ඕබ්‍රයන් කීය. "මං වේග පන්දු යවන්නෙකු වුණේ පාසල් කාලයේ. නමුත් ප්‍රාන්ත ක්‍රිකට් කණ්ඩායමට ක්‍රීඩා කරන්න පටන් ගත්තාම ඒ වෙනස සිද්දවුණා. මගේ පුහුණුකරු තමා මාව දඟපන්දු යවන්නෙකු කළේ. ඔබ මෙය තේරුම් ගත්තෙ කොහොමද කියන එක මට හිතාගන්නවත් බෑ"

"ඔබේ දකුණු අතේ ඇඟිලි වල රළුවීම් පිහිටි ආකාරය හොඳින් නිරීක්ෂණය කළාම ඒ බව තේරුම් ගන්න අමාරු නෑ. විශේෂයෙන්ම වෙදැඟිල්ලේ ඇතුළු පැත්තේත් මැදඟිල්ලේ පිට පැත්තේත් ඇති රළු වීම්......."

මේ අවස්ථාවේ හෝම්ස්ගේ කථාවට බාධා වූයේ, අතුරුපස බඳුන් රැගත් වේටර්වරයා අප මේසය වෙත පැමිණීම නිසාය. මගේ මිත්‍රයා වෙත අසුනක් ළං කොට, ඔහුට ද අතුරුපස ගෙන එන මෙන් මම සේවකයාට දන්වා සිටියෙමි.

"රස්ටි. ඔබ කෑම කාල ඉවර ද දන්නෙ නෑ, මම අතුරුපස ඇණවුම් කළාට?" මා ඔහුගෙන් විමසුවේ සමාව අයදින ස්වරයෙනි.

"ඒකට කමක් නෑ ජෝන්. ඔබට ස්තුතියි. "රස්ටි කීය. "මං අතුරු පස බඳුන් දෙකකුත් අවසන් කරලයි ඉන්නෙ. නමුත් තවත් එකක් මට වැඩි වෙන එකක් නැහැ" ඔහු කීවේ හඬ නගා සිනාසෙමිනි.

"ඔබ නාවික රැකියාව අත් ඇරල හමුදා සේවයට බැඳිල කොයිතරම් කල් වෙනවද? ඒක මට කියන්න අමාරුයි" හෝම්ස් කීය.

"මගේ තාත්තා නෞකාවක කපිතාන් වරයෙකු ලෙසයි රැකියාව කළේ. ළා බාල කාලයේම ඒ කියන්නේ මට වයස අවුරුදු දහතුනක් වෙද්දී මං නාවුක රැකියාවට බැඳුණා. නමුත් මහා ඉන්දියානු කැරැල්ලෙදි ඉන්දියානුවන්, ඉංග්‍රීසි ජාතිකයන් සමූල ඝාතනය කළ හැටි අහලා මගේ ඇඟේ ලේ උණුවුණා. මුළු පෙරදිගටම නවීන

ශිෂ්ටාචාරය අරගෙන ගියේ අපි. උන්ට ඉංග්‍රීසි උගන්වලා, ශිෂ්ට සම්පන්න වෙන්න සිරිත් විරිත් කියාදීලා, ආගම ධර්මය උගන්වලා අපි මොන තරම් සේවයක් කළාද? නමුත් ඉන්දියානුවන් අපව විනාශ කරන්න ගත්තේ මොන තරම් අකෘතඥ ආකාරයටද?"

"ඔබ ඉතා භක්තිමත්ව ක්‍රිස්තියානි ආගම අදහන කෙනෙකු බවත්, ජීවිතයේ එක් කාලයක සූසාන් නම් කෙනෙකු ඔබේ හදවතට ඉතාම සමීපව සිටි බවත්, මට කිව හැකියි" මගේ මිත්‍රයා කීය.

"ඒ ඔක්කොම හරි. ඔබ කොහොමද මේව දැනගත්තේ?"

"ඉතාම සරලයි" හෝම්ස් කීය. "තමන්ගේ මැණික් කටුවේ කුරුසියක ලකුණ පච්ච කොටවා ගැනීම දැන් දකින්න ලැබෙන්නේ ඉතාම කලාතුරකින්. ඔබ අයිරිෂ් සම්භවය. ඇති, ඒනිසා රෝමානු කතෝලික කෙනෙකු යයි මා විශ්වාස කරනවා. ඔබට ඒ කරුණ අමතක වුණත් කුරුසියේ ලකුණට පහළින් සූසාන් යන නම මට දැකගත හැකියි."

"ඔව් මහත්මයා. මං ආදරය කළ තරුණිය සූසාන්" රස්ටි කීය. "අපි විවාහ වුණා. නමුත් හෘදයාබාධයකින් ඇය මියගියා....... ඒ සිදුවීමෙන් මට මුළු ලෝකයම එපා වුණා......."

එම ශෝක ජනක සිදුවීම සිහිවීමෙන් මගේ මිත්‍රයා හැඟීම් බර වූ අයුරු මම දුටුවෙමි. එබැවින් මම කතාබහ වෙනත් අතකට හැරවූයෙමි.

ඇෆ්ගනිස්ථානෙදි එකටම හිටි අපි වෙන්වුණේ කොහොමද?" මම ඇසීමි.

"ඇයි ජෝන් ඔබ බර්ක්ෂයර් රෙජිමේන්තුවට මාරු වුණා නේ" රස්ටි කීය. "ඊට පස්සෙ මට අහන්න ලැබුණා ඔබ තුවාල ලබලා ආපහු එංගලන්තයට එවුණු බව."

"මේජර් ඕබ්‍රයන්. ඔබත් ඊයෙ පෙරේදා මොකක් හරි අනතුරකට මුහුණ දීල වගෙයි" හෝම්ස් කීවේ රස්ටිගේ හිස වටා ඔතා තිබූ වෙළුම් පටි දෙස නෙත් යොමු කරමිනි.

"ඔව් මහත්මයා. වහලක් උඩින් මගේ හිස උඩට උළුකැට දෙකක් වැටුණා."

"මොනවා? ඒ කොහොමද? කොහේදිද මේක සිදුවුණේ?" හෝම්ස් විමසීය.

"මං පදිංචි ගොඩොල්ෆින් වීදියේ, ෆුලම් බැරැක්කවල." රස්ටි කීය. "පෙරේදා උදේ ගෙදරින් එළියට බැහැල අඩි දහයක් ඉදිරියට

එන්න ලැබුණේ නෑ. එකක් පිටිපස්සෙ එකක් වහලකින් රූටා ආව උළුකැට දෙකක්; වැටුණේ මගේ ඔළුවටම"

"ඔබ ඒ ගැන වහාම හොයල බැලුවද?"

"වහාම නම් හොයන්න බැරිවුණා හෝම්ස් මහත්මයා. ඒ හරියේ රැඳී ඉන්න කුලීරථ රියැදුරන් මා අඳුනනවා. ඔවුන් වහාම මාව සාන්ත මයිකල් රෝහලට ගෙන ගියා. හිසේ ඇතිවුණු තුවාල වලින් ලේ හුඟාක් ගලාගෙන ගියා. මැහුම් කිහිපයක් දැමීමටත් වෛද්‍යවරුන්ට සිදුවුණා. මාව දින එකහමාරක් රෝහලේ නවත්වා ගත්තා. ඊට පස්සේ තමා ටිකට් කැපුවේ"

"මේ ගැන ඔබ හොයා බැලුවෙ නැද්ද?" හෝම්ස් විමසීය. "මේක හිතාමතා කළ වැඩක් වෙන්න බැරිද? ඒ ගෙදර පදිංචිකරුවන්ගෙන් ඔබ විමසා බැලුවද?"

"පොලිස් භටයෙකුත් සමග ගිහින් මං විමසා බැලුවා. ඒක චමරියක් හෝම්ස් මහත්මයා. විවිධ තරාතිරම්වල පුද්ගලයන් ඒ ගෙදර කාමර කුලියට අරගෙන පදිංචිවෙලා ඉන්නවා. වහල හොඳටම අබලන් බවයි පදිංචිකරුවන් කිහිප දෙනෙකුම කිව්වේ. ගේ අයිතිකාරයා කුලී ගන්නවා මිසක්, වහල හදන්න සැලකීමක් කරන්නෙ නැතිලු"

"ඔය තරමින් බේරුණේ හොඳ වෙලාවට" මම කීවෙමි. "මොළය තුළට ලේ ගැලීමක් සිදුවුණා නම් ඔබ මරණයට පත්වෙන්නත් ඉඩ තිබුණා"

"ඇත්තෙන්ම ඔව් ජෝන්" ඔහු කීය. "ඊජිප්තු මමියේ ශාපය මගේ හිස මතට එන්නෙ නැතුව, මාව යන්තම් බේරලා. සොහොන් ගැබ ගවේෂණය කළ කණ්ඩායමේ, මං සුළු සාමාජිකයෙකු විතරයි. ඒ නිසා වෙන්න ඇති මේ තරමින් බේරුණේ. මං ඔය මිථ්‍යා විශ්වාස ඇදහූ කෙනෙක් නෙමෙයි මිත්‍රවරුනි. නමුත් පහුගිය කාලෙ දකින්න ලැබුණු අහන්න ලැබුණු දේවල් නිසා, මගේ ස්ථාවරය වෙනස් කරගන්නයි වෙලා තියෙන්නෙ"

හෝම්ස් ඉදිරියට නැමී දෙනෙත් සම්පූර්ණයෙන්ම විවර කරගෙන, රස්ටි දෙස බලා සිටියේ අතිශය පුදුමයට පත්වය. අන්තිමේදී ඔහු මේජර් වරයා ඇමතුවේය.

"මේජර් ඕබ්‍රයන්. ඔබ කරන්නෙ බොහොම බරපතළ ප්‍රකාශයක්. ඒක අපේ සිත්වල ඇති කරන්නේ අප්‍රමාණ කුතුහලයක්. ඔබ කී දේ තවත් පැහැදිලි කරන ලෙස මං ඔබෙන් ඉල්ලා හිටිනවා. කරුණාකරල අපට හැමදෙයක්ම මුල ඉඳල කියන්න."

"හෝම්ස් මහත්මයා, මං භක්තිමත්ව ක්‍රිස්තියානි ආගම අදහන කෙනෙක්" රස්ටි කථාව ඇරඹීය. "අපේ සමහර මිනිස්සු වගේ ආගමත් අදහමින් බහුශ්‍රැත විශ්වාස කරන කෙනෙක් නෙමෙයි, මම. ඇෆ්ගනිස්ථානයේ යුද සේවය අවසන් කරල ආපහු එන්න පිටත්වෙද්දි, මං තෝරා ගත්තෙ අනික් අය ආපසු එන මාර්ගය නෙමෙයි. මට උවමනා වුණා ශුද්ධ වූ දේශයත් බලාගෙන ආපහු එන්න. බයිබලයේ සඳහන් වෙන උර් නගරයත් මෙසපොතේමියාවේ ගංගා බලන්නත් මං ගියා. බැග්ඩෑඩයේ දින කිහිපයක් ගත කරලා මං ගියේ ජෙරුසෙලමට. මුස්ලිම් භක්තිකයන් විසින් ඔවුන්ගේ තුන්වැනි ඉහළම පුදබිම ලෙස සලකන, කලින් යුදෙව්වන්ට අයත්ව තිබුණු "ජූවිෂ් ටෙම්පල් මවුන්ට්" නම් ස්ථානය බැලීමත් මගේ එක බලාපොරොත්තුවක් වුණා. ඒ වගේම "චර්ච් ඔෆ් හෝලි සෙපල්කර්" නැරඹීමටත් මං හිතාගෙන හිටියා. මාත් ආධුනික පුරාවිද්‍යාඥයෙකු බව ඔබට කිව යුතුයි. එඩ්වඩ් රොබින්සන්, ජෙනරාල් චාල්ස් ගෝඩන් ආදීන් කළ ගවේෂණාත්මක සොයා ගැනීමුත් මගේ සිත් ඇදගත්තා.

ඊට පස්සේ මං ගියේ ඊජිප්තුවේ කයිරෝ නගරයට. ගීසාහි පිරමීඩ සහ ස්ෆින්ක්ස් ස්මාරකය බලන්න මං ලොකු ආශාවකින් හිටියේ. මං නවාතැන් ගත්තේ ගියොප්ස්ගේ යෝධ පිරමීඩ අසල මෙනා හෝටලයේ. එහේදි තමයි මට ආචාර්ය ඩික් ෆර්ගසන් හමුවුණේ. පසු ගිය කාලයේ ඊජිප්තුවේ කළ කැණීම් සමහරකට මූල්‍ය දායකත්වය සැපයූ, ෆර්ගසන් සාමි ගැන ඔබ අහල ඇති. මේ ෆර්ගසන් සාමිගේ ඥාති පුත්‍රයෙක් තමා ආචාර්ය ඩික්. මේ කැණීම් කටයුතුවල ප්‍රධානත්වය දැරුවේ, කේම්බ්‍රිජ් සරසවියේ ඊජිප්තු පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක්. ඔහු තමා මහාචාර්ය මොරිස් විලියම්ස්. ඔවුන් සමග එකතුවෙන්න කියලා ඩික් ෆර්ගසන් මට ඇරයුම් කළා."

"ප්‍රවෘත්ති පත්‍ර වල කණ්ඩායමේ ගවේෂණ ගැන පළවුණා" මම කීවෙමි. "මං හිතන්නේ යථා කාලයෙදි මහ රැජිනගෙන් ඔබ හැමදෙනාටම ගෞරව සම්මාන පිරිනැමේවි."

"ඔව් ඒක හරි" රස්ටි කීය. "නමුත් ෆර්ගසන් සාමිට එරෙහිව දැඩි විවේචන එල්ල වුණු බවත් ඔබට මතක ඇති. සොයාගත් පුරාවස්තු හැම එකක්ම ජාතිය වෙනුවෙන් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට පිරිනමනවා වෙනුවට, ඔහු මොකක්ද කළේ? නිව්යෝර්ක්හි මෙට්‍රොපොලිටන් කෞතුකාගාරයට සහ පුරාවස්තු එකතු කරන

රුසියාවේ රජ පවුලට ඔහු ඒවා අධික මිලකට විකිණුවා. ඔහු කළ කැපකිරීම බලනකොට ඒකෙ වැරැද්දකුත් නෑ"

"ඔය ප්‍රශ්න කල්ගතවෙද්දි විසඳාගනීවි" හෝම්ස් නොඉවසිල්ලෙන් කීවේ, මා දෙස අමනාප බැල්මක් හෙළමිනි. "කරුණාකර ඔබ කියාගෙන ආ කථාව දිගටම කියන්න මහත්මයා"

"මහාචාර්යතුමාගේ අරමුණ වෙලා තිබුණේ 18 වැනි රාජ පරම්පරාවට අයත් 3 වැනි අමෙන් හොතෙප් සහ 4 වැනි අමෙන් හොතෙප් රජවරුන්ගේ සොහොන් බිම් සොයා ගැනීම. මේ සඳහා කැණීම් කළේ ලුක්සෝ, ඒ කියන්නේ තීබ්ස් වල. මේ රජවරුන් දෙදෙනා ගේද එහෙමත් නැත්නම් ලාබාල යුවරජෙකුගේද දන්නෙ නෑ, අපට රාජකීය සොහොනක් හමුවුණා. මැණික් වර්ග රත්රන් ආදී නිධන් වස්තු විශාල ප්‍රමාණයක් හොයා ගැනීමටත් හැකිවුණා. විශ්වාස කරන්න මහත්වරුනි. ඉන්දියානු මහරාජාවරුන් සතු අනර්ඝ මුතු මැණික් රිදී රත්තරන් ආදී වස්තුව මං දැකල තියෙනවා. නමුත් මේව එක්ක බලනකොට ඒව මොනවද? අවුරුදු දහස් ගණනක් තිස්සේ නිධාන සොයා රජවරුන්ගේ සොහොන් හෑරූ නිදන් හොරුන්ට අහුනොවී, මේවා බේරුණේ කොහොමද කියන එකත් පුදුමයි. ඒ සමහරවිට මළසිරුර තැන්පත් කර තිබූ ප්‍රධාන කුටියේ, බිත්ති පුරා කොටා තිබුණු ශාපය නිසා වෙන්න ඇති. සිතේ භීතියක් ඇති කරන එය, මගේ හිතේ නොමැකෙන ආකාරයට තැන්පත් වුණා. "මෙම ශුද්ධ වූ සොහොන් ගැබට ඇතුළු වී එහි වටිනා දේ පැහැර ගන්නන් සහ මෙතැන විනාශ කරන්නන් මරණයට අධිපති හතෝර් දෙවියා විසින් විනාශ කරනු ඇත" රූපාක්ෂර මඟින් සෑම තැනකම ලියා තිබුණේ ඒ වැකිය බව මහාචාර්ය මොරිස් විලියම්ස් අපට කිව්වා"

"එහි ලියා තිබුණේ ඒ වැකිය පමණද?" මම ඇසීමි.

"නැහැ මහත්මයා. මේ විදියටත් තිබුණා. "මගේ නින්දට බාධා කරන්නන් දියේ ගිලීමෙන් හෝ ගින්නට අසු වීමෙන් මරණයට පත්වනු ඇත. එසේ නොවුවහොත් සතුරන් විසින් පහරදීමෙන් හෝ ඔවුන්ගේ හිස් මත පර්වත කඩා වැටී ශරීර සුනුවිසුනු වීමෙන් මරණයට පත්වනු ඇත. ගෝනුස්සා සහ නාගයා ඔවුනට දෂ්ට කරනු ඇත; නැත හොත් හිපපොටේමස්, සිංහයා හෝ කිඹුලාට ගොදුරු වී ඔවුන් ජීවිතක්ෂයට පත්වීම නිසැකයි!"

"ඔබට මේ හැම දෙයක්ම කට පාඩම් ද? නැත්නම් මතක තිබුණද?" හෝම්ස් විමසීය.

"මහාචාර්ය විලියම්ස් සොහොන් ගැබ තුළ රූපාක්ෂර වලින් සටහන් කර තිබුණු දේ අපට තේරුම් කර දුන්නා" රස්ට් කීය.

"එතකොට ඒ හැම එකක්ම මගේ අත් පොතේ සටහන් කරගත්තා. ඊයේ පෙරේදා ඒ පොත අරගෙන මේ වාක්‍ය කිහිප වාරයක්ම කියවීමට මට හිතුණා"

"එතකොට ඔබට හිතෙන්නේ" හෝම්ස් කීය. "ඔබ මුහුණ දුන් අවාසනාවන්ත සිදුවීමට - ඒ කියන්නේ හිස මතට උළුකැට වැටීම ශාපයේ ප්‍රතිඵලයක් කියලයි?"

මං කවදාවත් මිථ්‍යා විශ්වාසය ඇදහූ කෙනෙක් නෙමෙයි හෝම්ස් මහත්මයා." රස්ට් කීය. "නමුත් ෆර්ගසන් - විලියම්ස් ගවේෂණයෙන් පසුව මට දකින්න ලැබුණේ, ඉතා අසාමාන්‍ය අද්භූත සිදුවීම්. එතකොටයි මට සිතුණේ, ඊජිප්තුවේ ෆේරෝවරුන්ගේ ශාපයත් අපට තේරුම් ගැනීමට නොහැකි, අද්භූත ආකාරයකට ක්‍රියාත්මක වෙනවාදෝ කියල. විශ්වයේ පවතින හැම දෙයක්ම අපේ පියවි ඇසට පෙනෙන්නෙ දැනෙන්නෙ නැහැ. නමුත් ඒවා පවතින බව විද්‍යානුකූලව ඔප්පු කරල තියෙනවා."

"ඔව් ඒකත් ඇත්ත තමා" හෝම්ස් කීය. "ඔබේ කතන්දරය එන්න එන්නම රසවත් වෙනවා. මොනවද ඔබ කියූවේ අසාමාන්‍ය ආකාරයේ අද්භූත සිදුවීම් වුණා කියල?"

"එයින් පළමුවැනි එක සිදුවුණේ ඊජිප්තුවේදී කැණීම් කරද්දී. අපි කැණීම් ඇරඹුවේ තරමක් වැලි සහ පර්වත සහිත කඳු බෑවුමකින්. අප සොහොන් ගැබ තුළට හාරා දොරටුව විවෘත කළ දවසෙම පොළොව යට තිබූ දෝනාවක් කඩාගෙන වැටුණා. එයට කම්කරුවන් තිදෙනෙකු යටවුණා. පස් හා ගල් ඉවත් කොට ඔවුන් එළියට ගත්තා. එයින් බරපතළ තුවාල ලබා සිටි කම්කරුවෙක් මියගියා. කැණීම් කරද්දී මෙහෙම දේවල් සිදුවෙන බව ඇත්තයි. නමුත්......."

"....... හොඳයි මොකක්ද ඊළඟට සිදුවුණේ?"

"කැණීම් කටයුතුවලදී මහාචාර්ය විලියම්ස්ට සහාය දීමට, ඉංග්‍රීසි ජාතික තරුණයෙකු ඊජිප්තුවට ගොස් සිටියා. හැරී රේමන්ඩ් නම් වූ ඔහු අවුරුදු 22 ක පමණ හැඩිදැඩි නිරෝගී සරසවි සිසුවෙක්. සොහොන් ගැබෙන් හමුවුණු පුරාවස්තු ලේඛන ගත කිරීමේ කටයුතු කෙරුණේ ඔහුගේ ප්‍රධානත්වයෙන්. තුන්වැනි දවසේ ඔහු උණ රෝගයකට ගොදුරු වුණා. අපට වෛද්‍යවරයෙකුගෙන් කලින් ලැබී තිබුණු උපදෙස් අනුව ඖෂධ ලබා දුන්නා. නමුත්

අසනීප තත්ත්වය උග්‍රවුණා. අප කැණීම් කළ ලුක්සෝ කිට්ටුවක ඉංග්‍රීසි වෛද්‍යවරයෙකු නැහැ. නයිල් ගඟේ මගීන් ප්‍රවාහණය කරන නැවක නංවලා, ඔහු කයිරෝවට එව්වේ තවත් අයෙකු සමග. ඒක හැතැක්ම තුන්හාර සීයක දුරක්. නමුත් නැව ඇබිඩොස් නගරයට සේන්දු වූ දිනයේ, රේමන්ඩ් ගේ අසනීපය අසාධ්‍ය වෙලා ඔහු මියගියාලු"

"තවත් දේවල් සිදුවුණාද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. සොහොන් ගැබ කැණීමෙන් සොයාගත්, ප්‍රමාණයෙන් විශාල පුරාවස්තු අපි නැවකට පටවලා එංගලන්තයට එව්වා. "ලෝඩ් නෙල්සන්" නම් මේ නෞකාව ඉතාම හොඳ තත්ත්වයේ ඉංග්‍රීසි නැවක්"

"එය මුහුදුබත් වුණාද?" හෝම්ස් ඇසීය.

"ඔව්. ඒ ගැන ඔබට දැනගන්න ලැබෙන්න ඇති" රස්ට් පිළිතුරු දුන්නේය. "මධ්‍යධරණී මුහුදේ දී කුණාටුවකට අහුවෙලා නැව මුහුදු බත් වුණා. වාසනාවකට වගේ ජීවිත හානි කිසිවක් සිදුවුණේ නෑ. නමුත් බරෙන් වැඩි පුරාවස්තු කිසිවක් බේරා ගැනීමට හැකිවුණේ නෑ. සියල්ල මුහුදු පත්ළටම ගියා. රජතුමාගේ මම්යේ මුහුණ වසා තිබූ දඹරන් වෙස්මුහුණත් මුහුදුබත්වුණා"

"තවත් මොනවා හරි වුණාද?"

"ඊජිප්තු රූපාක්ෂර කියවීමේදි මහාචාර්ය තුමාට සහාය දුන්නේ, කේම්බ්‍රිජ් සරසවියේ ම සහකාර කථිකාචාර්යවරයෙක්." රස්ට් කීය. "ඔහුගේ නම ඉයන් හයිස්මිත්. සති කිහිපයකට පෙර මැංචෙස්ටර්හි සිදුවුණු දුම්රිය අනතුර ගැන ඔබට මතක ඇති. ඒ අනතුරේදි හයිස්මිත් මිය ගියා"

"මහා භයානක අනතුරක් වුණේ" හෝම්ස් කීය. "මගේ මතකය නිවැරදියි නම් දොළොස් දෙනෙකු පමණ මියගියා. දුම්රිය මාර්ගයේ සංඥා පද්ධතියේ වැරැද්දක් නිසාලු එය සිදුවුණේ. ඊළඟට මොකක්ද වුණේ?"

"ඒක වුණේ ගිය සතියේ" රස්ට් කීය.

"ඔබ දන්නවාද මං දන්නෙ නෑ. කේම්බ්‍රිජ් සරසවියේ ආචාර්ය මහාචාර්යවරුන්ගේ නිවාස තිබෙන්නේ සරසවි උද්‍යානයේමයි. අලංකාර ලෙස වටේට මල් වවා තිබෙන මහාචාර්ය විලියම්ස්ගේ නිවසට, පුරා විද්‍යා පීඨයේ සිට යාර සීයකට වඩා දුර, නෑ. පහුගිය අවුරුදු විස්සක පමණ කාලයක් තිස්සේ මහාචාර්යතුමා මේ දුර මහා රාත්‍රියේ පවා ගමන් කර තිබුණේ තනිවම, පයින්මයි. එදා

පර්යේෂණාගාරයට වී මෙවර ලැබුණු පුරාවස්තු විශ්ලේෂණය කරමින් සිටි ඔහු, රෑ දොළහට පමණ තනිවම ආපසු ගෙදර එමින් සිට තිබෙනවා. අඳුරේ සැඟවී සිටි කවුරුන් හෝ ඔහු වෙතට පැන ඔහුට, දැඩි ලෙස පහර දීල තිබුණා. මහාචාර්යතුමා සිහි නොලබාම මියගිය බව ඔබ පුවත්පත්වල දකින්න ඇති. පොලීසිය නම් කියන්නේ මේ ප්‍රදේශයේ මංකොල්ලකරුවන් කල්ලියක් ගැවසෙන බවයි. වටිනා පුරාවස්තු රාශියක් හමුවුණු බව පුවත්පත්වල පළවුණා නේ. ඒ නිසා ඒවා මංකොල්ල කෑමේ අරමුණෙන්, මේ ප්‍රහාරය එල්ල කරන්න ඇති කියලයි ඔවුන් කියන්නේ. ඒ ගැන තවමත් කිසිවෙකු අත් අඩංගුවට ගෙන නෑ, මම දන්න තරමින්."

"හරි ඛේදජනක සිදුවීමක්" හෝම්ස් කීය. "ඔය ගැන සෙවීම භාරවෙලා තියෙන්නේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ ඇතල්නි ජෝන්ස්ට බව ලෙස්ට්‍රේඩ් මා සමග කිව්වා. තවත් මොනවද ඔබට කියන්න තියෙන්නේ?"

"මහාචාර්යතුමාගේ අවමඟුල් උත්සවයට මං සහභාගි වුණා" රස්ටි කීය. "එහිදී මට හමුවුණා ගවේෂණයට මුදල් ලබා දුන් ෆර්ගසන් සාමි සහ ඔහුගේ ඥාති පුත්‍රයා ආචාර්ය ඩික් ෆර්ගසන්. අපේ කණ්ඩායමේ සිටි බ්‍රිතාන්‍ය කෞතුකාගාරය නියෝජනය කළ පුරා විද්‍යාඥයා මර්වින් ග්‍රීන් තවමත් කයිරෝවල.

කලින් ශාපය ගැන විශ්වාස නොකළ, එයට හිනාවුණු අයත්, දැන් එය විශ්වාස කරන්න පටන් අරගෙන. ෆර්ගසන් සාමි ඉන්නේ දැඩි කම්පාවකට පත්වෙලා. ඔහුට කතාකරගන්නවත් බැහැ. ඔහුගේ ඥාති පුත්‍ර ආචාර්ය ඩික් කථා කළේ, මරණ දඬුවමට නියමවුණු පුද්ගලයෙකු වගේ......."

"ඔහු මොකද කිව්වේ?"

"ශාපයේ මීළඟ ගොදුර තමා බව සහතික යයි ඩික් කිව්වා. "මේ වයසක මනුස්සයා ගැනත් මට හුඟක් භයයි" ඩික් කිව්වේ තම මහප්පා පෙන්වමින්"

"කවුද මේ ඩික්? ඔහුත් කේම්බ්‍රිජ් සරසවියේ පුරාවිද්‍යා අංශයේ සේවය කරන කෙනෙක්ද?" හෝම්ස් විමසුවේය.

"ඔහු තමා ෆර්ගසන් සාමිගේ මල්ලිගේ පුතා." රස්ටි කීය. "ඩික් පුරාවිද්‍යාවට සම්බන්ධ කෙනෙකු නොමෙයි. ඔහු සම්බන්ධ සත්ත්ව විද්‍යාවට. කාලයක් ඔහු එඩිංබ්‍රෝ සරසවියේ සහකාර කථිකාචාර්ය ධුරයක් දරල තියෙනවා. නමුත් එහි ඒකාකාරී ජීවිතය එපා වෙලා

ආසියාවේ සහ දකුණු ඇමරිකාවේ වනාන්තරවල සංචාරවල යෙදුණලු. ඔහු සතුන් ගැන පර්යේෂණවලට කැපවී ඉන්න කෙනෙක්. ඔහුට ආචාර්ය උපාධිය පිරිනැමිල තියෙන්නෙත් උරගයින් ගැන කළ පර්යේෂණ සඳහා. ඒක නෙමෙයි වොට්සන්. ස්වර්ණ්ඩ් සඟරාවෙ ඔබේ මීළඟ වික්‍රමාන්විත කථාව අපට කියවන්න ලැබෙන්නෙ කවදටද?"

"ඒක බොහොම සිත් ඇදගන්නා කතාවක් වේවි" මම කීවෙමි. "ඒකෙ තියෙන්නෙ ඉන්දියාවෙ භයානක විසකුරු සර්පයෙකු ගැන. ඔබ ඒ සතා ගැන දන්නවාත් ඇති"

"මොකාද? වගුරු පොළඟාද?"

"හරියට හරි. මේකෙ තරුණ කාන්තාවක් ඉන්නවා. කලක් ඉන්දියාවේ වාසය කළ ඇගේ......."

"....... ඒ කතාව මේ වෙලාවෙ ප්‍රසිද්ධියට පත් කරන එක සුදුසු නැහැ නේද වොට්සන්?" හෝම්ස් කීවේ මා කියූ දෙයට බාධා කරමිනි.

"ඔව්. ඒකත් හරි තමා" රස්ටි කීය. "කොහොම වුණත් මං ඉක්මනින්ම දවසක බේකර් වීදියට එනවා, වොට්සන් දොස්තර මහත්මයා හමුවෙන්න. ඇෆ්ගනිස්ථානයේ අපේ අත්දැකීම් ගැන කොයි තරමක් දේවල් තියෙනවද කතාබහ කරන්න" මෙසේ කියූ රස්ටි අපෙන් සමුගෙන පිටවී ගියේය.

"වොට්සන්. ඔබේ මිත්‍රයා කියූ කතන්දරය අහලා, මගේ යටපත් වී තිබුණු ආශාවක් නැවත අලුත් වුණා" හෝම්ස් කීවේ පයිප්පය දල්වා ගනිමිනි. "ඔබ පාඨකයන්ට කියල තියෙනවානෙ පුරාණ ශිෂ්ටාචාර, සමුද්‍ර පුරාවිද්‍යාව ගැන, මගේ උනන්දුවක් තියෙනවා කියල. ඊජිප්තු පුරාවිද්‍යාවත් මගේ සිත් ඇදගත් ක්ෂේත්‍රයක්. ඒ වුණත් ඒවා ගැන සොයා බලන්න, නරඹන්න නම් අපට ඊජිප්තුවට යන්න වෙනවා. මං හිතන්නෙ නෑ මට කවදාවත් ඒ වගේ දීර්ඝ විවේක නිවාඩුවක් ගත හැකිවේවි කියලා. කොහොම වුණත් මේ සම්බන්ධයෙන් හමුවී කතාබහ කිරීමට, මා කැමති පුද්ගලයින් දෙදෙනෙකු ඉන්නවා. බේකර් වීදියට ගියාම මං කියන්නම්. ඔබට පුළුවනි පුරාවිද්‍යා විශ්වකෝෂයේ ඔවුන් ගැන කියවා බලන්න"

එහෙත් එදින අපට එම පුරාවිද්‍යාඥයන් ගැන කියවීමට අවකාශයක් නො ලැබිණ. ඒ හෝම්ස්ගේ වැඩිමහල් සොහොයුරා වූ මයික්‍රොෆ්ට්, මගේ මිත්‍රයා හමුවීමට බේකර් වීදියට පැමිණි බැවිනි.

"මං ඔබ හමුවීමට නිතර මෙහේ එන කෙනෙක් නෙමෙයි නෙ ෂර්ලොක්" මයික්‍රොෆ්ට් කීය. "මං එන්නේ ඔබගේ උදව් අත්‍යවශ්‍යම වුණාම විතරයි"

"මොකක්ද ඒ උදව්ව?"

"අග්‍රාමාත්‍යතුමාත්, රාජ්‍යාරක්ෂක ඇමතිතුමාත් ඉල්ලා හිටිනවා, බැරෑරුම් කටයුත්තක් සඳහා ඔබව විදේශයකට යවන්න කියලා."

"කොහේටද?"

"ආසියාවේ රටකට......."

"කතාකරල වැඩක් නෑ මයික්‍රොෆ්ට්" හෝම්ස් කීවේ උස් හඬින් සිනාවෙමිනි. "ඒව නම් නොකෙරෙන වැඩ. ලන්ඩනයෙන් පිටවෙලා මට යන්න හැටියක් නෑ. මට තියෙනවා කළ යුතු වැඩ අප්‍රමාණව"

"ඒව ඔක්කොම ජනේලයෙන් එළියට විසිකරන්න ෂර්ලොක්. මේක අපේ මාතෘභූමිය - එංගලන්තයේ ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක්. මේ අහන්න......."

මයික්‍රොෆ්ට්ගේ එම කතන්දරය පහසුවෙන් ඉක්මනින් අවසන් නොවෙන එකක් බැව් මම තේරුම් ගතිමි. එහි ඇති රහස්‍යභාවය නිසා එය තම මලණුවනට රහසිගතව පැවසීමට, මයික්‍රොෆ්ට්ගේ කැමැත්තක් තිබෙන්නටත් ඇත. එබැවින් මම එතැනින් ඉවතට ගියෙමි.

පසුවදා උදැසන තේ බොමින් සිටියදීවත්, මයික්‍රොෆ්ට් පැමිණි කාරණය ගැන මගේ මිත්‍රයා මට සඳහනක් නොකෙළේය. සුපුරුදු ලෙස උදැසන පුවත්පත් කියවමින් සිටි ඔහු එක්වරම මා ඇමතුවේය.

"මං ඔබට ඊයෙ හවස කිව්ව නේද, ඊජිප්තු පුරාවිද්‍යාඥයන් දෙන්නෙක් හමුවීමට මං කැමැත්තෙන් ඉන්නවා කියල?"

"ඔව්. නමුත් ඔවුන්ගේ නම් ඔබ මට කිව්වෙ නෑ"

"මං හමුවෙන්න හිටි එක්කෙනෙක් මහාචාර්ය ෆ්ලින්ඩර්ස් පෙට්‍රි, දැන් ඉතින් අපට ඔහු හමුවෙන්න ඉඩක් ලැබෙන්නෙ නෑ වොට්සන්"

"ඒ ඇයි?"

"ඔහු යළිත් වරක් කැණීම් කටයුතු සඳහා ඊජිප්තුව බලා යන්න නැව් නැගලා"

"හැබෑට? එහෙනම් ඔබට සෑහෙන කාලයක් බලා ඉන්න සිදුවේවි."

"ඔව්. මෙවර ඔහු තවත් රජ කෙනෙකුගේ සොහොන් බිමක කැණීම සඳහායි ගිහින් තියෙන්නෙ. ආපහු එන්න කොයිතරම් කාලයක් ගතවේද කියල, කාටවත් කියන්න බෑ. ඔබේ මිත්‍රයා මේජර් ඕබ්‍රයන්ගේ කතාව මගේ හිතේ ඇති කළේ ලොකු කුතුහලයක්. මං කැමතියි මේ ගැන මං හමුවීමට බලාපොරොත්තුවෙන් සිටි අනික් පුද්ගලයා හමුවෙන්න"

"ඔහු කවුද?"

"ඔහු නොවෙයි ඇය. ඒ පුරාවිද්‍යාඥවරියක්. ඇය තමයි අමෙලියා එඩ්වඩ්ස්. මෑතකදී ඇරඹූ ඊජිප්තු පුරාවිද්‍යා ගවේෂණ අරමුදලේ ලේකම්වරිය"

"හෝම්ස්. ඇය නේද අර තවත් මිතුරියක් එක්ක බෝට්ටුවකින් නයිල් ගඟේ හැතැක්ම දහසක් යාත්‍රා කළ කාන්තාව?"

"හරියට හරි! එහෙනම් ඔබත් ඇය ගැන දන්නවා?"

"මං ඇය ලියූ පොත කියෙව්වා" මම කීවෙමි.

"විශිෂ්ටයි වොට්සන්. ඔබ දන්නවාද ඇය ස්වෝත්සාහයෙන් ඊජිප්තු පුරාවිද්‍යාව උගත් තැනැත්තියක්. ඇය හමුවෙන්න හැකි කොහේද කියල මං හොයා බැලුවා. සතියේ දිනවල සවස් වරුවෙදි ඇය බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට පැමිණෙන බව මට දැනගන්න ලැබුණා. අපි යමු ඇය හමුවෙන්න"

එදා සවස් වරුවේ කුලීරියක නැගී අපි කෞතුකාගාරය බලා පිටත්ව ගියෙමු. මැරිල්බෝන් පාර දිගේ ගොස්, යූස්ටන් පාරට වැටුණු රිය, ගවර් වීදියට හැරී කෞතුකාගාරය පිහිටි බ්ලූම්ස්බෙරි වෙත ළඟා විය.

පුරාවිද්‍යා අංශයේ සහකාර නිලධරයකු වූ ෂෙලී මහතා, හෝම්ස් හොඳින් දැන හැඳින සිටි අයෙකි. පුරාවිද්‍යාඥවරිය හමුවීම සඳහා හෝම්ස් ඇය වෙත ලිපියක් එව්වේ ෂෙලී මහතා හරහාය.

"මං ඇයට කිව්වා ඔබ ගැන" ෂෙලී මහතා කීය. "එඩ්වඩ්ස් මෙනෙවිය එකඟවුණා, හමුවීමට අවස්ථාවක් ඔබට ලබාදෙන්න"

"ඊජිප්තු පුරාවිද්‍යා අංශය" නමින් විශාල නාම පුවරුවක් සවිකර තිබූ අංශයේ කාමරයකට, ෂෙලී අප කැඳවාගෙන ගියේය. ප්‍රබල අණ්වීක්ෂයක් ආධාරයෙන් යම් කිසිවක් පරීක්ෂා කරමින් සිටි කාන්තාව එය නවත්වා අප දෙස බැලුවාය.

"මේ තමයි ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මං කියූ අර විශේෂඥ අපරාධ පරීක්ෂකයා. මේ ඔහුගේ සහකරු දොස්තර වොට්සන්" ෂෙලී අප හඳුන්වා දුන්නේය.

"ඔබ දෙදෙනා පැමිණියේ ෆර්ගසන් සාමිගේ ඉල්ලීමක් අනුවද? තම නියෝජිතයකු එවන බව ෆර්ගසන් සාමි මට ලියුමකින් දන්වා තිබුණා"

"අප පැමිණියේ නම් කාගේවත් ඉල්ලීමකට නොවෙයි. අපේ පැමිණීම ඔබේ කටයුතුවලට බාධාවක් නම්, ඒ ගැන අප සමාව අයදිනවා එඩ්වඩ්ස් මෙනෙවිය" හෝම්ස් කීය.

අවුරුදු පනහක් පමණ වයස් වූ, එහෙත් සිහින් සිරුරක් හා රූමත් මුහුණක් තිබූ එඩ්වඩ්ස් මෙනෙවිය, අප වෙත දැක්වූයේ නිරහංකාර සිනාවකි.

"සැකයක් නෑ. එහෙම නම් ඔබ පැමිණෙන්න ඇත්තේ කුමක් හෝ වැදගත් පරීක්ෂණයකට අදාළ විමසීමකට වෙන්න ඇති?" ඇය කීවාය. "එහෙම කෙනෙකුට උදව් කරන්න ලැබීම සතුටක්. කියන්න මහත්මයා. මොකක්ද ඔබට ඇතිවෙලා තිබෙන ප්‍රශ්නේ?"

"ආචාර්යතුමියනි" හෝම්ස් කීය. "ෆර්ගසන් - විලියම්ස් කණ්ඩායම ඊජිප්තුවේ කළ කැණීම් වලින් පසු, ඔවුන් මුහුණදුන් ඛේදජනක සිදුවීම් ගැන ඔබට අහන්න ලැබෙන්න ඇති. මං එයින් අදහස් කළේ, දෝනාවක් කඩාවැටීමෙන් සිදුවුණු සේවකයෙකුගේ මරණය, රූපාක්ෂර කියවීමට සහය වූ පුරාවිද්‍යා සහකරුවෙකු අද්භූත උණ රෝගයකට ගොදුරු වී ඉක්මනින් මියයාම, පුරාවස්තු ප්‍රවාහණය කළ නෞකාව කුණාටුවකට අසුවී මුහුදේ ගිලී යාම, සහකාර කථිකාචාර්ය වරයෙකු එංගලන්තයට පැමිණි පසු දුම්රිය අනතුරකට ගොදුරු වී මිය යාම, මහාචාර්ය විලියම්ස් හොරුන්ගේ ප්‍රහාරයකට ලක් වී මිය යාම සහ මේජර් ඕබ්‍රයන් නම් තවත් සහකරුවෙකුගේ හිස මතට පුදුමාකාර අයුරින් උළුකැට වැටී තුවාල සිදුවීම. බොහෝ දෙනෙකු විශ්වාස කරන්නේ මේ සිදුවීම් ෆේරෝවරුන්ගේ ශාපයක ප්‍රතිඵලයක් ලෙස සිදුවුණා කියලයි. ඒ ගැන ඔබතුමියගේ අදහස මොකක්ද?"

"හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "බොහොම දෙනෙක් ඔය ශාපයක් ගැන කතා විශ්වාස කරන බව මං දන්නවා. ඒකෙ පුදුමයක් නෑ. මට පුදුම ඔබ වගේ බුද්ධිමත්, විශේෂඥ රහස් පරීක්ෂයෙකුත් මෙවැනි මිථ්‍යා කථා විශ්වාස කිරීම ගැන. මං ඔබට කෙටියෙන් කියන්නම්. ඔය හැම එකක්ම සරල ඒ වගේම අහඹු සිදුවීම්. ඔවායින් එකක් ඇරෙන්න, අනික් හැම එකක්ම මීට පෙර නැවත නැවතත් වුණු අහඹු සිදුවීම්"

"මීට පෙර නොවුණු සිදුවීම ලෙස ඔබ හඳුන්වන්නේ මොකක්ද?"

"එය තමා අර මහාචාර්ය විලියම්ස් එංගලන්තයේදී හොරුන්ගේ ප්‍රහාරයකට ලක්වීම. සොහොන්වල කැණීම් කර, වටිනා මුතුමැණික් රත්රන් සොයාගත් බව ආරංචි වුණාම, ඒවා මංකොල්ලකෑම ප්‍රහාර එල්ල කිරීම, ඊජිප්තුවෙදි සිදුවුණා නම් ඒක පුදුමයක් නොවෙයි. ඒ මොකද එහේ ඒවටම සූදානම් වුණු හොර කල්ලි ඉන්නවා. නවීන ආයුධවලින් සන්නද්ධවුණු මේ හොරු බොහොම දෙනෙක්, ඊජිප්තුවෙන් සහ ඒ අවට අරාබි රටවලින් බිහිවුණු, මිනීමරු අරාබිකාරයො. යුරෝපයේ උපත ලැබූ සුදු ජාතිකයනුත් මොවුන් අතර නැතිවා නොවෙයි.

නමුත් මේ වගේ අපරාධයක් මීට පෙර කවදාවත් එංගලන්තයේදී සිදුවුණේ නෑ. දැන් ඒකත් පටන් අරගෙන වගෙයි. ඔය වගේ ප්‍රහාරයක් ෆර්ගසන් සාමිට එල්ල වුණා නම්, මං එච්චර පුදුමවෙන්නෙ නෑ. ඒ මොකද මේ ගවේෂණයට මුදල් යෙදෙව්වෙ ඔහු. සොයාගත් ඒව විකුණල විශාල මුදලක් උපයා ගත්තෙත් ඔහු. මුතු මැණික් රත්රන් තවමත් ඉතිරිව තිබෙනවා නම්, ඒව තිබෙන්නෙත් ඔහු ළඟ. හෝම්ස් මහත්මයා. පුරාවිද්‍යාඥයන් වන අප ළඟ අන්තිමට ඉතිරි වෙන්නෙ මොනවද? රූපාක්ෂර ලියූ බදාම කැබලි, මිනී ඇටකටු; එවැනි දේ මිස රත්රන් සහ මුතුමැණික් නොවෙයි."

"එහෙම නම් කවදාවත් නොවුණු විධියට මහාචාර්යතුමාට, සරසවි උද්‍යානයේදී ප්‍රහාරයක් එල්ල වුණේ ඇයි?"

"මහා ධන නිධානයක් හමුවුණු ආරංචිය පුවත්පත් මගින් ලෝකය පුරා පැතිරුණා" ඇය කීවාය. "ඇමරිකාවේ හා ප්‍රංශයේ පුරාවිද්‍යාඥයන්, කෞතුකාගාරවලින්, සහ පෞද්ගලිකව රුසියාවෙන්, මේව මිලට ගන්න ධනවතුන් එංගලන්තයට ඇවිත් ෆර්ගසන් සාමි සමග සාකච්ඡා කළ බවත් ආරංචි වුණා. ඒ කියන්නේ විශාල ධනස්කන්ධයක් ඔවුන් වෙත ඇදී එන බව රහසක් නොවෙයි. එතකොට හොරුන් හිතන්න ඇත්තේ මොකක්ද? විශ්ව විද්‍යාලයේ පර්යේෂණාගාරයට වෙලා, පර්යේෂණ කරලා රෑ ගෙදර යන මහාචාර්යතුමාගෙ සාක්කුත්, රත්තරන් පවුම් සහ මුතුමැණික් වලින් පිරිලා ඇති කියලයි."

"නමුත් අපට දැනගන්න ලැබුණා" හෝම්ස් කීය. "ඔවුන් පිවිසුණු සොහොන් ගැබේ බිත්තිවල දීර්ඝ ශාපයක් කොටා තිබුණු බව......"

"....... එහෙම ශාපයක් ඔවුනට දකින්න නො ලැබුණා නම් තමයි පුදුමෙ. සොහොන් භාරන අයට කරන ශාප කිරීම් ඉතා දීර්ඝව, හැම සොහොන් ගැබකම දකින්න ලැබෙනවා. රූපාක්ෂරවලින් තිබුණු නිසා මුල් කාලවල. කැණීම් කළ අයට ඒවා කියවා ගන්න බැරිවුණා"

"ආචාර්යතුමියනි. එතකොට අනෙක් මරණ ගැන ඔබේ අදහස මොකක්ද?" හෝම්ස් විමසුවේය.

"පොළොවේ හැරූ උමං මාර්ග - දෝනාවල කඩා වැටීම, ඒ නිසා සිදුවන මරණ, ඊජිප්තුවේ අලුත් දේවල් නෙමෙයි. ඒ මොකද කාන්තාරයේ පොළොවේ අඩි ගණනක් යටට යනතුරු තිබෙන්නේ වැලි මිශ්‍ර පසක්. බොහොම දෙනෙක් ඒ ගැන සැලකිලිමත් වෙන්නෙ නෑ"

"එතකොට හැරී රේමන්ඩ් තරුණයා උණ රෝගයකට ගොදුරු වී ඉක්මනින් මරණයට පත්වීම?"

"පුරාවිද්‍යාත්මක වැදගත් කමක් ඇති තැන් හැම එකක්ම තිබෙන්නේ නයිල් ගඟ අවට" එඩ්වඩ්ස් මෙනෙවිය කීවාය.

"මම නයිල් ගඟ දිගේ හැතැක්ම දහස් ගණනක් යාත්‍රා කළා. ගඟ දෙපස ඇති වගුරු බිම් අනන්තයි අප්‍රමාණයි. ඊට අමතරව ගංවතුර නිසා ජලය රැඳෙන තැන්. මේ ප්‍රදේශවල මදුරුවන් සහ අනික් කෘමීන් මොන තරමක් ගැවසෙනවාද කියා ඔබට හිතන්න පුළුවන්ද? උන් නිසා හැදෙන ලෙඩ රෝගම ඇති සිය ගණනක්. මට මතකයි ළඟදී අපේ කීට විද්‍යාඥයකු කියා තිබුණු දෙයක්. ලෝකයේ වෙන කොහෙන්වත් හමු නොවුණු, ලෙඩ රෝග පතුරුවන මදුරුවර්ග කීපයක් ඊජිප්තුවෙන් හමුවුණාලු. ඒ නිසා මාරාන්තික ලෙඩ රෝග පතුරුවන, "ඊජිප්ටයි" කියන නම ඇති මදුරු වර්ග ගණනාවක් අනාගතයේදී දකින්න ලැබේවිලු"

"එතකොට ඔබ කියන්නේ උණ රෝගයට හේතුව මදුරුවන් දෂ්ට කිරීම කියලද?"

"සහතිකෙන්ම ඔව්" ඇය කීවාය.

"එතකොට පුරාවස්තු රැගත් නෞකාව මධ්‍යධරණී මුහුදේ ගිළුණු එක?"

"හෝම්ස් මහත්මයා. ඔබ වැනි උගත් බුද්ධිමත් කෙනෙකුත් මෙහෙම ප්‍රශ්න අහන එක මට පුදුමයි" ඇය කීවාය. "ලෝකයේ සප්ත මහා සාගරවලම කුණාටුවලට අහුවෙලා නැව් ගිලෙනවා"

"ඔව්. ඔබ කියුවා හරි ආචාර්යතුමියනි." හෝම්ස් කීය. "මේ හැම දෙයක්ම අහඹු සිදුවීම් කියල මගේ හිතේ තිබුණා. ඒ වුණත් ඔබ වැනි පළපුරුදු විද්‍යාඥවරියකගේ, අදහස් දැනගැනීමටයි මට උවමනා වුණේ. ක්‍රිස්තියානිකාරයන් වෙලත් අපේ මිනිස්සු ෆේරෝවරුන්ගේ ශාප වැනි බහුබූත අදහස් විශ්වාස කරන්නෙ ඇයි?"

"ඒව නම් මේ ලේඛක ලේඛිකාවො මිනිසුන්ගේ ඔළුවලට දැමූ බහුබූත" ඇය කීවාය. "ජේන් ලූඩන් වෙබ් නමින් බිහිසුණු කතා ලියන ලේඛිකාවක් හිටියා. ඊජිප්තු මමී වටා එතූ රෙදි පටි ඉවත් කිරීමෙ සංදර්ශනයක් 1821 දී පිකැඩලියේ පැවැත්වුණා. ඒක බලාගෙන හිටි ඇය ලිව්වා "මමීයේ ශාපය" කියල විද්‍යා ප්‍රබන්ධයක්. එදා ඉඳල තමයි මිනිස්සු ඊජිප්තු සොහොන් ගැබ්වල ශාපයක් ගැන කතාකරන්න පටන් ගත්තෙ. ඇමරිකාවෙ හිටිය තේ ඔළුව නරක්වුණු මිනිහෙක් එඩ්ගා ඇලන් පෝ කියල?"

"ඉතාම ශ්‍රේෂ්ඨ ලේඛකයෙක්!" මම කීවෙමි.

"ශ්‍රේෂ්ඨ කම කොහොම වෙතත් එයාගෙ හොල්මන් අවතාර කතාවලින් වුණේ මොකක්ද?"

මම පිළිතුරක් නොදුන්නෙමි.

"බාගෙට බයවෙලා, බාගෙට මොළේ නරක්වෙලා ඉඳපු මිනිස්සුන් ගෙ මොළ, සම්පූර්ණයෙන්ම නරක්වුණා. ඔවුන් හොඳටම හයවුණා!"

"ආචාර්යතුමියනි ඔබ කියන්නේ ශාපය ආදී හැමදෙයක්ම මිනිසුන්ගේ හිත්වල මවා ගත්තු බහුබූත කියලයි?"

"සම්පූර්ණ සත්‍යය නම් ඒකයි හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "මහාචාර්ය මොරිස් විලියම්ස් අවාසනාවන්ත ලෙස ඝාතනය වුණා නේ. මේක ගැන පුවත්පතකට විශේෂාංග ලිපියක් ලියූ පත්තර කාරයෙක්, සම්මුඛ සාකච්ඡාවක් පවත්වා තිබුණා. කවුරු සමගද? මේ ඊජිප්තු කැණීමට මුදල් යෙදවූ ෆර්ගසන් සාමිගෙ ඥාති පුත්‍රයා සමග. ඔබ කිව්වා වගේ සොහොන් ගැබ ඇතුළත කොටා තිබූ ශාපය ගැන සම්පූර්ණ තොරතුරු, ඔහු පුවත්පත් වාර්තාකරුට කියල තිබුණා. ඔවුනට මේ වගේ සුළු දෙයක් ඇති, පත්තරවල පිටු පුරවලා ජනතාවගේ ඔළු අවුල් කරන්න. ඊළඟට මාස ගණනක් ඔවුන්ගේ පත්තර විකුණාගන්න"

"ආචාර්යතුමියනි. ඔබ කලින් මගෙන් ඇහුවානේ මාත් දොස්තර වොට්සනුත් ආවෙ, ෆර්ගසන් සාමිගේ නියෝජිතයන් හැටියටද කියල? ඇයි ඔබ එහෙම ඇහුවෙ?" හෝම්ස් විමසුවේය.

"මං එහෙම ඇහුවෙ මේකයි" විද්‍යාඥවරිය කීවාය. "බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඊජිප්තු පුරාවිද්‍යා අංශය, බොහොම අංග සම්පූර්ණ, සරු සාර එකක් කරන්න, අපි ලොකු කැපවීමකින් විශාල උත්සාහයක් දරනවා. ඒ වෙනුවෙන් මහාචාර්ය ෆ්ලින්ඩර්ස් පෙට්‍රීත් මමත් ගියා, මේ පුද්ගලයත් හම්බ වෙන්න. කවුද කිව්වොත් ෆර්ගසන් සාමි සහ ආචාර්ය ඩික් ෆර්ගසන්. අපි ඔවුන්ට කිව්වේ මේ ගවේෂණයෙන් ඔවුන් ලැබූ ප්‍රතිඵල, මුළු ලෝකය සමගම බෙදා හදාගන්න; ඔවුන් සොයාගත් දේවල් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට පරිත්‍යාග කරන්න. නැත්නම් සාධාරණ මුදලකට අපට විකිණීමට හිතා බලන්න කියලා. ඒවා ඇමරිකානු ධන කුවේරයන්ට විකුණා ලබනා ලාභය ගැන හිතන්න එපා; ඔහු ඒවා අපට පරිත්‍යාග කළොත්, කෞතුකාගාරයේ එක් අංගනයක්ම ඔහු වෙනුවෙන් නම් කරන බව මං කිව්වා. ඔහු ඒ ගැන වැඩිදුර කල්පනා කර බලන්න පොරොන්දු වුණා.

ඔහුගේ නිවසෙන් අපි පිටත්වී ආවෙ බොහොම සතුටෙන්. දවස් දෙකකින් අපට ෆර්ගසන් සාමිගෙන් ලිපියක් ලැබුණා. ඔහුගේ නමින් - ඩග්ලස් ෆර්ගසන් සාමි නමින් අංගනයක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පිහිටුවීමට අප කළ යෝජනාවට ඔහු කැමති බවත්, ඒ ගැන වැඩිදුර සාකච්ඡා කර ගැනීමට තම නීතිඥයා වන සර් ජේම්ස් කිංස්බරි එවන බවත් කියා තිබුණා. ඉතින් දෙදෙනෙක් ආව බව මගේ ලිපිකරු කීවාම මං මුලින් හිතුවේ ඔබ ආවෙ ෆර්ගසන් සාමි වෙනුවෙන් කියලා."

"ශ්‍රේෂ්ඨ කාන්තාවක්" හෝම්ස් කීවේ ඇයට ස්තුති කොට අප කෞතුකාගාරයෙන් පිටවී එද්දීය. ග්‍රේට් රසල් වීදිය හරහා පැමිණි අපි කුලීරියක නැගී බේකර් වීදියට පැමිණියෙමු.

පහුවදා උදේ වරුවේම පැවැතියේ දැඩි ශීතලක් හා ඝන මීදුමකි. මගේ මිත්‍රයා නොඉවසිල්ලෙන් බලා සිටියේ බැහැර යාමට බලාපොරොත්තුවෙන් බැව් මම දැන සිටියෙමි. උදේ අහරින් පසු හැඳ පැලඳ ගෙන පයිප්පය මුවේ ගසාගත් හෝම්ස්, විසිත්ත කාමරය තුළ ඉහළ පහළ සක්මන් කළේය. කිහිප විටක්ම ජනේලයෙන් ඉවත බැලූ ඔහු තමාටම යමක් කියා ගත්තේය.

ඝන මීදුම නිසා සෙමින් ආ අශ්ව කරත්තයක් අපේ නිවස ඉදිරිපිට නැවැත්වූ හඬ අසන්නට ලැබිණ. එහි පැමිණි අමුත්තා අපේ සීනුව නාද කොට නිවස තුළට පිවිසි හඬත්, ඔහු හඬසන්

මහත්මියට යමක් කියා උඩුමහලට නැඟුණු ශබ්දයත් ඇසිණි. මේ නම් ස්කොට්ලන්ඩ්යාඩ්හි අපේ මිත්‍රයෙකු විය යුතු යයි මම අනුමාන කළෙමි.

මගේ ඒ සිතිවිල්ල නිවැරදි විය. "සුභ උදෑසනක් හෝම්ස් මහත්මයා" කියමින් දොරෙන් ඇතුළුවූයේ ස්කොට්ලන්ඩ්යාඩ්හි පොලිස් පරීක්ෂක ඇතල්නි ජෝන්ස්ය.

"මේ විධියට උදේ පාන්දරම ඔබට කරදර කරන්න සිදුවීම ගැන කණගාටුයි" ඔහු කීවේ හෝම්ස්ගේ සංඥාව අනුව අසුනක හිඳ ගනිමිනි. "ඔබට අහන්න ලැබුණා නේද කේම්බ්‍රිජ් සරසවියේ මහාචාර්ය මොරිස් විලියම්ස්ගේ ඝාතනය ගැන? මං කොයිතරමක් මහන්සි වුණාද. ඒත් කිසිම හෝඩුවාවක් නෑ."

"මේ පරීක්ෂණය ඔබට භාරවුණු බවට මට අහන්න ලැබුණා" හෝම්ස් කීය. "මං හිතුවා මේ වෙනකොටත් ඔබ ඒක පහසුවෙන්ම විසඳල ඇති කියලා"

"මෙක නේ හෝම්ස් මහත්මයා" ජෝන්ස් කීය. "ඔය පැත්තෙ ගැවසුණා පහරදීම් කර මංකොල්ලකෑම් කළ හොර කල්ලි කීපයක්. උන් කිහිප දෙනෙක්ම නිතර හිරේට ආව ගිය තක්කඩි. එයින් හැම කල්ලියකම කීපදෙනෙකු හරි අත් අඩංගුවට ගන්න අපට හැකිවෙලා තියෙනවා. නමුත් උන්ට විරුද්ධව කිසිම හෝඩුවාවක් හොයාගන්න අපට හැකිවෙලා නෑ. තවමත් කීපදෙනෙකු අපට අහුවෙලා නැති බව ඇත්තයි. නමුත් අහුවුණු උන් හැම එකෙකුම කියන්නේ එකම දෙයක්"

"ඒ මොකක්ද?"

"පර්යේෂණාගාරයේ ඉඳල මහරෑ තනියම ගෙදර යන මහාචාර්යවරයෙකුගේ සාක්කුවල, රන්පවුම් තිබේවි කියල හිතන්න තරම් උන් මෝඩ නැතිලු"

"ඉතින් මොකක්ද ඔබේ අදහස?" හෝම්ස් ඇසීය.

"අන්තිමට මට හිතන්න වෙලා තියෙන්නෙත්, පුවත්පත්වල පළවූ අර ශාපයේ කතාව තමා" ජෝන්ස් කීය. "ඒ කියන්නේ මහාචාර්යතුමා ඝාතනය වුණේ කිසිම හේතුවක් නැතිව කියලයි"

"එතකොට මිනීමරුවාත් ඊජිප්තුවෙන් ආව භූතයෙක්ද?" මම ඇසීමි.

"එහෙම දෙයක් නම් මං කොහොමටවත් හිතන්නෙ නෑ" ජෝන්ස් කීය. "අපරාධකරු අපේම මිනිහෙක්. මං ආවෙ ඔහු සොයා ගැනීමට හෝම්ස් මහත්මයාගෙන් උදව් ඉල්ලන්න"

"ජෝන්ස්. මොකක්ද ඔබ මේ ගැන ලබා තියෙන ප්‍රගතිය?"

"ප්‍රගතියක් කියන්න නම් අලුතෙන් හොයා ගත් කිසිම දෙයක් නෑ මහත්මයා. නමුත් මහාචාර්යතුමාට හා සරසවියට අදාළ අයගෙන්, මා සටහන් කරගත් සාක්ෂි තියෙනවා. පියවරෙන් පියවර හැම දෙයක්ම මං ක්‍රමානුකූලව විමසා සටහන් කරගත්තේ, ඔබතුමා කියල දුන් පිළිවෙළට."

මෙසේ කියූ ජෝන්ස් තම කරේ තිබූ කළු පැහැති බෑගයෙන් ඝනකම් ලිපිගොනුවක් එළියට ගත්තේය.

"හෝම්ස් මහත්මයා. ඔබ මේක කියවලා බැලුවොත්, සැක කටයුතු මොකක් හරි තැනක් අල්ලාගන්න, ඔබට බැරි වෙන්නෙ නෑ." මෙසේ කියූ පොලිස් නිලධරයා තම අතේ තිබූ ලිපිගොනුව හෝම්ස් සමීපයේ වූ ටීපෝව මත තැබුවේය.

"කණගාටුයි ජෝන්ස්" හෝම්ස් කීය. "මෙය කියවා බැලීමට මේ මොහොතෙ නම් මට අවකාශයක් නෑ. මං මේ හැඳ පැළඳගෙන ඉන්නේ, වැදගත් පරීක්ෂණ කටයුත්තක් සඳහා එළියට යන්න. මීදුම ඝන වැඩි නිසයි මං පිටත් නොවුණෙ. ඒ කටයුත්තට ගිහින් ආපහු ආව වහාම, ඔබේ ලිපිගොනුවට මං අවධානය යොමු කරන්නම්"

"ස්තුතියි හෝම්ස් මහත්මයා" කී ජෝන්ස් අසුනෙන් නැගිට්ටේය. "මං ආවෙ කුඩා කුලීරියක. ඔබට කැමති නම් ඒකෙ ඔබේ ගමන යන්න පුළුවනි......."

"....... කමක් නෑ ජෝන්ස්. මං එකක් කැඳවා ගන්නම්. මීදුම තව තුනී වන තුරු මං පිටත් වෙන්නෙ නෑ"

හෝම්ස් පිටත් වී ගියේ උදේ නවය හමාරට පමණය. ඔහු ආපසු පැමිණෙන විට දහවල් එකට ළංවී තිබිණ. මම විසිත්ත කාමරයට වී පොතක් කියවමින් සිටියෙමි. ඊට මඳ වේලාවකට පෙර නිකුත් වී තිබූ සවස පුවත්පත් කිහිපයක් ඔහු මගේ උකුළට විසි කළේ මෙසේ කියමිනි.

"මුල පිටුවෙම මේ දැන් ලැබුණු පුවතක් කියා තියෙන කෙටි ප්‍රවෘත්තිය කියවල බලන්න වොට්සන්"

ෆර්ගසන් සාමිගේ ලොකු ඡායාරූපයක් සමග මෙම පුවත ලොකු අකුරෙන් පළ වී තිබිණි.

මමියේ ශාපයේ අලුත්ම ගොදුරද?

කෙන්ටහි විශේෂ වාර්තාකරුගෙනි.

ඊජිප්තුවේ ෆේරෝ රජදරුවන්ගේ 4 වැනි අමෙන් හොතෙප් රජතුමාගේ සොහොන් ගැබ සොයා ගෙන එහි නිදන්ව තිබූ වස්තු සම්භාරය මෙරටට ගෙන ඒමේ ගෞරවය හිමි වන්නේ විලියම්ස් - ෆර්ගසන් ගවේෂණ කණ්ඩායමට බව රහසක් නොවේ. මෙම ගවේෂණයේ මූල්‍ය සැපයුම්කරු වූයේ සුප්‍රකට කෝටිපතියකු වූ ඩග්ලස් ෆර්ගසන් සාමිවරයාය. කෙන්ට් ප්‍රාන්තයේ ෆර්ගසන් පවුලේ පරම්පරාගත මන්දිරයේ ඔහුගේ නිදනකාමරයේ තිබී ෆර්ගසන් සාමිගේ මළ සිරුර ඔහුගේ සේවකයාට අද උදේ හමුවිය.

මෙම ප්‍රදේශය භාර පොලිස් ප්‍රධානියා වූ රෙක්ස් - සිමන්ඩ්ස් මහතා පවසන්නේ මරණය ස්වාභාවික හේතූන් නිසා, එනම් හෘදයාබාධයකින් සිදුවූ බව අනුමාන කරන බවයි. සාමිවරයා සමග මෙම ගවේෂණ කණ්ඩායමේ නායකත්වය දැරූ අනෙක් තැනැත්තා වූයේ පසුගියදා සාහසිකයන් අතින් ඝාතනයට ලක්වූ මහාචාර්ය මොරිස් විලියම්ස් මහතාය. මෙම ගවේෂණ කණ්ඩායමේම තවත් සාමාජිකයෙක් දුම්රිය අනතුරකින් නොබෝදා මිය ගියේය. මෙම අන්දමේ හදිසි මරණ ගැන අසන්නට ලැබෙන විට කෙනෙකුගේ සිහියට නැඟෙන්නේ, සොහොන් ගර්භ භාරා නිදන් වස්තු ගෙනයන්නන්ට එරෙහිව ඊජිප්තු රජවරුන් කර ඇතැයි කියන ශාපය පිළිබඳවයි.

මිය යන විට හැත්තෑ දෙවැනි වියේ පසුවූ ෆර්ගසන් සාමි තරුණ වියේදී පිහිනුම් ක්‍රීඩා මෙන්ම මලල ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පදක්කම් දිනූ ක්‍රීඩකයෙකි. කිසිදා විවාහ නොවූ ෆර්ගසන් සාමි වෙනුවෙන් ශෝකවන්නා ලෙස සිටින්නේ එකම පුද්ගලයෙකු පමණි. ඒ සුප්‍රකට සත්ත්ව විද්‍යාඥයකු වන ආචාර්ය ඩික් ෆර්ගසන්ය."

"ගවේෂණ චාරිකාවට ගිය අයගෙන් අද්භූත අන්දමට මියගියේ එක් අයෙකු පමණක් නම්, ඒක අහඹු සිදුවීමක් කියල අපට අමතක කරන්න තිබුණා" හෝම්ස් කීය. "මං එහෙම කියද්දී අදහස් කළේ, අර දුම්රිය අනතුරට මුහුණ දුන් තරුණයා ගැන. නමුත් දැන් තවත් හදිසි මරණ දෙකක්. ඊට අමතරව මේජර් ඕබ්‍රයන් මුහුණ දුන් හදිසි අනතුර. මෙහෙම තත්ත්වයක් උදාවුණා කියන්නේ," අපි අනිවාර්යයෙන්ම ඒ ගැන ගැඹුරටම සොයා බැලිය යුතුයි.

කෙන්ට් බලා පිටත් වී යන ශීඝ්‍රගාමී දුම්රියක් තියෙනවා තව පැය කාලකින්. ඔබ ඉක්මනින් සූදානම් වුණොත් අපට ඒක අල්ල ගන්න පුළුවන් වේවි. හැන්දෑවේ තුනහමාරට දුම්රිය පොළේදි අප හමුවෙන්න කියලා මං පොලිස් පරීක්ෂක සිමන්ඩ්ස්ට විදුලි පුවතක් යැව්වා.

ස්ටෝක් මොරාන් වෙත ගොස් අප ආපසු පැමිණ ගතවී තිබුණේ සතියකටත් අඩු කාලයකි. අපි යළිත් වරක් වෝටලූ දුම්රියපොළ වෙත පැමිණ ශීඝ්‍රගාමී දුම්රියකට නැගුණෙමු. නියමිත වෙලාවටම දුම්රිය එහි ළඟා වූ අතර, පොලිස් නිලධරයා අප එනතුරු දුම්රියපොළේ බලා සිටියේය.

සුපුරුදු ආගිංසන හුවමාරුවෙන් පසු අප, රෝද හතරේ ලොකු අශ්ව කරත්තයක් වෙත කැඳවාගෙන යන ලදී.

"මං ඔබේ උපදෙස් අනුවම කටයුතු කළා හෝම්ස් මහත්තයා." සිමන්ඩ්ස් කීවේ අප නැංවාගත් රිය පිටත් වෙද්දීමය. "වෛද්‍යවරයා ඇවිත් මරණය සහතික කරන කොට උදේ නවයට විතර ඇති. මළසිරුර ඒ වෙලාවෙම මෘත ශරීරාගාරයට ගෙන ගියා. කාමරය ඇතුළත කිසිවක් එහා මෙහා නොකරන්න අපි පරෙස්සම් වුණා."

"විශිෂ්ටයි සිමන්ඩ්ස්"

ෆර්ගසන් මන්දිරය පිහිටා තිබුණේ, ප්‍රධාන පාරෙන් හැරී හැතැක්ම දෙකක් පමණ ඈතිනි. ඕක් හා සෙඩාර් ගස්වලින් සෙවණ වූ අලංකාර වනෝද්‍යානය මැදින්, අපේ අශ්ව කරත්තය ගමන් කළේය. ෆර්ගසන් මන්දිරය තරමක් පැරණි එකක් වුවත්, එයට මෑතකදී ඉදිකරන ලද නවීන අංගනයක් ද විය. එය ඊජිප්තුවෙන් ගෙන එන ලද ස්ෆින්ක්ස් රූප, දේව ප්‍රතිමා හා චිත්‍ර වලින් අලංකාර කොට තිබිණි. ෆර්ගසන් සාමි තම පාවිච්චිය සඳහා යොදා ගත්තේ මෙම නවීන කොටසේ බිම තට්ටුව බව පසුව අපට දැනගන්නට ලැබිණි. මැඳුරේ ප්‍රධාන ගෘහ සේවකයා යයි සිතිය හැකි මැදිවියේ

පුද්ගලයකු පැමිණ අශ්වරියේ දොර විවෘත කළේය. මගේ මිත්‍රයා කළ විමසීම මුලින්ම එල්ල වූයේ ඔහු වෙතය.

"ඔබේ නම?"

"වුඩ්වඩ් රසල්"

"ෆර්ගසන් සාමිගේ ප්‍රධාන ගෘහ සේවකයා හැටියට, ඔබ වැඩ කරන්නේ කොයිතරම් කාලයක ඉඳලද?"

"අවුරුදු දහයක පමණ කාලයක සිට"

"පහුගිය දින කිහිපයේ ඔහු හිටියේ ටිකක් අසනීපයෙන් වගේද?"

"නැහැ මහත්මයා. හුඟ දවසකින් යන්න බැරිවුණා කියල ගොල්ෆ් ක්‍රීඩා කරන්න යන්න උවමනා බවත් මට කිව්වා. අසනීපයක් තිබුණෙ නෑ"

"මහාචාර්ය මොරිස් විලියම්ස් ගේ ඝාතනය ගැන මොනවද ඔහු කිව්වෙ?"

"මා සමග නම් මොකුත් කිව්වෙ නෑ" රසල් කීය. "ආරංචිය අහන්න ලැබුණු වෙලේ ඔහු හරියට කම්පා වුණා. නීතිඥ මහත්මයා සමගත් ඩික් මහත්මයා සමගත් ඒ ගැන කතාබස් කළා මට ඇහුණා."

"තමනුත් ශාපයක ගොදුරක් වීමට ඉඩ ඇති බව ඔහු කිව්වද?" හෝම්ස් විමසීය. "එවැනි කාරණයක් නිසා ඔහු භයකින් ජීවත්වුණා කියල ඔබට හිතෙනවද?"

"ශාප වගේ දේවල්වලට ඔහු කවදාවත් බය වුණේ නෑ." රසල් කීය. "ඩික් මහත්මයා තමා ඒවාට භයෙන් ඉන්නේ. විද්‍යාඥයෙකු වෙලත් ඔය වගේ බහුබූත විශ්වාස කරන්න තරම් මෝඩද කියා සාමිවරයා ඩික් මහත්මයාට අවඥාවෙන් සිනාසුණා"

"ඔවුන්ගේ ඊජිප්තු චාරිකාවේදී සිදුවුණු මරණ ගැන, ඔහු ඔබ සමග මොනවා හරි කිව්වද?"

"මං ඒ කතන්දර වලට කෙළින්ම සම්බන්ධ වුණේ නැහැ මහත්මයා" රසල් කීය. "නමුත් මේ ගෙදරට ආ කීප දෙනෙකුටම මා සංග්‍රහ කරන අතරේ, එතුමා ඊජිප්තුවෙදි සිදුවුණු මරණ ගැන කිව්වා."

"ඒ ගැන ඔහුගේ අදහස වුණේ මොකක්ද?"

"කැණීම් සඳහා යන යුරෝපීයයන් උණ රෝගයට ගොදුරුවීම සාමාන්‍ය දෙයක් බවයි ඔහු කිව්වේ. මියගිය රේමන්ඩ් මහතාට කලට වේලාවට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට නොහැකිවීම ගැන ඔහු කණගාටු වුණා. ඉක්මනින් රෝහලකට ගෙන යෑමේ පහසුකම

තිබුණා නම් තුවාල ලබා මියගිය ඊජිප්තු සේවකයා පවා බේරාගන්න හැකියාව තිබුණාලු. මින් ඉදිරියට ගවේෂණ කණ්ඩායම් වලට ඉංග්‍රීසි ජාතික වෛද්‍යවරයෙකුත් අනිවාර්යයෙන් ගෙන යා යුතු බව ඔහු කිව්වා"

"රසල් දැන් මට කියන්න" හෝම්ස් කීය. "පසුගිය කාලයේ මෙහේට ආව අමුත්තන් කවුද? ඒ කියන්නේ පහුගිය දින පහ ඇතුළත?"

"ඊයෙ ආවෙ එතුමාගෙ ඥාතිපුත්‍ර ආචාර්ය ඩික් ෆර්ගසන් විතරයි"

"ඔහු ආවෙ කීයටද පිටවී ගියේ කීයටද?"

"ඔහු ආවෙ හවස තුනට විතර. ඊජිප්තුවෙන් ගෙන ආ දේවලින් කොටසක් කෞතුකාගාරයට තෑගි කිරීම ගැනයි කතාබහ කෙරුණේ. මේ ගෙදර ආවම ඩික් මහත්තයා සාමාන්‍යයෙන්, රාත්‍රි ආහාරය අරගෙනයි පිටවෙලා යන්නේ. නමුත් ඊයේ ඩික් මහත්මයාට මේ කිට්ටුව වෙසෙන තවත් විද්‍යාඥයකු හමුවෙන්න තියෙනවා කිව්වා. රෑ වෙන්න කලින් ඔහු හමුවීමට අවශ්‍ය නිසා, එහේ ගිහින් ආයෙ එනවා කිව්වා. තමන් රෑ වීමට ඉඩ තියෙන නිසා තමන් එනතුරු බලා නොඉඳ, රෑ කෑම ගන්න කියලා ෆර්ගසන් සාමිට කිව්වා. ඒ කාරණය මටත් මතක් කළා. තමන් සඳහා කෑම ටිකක් කෑම කාමරයේ තබලා, රෑ වුණොත් අපටත් කෑම කා නින්දට යන්න කිව්වා. එහෙම කියලා ඔහු පිටත්වී ගියා."

"ඒ කීයට විතරද?"

"හැන්දෑවේ හයහමාරට විතර...... නැත්නම් ඊටත් ටිකක් කලින්"

"එතකොට ෆර්ගසන් සාමි රෑ කෑම ගත්තේ තනියමද?"

"ඔව්"

"ඔහු සාමාන්‍ය පරිදි කෑම ගත්තද? ඔහුගේ රෝගී බවක් හෝ ආහාර ගැනීමේ යම් අඩුවක් හෝ වෙනසක් තිබුණද?"

"කිසිම අඩුවක් හෝ වෙනසක් තිබුණෙ නෑ මහත්මයා" රසල් කීය. "සුප්වලින් පටන් අරගෙන අතුරුපසින් අවසන් වන ආකාරයට ඔහු සියලුම කෑම භුක්ති වින්දා. අවසානයේ කෝපි කෝප්පයක් පානය කළා. එතුමා කෑම ගත්තේ රාත්‍රි හතට. තමන් සමග කෑම ගැනීමට නොඉඳ, ඩික් මහත්මයා පිටවී යාම ගැන එතුමා දොස් කිව්වා"

"ඊළඟට නිදාගන්න ඇඳට ගියේ කීයටද?"

"රෑ නවය වෙද්දී නින්දට යාම ඔහුගේ සිරිතක්." රසල් කීය. "නින්දට පෙර ඔහු පොත් කියවනවා. ඒ නිසා හිස දමන පැත්තේ උස් ටීපෝව මත පහනක් දල්වා තැබීම සිරිතක් ලෙස කෙරෙනවා."

"නින්දට පෙර ඔහු පහන නිවා දමනවාද?"

"එතුමා හැමදාමත් වගේ පොත් කියවන්නේ ඇඳේ හාන්සිවෙලා. සමහරදාට ඇඳෙන් නැගිටලා පහන් නිවා දමලා නිදාගන්නවා. සමහරදාට පොත අතේ තිබියදීම එතුමාට නින්ද යනවා. එවැනිදාට පහන නිවා දමන්නෙ මමයි. තවත් සමහරදාට පහනේ තෙල් අවසන් වීම නිසා එය ඉබේම නිවී ගිහින්. ඒක මම දකින්නේ පහුවදා උදේට"

"ඊයේ රාත්‍රි කොහොමද?"

රසල් පිළිතුරු දීමට පටන් ගත්තේ මඳ වේලාවක් කල්පනා කිරීමෙන් පසුවය.

"පුරුදු විදියට ඊයෙත් ඇඳට ගියේ නවයට විතර. ඔහු නින්දට යද්දී සාමාන්‍යයෙන් කාමරයේ දොර අඩවල් කරලයි තියෙන්නේ. නවයහමාර වෙද්දිත් එතුමාට නින්ද ගිහින් තිබුණේ නැහැ. ඇඳෙන් නොබැසම ටීපෝවේ තබා තිබූ පොතක් කියවීම සඳහා ගන්නා හැටි මං දුටුවා."

"රසල් ඔබ ඊට පස්සෙ දුටුවෙ මොනවද?"

"මං මොකක්වත් දුටුවේ නැහැ" රසල් කීය. "වෙනදාට නම් අපි මේ වෙලාවට දොරවල් වහල නින්දට යනවා. නමුත් ඊයේ ඩික් මහත්මයා රෑ කෑමට ඒවි කියන බලාපොරොත්තුව නිසා, මං මඟ බලාගෙනයි හිටියේ. කොයිතරම් වෙලාවක් ඉන්න වේද නොදන්නා නිසා, මං විසිත්ත කාමරයේ පුටුවක හිඳගත්තා. ඒ වෙලාවේ ෆර්ගසන් සාමිගේ නිදන කාමරය තුළින් මට ඇහුණේ ඔහු ගොරවන ශබ්දය"

"අමාරුවෙන් හුස්ම ගැනීමේදී නැගෙන "ගොර - ගොර" ශබ්දයක්ද? නැත්නම් මෙම ශබ්දය වෙනදටත් ඔබ අහල පුරුදුද?"

"මට හොඳට අහල පුරුදුයි මහත්මයා" රසල් කීය. "ඒක වෙනදාටත් එතුමාගෙ කාමරයෙන් ඇහෙන, නින්දෙන් ගොරවන ශබ්දයමයි"

"ඊළඟට මොකක්ද වුණේ?"

"විසිත්ත කාමරයේ අසුනේ මටත් නින්ද ගියා මහත්මයා." රසල් කීය. "ඩික් මහත්තයා ආව අශ්වකරත්තයේ ශබ්දයටයි මට

ඇහැරුණේ. එතකොට මං හිතන්නෙ දහයමාර පහුවෙලා. අපි ඉක්මනින් ඔහුට රාත්‍රි ආහාරය පිළිගැන්නුවා. ඔහු එච්චර කෑවෙ නැහැ. අපි - ඒ කියන්නේ ගෙදර සේවිකාවන් දෙදෙනා සහ මම බඩගින්නේ නිසා, අපට මේසය උඩ තිබූ කෑම ඉවත් කරගෙන ගිහින් කන්න කිව්වා"

"ඔහු ඒ වෙලාවෙම පිටත්වෙලා ගියේ නැද්ද?"

"නැහැ. ඔහු කිව්වා මහප්පා සමග වචන කිහිපයක් කතා කර පිටවී යන බව."

"ඔහු පිටවී යන වෙලාවෙ ඔබ ගිහින් ඉස්සරහ දොරවල් වැහුවෙ නැද්ද?"

"නැහැ මහත්මයා" රසල් කීය. "ඊට බලු කූඩුව විවෘත කරන නිසා අපට සොර සතුරන්ගේ භයක් නෑ. මමත් අනික් අය සමග කුස්සිය පැත්තට වෙලා කෑම කෑවා. ඩික් මහත්මයා පිටත්වෙලා යද්දී ඔහුගේ අශ්ව කරත්තයේ ශබ්දය අපට ඇසුණා. එතකොට මං හිතන්නේ වෙලාව එකොළහමාරට විතර ඇති."

"ඊළඟට ඔබ මොකක්ද කළේ?"

"ඉස්සරහ දොර වසා දමලා මං නින්දට ගියා"

මෙතෙක් වේලා දිගින් දිගටම ප්‍රශ්න අසන ලද්දේ හෝම්ස් විසිනි. මීළඟට පොලිස් පරීක්ෂක රෙක්ස් සිමන්ඩ්ස් ද ප්‍රශ්න කිහිපයක් සේවකයා වෙත යොමු කළේය.

"වෙන කවුද මෙහේට ඇවිත් ගිය අමුත්තො?"

"ඊයෙ නම් වෙන කවුරුවත් ආවෙ නෑ. පෙරේදා ආව නීතිඥ මහත්මයා - සර් ජේම්ස් කිංස්බරි"

"ඔහු හුඟක් වෙලා හිටියද?"

"ඔව්. උදේ නවයට විතර ආ ඔහු ආපහු ගියේ දහවල් කෑමෙනුත් පස්සේ"

"වෙනදාටත් එච්චර වෙලා ඉන්නවද?"

"වෙනදාට ඉක්මනට යනවා" රසල් කීය. "නමුත් පෙරේදා ඔවුන් සාකච්ඡා කළේ ඊජිප්තුවෙන් ගෙන ආ භාණ්ඩ කෞතුකාගාරයට භාරදීම ගැන."

"වෙන කවුද ආවෙ?"

"ඕබ්‍රියන් කියලා හමුදා මේජර් වරයෙක් පෙරේදා හවස ඇවිත් ගියා. එච්චර වෙලා හිටියෙ නෑ. ඊට දින දෙකකට විතර කලින්

කෞතුකාගාර මහත්තයෙකුයි නෝනා කෙනෙකුයි ඇවිත් ගියා. ඔවුන්ගෙ නම කිව්වා. මට දැන් මතක නෑ"

"මහාචාර්ය පෙට්‍රි සහ අමෙලියා එඩ්වඩ්ස් නෝනද?" හෝම්ස් විමසුවේය.

"අන්න හරි. ඒ දෙන්නා තමයි"

"රසල්. දැන් අපට එතුමාගෙ නිදන කාමරය පෙන්වන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

සේවකයා බිම් තට්ටුවේ පිහිටා තිබූ ෆර්ගසන් සාමිගේ නිදන කාමරය වෙත අප කැඳවාගෙන ගියේය. එහි දොර පිහිටා තිබුණේ විසිත්ත කාමරයට විවෘත වන පරිද්දෙනි. සාමිවරයා නිදන වෙලාවට කාමරයේ දොර විවෘතව තබන ආකාරය පෙන්වන මෙන් හෝම්ස් සේවකයා ගෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව එම කරුණ මගේ මිත්‍රයාට දැකගන්නට ලැබිණ.

"මහත්වරුනි, කරුණාකර කොරිඩෝවෙම රැඳී ඉන්නා මෙන් මං ඔබෙන් ඉල්ලා හිටිනවා" හෝම්ස් කීය. "මං නිදන කාමරය පරීක්ෂා කර බලන්නම්."

ඔහු කාමරය තුළ පැය භාගයක් පමණ ගතකොට පසුව අප කැඳෙව්වේය.

"හෝම්ස් මහත්තයා" පොලිස් නිලධරයා කීය. "ඔබ මේ මරණය ගැන පරීක්ෂා කරන්නෙ, ප්‍රශ්න කරන්නෙ, කාමරය සෝදිසි කරන්නෙ, හරියට මිනීමැරුමක් සිදුවුණා කියන්න වගෙයි. ඒ වුණත් ෆර්ගසන් සාමිවරයා මියගියේ හෘදයාබාධයකින්"

"ඒක වෙන්න පුළුවනි" හෝම්ස් කීය. "නමුත් මං මේ බලන්නෙ ඊජිප්තු මමියේ ශාපය, අපට තේරුම් ගන්න බැරි විදියකට ගෙට ඇතුළුවෙලාද කියල.

රසල්. දැන් මට කියන්න, ඔබ දකිද්දී සාමිවරයාගෙ මළ සිරුර තිබුණේ මොන ආකාරයට ද කියල"

"මා දකිද්දී එතුමා සිටියේ බිත්තිය අයිනටම වෙන්න, මුනිං අතට......" රසල් පිළිතුරු දුන්නේය.

"එතුමා මොනවා හරි නිදන්ගත රෝගයකින් පෙළුණද?" හෝම්ස් විමසීය. "මං අදහස් කරන්නේ දීර්ඝ කාලීනව බෙහෙත් ගන්න වෙන රෝග....... ඔය දියවැඩියාව, ඇදුම වගේ, අවුරුද්ද පුරාම පිළිවෙළකට බෙහෙත් ගන්න වෙන රෝග?"

"නැහැ මහත්මයා. මං දන්න තරමින් සෙම්ප්‍රතිශ්‍යාවක් හිස කැක්කුමක් ඇරෙන්න වෙනත් ලෙඩක්, සාමිවරයාට කවදාවත් තිබුණෙ නෑ"

"පවුලේ වෛද්‍යවරයා කවුද? ඔහු අන්තිමට මෙහේ ආවෙ කවදද?"

"පෝල් මැක්මිලන් දොස්තර මහත්මයා තමා අවශ්‍ය වුණු විට ගෙන්වා ගත්තේ" රසල් පිළිතුරු දුන්නේය. "ඔහු අන්තිමට මෙහේ ආව කාලයක් මට මතක් කරන්න අමාරුයි. සාමිවරයා ඊජිප්තුව බලා නැව් නගින්න කලින් නම් මෙහේ ඇවිත් ගියා. ඒ මාස පහකට පමණ කලින්."

"ඒ ආවේ අසනීපයකටද?"

"නැහැ මහත්මයා. ගමනේදී බෙහෙත් වර්ග අවශ්‍යවීමට ඉඩ ඇති නිසා, අපේ මහත්මයා දොස්තර මැක්මිලන්ගෙන් බෙහෙත් වර්ග ඉල්ලා තිබුණා. නැවේදී උවමනාවීමට ඉඩ ඇති බෙහෙත් සහ ඊජිප්තුවේදි උවමනාවීමට ඉඩ ඇති කියලා, බෙහෙත් ඇසිරූ ට්‍රන්ක පෙට්ටියක් ඔහු ගෙන ආවා. මේ තියෙන්නේ ඒ පෙට්ටිය" සේවකයා පෙන්වූයේ තරමක් ලොකු ට්‍රන්ක පෙට්ටියකි.

එතැනට ගිය හෝම්ස් බිම දණ ගසාගෙන එය පරීක්ෂා කළේය. එය ඉබියතුරු වලින් වසා තිබිණ. එහි යතුර සොයාගැනීමට මඳ වේලාවක් ගතවිය.

මෙවැනි ගමනකදී අවශ්‍ය වීමට ඉඩ ඇති ඖෂධ, පෙට්ටිය තුළ ක්‍රමානුකූලව අසුරා තිබිණි. දියර බෙහෙත් බෝතල් තිබූ කුඩා පෙට්ටිවල මෙන්ම, අනෙක් ඖෂධ සමගද, පාවිච්චි කළ යුතු ආකාරය සවිස්තරව ලියා තිබිණ. මීට අමතරව පෙට්ටිය තුළ අඩංගු ඖෂධ, උපකරණ ආදිය ගැන තොරතුරු ඇතුළත් කොට, අත් අකුරෙන් ලියා තිබූ අත්පොතක් ද විය. එහි අවසානයේ වෛද්‍ය පෝල් මැක්මිලන්ගේ අස්සන ද අපි දුටුවෙමු.

"ගමන් ගිහින් ආවට පස්සෙ ෆර්ගසන් සාමි පරීක්ෂා කරන්න, වෛද්‍යවරයා මෙහේ එන්න ඇති?" හෝම්ස් ඇසීය.

"නෑ මහත්මයා" රසල් කීය. "වෛද්‍ය මැක්මිලන්ගේ චිකිත්සාගාරය තියෙන්නේ ඈෂ්ෆර්ඩ් නගරයේ. එහේ ගිහින් වෛද්‍ය පරීක්ෂණයක් කරගත්තා"

වෛද්‍ය පෝල් මැක්මිලන්ගේ එම චිකිත්සාගාරය පිහිටි ස්ථානයේ ලිපිනය හෝම්ස් සටහන් කර ගත්තේය.

"ෆර්ගසන් සාමිගේ හදිසි මරණය ගැන ආචාර්ය ඩික්ට දැනුම් දුන්නද?"

"ඔහුගේ පදිංචිය මීට හැතැක්ම පහළොවක් පමණ දුර හැන්වෙල් ගම්මානයේ" රසල් පිළිතුරු දුන්නේය. "අපි පණිවුඩ කරුවෙකු යැව්වා. නමුත් ඔහුට ඩික් මහත්මයා හමුවෙලා නැහැ. ඔහු අද උදේ පාන්දරින්ම එඩිංබ්‍රෝ වෙත ගිහින්ලු. දින දෙක තුනකට එන එකක් නැහැ කියා සේවකයෙක් කිව්වලු. නමුත් සැකයක් නෑ පුවත්පතෙන් දැනගත්තු වහාම ඔහු ඒවි"

"ෆර්ගසන් සාමි දුම්පානය කළ කෙනෙක්ද?"

"නැහැ මහත්මයා. ඔහු කවදාවත් කිසිම අයුරකින් දුම්පානය කළේ නෑ" සේවකයා කීය. "ඩික් මහත්මයා සුරුට්ටු උරන කෙනෙක්. ඔහු සුරුට්ටු දල්වාගෙන සාමිවරයාගේ කාමරයට එනවාටවත්, එතුමා කැමැතිවුණේ නැහැ."

"ඔබට ස්තුතියි රසල්" හෝම්ස් කීවේ එතැනින් පිටත්වී යාමට සූදානම් වෙමිනි. "තවත් මා දැනගත යුතු දේවල් තිබෙන්න පුළුවනි. එහෙම වුණොත් මං එනවා ඔබ හමුවෙන්න"

සමහර අවස්ථාවන්හි හෝම්ස් කටයුතු කළ ආකාරය, මට කිසිසේත් තේරුම් ගැනීමට නොහැකි විය. මේ බැව් මම මීට පෙරද මගේ වාර්තාවල සඳහන් කර ඇත්තෙමි. පොලිස් නිලධරයා පැවසූ අයුරින් අප ඉදිරියේ ඇත්තේ, හෘදයාබාධයකින් සිදුවූ මරණයකි. එහෙත් මගේ මිත්‍රයා කටයුතු කරන්නේ සැක කටයුතු යමක් දක්නට ලැබුණු විලසිනි. මෙම හදිසි මරණය ඊජිප්තු මමියේ ශාපයේ ප්‍රතිඵලයක් ලෙස, ඔහුටත් ඒත්තු ගොස්ද?

"සිමන්ඩ්ස් මහත්මයා. මළසිරුර පරීක්ෂා කර බලන්න මං සූදානම්." හෝම්ස් කීය.

මළසිරුර ගෙනගොස් තිබුණේ ඈෂ්ෆර්ඩ් රෝහලේ මෘත ශරීරාගාරය වෙතයි. පොලිස් ශල්‍ය වෛද්‍යවරයා වූ සඩ්බරි අප එන තෙක් බලා සිටියේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයාට මළසිරුර පරීක්ෂාකර බලන්න උවමනා වේවි කියලා සිමන්ඩ්ස් කිව්වා" බුද්ධිමත් පෙනුමක් තිබූ තරුණයෙකු වූ සඩ්බරි කීවේය. "ඒ නිසයි අපි පශ්චාත් මරණ පරීක්ෂණය මේ වෙලාවට දා ගත්තෙ"

"ඒ ගැන ඔබට ස්තුතියි දොස්තර මහත්මයා." හෝම්ස් කීය. "ඔබේ වැඩ පටන්ගන්න කලින් අපට මිනිත්තු දහයක් දෙන්න. මේ

මගේ සහායකයා දොස්තර ජෝන් වොට්සන්. ඔහුත් ඔබ වගේම වෛද්‍ය වෘත්තියේ නියැළී සිටින කෙනෙක්"

ෆර්ගසන් සාමිවරයාගේ මෘත ශරීරය කිරිගරුඬ ලෑල්ලක් මත තබා සුදු රෙද්දකින් වසා තිබිණි. මෘත ශරීරාගාරයට හෝම්ස් සමග පිවිසියේ මා පමණක් වීම, මගේ මිත්‍රයාට පහසුවක් වූ බැව් පෙනිණ.

"අපට තියෙන්නෙ මිනිත්තු දහයයි; වැඩිම වුණොත් පහළොවයි වොට්සන්. මං කැමතියි මෘතශරීරයේ බාහිර පෙනුම සූක්ෂම පරීක්ෂාවකට ලක් කරන්න. ඔය දොර වහල දාන්න"

තම කබා සාක්කුවෙන් ප්‍රබල උත්තල කාචයක් අතට ගත් ඔහු මළසිරුර, කේශාන්තයේ සිට පාදාන්තය දක්වා පරීක්ෂා කිරීමට පටන් ගත්තේය. උඩුබැලි අතට තිබූ මළසිරුරේ තමාට දක්නට ලැබූ කරුණු කිහිපයක්, ඔහු සටහන් කර ගත්තේය. මීළඟට එය මුනින් අතට හරවා යළි පරීක්ෂාවට ලක් කළේය. මෙවර ඔහු වැඩි අවධානයක් යොමු කළේ, මළසිරුරේ හිසේ පිටුපස කේෂ රේඛාව අවසන් වී බෙල්ල ඇරඹෙන තැන වෙතය.

"මෙතැන නිල්පාටට හැරුණු තරමක් ලොකු පදාසයක් තිබෙනවා" හෝම්ස් කීය. "ඒ ගැන මොකක්ද ඔබේ අදහස?"

"ඇයි හෝම්ස් මෘත ශරීරයක් පැය කිහිපයක් උඩුබැලි අතට තිබුණාම, මේ වගේ වර්ණයේ වෙනස්කම් දක්නට ලැබීම සාමාන්‍ය දෙයක් නේ" මම කීවෙමි. "මේ බලන්න අත්වල යට පැත්තේ කලවාවල යට පැත්තේ, තට්ටම්වල සහ පිටේ දෙපැත්තේ, ඒ විධියේ පාට වෙනස්වීම් දක්නට ලැබෙනවා. අපි ඒවට කියන්නේ "පශ්චාත් මරණ වෙනස්වීම්" කියල නේ"

"ඔබ කියන දේ හරි වොට්සන්. නමුත් බෙල්ලේ තිබෙන පාට වෙනස්වීමට සමානද, තට්ටම්වල සහ පිටේ තිබෙන පාට වෙනස්වීම්?"

"මං දන්නෙ නෑ ඔබට මෙතැන සියුම් වෙනසක් පෙනෙනවද කියල" මම කීවෙමි. "මට නම් එහෙමකට වෙනසක් පෙනෙන්නෙ නෑ. ඒ විධියෙ වෙනසක් වෙන්න හේතුවකුත් නෑ. එහෙම නේද?"

ඊට කිසිවක් නොකියූ හෝම්ස් බෙල්ලේ පිටුපස හා කේශ රේඛාව පෙදෙස වඩාත් හොඳින් පරීක්ෂා කිරීමට පටන් ගත්තේය. ඔහු මෘත ශරීරාගාරයේ කවුළු ආවරණය කර තිබූ ජනෙල් රෙදි පැත්තකට ඇද දැමුවේ ඇතුළට දීප්තිමත් ආලෝකයක් ලැබෙන

පරිද්දෙනි. බැසයන හිරුගේ තඹ පැහැති ආලෝක ධාරා මළසිරුර මතටම වැටිණි. එහි බෙල්ල සමීපයටම තම කාචය ළං කළ ඔහු එම පරීක්ෂාව සඳහා මිනිත්තු කිහිපයක්ම ගත කළේය. අන්තිමේදී ඔහුගේ මුවෙන් නිකුත් වූයේ සිවුරුහන් හඬකි. ඒ සමගම හෝම්ස්ගේ පරීක්ෂාව අවසන් විය.

අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා වෛද්‍යවරයා, පොලිස් නිලධරයා ඇතුළු පිරිස කැඳවනු ලැබිණ. ඔවුහු පැය භාගයකට වැඩි කාලයක් තම රාජකාරිය සඳහා ගත කළහ.

"කියන්න තරම් අසාමාන්‍ය යමක් නැහැ කියලයි මට හිතෙන්නේ" වෛද්‍ය සඩබරි කීය. "කොහොම වුණත් මගේ සම්පූර්ණ වාර්තාවේ පිටපතක් මං ඔබට එවන්නම් හෝම්ස් මහත්මයා"

"ඔබට බොහොම ස්තූතියි" හෝම්ස් කීවේ වෛද්‍යවරයාට අතට අත දෙමිනි.

ඇෂ්ෆර්ඩ් හි දුම්රිය පොළෙන් අපි ලන්ඩන් බලා ගමන්ගත් ශීඝ්‍රගාමී දුම්රියකට නැගුණෙමු. උදේ සිට සැන්දෑ වන තුරුම කාර්ය බහුලවීම නිසා මගේ සිරුරට දැනුණේ දැඩි මහන්සියකි. අපේ නිවහනට ගොස් ඇඳට වැටෙන තුරු මා සිටියේ නොඉවසිල්ලෙනි. තම පයිප්පය දල්වා ගත් මගේ මිත්‍රයා වෙහෙසට පත්වූ බවක් නම් මම නුදුටුවෙමි. ඔහු තම නළල පිරිමදිමින් දිගින් දිගටම කල්පනා කළේය. විටෙක තම කබායේ සාක්කුවකට තට්ටු කළේය. ඒ සාක්කුවේ දමාගත් සටහන් පොත හෝ මුදල් පසුම්බිය එහි තිබේදැයි සැක හැර දැනගන්නා විලසිනි. මෙම හදිසි මරණය ගැන අබිරහස් යමක් ඔහුට සොයා ගැනීමට හැකිවී ඇත්ද? ඒ පිළිබඳව හෝම්ස් කථාවට ඇද ගන්නා අරමුණෙන් මම ප්‍රශ්න කිහිපයක් ඇසුවෙමි. එහෙත් මගේ ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු දුන් ඔහු, වැඩිදුර කතා නොකොට මඟ හැරියේය. ඉන්පසු මම නිහඬවීමි.

අපේ දුම්රිය ශීඝ්‍රගාමී එකක් වුවත්, එය අනපේක්ෂිත ලෙස තැන් කිහිපයකදීම ප්‍රමාද විය. දුම්රිය ලන්ඩනයට ළඟා වන විට බොහෝ රෑ බෝවී තිබිණ. රාත්‍රී ආහාරයෙන් පසු හෝම්ස් තම හාන්සි පුටුවට වී යළිත් වරක්, අහස - පොළොව ගැටලන කල්පනාවකට වැටුණේය. විඩාපත්ව සිටි මම ඉක්මනින් නින්දට යෑමට තීරණය කළෙමි.

පසුවදා උදයේ මා අවදිවන විටත් හෝම්ස් බැහැර ගොස් සිටියේය. ෆර්ගසන් සාමිගේ මරණය ඔහුට ගැටලුවක් වී ඇත්තේ ඇයිද යන්න මම කල්පනා කළෙමි. ස්කොට්ලන්ඩ්යාඩ්හි පොලිස් පරීක්ෂක ඇතල්නි ජෝන්ස් පැමිණ, තවත් කටයුත්තක් හෝම්ස්ට භාරදුන් බව මට සිහිවූයේ එවිටයි. එම රාජකාරි සඳහා ඔහු ස්කොට්ලන්ඩ්යාඩ් වෙත යන්නට ඇතැයි මම අනුමාන කළෙමි. ඉන්පසු මවිසින් සම්පූර්ණ කළ යුතුව තිබූ "තිත් සහිත පටිය" කථාන්තරය ලිවීම ඇරඹුවෙමි.

මගේ මිත්‍රයා ආපසු එන විට සවස තුනට ළංවී තිබිණි. පැමිණි වහාම ඔහු කළේ සීනුව නාදකොට කෝපි පෝච්චියක් එවන මෙන් හඩසන් මහත්මියට දන්වා සිටීමයි.

"මගේ හිතවත් වොට්සන්" ඔහු කීය. "උදේ මං අතුරුදන්ව හිටි බව දැකලා, ඔබ පුදුමයට පත්වෙන්න ඇති. මා කළ යුතු වැඩ රාජකාරි හුඟක් තිබුණා. ඊයෙ දවස පුරාම ඔබත් මා සමගම මහන්සි වුණා. ඒකයි මං යන්න කලින් ඔබ අවදි නොකළේ"

"සැකයක් නැහැ ඔබ යන්න ඇති ස්කොට්ලන්ඩ්යාඩ් පැත්තෙ - අර මහාචාර්යතුමාගෙ ඝාතනය ගැන කරුණු එක් රැස් කරන්න?" මම කීවෙමි.

"නැහැ වොට්සන්. මං මුලින්ම ගියේ ලන්ඩන් විශ්ව විද්‍යාලයට"

"ඒ මොකටද?"

"සත්ත්ව විද්‍යාව පිළිබඳ මහාචාර්ය හොප්සන් හමුවෙන්න. මොහොතක් ඉන්න මං කෝපි කෝප්පයක් බීලම ඔබට එය පැහැදිලි කර දෙන්නම්."

කෝපි බී අවසන් කළ හෝම්ස්, තම අත් බෑගයේ වූ කුඩා පැකට්ටුවක් එළියට ගත්තේය. එය විවෘත කොට ඔහු අතට ගත්තේ කුමක්දැයි මම නොඉවසිල්ලෙන් බලා සිටියෙමි.

"වොට්සන් මේ මොකක් කියලද ඔබ හිතන්නෙ?"

"මං හිතුවෙ ඔබ මහා පුදුමාකාර දෙයක් පෙන්වන්න හදනවා කියල" මම කීවෙමි. "ඔක මේ රෝගීනට බෙහෙත් විදින වීදුරු සිරින්ජයක් නෙ"

"ඔව්. වීදුරු සිරින්ජයක, ඖෂධ රඳවා තබන ඉදිරි කොටස සහ එයට අමුණා ඇති ඉඳිකටුව; මේ තියෙන්නේ එහි බිඳීගිය පිස්ටනය සහ එහි කැබැල්ල"

"මොකක්ද ඔකෙ තියෙන වැදගත් කම? කොහේ තිබිලද ඔබට ඔක හම්බවුණේ?"

"ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න කලින් මා කිව යුතුයි" හෝම්ස් කීය. "මේක නිසා ඊයෙ රෑ මට නින්ද ගියේ නෑ"

"ඒ කියන්නේ ඔබ අර ඉස්සර කාලෙ කළා වගේ, සියයට හතේ කොකේන් ද්‍රාවණය වත් ඇඟට විදගත්තද?"

"කොහොමටවත් නෑ වොට්සන්. ඔබේ මොළය තවදුරටත් අවුල් නොකර, මං හැම දෙයක්ම පැහැදිලි කරන්නම්. මං ඔබට කලිනුත් කිව්වා වගේ, ඊජිප්තු බහුබූතය මං කොහොමටවත් විශ්වාස කළේ නෑ. මහාචාර්ය මොරිස් විලියම්ස් ඝාතනය, මේජර් ඕබ්‍රයන්ගේ හිස මතට උළුකැට දමා ඝාතනයට තැත්කිරීම යන සිද්ධීන් දෙක ගැන හිතන්න. ඒවා එකම පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින්, හිතාමතා සැලසුම් කොට කළ ඒවා බව මට අවබෝධ වුණා. නමුත් ඒ මොන අරමුණකින්ද? මේ අසරණ මිනිසුන් ඝාතනය කරන්න කාටද උවමනා? මේක තේරුම් ගැනීමට අමාරුවුණු ප්‍රශ්නයක්.

ඔන්න ඊළඟට ෆර්ගසන් සාමි හෘදයාබාධයකින් නින්දේදීම මියගියා. මට ලැබුණු පළමුවැනි හෝඩුවාව ඒකයි. අවුරුදු හැත්තෑ දෙකක නෙමෙයි; ඊට අඩු වයසේ නිරෝගී ලෙස දිස්වන කෙනෙකු වුණත්, හදිසියේම හෘදයාබාධයකින් මියයන්න පුළුවනි. ඒ ගැන කතා දෙකක් නෑ. ඔබත් වෛද්‍යවරයෙකු ලෙස එහෙම කියාවි. නමුත් වෛද්‍යවරයෙකු නොවන මට හිතුණේ මෙහෙම දෙයක්. ඔහුගේ සේවකයා රසල් කිව්වා, ෆර්ගසන් සාමි කිසිම නිදන්ගත රෝගයකට ප්‍රතිකාර ගත්තෙ නැහැ; ගොල්ෆ් ක්‍රීඩා කිරීමට යන්න හිත හිතා හිටියෙ; කලින්දා රෑ හොඳට ආහාර ගත්තා කියල. මට හැකිවුණා ෆර්ගසන් සාමිගේ පෞද්ගලික වෛද්‍යවරයා සමග දුරකතනයෙන් කථාකරන්න. දින කිහිපයකට කලින් තමන් ඔහු සෝදිසි කරද්දී, ෆර්ගසන් සාමි හොඳ නිරෝගී තත්ත්වයෙන් හිටි බව ඔහු සහතික කළා......."

"........ ඒ වුණත් හෝම්ස්........" මම ඔහුට බාධා කළෙමි.

"........ ඔහොම ඉන්න වොට්සන්. මං දන්නවා ඔබ කියන්න හදන දේ. නමුත් ඔබ කාටවත් ඇතුළට එන්න නොදී, මං තනියම ගිහින් ෆර්ගසන් සාමිගේ නිදන කාමරය පරීක්ෂා කළා ඔබට මතකද? ඒකෙ මතුපිටින් කිසිම හෝඩුවාවක සලකුණක්වත් තිබුණෙ නෑ. යමක් තිබුණා නම් මිනිය ඉවත් කරගෙන යද්දී ඒවාත් මැකී ගිහින්. නමුත් මං අධෛර්යයට පත්වුණේ නෑ.

මං පරීක්ෂා කළා සාමිවරයාගේ ඇඳ යට. මෙන්න මට හමුවුණු දේ. පිස්ටනය බිඳී ගිය මිලිලීටර තුනේ සිරින්ජය, ඉදිකටුවත් සමග. මට මේක හමුවුණේ සාමිවරයාගේ ඇඳේ ඈත කෙළවර - ඒ කියන්නේ, ඇඳ බිත්තියට හේත්තුවුණු පැත්තේ බිම තිබිලා. ඇත්තම කිව්වොත් ඇඳ බිත්තියට හොඳින් හේත්තු වී තිබුණේ නෑ. අතක් දැමීමට අපහසු තරම් හිඩැසක් එතැන තිබුණා. මට මේක දැකගන්න හැකිවුණේ, මං ඒ ඇඳ ඉවතට ඇද්ද නිසා.

ඇඳ යට ගනකම් දූවිලි තට්ටුවකින් වැහිල තිබුණා. දිගු කලකට පෙර එතැනට වැටී තිබුණු පැන්සල් දෙකක්, මකන කෑල්ලක්, කුඩා ඉබියතුරක් සහ කාසියක්, දූවිලිවලින් වැසී තිබී මට හමුවුණා. නමුත් මේක තිබුණේ ඒ දූවිලි තට්ටුවට උඩින්. ඒකෙන් මොකක්ද වොට්සන් ඔබට තේරුම් ගන්න හැකිවෙන්නෙ?"

"ඒවා වැටිල තියෙන්නේ කලකට පෙර. නමුත් මේක වැටිල තියෙන්නෙ මෑතකදීද?"

"විශිෂ්ටයි වොට්සන්. ඔබ නිවැරදියි. මේක මං වහාම කඩදාසියකින් පරෙස්සමින් ඔතාගත්තා. ඉදිකටුවෙන් අනතුරක් නොවෙන්න, එහි තුඩ මට හමුවූ මකන කෑල්ලට ඇතුළු කළා.

මීළඟට මගේ හිතට ආ ප්‍රශ්නය මේකයි. වෛද්‍ය ප්‍රතිකාර නොගත්තා නම්, ඊයෙ පෙරේදා සිරින්ජයක් මේ කාමරයට ආවෙ මොකටද? ෆර්ගසන් සාමි මත්ද්‍රව්‍යයක් ශරීරයට විදගත්තා කියල හිතන්නෙ කොහොමද? ඔහු මත්පැන් පමණක් නොවෙයි දුම්බීමත් පිළිකුල් කළ කෙනෙක්.

ඔබට අමුතුවෙන් කියන්න උවමනා නෑ. ඕනෑම ඖෂධයක් හෝ රසායන ද්‍රව්‍යයක් විදීමට සිරින්ජයක් පාවිච්චි කළාම, එම ඖෂධයේ ස්වල්පයක් වත්, සිරින්ජයේ සහ ඉදිකටුවේ ඉතිරිවෙනවා. සමහරවිට ඒ ප්‍රමාණය මයික්‍රොග්‍රෑම් ගණනක් වෙන්න පුළුවනි. නමුත් එයින් ප්‍රයෝජනයක් ගත හැකියි. එහෙම ගත හැකි වෙන්නෙ එම ඖෂධයේ සාන්ද්‍රණය අනුවයි.

මේක විශ්ලේෂණය කිරීම ඒ පිළිබඳ විශේෂඥයෙකුට භාරදෙන්න මං තීරණය කළා. ඒ නිසයි මං අද උදේම ලන්ඩන් විශ්වවිද්‍යාලයේ, සත්ත්ව විද්‍යා අංශයේ මහාචාර්යතුමා හමුවෙන්න ගියේ. මගේ අවශ්‍යතාවය මං ඔහුට කිව්වා. නමුත් ඔහු මාව යොමුකළේ වෛද්‍ය පර්යේෂකයෙකු වෙත. ඒ තමයි විෂවේදය පිළිබඳ විද්‍යාඥයකු වන ආචාර්ය ඕල්බ්‍රයිට්. මොකක්ද මං ඔහුට ඉදිරිපත් කළ ප්‍රශ්නය? මෙන්න මේකයි.

"ආචාර්ය ඕල්බ්‍රයිට්. මේ සිරින්ජය තුළ යම් කිසි ප්‍රබල විෂක ඉතා ස්වල්පයක් රැඳී තිබෙන්න ඉඩ තියෙනවා. මට උවමනා කරන්නේ ඒ විෂ කුමක්ද, එයින් මනුෂ්‍ය ජීවිතයකට හානි සිදුකරන්න හැකියාවක් තියෙනවාද කියන කරුණ දැනගන්න"

"මහත්මයා. ඒකට සමහරවිට පැය දෙක තුනක පමණ කාලයක් ගතවෙන්න ඉඩ තියෙනවා" ඔහු කිව්වා. "නමුත් ඔබ වාසනාවන්ත නම් පැයකින් වුණත්, අපට පොට අල්ලගන්න හැකිවේවි. කරුණාකර මඳ වේලාවක් එළියෙන් වාඩි වී සිටින්න"

මෙවැනි පර්යේෂණාගාරයක පිළිවෙළ, ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනෙ වොට්සන්. විෂ වර්ග අත්හදා බැලීමට. යොදාගන්නා, නොයෙක් ප්‍රමාණවල මීයන්, ඌරු මීයන්, හාවුන් ආදී සතුන් පිරවූ කූඩුවලින්, පර්යේෂණාගාරය පිරිලා. අනෙක් පැත්තෙත් රසායන ද්‍රව්‍ය සහිත බෝතල් ඇසිරූ රාක්ක. සහකාර කාර්මික විද්‍යාඥයන් පස්දෙනෙකු වහාම කැඳවාගන්න කියලා ඔහු දෙවැනියාට අණ දුන්නා.

මං එළියෙන් වාඩිවෙලා පුවත්පතක් දිග හැර ගත්තා. මට බලාසිටීමට සිදුවුණේ පැයක පමණ කාලයක් පමණයි. ඇතුළට කැඳවීමක් ලැබුණා. මාව යොමු කෙරුණේ ආචාර්ය ඕල්බ්‍රයිට්ගේ කාර්යාලයට. ඔහුගේ මේසය මත තිබුණා ලොකු හා කුඩා වීදුරු දීසි දෙකක්. ලොකු එකේ හාවෙකුගේ හා කුඩා එකේ මීයෙකුගේ මළසිරුරු මට දකින්න ලැබුණා. මට වචනයක් වත් කීමට පෙර, ඔහු ඇඟිල්ල දිගු කළේ ඒ සත්ත්ව මළසිරුරු වෙත. ඊට පස්සෙයි ඔහු කතාව ඇරඹුවේ.

"හෝම්ස් මහත්මයා ඔබ වාසනාවන්තයි. ඉක්මනින් සාර්ථක ප්‍රතිඵල ලබාගන්න අපට හැකිවුණා. ඔබ ගෙනා සිරින්ජයේ තිබුණේ මොනවාද කියා ඔබ දන්නවාද? මෙන්න අපට ලැබුණු ප්‍රතිඵලː

> "මාරාන්තික සර්ප විෂ. ඉන්දියානු කළු නාගයාගේ විෂ වීමට බොහෝ දුරට ඉඩ ඇත. සර්පයාගේ විෂ ග්‍රන්ථිවලින්ම ලබාගත්, තනුක නොකළ උග්‍රවිෂ බැව් පෙනේ."

"ඔබට ස්තුතියි ආචාර්ය ඕල්බ්‍රයිට්" මං කිව්වා. "රසායනික විෂ වර්ග ගැන මං හදාරලා තියෙනවා. නමුත් සර්ප විෂ ගැන මං වැඩිය දන්නේ නෑ. මේක ගැන යමක් කියන්න ඔබට හැකිද?"

"ඔව් මහත්මයා. ඉන්දියානු වර්ගයේ නාගයාගේ තිබෙන්නේ නියුරො ටොක්සිනයක් - එනම් ස්නායු පද්ධතියට බලපාන විෂක්. මේ විෂෙන් මිලි ග්‍රෑම් 20 ක් සිරුරට ඇතුළුවුණොත්, එය ප්‍රමාණවත් වැඩිහිටි කෙනෙකු මිනිත්තු හතරක් තුළ මරණයට පත් කරන්න. මරණය සිදුවන්නේ, ප්‍රාචීරය අප්‍රාණික වී, පෙණහලු හා ඒ නිසා ශ්වසන පද්ධතිය අක්‍රිය වීමෙන්. නාග විෂ මගින් හෘදය වස්තුවේ මාංශ පේශි අක්‍රිය කරන්නත් පුළුවනි."

"එතකොට හෝම්ස් ඔබ කියන්නේ ෆර්ගසන් සාමිගේ මරණය, විෂ යොදා කළ මිනිමැරීමක් කියලද?"

"ඒ ගැන කිසිම සැකයක් නෑ වොට්සන්" හෝම්ස් කීය. "ඔබට මතකද මළසිරුරේ හිසේ පිටුපස කේෂ රේඛාව අසල මං ඇඩි අවධානයකින් පරීක්ෂා කළ හැටි. විෂ නිසා සමේ ඇති වූ වෙනස්කම් සහ ඉදිකටු තුඩ ඇතුළුවුණු තැන මං පැහැදිලිවම දුටුවා"

"එතකොට අපරාධකාරයා ෆර්ගසන් සාමිගේ ඥාති පුත්‍රයා ආචාර්ය ඩික්ද?"

"ඒ ගැනත් කිසිම සැකයක් නෑ" හෝම්ස් කීය. "ෆර්ගසන් සාමි කොහොමටත් විශාල ධනවතෙක්. නමුත් ඊයෙ පෙරේදා ඔහු උපයාගත් ධනය ප්‍රමාණයෙන් විශාල ඇති. එයින් විශාල කොටසක් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට පරිත්‍යාග කරාවි කියන භයෙන් තමා ආචාර්ය ඩික් හිටියේ. මං ඔහු ගැන හුඟක් හොයල බැලුවා වොට්සන්. ඔහු තරුණ කාලයේ ඉගෙනීමට බොහොම දක්ෂකම් දැක්වූ කෙනෙක්. ග්ලාස්ගෝ සරසවියෙන් ඔහු සත්ත්ව විද්‍යාව ගැන විශේෂ උපාධියක් ලබලා තියෙනවා. ඔහුගේ ප්‍රියතම ක්ෂේත්‍රය උරගයින් අධ්‍යයනය. ඔහු ආචාර්ය උපාධිය ලබාගෙන තියෙන්නේ, කිසිම යුරෝපීයයකු නොකළ අන්දමේ පර්යේෂණවල නිරතවීමෙන්. යුරෝපීය සත්ත්ව විද්‍යා සංසදයේ මූලස්ථානයේදී ඔහු පැවැත්වූ දේශන පෙළ, ඉතා ඉහළින් පිළිගැනීමට ලක්වෙලා තියෙනවා. ඒ දේශනවල මාතෘකාව ඔබ දන්නවාද? "ආසියා කලාපයේ විෂඝෝර සර්පයෝ"

"නමුත් ඇයි ඔහු මේ වගේ පහත් තත්ත්වයකට ඇද වැටුණේ?"

"ඔහු සියලු දුශ්චරිතයේ කෙළ පැමිණි අයෙක්. තම පියාගෙන් උරුමවුණු සියලු ධනස්කන්ධයම ඔහු රේස් ඔට්ටු පිටියේ කාබාසිනියා කරලා. දැන් හතර වටේටම ණයයිලු. බැංකු හා

මූල්‍යායතන මගින් ඔහුගේ බංකොලොත් බව රටට ප්‍රකාශ කරන්න කලින් ක්‍රියාත්මක වීමට, ඩික් ෆර්ගසන් තීරණය කළා. ඊජිප්තු පුරාවස්තු හමුවෙන්න කලින් ඉඳන්ම, ඔහු ෆර්ගසන් සාමිට කරදර කරමින් ඉඳල තියෙන්නේ. තම ඥාති පුත්‍රයාගේ පිළිවෙළ දන්නා නිසා, ඔහු නමට තමන්ගේ දේපළ ලියන්න, ෆර්ගසන් සාමිගේ කැමැත්තක් තිබිල නෑ. මට මේ තොරතුරු අද උදේ දැනගන්න ලැබුණේ සාමිවරයාගේ නීතිඥ සර් ජේම්ස් කිංස්බරි ගෙන්"

"මේ ඝාතනය කළේ ආචාර්ය ඩික් කියමු" මම කීවෙමි. "එතකොට අනෙක් ඝාතනය - මහාචාර්ය විලියම්ස් ගේ සිද්ධිය, මගේ මිත්‍ර මේජර් ඕබ්‍රයන්ගේ හිසට තුවාල සිදුකිරීම? ඔබ මොනවද ඒ ගැන කියන්නේ?"

"වොට්සන් මට හොඳටම විශ්වාසයි ඒ දෙකත්, ආචාර්ය ඩික් ගෙම වැඩ කියලා. තමා වෙත කිසිම සැකයක් එල්ල නොවෙන විධියට, මහප්පා ඝාතනය කළ හැකි ක්‍රමය මොකක්ද කියලා, ඔහු කල්පනා කරමින් ඉන්න ඇති. ඊජිප්තුවේදි උමගක් කඩා වැටීමෙන් හා උණ රෝගයෙන් දෙදෙනෙකු මියගියාම, ඒක ඔහුට හොඳ අවස්ථාවක් වුණා. ඊළඟට හයිස්මිත් තරුණයා දුම්රිය අනතුරෙන් මියගිය එකෙන්, ඩික්ගේ සැලසුම් තවත් ශක්තිමත් වෙන්න ඇති. ඔහු අංක එකේ කෛරාටිකයෙක්. ෆේරෝවරුන්ගේ ශාපය ගැන විශාල ප්‍රචාරයක් ලබාදෙන්න පුවත්පත් යොදා ගැනීමට ඔහුට හැකිවුණා."

හෝම්ස්ගේ මෙහෙයීමෙන් ක්‍රියාත්මක වුණු ස්කොට්ලන්ඩියාඩ් පොලීසිය මගින්, ආචාර්ය ඩික් ෆර්ගසන් හිරභාරයට ගන්නා ලදී. කිසිදු විවේකයක් නොගෙන ක්‍රියාශීලී වුණු හෝම්ස්ට මහාචාර්ය විලියම්ස් ඝාතනය පිළිබඳ රහසද හෙළිකර ගැනීමට හැකිවිය. එය ආචාර්ය ඩික්ගෙන් මුදල් ලබාගෙන කුලියට කළ මිනීමැරුමක් බව, ලන්ඩන් පාතාලයෙන් අල්ලාගත් අපරාධකරුවෝ, පාපෝච්චාරණය කළහ. මගේ මිත්‍ර මේජර් ඕබ්‍රයන්ගේ හිසට, වහලක් මත සිට උළුකැට දැමීමද තමන් සිදුකළේ, ආචාර්ය ඩික් දුන් කොන්ත්‍රාත්තුවේ කොටසක් ලෙස බැව් ඒ අපරාධකරුවෝ හෙළි කළහ. කෙටි නඩු විභාගයකින් පසු මරණීය දණ්ඩනයට නියම වූ ආචාර්ය ඩික් ෆර්ගසන් හෙවත් රිචඩ් මර්ෆි ෆර්ගසන් නම් සත්ත්ව විද්‍යාඥයා එක්සිටර්හි පෝරකයේදී අවසන් හුස්ම හෙළුවේය.

දින කිහිපයකට පසු මගේ මිත්‍ර රැල්ෆ් ඕබ්‍රයන් අප සමග රාත්‍රී භෝජනයක් සඳහා බේකර් වීදියට පැමිණියේය. ඒ මවිසින් කරන ලද ඇරයුමක් අනුවය.

"මේජර් ඕබ්‍රයන්" හෝම්ස් කීය. "එදා ඊ සිම්සන්ගේ අවන්හලේදී අහම්බෙන් අපට ඔබ හමුනොවුණා නම් මොකද වෙන්නේ? තමන්ගේ සියලුම අපරාධ මමියේ ශාපයට බැර කරලා, ෆර්ගසන් සාමිගේ මුදලයත් උරුම කරගෙන ආචාර්ය ඩික්ට යෙහෙන් වැජඹෙන්න තිබුණා. එහෙම නේද?"

"සම්පූර්ණ ඇත්ත හෝම්ස් මහත්මයා" රස්ටි කීය. "නමුත් ඔබ කළ සොයාගැනීම් වල මට පැහැදිලි නොවුණු එක් තැනක් තිබුණා."

"ඒ මොකක්ද?"

"ආචාර්ය ඩික් ඔය තරම් පළපුරුදු විද්‍යාඥයෙකු වෙලත්, නොරාටික කෙනෙකු වෙලත්, ෆර්ගසන් සාමිට විෂ එන්නත් කළ සිරින්ජය දාල ගියේ ඇයි?"

"හේතු කීපයක් නිසාම ඒ දේ සිදුවුණා වෙන්න පුළුවන්" හෝම්ස් කීය. "ඔහු විෂ එන්නත් කරද්දී ෆර්ගසන් සාමි ඉන්න ඇත්තේ, අඩ නින්දේ, බිත්තිය අයිනට වී. නාග විෂ ශරීරයට ඇතුළුවෙද්දී ඉතාම දරුණු, බිහිසුණු වේදනාවක් දැනෙන බව එදා ආචාර්ය ඕල්බ්‍රයිට් මා සමග කිව්වා. මේක හොඳින් දැනසිටි ඩික්, සාමිවරයාගේ කටින් මරළතෝනියක් නැගේවි කියන භයට, ඔහුගේ මුව තදින් අවහිර කරගෙන ඉන්න ඇති. සාමිවරයා ඒ වෙලාවෙ මරුවිකල්ලෙන් කළ දැගලීමෙදි, ඩික්ගේ අතින් සිරින්ජය ගිලිහී ගියා. රෝල්වී ගිය එය ඇඳ අයිනේ තිබූ ඉඩෙන්, බිමට - ඒ කියන්නේ ඇඳ යටට වැටුණා. ඔහු මේ දේ කළේ සේවකයා - රසල් කෑමට යවලා. ඔහු කොයි මොහොතේ හෝ ෆර්ගසන් සාමිගේ කාමරයට එන බව ඩික් දැනගෙන හිටියා. ඉතින් ඇඳ යටට ගිය සිරින්ජය ආපහු හොයාගන්න තරම් වෙලාවක් ඩික්ට තිබුණේ නෑ. අනික් කාරණය; ඒක හමුවුණත් තමාව පෝරකයට යවන්න තරම් ප්‍රබල සාක්ෂියක් ඒකෙ සැඟවී තියේවි; කවුරු හරි ඒ බව පෙන්වා දේවි කියල ඔහු කොහොමටවත් හිතන්න නෑ"

රිදී කිණිස්ස

එකල පුවත්පත්වල මුල් පිටුවේ පළවූ මෙම අභිරහස් මිනීමැරුම පිළිබඳව, තවමත් බොහෝ දෙනෙකුට මතක ඇතැයි විශ්වාස කරමි. එහෙත් මෙය නොදන්නා තරුණ පාඨකයන් බොහෝ දෙනෙකු ද සිටිනවා නිසැකය. ඔවුන්ගේ යහපත තකා මෙය ඉදිරිපත් කිරීමට මම තීරණය කළෙමි. මෙම සිදුවීම වූයේ මා විවාහ වීමට පෙර, මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා සමග බේකර් වීදියේ නිවහනේ ගත කළ කාලයේදී බැව් කිවයුතුය.

උණ හා සෙම්ප්‍රතිශ්‍යාවට ගොදුරුව සිටි අපගේ මුළුතැන් ගෙයි සේවිකාවට එදින තම රාජකාරියේ යෙදීමට හැකියාවක් නොතිබිණි. අපේ උදේ ආහාරය පිළියෙල කළේ හඩ්සන් මහත්මියයි. තම රාජකාරි මඳකට අත්හිටවූ ඇය, බේකන් බදිමින් සිටි දිගු හැන්ද ද අතින් ගෙන උඩුමහලට පැමිණියාය.

"හෝම්ස් මහත්මයා. ඔබ හමුවෙන්න මහත්මයෙක් ඇවිත් ඉන්නවා. ඔහු ඉන්නේ ලොකු හදිසියකින්. ඔහු කළ කලබලේට, මට කුස්සියෙ කරමින් සිටි වැඩ අතරමග නතර කරල එන්න වුණා. වහාම ඔබ හමුවෙන්න ඕනලු"

උදෑසන කෝපි පානය කරමින් අපි දෙදෙනා මේසය අසල හිඳගෙන සිටියෙමු. අමුත්තෙකු පිළිගැනීමට අපගේ කිසිදු සූදානමක් හෝ අපේක්ෂාවක් නොවීය. එහෙත් හඩ්සන් මහත්මියගේ කටෙන් වචන පිටවෙද්දී අමුත්තා ද පියගැට පෙළ ඉහළට දිව ආවේය.

"මට සමාවෙන්න මහත්මයා" ඔහු කීය. "මේ ආකාරයෙන් කඩා වැදීම ගැන මට සමාවෙන්න. මේක ලොකු හදිස්සියක්. මං ආවේ ඔබෙන් උදව් බලාපොරොත්තුවෙන්. භයානක මිනීමැරුමක් සිදුවෙලා. ඔබට පුළුවන්ද මා එක්ක එන්න?"

"මොහොතකට මෙහෙත් හිඳගන්න මහත්මයා" හෝම්ස් කීවේ අප සමීපයේ වූ අසුනක් පෙන්වමිනි. "ඔබ කියන්නේ එම පුද්ගලයා මියගිහින් කියලද?"

"ඔව් මහත්මයා. මිනිය සීතල වෙලා. පොලීසිය හිතන්නේ......."

"ඔබ මගේ උදව් පතා ආ බව පොලීසිය දන්නවද?"

"ඔව්. ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියෙන් එතැනට ආවේ, මා මෙහේ එන්න මොහොතකට පෙර. පොලිස් පරීක්ෂක හෙඩිංලි මහත්මයා තමයි ආවේ. මේ ගැන ෂර්ලොක් හෝම්ස් මහත්මයා හමුවෙන්න යන බව මං ඔහුට කිව්වා. කිසිම දෙයක් අල්ලන්නේ නැතුව ඒ විදියටම තියෙන්න අරින්න කියලා, ඔහු එවිට පොලිස් භටයන්ට උපදෙස් දුන්නා......."

මේ අතර උදේ ආහාරය බන්දේසියක තබාගත් හඩ්සන් මහත්මිය උඩුමහලට පැමිණියාය. සේවක ළමයා ද තවත් බන්දේසියක් රැගෙන ඇය පිටිපස පැමිණියේය.

"මහත්වරුනි." ඇය කීවාය. "ඔබට බැහැරක ඉක්මනින් යන්න සිදුවේවි කියා මට හිතුණා. ඒ නිසා මම පිළියෙල කර තිබූ බේකන් සහ බිත්තර අරගෙන ආවා. බිලී ගෙනා පාන් මෙහෙන් තියලා ඉක්මනට බටර් අරගෙන එන්න......."

"ඔබට ස්තූතියි හඩ්සන් මහත්මිය" මගේ මිත්‍රයා කීවේ අසුනෙන් නැගිටිමිනි.

"මහත්මයා" ඔහු අමුත්තා ඇමතුවේය. "අප යන්න උවමනා කොහේටද, ප්‍රවාහණය කොහොමද කියල කියන්නවත් ඔබට ඉඩක් ලැබුණෙ නැහැනෙ. අපි හැඳ පැළඳ ගන්න තුරු ඔබට පුළුවනි උදේ ආහාරය ගන්න......"

"ස්තූතියි මහත්මයා." අමුත්තා කීය. "කිසිම ආහාරයක් ගැනීමට තරම් සන්සුන් බවක් මගේ සිතේ නෑ. ඔබේ පැමිණීමයි මට උවමනා. මං ආවේ ලොකු අශ්ව කරත්තයක. ඒක නවත්වා තිබෙනවා ඔබේ නිවස අසල. ඔබ ඉක්මනින් සූදානම් වී එනතුරු, මං කරත්තයේ ඉන්නම්" කී ඔහු අපෙන් පිළිතුරක් ලැබෙන තුරු නොරැඳී පහළ තට්ටුවට බැස්සේය.

තොරතුරු කිසිත් හරිහැටි නොදන්නා පරීක්ෂණයකට හෝම්ස්ට මෙසේ යාමට සිදුවී ඇත්තේ වරක් දෙවරක් නොවේ. එබැවින් එවැනි හදිසි අවස්ථාවලදී ගෙන යා යුතු දේවල් ඇසිරූ කුඩා ගමන් මල්ලක්, මගේ මිත්‍රයා සැමවිටම සූදානම් කරගෙන සිටියේය. ප්‍රබල උත්තල කාචවලට අමතරව තවත් දේ එහි අඩංගු විය. කුඩා දේ අල්ලන අඬු, කෝද්‍ර, ටේප්පටි, අත්‍යවශ්‍ය රසායනික ද්‍රව්‍ය, පැරිස්

බදාමය ආදී නොයෙක් දෑ එහි ඇතුළත් වූ බව මම මීට පෙරද ඔබට පවසා ඇත්තෙමි.

ඉක්මන් අහරකින් පසු අපි වහා පිටත්වූයෙමු. අමුත්තා පැමිණි අශ්ව කරත්තය සෑහෙන තරම් ඉඩකඩ තිබූ එකක් විය. අප එහි ඇතුළු වූ විගසම රිය ගමන් ඇරඹුවේය.

"අපට ගමනට ටිකක් වෙලා ගතවේවි" අමුත්තා කීය. "ඒ අතරේ මං ඔබට හැම දෙයක්ම කියන්නම්. මගේ නම ඩේවිඩ් ඇලන්. මෙන්න මගේ ආගන්තුක පත්‍රය. මේ තවත් ආගන්තුක පතක්. ඒක මගේ නීතිඥයා වැලන්ටයින් මහත්මයාගෙ. මං මේ දේවල් ඔබට දෙන්න තිබුණෙ ආව ගමන්. ඒ කිසි දෙයක් මගේ ඔළුවට ආවෙ නෑ. මේ බියකරු දර්ශනය මා දකිද්දී මගේ නීතිඥ මහත්මයාත් මා සමග හිටියා. බේකර් වීදියට ඇවිත් මේ ගැන ඔබට දැනුම් දෙන්න කියලා මට කිව්වේ ඔහු. ඔබ පැමිණෙන තුරු කාමරය තුළ කාටවත් ඇඟිලි ගහන්න බැරිවෙන්න, ඔහු එහි රැඳී හිටියා.

"ඒක බුද්ධිමත් තීරණයක්" හෝම්ස් කීය. "සිදුවෙලා තිබෙන්නේ මොකක්ද කියන එක දැන් මට කියන්න."

"මේ අපරාධයට ගොදුරු වී මියගිහින් ඉන්න පුද්ගලයාගෙ නම ආතර් කොලින්ස්. මට කණගාටුයි කියන්න; ඔහු යහපත් පැවැත්මක් තිබුණු කෙනෙක් නෙමෙයි. මියගිය කෙනෙකු ගැන මෙහෙම කීම වැරැදියි. නමුත් සත්‍යය එයයි. ඊළඟට මං ඔබට මේ කාරණයක් කියන්න ඕන. ඔහු සමග මට ඥාති සබඳකමක් ඇති වීමටයි, කාරණා සැලසුම් වී තිබුණේ. ඒ කොහොමද? මගේ දුව මියුරියෙල් විවාහ ගිවිසගෙන ඉන්නේ, මේ ආතර් කොලින්ස්ගේ ඥාති පුත්‍රයෙකු සමග. ඒ හැම දෙයක්ම මං ඔබට පැහැදිලි කර කියන්නම්.

මේ ආතර් කොලින්ස් සමග පහුගිය මාස තුනට වැඩි කාලයක් තිස්සේ, මං ඉතාම අප්‍රසන්න ලියුම් ගනුදෙනුවක යෙදුණා. ඒ ගැන වැඩි විස්තර මගේ නීතිඥ වැලන්ටයින් මහත්මයා ඔබට කියාවි.

අප අතර ඇති වී තිබූ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට අවස්ථාවක් ලබාදෙන්න කියලා, මං කොලින්ස්ගෙන් ඉල්ලමින් හිටියේ. ඔහු ඒකට උනන්දු වුණේ නැහැ. අන්තිමට මං එවූ ලියුම පෙරේදා ඔහු අතට ලැබෙන්න ඇති. එතකොට ඔහු ඊයෙ මට ලියුමක් එවල තිබුණා, මා හමුවීමට කැමැත්ත පළ කරලා. ඒ අද උදේ අටට ඔහුගේ නිවසේදී හමුවෙන්නට මට දැනුම් දෙමින්. මගේ උදව්වට මා සමග එන්න වැලන්ටයින් මහත්මයා කාරුණික වුණා. ඒ අනුවයි අපි උදේ අට වෙද්දි ඒ නිවසට ආවෙ.

අපි කිහිපවාරයක්ම ඔහුගේ නිවසේ සීනුව නාද කළා; බොහොම ශබ්දෙට දොරට ගැහුවා. නමුත් කිසිම ප්‍රතිචාරයක් ලැබුණෙ නෑ. අන්තිමේදී අපි පහළ තට්ටුවට බැස්සා. අපට හමුවුණා මේ ගොඩනැගිල්ල භාරව ඉන්න සේවකයා. කොලින්ස්ගේ විසිත්ත කාමරයේ ගෑස් පහන්, මුළු රාත්‍රිය පුරාම දල්වා තිබුණු බව සේවකයා කිව්වා. මොකක් හරි ප්‍රශ්නයක්ද කියලා, සේවකයාගෙ හිතෙත් සැකයක් ඇතිවී තිබුණා. ඉතින් ඔහුත් අප සමග උඩුමහලට ආවා. සීනුව නාදකරමින්, දොරට තඩිබාමින් කොලින්ස් අවදිකරන්න, මේ සේවකයාත් ලොකු මහන්සියක් ගත්තා. අන්තිමේදී ඔහු තමන් භාරයේ මේ නිවස සඳහා ඇති අමතර යතුර අරගෙන, දොර අරින්න උත්සාහ කළා. නමුත් එයත් සාර්ථක වුණේ නැහැ. ඒකට හේතුව ඇතුළතින් සොයිබ - අගුළු දමා දොර වසා තිබීමයි.

අන්තිමේදී සේවකයා ගිහින් මුර සංචාරයේ යෙදී සිටි පොලිස් භටයකු කැඳවාගෙන ආවා. ඔහුගේ ද අවසරය ඇතිව අපි තීරණය කළේ, දොර කඩල බලන්න. ඒ අනුව සේවකයා කැඳවාගෙන ආ කාර්මිකයෙක් අගුළ කඩා දමා දොර විවෘත කර දුන්නා.

දෙවියනේ! අපට දකින්න ලැබුණු දෙයක්. ඔහුගේ විසිත්ත කාමරයේ පොළොව මත, ආතර් කොලින්ස් වැටී සිටියේ මියගිහින්. ඔහු මරා දමා තිබුණේ කිණිස්සකින් ඇනීමෙන්. එය ඔහුගේ බෙල්ල පිටුපසින් පිටේ ඇමිණී තිබුණා. අපරාධකාරයා කවුරු වුණත්, ඒ ආයුධය ගලවා ඉවත්කරගෙන යාමට වත් උත්සාහ දරා නැහැ."

ඇලන් මහතා තම ලේන්සුව අතට ගෙන නළලෙන් හා මුහුණෙන් ගලා ගිය ඩහදිය පිසදමා ගත්තේය. ඔහු මේ විස්තරය කියද්දී රථය පිවිසුණේ, තරමක් නිශ්ශබ්ද අතුරු පාරකටයි. ඒ වෙස්ට්මින්ස්ටර් හා වික්ටෝරියා අතර ප්‍රදේශයයි. රතු පැහැති ගඩොලෙන් ඉදිකර තිබූ අලුත් උස තට්ටු නිවාසයක් ඉදිරියේ රිය නවත්වන ලදී. එසේ නැවැත්වූයේ ගොඩනැගිල්ලේ ප්‍රධාන පිවිසුම් දොරටුව ඉදිරිපසමය. සේවකයෙක් දුව ඇවිත් අශ්ව කරත්තයේ දොර විවෘත කළේය.

"කොලින්ස්ගේ නිවස තිබෙන්නේ දෙවැනි තට්ටුවේ" ඇලන් මහතා කීවේ පෙරමුණ ගනිමිනි.

පියගැට පෙළේ ඉහළට නැඟුණු, අප මිනිත්තු කිහිපයකින් පිවිසුණේ කොරිඩෝවකටයි. සෑහෙන තරම් හානියකට පත් ඉදිරි දොර අපට ඇතදීම දැකගත හැකිවිය. "ආතර් කොලින්ස් මහතා"

යනුවෙන් ලියූ පිත්තල නාම පුවරුවක් දොරට ඉහළින් විය. අපට මුලින්ම දැක ගන්නට ලැබුණේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂක හෙඩිංලි මහතාය. ඔහු මගේ මිතුරා දුටු වහාම ඉදිරියට ආවේය.

"ආයුබෝවන් හෝම්ස් මහත්මයා. ඔබ දකින්න ලැබීමත් සතුටක්. වැලන්ටයින් කියල නීතිඥ මහත්මයෙක් කාමරය ඇතුළෙ වාඩිවෙලා ඉන්නවා. ඔහු මුරබල්ලෙක් වගේ. අපි කාමරේ හරහා ඇවිද්දත් ඔහු ගොරවනවා"

කුඩා සාලයකට පා තැබූ අපි, එතැනින් විසිත්ත කාමරයට පිවිසුණෙමු. නීතිඥ මහතා ඇඩි සෝදිසියකින් පසුවූයේ එය තුළය. ඔහුට අමතරව ඒ තුළ පොලිස් භටයන් දෙදෙනෙකු ද අපට දක්නට ලැබිණ. විසිත්ත කාමරය ඇතුළත දර්ශනය සිත් බියපත් කරවන එකක් බැව් අමුතුවෙන් කීම අනවශ්‍යය.

විවෘතව තිබූ ජනේල හරහා හිරු එළිය වැටී තිබිණ. 'කලින්දා රාත්‍රියේ දල්වන ලද ගෑස් ලාම්පු තවමත් එලෙසමය. අඩක් හිස් කරන ලද මත්පැන් වීදුරුවක් සහ විවෘත පොතක් මේසය මත තිබිණි. ප්‍රහාරය එල්ල වී ඇත්තේ බලාපොරොත්තු නොවූ ලෙස, ඉතා ක්ෂණිකව බැව් එයින් පැවසිණ. ඉදිරියට පා නැගූ අපි මළ සිරුර වෙත නෙත් යොමු කළෙමු.

මියගිය පුද්ගලයා වයස අවුරුදු පනස් පහක හැටක අයෙකු බැව් දිස්විය. ඔහු මුනින් අතට බිම වැටී සිටියේ ඇත් දෙපසට විහිදුවාගෙනයි. ඔහුගේ වම් උරහිස අසල නමුත් බෙල්ලට සමීපව මාරාන්තික ආයුධය තවමත් ඇමිණී තිබූ ආකාරය දැකිය හැකිවිය. එළියට දිස්වී තිබුණේ කිණිස්සේ ඉතා සිහින් වූ මිට කොටස පමණි. එහි තලය සම්පූර්ණයෙන්ම සිරුර තුළට කිඳා බැස තිබිණි. ගිනිඋදුන සමීපයේ වූ විශාල බිත්ති ඔරලෝසුව වයින් තැබීමට ගන්නා යතුර ද, බිම තිබී අපට හමු විය. පහර එල්ලවන වෙලාවේ මියගිය තැනැත්තා යෙදෙමින් සිටි කටයුත්ත කුමක්ද යන්න එයින් පැහැදිලි විය.

බිත්ති ඔරලෝසුවේ ඉදිරිපස වීදුරුව විවෘතව තිබූ නිසා මේ අදහස වැඩිදුරටත් තහවුරු විය.

"ඔබට පෙනෙනවා නේද?" පොලිස් නිලධරයා කීවේ මගේ අවධානය ඒ දෙසට යොමුවී ඇති බැව් දුටුවිටයි. "ඔහු ඒ වෙලාවෙ ගිනිඋදුන ඉස්සරහ ඉඳල තියෙන්නෙ, ඔරලෝසුව වයින් කරමින්. මිනීමරුවා ශබ්දයක් නොනගා පිටුපසින් ආවා. ඊළඟට පිටුපසින්

පිහියෙන් ඇන්නා. අනෙක මේ කාරණය ඔබ දුටුවාද? කිණිසි පාර එල්ල වෙලා තියෙන්නේ ශරීරයේ වම් පැත්තට. අපරාධකාරයා වමත්කාරයෙකු බව ඒකෙන් පැහැදිලියි. මෙතන තේරුම් ගන්න අමාරු කාරණා තිබෙන්නේ දෙකයි. අපරාධකාරයා මෙතැනට ඇතුළුවුණේ කොහොමද? ඝාතනයෙන් පසු ඔහු මෙතැනින් පිටවුණේ කොහොමද?"

"මළසිරුර තිබුණු තැනින් වෙනත් තැනකට, කිසිම විදියක සෙලවීමක් කළේ නැහැ නේද?" හෝම්ස් විමසුවේය.

"නැහැ. අපි පොලිස් ශල්‍ය වෛද්‍යවරයා වන විල්කොක්ස් මහත්මයාට පණිවුඩයක් යැව්වා. ඔහු මරණය සහතික කළා. නමුත් පශ්චාත් මරණ පරීක්ෂණය ගැන වෙලාවක් යොදා ගන්න ඔබ හමුවීමට එන බව කිව්වා."

"එහෙම නම්" හෝම්ස් කීය. "අපි කිසිම ආකාරයක සෙලවීමක් නොකර මළසිරුර ඔහොමම තියමු. ඔහු එනතුරු සුළු පරීක්ෂණ දෙකක් අපට කරන්න පුළුවනි. ඒ මළ සිරුරේ උෂ්ණත්වය මැන ගැනීම. අනෙක කිණිස්සේ මිටට ෆ්‍රෙන්ච් - චෝක් කුඩු ස්වල්පයක් ඉස, එය පරීක්ෂා කිරීම"

තම බෑගයෙන් දිගු උෂ්ණත්ව මානයක් එළියට ගත් හෝම්ස් එය මළසිරුරේ ඇඳුම් වලට යටින් උදරය දෙසට ඇතුළු කළේය. රබර් බෝලයක් සහිත බටයක් අතට ගත් හෝම්ස් ඒ මගින් කිණිස්සේ මිට මතට පියර වැනි කුඩු ස්වල්පයක් පිම්බේය. ප්‍රබල කාචය අතැතිව කිණිසි මිට පරීක්ෂාවට ලක් කළ ඔහු මෙසේ කීය.

"ප්‍රශ්නය වඩාත් සංකීර්ණ වෙනවා. කිණිස්සේ මිට අතෙන් ඇල්ලූ බවට සලකුණු නැහැ. අනෙක මිට සහ තලය වෙන් කරන ආරක්ෂකයේ අකුරු වගයක් කොටා තිබෙනවා"

"ඒ මොකක්ද හෝම්ස්?" මම ඇසීමි.

"මේ කාචය එතැනට ළං කරලා බැලුවොත් ඔබට පෙනේවි. එහි තිබෙන්නේ නම් ඉතාලි වචනයක්. එහි තේරුම "ද්‍රෝහියා" යන්නයි."

"ඒක විශිෂ්ට සොයා ගැනීමක් හෝම්ස් මහත්මයා" හෙඩිංලි කීය. "මේ ගෙදර මුර කරන සේවකයාගෙන් මට ලැබුණු ආරංචිය හුඟක් ප්‍රයෝජනවත් වේවි. ඉතාලි ජාතිකයන් ගැන මොනවා හරි කාරණා රැසක් ඔහු මට කිව්වා. නමුත් ඒ වෙලාවෙ මං ඒ ගැන උනන්දුවක් දැක්වූවෙ නෑ"

"තම සටහන් පොත අතට ගත් හෝම්ස්, මෙම කාමරය පිහිටි ආකාරය, ලී බඩු පිහිටා තිබූ හැටි, මළ සිරුර වැටී තිබූ ආකාරය ආදී සටහන් කිහිපයක් ඇඳ ගත්තේය. එය අවසානයේ ඔහු පොලිස් නිලධරයා ඇමතුවේය.

"පොලිස් ඡායාරූප ශිල්පියාට එන්න කියල ඔබ දැනුම් දුන්නද මහත්මයා?"

"ඔහු නිසැකවම ඒවි හෝම්ස් මහත්තයා" හෙඩිංලි කීය. "විල්කොක්ස් දොස්තර මහත්තයාට ඡායාරූප ශිල්පියා නැතුවම බෑ. ඒ මොකද දොස්තර මහත්තයා ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව ගැන විශ්වවිද්‍යාලයේ උගන්වනවා නේ. ඒ නිසා ඔහු මේ හැමදෙයක්ම ඡායාරූප ගත කරලා ළඟ තබාගන්නවා"

"අනර්ඝයි" මගේ මිත්‍රයා කීය. "මටත් උවමනායි කෝණ කීපයකින් ඡායාරූප කීපයක්. ඒක නෙමෙයි. ඔබ කිව්වා නේද මළ සිරුර එහා මෙහා කළේ නැහැ කියල. එතකොට ජනේල ඇරියෙ කවුද?"

"කවුරුවත් ඇරියෙ නෑ. අපි මෙහේ එනකොට, කාමරයට ඇතුළුවෙන කොටත් ජනේල ඇරලයි තිබුණේ" නීතිඥ වැලන්ටයින් කීය. "ඔබට මතක ඇති. කලින් දිනවලටත් වඩා, ඊයේ රාත්‍රී තද උණුසුමක් තිබුණා. ඒ නිසා කොලින්ස්මයි ජනේල ඇර දමන්න ඇත්තෙ"

පොලිස් ඡායාරූප ශිල්පියා පැමිණ සිටින බව මේ අවස්ථාවේ සේවකයා අපට දැනුම් දුන්නේය.

"බොහොම හොඳයි" මගේ මිත්‍රයා කීවේ අතිශය සතුටට පත්වෙමිනි. "පශ්චාත් මරණ පරීක්ෂණය පටන්ගන්න කලින්, අප සඳහා ගත යුතු ඡායාරූප කීපයක්ම තිබෙනවා. වොට්සන්, ඔහු කැමරාව සූදානම් කරගන්න තුරු ඔබට පුළුවන්ද මගේ උදව්වට එන්න?"

අභිරහස් මරණ පරීක්ෂණයේ යෙදෙද්දී, එතැන හෝ මළසිරුර ඡායාරූප ගතකිරීම, හෝම්ස් එතරම් ප්‍රයෝජනයට ගත් ක්‍රමයක් නොවේ. එහෙත් කුමක් හෝ හේතුවක් නිසා මෙදින නම් ඔහුට එය අවශ්‍ය වී ඇත. කෙසේ වෙතත් පරීක්ෂණවලදී ඔහු යොදාගත් විශේෂ උපක්‍රම, කාලයෙන් කාලයට මෙන්ම පරීක්ෂණයෙන් පරීක්ෂණයට ද වෙනස් වූ බැව් රහසක් නොවේ.

"වොට්සන්. මුලින්ම ඔබ බිත්ති ඔරලෝසුව වයින් කරන ආකාරයට ඒ දිහාවට අත දිගු කරගෙන ඉන්න. තව ටිකක්

ඉස්සරහට එන්න. ඔබ නැගිට ඉන්න ඕන, කොලින්ස් මහත්මයා සිටිය තැන."

"මහත්මයා" හෝම්ස් කීවේ ඡායාරූප ශිල්පියා අමතමිනි. "මේක සිදුවී තිබෙන්නේ ඊයෙ රෑ. එළියේ අන්ධකාරය තිබුණත්, කාමරය තුළ ගෑස් පහන් දල්වා තිබුණු බවක් අපට අහන්න ලැබුණා. මියගිය පුද්ගලයා නැගිට සිටියා නම්, ජනේලය පැත්තට ඔහු දිස්වෙන්න ඇත්තේ කොහොමද? මං කැමතියි ඒක දැනගන්න. මගේ මිත්‍ර දොස්තර වොට්සන් ගිනි උදුන අසල සිටගෙන, බිත්ති ඔරලෝසුව දෙස බලා ඉන්න හැටි, ජනේලය දෙසින් ඡායාරූප ගතකරන්න ඔබට හැකිද? අන්න හරි. විශිෂ්ටයි. එපමණයි"

"මං එකතු කරන මේ දත්තවලින්, මොන තරම් ප්‍රයෝජනයක් ලැබෙනවද කියන එක, මට කල්තියා කියන්න අමාරුයි" හෝම්ස් කීය. "සමහරවිට මේව කිසිම ප්‍රයෝජනයක් නොගෙන අහකදාන්න වෙන්නත් පුළුවනි. නමුත් අනික් අතට අතිශයින්ම ප්‍රයෝජනවත් වෙන්නත් ඉඩ තියෙනවා........ ආ මේ එන්නේ විල්කොක්ස් දොස්තර මහත්මයා විය යුතුයි"

පොලිස් ශල්‍ය වෛද්‍ය විල්කොක්ස් සැමවිටම ඉතා ප්‍රසන්න පුද්ගලයෙකු විය. මට අතට අත දුන් ඔහු, හෝම්ස්ට හිස නමා අතට අතදී ආචාර කළේ ගෞරව සම්ප්‍රයුක්තවය. මෘත ශරීරය පරීක්ෂාව ඉන්පසුව අරඹන ලදී. හෝම්ස් උෂ්ණත්වමානය අතට ගෙන වෛද්‍යවරයා අතට දුන්නේය.

"ඔහු මිය ගිහින් පැය දහයක් වත් ගතවෙලා වගෙයි. එහෙම නේද හෝම්ස් මහත්මයා?" විල්කොක්ස් ඇසීය. "බොහොම සිතා මතා සූක්ෂමව කළ අභිරහස් මිනීමැරුමක්"

"සම්පූර්ණ ඇත්ත" හෝම්ස් කීය. "මේ කිණිස්සේ මිටෙන් අල්ලා බලන්න. කිණිසි තුඩේ කෙළවර රැඳී තිබෙන්නෙ මෘදු පටකවල නෙමෙයි."

විල්කොක්ස් එම කරුණට අවධානය යොමු කොට, ඉන්පසු මටද අවස්ථාවක් ලබා දුන්නේය. කිණිසි තුඩ අස්ථියක් වැනි දෘඪ යමක ඇණී හිරවී ඇති බවක් මට සිතිණ.

"මේක දැවටිලා තියෙන හැටියට ඒ අස්ථියක් විය යුතුයි" මම කීවෙමි.

"ඔව්" හෝම්ස් එකඟ විය. "මේ කිණිස්සෙන් අනිද්දී ඒකට අසාමාන්‍ය බලයක් යොදල තියෙනවා. එච්චර විතරක් නෙමෙයි. බලන්න එය සිරුර තුළට යද්දී මඳක් කරකවා ඇති හැටි. ඔබ දුටුවාද

කමිස රෙද්ද ආයුධයේ තලය සමග මඳක් කරකැවී, ඇඹරී ඇති හැටි."

"ඒක නම් ඉතා අසාමාන්‍ය දෙයක් තමා" විල්කොක්ස් එකඟ විය. "නමුත් මොන අරමුණකින් එහෙම දෙයක් කළාද කියල හිතාගන්න අමාරුයි. කොහොම නමුත් මිනිය උඩ අතට හරවන්න කලින්, අපි කිණිස්ස ඉවත් කරලා ඉඳිමුද?"

"ඇත්තෙන්ම ඔව්" කී මගේ මිත්‍රයා, එම කටයුත්ත සඳහා වෛද්‍යවරයාට උදව් කළේය. ආයුධය ඉවතට ගැනීමත් සමගම, රැළි වැටී තිබූ ඇඹරී තිබූ කමිස රෙද්ද යථා තත්ත්වයට පත්විය. අනතුරුව මෘත ශරීරය නිදන කාමරය වෙත ගෙන ගොස්, වැඩිදුර පරීක්ෂාව සිදුකරන ලදී. ප්‍රධාන රුධිර වාහිනී නාළ කැපී යාමෙන් සිදුවූ අධික ලේ ගැලීම, මරණය ඉක්මන් වීමට හේතුව බව වෛද්‍යවරයා තහවුරු කළේය. පොලිස් නිලධරයා ද ඒ ගැන තම අදහස් පළ කළේය. හෝම්ස් වෙත එල්ල කළ යම් උපහාසාත්මක බවක් එහි රැඳී තිබුණා යයි මට සිතිණ.

"ඉතින් මහත්වරුනි" පොලිස් පරීක්ෂක හෙඩිංලි කීය. "ඔබ මළ සිරුර, තුවාලය සහ පොළොව පරීක්ෂා කළා. ඡායාරූප ගත්තා. ආයුධයත් සෝදිසිකරලා බැලුවා. නමුත් අපට ඉදිරියට යන්න හැකිවුණු බවක් මට නම් පෙනෙන්නේ නෑ.

මෙන්න මිනිහෙක් මරා දමල ඉන්නවා, ඔහුගේම තට්ටු නිවාසයේ විසිත්ත කාමරය ඇතුළේ. මෙතැනට ඇතුළුවෙන්න පුළුවන් එකම එක දොරයි තිබෙන්නේ. නමුත් අපරාධය සිදුවෙන වෙලාවෙ ඉඳල අද උදේ වනතුරුත්, ඒක ඇතුළෙන් අගුළු දමලයි තිබුණේ. ජනෙල් පියන් කිහිපයක් ඇරලා තිබුණු බව ඇත්තයි. නමුත් ඒවා තියෙන්නේ පොළොවේ ඉඳල අඩි හතළිහක් පමණ උඩින්. මිනිහෙක් කොහොමද එවැනි ජනේලයක් ළඟට එන්නෙ? වැහි වතුර පහළට ගලා යන වැහි පීල්ලක්, හෝ ජල නළයක් එවැනි මොකක්වත් බිත්තිය දිගට නෑ. මනුස්සයෙකුට තියා මැස්සෙකුටවත් අඩිය තියන්න පුළුවන් තැනක් බිත්තියේ නෑ.

උදුනේ සිට ඉහළට තිබෙන දුම්බටය හා දුම් කවුළුව ඉතාම කුඩා පටු එකක්. මිනිහෙකුට තබා තරමක් ලොකු බළලෙකුටවත්, ඒක දිගේ යන්න එන්න බෑ. දැන් අපට තියෙන ප්‍රධානම ප්‍රශ්නය මේකයි. අපරාධකාරයා මෙතැනට ආවෙ කොහොමද? ඔහු මෙතැනින් පිටවී ගියේ කොහොමද?" හෙඩිංලි කීය.

සාමාන්‍යයෙන් අපරාධ පිළිබඳව කෙරෙන මෙවැනි විග්‍රහ මට අසන්නට ලැබෙන්නේ, මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගෙනි. ඔහු බේකර් වීදියේ නිවහනේදී සැප පුටුවට වී, පයිප්පය උරමින් මෙවැනි දේ පවසන්නේ මට ය. ඒ තමන්ගේ සිතේ ඇති වී තිබෙන ගැටලු නිරාකරණය කරගැනීමේ අරමුණෙනි. නමුත් මේ පොලිස් නිලධරයා? ඔහු ගැන මගේ සිතේ ඇතිවූයේ ඊර්ෂ්‍යාව මිශ්‍ර තරහකි. ඊර්ෂ්‍යාව, ඔහු සඳහන් කළ සියල්ල සැබෑ නිසාය. මගේ සිතේ තරහක් ඇතිවූයේ, හෝම්ස් නිහඬව කල්පනා කරද්දී, මේ හිස උදුම්මාගත් තරුණයා තමාගේ දැනුම පෙන්වීමට කළ උත්සාහය ගැනය.

“ඒව කොහොම වුණත්” වැලන්ටයින් නීතිඥවරයා කීවේ අවධාරණාත්මක හඬකිනි. “අපරාධකාරයා ගේ ඇතුළට ඇවිත් තියෙනවා. නමුත් ඔහු දැන් මේකෙ නැහැ. ඒකෙන් තේරෙන්නෙ ඔහු පිටවෙලා ගිහින් බවත් ඇත්ත. මේ දොරේ අගුළ අරින්නෙ නැතුව, ඔහුට පිටවී යාමට ක්‍රමයක් තිබුණු බව එයින් පැහැදිලි වෙනවා. ඒ ක්‍රමය කුමක්ද කියා සොයා ගැනීමට කාට හරි පුළුවන් වෙන්න ඕන”

පොලිස් නිලධරයාගේ මුහුණට සිනාවක් නැගිණ. එය පරාජිත සිනාවක් මිස ජයග්‍රාහී සිනාවක් නොවීය.

“ඇතිවී තිබෙන තත්ත්වය ගැන පැහැදිලි කිරීමට අපි උත්සාහ කරනවා නම්.......” හෝම්ස් කථාව ඇරඹුවේය. “මියගිය නැනැත්තා නිවස තුළ ඉඳල තියෙන්නෙ තනියම. දෙවැන්නෙක් හිටි බවට කිසිම සලකුණක් නෑ. අඩක් හිස්කළ බීම වීදුරු තිබුණෙත් එකයි. ඔහු වාඩිවෙලා පොතක් කියවමින් සිටියා. ඔරලෝසුවේ වෙලාව දොළහට මිනිත්තු දහයක් තිබියදී නැවතී ඇති බව ඔහුට අහම්බෙන් දකින්න ලැබුණා. ඔහු මොකද කළේ? ඔහු නැගිටලා අතේ තිබුණු පොත අනෙක් පැත්ත හරවා මේසය උඩින් තැබුවා. ඊළඟට ඔහු ඔරලෝසුවේ මුහුණත වසා තිබූ වීදුරුව ඇරලා ඔරලෝසුව වයින් කරන්න පටන්ගත්තා. ඔහු වෙත මරණය ළඟාවුණේ ඒ මොහොතෙදි”

“අපරාධකාරයා ගැන කියනවා නම්......” පොලිස් පරීක්ෂක හෙඩිංලි කීය. “ඔහු චමත්කාරයෙක්. අඩි ශබ්දයක් නොඇසෙන පිළිවෙළට ඔහු පිටුපස්සෙන් ළං වුණා. ඊටපසු මාරාන්තික පිහි පහර එල්ල කළා”

“ඒ වගේ තමයි පෙනෙන්නේ” හෝම්ස් කිය. “කොහොම වුණත් අපි මේ ගෙදර මුරකාරයා හෙවත් සේවකයා කැඳවා විමසා බලමු.”

“ඊයෙ රෑ කවුරු හරි මේ ගෙදරට ඇවිත් තියෙනවා. ඒ ආවෙ කවුද කියල ඔබ දුටුවද?”

“සෑහෙන පිරිසක් ඊයෙ දවසෙ මේ ගොඩනැගිල්ලට ඇවිත් ගියා” සේවකයා කිය. “ඒ අයගෙන් මේ ගෙදරට ආවෙ කවුද කියන එක නම්, මට කියන්න අමාරුයි. ඇලන් මෙනෙවිය ඇවිත් රෑ නවය හමාරට පමණ පිටවෙලා ගියා”

“මගේ දුව!” ඇලන් මහතා කීවේ මවිතයට පත් හඬකිනි. “ඇය මෙහි ආ බවක් මං දැනගෙන හිටියෙ නැහැනෙ”

“ඇය පිටවෙලා ගියේ රෑ නවය හමාරට විතර” සේවකයා කිය.

“ඇය ආවෙ මොන උවමනාවකටද කියල ඔබ දන්නවද?” පොලිස් නිලධරයා විමසුවේය.

“මට අනුමාන කරන්න පුළුවනි” ඇලන් මහතාගෙන් පිළිතුරු ලැබිණ.

“ඒ වුණත් කිසිවක් කියන්න එපා” නීතිඥයා ඇලන්ට උපදෙස් දුන්නේය. “ඔබ මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න උවමනා නෑ”

“වැලන්ටයින් මහත්මයා” පොලිස් නිලධරයා නීතිඥයා ඇමතුවේය. “මේ ගැන විවෘතව කතාකරනවට, ඔබ ඔහුට බාධා කරන්නෙ ඇයි? අපරාධය ගැන අපි ඒ තරුණ නෝනව සැක කරන්නෙ නෑ. උදාහරණයක් වශයෙන්, අපි අහන්නෙ නෑ ඇය චමත්කාරියක් ද කියා.”

එසේ කියූ හෙඩිංලි, ඇලන් මහතා දෙස හොරැහින් බලාගෙන සිටියේය. ඇලන් මහතා එක්වරම, මළමිනියක් මෙන් සුදුමැලි වූ අයුරු අපි දුටුවෙමු. හෙඩිංලි ඉක්මනින් ඉවත බලාගත්තේ තමා එය නුදුටු බැව් හඟවමිනි.

“අර මෙහේ ආව කිව් ඉතාලි ජාතිකයන් ගැන ආයෙමත් කියන්න” හෙඩිංලි සේවකයා කැඳවමින් ඉල්ලා සිටියේය.

“එයාල මුලින්ම මෙහේ ආවෙ කවදද?”

“සතියකට විතර කලින්. මුලින්ම ආවෙ, ඔය වීදි අයිනෙ සංගීත වාදනය කරමින් මුදල් හිඟාකන මිනිහෙක් වගේ, සාමාන්‍ය පෙනුමක් තියෙන කෙනෙක්. ඔහු මගේ ගෙදරට ලියුමක් ගෙනත් දුන්නා. ඒක දමල තිබුණෙ කිළිටිවුණු, පොඩිවුණු ලියුම් කවරයක. පිටත ලියල තිබුණෙ “කොලින්ස් මහතා, තේමස් මැන්ෂන්ස්”

කියලා. ඒ ලියුම කොලින්ස් මහත්තයා අතට දෙන්න කියල ඒ මිනිහ යන්න ගියා. මං ඒ ලියුම කොලින්ස් මහත්මයගෙ ලියුම් පෙට්ටියට දැම්මා"

"මොකක්ද ඊළඟට සිද්දවුණේ?"

"ඊළඟ දවසෙ උදේම ආවා සාස්තර කියන ඉතාලි ගැහැනියක්. කුරුලු කූඩුවක් හෙම එල්ලාගෙන ආව ඇය නාකි ගැහැනියක්. මේ ගේට්ටුව ළඟම බිම වාඩිවෙලා, ඇය සාස්තර රස්සාව පටන්ගත්තා. මං වහාම ඇයව එළවා දැම්මා. විශ්වාස කරන්න මහත්තයා. මිනිත්තු දහයක් ගියේ නෑ. මෙන්න ඇය ආයෙමත් මෙතැනට ඇවිත්; කුරුලු කූඩුව එහෙම අතින් එල්ලාගෙන. ඇයට කෑ ගහලා මං එවේලේම ඇයව එළෙව්වා. මේ විදියට ඇය මෙතැනට ආවෙ කී සැරයක්ද මං දන්නෙ නෑ. ඒ .හැම සැරයකම මටත් කේන්ති අරගෙන කෑගහන්න සිද්දවුණා"

"ඉතින්, ඉතින්......."

"ඊළඟ දවසේ ආවනේ අයිස්ක්‍රීම් වෙළෙන්දෙක්" සේවකයා කීය. "ඇවිල්ලා මේ පදික වේදිකාවෙ පැළ වුණා වගේ....... එයාට උවමනා වෙලා තිබුණෙ, මෙතැනට වෙලා කාලය නාස්ති කිරීම බව මට තේරුණා. මෙතැනින් යන එන කොල්ලන්ට රහ බලන්න ඔහු අයිස්ක්‍රීම් හැන්ද ගණනේ දෙනවා. මං උත්සාහ කළේ ඒ යකාවත් මෙතැනින් එළවා දැමන්න. ඒක හරිගියේ නෑ. ඒ මොකද මිනිහා මට බොහොම සැරෙන් කිව්වා, එයාගෙ රස්සාව කරගන්න එකට අවහිර කරන්න එපා කියලා. අපූරු රස්සාව! මේ පළාතෙම ඉන්න රස්තියාදුකාර, ගැටකපන කොල්ලෝ, දිව දික්කරගෙන අයිස්ක්‍රීම් රහ බලන්න පෝලිමේ. උන් ගේට්ටුවත් අවහිර කළා. ඊට පස්සේ බොහොම සැර පරුෂවෙලා තමයි මං උන්ව එළවා ගත්තේ"

"ඊට පස්සේ?"

"ඊළඟ දවසෙ ආවා, පියානෝ එකෝඩියන් එකක් එල්ලා ගත්තු සංගීතකාර හිඟන්නෙක්" සේවකයා කීය. "උගේ කරේ රිළවෙක්. උන්ව පන්නා දමන්න ගියාම, ඒ යකා මගේ ඇඟට රිළවා උසි ගැන්නුවා. අන්තිමට බොහොම අමාරුවෙන් තමා එයාලවත් එළවගත්තේ" සේවකයා තම නළලෙන් වැගිරෙමින් තිබූ ඩහදිය පිස දමමින් කීය.

"ඉතාලි ජාතිකයා ඔබ අතට දුන්නු ලියුම දුටුවොත් ඔබට හඳුනාගන්න පුළුවන්ද?"

"බැරිවෙන එකක් නෑ"

"මෙන්න මේව තිබුණේ ඔහුගේ කබා සාක්කුවේ" පොලිස් නිලධරයා කීවේ කාමරය තුළින් ලිපි කිහිපයක් ගෙන එමිනි. ඒවා එකට ගැටගසා තිබිණි.

"කොලින්ස් මහතා" කියල තුගතෙකුගේ අත් අකුරින් කවරය ලියල තියෙන එක මේක. බලන්න ඉතාලිකාරයා ඔබ අතට දුන්නු එක මේකද කියල?"

සේවයා ඉතා ඕනෑකමින් කවරය පරීක්ෂා කර බැලීය. අනතුරුව ඔහු එය ආපසු භාර දුන්නේ, "හරි. මේක තමයි" කියමිනි.

"හෝම්ස් මහත්මයා. මේ ලියුම ගැන ඔබට මොනවද කියන්න පුළුවන්?" හෙඩිංලි ලිපිය මගේ මිත්‍රයා අතට දුන්නේය.

තම කබා සාක්කුවෙන් ප්‍රබල උත්තල කාචය අතට ගත් හෝම්ස් ප්‍රථමයෙන්, ලිපියේ කවරය පරීක්ෂා කිරීම ඇරඹුවේය. අනතුරුව කවරය තුළ වූ ලිපිය ද පරීක්ෂා කළේය.

"හරි අපූරු ලේඛනයක්. වැලන්ටයින් මහත්මයා. ඔබට මොනවද මේක ගැන හිතෙන්නේ?" හෝම්ස් කීවේ එය නීතිඥවරයා වෙත දිගුකරමිනි.

ඔහු එය කියවද්දී මම ඔහුගේ උරහිසට උඩින් ලිපිය දෙස බැලීමි. සාමාන්‍ය සටහන් කඩදාසියක එය ලියා තිබුණේ රතු තීන්ත යොදාගනිමිනි. ලිපියේ මුදුනේ මැද මුහුදු කොල්ල කාරයින්ගේ සලකුණ වන හිස් කබල සහ හරස් අස්ථි දෙක ඇඳ තිබිණි. එහෙත් එය දක්ෂ චිත්‍ර ශිල්පියෙකුගේ නිර්මාණයක් නොවීය. එහි පහතින් මෙලෙස සටහන්ව තිබිණ.

> "සාධාරණය ඉටුකිරීම සඳහා ඔබට දින හයක කාලයක් ලබා දෙන්නෙමි. එසේ නොකළහොත් ඇතිවන ප්‍රතිඵලය කුමක්ද යන්න, ඉහළ ඇති සංඥාවෙන් සිතාගන්න"

"ඇලන් මහත්මයා" නීතිඥයා කීය. කොලින්ස් ඊයෙ ඔබ වෙත ලියුමක් එවා තිබුණා නේද? ඇයි එහෙම එකක් එව්වෙ කියන එක මේකෙන් පැහැදිලි වෙනවා, මං හිතන්නෙ. ඔබ ඒ ලියුම අරගෙන ආවද?"

"ඔව්" කී ඇලන් මහතා තම සාක්කුවේ තිබූ ලිපිය රැගෙන එය ශබ්ද නගා කියෙව්වේය.

"ඔව්. ඔබ කියන වෙලාව මට නම් කොහොමටවත් පහසු වෙලාවක් නෙමෙයි. ඒ වුණත් කමක් නෑ එන්න. ඔබේ තර්ජනාත්මක ලියුම්වලින් මට නම් ලැබෙන්නේ විනෝදයක්.

ආතර් කොලින්ස්"

"කොලින්ස් මහත්මයා කවදා හරි ඉතාලියට ගිහින් තියෙන කෙනෙක්ද?" පොලිස් නිලධරයා විමසීය.

"අපොයි ඔව්" ඇලන් මහතා පිළිතුරු දුන්නේය. "පහුගිය අවුරුද්දම වගේ ඔහු ගත කළේ ඉතාලියේ කැප්රි නගරයේ"

"අන්න ඒකෙන් අපට ලැබෙනවා, අපි හොයමින් සිටි හෝඩුවාව. මේ බලන්න. මේ තමයි අනික් ලියුම් දෙක. තැපැල් මුද්‍රාව ඊසී - මධ්‍යම ලන්ඩනයේ නැගෙනහිර. ඉතාලි කාරයන් ගැවසෙන සැෆ්රන් හිල් තියෙන්නෙ ඒ පැත්තෙ."

ඔහු අවසන් ලිපිය දිග හැරී විට අපට දක්නට ලැබුණේ මෙවැනි සටහනකි. එය ඉතාලි භාෂාවෙන් ලියා තිබිණි.

"මතක තබාගන්න! ඔබට අත්වන්නේ මරණය! පරෙස්සම්වන්න! කැප්රි අමතක නොකරන්න"

"හෝම්ස් මහත්මයා. ඔබේ රාජකාරි අවසාන නම් මං යන්නම්" පොලිස් නිලධර හෙඩිංලි කීය. "මං යනවා පුංචි ඉතාලිය පැත්තෙ ටිකක් හොයල බලන්න. ඒ ඉතාලිකාරයන් හතරදෙනා හොයා ගැනීම එච්චර අමාරුවේවි කියල මං හිතන්නෙ නෑ. අවශ්‍ය වුණොත් හඳුනාගන්න මෙහේ සේවකයත් ඉන්නවා නෙ"

"ඔබ යන්න කලින්" හෝම්ස් කීය. "මට තියෙනවා වැඩිදුර සොයා බැලිය යුතු කාරණා දෙකක් ගැන, ඔබට මතක් කරන්න. එකක් අර කිණිස්ස. ඒක ඇත්තෙ ඔබේ සාක්කුවේ කියලයි මං හිතන්නෙ. මට පුළුවන්ද ඒක ටිකක් පරීක්ෂා කරල බලන්න?"

එය සාක්කුවෙන් ගත් හෙඩිංලි කිණිස්ස හෝම්ස් අතට දුන්නේ එතරම් කැමැත්තකින් නොවේ.

"ඉතාම අසාමාන්‍ය ආයුධයක්" හෝම්ස් කීවේ එය ඒ මේ අතට හරවමින් මඳ වේලාවක් පරීක්ෂා කිරීමෙන් පසුවය. "ඒකෙ හැඩයත් හරි අසාමාන්‍යයයි. ඒ වගේමයි ඒක සෑදීමට යොදාගෙන ඇති ලෝහ. මෙම පිහියේ මිට ඇලුමිනියම් වලින් සාදා තියෙන්නෙ. එහෙම දෙයක් මං දුටු පළමුවැනි වතාව මේක. ඊට අමතරව අසාමාන්‍ය දේවල් හුඟක් තියෙනවා. හ්ම්.......

"තළය සහ මිට මේ විදියට සිහින්ව දිගට හදන්න ඇත්තේ, කබා අතේ උඩ කොටසේ සඟවා ගෙන යාමට විය යුතුයි." හෙඩිංලි කීය. "ඇලුමිනියම් යොදාගන්න ඇත්තෙ ආයුධය සැහැල්ලු වෙන්න"

"ඔව්. බාග වෙලාවට එහෙම වෙන්න ඇති" කී හෝම්ස් මගේ අතේ තිබූ ඔහුගේ උපකරණ මල්ල මගෙන් ඉල්ලා ගත්තේය. "හෙඩිංලි මහත්මයා. මං කැමතියි මේ අපූරු ආයුධයේ රූප සටහනක් ඇඳගෙන, මෙහි කොටස්වල දිග පළල සලකුණු කරගන්න. ඒ ගැන ඔබේ විරුද්ධත්වයක් නැහැ නේද?"

හෝම්ස් බෑගය තුළින් ගත්තේ තුනට නමා තිබූ කෝදුවක් සහ ඉතා සියුම් ලෙස දශමයට මිනුම් කළ හැකි කැලිපරයකි. ප්‍රථමයෙන් ඔහු කඩදාසියක, ආයුධයේ රූප සටහනක් ඇඳ ගත්තේය. ඉන්පසු එහි කොටස්වල දිග පළල පමණක් නොව, මිටේ සහ පිහි තළයේ ගනකම ද සටහන් කරගත්තේ, එයට සෑහෙන වේලාවක් ගත කරමිනි. අන්තිමේදී ආයුධය තම දකුණු අතේ ඇඟිලි මත හරස් අතට තබා ඉහළ පහළ පැද්දුවේ, ආයුධයේ බර ගැන වැටහීමක් ලබා ගැනීමට විය යුතුය.

"මං ඔබගෙන් අහන්න හිටි අනික් කාරණය" හෙඩිංලි අමතා හෝම්ස් කීවේ කිණිස්ස ඔහුට භාරදෙමිනි. "මේ ගෙවල්වලට අනෙක් පැත්තේ තිබෙන තට්ටු නිවාස ගැන"

ජනේලය වෙත ගිය හෝම්ස් අප සිටි තට්ටු නිවාසයට සමාන්තර ආකාරයට, මේ ප්‍රමාණයටම ඉදිකොට තිබූ තට්ටු නිවාස ගොඩනැගිල්ලක පිටුපස දෙසට නෙත් යොමු කළේය. එය පිහිටා තිබුණේ මෙම ගොඩනැගිල්ලට අඩි 30 ක පමණ දුරකිනි. ගොඩනැගිලි දෙක අතර බිමේ නොයෙක් වර්ගවල කුඩා පඳුරු හා පැළෑටි වවා තිබූ අතර, බොරලුවලින් වැසුණු අඩිපාර කිහිපයක්ද ඒ මේ අතට වැටී තිබිණි.

"අර ගොඩනැගිල්ලේ කාමරයක ඊයේ රෑ කවුරු හරි හිටියා නම්" හෝම්ස් කීය. "ඇත්තටම සිදුවුණේ මොකක්ද කියල අපට දැනගන්න තිබුණා. ඒ මොකද මේ ගෙ ඇතුළත හොඳට ආලෝකමත් කරල ජනෙල් විවෘතව, තිරරෙදි උඩට දමල තිබුණා. නිවස තුළ තිබුණු උණුසුම එයින් නැතිවී යන්න ඇති. ඒ වගේම හොඳින් නිරීක්ෂණය කළ කෙනෙකුට, මේක ඇතුළ පැහැදිලිව පෙනෙන්නත් ඇති. විමසීමක් කරල බලන්න වටිනවා"

"ඔව් ඒක ඇත්ත තමයි" හෙඩිංලි කීය. "මේ මිනීමැරුමට පත්තරේ මුල් පිටුවෙම තැනක් ලැබේවි. ඒ නිසා ඒක කියවූ ගමන්,

ඇසින් දුටු සාක්ෂි කාරයෙකු ඉන්නවා නම් ඉදිරිපත් වේවි. මට දැන් යන්න වෙලාව හරි. දැන් මට සිදුවෙනවා ඔබ හැමදෙනාටම එළියට යන්න කියලා, මේකෙ දොරවල් යතුරු දමන්න"

තරප්පු පෙළ බැස පහළට ගිය අපට නීතිඥ වැලන්ටයින් මහතා හමුවිය. අප සමග කථාකිරීමේ අරමුණෙන් ඔහු එතැන රැඳී සිටි බැව් පෙනිණ.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබට කාරණා මොනවා හරි මේ වෙලාවෙ මගෙන් විමසන්න උවමනාද? එහෙම නම් මට පුළුවනි දැන් ඒ ගැන කියන්න. එහෙමත් නැත්නම් මට පුළුවනි අද හැන්දෑවට ඇවිත් ඔබ හමුවෙන්න"

"ඔබට ස්තූතියි වැලන්ටයින් මහත්මයා" හෝම්ස් කීය. "මං කැමතියි මේ වෙලාවෙම කාරණා කිහිපයක් දැනගන්න. අපි යමුද අන්න අර ලතා මණ්ඩපයේ සෙවණට. මේ දවස්වල අව්ව හරිම සැරයි නේ. අනික් අයගෙන් බාධාවක් නැතුව අපට නිදහසේ එතැන හිඳගෙන කතා කරන්නත් පුළුවනි"

අප ගමන්ගත්තේ ගෙවත්තේ කෙළවරක ගස් කිහිපයක සෙවණේ තබා තිබූ බංකුව වෙතය.

"ආතර් කොලින්ස් මරණයට පත්වෙනවා දකින්න උවමනාවෙන්, කවුරු හරි ඉඳල තියෙනවා" හෝම්ස් කීය. "ඒ කවුද කියල ඔබ දන්නවද?"

නීතිඥ මහතා හෝම්ස්ගේ ප්‍රශ්නයට පිළිතුරු දීමට සූදානම් විය. ඒ තම මිත්‍රයා වූ ඇලන් මහතාට ද අප අසලට පැමිණෙන මෙන් සංඥා කරමිනි.

"ඔබට දෙන්න තිබෙන පිළිතුර බොහොම පැටළුණු සංකීර්ණ එකක් හෝම්ස් මහත්මයා" නීතිඥයා කීය. "මේ වෙලාවෙ කෙනෙක් කොලින්ස්ගේ මරණය ප්‍රාර්ථනා කරනවා නම්, ඒ එකම පුද්ගලයෙක් කියලයි මං හිතන්නෙ. ඔහු තමා කොලින්ස්ගේ අන්තිම කැමැති පත්‍රය අනුව, සියලුම දේපළ වල උරුමකාරයා වන ඔලිවර් ටේට්. ඔහු කොලින්ස්ගේ ඥාතියෙකු වත් නොවෙයි. ඔහු මිතුරෙකු පමණයි. නමුත් ටේට්ට උරුම වෙන දේපළවල වටිනාකම පවුම් තිස් දහසකට වැඩියි."

"කොහොමද එහෙම දේකට මඟ පෑදුණේ?" හෝම්ස් විමසීය.

"කලකට පෙර මිය ගිය සාර්ථක ඉඩම් හිමි වැවිලි කරුවෙකු වූ සුප්‍රසිද්ධ රිචඩ් කොලින්ස් ගැන ඔබ අහල ඇති.......?" වැලන්ටයින්

මහතා කීය. "ඔහුට එංගලන්තයේ පමණක් නොවෙයි; විදේශවලත් ඉඩකඩම් තිබුණා. ඒ තමයි ඉන්දියාවේ ඩාජිලිංහි ඔහු සතුව තිබුණු තේ වතු. මේ රිචඩ් කොලින්ස්ට පුතුන් දෙදෙනයි. වැඩිමලා තමයි මේ ආතර් කොලින්ස්. මොහු විවාහ වෙලා නැහැ. මොහුට බාල මල්ලි කෙනෙක් හිටියා වික්ටර් නමින්. තරුණ කාලයේම වික්ටර් මියගියේ හදිසි අනතුරකින්. ඒ මීට අවුරුදු විස්සකට පමණ පෙර. ඒ කාලයේ මේ දෙදෙනාගේ පියා වුණු රිචඩ් කොලින්ස් ජීවතුන් අතර සිටියා. ඔහු වික්ටර්ගේ වැන්දඹු බිරිඳට සහ දරුවන්ට ජීවත්වීමට විශාල වශයෙන් මුදලින් උපකාර කළා. නමුත් ප්‍රශ්නය ඇතිවුණේ මීට අවුරුදු පහළොවකට පමණ පෙර, වයස්ගතව සිටි රිචඩ් මහතා මියගියාම."

"ඔහු අන්තිම කැමති පත්‍රයක් ලියුවේ නැත්ද?"

"වික්ටර්ගේ බිරිඳගේ පාර්ශවයේ ඥාතීන් කළ බලවත් ඉල්ලීම අනුව, රිචඩ් කොලින්ස් අවසාන මොහොතේ අන්තිම කැමැති පත්‍රයක් ලියූ බව ඇත්තයි" නීතිඥ මහතා කීය. "නමුත් මේ කාලෙ වෙනකොට ඔහු සිටියේ බොහොම වයස්ගතව මානසික ව්‍යාකූල තත්ත්වයෙන්. ඒ නිසා ඔහුගේ ඒ අන්තිම කැමැති පත්‍රය නීතිය හමුවේ අභියෝගයට ලක්කරලා ඉවතට දමන්න, ආතර් කොලින්ස්ට හැකිවුණා.

රිචඩ් මහතාගේ බලාපොරොත්තුව වුණේ, විවාහ නොවුණු ආතර් සියලුම දේපළ මල්ලිගේ අනාථ පවුලට හිමිකරදී, ඒ දරුවන් තුන්දෙනා ගැන බලාගනීවි කියලයි. නමුත් ඒ දේ සිදුවුණේ නෑ. ඔහු ඔවුන් වෙනුවෙන් එක පැන්සයක් වියදම් කළේ නෑ. මගේ මේ මිත්‍ර ඇලන් මහතා නොවෙන්න, ඒ දරුවන් තුන්දෙනා සහ ඔවුන්ගේ මව කුසගින්නේ මියයන්න තිබුණා. මෑතකදී මේ ප්‍රශ්නය වඩාත් උග්‍ර අතට හැරුණේ කාරණා දෙකක් නිසා.

එයින් පළමුවැනි එක; මියගිය බාල සහෝදර වික්ටර්ගේ වැඩිමහලු පුත්‍රයා ක්‍රිස්ටෝෆර් දැන් තරුණයෙක්. ඔහු නීතිය හදාරාලා, ජ්‍යෙෂ්ඨ නීතිවේදියකු යටතේ පුහුණුව ලබලා, තම වෘත්තිය පටන්ගන්න සූදානමින් ඉන්නේ. ඔහු විවාහ ගිවිසගෙන ඉන්නේ මේ ඇලන් මහතාගේ දියණිය මියුරියල් සමග. ලන්ඩනයේ ප්‍රසිද්ධ නීතිඥ සමාගමක කොටස් කරුවෙකු වීමට, ක්‍රිස්ටෝෆර්ට හොඳ අවස්ථාවක් ලැබිල තියෙනවා. ඔහුට ඒ සඳහා අඩු පාඩු ප්‍රාග්ධනයක් විතරයි. ඔහුට තම සීයාගේ දේපළින් ලැබිය යුතු

කොටස හිමිවුණා නම් එය ප්‍රමාණවත්. අපි කීප වාරයක්ම ආතර් කොලින්ස්ගෙන් එය ඉල්ලා හිටියා. ඒක අපි සෑහෙන කාලයක ඉඳලයි ඉල්ලන්නේ. නමුත් ආතර් හැමදාමත් කළේ ඒක ප්‍රතික්ෂේප කිරීම. අද උදේ ඔහු හමුවීමට අපි වෙලාවක් යොදාගත්තෙත්, මේ කාරණය ගැන ඔහු සමග සාකච්ඡාවකටයි. එතකොට දෙවැනි කාරණය තමයි......" කී නීතිඥ මහතා තම කථාව නවත්වා මඳ වේලාවක් නිහඬව සිටියේය. දෙනෙත් පියාගෙන සිටි හෝම්ස් මෙවර දෙනෙත් විවෘත කළේ නො ඉවසිල්ලෙනි.

"ඔව්. මොකක්ද දෙවැනි කාරණය?"

"ඔව් මම කියන්නම්. ඒක ටිකක් ලැජ්ජාසහගත වගේම පුදුමාකාර කතාවක්. ඔලිවර් වෙට්ට් කියන්නේ මියගිය ආතර්ගේ හිතවත්ම මිත්‍රයෙක්. ස්ථිර රැකියාවක් නොකළ ඔහු යැපුණේ ආතර්ගෙන්. ඩාබි හි අශ්වරේස් වලට ඔවුන් සහභාගී වුණේ එකටමයි.

කාලයක් ලන්ඩනයේ සමාජ ශාලාවක නළඟනක වුණු රූත් හක්ස්ලි නම් ගැහැනියක ඉන්නවා. ඇය දිගු කලක් ආතර් කොලින්ස්ගේ අනියම් බිරිඳ ලෙස සිටි බව මා කිව යුතුයි. මේ තුන්දෙනා අතරේ යම්කිසි පෞද්ගලික එකඟතාවයක් ඇතිවුණු බව අපට දැනගන්න ලැබුණා. ඒ මොකක් ද කියනවා නම්

(1) ඔලිවර් වෙට්ට් විසින් රූත් හක්ස්ලි නීත්‍යානුකූලව විවාහ කරගත යුතු බව;

(2) එම සේවය වෙනුවෙන් කොලින්ස් තමන්ගේ දේපළ තම මිත්‍රයා වන ඔලිවර් වෙට්ට්ට ලිවීමට එකඟවන බව.

නමුත් කොලින්ස් සියලුම දේපළ මිත්‍රයාට ලියන්නේ ප්‍රාණ භුක්තිය තියාගෙන බවත්, ඒ අනුව වෙට්ට්ට දේපළ ලැබෙන්නේ මිත්‍රයාගේ මරණයෙන් පසුව බවත් අපට දැනගන්න ලැබුණා."

"එතකොට මේ දේපළ පැවරීමේ ගනුදෙනුව සම්පූර්ණයෙන්ම ලියා අවසන් කරලද?"

"අවාසනාවකට වගේ එය ලියා ඉවර බව ඇත්තයි. නමුත් ආතර් කොලින්ස් ගේ ජීවිත කාලය තුළදී එහි යම් වෙනස් කම් කරන්න, නීතියෙන් ඔහුට හැකියාව තියෙනවා. අපට උවමනා වුණේ ඔහුගේ මියගිය සහෝදරයාගේ වැන්දඹු බිරිඳ සහ දරුවන් වෙනුවෙන්, සුළු කොටසක්වත් වෙන් කරන්න කියා, කොලින්ස්ගෙන් ඉල්ලා සිටින්නයි. මේ ගැන සානුකම්පිතව සලකා බලන්න කියලා

ආයාචනයක් කරන්න. ඇලන් මහතාගේ දියණිය මියුරියල් ඊයේ රාත්‍රි බොහොම රහසිගතව මෙහේ ආවා. ඇය විවාහ ගිවිසගෙන සිටින්නේ මියගිය කොලින්ස්ගේ ඥාතිපුත්‍ර ක්‍රිස්ටෝෆර් සමග බව මං ඔබට කලින් කිව්වා"

"ඒ ආයාචනයට කොලින්ස් දක්වා තිබෙන්නේ මොන වගේ ප්‍රතිචාරයක්ද?"

"ඉතා උණුසුම් ආකාරයට මියුරියල් මෙනෙවිය සමග බහින් බස්වීමක් වෙලා. අන්තිමේදී ඒක ඉතා අප්‍රසන්න ආකාරයට අවසන් වුණු බව මට අහන්න ලැබුණා"

මේ කතන්දරයට කන් දුන් හෝම්ස්ගෙන් පළවුයේ ඇඩි නිහඬභාවයකි. මිනිත්තු කිහිපයකට පසු ඔහු නිවස අසල බොරලු පාරේ ඉහළ පහළ සක්මන් කිරීමට පටන්ගත්තේය. තම දෑත් පසුව ඉදිරියෙන් එකිනෙක පටළවා ගෙන, මුහුණ පහතට යොමු කරගෙන ඔහු ඇවිද්දේ, යම් නිශ්චිත සිතිවිලි මඟකට පිවිසීමෙන් යයි මට සිතිණ. ඔහු මුහුණ පහතට යොමුකරගෙන, දෙනෙත් හොඳින් විවෘත කරගෙන ඇවිද ගිය ආකාරය, නිතර දකින්නට ලැබෙන ඉරියව්වක් නොවේ. පොළොවේ බොරලු හා තණ පඳුරු අතරේ යමක් දැකීමේ අරමුණෙන් ඔහු ඇවිද්දා යයි, කෙනෙකු සිතන්නට ඉඩ තිබිණි.

"මේ ඔලිවර් වෙට්ට් කියන්නේ මොන වගේ පුද්ගලයෙක්ද?" අන්තිමේදී හෝම්ස් විමසුවේය. "පැහැදිලිවම ඔහු බොහොම පහත් පෙළේ තක්කඩියකු බව ඇත්තයි. නමුත් ඔහු නූගත්, මෝඩ පහේ, මත්පැනට ඇබ්බැහි වූ කෙනෙක්ද?"

"කොහොමටවත් නෑ හෝම්ස් මහත්මයා" ඇලන් මහතා පිළිතුරු දුන්නේය. "ඔහු තක්කඩියකු බව ඇත්තයි. නමුත් නූගතෙකු වත් මෝඩයෙකු වත් නෙවෙයි. ඔහු කලකට පෙර දක්ෂ යාන්ත්‍රික ඉංජිනේරුවෙක්. දුම්රිය එන්ජින් නිෂ්පාදනය කරන කම්හලක ඔහු කාලයක් සේවය කළා. එහන ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවකුට පහරදීම නිසා වෙට්ට් රැකියාවෙන් නෙරපනු ලැබුවා. ඉන්පසු කාලයක් කර්මාන්තශාලා වල කාර්මික උපදේශකවරයකු වශයෙන් සේවය කළ බවත් අහන්න ලැබුණා. නමුත් තමන්ගේ කාලය සූදුවට යොදවන්න පටන්ගත්තාම, ඒ රැකියා අහිමිවුණාලු. අනික ඔලිවර් වෙට්ට් කොලින්ස්ගේ ආශ්‍රයට වැටුණට පසු, රැකියාවක් කර මුදල් ඉපයීමේ උවමනාවක් එන්න නැහැ. නමුත් සූදුව නිසාම මේ කාලයේ ඔහුට හුගක් අගහිඟ බව අපට හිතාගන්න පුළුවනි"

"ඔහුගේ පෙනුම කොහොමද?"

"මට ඔහු දකින්න ලැබී තිබෙන්නේ එක් වරක් පමණයි" ඇලන් මහතා කීය. "මට මතක හැටියට ඔහු කෙට්ටු මිටි, සුදුමැලි පෙනුමක් ඇති කෙනෙක්. උඩු හා යටි රැවුල් සියල්ලම මුඩු කරලා. ඔහුගේ වම් අත කලකට පෙර අනතුරකට ලක් වී තිබෙනවා. ඒ නිසා වම් අතේ මැදගිල්ල කැඩී ගොස් එහි අඩුව මා දුටුවා."

"කොහේද ඔහුගේ පදිංචිය?"

"නොරිච් ප්‍රාන්තයේ රයිස්හැම්වල. ලිපිනය වින්ටර් ග්‍රේන්ජ්, රයිස්හැම්." වැලන්ටයින් මහතා පිළිතුරු දුන්නේය.

"ඔබ අපේක්ෂා කළ තොරතුරු සියල්ල ඔබට ලැබුණාද? අප දෙදෙනා දැන් ඔබගෙන් සමුගත යුතුව තිබෙනවා" නීතිඥ වැලන්ටයින් මහතා කීය.

අපට අතට අතදී ඔවුහු පිටවී ගියහ. මගේ මිත්‍රයා නිවස අසල වූ කුඩා මල්පාත්ති දෙස පරීක්ෂාවෙන් බලමින් ඇවිදීමට පටන්ගත්තේ කල්පනාවකට වැටෙමිනි.

"පුදුමාකාර ඒවගේම සිත් ඇදගන්නාසුලු අබිරහසක් වොට්සන්" ඔහු කීය. "මට හොඳටම විශ්වාසයි. පොලිස් පරීක්ෂකවරයා ලුහුබඳින්නේ සම්පූර්ණයෙන්ම වැරදි පුද්ගලයින් පසුපස. ඔහු මංසන්ධියකදී වැරදි පැත්තකට හැරුණා. ඒක එයාගෙ ප්‍රශ්නයක්. මට කමක් නෑ. ආ මේ එන්නේ ගොඩනැගිල්ල භාර සේවකයා. මෙයා මේ එන්නේ අපෙන් අලුත්ම තොරතුරු දැනගන්න. නමුත් මට උවමනා කරන්නේ......."

අප වෙත පැමිණි සේවකයාට සිනාවකින් සංග්‍රහ කළ හෝම්ස් ඔහුට ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය.

"අර තට්ටු ගෙවල් තියෙන ගොඩනැගිල්ල මුහුණ දල තියෙන්නෙ මොන පාරට කියලද ඔබ කිව්වෙ?"

"වැප්මන් වීදියට මහත්මයා. ඒව ඔක්කෝම වගේ නොයෙක් කාර්යාල. ඒක හැඳින්වෙන්නේ හැම්ඩන් කෝට් නිවාස කියල"

"එතකොට ඒවල අංක මොනවද? උදාහරණයක් වශයෙන් අර දැනටත් දෙවැනි තට්ටුවේ, ජනේලයක් විවෘත ගෙයක් තියෙනවානේ. ඒකෙ අංකය මොකක්ද?"

"ඒක අංක හය. කොලින්ස් මහත්මයාගේ ගෙදර කෙළින්ම තියෙන තට්ටු ගෙය අංක අට"

"හැබෑට? ඔබට ස්තුතියි." හෝම්ස් කීය. "ඒක නෙමෙයි මිත්‍රයා. මට හරි ඇබැද්දියක් වුණා. මගේ උපකරණයකට අයිති ලෝහ තහඩු

කෑල්ලක්, උඩ තට්ටුවේ ජනේලයකින් පහළ පඳුරු අතරට වැටුණා. ඒකෙ හැඩය මෙන්න මේ වගෙයි. ප්‍රමාණයත් මේ තරම්"

තම ආගන්තුක පතක් අතට ගත් හෝම්ස් එය පිටුපස කවයක් ඇන්දේය. එය මැද කුඩා ෂඩාස්‍රයක් ඇඳ, පැන්සලෙන් අඳුරු කළේය. "එය ගනකමින් හුඟක් අඩු රවුම් කාසියක් වගෙයි. මැද තියෙනවා මේ හැඩේ - ඒ කියන්නේ ෂඩාස්‍රාකාර සිදුරක්. කොහේ වැටුණද මං දන්නෙ නෑ" කී හෝම්ස් කාඩ්පත සේවකයා අතට දුන්නේය. "උද්‍යානයේ වැඩකරන සේවකයාට කියන්න මේක ගැන බලන්න. කියලා. ඒකෙන් වෙන කෙනෙකුට ඇති ප්‍රයෝජනයක් හෝ වටිනාකමක් නෑ. නමුත් මට ඒක හුඟාක් වටිනවා. ඔහුට කියන්න මේක හොයල දුන්නොත්, මං රත්තරන් පවුමක් තෑගි දෙනවා කියල"

සේවකයා තම හිස්වැස්ම ඔසවා හිස නමා අපට ආචාර කළේය. අපි එතැනින් ඉවත් වී ආවෙමු. මඳ දුරක් වීත් ආපසු හැරී බැලූ මා දුටුවේ, සේවකයා පඳුරු හා තණකොළ අතර පහුරුගාමින්, තම සෙවීම අරඹා ඇති අයුරුය.

හෝම්ස්ගේ මෙම ක්‍රියාව මට තේරුම් ගැනීමට හැකි නොවූ ගැටලුවක් විය. හෝම්ස්ගේ උපකරණයක කොටසක් ජනේලයෙන් ඉවතට වැටෙන ආකාරයක් මම නුදුටුවෙමි. ඔහු වටිනා දෙයක් එලෙස ඉවතට වැටෙන ආකාරයට කටයුතු කරන්නෙකු ද නොවේ. අප ඉදිරියට ඇවිද යද්දී, ඒ ගැන ඔහුගෙන් විමසීමට මම සූදානම් වූයෙමි. නමුත් ඔහු කළ ප්‍රකාශය නිසා මගේ විමසුමට බාධා ඇති විය.

"වොට්සන්. අපි ගිහින් වැප්මන් වීදියේ නිවාසවල පදිංචිකරුවන්ගෙනුත් විමසල බලන්න ඕන."

අප පැමිණියේ හැම්ඩන් කෝට්හි අංක හය දරණ නිවස වෙතය. එහි තට්ටුවල පදිංචිකරුවන්ගේ නාම ලේඛනය, බිත්තියේ වූ පුවරුවක අලවා තිබිණි.

"තුන්වැනි තට්ටුව" ඔහු කියවීය. "ජෝන් ස්ලේටර් මහතා - කොටස් වෙළඳපළේ තැරැව්කරු. හ්ම්! මං හිතන්නෙ අපි ගිහින් මේ ස්ලේටර් මහත්මයාගෙන් විමසලා බැලුවොත් හොඳයි"

ගල්වලින් තනා තිබූ පියගැට පෙළ දිගේ අපි ඉහළට නැඟුණෙමු. ස්ලේටර් මහතාගේ කාර්යාලයේ දොර අගුළු දමා වසා තිබිණි. ඔහු පැමිණෙන වේලාවක් ගැන කිසිදු සඳහනක් නොවීය. අපි පහළ තට්ටුවට බැස එහි වූ කාර්යාලයෙන් විමසා බැලුවෙමු.

"ස්ලේටර් මහත්තයා ඉන්න වෙලාවක් මට හරියටම කියන්න බැහැ" පුවත්පත් දැන්වීම් භාරගන්නා එම කාර්යාලයේ සේවකයා කීය. "එතන වැඩට ඉලන්දාරියෙක් ඉන්නවා. මේ වෙලාවෙ එයා දොර වහල දාල කෑමට ගිහිං වෙන්න ඇති. තව පැය දෙකකින් විතර ආවොත් සමහරවිට ඔහු හම්බවෙන්න පුළුවන් වේවි. හරියටම කියන්න නම් අමාරුයි"

අපි ඔහුට ස්තුතිකොට එතැනින් පිටත්ව ආවෙමු.

"දහවල් කෑම වෙලාවත් පැනලා. දැන් අපට කරන්න තියෙන්නේ කොහෙන් හරි කෑම ටිකක් කාල ආපහු ගෙදර යන එකයි." ඇඩි කුසගින්නේ සිටි මම හෝම්ස්ට කීවෙමි. "හැන්දෑවෙලා අපි ආපහු එමු"

මගේ මිත්‍රයා ඒ යෝජනාවට එකඟ විය.

උදේ කෑම වේලද හරි හැටි ගැනීමට අවස්ථාවක් නොතිබූ බැවින්, මෙවැනි අපහසුවක් දැනීමේ පුදුමයක් නොවීය. වෙස්ට්මින්ස්ටර්හි අවන්හලකින් දිවා භෝජනය ගෙන බේකර් වීදියේ නිවහනට ආපසු ආවෙමු. එවිට සවස හතරට ළංවී තිබිණ. පැයක පමණ විවේකයක් ගෙන, යළිත් වරක් පරීක්ෂණය සඳහා යාමට මගේ මිත්‍රයා යෝජනා කළේය.

කෙටි නින්දක් නිදා ගැනීමේ අරමුණෙන් මම ඇඳේ වැතිරුණෙමි. මා අවදිවන විට සවස පහමාර පමණ වී තිබිණ.

මා වෙත කෙටි ලියුමක් ලියා තබා, හෝම්ස් නිවසෙන් බැහැර ගොස් සිටියේය.

"පරීක්ෂණයේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීම සඳහා යළිත් වික්ටෝරියා වෙත යමි."

ඔහු යළිත් වරක් නිවස වෙත පැමිණෙන විට ඇඳිරි වැටෙන්නට පටන් ගෙන තිබිණි.

"ඔබට තදින්ම නින්ද ගිහින් තිබුණා වොට්සන්" හෝම්ස් කීය. "ඔබව අවදි කරන්න මට හිතුණෙ නෑ. ඒ මොකද මගේ ගමනෙන් සාර්ථක ප්‍රතිඵල ලැබේවි කියල මගේ විශ්වාසයක් තිබුණෙ නෑ"

"හමුවෙන්න ගිය පුද්ගලයා ඔබට හමුවුණාද?" මම විමසුවෙමි.

"කවුද ජෝන් ස්ලේටර්ද? ඔහු හමුවුණේ නෑ. නමුත් ඔහුගේ සේවකයා හමුවුණා"

"ඒකෙන් ප්‍රයෝජනයක් වුණාද?"

"ප්‍රයෝජනයක් වුණා කියල හිතන්න අමාරුයි. ස්ලේටර් මහත්මයා දින දෙක තුනකට එන එකක් නෑ කියල සේවකයා කිව්වා."

"ඔබ කොහොමද දන්නෙ?" මං විමසුවා.

"ඔහු මට ලියුම් කැල්ලක් ලියල තියල ගිහිං තිබුණා. මේ බලන්න" කියූ ළමයා මට එය පෙන්නුවා.

ඒක ලියල තිබුණේ රතු පාට තීන්තෙන්.

"ඇයි ඔහු රතු තීන්ත යොදාගෙන තියෙන්නේ?" මං ඇහුවා.

"ඊයෙ හෝ පෙරේදා මා අතින් තිල් තීන්ත කුප්පිය බිඳුණා."

"ස්ලේටර් මහත්මයා හමුවෙන්න මං ආවෙ ඇයි කියල දන්නවද? මං දැන අඳුනන ජෝන් ස්ලේටර් කියල මහත්මයෙක් ලන්ඩනයේ හිටියා. මේ ඔහුද කියල දැනගන්නයි මට උවමනා. ඔහු ටිකක් කළු, කෙට්ටු උස කෙනෙක්ද? ඔහු රැවුළ සම්පූර්ණයෙන්ම මුඩු කළ කෙනෙක්"

"ඔබ ඔය කියන්නෙ අපේ ස්ලේටර් මහත්මය ගැන නම් වෙන්න බෑ" ළමයා කිව්වා. "ඔහු කෙට්ටු බව ඇත්තයි. නමුත් ඔහු උසත් නෑ. කළුත් නෑ. ඔහුට යටි රැවුළක් තියෙනවා. අනික ඔහු උපැස් යුගළක් පළඳිනවා. ඔහුගේ කොණ්ඩය නම් බොරු කොණ්ඩයක් කියලයි මට හිතෙන්නෙ"

"ඔබ කොහොමද ඒක දන්නෙ?"

"මගේ තාත්තාත් බොරු කොණ්ඩයක් පළඳින කෙනෙක්. ඒ නිසා මට තේරුම් ගන්න පුළුවනි. බොරු කොණ්ඩවල තියෙන්නෙ ඇත්ත කෙස්ගස් නොවෙයිනෙ. ළඟට බැලුවාම ඒක පෙනෙනවා"

"මගේ මිත්‍රයාගේ වම් අතේ සුළු ආබාධයක් තියෙනවා" මම කිව්වා.

"අපේ ස්ලේටර් මහත්මයා එක් අතකට අත් ආවරණයක් පළඳිනවා. ඒත් ඒ වම් අතට ද දකුණු අතට ද කියා මට මතක නෑ. කොහොම වුණත් ඔහුගේ වම් අතේ ආබාධිත බවක් මම නම් දැකල නෑ. ඔබ කවුරුන් කියාද මහත්මයාට කියන්නෙ?"

"මං ලියුම් කැල්ලක් ලියා දෙන්නම්" මං කිව්වා. "මට ලියුම් ලියන කඩදාසි කැල්ලක් සහ පෑනක් දෙන්න"

ඔහු සටහන් ලිවීමට ගන්නා බාල කඩදාසි පැකට්ටුවක් අරගෙන එයින් එකක් මට දුන්නා. ඒ වර්ගයේම ලියුම් කවර පැකට්ටුවකින් ලියුම් කවරයකුත් දුන්නා. තීන්ත බෝතලයේ අඩියේ ඉතිරි වී තිබූ තීන්තවලින් මම සටහනක් ලිව්වා. ඒක සේවක ළමයා අතට

දෙන්න සූදානම් වෙලත්, ආයෙමත් ඒක සාක්කුවේ දමා ගත්තේ මෙහෙම කියමින්.

"එක අතකින් ලියුමක් අවශ්‍ය නෑ. එඩ්වින් කුසැක් කියල මහත්මයෙක් ඔහු හමුවෙන්න ආ බව, ඔබේ මහත්මයට කියන්න. මං තව දින දෙක තුනකින් එන්නම්."

හෝම්ස්ගේ මේ ක්‍රියා කලාපය ගැන මම තරමක පුදුමයකට පත්වූයෙමි. වැප්මන් වීදියට මුහුණ දා ඇති නිවාසවල පදිංචිකරුවෙකු හමුවීමට හෝම්ස්ට උවමනා වූයේ ඇයි? ඒ කලින්දා රාත්‍රියේ තේම්ස් මැන්ෂන්ස් නම් කොලින්ස්ගේ තට්ටු නිවාසය ගැන අසාමාන්‍ය යමක් දුටුවේ දැයි විමසීමටය. එහෙත් ආපසු වෙස්ට් මින්ස්ටර් වෙත ගිය ඔහුට එම කාර්යය අමතක වී ඇති බව් මම දුටුවෙමි. මේ ගැන ඔහුගෙන් වැඩිදුර විමසීමට උත්සාහ කළත් එය සාර්ථක නොවීය. මේ ගැන කථා කිරීමට ඔහුගේ කැමැත්තක් නොතිබූ බැව් මම තේරුම් ගතිමි.

රාත්‍රි ආහාරයෙන් පසු තම බ්‍රයර් පයිප්පය දල්වා ගත් මගේ මිත්‍රයා, හාන්සි පුටුවේ වැතිරී කල්පනා කිරීමට පටන් ගත්තේය. පයිප්පයෙන් නිකුත් වූ දුමේ ද තිබුණේ සුගන්ධවත් බවකි. එවේලේ පොතක් කියවීමට උත්සාහ කළ මට, එයින් ගැහැටක් නොවීය. මඳ වේලාවක් ගතවූ පසු ඔහු තමාගේ වයලීනය දෙන මෙන් මගෙන් ඉල්ලා සිටියේය.

බේකර් වීදියේ අපේ නිවහනේ විසිත්ත කාමරයේ එක් මුල්ලක්, මේ වයලීනය තැබීමට වෙන්කොට තිබිණි. වයලීනය දමා තිබූ පෙට්ටියෙන් එය ඉවතට ගෙන මගේ මිත්‍රයා අතට දුන්නෙමි.

"ඔබ දන්නවද වොට්සන් මේ වර්ගයේ වයලීනයට, ඒ නම ලැබුණෙ කොහොමද කියල?"

"මං දන්නෙ නෑ"

"ඉතාලියේ ජීවත්වුණා ඉතා ශ්‍රේෂ්ඨ වයලීන නිෂ්පාදකයෙක්. ඔහු අන්තෝනියෝ ස්ට්‍රැඩිවේරියස්. ඔහුගේ අති විශිෂ්ටතම නිර්මාණය තමා මේක. මේ තරම් මියුරු සංගීතයක් නැඟිය හැකි වයලීනයක් තවත් ලෝකෙ කොහේවත් නිෂ්පාදනය කරලා නෑ. ක්‍රිමෝනා හා අමටි වයලීන උසස් බව ඇත්තයි. නමුත් මගේ ආදරය දිනාගත් වයලීනය මේකයි. ඔබට මතකද මං කිව්වා ගිනි 500 ක් පමණ වටිනා මේ වයලීනය, මං මිලට ගත්තේ සිලිං 55 කට බව? ඔව්. ටොටින්හැම් කෝට් පාරෙන් මට අත්වුණු ඒ වාසිය, මට ජීවිතේට අමතක වෙන්නෙ නෑ"

ඔහුගේ මුවින් පිටවූ ඒ කතන්දරය මම මීට පෙරද කිහිප වරක් අසා ඇත්තෙමි. ඔහු එය යළි පැවසුවේ මා දැනුවත් කිරීමට නොව, සිතේ ඇතිවූ සතුට මා සමග බෙදා හදා ගැනීමට බැව් මම තේරුම් ගතිමි. හෝම්ස් මීළඟට තම වයලීනය ඉතා මියුරු ලෙස වාදනය කිරීමට පටන් ගත්තේය. මගේ සියලු කටයුතු පසෙකට ලා මම ඊට කන්දුන්නෙමි. සවස් වරුවේ තමාට ලැබුණු අත්දැකීම් ගැන කථාව මීළඟට ඇරඹීම ස්ථිර බැව් මම දැන සිටියෙමි.

"අද හැන්දෑවෙ මම තවත් සැරයක් කොලින්ස් පදිංචිව සිටි තේම්ස් මැන්ෂන්ස් අසල හැම්ඩන් කෝට් තට්ටු නිවාසය වෙත ගියා" හෝම්ස් කීවේ තම සංගීත භාණ්ඩය පසෙකින් තබමිනි. "මට හමුවුණා ඒ ගොඩනැගිල්ල භාර මුරකාරයා."

"මං උදේ ආවා අංක 6 දරන නිවසේ ජෝන් ස්ලේටර් මහත්මයා හමුවෙන්න" මං කිව්වා. "නමුත් ඔහු හමුවුණේ නෑ. ඊළඟට මීට පැය බාගයකට විතර කලින් ඔහුගේ සේවක ළමයා හමුවුණා. ස්ලේටර් මහත්මයා හමුවිය හැකි වෙලාවක් හෝ දවසක් ගැන, සේවකයා දැනගෙන හිටියෙත් නෑ. ස්ලේටර් මහත්මයා ආපහු එන දවසක් ඔබටවත් කිව්වෙ නැද්ද?"

"ඔබ කොටස් වෙළඳපොළේ.......?" ඔහු සූදානම් වුණේ මගෙන් යමක් විමසන්නට.

"අන්න හරි. මං ස්ලේටර් මහත්මයා හමුවෙන්න ආවේ කොටස් වෙළඳපොලේ කොටස් මිලදී ගන්න." මං කිව්වා.

"හැබෑට? ඔහු අද උදෙන්ම පිටත්වී ගියා නේ. මං හිතන්නේ උදේ අටහමාර වෙද්දි ගියා"

"ඒ තරම් උදෙන්ම? එහෙම නම් ඔහු අද කන්තෝරුවට එන්න ඇත්තේ හුඟක් පාන්දරින්ම වෙන්න ඇති?" මං ඇහුවා.

"එහෙම වෙන්න ඇති මහත්මයා. ඔහු ආවෙ කීයටද කියලා මං දුටුවෙත් නෑ"

"ඔහුගේ ගමන් බඩුත් හුඟක් තිබුණද?"

"ඔව් මහත්මයා. ඔහු රෝද හතරේ ලොකු කුලීරියක් ගෙන්වා ගෙන තමා බඩු පටවා ගත්තේ"

"මොනවද ඔය තරම් බඩු?"

"ඔහුගේ රැකියාව සම්බන්ධ ඒවා ද ඇඳුම් ද මන්දා. ලොකු හතරැස් පෙට්ටියක් තිබුණා, අඩි පහක් විතර දිග. පළලෙන් අඩු සිහින් පෙට්ටියක් තිබුණා. ඒ බඩු පටවාගන්න මාත් ඔහුට උදව් කළා"

"ස්ලේටර් මහත්මයා මෙහේ පදිංචියට ඇවිත් හුඟක් කල්ද?"

"එච්චර කල් නෑ. මාස එක හමාරක් වෙන්න ඇති."

"ඔබට ස්තුතියි. එහෙනම් මං ඔහු හමුවෙන්න වෙනත් දවසක එන්නම්"

මං එතැනින් පිටවී ඇවිත් ඒ හරියේ රෝද හතරේ කුලීරියක් නවත්වාගෙන හිටි කුලීරියදුරෙකු හමුවුණා. ඔහු සමග කතාබහ කළත් ඒ හැටි තොරතුරක් දැනගන්න හැකිවුණේ නෑ. මට උවමනා වුණේ නිව් ඔක්ස්ෆඩ් වීදියේ වෙළඳ සලකට යන්න. නමුත් හවස් වෙනකොටම ඒවා වහල දමන නිසා, එහි යාමෙන් වැඩක් නෑ. මං බලාපොරොත්තු වෙනවා හෙට උදේ ඒ පැත්තට යන්න. ඔබත් කැමතිද මා එක්ක එන්න?"

මගේ මිත්‍රයා දැන් ගමන් කරන්නේ කුමන මාර්ගයකද යන්න මට කිසිසේත් තේරුම් ගැනීමට නොහැකි විය. හෝම්ස් වෙත ප්‍රශ්න කිහිපයක් යොමු කළත්, ඔහුගෙන් පැහැදිලි පිළිතුරක් මට නොලැබිණි. අභිරහසක් විසඳීමේදී තමා කිරීමට බලාපොරොත්තුවන කටයුතු, කල් තබා පැහැදිලි නොකිරීම මගේ මිත්‍රයාගේ සිරිතකි. ඒ බැවි මම දැන සිටියෙමි.

පසුවදා උදයේ කුලීරියක නැගී අපි නිව් ඔක්ස්ෆඩ් වීදියට ගියෙමු. "නවලොවට නව ලෝහ" යනුවෙන් නාම පුවරුවක් ප්‍රදර්ශනය කළ වෙළඳ ආයතනය අසල රිය නවත්වන ලදී. විශාල සාප්පුවක් වූ එහි ප්‍රදර්ශන කවුළුවල තිබුණේ, මා නිතර දැක නොතිබූ භාණ්ඩය. ලියවන පට්ටල් යනුවෙන් හඳුන්වන නවීන යන්ත්‍ර, ලෝහ කැපීමට හා විදීමට ගන්නා අලුත් මාදිලියේ ඩ්‍රිල් යන්ත්‍ර, ඒවාට යොදන විවිධ ප්‍රමාණවල කටු, නොයෙක් වර්ණ ගත් ලෝහ කුට්ටි හා පොලු ආදී දහසකුත් එකක් දැ එහි තිබිණ. මා එතැන බලා සිටියදී හෝම්ස්, වෙළඳසල ඇතුළටම නොපෙනී ගියේය. පැය කාලකට පමණ පසු ඔහු එළියට පැමිණියේ තරමක් ලොකු පාර්සල් දෙකක් ද අතැතිවය. මම පුදුමයෙන් මෙන් ඒ දෙස බැලීමි.

"මගේ මිත්‍රයා ජැක් හාඩ්වික්ට ගෙනියන තෑග්ගක්" හෝම්ස් සිනාවෙමින් කීවේය. "මෙතන තියෙනවා ලෝහ කුට්ටි කිහිපයක්. හාඩ්වික් දන්නවා මට උවමනා කරන්නේ මොන වගේ දේවල්ද කියලා"

ජැක් හාඩ්වික් යනු රෝඩ්ස් විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු අංශයේ සේවය කළ කථිකාචාර්යවරයෙකි. හෝම්ස්ට ඔහු හඳුනා ගැනීමට

ලැබුණේ අවුරුදු කිහිපයකට පෙරය. ඒ හාඩ්වික්ගේ පෞද්ගලික පර්යේෂණාගාරයේ සිදු වූ සොරකමක් හෙළි කර ගැනීමට, මගේ මිත්‍රයාට හැකිවූ අවස්ථාවේදීය.

හෝම්ස් මීළඟට මිලදී ගත්තේ මා වඩාත් විස්මයට පත් කළ දේවල්ය. අපි හෝල්බෝන් දෙසට ඇවිදගෙන ගියෙමු. පෞරාණික බඩු හා ලී බඩු විකුණන තැනක ප්‍රදර්ශන කවුළුවේ දිස් වූ යමක් වෙත, ඔහුගේ අවධානය යොමු විය. 1870 වසරේදී සිදු වූ ඛේදවාචකය ගැන ඔබට මතක ඇතැයි සිතමි. එකල ප්‍රංශ ජාතිකයන් භාවිත කළ යල් පැනගිය කුඩා ගිනි අවි රැසක් මෙහි විකිණීම සඳහා තබා තිබිණි. ආයුධ ප්‍රිය කරන අය මේවා මිලට ගත්තේ අරුමෝසම් බඩු ලෙස නිවාස අලංකාර කිරීමටයි. වෙළඳසල තුළට ගිය ඔහු එළියට ආවේ මිලට ගත් භාණ්ඩ දෙකක් අතැතිවය. එකක් දිගින් වැඩි වූ අසිපත් - බයිනෙත්තුවකි. අනෙක පැරණි වැසිපොට් රයිෆලයකි.

"මේ විදියට අවි ආයුධ රැස් කිරීමේ අරමුණ මොකක්ද?" මා හෝම්ස්ගෙන් විමසුවේ අප ග්‍රීන් පටුමග දෙසට හැරෙද්දීය.

"නිවාසවලට ආරක්ෂාව ලබා ගැනීම" ඔහු පිළිතුරු දුන්නේය. " පතරොම් තුවක්කුවකින් අහසට වෙඩිල්ලක් දෙකක් තැබුවාම, එළියට පෙනෙන විධියට භයානක අසිපතක් ප්‍රදර්ශනය කළාම, නිර්භය හොරෙකුගේ සිතේ වුණත් චකිතයක් ඇතිවෙනවා."

ඔහුගේ පිළිතුරෙන් මට සිනාපහළ විය. කෙසේ වෙතත් ඔහු මේ උත්සාහ දරන්නේ තේම්ස් මැන්ෂන්ස්හි අභිරහස විසඳීමට බැව් මම තේරුම් ගතිමි.

මා ෂර්ලොක් හෝම්ස්ගේ අපරාධ පරීක්ෂණ කටයුතුවලට සහාය වුණු බැව් සැබෑය. එහෙත් වෛද්‍ය විද්‍යාව සමග මගේ තිබුණු බැඳීමෙන් මම නොමිදුණෙමි. වෛද්‍ය සම්මන්ත්‍රණවලට මම හැකි සෑම අවස්ථාවකම සහභාගි වූයෙමි.

තමා මිලදී ගත් ලෝහ ද්‍රව්‍ය සමග, සවස් වරුවේ හාඩ්වික් හමුවීමට යොදාගත් බැව් හෝම්ස් මා සමග කීය. එබැවින් මම සවස් වරුවේ වෛද්‍ය පුස්තකාලයට යාමට තීරණය කළෙමි. එම වැඩ කටයුතු අවසන් වී මා ආපසු නිවහනට එද්දී රෑ බෝවී තිබිණ. අපේ නිවස බලා යමින් සිටි නීතිඥ වැලන්ටයින් මහතා මට හමුවූයේ ඩෝසෙට් වීදියේ මංසන්ධිය සමීපයේදීය.

"ෂර්ලොක් හෝම්ස් මහත්තයා විදුලි පුවතකින් මාව කැඳවලා තිබුණා" නීතිඥයා කීය. "ඔහු කියල තිබුණා අත් අකුරු සාම්පලයක් ගෙනත් දෙන්න කියලා"

අප නිවසට ළඟා වන විටත් හෝම්ස් සිටියේ, විසිත්ත කාමරයේ මේසය අසලයි. අපරාධය සඳහා යොදා ගත් ආයුධය අපේ මේසය උඩ තිබෙනු දැක මම පුදුමයට පත්වූයෙමි.

"ඔබ ඉල්ලා තිබූ අකුරු සාම්පලය මට හමුවුණා" නීතිඥ මහතා කීය. "ඒක හොයාගන්න හැකිවේවි කියල මං හිතුවෙ නෑ. නමුත් වාසනාවකට වගේ ඒ අදාල පාර්ශවයෙන් ඇලන්ට ලැබුණු ඒ ලියුම ඔහු පරෙස්සම් කරල තිබුණා"

නීතිඥ වැලන්ටයින් සාක්කුවෙන් ගත් ලියමන, හෝම්ස් අතට ගත්තේ සතුටෙනි.

"ඒක තෙමෙයි හෝම්ස් මහත්මයා" නීතිඥවරයා පැවසුවේ මේසය උඩ තිබූ කිණිස්ස අතට ගනිමිනි. "මං හිතාගෙන හිටියේ මේක පොලිස් පරීක්ෂක මහත්මයා අරගෙන ගියා කියල"

"අපරාධයට යොදා ගත්තු සැබෑ ආයුධය, ඔහු පොලීසියට ගෙන ගිය බව ඇත්තයි" හෝම්ස් කීය. "මා ඇඳගත් රූප සටහන් අනුව අද හවස මේක නිර්මාණය කළේ, ජැක් හාඩ්වික් මහත්මයා. මේක ඔහුගේ විශිෂ්ට නිර්මාණයක්. මා කළේ රූප සටහන හා මිමි ඔහුට දීම පමණයි......."

හෝම්ස්ගේ කථාවට බාධාකරන ශබ්දයක් අපට එළියෙන් අසන්නට ලැබිණ. වේගයෙන් ආ අශ්ව කරත්තයක් අපේ නිවහන ඉදිරියේ නැවැත්වූ හඬත්, එයින් බට කෙනෙකු අපේ පියගැට පෙළ ඉහළට දුව ආ ශබ්දයත් අසන්නට ලැබිණ. මම දොර විවෘත කෙළෙමි. හති දමමින් කාමරය තුළට කඩා වැදුණේ ඩේවිඩ් ඇලන් මහතාය.

"මේ අහන්න වැලන්ටයින්. හරිම භයානක දෙයක් තේ සිද්ධවුණේ" ඇලන් මහතා කීවේ අමාරුවෙන් හුස්ම අල්ලමිනි. "මිනීමැරුම සම්බන්ධයෙන් ඔවුන් මගේ දූව මියුරියල්ව සිරභාරයට ගත්තා. පොලිස් පරීක්ෂක හෙඩිංලි අපේ ගෙදරට ඇවිල්ලයි ඒ විදියට කළේ. දෙවියනේ මේක නම් මහ අපරාධයක්. මට පිස්සු හැදේවි"

"කලබල වෙන්න එපා ඇලන් මහත්මයා" ඔහුගේ උරහිස මත අත තබා සනසවමින් හෝම්ස් කීය. "මේ අපරාධයට ඔබේ දූව පැටලෙන්න කිසිම ක්‍රමයක් නෑ........ මං හිතන්නේ ඇයත් වමත් කාරියක වෙන්න ඇති?"

"ඔව් මහත්මයා. ඒක හරි භයානක අහඹු සිදුවීමක්. හිතන්න. ඔවුන් ඇයව අරගෙන ගියේ හිරගෙදරට දාන්න. අනේ දෙවියනේ! මගේ අසරණ මියුරියල්!"

"භයවෙන්න එපා මහත්මයා" හෝම්ස් කීය. "අපි පුළුවන් ඉක්මනින් ඇයව නිදහස් කරගමු."

ඒ මොහොතේ තවත් කවුදෝ පියගැට පෙළ නැග ආ හඬක් සහ දොරට තට්ටු කළ හඬ අසන්නට ලැබිණ. මම දොර විවෘත කළෙමි. පැමිණ සිටියේ පොලිස් පරීක්ෂක හෙඩිංලිය. ඔහු දුටු වහාම අප නිවසෙන් පිටවී යාමට ඇලන් මහතා තීරණය කළේය.

"ඇලන් මහත්මයා. මට තියෙනවා ඔබ සමග කතා කරන්න කාරණා රැසක්." හෝම්ස් කීය. "කරුණාකරල ඔබට පුළුවන්ද තව පැයකින් ආපහු එන්න? එනව නේද? මං හිතන්නේ ඒ වෙනකොට ඔබට සහනයක් ගෙනෙන ආරංචියක් දෙන්න අපට පුළුවන් වේවි"

ඊට එකඟත්වය පළ කළ ඇලන් මහතා පිටවී ගියේ, අතිශය කම්පාවට පත් මුහුණෙනි. හෝම්ස් තම අවධානය පොලිස් නිලධරයා වෙත යොමු කළේ එවිටයි. "හෙඩිංලි. ඔබ මේ අභිරහස විසඳන්න අවිවේකීව කටයුතු කරල පාටයි......." හෝම්ස් කීය.

"මං නිකං හිටියේ නෑ හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඇලන් මෙනෙවියට විරුද්ධ සාක්ෂි දැනටම සෑහෙන්න තියෙනවා. මියගිය පුද්ගලයා සමග අන්තිමට සාකච්ඡාවක් පවත්වලා තියෙන්නේ ඇය; ඒ සාකච්ඡාව ඉවර වුණේ සණ්ඩු සරුවල් සහ තර්ජන සමග බව අපට අහන්න ලැබුණා. ඇය වමත් කාරියක්. මිනීමැරුම සිදුකළ තැනැත්තා වමත හුරු කෙනෙකු බවයි කාගේත් නිගමනය වුණේ."

"වෙන මොනවද?"

"මං අර ඉතාලි ජාතිකයන් හමුවුණා. ඒක සම්පූර්ණයෙන්ම රඟ දැක්වීමක්. වැන්දඹු ස්ත්‍රීන් අඳින ඇඳුමකින් සැරසිලා, මුහුණ වේල් පොටකින් වහගෙන ඉඳපු ගැහැනු කෙනෙක්, මෙයාලට මුදල් ගෙව්වලු. ඒ මොකටද? ගොඩනැගිල්ලෙන් එළියේ පාරෙ - පදික වේදිකාවෙ ඉඳගෙන අර රඟදැක්වීම කරන්න. සේවකයා අතට දුන්නු ලියුමත් ඔවුනට දීල තියෙන්නේත් ඇය. ඒ කාන්තාව

හඳුනාගැනීමක් තවමත් ඔවුන් අතින් සිදු කෙරුණෙ නෑ. ඒ වුණත් ඔවුන් කළ විස්තරයේ හැටියට, ශරීර ප්‍රමාණයෙන් ඇය සමාන වෙන්නේ කාටද දන්නවද? ඇලන් මෙනෙවියට"

"ඇය ඔය අපරාධය සිදුකළා කියල හිතමු. නමුත් ඇය කොහොමද දොර ඇතුළතින් අගුළු දමාගෙන, ඒ විසිත්ත කාමරයෙන් පිටවුණේ?"

"අන්න එතැන තමා ප්‍රශ්නෙ තියෙන්නෙ" හෙඩිංලි කීවේ පරාජිත සිනාවක් මුවගට නැගෙද්දීය. "අපි ඒ දොර කඩාගෙන ඇතුළුවෙද්දී කිසිකෙනෙකු ඒක ඇතුළෙ හිටියෙ නැති බව ඇත්තයි. ඒ කියන්නේ අපරාධකාරයා කොහොම හරි එතැනින් පැනගිහින් තියෙනවා. ඔබ මොකද කියන්නේ?"

"මෙහෙම හිතන්න හෙඩිංලි" හෝම්ස් කීය. "දොර කඩාගෙන ඇතුළුවෙද්දී කවුරු හරි හිටියෙ නැහැ කියන්නෙ මෙහෙම වෙන්න පුළුවන්. අපරාධකාරයා කොහොමටවත් මේ කාමරයට ඇතුළුවෙලා නෑ!"

"මොකක්? ඇතුළුවෙලා නෑ? ඔබ මොනවද මේ දොඩවන්නෙ? ඔබ අදහස් කරන දේ මට නම් කොහොමටවත් තේරුම් ගන්න බෑ"

"හරි" හෝම්ස් කීය. "මං මේ අභිරහස දැන් විසඳලා අවසන්. මං හදන්නේ දැන් ඒ ගැන මං දන්නා හැම දෙයක්ම ඔබට තේරුම් කරදීලා ඒ ප්‍රතිඵල ඔබට භාර දෙන්නයි.

මෙන්න මේ කාරණයට අපි කවුරුත් එකගයි නේ. කිණිසි පහර එල්ලවෙද්දී මියගිය පුද්ගලයා බිත්ති ඔරලෝසුව වයින් කරමින් ගිනිඋදුන ඉදිරිපිට නැගිට සිටියා. කිණිස්සේ තළය ශරීරයට ඇතුළුවුණේ මඳක් ඇලේට, ඒ වගේම වම් පැත්තට. ටිකක් කල්පනා කරල බැලුවොත් ඔබට මතක් වේවි. කිණිස්සේ මිට තිබුණේ විවෘතව තිබුණු ජනෙල් කවුළුවක් දිහාවට"

"ඔව්. ඔබ හරි. නමුත් ඒ ජනේලය තිබුණේ පොළොවට අඩි හතළිහක් ඉහළින්!"

"ඔව් ඒක නිවැරදියි. මේ අපරාධය කිරීමට යොදා ගත් ඉතාම අසාමාන්‍ය ආයුධය ගැන දැන් අපි හිතල බලමු." මෙසේ කී හෝම්ස් ලාච්චුවක් විවෘත කිරීමට සූදානම් වූවා පමණි. කිසිවෙකු නොනවත්වාම දොරට තට්ටු කිරීමට පටන් ගත්තේය. වහා දොර විවෘත කළ මට දකින්නට ලැබුණේ, ඒ තේම්ස් මැන්ෂන්ස් ගොඩනැගිල්ලේ මුරකාර සේවකයා බවයි. අප සමග සිටි අමුත්තන්

දුටු ඔහු, තරමක පුදුමයකට පත් වූ බව පෙනිණ. කෙසේ වෙතත් ඔහු මගේ මිත්‍රයා වෙත ළං වූයේ තම සාක්කුවෙන් ගත් නමා තිබූ කඩදාසියක් දිග හරිමිනි.

"මහත්මයා. ඔබ අතින් නැතිවුණා කිව් දේ මට හම්බවුණා." ඔහු කීය. "ඒක හොයා ගන්න සෑහෙන්න අමාරු වුණා. ඒක පඳුරක කොළ අතරේ හිරවෙලයි තිබුණේ."

නමා තිබූ කඩදාසිය දිග හැරි හෝම්ස්, ඒ දෙසට තම දෙනෙත් යොමු කළේය. මීළඟට ඔහු එය මේසය උඩ තැබුවේ කාටත් පහසුවෙන් දැක ගැනීමට හැකිවෙන පරිද්දෙනි.

"ඔබට බොහොමත්ම ස්තුතියි" හෝම්ස් කීවේ තම මුදල් පසුම්බියෙන් පවුමේ කාසියක් එළියට ගනිමිනි. "මෙන්න මං ඔබට දෙනවා කිව් තෑග්ග. ඔබේ නම පොලිස් පරීක්ෂක මහත්මයා ළඟ තියෙනවා නේද?"

"ඔව් මහත්මයා" කියූ සේවකයා තම ත්‍යාගය සාක්කුවේ දමාගෙන පිටවී ගියේ අප කාටත් ආචාර කිරීමෙන් පසුවය.

"අපි කතාකරමින් හිටියේ අපරාධයට යොදාගත් අසාමාන්‍ය ආයුධය ගැන" කී හෝම්ස් ලාච්චුව ඇර කිණිස්ස අතට ගත්තේය. "මේ අර අපරාධය කළ ආයුධයට, සෑම අතකින්ම සමාන වන අයුරෙන් සෑදූ එකක්. ප්‍රමාණයෙන් අන්තිම දශමයටම ඒ ආයුධයට සමානයි. යොදාගෙන ඇති ලෝහත් සර්වප්‍රකාරයෙන්ම සමානයි. ආයුධය මත ඉතාලි වචනයක් කොටා තිබුණට, ඒක සම්පූර්ණයෙන්ම එංගලන්තයේ නිෂ්පාදනය කරන ලද්දක්. තළය කොටස සෑදීමට යොදාගෙන තිබෙන්නේ අඟල් තුන්කාලේ සාමාන්‍ය වානේ. මිට සාදා ඇත්තේ ඇලුමිනියම් කුරකින්. ලියවන පට්ටල් වැඩ හුරු පුරුදු කාර්මිකයෙකුට, මෙවැනි ආයුධයක් බොහොම පහසුවෙන් හදන්න පුළුවනි.

දැන් බලන්න මගේ රූප සටහන දිහා. A සහ B යනුවෙන් මා ලකුණු කර ඇති කොටස් දෙක, තළයෙන් පිටතට විහිදුණු තෙරායැම්. ඒ දෙක අන්තිම දශමයටම එක සමානයි. ඒවා මිලිමීටර් 10.9 ක විෂ්කම්භය ඇති වෘත්තයක කොටස්. මොකක්ද මේ ප්‍රමාණයේ වැදගත් කම? නිව් ඔක්ස්ෆඩ් වීදියේ පරණ ආයුධ වෙළඳසලකින් ඔබට මිලට ගන්න පුළුවනි, පරණ වැසිපොට් රයිෆලයක්. මේ තියෙන්නේ එයින් එකක්. මේ රයිෆලයේ තුවක්කු බටයේ ඇතුළත විෂ්කම්භයත් හරියටම මිලිමීටර 10.9 යි. එවැනි දෙයක් අහම්බෙන් සිදුවීම හරිම පුදුමයි නේද?"

තමා අතට ගත් රයිෆලයේ බැරලයෙන් අල්ලා ගත් හෝම්ස්, එහි කට උඩ අතට සිටින සේ අල්ලා ගත්තේය. ඉන්පසු කිණිස්සේ තලයෙන් අල්ලාගෙන එහි මිට පහළට සිටින සේ රයිෆල් කටට ඇතුළු කළේය. අනතුරුව කිණිස්ස අතින් මුදා හැරියේය. එය ඉක්මනින් තුවක්කු බටය දිගේ පහළට වැටිණි. මීළඟට රයිෆලය බඳෙන් විවෘත කළ විට කිණිස්ස එතැනට පැමිණ තිබූ අයුරු අපි දුටුවෙමු.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" වැලන්ටයින් මහතාට කෑ ගැසිණ. "ඔබ කියන්නේ කිණිස්ස රයිෆලය තුළට අල වෙඩි තිබ්බ කියලද?"

"සහතිකෙන්ම ඒක තමා සිද්දවුණේ" හෝම්ස් කීය. "මේකෙ මිට ඇලුමිනියම් වලින් හැදුවෙ ඇයි? දැනටමත් බරින් වැඩි තලයක් ඇති ආයුධයක්, සැහැල්ලු වෙන්න. ඊළඟට මිටේ කෙළවරට ෂඩාස්‍රාකාර බොත්තමක් තිබීමෙන්ම ඒ කාරණය ස්ථිර වෙනවා"

"මේක වෙන්න බැරි දෙයක්" පොලිස් නිලධරයා කීය. "ඔබ කියන දේ මට විශ්වාස කරන්න අමාරුයි"

"හොඳයි. මං ඒක ක්‍රියාත්මක කරලම ඔබට පෙන්වන්නම්" හෝම්ස් කීය. "මේ කිණිස්සෙන් ප්‍රයෝජනයක් ලැබෙන්න නම් ඒක ගමන් කළ යුත්තේ උල් තුඩ ඉදිරියට හිටින්න. ඒක සරලයි නේ. එහෙම යන්න නම් එය ගමන් කරද්දී රවුමට කරකැවෙමින්, එනම් තම අක්ෂය වටා භ්‍රමණය වෙමින්, ගමන් කළ යුතුයි. ඒක සිරුරට ඇතුළු වෙද්දීත්, කරකැවෙමින් ඇවිත් තිබූ බව අපි දුටුවා. ඒ කමිස රෙද්ද ඇඹරී තිබුණු හැටියෙන් සහ තුවාලයෙන්. කොහොමද එහෙම කරකැවුණෙ? රයිෆල් බටය ඇතුළු පැත්තේ ඇති, කරකැවෙමින් ඉදිරියට යන, සිහින් "කාණු" පද්ධතියක් මගින්. නමුත් කිණිස්සේ ඇලුමිනියම් මිට මෙම "කාණු" සමග නිසි ලෙස සිරු මාරු වෙන්නෙ නෑ. ඒ නිසා ඒ "කාණු පද්ධතිය" සමග හොඳින් බද්ධ වෙලා සිරු මාරු වෙන දෙයක්, මිට වටේට යොදන්න වෙනවා.

ඒකට යොදාගත හැක්කේ මොකක්ද? මෘදු ලෝහයකින් තැනූ වොෂරයක්. ඒක කිණිසි මිටේ ෂඩාස්‍රයට තුලටම හිරවී සිටිනවා. එපමණක් නොවෙයි; එය කාණු පද්ධතිය සමග බද්ධ වී කිණිස්ස භ්‍රමණය කරමින් ඉදිරියට ගෙනියනවා. එපමණකුත් නොවෙයි. ආයුධය රයිෆල් බටයෙන් පිටවුණු ඉක්මනින්ම, වොෂරය ඉවතට

වැටෙනවා. මේ බලන්න මගේ මිත්‍ර ජැක් හාඩ්වික් ඉංජිනේරු මහත්මයා හැදූ, මැද ෂඩාස්‍රයක් ඇති වොෂරය"

ඔහු මේසය උඩ තැබුවේ මැද ෂඩාස්‍රාකාර සිදුරක් තිබූ කවාකාර ලෝහ පෙත්තකි.

"මේක හරි අපූරුයි. විද්‍යා ප්‍රදර්ශනයකට පාසල් සිසුන් තැනූ ප්‍රදර්ශන භාණ්ඩයක් වගෙයි" පොලිස් නිලධරයා කීවේ සිනාමුසු මුහුණෙනි. "නමුත් ඔබ හිතේ මවාගෙන ඉන්න තාලේ දැවැන්ත වැඩක් කරන්න නම් මේකට බෑ"

"මේ ක්‍රමයේ සාර්ථකත්වය ගැන මගෙත් එච්චර විශ්වාසයක් නෑ" නීතිඥයා කීය.

"හොඳයි අපි බලමු" හෝම්ස් කීය.

"මේ තියෙන්නේ බෝර 20 තුවක්කුවක් සඳහා හාඩ්වික් නිර්මාණය කළ උණ්ඩයක්. මේකට යොදලා තියෙන්නේ දුම් රහිත වෙඩි බෙහෙත්, අටෙන් එකක ප්‍රමාණය. දැන් බලන්න මං මේක අටවන හැටි"

කිණිස්සේ මිටේ තිබූ බොත්තමට හෝම්ස් වොෂරය සවි කළේය. ඉන්පසු එය තුවක්කු බටය තුළට බැස්සුවේය. අනතුරුව ගිනි අවියේ කඳ මැදින් විවෘත කොට, උණ්ඩය දමා ගිනි අවිය වසා දැම්මේය.

"දැන් බලන්න මං අද උදේ සැදූ ඉලක්ක පුවරුව. ස්ට්‍රෝබෝඩ් වලින් හදලා, මං ඒක කාමර දෙකක් එහා බිත්තියේ සවිකළා. කාමරවල දොරවල් විවෘත කළාම අපට ලැබෙනවා අඩි 35 ක දුරක්. ඔබට මේ ජනේල වහන්න පුළුවන්ද වොට්සන්?"

මම ජනේල වසා දැම්මෙමි. ඉතාම සෙමින් ඉලක්කය ගත් හෝම්ස් ගිනි අවිය ක්‍රියාත්මක කළේය. එතරම් තියුණු නොවූ වෙඩි ශබ්දයක් ඇසිණ. ඉලක්ක පුවරුව වෙත කිණිස්ස ගමන් කළේ, ඇසට නොපෙනෙන තරම් විදුලි වේගයකිනි. අන්තිමට අපට එය දක්නට ලැබුණේ ඉලක්ක පුවරුව මතය. ඒ මධ්‍ය ලක්ෂයට අඟල් බාගයක් පමණ නුදුරිනි. කිණිස්සේ තලය ලෑලි තුළට මිට දක්වාම කිඳා බැස තිබිණි.

"මේ බලන්න කිණිසි මිටේ පිටුපසට මා යෙදූ වොෂරය. මේ තියෙන්නේ අර සේවකයා ටික වේලාවකට පෙර ගෙන ආ වොෂරය. ඒ දෙක සෑම අතින්ම සමාන බව ඔබට පෙනේවි"

"මං ඔබ සමග එකඟවෙනවා හෝම්ස් මහත්මයා" පොලිස් පරීක්ෂක හෙඩිංලි අන්තිමේදී පිළිගත්තේය. "දැන් තියෙන එකම

ප්‍රශ්නය, මේ විදියට මිනීමැරුවේ කවුද? අනික ඇයි වෙඩිල්ල තැබූ ශබ්දය කාටවත් ඇහුණෙ නැත්තෙ?"

"ශබ්දය ඇහුණෙ නැති එක ගැන කියනවා නම්" හෝම්ස් කීය. "ඔහු තමන්ගේ රයිෆලයට සම්පීඩිත - වායු ඇටවුමක් සවිකර ඇති. ඒකෙන් ශබ්දය හුඟාක් අඩුවෙනවා. ඒ විතරක් නෙමෙයි. කිණිස්ස මිටේ දැවටුණු වෙඩි බෙහෙත් ඉතිරි වෙන්නෙත් නෑ.

ඊළඟට අපි කල්පනා කරන්න ඕන කවුද මේක කළේ කියල. මට පුළුවනි ඔහුගේ නම ඔබට කියන්න. නමුත් ලැබී තිබෙන සාක්ෂි අපි පිළිවෙළින් බලමු.

ඔබට මතක ඇති මේ ඡායාරූපය. මේ තමයි මගේ ඉල්ලීම අනුව දොස්තර වොට්සන්, බිත්ති ඔරලෝසුව වයින් කරන ඉරියව්වෙන් නැඟිට සිටි හැටි. ඒ වෙලාවෙ ඔහුගේ දෙපා තිබුණු තැන්, මම රටහුණුවලින් බිම සලකුණු කරගත්තා. ඊළඟට එතැනට ගිහින් හිටගෙන අනික් පැත්ත බැලුවාම මං දුටුවේ කුමක්ද? විවෘතව තිබූ ජනේලයෙන් මට දකින්න ලැබුණා, වෙනත් නිවසක ජනේල දෙකක්. අඩි තිහක් එහා පැත්තෙන් තිබුණු එම ගොඩනැගිල්ල තමා හැම්ඩන් කෝට් යනුවෙන් හැඳින්වෙන්නේ. මං දුටුවේ වැප්මන් වීදියේ, අංක හය දරන හැම්ඩන් කෝට් තට්ටු නිවාසයේ, දෙවැනි හා තුන්වැනි තට්ටුවල ජනේල. මං ගිහින් විමසා බැලුවා. දෙවැනි තට්ටුවේ තිබෙන්නේ පුවත්පත් සඳහා වෙළඳ දැන්වීම් භාරගන්නා කාර්යාලයක්. තුන්වැනි තට්ටුව කුලියට අරගෙන ඉන්නේ ජෝන් ස්ලේටර් නම් කොටස් වෙළඳපොළේ තැරැව්කරුවෙක්. ඒක නෙමෙයි. අර කොලින්ස්ට තර්ජනය කර එවූ ලියුම මේ වෙලාවෙ ඔබ ළඟ තියෙනවද?"

"ඔව් මා ළඟ තියෙනවා" කී හෙඩිංලි එය හෝම්ස් අතට දුන්නේය.

"මෙකෙ උඩින්ම තිබෙන හිස්කබල සහ හරස් අස්ථි දිහා පරීක්ෂාවෙන් බලන්න. ඒවා විකාර චිත්‍ර. ඒ කියන්නේ මෙය ඇන්ද තැනැත්තා, චිත්‍ර කලාවේ දක්ෂයෙක්වත්, වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් තිබුණු කෙනෙක්වත් නෙමෙයි. ඔහු මෙය ඇඳීමට වෛද්‍ය පොතක චිත්‍රයක් දිහා බලලවත් නැහැ. නමුත් ඔහු ක්‍රමානුකූලව යාන්ත්‍රික ඇඳීම උගත් පුද්ගලයෙක්. මං එහෙම කියන්නෙ ඇයි? මේ චිත්‍රය සියුම් තුඩක් සහිත පැන්සලකින් මුලින් ඇඳලා, ඊට පසු මකනයකින් ඒ ඉරි මකා ඉවත්කර තිබෙනවා. ප්‍රබල කාචයකින් බැලුවාම ඒක පැහැදිලිවම පෙනෙනවා. සැලසුම් ශිල්පීන්

යොදාගන්නා රතුපාට මකනයක සියුම් කුඩු වුණත් දැකගන්න පුළුවනි.

අනික මෙහෙම ලියන්න යොදාගෙන තිබෙන්නේ නුගත් මිනිසුන් ලිවීමට යොදා ගන්නා බාල තීන්ත නෙමෙයි; සැලසුම් ශිල්පීන් යාන්ත්‍රික ඇඳීමට යොදාගන්නා මිලෙන් අධික ඩයික්‍රොයික් තීන්ත. මේ ජෝන් ස්ලේටර් මහතාගේ කාර්යාලයට මං ගියාට, මට ඔහු හමුවුණේ නැහැ. නමුත් ඔහුගේ මේසය උඩ මං දුටුවා, යාන්ත්‍රික ඉංජිනේරුවන් හා සැලසුම් ශිල්පීන් ඇඳීමට යොදාගන්නා සියුම් උපකරණයක්, ඩයික්‍රොයික් තීන්ත හා අර විශේෂ මකනයක්. ඔහුගේ සටහන් ලියන කඩදාසියක් හා ලියුම් කවරයක් අරගෙන, ඒ තීන්තෙන් මා යමක් ලියුවා. ඒක ඔබට හොඳ සාක්ෂියක් වේවි.

මට තවත් දේවල් දැනගන්න ලැබුණා. මේ ජෝන් ස්ලේටර් මහත්තයා හැම්ඩන් කෝට් හි අංක 6 කුලියට අරගෙන තියෙන්නේ මාස එකහමාරකට කලින්. ඔහු මිටි, කෙට්ටු සුදුමැලි කෙනෙක්. උපැස් යුගළක් හා බොරු කොණ්ඩයක් පළඳිනවා. ඔහු සැමවිටම එක් අතකට අත්වැස්මක් පළඳිනවාලු. ඒ වම් අතේ බවට සැක නෑ. එදා උදේ අටහමාරට ඔහු කාර්යාලයෙන් පිටව් යනවා මුරකරු දැකල තියෙනවා. නමුත් ඔහු එයට ආවෙ කොයි වෙලාවෙද කියල කවුරුවත් දන්නෙ නෑ. ඔහු තම බඩු ලොකු අශ්වකරත්තයකට පටවාගෙන ගියාලු: අඩි පහක් පමණ දිග සිහින් පෙට්ටියක් හා ලොකු හතරැස් පෙට්ටියක්. එයින් දිග පෙට්ටිය රයිෆලය අඩංගු එක බවටත් සැකයක් නෑ. කුලීරිය වික්ටෝරියා දුම්රිය පොළටයි ගිහින් තියෙන්නේ"

"කවුද මේ ජෝන් ස්ලේටර් කියන්නෙ?" පොලිස් නිලධරයා විමසුවේ අසුනෙන් නැගිටිමිනි.

"ඒ කවුද කියන එක ඔබට හොයා ගන්න වෙනවා", හෝම්ස් කීය. "නමුත් මං ඔබට ප්‍රයෝජනවත් වෙන හෝඩුවාවක් දෙන්නම්. මේක මට කිව්වේ මේ වැලන්ටයින් නීතිඥ මහත්මයා. ආතර් කොලින්ස්ගේ මරණයෙන් වාසියක් සැලසෙන්නේ එකම එක පුද්ගලයෙකුට පමණයිලු. ඔහු කවුද?

ඔහුගේ නම ඔලිවර් වෙට්. මියගිය ආතර් කොලින්ස්ගේ හිතවත්ම මිත්‍රයා වන වෙට් සුදු අන්තුවෙක්. යාන්ත්‍රික ඉංජිනේරුවෙකු ලෙස අධ්‍යාපනයක් ලබා ඇති ඔහු, ඉංජිනේරු ක්ෂේත්‍රයේ දක්ෂයෙක්. ඔහුත් මිටියි, කෙට්ටුයි, සුදුමැලියි. ඔහුගේ වම් අතේ මැදගිල්ල කැඩී ගිහින්. ඔහු රැවුළ සම්පූර්ණයෙන්ම මුඩු

කරලා පමණක් නොවෙයි; හිසේ තරමක තට්ටයකුත් තිබෙනවා. මේ මහත්වරු දෙදෙනාගේම අත් අකුරු මං දුටුවා. මට කියන්න තියෙන්නේ ඒවා වෙන්ව හඳුනා ගැනීම අපහසු බවයි."

"ඒ ඇති හොඳටම" හෙඩිංලි කීය. "මං ඇලන් මෙනෙවිය වහාම නිදහස් කරන්න පියවර ගන්නවා. මට අර ඔලිවර් ටෙට් ගේ ලිපිනය දෙන්න"

එදා රාත්‍රියේ ඔහුගේ නිවසේදී ජෝන් ස්ලේටර් හෙවත් ඔලිවර් ටෙට් අත් අඩංගුවට ගැනීමට පොලීසිය සමත් විය. ඔහුගෙන් කළ ප්‍රශ්න කිරීම් වලින් පසු, ඔහුගේ ගෙවත්තේ වළ දමා තිබී, විශේෂ ආයුධයක් ගොඩට ගැනීමට පොලීසිය සමත් විය. ජල රෝධක රෙදි වලින් ඔතා තිබූ එය, ප්‍රමාණයෙන් විශාල සම්පීඩන-වායු ඇටවුමක් සහිත, බෝර විස්සේ වැසිපොට් රයිෆලයකි. කෙටි නඩු විභාගයකින් පසු ඔහුට මරණ දඬුවම හිමිවිණි.

මියගිය ආතර් කොලින්ස්ගේ දේපළ සම්පූර්ණයෙන්ම ඔහුගේ මලණුවන් වූ වික්ටර් කොලින්ස්ගේ වැන්දඹු බිරිඳට හා දරුවනට උරුම විය. මියුරියෙල් ඇලන් මෙනෙවිය හා ක්‍රිස්ටෝෆර් කොලින්ස් අතිනත ගත් බැව් අපට පුවත්පත් වලින් දැනගන්නට ලැබිණ.

ඩෝචෙස්ටර් ඛේදවාචකය

මගේ හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතා ඉතා පුදුමාකාර මතකයක් තිබූ තැනැත්තෙකි. ඔහු තම සිත තුළ ගොනුකර ගෙන තිබූ කරුණු කාරණා ප්‍රමාණය අති විශාලය. එහෙත් වැදගත් කරුණක් හෝ පුද්ගලයකු ගැන මතකය අවදිකර ගැනීමට අවශ්‍ය වූ විට, එය යළි ඇද ගැනීමට ඔහුට ගතවූයේ එක් ක්ෂණයකි. මෙය මා නැවත නැවතත් දැක තිබූ සංසිද්ධියකි.

එය 1887 වර්ෂයේ ජූනි මාසයයි. ගිම්හාන ඍතුව වුවත්, මහජනයා ඉතා අපහසුවට පත්කළ ශීතලක්ද, නොකඩවා ඇද හැළුණු වර්ෂාවක්ද, ඒ දිනවල පැවතිණ. අහස කළු වලාකුළුවලින් වැසී තිබූ අතර, වේගයෙන් හැමූ සුළඟ නිසා වර්ෂාව සතර අතට විහිදී ගියේය. වෙනදාට ජනයාගෙන් පිරී ඉතිරෙන ලන්ඩනයේ වීදි පාළුවට ගොස් තිබිණ.

හෝම්ස් විසින් එකතු කරනු ලැබූ විවිධ විෂයයන්ට අයත් පොත්, වීදුරු අල්මාරි හා රාක්කවල අසුරා තිබුණේ, කිසිදු ක්‍රමානුකූල පිළිවෙළකට නොවේ. මා අතිශයින් ප්‍රිය කළ, විලියම් ක්ලාක් රසල් නම් ඇමරිකානු ලේඛකයාගේ, මුහුදු ගමන් පිළිබඳ මට අයත් ප්‍රබන්ධ පොත් ද, හෝම්ස්ගේ අපරාධ පරීක්ෂණ පොත් අතරේ "අතරමංව" තිබිණි. හෝම්ස්ගේ පොත් නිසි පරිදි වර්ග කොට, අල්මාරිවල හා රාක්කවල විවිධ තැන්වල තැන්පත් කිරීමට මම සිතා ගත්තෙමි. මේ වෙලාවේ මගේ මිත්‍රයා ජනේලය අසලට වී බේකර් වීදියට මහා වර්ෂාව ඇද හැළුණු ආකාරය නරඹමින් සිටියේය. වර්ෂාව නොතකා පයින් ගමන් කළ අය ගැන, ඔහු නෙත් යොමු කළේ උනන්දුවෙනි.

"වොට්සන්. කරුණාකරල මං ඔය පොත් අසුරල තිබෙන පිළිවෙළ නම් වෙනස් කරන්න එපා" ඔහු කීවේ මා දෙසට හැරෙමිනි. "මට ඔය පොත් වරින්වර විමර්ෂණය කරන්න සිදුවෙනවා. ඔබ එවැනි පොත් මට නුහුරු තැනක තැබුවොත්, ඒක මට උදව්වක් නෙමෙයි; විශාල කරදරයක් වෙනවා. උවමනා කරන

පොත සොයමින් නාස්ති කරන්න කාලයක්වත් ඒකට ඉවසීමක්වත් මට නෑ"

"ඒ වුණත් හෝම්ස් මේව තියෙන්නේ කිසිම පිළිවෙළකට නෙමෙයි. ඔබ කොහොමද උවමනා වුණාම අවශ්‍ය පොතක් හොයා ගන්නෙ?"

"මට උවමනා කරන පොත් තිබෙන තැන්, මගේ මනස තුළ ඇඳී තිබෙන්නෙ ඡායාරූපයක වගේ." හෝම්ස් කීය. "මං මේ කියන දේ හරිද කියල දැන් බලන්න. ලොකු වීදුරු අල්මාරියේ උඩ ඉඳන් දෙවැනි තට්ටුවේ, වම් පැත්තේ ඉඳන් හතරවැනි පොත මොකක්ද කියල මම කියන්නද? "විෂ යොදා ඝාතන සිදුකළ ලොව පුරා මිනීමරුවන්" ඒක හරිද?"

"හරි"

"ඊළඟට පොත් රාක්කයේ පහළම තට්ටුවේ දකුණු කෙළවරේම තිබෙන පොත මේකද බලන්න; "එල්ලුම් ගසට ගිය වෛද්‍යවරු" හරිද?"

"ඔහොම ඉන්න බලන්න........ හරියටම හරි" මම කීවෙමි. "හොඳයි මං අහන්නම්. මේක කියන්න බලන්න. කුඩා වීදුරු අල්මාරියේ, උඩම තට්ටුවේ දකුණු පැත්තේ කෙළවරේ ඉඳන් තුන්වැනි පොත. ඒක මොකක්ද කියන්න බලන්න"

"ඒකෙ පිට කවරය ඉරිල නේද?"

"ඔව්"

"පිටු අටසියයක පමණ ලොකු පොතක්?"

"ඔව්"

"ශ්‍රීමත් හෙන්රි වෝඩ් ලියූ "අපේ ඇටකටු ලොව පුරා විසිරී ඇත" කියන පොත. ඒක ඉන්දියානු මහා කැරැල්ල ගැන ලියැවුණු විශිෂ්ටතම පොත"

"ඔබ නිවැරැදියි"

"ඔය පොත දැන් මුද්‍රණයේ නැහැ" හෝම්ස් කීය. "මං ඕක මිලදී ගත්තේ චාරිංක්‍රොස් වීදියේ පරණ පොත් වෙළෙන්දෙකුගෙන්. ඕකෙම හොඳ තත්ත්වයේ පිටපතකට, හෝල්බෝන්හි පරණ පොත් වෙළෙන්දෙක් මගෙන් පවුම් පහක් ඉල්ලුවා......."

ඔහු කථාව අතරමග නැවැත්වූයේ, අප නිවහනේ සීනුව නාද වෙන ශබ්දය ඇසුණු විටයි.

"....... මේ නම් අපේ අනුග්‍රාහකයෙක්. මට හිතෙනවා සුවිශේෂ අන්දමේ කෙනෙක් කියා."

දොර විවෘත කළ හඩ්සන් මහත්මිය අමුත්තාට නිවසට ඇතුළුවීමට ඉඩ සැලැස්වූ ශබ්දයත්, ඉන්පසු දෙදෙනෙකු උඩු මහලට පැමිණෙන ශබ්දයත් අසන්නට ලැබිණ.

අපගේ දොර විවෘත විය. හඩ්සන් මහත්මිය සමග ඇතුළට පැමිණියේ රෝමානු කතෝලික ආගමේ පූජකවරයෙකි; එනම් පියතුමෙකි. මෙවැනි කෙනෙකු මීට පෙර හෝම්ස්ගෙන් උපකාර පතා පැමිණි බවක් මට සිහිකළ නොහැකි විය.

"සුභ උදෑසනක් ජෝසප් පියතුමනි" හෝම්ස් කීවේ මිනිත්තු දෙකක් පමණ නිහඬව අමුත්තා දෙස බලාසිටීමෙන් අනතුරුවය. "අද බොහොම අයහපත් කාල ගුණයක් සහිත දවසක් බව ඇත්තයි. ගිනිඋදුන ළඟින්ම තිබෙන මේ අසුනේ හිඳගන්න. යූස්ටන් දුම්රියපොළේ සිට පයින්ම එද්දී, ඔබ මුහුණ දෙන්න ඇත්තේ දැඩි ශීතලකට. ඔබතුමා බීමට කැමැති තේද කෝපිද?"

අසුනේ හිඳ නොගත් පියතුමා හෝම්ස් දෙස බලා සිටියේ, එම වචන අදහාගැනීමටත් නොහැකිව, සම්පූර්ණයෙන්ම විවර කරගත් දෙනෙතිනි.

"දෙයියන්ට ඔප්පුවෙච්චාවෙ!" පියතුමාට කියැවිණි. "ඔබ කොහොමද මගේ නම දැනගත්තෙ? මං උමං දුම්රියේ හෝ කුලීරියක ආවෙ නැති බව ඇත්ත. මං යූස්ටන් ඉඳන් පයින්ම ආ බව ඔබ දැනගත්තෙ කොහොමද හෝම්ස් මහත්තයා?"

"ඔබේ ඇතුළු කබා සාක්කුවේ ඇති, දුම්රිය ටිකට් පතක දෙවැනි භාගය මට පෙනෙනවා. ඒ ඔබ ඩෝචෙස්ටර් සිට ලන්ඩනයට ඒමට මිලට ගත් ටිකට්පත. ඔබ යූස්ටන් හිදී දුම්රියෙන් බැස්ස බව මම තේරුම් ගත්තෙ ඒකෙන්. මං මේ වීදුරු ජනේලයෙන් බලාගෙනයි හිටියේ. ඔබ මේ මහ වැස්සේ පයින් එන හැටි මං ඇතදීම දුටුවා. හොඳයි ඔබේ තෙමුණු වැහි කබාය සහ හිස්වැස්ම මගේ මිත්‍ර වොට්සන් අතට දෙන්න"

පියතුමා එම දේවල් මා අතට දී අසුනේ හිඳ ගැනීමට සැරසුණේ, හෝම්ස් වෙත ප්‍රශ්නයක් ඉදිරිපත් කරමිනි. "ඔබ කොහොමද මහත්මයා මගේ නම දැනගත්තෙ?"

"පියතුමනි, ඩෝචෙස්ටර්හි සාන්ත මරියා දෙව්මැඳුර, එහි සුවිශේෂ ගෘහ නිර්මාණ ශිල්පය නිසාම සුප්‍රසිද්ධයි. එංගලන්තයේ

පමණක් නොවෙයි. එය මුළු යුරෝපයේම ප්‍රසිද්ධ බව, ඔබට අමුතුවෙන් කීමට අවශ්‍ය නැහැනෙ. එතැන ප්‍රධානියා ගරු මයිකල් ජෝසප් පියතුමා කියන කරුණ, මගේ දැනුම් ගබඩාවෙ ඉහළින්ම තිබෙන දෙයක්"

මේ අවස්ථාවේ අපේ සේවක ළමයා උඩුමහලට පැමිණියේ, කෝපි පෝච්චියක් සහ කේක් තසිමක් ද සමගය. විශේෂ අමුත්තකු පැමිණි විට කරන සංග්‍රහය විශේෂ එකක් කිරීමට, හඩ්සන් මහත්මිය අමතක නොකළාය. පියතුමා ඔහුගේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ කෝපි බී, මඳ වේලාවක් නිහඬව සිටීමෙන් අනතුරුවය.

"හෝම්ස් මහත්මයා. ඇවිත් ඔබව හමුවෙන්න කියලා ඔබ ගැන මට රෙකමදාරු කළේ, ඩෝචෙස්ටර් රෝහලේ විශේෂඥ වෛද්‍ය ලයනල් හක්ස්ලි මහත්මයා. ඔහු අපේ දෙව්මැඳුරේ භක්තිමත් සාමාජිකයෙක්. මා දිගින් දිගටම කල්පනා කරන බව දැකලා තමයි ඔහු ඒ උපදෙස දුන්නේ. මට ඇතිවී තිබෙන ප්‍රශ්නය දැන් මං ඔබට කියන්නම්.

ඔබ දැනටමත් දන්නා අයුරින්, සාන්ත මරියා දෙව්මැඳුරේ ප්‍රධාන පියතුමා මමයි. මගේ දෙව්මැඳුරේ ආශිර්වාදය ලබන බැතිමතුන් සෑහෙන තරම් ප්‍රමාණයක් ඒ පළාතේ ඉන්නවා. ඒ හැම කෙනෙකුම කිසිම කලබලයක් නැති භක්තිමත්ව ආගම අදහන අය.

මේ අතරේ ඉන්නවා ඈන්තනි බෙනඩික් නම් මහත්මයෙක්. ඔහු එංගලන්තයේ දිගු කලක සිට පැවත එන, හොඳ කතෝලික පවුලකින් බිහිවුණු කෙනෙක්. ඔහු බොහොම පොහොසත් කෙනෙක්. ඒ වගේම ත්‍යාගශීලී කෙනෙක්. අපේ දෙව්මැඳුරට අවුරුද්ද පුරා ඔහු කරන පරිත්‍යාගවල ප්‍රමාණය, මෙතෙකැයි කියා නිම කරන්න බැහැ. මා දන්නා තරමින් බෙනඩික් මහත්මයා කවදාවත් විවාහ වෙලා නැහැ. ඔහු වයස අවුරුදු හැත්තෑවක පමණ කෙනෙක්. තමන්ගේ මරණයෙන් පසු තමන්ගේ දේපොළ, දෙව් මැඳුරට හිමි වෙන ලෙස නීතිමය කටයුතු කරන බවයි, ඔහු මා සමග කියා තිබෙන්නේ."

"ඔහුගේ දේපළට උරුමකම් කිවහැකි ඥාතීන් කවුරුවත් නැද්ද?"

"මා දන්නා පමණින් කිසිවෙක් නැහැ මහත්මයා" පියතුමා කීය. "එහෙම කිසිවෙකු ඉන්නවා නම් අපට දැනගන්න ලැබෙනවා"

"ඔහුගේ මුළු මුදලයේ වටිනාකම කොපමණද කියා පියතුමාට දැනගන්න ලැබුණාද?"

"එහෙම ගණන් බැලීමක් අප කවදාවත් සිදුකළේ නැහැ හෝම්ස් මහත්මයා. එහෙම අවශ්‍යතාවයක් ඇතිවුණෙත් නැහැ. නමුත් ඔහු සතු නිවස, ඉඩකඩම් සහ ඔහු එකතුකර ඇති පෞරාණික සිතුවම්, ප්‍රතිමා ආදී සියල්ල එකතුවුණාම, එය පවුම් ලක්ෂයකට වැඩිවුණොත් මිස අඩු නැහැ."

"ඇත්තට? ඒක නම් ඉතාම විශාල මුදලක්" හෝම්ස් කීය. "ඔබ කිව්වා ඔහුගේ වයස අවුරුදු හැත්තෑවක් කියලා. කොහොමද ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය දැන්?"

"මට වෛද්‍ය ක්ෂේත්‍රයේ දැනුමක් නම් නැහැ මහත්මයා. නමුත් බැලූ බැල්මට මට පෙනෙන්නේ, බෙනෙඩික් මහත්මයා හොඳ නිරෝගී සුවයෙන් ඉන්නා කෙනෙකු බවයි."

"එහෙම නම් ඔබට දැන් ප්‍රශ්නයක් වී තිබෙන්නේ මෙහෙම දෙයක්ද? බෙනඩික් මහත්මයාගේ දේපළ ගැන, තවත් කවුරු හරි උනන්දුවක් දක්වන්න පටන් අරගෙන ඇති?"

"ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා. ඒක තමයි ප්‍රශ්නය. මං ඔබට හැම දෙයක්ම කියන්නම්.

මීට මාසයකට පමණ කලින් බෙනඩික් මහත්මයා පාපෝච්චාරණය සඳහා මා ඉදිරියට පැමිණියා. ඔබ දන්නවා එහිදී ඔහු හෙළිකළ කිසිවක්, මං කොහොමටවත් ඔබට හෙළි නොකරන බව. ඔහු අතින් සිදුවී තිබූ බරපතළ නොවන ඒ වැරැදිවලට ඔහු පශ්චාත්තාප වුණා. මට හැකිවුණා ඔහුගේ ඒ වැරැදිවලට සමාව දී ඔහුගේ ආත්මය සම්පූර්ණයෙන් නිදොස් කරන්න. මේ කටයුතු වලට පස්සේ දෙව්මැඳුරේ ඉතිරි වී හිටියේ අප දෙදෙනා පමණයි. එතකොට ඔහු මගෙන් ඇහුවා, වෙනත් කාරණයක් ගැන මා සමග කතා කරන්න පුළුවන්ද කියලා.

මහත්මයා. පියතුමෙකුගේ දෙසවන් කියන්නේ, කරදරයක වැටී ඉන්නා කෙනෙකුට හැමවිටම විවෘත ඒවා. තමන් අතට මුද්‍රිත පත්‍රිකා වගයක් ලැබෙන්නට පටන්ගෙන ඇති බව එතකොටයි ඔහු හෙළි කළේ. "ඔලිව් මල්" ලෙස තමන් හඳුන්වාගත් කවුරුන් හෝ, ඔහුට ජීවිතය ගැන අනතුරු ඇඟවීම් කර තිබුණා"

"ඔහුට මරණ තර්ජන කර තිබුණාද?" මෙතෙක් වේලාවක් අඩ නින්දේ සිටින අයුරින් කථාවට සවන් දුන් හෝම්ස්, එක්වරම

විමසුවේ තිගැස්සීමට පත් ආකාරයෙනි. "ඔය පත්‍රිකා ගැන මට සම්පූර්ණයෙන් විස්තර කරන්න"

"මහත්මයා. පුවත්පත් සඟරා මගින් මා කියවා ඇති ආකාරයට, සාමාන්‍යයෙන් මෙවැනි දේවල් කරන්නේ අතින් ලියූ ලිපියක් මගින්. නමුත් මේවා තිබුණේ මුද්‍රිතව, එක කඩදාසියක් පමණයි"

"බෙනඩික් මහත්මයාට මේව ලැබුණේ කොහොමද? තැපැල් මගින් ඔහුට එවා තිබුණද?"

"නැහැ හෝම්ස් මහත්මයා" පියතුමා කීය. "මේ පත්‍රිකා ඔහුට ලැබුණේ ඔහු ඉරිදා උදේ දේව මෙහෙය සඳහා දෙව් මැඳුරට පැමිණි වෙලේ."

"එහෙම නම් අපට හිතන්න තියෙන්නේ, දේව මෙහෙය සඳහා පැමිණි හැම කෙනෙකුටම, මෙම පත්‍රිකාව බැගින් ලැබෙන්න ඇති කියලයි. එහෙම නේද පියතුමනි. එහෙමත් නැත්නම් මේ "ඔලිව් මල්" කණ්ඩායමේ අවධානය යොමු වෙලා තියෙන්නේ, ඇත්තනි බෙනඩික් මහතා වෙත විතරද?"

"අතික් අයටත් එවැනි පත්‍රිකා ලැබුණු බවක් මට අහන්න ලැබුණේ නෑ" පියතුමා කීය. "මට හුඟක් සමීප, හිතවත් කිහිපදෙනෙකුගෙන් මං පෞද්ගලිකව විමසා බැලුවා. ඔවුන් කාටවත් එවැනි පත්‍රිකාවක් ලැබී තිබුණේ නැහැ. "ඔලිව් මල්" යන නම යොදාගත් කණ්ඩායමක් හෝ පුද්ගලයකු ගැන දන්නවාද කියාත් මං විමසුවා. නමුත් එහෙම දෙයක් ඔවුන් කවුරුවත් දැන හිටියේ නෑ."

"හරිම සිත් ඇදගන්නා සුලු කරුණක්" හෝම්ස් කීය. "මේ කියන විදියේ පත්‍රිකා කීයක් මේ වනවිට ඔහුට ලැබිල තියෙනවද?"

"හතරයි. ඒ ගතවුණු සෑම ඉරිදා දවසකටම එක බැගින්"

"හැම එකකම සඳහන්ව තිබුණේ එකම දෙයද?"

"හැම එකකම තිබූ පණිවුඩය, පොදුවේ බැලුවාම එකයි. නමුත් වචන යොදා තිබූ ආකාරයේ සුළු වෙනස්කම් තිබුණා."

"බෙනඩික් මහත්මයා දෙව්මැඳුරේ හැමදාම ඉඳගන්නෙ එකම තැනකද?"

"ඔව්"

"එහෙම නම් මේ පත්‍රිකාව ඔහුගේ අවධානය සඳහා කල්තබා එතැන තබනවා වෙන්න ඇති?" හෝම්ස් කීය. "ඔබ දේව මෙහෙය අරඹන්න පෙර, දෙව් මැඳුරට ඇතුළුවිය හැක්කේ කාටද?"

"ඕනෑම කෙනෙකුට ඇතුළුවෙන්න පුළුවනි හෝම්ස් මහත්මයා" පියතුමා කීවේ මඳ සිනාවක්ද සමගයි. "දෙවියන්ගේ මන්දිරය සැමට සැමවිටකම විවෘතයි"

"ඔව් ඒක හරි, ඒක හරි" හෝම්ස් කීය. "මේ පත්‍රිකාවක් ඔබ අරගෙන ආවෙ නැද්ද?"

"ඔබ එවැන්නක් ඉල්ලාවි කියල මට ඉවෙන් වගේ දැනුණා මහත්මයා" පියතුමා කීවේ ඔහු ළඟ තිබූ කුඩා මල්ල විවෘත කරමිනි. "ඇත්තම කියනවා නම් මෙහෙම ඔබ හමුවෙන්න එන බවක්, මම බෙනඩික් මහත්මයාට කිව්වේ නෑ. ඔහුට ලැබුණු පත්‍රිකාවක් මං ඉල්ලා හිටියාම, මුලදී ඔහු එය මා අතට දෙන්න මැලි වුණා. මා එය වඩාත් හොඳින් අධ්‍යයනය කළ යුතු බව කීවාම, අන්තිමේදී ඔහු මගේ අදහසට එකඟවුණා"

"මා ගැන ඔබ සිතූ අයුරු ප්‍රශංසනීයයි" කී හෝම්ස් පියතුමා දිගු කළ ලියුම් කවරය අතට ගත්තේය. එය තුළින් ඔහු එළියට ගත්තේ ෆුල්ස්කැප් පිටු භාග ප්‍රමාණයේ මුද්‍රිත කඩදාසියකි.

හෝම්ස් එය ඉතා පරෙස්සමෙන් දිග හැර ආලෝකයට අල්ලා, දිය සලකුණ පරීක්ෂා කිරීමට තීරණය කළේය. ජනේලයේ තිබුණේ අඳුරු බවක් නිසා ඔහු ලිපිය ගිනි උදුනේ ආලෝකයටත්, පසුව ගෑස් පහනේ ආලෝකය වැඩිකොට එයටත් අල්ලා පරීක්ෂා කළේය.

"Fiore de Oliva

ෆියොරේ ඩි ඔලිවා."

කඩදාසි වර්ගයේ නමත් ඔලිව් මල" හෝම්ස් කීය. "වොට්සන් ඔය කුඩා අල්මාරියේ යටම තට්ටුවේ තිබෙන කොළපාට පොත මා අතට දෙන්න"

මම එය පහසුවෙන් සොයා ගත්තෙමි. යුරෝපීය කඩදාසි නිෂ්පාදකයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කෝෂ ග්‍රන්ථයක් වූ එය මගේ මිත්‍රයා අතට දුන්නෙමි.

"මං හිතුවා හරි. මේක ඉතාලියේ නිෂ්පාදනය කෙරෙන කඩදාසියක්" හෝම්ස් කීය. "රෝම නගරය සමීපයේ ෆැබියානෝ නම කඩදාසි නිෂ්පාදන සමාගමේ, ඉතා හොඳ වර්ගයේ කඩදාසියක්."

"මෙම තර්ජනය කරන පුද්ගලයන්, තමන්ගේ කණ්ඩායමේ නම විදියට "ඔලිව් මල" කියන කඩදාසි වර්ගයේ නම යොදා ගැනීමෙන්,

අපට හිතාගත හැක්කේ කුමක්ද හෝම්ස් මහත්තයා?" පියතුමා විමසුවේය.

"ඒක ඒ තරම් හිතාමතා යොදාගත් නමක් කියල මං හිතන්නෙ නෑ" හෝම්ස් කීය. "ඉතාලිය සහ ඊට සමීප සිසිලිය සාඩිනියාව වැනි දූපත්, ත්‍රස්තවාදී හා මැර කල්ලිවල නිජබිම්. ඔලිව් මල් කියන කල්ලියක් ගැන මට මීට කලින් නම් අහන්න ලැබිල නෑ. හොඳයි. දැන් අපි බලමු ඔවුන්ගේ ලිපියේ අන්තර්ගතය කුමක්ද කියලා........"

"ඔබට නීත්‍යානුකූලව, සාධාරණව අයිති දේවල්, ඔබ ළඟ තබාගන්න. එහෙම නොවෙන දේවල් ආපසු අපට දෙන්න. එසේ නොකළහොත්, ඔබට ඉක්මනින් දෙවියන් සමග එකඟතාවයකට ඒමට හැකිවනු ඇත. ඒ කෙසේද යත් අපගේ උදව්වෙන් ඔබට ඉක්මනින් දෙවියන් හමුවෙන නිසා!"

"ඔලිව් මල්"

"අනික් පත්‍රිකාවලින් කියැවුණේත් මේ වගේ පණිවුඩයක්මද?"

"ඔව්"

"ඔබ කිව්වා දැනටම පත්‍රිකා හතරක් ලැබිල තියෙනවා කියල. මේ කීවෙනි එකද?"

"තුන්වැනියට ලැබුණු එක"

"පියතුමනි. දැන් මං අහන මේ ප්‍රශ්නයට හොඳට කල්පනා කර පිළිතුරු දෙන්න.

පණිවුඩ සහිත පත්‍රිකා, ලැබුණු අනුපිළිවෙළින් කියවද්දී, ඒවායේ තර්ජනාත්මක බව ක්‍රම ක්‍රමයෙන් වැඩිවුණාද? එහෙම වුණේ නැද්ද?"

"එහෙම තර්ජනාත්මක බවේ වැඩිවීමක් වුණේ නැහැ කියලයි මට හිතෙන්නෙ" පියතුමා පැවසුවේ නළල රැළි කරගෙන මඳ වේලාවක් කල්පනා කිරීමෙන් පසුවය.

"ඔලිව් මල් කල්ලිය බෙනඩික් මහතාට යම් ආඥාවක් නිකුත් කරල තියෙනවා. නමුත් එය සම්පූර්ණ කළ යුතු අවසන් දිනයක් හෝ වේලාවක් ඔවුන් මෙහි දක්වල නෑ. අනික් පත්‍රිකාවලත් එසේමද?"

"ඔව්. කිසිම දිනයක් හෝ වේලාවක් ඒවලත් නෑ"

"ඔහු හෝ ඔබ මේ ගැන පොලීසියට පැමිණිල්ලක් කළාද?"

"මම නම් එහෙම දෙයක් කළේ නෑ" පියතුමා කීය. "ඔහුත් පොලීසියට මේ ගැන කිව්වෙ නැහැ කියලයි මට හිතෙන්නෙ. එහෙම කිව්වා නම් බෙනඩික් මහත්මයා මේක මා ළඟට ඇවිත් කියන එකක් නෑ. අපි දෙන්නා කතා වුණේ මේක කාගෙ හරි විහිළුවක්ද කියා අපි දන්නෙ නැහැ කියලයි. පොලීසියට කියා පසුව විහිළුවක් කියල ඔප්පු වුණොත් ඒකෙන් අප දෙදෙනාටම ලැජ්ජාවට පත්වීමට සිදුවෙන බව මට හිතුණා."

"ඔව් ඒක ඇත්ත" හෝම්ස් එකඟ විය.

"කොහොම වුණත් බෙනඩික් මහතා වෙත කර තිබෙන තර්ජනයේ, යම් බරපතළ බවක් තියෙනවා කියලයි මට හිතෙන්නෙ. මේ පත්‍රිකා පරීක්ෂා කරලා, ඒක ආවෙ කොහෙන්ද කාගෙන්ද කියන කරුණු පොලීසියට සොයාගන්න හැකිවේවි කියල මං හිතන්නෙ නෑ. නමුත් ඔවුන්ගේ ආරක්ෂාව ඉල්ලා හිටියා නම් ඔවුන් එය ලබාදෙන්න ඉඩ තිබුණා"

"හෝම්ස් මහත්මයා. මට හිතෙන්නෙ ඔබ මේක බොහොම බැරෑරුම් විදියට භාරගන්නා බවක්?" පියතුමා කීය.

"පියතුමනි. මේ ආකාරයෙන් කරන තර්ජන, කොයිවෙලාවකවත් සුළුකොට තකන්න නරකයි." හෝම්ස් කීය. "ඔබ කියන ආකාරයට මේක සමහරවිට විහිළුවක් වෙන්නත් පුළුවනි. අනික් අතට මේක මිනීමරු අරමුණක් ගැබ්වුණු තර්ජනයක් වෙන්නත් පුළුවනි.

මේ පණිවුඩයේ සඳහන් වෙලා තියෙනවා, බෙනඩික් මහතාට සාධාරණව හා නීත්‍යානුකූලව අයිති දේවල් සහ එසේ නොවෙන දේවල් ගැන. එහෙම දෙවර්ගයක බඩු ඔහු ළඟ තියෙන බවක් ඔබට දැනගන්න ලැබිල තියෙනවද? ඔවුන් මේ කතාකරන්නෙ මොනවා ගැනද කියා ඔබ දන්නවාද? ඔහු මේ ගැන ඔබත් එක්ක කිව්වාද?"

"ඔහු මට මොකුත් කියල නෑ. මං ඔහුගෙන් ඇහැව්වෙත් නෑ" පියතුමා කීය. "ඔහු පෞරාණික කලා නිර්මාණ එකතු කරන, ඒවා සංරක්ෂණය කරන කෙනෙකු ලෙස සුප්‍රසිද්ධයි. නමුත් ඔහුගේ ගෙදරට මං කවදාවත් ගිහින් නැහැ. ඒ නිසා ඔහු එකතු කරන්නේ මොන වගේ පරණ දේවල්ද කියන එක මං ඇහින් දැකල නැහැ."

"එතකොට මේ එවා ඇති පත්‍රිකා වල සඳහන් කාරණා ඇත්ත කියල අපි විශ්වාස කළොත්? එතකොට අපට එන්න වෙන්නේ මෙවැනි නිගමනයකට" හෝම්ස් කීය. "තවත් කවුරු හරි

අයිතිවාසිකම් කියන යම් පෞරාණික දේවල්, බෙනඩික් මහත්මයා ලබාගෙන තියෙනවා. ඔහු ඒවා තමන් සතුකරගත්තේ, නීත්‍යානුකූල ක්‍රමයකටද නැද්ද කියන කරුණ අපට කියන්න බෑ.

පියතුමනි. මෙහි මා දකින තවත් කාරණයක් තියෙනවා. මේ පත්‍රිකාවේ අඩංගු ඉංග්‍රීසි වාක්‍ය සැකසීමේදී, ඉංග්‍රීසි ජාතික මුද්‍රණකරුවන් නොයොදන ආකාරයට, පද වෙන් කිරීම් දකින්න ලැබෙනවා. යම් විදේශික මැදිහත් වීමක් මෙතැන තියෙනවාද කියන සැකය මගේ හිතේ මතුවෙනවා. බෙනඩික් මහත්මයාට මේ පත්‍රිකාව එවන්නේ ඉතාලි ජාතිකයෙකු කියලා අප තීරණය කළොත් වරදක් නෑ. මේ බෙනඩික් මහත්මයා නිතර විදේශ ගමන්වල යෙදෙන කෙනෙක්ද? විශේෂයෙන්ම ඉතාලියට?"

"ඇත්තෙන්ම ඔව්" පියතුමා කීය. "ඔහු ඉස්සර කාලේ අවුරුද්දකට තුන් හතර වතාවක් ඉතාලියේ සංචාරය කළ කෙනෙකු බව මං අහල තියෙනවා. නමුත් මෑත කාලයේ, ඒ කියන්නේ පහුගිය අවුරුදු හතක අටක කාලයේදී ඒ තත්ත්වය වෙනස් වෙලා. දැන් ඔහු ඉතාලියට ගියා නම් ඒ අවුරුද්දකට වරක් පමණයි. දැනුයි මට මතක් වෙන්නෙ. කලකට පෙර ඔහු වතිකානුවට ගිහින්, ශුද්ධෝත්තම පාප්වහන්සේ පවා වරක් හමුවුණු බව මට කියල තියෙනවා"

"මේ පත්‍රිකාව අනුව නම් අපට හිතාගන්න තියෙන්නේ, ඔහු අවසර නොමැතිව පෞරාණික යමක් ගෙන ඇවිත් තිබෙන බවයි" හෝම්ස් කීය. "එහෙම නේද පියතුමනි? මං කැමතියි මේ පත්‍රිකාව වැඩිදුර පරීක්ෂණයට ලක් කරන්න. ඔබ මේක මා ළඟ තියල ගියොත්, ඒක ඔබට හෝ බෙනඩික් මහත්මයාට කරදරයක්ද?"

"කොහොමටවත් නැහැ හෝම්ස් මහත්මයා" පියතුමා පිළිතුරු දුන්නේය. "අපරාධ පරීක්ෂණය පිළිබඳ විශේෂඥයෙකුට මං එය භාර දුන්නු බව, ඔහුට දැනුම් දෙන්නම්. මේක යක්ෂයා අප වෙත ළංවෙන තැනක්. මං කැමතියි මේක ඉක්මනින් අවසන් වෙනවා දකින්න" කී පියතුමා තම පපුවේ කුරුසිය ඇන්දේය.

"මේකෙ පිටිපස යක්ෂයා සැඟවී ඉන්නා බව ඔබ විශ්වාස කරනවා එහෙනම්?" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා. මේ මුද්‍රිත පත්‍රිකා ඔහුගේ වැඩ බව මට විශ්වාසයි"

"පියතුමනි. මම යක්ෂයින්ගේ වැඩ කටයුතු හුඟක් දැකල තියෙන කෙනෙක්. මේකෙ අවසානයක් දකින තුරු, ඔබට උදව් කරන්න මං පොරොන්දු වෙනවා"

"ඔබට ස්තුතියි හෝම්ස් මහත්මයා" කී පියතුමා අසුනෙන් නැගී සිටියේය. "ඔබගේ වචනවලින් මගේ සිතට දැනෙන්නේ විශාල සහනයක්. වැස්සත් මඳ වේලාවකට හරි නැවතී ඇති බවයි පෙනෙන්නෙ. එහෙම නම් මට යන්න අවසර දෙන්න. කුමක් හෝ දෙයක් සොයා ගත් වහාම හෝ නිගමනයකට පැමිණි වහාම, මට එය දැනුම් දෙන්න" කී පියතුමා, ඔහුගේ වැහි කබාය හා හිස් වැස්ම ගෙන අපෙන් සමුගත්තේය.

"මේ කඩදාසියේ මුද්‍රිත අකුරෙන්, ඔබට යම්කිසි නිගමනයකට එන්න හැකිවුණේ නැද්ද හෝම්ස්?"

මා විමසුවේ පියතුමා පිටවී ගිය පසුවද පත්‍රිකාව පිරික්සමින් සිටි මගේ මිත්‍රයාගෙනි.

"මේක පැහැදිලිවම අතින් අකුරු අමුණන, කුඩා මුද්‍රණාලයක සිදු කෙරුණු කටයුත්තක්. අකුරු සියයට සීයක් එකම රේඛාවක නොමැති බව කාචයෙන් බැලූ විට පෙනෙනවා. යුරෝපා ජාතිකයන්ට අයත් මුද්‍රණාල මේ ලන්ඩන් නගරයේ කොතෙකුත් තියෙනවා. බාල වර්ගයේ කඩදාසි වෙළෙඳපළේ ඕනෑතරම් තිබියදී, ඇයි මේ ඉතාම හොඳ වර්ගයේ ඉතාලි කඩදාසියක් යොදා ගත්තේ? එක කාරණයක් නම්: ඔහු මුද්‍රණ ක්ෂේත්‍රයේ ඉන්නා කෙනෙකු නම්, වටිනා කඩදාසියක් මේ සඳහා යොදා ගැනීමට යන වියදම, ඔහුට දැනෙන්නෙවත් නෑ. අනික් කාරණය: ඔහු ධනවතෙක් වීමටත් පුළුවනි. ඒ කොහොම වුණත් මේ හැම දෙයක්ම, අප නොමග යැවීමට කරන කපටිකම් වෙන්නත් පුළුවන් වොට්සන්. මේක සිදු කරන පුද්ගලයාගෙ මොකක් හරි සූක්ෂම වැඩ පිළිවෙළක්, යටින් තියෙනවා විය හැකියි.

ඒක නෙමෙයි මිත්‍රයා. ඉතාලි ජාතිකයන් අප අවට හොල්මන් කරන්න හදන මේ වෙලාවෙ, සැඳෑ ආහාරය ඉතාලි අවන්හලකින් ගත්තොත් කොහොමද? එහෙමත් නැත්නම් මේ වැහි දවසෙ ඔබ වැඩිය කැමති, ගේ ඇතුළට වෙලා ඉඳල හඩ්සන් මහත්මියගේ සාමාන්‍ය ඉංග්‍රීසි කෑම වේලකටද?"

"වැස්ස බොහොම දුරට පායලා" මම කීවෙමි. "ඔබ යෝජනා කරන්නේ ගෝල්ඩිනිගේ අවන්හල පැත්තේ යන්න නම්, ඒ ගැන මගේ විරුද්ධත්වයක් නැහැ. අලුත් ඉතාලි වයින් වර්ග කීපයක්ම වැම්බරි සමාගමෙන් ආනයන කර ඇති බව, මං පුවත්පත්වල දුටුවා."

වැස්ස පටන්ගත්තොත් පමණක් කුලීරියක යන අරමුණෙන්, අපි අවන්හල වෙත ඇවිදගෙන යාමට තීරණය කළෙමු. මඟ දිගටම හෝම්ස්ගේ තිබුණේ ඇඩි නිහඬතාවයකි. ජෝසප් පියතුමා ගෙන ආ ගැටලුව ගැන ඔහු ගැඹුරටම කල්පනාවට වැටී ඇති බැව් මම තේරුම් ගතිමි.

ඔහු කතාබහ පටන්ගත්තේ අප අවන්හලට ගොස් රාත්‍රී ආහාරය ඇරඹීමත් සමගය.

"වොට්සන් ඔබ අහල තියෙනවද මං දන්නෙ නෑ, ගියාකොමෝ මෙයර් බියර් නම් ජර්මන් සංගීතඥයා ගැන? අහල නෑ? මේ සියවසේ මුල් භාගයේ උන්නු විශිෂ්ටතම සංගීතඥයන් අතරින් ඔහු ප්‍රමුඛ පෙළේ කෙනෙක්. ඔහුගේ විශිෂ්ටතම ඔපෙරාව තමා "ලෙ හියුගෙනෝ". මං කීපවාරයක්ම එය නරඹලා රසවිඳලා තියෙනවා. නමුත් ආයෙත් සැරයක් එය ලන්ඩනයට ආව දවසක එය නරඹන්න මං කොහොමටවත් අමතක කරන්නෙ නෑ"

"ඔබට තියෙන මේ හැකියාව ගැන, වෙලාවකට මට පුදුමත් හිතෙනවා හෝම්ස්" මම කීවෙමි.

"මොන හැකියාව ගැනද?"

"ජෝසප් පියතුමා අප හමුවෙන්න ඇවිත්, මහ ගැටලුවක් ඉදිරිපත් කළේ අද හවස. ඒක මනුස්සයෙකුගෙ ජීවිතයට තර්ජනයක් එල්ල වෙලා තිබෙන ප්‍රශ්නයක්. ඒකෙ විසඳීම ගැන කතා නොකර ඔබ කොහොමද සංගීතය ගැන හිතන්නෙ?"

"ඔබ කියන දේ තමයි ඇත්ත කියලා, ඔබට හිතෙනවා වෙන්න ඇති වොට්සන්. මං ඔය ගැන දිගින් දිගටම හිතලා, අන්තිමට ඒක ගැන හිතන එක නැවැත්තුවා"

"නැවැත්තුවා? ඒ ඇයි?"

"අපට ලැබී තිබෙන සාධක හා හෝඩුවාවන් අනුව, අපට යන්න පුළුවන් දුර එපමණයි. හරියට ළඟ තිබෙන ගල්අඟුරු හා ජලය අවසන් වුණාම, දුම්රිය එන්ජිමකට එතැනින් එහාට යන්න බැහැ වගේ.

මේ පණිවුඩ ලැබෙන්න පටන් අරගෙන සති හතරක් වෙනවා. නමුත් ඒ ගැටලුව විසඳාගන්න, බෙනඩික් මහත්මයාට ලොකු හදිසියක් නැහැ වගෙයි. ඇත්ත වශයෙන් මේ ගැන ඉදිරියට ආ යුත්තේ ඔහු මිස පියතුමා නොවෙයි නේද. මේක කිසිම හදිසියක් තිබෙන ප්‍රශ්නයක් බව මට නම් පෙනෙන්නෙ නෑ"

හෝම්ස්ගේ ඒ නිගමනය සම්පූර්ණයෙන්ම වැරදි බැව් පසුවදා උදෑසන අපට දැනගන්නට ලැබිණ.

II

ප්‍රශ්නයක් ඔහු හමුවට ආ විට, තමා මීළඟට ගත යුතු ක්‍රියා මාර්ගය හෝම්ස් සැලසුම් කරන්නේ ඉතා සැලකිල්ලෙනි. එමෙන්ම ඉතා සියුම් අයුරින් සිතා බලමිනි. එබැවින් ඔහු ගන්නා තීරණ හෝ නිගමන, සම්පූර්ණයෙන්ම වැරදී යන්නේ ඉතාමත් කලාතුරකිනි.

පසුවදා උදෑසන අප වෙත විදුලි පුවතක් ලැබිණ. හෝම්ස් එය විවෘත කරන අතරේ, උදෑසන පුවත්පත් රැගත් හඩ්සන් මහත්මිය උඩුමහලට ආවාය. විදුලිපුවත විවෘත කළ හෝම්ස්ට කැගැසුණේ ශෝකයෙන් මෙන්ම තමා කෙරෙහි කෝපයෙනි.

"මං මහා මෝඩයෙක් වොට්සන්! මං ගත්තු තීරණය අන්තිම වැරදියි. දෙවියනේ! මෙහෙම දෙයක් වේවි කියල මං හීනෙකින්වත් හිතුවෙ නෑ........" ඔහු අතේ තිබූ විදුලි පුවත උදුරාගෙන මම එය කියවා බැලුවෙමි.

"ඇන්තනි බෙනඩික් ඊයෙ රෑ අද්භූත ලෙස මරා දමලා.
ඩෝචෙස්ටර් වෙත වහා පැමිණෙන මෙන් ඉල්ලා සිටිමි.
මයිකල් ජෝසප් පියනම"

මීළඟට මම උදෑසන පුවත්පත් කිහිපයක්ම පරීක්ෂා කර බැලුවෙමි. සැලකිය යුතු තරම් විස්තරයක් තිබුණේ "ඩේලි එක්ස්ප්‍රස්" පුවත්පතේ පමණි. මම ඒ බැව් මගේ මිත්‍රයාට දැනුම් දුන්නෙමි.

"මට ඒ විස්තරය කියවන්න වොට්සන්"

"........ ඩෝචෙස්ටර්හි සුප්‍රකට ධනපතියෙකු වූ ඇන්තනි බෙනඩික් මහතා, සාහසිකයෙකුගේ වෙඩි පහරින් ඊයේ ජීවිතක්ෂයට පත්වූ බව අප පාඨකයන් වෙත දැනුම් දෙන්නේ සාතිශය සංවේගයෙනි.

බෙනඩික් මහතා මේ අයුරින් ඝාතනයට ලක්වී ඇත්තේ හෝලික්‍රොස් මාවතේ පිහිටි ඔහුගේ නිවසේදීය.

පැවසුණු සාක්ෂිවලින් පෙනී යන්නේ මෙම සිදුවීම වෙද්දී, ඔහු නිවසේ බිම්මහලේ පිහිටි සුරක්ෂිතාගාරය තුළ සිටි බවයි. ඔහු සතු දුර්ලභ එමෙන්ම වටිනා සිතුවම් හා පෞරාණික පිළිම ගබඩා කර තිබුණේද මෙම සුරක්ෂිතාගාරයේය.

ඔහුගේ ප්‍රධාන සේවකයා වූ සයිරස් බොටම්ලි විසිත්ත කාමරය පිරිසිදු කරමින් සිට ඇත. බෙනඩික් මහතා රෑ කෑම සඳහා පැමිණිය යුතු වෙලාවට නොපැමිණි නිසා, සේවකයා අභ්‍යන්තර දුරකතන මාර්ගයකින් තම ස්වාමියා ඇමතීමට උත්සාහ දරා ඇත. නමුත් එයට කිසිදු පිළිතුරක් නොලැබුණු නිසා, බොටම්ලි ඉතා ඉක්මනින් දොර විවෘත කරගෙන ස්වාමියාගේ සුරක්ෂිතාගාරයට පිවිසී ඇත.

සේවකයාට දකින්නට ලැබුණේ තම ස්වාමියා, හිසට සිදුවූ තුවාල සහිතව ලේ විලක් මැද බිම වැටී සිටි ආකාරයයි. සේවකයා එතැනට පැමිණි මොහොතේ බෙනඩික් මහතා සිට ඇත්තේ සිහි විසඥවය.

මේ අනුව ඔහුගේ ජීවිතය බේරා ගැනීමේ අරමුණෙන් වෛද්‍යවරයෙකු වහා කැඳෙව්වත් ප්‍රයෝජනයක් නොවිණි. බෙනඩික් මහතා සිහි නොලබාම මියගොස් ඇත.

මේ අනුව වහාම පොලීසිය කැඳවීමට පියවර ගන්නා ලදී. මෙතැන අභිරහස් ආකාරයේ මිනීමැරුමක් සිදුවී ඇති නිසා, සියලු පරීක්ෂණ කටයුතු ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට භාරවිය. එහි සුප්‍රකට අපරාධ පරීක්ෂක ජී. ලෙස්ට්‍රේඩ් මහතා, මේ අපරාධය සම්බන්ධ පරීක්ෂණය මෙහෙයවන බව, විශ්වාස කටයුතු මාර්ගයකින් "ඩේලි එක්ස්ප්‍රස් පුවත්පතට දැනගන්නට ලැබිණි. මීට අමතරව බේකර් වීදියේ සුප්‍රකට අපරාධ පරීක්ෂණ විශේෂඥ ෂර්ලොක් හෝම්ස් මහතාටද දැනුම් දෙනු ඇතැයි තතු දත්තෝ පවසති"

"එච්චරද වොට්සන්?"

"තවත් තියෙනවා, ඇන්තනි බෙනඩික් මහතා මෑත කාලයේ කළ පරිත්‍යාග සමහරක් කියල විස්තරයක්; ඊට අමතරව ඔහු සතු කලා නිර්මාණවල ලේඛනයක්. ඒවා ඔබට කියවීමට අවශ්‍ය නැහැනෙ?"

"කලකිරීමෙන් මං මේ විදියට නිහඬවීම ගැන මට සමාවෙන්න වොට්සන්. මං කොහොමද දැන් අර මනුස්සයාට මුහුණ දෙන්නෙ? මීට පස්සෙ කවදා හරි දවසක මං මේ විදියට මෝඩයෙකු ලෙස ක්‍රියා කළොත් ඔබ කළ යුත්තේ මොකක්ද දන්නවද? "ඩෝචෙස්ටර්හි බෙනඩික්" කියල මගේ කනට කොඳුරන්න.

සිදුවුණු දේට දැන් කරන්න දෙයක් නෑ. අපට කළ හැක්කේ පුළුවන් ඉක්මනට ඩෝචෙස්ටර් බලා යාම පමණයි. වොට්සන්, ඊට කලින් "කාගේ කවුද?" කෝෂ ග්‍රන්ථය අරගෙන, බෙනඩික් මහත්මයා ගැන එහි සඳහන් වෙලා තියෙන්නෙ මොනවද බලන්න"

ඔහු සඳහන් කළ පොත මම රාක්කයෙන් අතට ගත්තෙමි. පිටු කිහිපයක් පෙරළීමෙන් ඒ නම සොයා ගැනීමට මට හැකිවිණි.

"මේ තියෙන්නෙ හෝම්ස්....... කියවන්නද ඔබට ඇහෙන්න?"

"බෙනඩික්, ඇන්තනි තෝමස් - පෝල් ෆ්‍රැන්සිස් හා ජෙරල්ඩින් බෙනඩික්ගේ වැඩිමහල් පුත්‍රයා. අධ්‍යාපනය - ශාන්ත ලූක් හා ස්ටෝනිහර්ස්ට් විදුහල්. වෙරළාරක්ෂක සේවය, ක්‍රිමියානු යුද්ධයේදී හැම්ෂයර් රෙජිමේන්තුවේ සේවය කළේය."

"...... වොට්සන් ඔහු මුදල් උපයාගත් ආකාරය ගැන මොකක්වත් නැද්ද?"

"....... බ්‍රිටිෂ් මර්කන්ටයිල් බැංකුවේ සහ මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලවල සේවය කර විශ්‍රාම ගත්තේය. "නයිට්ස් ඔෆ් මෝල්ටා" සහ "ඕඩර් ඔෆ්ද හෝලි සෙපල්කර්" නම් රෝමානු කතෝලික ආගමේ ගෞරව සම්මානවලින් පිදුම් ලබා ඇත.

.... එපමණයි"

ශීඝ්‍රගාමී දුම්රියකින් එහි යාමට අපට පැය තුනකට කිට්ටු කාලයක් ගතවන්නට ඇත. මගේ මිත්‍රයා ඒ කාලය ගත කළේ නිහඬව කල්පනා කරමිනි.

ඩෝචෙස්ටර් වෙත පැමිණි අපට බෙනඩික් මහතාගේ නිවස සොයා ගැනීම අපහසු කරුණක් වූයේ නැත. හෝම්ස්ගේ නම සඳහන් කළ විගස, මුරට සිටි පොලිස් භටයා අපට ඇතුළට යාමට අවසර දුන්නේය. මේ වනවිට නිවස තුළ පොලිස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ් සිටියේ ලිපිලේඛන සමූහයක් පරීක්ෂා කරමිනි.

"හෝම්ස් මහත්මයා" අප දුටු විගසම ලෙස්ට්‍රේඩ් ආශිංසනය කළේය. "මට හවුල් වෙන්න ඔබත් මෙහේ ආ බව දකින්න ලැබීම සතුටක්. මේ වගේ සංකීර්ණ පැටළුණු ගැටලුවක්, සෑහෙන කාලයකට මට දකින්න ලැබිල නෑ. ඒ හින්දා ඔබේ පැමිණීම මගේ හිතට ලොකු හයියක්. වොට්සන් දොස්තර මහත්මයා. ආයුබෝවන්. මෙතැන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රශ්න කිසිවක් නැතිවුණත්, ඔබ දකින්න ලැබීමත් සතුටක්"

"ඔබ සමග හවුලේ පරීක්ෂණවල යෙදෙන්න ලැබීම මටත් සතුටක් ලෙස්ට්‍රේඩ්" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය.

"හෝම්ස් මහත්මයා. මේ අපරාධය හා මියගිය තැනැත්තා ගැන මොනවද ඔබ දන්න තොරතුරු? කොහොමද ඔබට ඒව දැනගන්න ලැබුණෙ?"

"මට මේ සම්බන්ධ කාරණා ඊයේ හවස දැනගන්න ලැබුණේ ඩෝචෙස්ටර් දෙව් මැඳුරෙ ජෝසප් පියතුමාගෙන්. අනික් හරිය පුවත්පතේ තිබුණු තොරතුරු තමා.

මෙන්න මේක තමයි පියතුමා මා අතට දුන්නු පත්‍රිකාව" එය ලෙස්ට්‍රේඩ් අතට දුන් හෝම්ස් ඒ පිළිබඳව තමන්ට අසන්නට ලැබුණු විස්තරය පොලිස් නිලධරයාට පැවසීය. මීළඟට හෝම්ස් කීවේ පත්‍රිකාව හා එහි මුද්‍රිත අකුරු මගින්, තමා කළ නිගමන කිහිපයයි.

"කව්ද හෝම්ස් මහත්මයා මේ "ඔලිව් මල්" කියල හඳුන්වාගන්නේ?"

"කණගාටුයි. මාත් ඒ ගැන කිසිදෙයක් දන්නෙ නෑ. මේ අපරාධය ගැන මං දන්නා තොරතුරු හැම දෙයක්ම ඔබට කිව්වා ලෙස්ට්‍රේඩ්. දැන් ඔබේ වාරය. ඔබ සොයාගෙන තියෙන්නෙ මොනවද කියලා මමත් කැමතියි දැනගන්න"

"ඔව්. එහෙම කියන එකත් සාධාරණයි" ලෙස්ට්‍රේඩ් කීය. "ඇත්තනි බෙනඩික් මහත්මයා විශාල ධනවතෙකු බවයි මට දැනගන්න ලැබුණේ. ඔහුගේ මුදල් සියල්ලම වගේ ආයෝජනය කරල තියෙන්නේ කලාකෘතිවලට. ඒ පෞරාණික පිළිම සහ තෙල්සායම් සිතුවම්. කලාකෘති ගැන නම් මං විශේෂඥයෙක් නෙමෙයි. මහත්වරුනි. නමුත් ඔහු ළඟ තිබෙන සමහර දේවල් අවුරුදු පන්සියයකට වඩා පැරණියිලු; ඒ නිසා ඒවාට මිලක් නියම කරන්න පවා අමාරුයිලු.

ඔහුගේ මේ භාණ්ඩ ගබඩාකර තබාගන්න බෙනඩික් මහත්මයා කරල තියෙන්නේ මොකක්ද දන්නවද? ඔහු තමන්ගේ ගෙදර බිම් මහල සුරක්ෂිතාගාරයක් බවට හරවලා. හරියට බැංකුවල සුරක්ෂිතාගාර තියෙන්නේ. අන්න ඒ වගේ එකක්. ඒකෙ දොර අරින්න-වහන්න, නවීන තාක්ෂණික අගුල් පවා තියෙනවලු.

ඔහු තමන්ගේ කාලයෙන් වැඩි හරියක්, මේ තැනට වෙලාලු ගත කරන්නෙ. ඒවා පරීක්ෂාකර බලමින්, ඒවල තොරතුරු අඩංගු

නාමාවලියක් සකස් කරමින්. ඊයෙ රාත්‍රියෙත් ඒ පිළිවෙළේ වෙනසක් තිබිල නෑ. නමුත් රාත්‍රි එකොළහ කියන්නේ ඔහු නින්දට යෑම සඳහා සුරක්ෂිතාගාරයෙන් එළියට එන වෙලාවලු. නමුත් ඇවිත් නැහැ. එතකොට ඔහුගේ සේවකයා බොටම්ලි තම ස්වාමියාගේ සුරක්ෂිතාගාරය තුළට දුරකතන ඇමතුමක් දීල තියෙනවා."

"ආ ඔව්. පුවත් පතේ එහෙම දෙයක් සඳහන් වී තිබුණා. නමුත් ඒක හරි හැටි තේරුම් ගන්න මට බැරි වුණා" හෝම්ස් කීය.

"මමත් මෙහෙම දෙයක් දුටු පළමුවැනි වතාව" ලෙස්ට්‍රේඩ් කීය. "සුරක්ෂිතාගාරයට ඇතුළුවෙන දොරටුව වහලා තිබෙන දොර පියන, ඝනකමින් ඉතාමත් වැඩි එකක්. දොර වහපු වෙලාවට ඇතුළෙ ශබ්ද පිටට ඇහෙන්නෙත් නෑ; පිටත ශබ්ද ඇතුළට ඇහෙන්නෙත් නෑ. ඒ නිසයි මේ වගේ අභ්‍යන්තර දුරකතනයක් සවිකරවා ගන්න, බෙනඩික් තීරණය කරල තියෙන්නේ. ඒ මොකද හදිසියේ තමන් හමුවෙන්න කවුරු හරි ආවොත්, එහෙමත් නැත්නම් වෙනත් කාරණයක් ගැන ස්වාමියාට කතාකරන්න සේවකයින්ට උවමනා වුණොත්, පණිවුඩයක් දෙන්න විධියක් නැති නිසා. එක් අවස්ථාවකදී බෙනඩික්ට සුරක්ෂිතාගාරය තුළ නින්ද ගියාලු. දුරකතනය නාදකරවීමෙන් තමා ඔහු අවදිකරවාගෙන තියෙන්නෙ."

"නමුත් මේ වාරයේ ඒක සාර්ථක වුණේ නෑ?"

"ඔව්. මිනිත්තු තුන හතරකට වඩා දුරකතනය නාද වුණත්, තමන්ගේ ස්වාමියා ඊට ප්‍රතිචාර නොදැක්වූ බව බොටම්ලි කියනවා. බෙනඩික් සාමාන්‍යයෙන් ගැඹුරු නින්දකට වැටෙන කෙනෙකු නෙමෙයිලු. ඒ නිසා තමයි සේවකයාගෙ හිතේ සැකයක් ඇතිවෙලා තියෙන්නේ. ඉතින් ඔහු පහළ තට්ටුවට බැහැලා දොර විවෘත කිරීමට කටයුතු කළා."

"මොහොතක් ඉන්න" හෝම්ස් කීය. "දොර අගුළු දමල තියෙන්නෙ කොහොමද?"

"සංයුක්ත රහස් අංකයක් යොදා ඇති අගුළක් මගින්"

"ඒ සංයුක්ත රහස් අංකය බොටම්ලි දැන හිටියද?"

"ඔව්. ඔහු කියනවා තමන් එය දැන හිටි බව"

"ගෙදර අනික් සේවකයනුත් මේ රහස් අංකය දන්නවද? මේ ගෙදර කවුද ඉන්න සේවකයින්?"

"බොටම්ලි හැරුණාම තවත් මේ ගෙදර ඉන්නවා, කෝකියෙක්, මුළුතැන් ගෙයි වැඩට උදව් වෙන සේවිකාව. තවත් ඉන්නවා ගෘහ සේවිකාවක්. ඊට අමතරව ඉන්නේ උද්‍යානයේ සේවකයා පමණයි. නමුත් ඔහු ගෙදර පදිංචි නැහැ. උදේ ඇවිත් හවස යන, ගමේ පදිංචි කෙනෙක්. මම සේවකයන් හැම දෙනෙකුගෙන්ම ප්‍රශ්න කළා. නමුත් සයිරස් බොටම්ලි ඇරෙන්න අනික් කවුරුවත්, සුරක්ෂිතාගාර දොරේ රහස් අංකය දන්නෙ නැහැලු."

"හොඳයි. බොටම්ලි දොර ඇරගෙන ඇතුළුවුණා. ඊළඟට?"

"ඔහුට දකින්න ලැබුණේ තමන්ගේ ස්වාමියා ලේ විලක් මැද බිම වැටී සිටි ආකාරය. බෙනඩික් මහත්මයාගේ හිසේ පැත්තක සිදුවුණු භයානක තුවාලයත්, බිම වැටී තිබුණු පිස්තෝලයත් සේවකයාට දකින්න ලැබුණාලු"

"ඔව් ඉතින්?"

"මේ අවස්ථාව වෙන කොටත් බෙනඩික් මියගිහින් ඉඳල නැහැ. ඔහු ඉඳල තියෙන්නේ සිහි විසඥව. මීළඟට තමන් කළ යුත්තේ මොකක්ද කියන කරුණ, බොටම්ලි ඉක්මනට කල්පනා කරාලු. ඔහු ගිහින් සේවිකාවන් දෙදෙනා සහ කෝකියාව අවදි කළාලු. එක් සේවිකාවක් යැව්වලු වෛද්‍යවරයා කැඳවාගෙන එන්න. අනික් සේවිකාව යැව්වලු මයිකල් ජෝසප් පියතුමා කැඳවාගෙන එන්න. ඒ තමයි ඊයෙ ඔබට හමුවුණු පියතුමා. බොටම්ලි කෝකියා සමග බෙනඩික් මහත්මයා ළඟ රැඳී ඉඳල තියෙනවා. ඔහුව එතැනින් එහා මෙහා කරන්න ඔවුන් හිතුවේ නැහැලු. ඒ එවැන්නක් කිරීමෙන් තුවාලකාරයාගේ තත්ත්වය, තවත් බරපතළ වේදෝ කියන භය නිසා.

වෛද්‍යවරයා සහ පියතුමා ගෙදරට ඇවිත් තියෙන්නේ එකටම වගේ. ඒ පණිවුඩය යවලා පැය භාගයක් ගතවෙන්නත් කලින්. බෙනඩික්ගේ ජීවිතය ගළවා ගැනීම දුෂ්කර කටයුත්තක් බව වෛද්‍යවරයාට පෙනී ගියා. ඔහු පියතුමාට ඒ බව දැනුම් දීලා තියෙනවා. වෛද්‍යවරයෙකු හැටියට කළ හැකි සෑම දෙයක්ම ඔහු කළාලු. නමුත් තුවාලකාරයා මරණ මංචකය කරා ළංවෙන බව, පියතුමාට පවා පෙනී ගොස් තිබෙනවා. එවිට පියතුමා කතෝලික ආගමේ හැටියට කළ යුතු අවසන් ආගමික චාරිත්‍ර කිරීම ඇරඹුවලු. ඒ අතරේ බොටම්ලි සේවිකාවන් දෙදෙනා අතේ, පළාතේ පොලිස් ස්ථානයට පණිවුඩයක් එවා තිබෙනවා. ඒ නිසයි ස්කොට්ලන්ඩ්යාඩ් එකට වහාම පණිවුඩය ලැබුණේ."

"ඉතාමත් සංකීර්ණ ප්‍රහේලිකාවක්" හෝම්ස් කීය. "සුරක්ෂිතාගාරයක් තුළ මිනිහෙක් ඉන්නවා. මෙකෙ දොර විවෘත කළ හැකි රහස් අංකය දන්නේ, ඔහු සහ ඔහුගේ හිතවත්ම සේවකයා පමණයි. දැනට අපිට දැනගන්න ලැබිල තියෙන්නෙ ඒ විදියට නෙ. සුරක්ෂිතාගාරය තුළ සිටි ගෙහිමියාට වෙඩි තබා, අපරාධකරු පැන යනවා. වෙඩි තැබීමට යොදාගත් පිස්තෝලය ඔහු ගෙන යන්නේ නෑ. ඒක ඔහු බිමට විසිකර යන්නේ. ලෙස්ට්‍රේඩ් ඔබ මෙන්න මේ කරුණ සැකහැර දැනගත්තද?"

"ඒ මොකක්ද?"

"සුරක්ෂිතාගාරයේ ඇතුළත ඉඳලා දොර අරින්නට අර රහස් අංකය උවමනාද? ඊළඟට ඇරල තියෙන දොර වහන්නටත් අංකය උවමනාද?"

"මමත් ඒක තවම හරි හැටි තේරුම් අරගෙන නැහැ හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "ඔබ අදහස් කරන්නේ මොකක්ද කියන එක මට තේරෙනවා. අපරාධකාරයා බෙනඩික් මහත්මයාට වෙඩි තියලා, රහස් අංකය මාර්ගයෙන් තමන්ට යන්න දොර ඇර ගත්තාද? ඊළඟට ඔහු දොර වසා දමා පිටවී ගියේ කොහොමද? ඉතාම වැදගත් කරුණක් හෝම්ස් මහත්මයා. මාත් ඒක සටහන් කරගන්න ඕන"

තම පොත අතට ගත් ලෙස්ට්‍රේඩ් එම කරුණ සටහන් කරගත්තේය.

"මෘත ශරීරය තවමත් තිබෙන්නේ එය මුලින් හමුවුණු තැනමද?" හෝම්ස් විමසීය.

"නැහැ. අපට එය ඉවත් කරන්න සිදුවුණා. දැන් එය තිබෙන්නේ රෝහලේ මෘත ශරීරාගාරයේ" කී ලෙස්ට්‍රේඩ්ගේ දෙතොලට සිනාවක් නැගිණ. "කොහොම වුණත් විශේෂඥ රහස් පරීක්ෂකවරුන් ගේ පිළිවෙළට කටයුතු කරන්න මං අමතක කළේ නෑ. මේ දේවල් මං ඉගෙන ගත්තේ ඔබෙන් කියන්න මම ලැජ්ජා වෙන්නෙත් නෑ. හෝම්ස් මහත්තයා. මළ සිරුර බිම වැටී තිබුණු ආකාරය මං රටහුණු කැල්ලකින් බිම ඇන්දා. මරණය සහතික කරන්න කලින් වෛද්‍යවරයා එහි අත් පා එහා මෙහා කළාලු. ඒ මියගිය බව නිශ්චිතව දැනගැනීමට. ඒ වෙනස් කිරීම්වලට කලින් අත් පා තිබුණු ආකාරය, හරියටම කොහොමද කියලා මං අසා දැනගත්තා."

"මගෙන් උගත් කාරණා ඔබ පිළිපදින බව මට අහන්නත් සන්තෝෂයි" හෝම්ස් කීය. "එතකොට අපරාධය සිදු කළ ආයුධය?"

"ඒක අපි එහෙමම තියෙන්න ඇරියා"

"ඒක බොහොම හොඳයි. දැන් තියෙන්නේ ඇසින් දුටු අයගේ සාක්ෂි විමසීම. ලෙස්ට්‍රේඩ්. ඔබ බොටම්ලිගෙන් ප්‍රශ්න කළාද? ඔහු මේ ගෙදර රැකියාවට ඇවිත් කොච්චර කල්ද?"

"ඔහු මේ ගෙදර ඉතාම විශ්වාස කටයුතු සේවකයෙක් පාටයි. මෙහි රැකියාවකට ඇවිත් දැන් අවුරුදු තිහකට වැඩියිලු" ලෙස්ට්‍රේඩ් කීය.

"මාත් කැමතියි ඔහුගෙන් ප්‍රශ්න කරල බලන්න"

"හෝම්ස් මහත්මයා. මං හිතුවා හැම දේකටම කලින් ඔබ අපරාධය සිදුවුණු තැන පරීක්ෂා කරල බලාවි කියල"

"එතැනත් පරීක්ෂා කළ යුතු තමයි" හෝම්ස් කීය. "නමුත් ඔබ මළසිරුර එතැනින් ඉවත් කරල නේ. ඒ නිසා මං එතැන ඉක්මනින් සෝදිසි කිරීමේ තේරුමක් නෑ. ඒ තරම් ලොකු වෙනස්වීමක් එතැන සිදුවෙන්නෙත් නෑ.

නමුත් ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ මතකය එහෙම නෙමෙයි. බොහොම ඉක්මනට කාරණා අමතක වෙන්න පුළුවනි. මුලදී වැදගත් කියලා ඔහුට සිතෙන දේවල්, මිනිත්තු කිහිපයක් යද්දි හිතෙන්නෙ වැදගත් නැහැ කියල. ඔහු ඇසූ-දුටු දේවල්, ඔහුගේ හිතේ තැන්පත් වෙලා තියෙන්නෙ, නිශ්චල ජලය මත මුද්‍රණය කළ චිත්‍රයක් වගේ. ඒක විසිරෙන්න, රැළි හැදෙන්න කලින්, පුළුවන් තරමක් එළියට ඇදල ගන්න අපට හැකිවිය යුතුයි."

"ඔබ කියන දේ සම්පූර්ණ ඇත්ත" කී ලෙස්ට්‍රේඩ්, බොටම්ලි නම් සේවකයා කැඳවාගෙන එන මෙන් දොර අසල සිටි පොලිස් භටයාට නියෝග කළේය.

ඒ කැඳවීම අනුව පැමිණියේ වයසින් අවුරුදු හැටපහක් පමණ වූ දුර්වල පෙනුමක් තිබූ පුද්ගලයෙකි. ඔහු සේවක නිල ඇඳුමක් හැඳ සිටියේය.

"මේ ඉන්න මහත්මයා තමයි ෂර්ලොක් හෝම්ස් මහත්තයා" ලෙස්ට්‍රේඩ් සේවකයාට කීවේ මගේ මිත්‍රයා හඳුන්වා දෙමිනි. "ඔහුට උවමනාවූ ප්‍රශ්න කිහිපයක් අහන්න"

"බොටම්ලි, මට දැනගන්න ලැබුණා" හෝම්ස් කීය. "සුරක්ෂිතාගාරයේ දොර විවෘත කිරීමට සංයුක්ත රහස් අංකයක් යෙදිය යුතු බව. එය සංයුක්ත අංකයක් වෙන්නේ ඩයල් කිහිපයක් කරකැවීමට සිදුවීමෙන් බව මං දන්නවා.......

.... මගේ පළමු වැනි ප්‍රශ්නය; ඇතුළේ සිට දොර විවෘත කිරීමටත් මේ රහස් අංකය දැනගෙන සිටිය යුතුද?"

"ඔව් මහත්මයා"

".......... ඊළඟට දොර ඇතුළෙන් වැසීමටත්, පිටතින් වැසීමටත්, දෙකටම රහස් අංකය පාවිච්චි කිරීමට සිදුවෙනවද?"

"ඔව් මහත්මයා. ඇතුළෙන් වැහුවත් පිටතින් වැහුවත් දෙකේදිම අංකය අවශ්‍යයි"

"ඔබේ ස්වාමියා ඔබ කෙරෙහි විශ්වාසයෙන්, එම රහස් අංකය ඔබට පමණක් හෙළිකර ඇති බව, මේ පොලිස් පරීක්ෂක මහත්තයා මට කිව්වා. මේක ඒ විදියට ඔබට දැනගන්න ලැබිලා දැන් හුගක් කල්ද?"

"නැහැ මහත්මයා. ඒක මා අතට ලැබිලා මාසෙකට වැඩිවුණේ නැහැ."

"හොඳයි. ඔබ දන්නා තරමින් මේ ගෙදර අය අතරින් ඒ අංකය දන්නේ ඔබ විතරද?"

"ඔව් මහත්මයා" බොටම්ලි පිළිතුරු දුන්නේය. "මෙම දොර වැසීමට හා ඇරීමට රහස් අංකයක් අවශ්‍ය බව, මේ ගෙදර අප කවුරුත් දැන හිටියා. ඔහුගේ හදිසි මරණයකදී දොර විවෘත කිරීම ප්‍රශ්නයක් වෙන බව මහත්මයා කිව්වා. ඒ නිසා මේ අංක සඳහන් කළ ලියමනක්, තමන්ගේ බැංකුවේ තැන්පත් කර ඇති බව බෙනඩික් මහත්මයා කිව්වා. හදිසියකදී ඒ බව නීතිඥ මහත්මයාට දැනුම් දෙන්න කියලත් මට කිව්වා."

"ඉතාම බුද්ධිමත් පියවරක්" හෝම්ස් කීය. "ඔබ මේ අංකය කිසිම විටෙක කිසිම කෙනෙකුට දැනුම් දී නැති බව සහතික කර කියන්න පුළුවන්ද?"

"ඔව් මහත්මයා. ඒ ගැන මට පුළුවනි දිවරන්න"

"එහෙම දිවුරුවා නම් ඒක වලංගු වෙන්නේ, මේ මොහොත දක්වා පමණයි" හෝම්ස් කීය. "ඒ මොකද දැන් ඔබට සිදුවෙනවා ඒ සංයුක්ත රහස් අංකය අපට හෙළිකරන්න"

"හෙළිකරන්න?" සේවකයා කීවේ තළල රැළි කරමිනි. "මං ඒක මගේ ස්වාමියාගෙන් භාරගත්තේ කිසි විටෙකත් කාටවත් හෙළි නොකරන පොරොන්දුව මත"

"නමුත් ඔබ දැන් කිව්වා වගේ, බෙනඩික් මහත්මයාගේ දේපළ පිළිබඳව කටයුතු කිරීමට එම අංකය බැංකුවෙන් ලබාගන්න සිදුවෙනවා. ඒ සඳහා පොලිස් පරීක්ෂක මහත්මයාට කළ යුතු වෙන්නේ, උසාවි නියෝගයක් ලබාගැනීම පමණයි"

"එහෙම නම් මං එය ඔබට හෙළි කරන්නම් මහත්මයා" කියූ සේවකයා අංකය හෙළි කළේ රහසක් කියන ආකාරයට කොඳුරමිනි.

සංයුක්ත අංකය 220-71-845

"ඔබට ස්තූතියි" කී හෝම්ස් එය තම සටහන් පොතේ ලියා ගත්තේය. ලෙස්ට්‍රේඩ්ද හෝම්ස් අනුගමනය කළේය.

"ඔබේ ස්වාමියාගේ මළසිරුර හමුවුණු අවස්ථාවේ ඔබ කටයුතු කර තිබෙන්නේ ඉතාමත් බුද්ධිමත් ආකාරයට" හෝම්ස් කීය. "මේ මහත්තයා මට ඒ ගැන කිව්වා. කලින් කියූ ඒවාට අමතරව ඔබ දැනුම් දිය යුතු තවත් කාරණා තියෙනවද? ඔබේ ස්වාමියා සමග අමනාප අය කවුරුත් ගැන හෝ ඔබ දන්නවද?"

වයස්ගත සේවකයා මඳ වේලාවක් නිහඬව කල්පනා කළේය.

"නැහැ මහත්මයා. මං දන්න තරමින් එහෙම කිසි කෙනෙක් හිටියෙ නෑ"

මේ අවස්ථාවේ සේවකයා කතාබහ අවසන් කිරීමට උත්සාහ කළේ නොඉවසිලිමත් බවකිනි.

"මහත්මයා, මං හිතන්නෙ මං දන්න හැම දෙයක්ම ඔබට කියලයි තියෙන්නෙ. පොලීසියට ප්‍රයෝජනවත් වේවි කියල හිතන තවත් මොනවා හරි මට මතක් වුණොත් මං ඔබට දැනුම් දෙන්නම්"

"බොටම්ලි. මං ඔබෙන් ප්‍රශ්න කර අවසන් නෑ" හෝම්ස් කීය. "කරුණාකරල කල්පනා කර බලන්න. පසුගිය කාලෙ ඔබේ ස්වාමියා හමුවෙන්න අමුත්තො කවුරු හරි ආවද? ඒ කවුද?"

සේවකයා මිනිත්තු කිහිපයක්ම කල්පනා කරමින් සිටියේය. අප කිසිවෙකුගේ මුහුණ කෙළින් නොබැලූ ඔහු වෙතින් දිස්වූයේ කැලඹීමට පත් ස්වභාවයකි. එක් වරක් තම හිස් මුදුන කැසූ ඔහු තීරණයකට පැමිණි බැව් පෙනිණ.

"මහත්මයා. ඔබ අහන්නේ අර ඉතාලි ජාතික මහත්මයා ඇරෙන්න, වෙනත් කවුරුවත් ආවද කියලද?"

අපි තුන්දෙනා මුහුණට මුහුණ බලාගත්තෙමු. ලෙස්ට්‍රේඩ්ගේ මුහුණෙන් නම් දිස්වූයේ මවිතය නොව කෝපය බැව් අපි දුටුවෙමු.

"ඔය ඉතාලි කාරයෙක් ගැන, තමුසෙගෙ කලින් කට උත්තරයේ මට කිව්වෙ නැහැනෙ බොටම්ලි" ලෙස්ට්‍රේඩ් කීය. "එයා කවුද, මොකක්ද එයා එක්ක ඔහේගෙ තිබෙන සම්බන්ධය කියල ඉක්මනට කිව්වොත් හොඳයි"

සයිරස් බොටම්ලිගේ මුහුණ ලැජ්ජාවෙන් රතු වූ බැව් පෙනිණ. කථාව ඔහු ඇරඹුවේ තරමක් අපහසුවෙනි.

"......... මහත්මයා. එයත් එක්ක මගේ නම් සම්බන්ධයක් නෑ. ඇත්තම කියනවා නම්, එයාට මහත්මයෙකුගෙ පෙනුමක් නෑ. ඉලන්දාරි ගැටයෙක්. බෙනඩික් මහත්මයා නම් මේ ඉලන්දාරියාව සාදරයෙන් පිළිගත්තා. ඔවුන් දෙදෙනා කෞතුකාගාරයේ ඇතුළෙ කතාබහ කරමින් පැය ගණන් ගත කළා."

"ඔය කියන්නෙ මොන කෞතුකාගාරයක් ගැනද?"

"මට සමාවෙන්න මහත්මයා" බොටම්ලි කීය. "අපේ මහත්මයාගෙ කලාකෘති තිබෙන සුරක්ෂිතාගාරයට, අපි කවුරුත් විහිළුවට කිව්වෙ කෞතුකාගාරය කියල."

"මේ ඉතාලි ජාතිකයා පුරාවස්තු වෙළඳාමේ යෙදුණු කෙනෙක් කියලද ඔබ හිතන්නෙ?" හෝම්ස් විමසුවේය.

"ඒ ගැන නම් මං මොකුත් දන්නෙ නෑ මහත්මයා"

"හොඳයි. මේ ඉතාලි ජාතිකයා බෙනඩික් මහත්මයා හමුවෙන්න අන්තිමට ආවෙ කවදද?"

"ඇයි මහත්මයා ඔහු ඊයෙ රෑත් ආවනේ"

ලෙස්ට්‍රේඩ්ගේ මුහුණ යළිත් වරක් කෝපයෙන් රතුවිය. හෝම්ස්ගේ මුහුණේ ද මම වෙනසක් දුටුවෙමි.

"බොටම්ලි. මේ අහනවා!" ලෙස්ට්‍රේඩ් කීවේ කෝපයෙනි. "ඊයෙ දවස ඇතුළත වුණු සිදුවීම් එකින් එක විස්තර කරන්න කියලා, මං තමුසෙට කිව්වේ මෙහේ ආව ගමන්. නමුත් මේක ඉතාම වැදගත්ම කාරණයක්. මේක මට නොකියා තමුසෙ ඇයි මඟ ඇරියෙ?"

"ඒක එච්චර වැදගත් කාරණාවක් කියල මට හිතුණෙ නෑ මහත්මයා"

"වැදගත් මොනවද නොවැදගත් මොනවද කියල තීරණය කිරීම අපට අයිති වැඩක්. තමුසෙට කරන්න තියෙන්නෙ දන්නා හැම දෙයක්ම හෙළි කිරීම"

"මට ඒ ගැන කණගාටුයි මහත්මයා"

"හොඳයි බොටම්ලි. දැන් මෙන්න මේ කාරණා මට කියන්න" හෝම්ස් කීවේ සේවකයා අමතමිනි. "මේ ඉතාලි ජාතිකයා මේ ගෙදරට ආවෙ කීයටද? ඔහු පිටව යද්දී ගේට්ටුව ඇරල දුන්නෙ ඔබද? එහෙනම් ඒ කීයටද?"

"ඔහු ගෙදරට ආවෙ හරියටම රාත්‍රී අටට." බොටම්ලි කීය. "ඔහු වෙනුවෙන් දොර විවෘත කළේ මම. මං ඔහු විසිත්ත කාමරයට කැඳවාගෙන ආවා. ඒ මොකද බෙනඩික් මහත්මයා ඔහු එනතුරු විසිත්ත කාමරයේ බලාගෙන සිටි නිසා."

"ඔබේ මහත්මයා මේ ඉතාලි ජාතිකයා එනතුරු බලාගෙන හිටියා?" ලෙස්ට්‍රේඩ් විමසුවේය.

"ඔව්. ඔහු එනතුරු තමා බලාගෙන ඉන්නා බව, බෙනඩික් මහත්මයා මට හවස කියලයි තිබුණේ. මේ ඉතාලි මහත්මයා මේ ගෙදරට ඇවිත් යන්නේ, දැන් බොහොම කාලයක ඉඳල........ මං හිතන්නේ අවුරුදු හතරක විතර ඉඳල"

"නිතර නිතර ඇවිත් යන කෙනෙක්ද?"

"ඉස්සර නම් ඔහු ඇවිත් ගියේ සති දෙකකට වරක් පමණ. නමුත් මෑතක ඉඳල ඒ කියන්නේ මාසෙක එකහමාරක ඉඳල ඔහු නිතර නිතර ඇවිත් ගියා. ඒ කියන්නේ සතියකට වරක් හෝ දෙකක්"

"ඔය ඉතාලි ජාතික මහත්මයා ඊයෙ රෑ මේ ගෙදරින් පිටවෙලා ගියේ කීයටද?" හෝම්ස් විමසුවේය." ඉදිරි දොර ඇරලා ඔහුට පිටවී යන්න ඉඩ සැලැස්සුවේ ඔබද?"

"මගේ මතකයේ හැටියට ඔහු පිටත්වී ගියේ, රාත්‍රී 9 ට ටිකකට කලින්"

"ඔහු ගෙදරින් පිටවෙලා ගියා කියල ඔබට හොඳටම විශ්වාසද?"

"මෙහෙමයි මහත්මයා" බොටම්ලි කීය. "මම ඒ වෙලාවේ හිටියේ සාලයට යාබද කෑම කන කාමරයේ. මං හිටියේ හැඳි ගෑරුප්පු පිහි පිසදමමින්.

දෙදෙනෙකු සාලය හරහා ඇවිද යන අඩි ශබ්දය මට ඇහුණා. ඒ වෙලාවෙ ඔවුන් හිටියේ කතාබහක නිරත වෙලා. ඉස්සරහ දොර විවෘත කරන ශබ්දය මට ඇහුණා. ඊළඟට දෙදෙනා එකිනෙකාට ශුභ රාත්‍රියක් ප්‍රාර්ථනා කරගන්නවාත් මට ඇහුණා. ඊළඟට ඉස්සරහ දොර වැහෙන ශබ්දයත්, ගේ ඇතුළට කෙනෙකු එන අඩි ශබ්දයත් මට ඇහුණා. මං ඒ වෙලාවේ හැඳි ගෑරුප්පු ගණන් කරමිනුයි

හිටියේ. ඒ නිසා ඒ පැත්තට මං ඒ හැටි අවධානයක් යොමු කළේ නෑ. නමුත් කෙනෙකුගේ අඩි ශබ්දය ඇහුණා. ඔහු ගේ ඇතුළට ඇවිත් තරප්පු පෙළ බැහැලා සුරක්ෂිතාගාරයට ගියා. එහි දොර වහනවා මට ඇහුණා. සැකයක් නෑ. ඒ අපේ මහත්මයා විය යුතුයි."

"ඊළඟට තවත් වාරයක් දොර විවෘත වෙන ශබ්දයක්, ඔබට ඇහුණෙ නෑ කියල හොඳටම විශ්වාසද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා නැහැ. දොර ආයෙ සැරයක් විවෘත වුණේ නැහැ"

"හොඳට කල්පනා කරල බලල, මට දැන් මෙන්න මේ කාරණය කියන්න බොටම්ලි" හෝම්ස් කීය. "ඔවුන් ගෙයින් පිටවෙන්න සූදානමෙන් ඉදිරි දොර වෙත එද්දී, ඔවුන් කතාබහ කරමින් හිටි බව ඔබ කිව්වා. ඔබට ඔවුන් කියූ දේවල්, වචන දෙක තුනක් හෝ කනට වැටෙන්න ඇති. ඔවුන් මොනවා ගැනද ඒ කතාබහ කළේ? දෙදෙනා අතර තිබුණේ මොන වගේ ආකල්පයක්ද? මිත්‍රශීලී එකක්ද? එහෙම නොවෙයිද?"

සේවකයාගේ සුදුමැලි මුහුණ රතු පැහැයට හැරිණි. කථා කිරීමට උත්සාහ කළත් වචන පිට කර ගැනීමට නොහැකිව ඔහුට ගොත ගැසිණ.

"......... මහත්මයා. ඒක .... ඒක ඔවුන්ගේ පෞද්ගලික කතාබහක්. මං ඒක ඔබට හෙළි කළ යුතුමද?"

"ඇයි මනුස්සයෝ! මෙතැන ඔබේ ස්වාමියා මරා දමලා!" ලෙස්ට්‍රේඩ් කෑගැසුවේ, සත්සුන් වන මෙන් හෝම්ස් කළ සංඥාව නොතකමිනි. "මේ මරණය ගැන අභිරහස හෙළිකර ගැනීමට, මේක වැදගත් සාක්ෂියක් වෙන්න පුළුවනි........."

"හොඳයි. එහෙම නම් මං කියන්නම් මහත්මයා" බොටම්ලි කීවේ යටහත් පහත් ස්වරයෙනි. "මොකක් හරි දෙයක් ගැන ඒ දෙන්නට, එකඟතාවයකට පත්වෙන්න බැරි වෙලා. ඒ මොකක් ගැනද කියන්න නම් මම දන්නේ නෑ. මං කාරණා හංගනවා කියල හිතන්න එපා. කොහොම වුණත් මට වාක්‍ය කිහිපයක් කඩින් කඩ ඇහුණා. අපේ මහත්තයා කිව්වා,

"......... ඒ දේ මං අද රාත්‍රියේ කළ යුතුමයි. මට වෙන විකල්පයක් නෑ"

එතකොට ඉතාලි මහත්තයා කිව්වා.

"ඒක අද රෑ සිදුවෙන්න උවමනා නෑ. මට පුළුවන් කමක් තියෙනවා නම් ඒක නවත්වන්න, ඒ වෙනුවෙන් ලෝකෙ පෙරළන්න වුණත් මං සූදානම්."

"ඒකට ඔබේ මහත්මයා මොනවද කිව්වේ?"

"එතකොට ඔහු මෙහෙම කිව්වා: "මං හිත හදාගෙන තීරණයකට ඇවිත් ඉන්නේ. මාව භයකරලා මාව තවදුරටත් නවත්වන්න, ඔබට පුළුවන් කමක් නෑ"

ඊට පස්සේ තමයි දෙන්නා ඉස්සරහ දොර ඇරලා එළියට බැස්සේ. සුභ රාත්‍රියක් ප්‍රාර්ථනා කළාට පස්සේ වැලෙන්ටිනෝ මහත්මයා යන්න ගියා"

"හ හා! එතකොට මේ අබිරහස් මහත්මයාගෙ නම වැලෙන්ටිනෝ. එහෙමද?" ලෙස්ට්‍රේඩ් විමසුවේ සිනාවක්ද සමගය. "මේ පුද්ගලයාට තිබෙන අනික් නම් ඔබ දන්නවා ඇති. ඒවා මොනවද? ඔහු ගැන මොනවද ඔබ දන්න වෙනත් තොරතුරු?"

"ඔහුගේ මුල නම සිල්වෙස්ට්‍රෝ" සේවකයා කීය. "ඒ මොකද අපේ මහත්මයා ඒ නමින් තරුණයා අමතනවා මට කිහිප වාරයක් ඇහිල තියෙනවා"

"ඔහු පදිංචි කොහේද කියල ඔබ දන්නවද?"

"ඔව් මහත්මයා. ඔහු පදිංචි ලන්ඩනයේ. ඔහු නමට තැපැල් කිරීම සඳහා බෙනඩික් මහත්මයා මා අතට ලියුම් දීල තියෙනවා. ඒ නිසා මට ලිපිනය කට පාඩමින් කියන්න පුළුවනි; සිල්වෙස්ට්‍රෝ වැලෙන්ටිනෝ, අංක 7 හෙන්රියටා වීථිය."

"ඔහුගේ වයස?"

"මට නම් හිතෙන්නේ වයස තිහක් හතළිහක් ඇති."

"බොටම්ලි. තමුසේ මේ තොරතුරු මට දෙන්න තිබුණේ මීට කලින්" ලෙස්ට්‍රේඩ් කීය. "මගේ රාජකාරියට බාධා කිරීම උඩ, මට තිබුණා තමුසෙව හිරභාරයට ගන්න. එහෙම දෙයක් නොවුණේ තමුසෙගෙ හොඳ වෙලාවට කියල හිතාගන්නවා"

"ඔය ඇති ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීවේ පොලිස් නිලධරයා සන්සුන් කිරීමට උත්සාහ දරමිනි. "සැකයක් නෑ. ඊයෙ රෑ වුණු සිදුවීමෙන් බොටම්ලිගේ මොළය සම්පූර්ණයෙන්ම අවුල්වෙලා ඇති"

හෝම්ස් මීළඟට හැරුණේ සේවකයා දෙසටයි. "මේ ටිකත් මට කියන්න බොටම්ලි. බෙනඩික් මහත්මයා සහ ඉතාලි ජාතික

තරුණයා අතර කෙරුණු අවසන් කතාබහ, අවසන් වුණේ මොන ආකාරයටද? ඒක කෝපාවිෂ්ටව සිදුවුණාද? නැතිනම් එහෙම නෙමෙයිද?"

"ඔබ කියන ආකාරයේ තරහක් තිබුණා කියල මට හිතෙන්නේ නැහැ මහත්මයා. එකිනෙකාගෙන් සමුගනිද්දි තිබුණේ, සුහද බවක් කියලයි මට හිතුණේ"

තමාට වෙනත් ප්‍රශ්න නොමැති බව හෝම්ස් පැවසීය. ඒ අනුව සේවකයාට එතැනින් පිටවී යාමට අවසර ලැබිණ.

"වොට්සන්. ඔබ මේතරම් වෙලා කිසිම දෙයක් කිව්වෙ නෑ." හෝම්ස් කීය. "ඔබට මොනවද බොටම්ලි ගැන හිතෙන්නෙ?"

"එයා දන්නා මොනවා හරි දෙයක් එයා අපට හංගනවා. මට හිතුණෙ එහෙමයි" මම කීවෙමි.

"දෙයියම්පා! ඔබ කියූ දේ සහතික ඇත්ත වොට්සන් මහත්තයා" ලෙස්ට්‍රේඩ් කීවේය." මට හොඳටම විශ්වාසයි, මේ වැලෙන්ටිනෝ කියන යක්ෂයා, මියගිය බෙනඩික් ගැන මොකක් හරි රහසක් දන්නවා. ඒක හෙළි කරන බවට තර්ජනය කරමින්, ඌ බෙනඩික්ගෙන් කප්පම් ගන්න ඇති. මේ මිනිහා බොටම්ලිත් ඒකට හවුල්. කීයක් ඔට්ටුද? ඔය දේ තමයි සිදුවෙන්න ඇත්තෙ"

"මටත් හිතෙන්නෙ එහෙම දෙයක්" මම කීවෙමි.

"බොටම්ලි තමන් දන්න දේ නොකියා යමක් හංගන බව ඇත්ත" හෝම්ස් කීය. "ඔබ කියන ඒ කාරණයට මමත් එකඟයි. ඒ වුණත් රහස් හෙළිකරනවා කියල බෙනඩික්ගෙන් කප්පම් ගැනීමක් සිදුවුණා කියන කාරණයට මං එකඟ නෑ. මං එහෙම කියන්නෙ ඇයි කියල ඔබ ඇහුවොත්? ඒකට හේතු ඉදිරිපත් කරන්නත් මට පුළුවන් කමක් නෑ. හැබැයි එක කාරණයක් මට සක්සුදක් සේ විශ්වාසයි. ඒ තමයි බොටම්ලි කියන්නේ, තමන් දන්නා රහස් ලෙහෙසියෙන් එළියට දමන කෙනෙකු නොවෙන බව. බුල්ඩෝග් වර්ගයේ බල්ලෙකුගේ කටින් අල්ලා ගත්තු දෙයක්, එළියට ඇද ගැනීම කරන්න පුළුවන් දෙයක්ද? ඒ වගේ තමයි බොටම්ලිත්. දරුණු බලපෑමක් කළොත් මිස, ඔහු දන්නා දේවල් හෙළි කරගන්න හැකි වෙන්නෙ නෑ"

"හෝම්ස් මහත්මයා. ඔබ කිව්වා නේද ඔබට ජෝසප් පියතුමා හමුවෙන්න තිබුණා නම් හොඳයි කියලා?"

"ඇත්තෙන්ම ඔව්. නමුත් ඊට කලින් අපි මේ බේදවාචකය සිදුවුණු තැන ටිකක් පරීක්ෂා කරල බලමු. ලෙස්ට්‍රේඩ් ඔබට හිතෙන්නෙ එතුමා මෙහේට ගෙන්වා ගැනීම සූදානම් කරන්න ඔබට හැකියි කියලද?"

"ඒකෙ ප්‍රශ්නයක් නෑ හෝම්ස් මහත්තයා. මට කරන්න තියෙන්නේ, පියතුමා මෙහේට කැඳවාගෙන එන්න කියලා පොලිස් භටයෙකු යැවීම පමණයි"

"දැන්ම නෙමෙයි" හෝම්ස් කීය. "තවත් පැය දෙකකින් විතර ඔහු මෙහේට කැඳෙව්වාම ඇති. ඒ සමගම මා යැවිය යුතු විදුලි පුවතකුත් තියෙනවා. මං ඒක ලියා දෙන්නම් පොලිස් භටයා අතට"

"ඒක ඒ විදියට කරමු" ලෙස්ට්‍රේඩ් කීය. "හෝම්ස් මහත්තයා. ඔබට හිතෙන්නෙ නැද්ද අර ඉතාලි කාරයා මෙහාට කැඳෙව්වොත් හොඳයි කියල? වැඩිදුර ප්‍රශ්න කිරීම සඳහා ඔහු මෙහේට ගෙන ඒම අත්‍යවශ්‍යයි කියල. මං ස්කොට්ලන්ඩ්යාඩ් එකට විදුලි පුවතක් යවන්නම්. බෙනඩික් මහත්මයාට තර්ජනය කරලා එවූ පත්‍රිකාවල, ඉතාලි සම්බන්ධය ගැන ඔබ මට කිව්වා. ඊළඟට මේ වැලෙන්ටිනෝ කියන මිනිහත් ඉතාලි කාරයෙක්. එහෙම වීම අහම්බෙන් වුණු එකක් කියලද ඔබ කියන්නේ?"

"කොහොමටවත් නෑ ලෙස්ට්‍රේඩ්. ඒක අහඹු සිදුවීමක් කියල මං කියන්නෙ නෑ. නමුත් බැලූ බැල්මට මතුපිටින් පෙනෙන දේ ගැන ලොකු විශ්වාසයක් තියන්න එපා. එහෙම කිරීම අවදානම්"

හෝම්ස් එසේ කීවේ බිම් මහලේ සුරක්ෂිතාගාරයට යාම සඳහා සූදානමෙන් අප අසුන්වලින් නැගිට්ටේය.

III

බෙනඩික් මහතාගේ සුරක්ෂිතාගාරය හැඳින්වීමට සේවකයන් යොදාගත් නම "කෞතුකාගාරය" යන්න අතිශයින්ම ගැළපෙන වචනයක් බැව් අපට පෙනී ගියේය.

එයට තිබූ එකම දොරටුව වැසීමට යොදාගත් දොර පියන, අඟල් 6 ක් පමණ ඝනකම් ඕක් දැවයෙන් සැදුණු එකක් විය. දොර වසා දැමීම සඳහා තිබුණේද, සංයුක්ත අංකයකින් ක්‍රියාත්මක වුණු සංකීර්ණ අගුළකි. සුරක්ෂිතාගාරයේ එක් බිත්තියක්ම වැසී තිබුණේ ප්‍රදර්ශන භාණ්ඩ අසුරා තිබූ රාක්කවලිනි. ඒ ප්‍රමාණයෙන් කුඩා

තෙල් සායම් චිත්‍ර, වීදුරු පෙට්ටිවල ඇසිරූ රිදී හා රත්රන් ආභරණ, මැණික් එබ්බවූ කඩු කිණිසි වැනි ආයුධ ආදියෙනි. තවත් බිත්තියක් දිගට වූ රාක්කවල බිම් මට්ටමේ සිට ඉහළට නොයෙක් ආකාර හා ප්‍රමාණවල පිළිම රාශියක් විය. මෙයින් බොහොමයක් ආගමික සංකේත බැව් අපි දුටුවෙමු. පුරාණයේ ලෝකඩවලින් සෑදූ ඒවා මෙන්ම, මෑත කාලයේ පළිඟු කිරිගරුඬ වැනි ඛණිජ වලින් කැටයම් කරන ලද ඒවාද ඒ අතර විය. ප්‍රමාණයෙන් දිගු වූ එක් බිත්තියක උඩ සිට පහළටම, ලොකු තෙල් සායම් චිත්‍ර සවිකර තිබිණි. සිතුවම් ගැන විශේෂඥයකු නොවූවත්, මේවා ඩාවින්සි, මයිකල් ආන්ජෙලෝ වැනි චිත්‍ර ශිල්පීන්ගේ හෝ, සමකාලීනයන්ගේ සිතුවම් බැව් මම තේරුම් ගතිමි.

"ඉතාම අලංකාර ප්‍රදර්ශනාගාරයක්" හෝම්ස් කීය. "මේකට සේවකයන් යෙදූ කෞතුකාගාරය කියන නම අපූරුවට ගැළපෙනවා. එහෙම නේද ලෙස්ට්‍රේඩ්?"

"සම්පූර්ණ ඇත්ත හෝම්ස් මහත්මයා."

"මේ තැනට වාතාශ්‍රය ලැබෙන්නේ කොහොමද දන්නෙ නැහැ නේද?" හෝම්ස් විමසීය. "මං තේරුම් ගත් විදියට මළසිරුර හමුවුණු වෙලාවෙ ඉඳල මේ වෙනතුරුත්, ගෑස්ලාම්පු එක දිගට දැල්වෙමින් තිබුණා. ඒ කියන්නේ ඊයේ හැන්දෑවෙ ඉඳලම. එහෙම නේද?"

"අපි ඒවට අත තිබ්බෙ නෑ හෝම්ස් මහත්තයා" ලෙස්ට්‍රේඩ් කීය. "අන්න අර පැත්ත බැලුවොත් ඔබට පෙනේවි, මේකට පිරිසිදු වාතාශ්‍රය ලබාදෙන තැන. එතැන කවුළුවක් වගේ ඉඩක් තිබෙනවා. ඒකට යකඩ ග්‍රිල් එකකින් ආරක්ෂාව ලබාදීලයි තියෙන්නේ. මේ කෙළින්ම අනික් පැත්තේත් මේ විදියටම කවුළුවක් තියෙනවා. ඒ නිසා වාතාශ්‍රය ගැන කිසිම ප්‍රශ්නයක් නෑ. ඒ වගේම මේ කවුළු උවමනා වෙලාවට වසා දැමිය හැකි පියන් තිබෙන බව ඔබට පෙනෙනවා ඇති. ඒවාට සම්බන්ධ කර තිබෙන රැහැන් පොටවල් මගින්, ඒ කටයුත්ත ඉතා කාර්යක්ෂමව කරන්න පුළුවනි. නමුත් මං ඔබට සහතික කරන්නම්. අපි ඒවට අත වත් තැබුවෙ නෑ."

මේ වනවිට අපි මෘතශරීරය හමුවූ බැව් පැවසෙන ස්ථානයට ළඟාවී සිටියෙමු. ලෙස්ට්‍රේඩ් කලින් පැවසූ ආකාරයට, ඔහු පොළොවේ රටහුණු වලින් ඇඳ තැබූ සලකුණ, පැහැදිලිව දැකිය

හැකි විය. මළසිරුරේ හිස තිබූ ස්ථානය වටේට ලේ නිසා ඇතිවූයේයයි සිතිය හැකි අඳුරු පැහැති පැල්ලමක් විය.

හෝම්ස්ගේ අවධානය මුලින්ම යොමු වූයේ, මළසිරුර තිබුණු තැන සිට අඩි තුනක් පමණ ඈත තැනකටයි. ඒ රිවෝල්වරය බිම වැටී තිබූ තැනය. එතැන දණ ගසාගත් හෝම්ස් ගිනි අවිය අතින් නො අල්ලා, එයට ඇස ළංකොට පරීක්ෂා කළේය. අනතුරුව කබා සාක්කුවෙන් උත්තල කාචය අතට ගෙන එය ආධාරයෙන්ද තව දුරටත් පරීක්ෂාව කළේය. තම සටහන් පොත මගෙන් ඉල්ලාගත් ඔහු මීළඟට යමක් එහි ලියා ගත්තේය.

"ලෙස්ට්‍රේඩ්. ඔබ පොලිස් ඡායාරූප ශිල්පියා ගෙන්වලා මෙතැන ඡායාරූප ගත කළාද?"

"ඔව් හෝම්ස් මහත්මයා. මළසිරුර ඉවත් කරගෙන යන්න කලින් එය වැටී තිබුණු සැටිත්, ගිනි අවිය තිබුණු සැටිත් ඡායාරූප ගත්තා. ඊළඟට ගිනි අවියේ වෙනම ඡායාරූපත් ගත්තා"

"නමුත් එය අතින් ඇල්ලුවේ නැහැ?"

"නැහැ මහත්මයා"

"විශිෂ්ටයි. මිනීමරුවා අපරාධය සඳහා යොදාගෙන තිබෙන්නේ බෙරෙටා වර්ගයේ ලැරමි නම් මාදිලියේ රිවෝල්වරයක්"

"මොකක්ද හෝම්ස් මහත්තයා ඒකෙ තිබෙන වැදගත්කම?"

"වැදගත්කමද? මේක ඉතාලියේ බෙරෙටා සමාගමේ නිෂ්පාදනය කරන, යුරෝපයේ අපරාධකාරයින් අතර ජනප්‍රිය ගිනි අවියක්"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! ඉතාලිකාරයා ඒක තමන්ගේ රටෙන්ම ගෙනැවිත් වගෙයි" ලෙස්ට්‍රේඩ් පැවසුවේ විස්මයෙනි.

"ඔබේ ඒ මතයට මමත් එකඟයි ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "මේ රටේ බහුල වශයෙන් දකින්න ලැබෙන්නේ, එංගලන්තයේ සහ ඇමරිකාවේ නිෂ්පාදිත ගිනිඅවි. එහෙම තිබියදී........."

මීළඟට මගේ මිත්‍රයාගේ අවධානය යොමු වූයේ, සුරක්ෂිතාගාරයේ දොරේ තිබූ සංකීර්ණ අගුළ වෙතය. මේ ආකාරයේ නවීන තාක්ෂණයෙන් සම්පූර්ණ අගුළු, බොහෝවිට දක්නට ලැබෙන්නේ, බැංකුවල මුදල් ගබඩාකර තිබෙන සුරක්ෂිතාගාරවල පමණක් බැව් හෝම්ස් කීය. ඔරලෝසු මුහුණත්

වැනි ඩයල කිහිපයක් කරකවමින් රහස් අංකය 220-71-845 යෙදූ පසු දොර විවෘත කිරීමට හැකිවිණි. නමුත් ඒ විගසම ඩයලවල අංක 000-00-000 ලෙස වෙනස් වූයේ ස්වයංක්‍රීයවය. ඒ අනුව දොර වසා දැමීම සඳහා යළිත් වරක් අගුළට රහස් අංකය ලබා දිය යුතු බැව් අපි දුටුවෙමු. හෝම්ස් කරුණු ගණනාවක්ම තම සටහන් පොතේ ලියා ගත්තේ සියුම් නිරීක්ෂණවලින් පසුවය.

ලෙස්ට්‍රේඩ්ගේ නියමය නිසා එම නිවසේම අප වෙනුවෙන් දහවල් ආහාරය පිළියෙල කර තිබිණි. දහවල් අහර අවසන් කොට අප විසිත්ත කාමරයේ කෝපි බොමින් සිටියදී නිවසේ සීනුව නාද වෙනු අපට අසන්නට ලැබිණ.

"ආ........ පියතුමා විය යුතුයි. මට තව ටිකෙන් අමතක වෙනවා" හෝම්ස් කීවේ තම සාක්කු ඔරලෝසුව පරීක්ෂා කරමිනි.

"ඉතාම ඛේදජනක සිදුවීමක් මහත්වරුනි" පියතුමා කීවේ ඔහු වෙත ගෙන එන ලද කෝපි කෝප්පය අතට ගනිමිනි.

"මීට වඩා ඉක්මනින් ක්‍රියාත්මක නොවීම ගැන, මං ඔබෙන් සමාව අයදිනවා පියතුමනි" හෝම්ස් කීය.

"ඒ ගැන ඔබට චෝදනා කරන්න කොහොමටවත් බෑ හෝම්ස් මහත්තයා" පියතුමා කීය. "මෙහෙම දෙයක් සිදුවේවි කියල ඔබ කොහොම හිතන්නද. අනික මේ ප්‍රශ්නය මං ඔබට දැනුම් දුන්නේ ඊයෙ හවස"

"බෙනඩික් මහත්මයාගේ අවසන් මොහොතේ ඔබ ඔහු ළඟ සිටි බව අපට අහන්න ලැබුණා පියතුමනි. ඔහුට යළි සිහි ලැබුණේ නැද්ද? ඔහුගේ කටින් එක වචනයක්වත් පිටවුණේ නැද්ද?"

"නෑ මහත්මයා. මං එද්දී ඔහු සිටියේ සිහි විසඥව. ඔහු දෙවියන් වෙත යාමට ඉතා සමීප බව වෛද්‍යවරයා මට දැනුම් දුන්නා. ඒ අනුව මං හැකිතරමින් ආගමික කටයුතු සිදුකළා. ඔහුට යළි සිහි ලැබුණා කියා මං හිතන්නේ නෑ."

"ඔහුගෙන් වචනයක්වත් අහගන්න වෛද්‍යවරයාට හැකිවුණෙත් නෑ?"

"මං දන්න තරමින් නෑ"

"පියතුමනි. ඔබතුමා අහල තියෙනවද වැලෙන්ටිනෝ කියල කෙනෙකු ගැන?" හෝම්ස් විමසුවේය.

"මං හිතන්නේ මට ඔය නම අහන්න ලැබිල තියෙනවා" පියතුමා කීය. "ඒ මොකද ඉතාලියෙන් එංගලන්තයට එන

සංක්‍රමණිකයන් ගැන සොයා බලන, අපේ ආගමික සංගමයක් තිබෙනවා. ඒකෙදි වෙන්න ඕන මට ඔය නම අහන්න ලැබුණෙ"

"එතකොට සිල්වෙස්ට්‍රෝ වැලෙන්ටීනෝ කියල කෙනෙකු ගැන ඔබතුමා දන්නවද?" මෙවර හෝම්ස් විමසුවේ අවධාරාණාත්මක හඬකිනි.

පියතුමා දෙඋර හැකිළුවේ තමා ඒ ගැන නොදන්නා බවක් හඟවමිනි. "සමහරවිට අහලත් ඇති. මුල නමත් වාසගමත් දෙකම ඉතාලි ජාතිකයන් අතර නිතර අහන්න ලැබෙන නම්. එහෙම කෙනෙකු ගැන මට නිශ්චිතව මතක නෑ. ඇයි ඔබ ඒ ගැන මගෙන් ඇහුවෙ?"

"ඒකට හේතුව ඔබතුමාට හෙළිකරන්න මට හැකියාවක් නෑ" හෝම්ස් පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙනි. "හරියට දෙවිමැඳුරට ඇවිත් පාපෝච්චාරණයෙදි කියන දේවල් අපට හෙළි කරන්න, ඔබතුමාට පුළුවන්කමක් නැහැ වගේ......."

එයට පිළිතුරු ලෙස ජෝසප් පියතුමාගේ මුහුණට නැඟුණේ ප්‍රසන්න සිනාවකි.

"හොඳයි හෝම්ස් මහත්මයා. ඔබට වෙනත් ප්‍රශ්න නොමැති වගෙයි. එහෙනම් මම යන්නද?"

එයට එකඟත්වය පළ කරමින් අප අසුන්වලින් නැගිටිද්දීම පොලිස් භටයෙක් එහි පැමිණියේය. ඒ ඩෝචෙස්ටර් පොලීසියෙනි.

"ඔබට අවශ්‍ය පුද්ගලයා පොලිස් භාරයට අරගෙන මෙහේට එවූ බව දැනුම් දෙන්න කියා, ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් කිව්වා" පොලිස් භටයා කීය. "ලන්ඩනයෙන් පිටත් වෙන්න සිදුවුණු ප්‍රමාදය නිසාලු, ඔවුන් මේ පණිවුඩය එවන්නේ. තවත් පැයක් පමණ ගතවෙද්දී ඔවුන් මෙහේට ළඟාවේවිලු"

"දැන් මොකක්ද අපි කරන්නේ?" හෝම්ස් විමසීය. "මං හිතාගෙන හිටියේ අපි මෘත ශරීරය පරීක්ෂා කරල බලන්න යමු කියන්න"

"කමක් නෑ හෝම්ස් මහත්මයා. අපි ඒ කටයුත්තට ගිහිං එමු" ලෙස්ට්‍රේඩ් කීය. "අපට පුළුවනි ඉක්මනින් ගිහිං එන්න"

මෘතශරීරාගාරයට පිවිසි පසු හෝම්ස් තම අවධානය මුලින්ම යොමු කළේ, බෙනඩික් මහතා ඇඳ සිටි ඇඳුම්වල සාක්කු කෙරෙහිය. එහෙත් ඒවා තුළ කිසිවක් දැකගන්නට නොලැබිණි. මෘතශරීරාගාරයේ සේවකයන් විසින් සාක්කුවල තිබූ සියලුම දේ ඉවත් කොට, වෙනත් තැනක ආරක්ෂා සහිතව තබා තිබිණි. එහෙත්

එතැනින් ද වැදගත් යමක් හමුනොවුණු බව හෝම්ස් පසුව මා සමග කීය.

ඉන්පසු ඔහුගේ අවධානය යොමු වූයේ බෙනඩික් මහතාගේ හිසේ තිබූ තුවාලය වෙතයි. ප්‍රබලකාචය උපයෝගී කරගෙන හෝම්ස් කරුණු රැසක් සටහන් කරගත්තේය. වෙඩි පහර එල්ල වී තිබුණේ දකුණු කන ඉදිරියෙන් සහ එය ඉහළින් "බොරු ඇහැ" ප්‍රදේශයටයි. වක්‍ර වූ තුවාලය අවට තිබූ ලේ, පටකවල සුන්බුන් සහ දැවුණු වෙඩි බෙහෙත්වල දැලි, මෘත ශරීරාගාර සේවකයන් විසින් පිරිසිදු කොට තිබිණි. මේ ගැන හෝම්ස් එතැන ප්‍රධානියාට මෙන්ම පොලිස් නිලධරයාටද දොස් පැවරුවේය.

කෙසේ වෙතත් තවමත් ඉතිරිව තිබූ සලකුණු කිහිපයක්ද විය. සම තුළට කාවැදුණු දැවුණු වෙඩි බෙහෙත්වල කළුපාට ලප, තැඹිලි පාටට හුරු දුඹුරු පාට ලකුණු, එහි සටහන් වී තිබුණේ "පච්ච කෙටීම්" විලසිනි. මගේ මිත්‍රයා තම සටහන් පොතේ රූප සටහනක් ඇඳ, තුවාලයේ දිග පළල ටේප් පටියකින් මැණ, එයද සටහන් කර ගත්තේය. මීළඟට තම බෑගයෙන් කපු පුළුන් කැබලි රැසක් සහ කුඩා බෝතලයක් ගත් ඔහු, එහි තිබූ දියරයෙන් බිංදු කිහිපය බැගින් පුළුන් කැබලි මතට දැමීය. අනතුරුව මළසිරුරේ අත් දෙකේම ඇඟිලි සහ අත්ලද, මුහුණේ තුවාලය අවටද පුළුන් කැබලිවලින් පිසදා, ඒවා වෙන වෙනම කවරවලට දමා සටහන් කර ගත්තේය.

හෝම්ස්ගේ අවසන් රාජකාරිය වූයේ මියගිය පුද්ගලයාගේ කන්පෙතිවල රූප සටහන් ඇඳ ගැනීමය. මෙය ඉක්මනින් නිම වෙතැයි මම බලාපොරොත්තු වූයෙමි. එහෙත් එයට සෑහෙන වේලාවක් ගතවිය. වම් අතේ රඳවාගත් මකන කැබැල්ලෙන් වරින් වර මකමින්, HB පැන්සලකින් ඔහු ඇඳගත්තේ, ප්‍රමාණයෙන් විශාල කරන ලද රූප සටහන්ය. එයද අවසන් කොට අපි බෙනඩික් මහතාගේ නිවස බලා ආපසු ඒමට පිටත් වූයෙමු.

අප එතැනට ළඟාවී මිනිත්තු පහක් ගතවීමට පෙර තවත් කුලීරියක් එහි පැමිණියේය. පොලිස් භටයන් දෙදෙනෙකුට මැදිවී එයින් බැස්සේ, හැඩිදැඩි එහෙත් වයසින් අවුරුදු තිස්පහක පමණ එමෙන්ම විදේශික පෙනුමක් තිබූ තරුණයෙකි.

"හෝම්ස් මහත්තයා. ඔබ ආවෙ නියම වෙලාවට" කී ලෙස්ට්‍රේඩ් මීළඟට හැරුණේ තරුණයා දෙසටයි. "මහත්මයා. අපට උවමනා වෙලා තියෙනවා ඔබගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න. ඒවා

ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කිරීම ඔබට අපහසුවක්ද? එහෙම නම් අපට පුළුවනි ඉතාලි භාෂාව දන්නා භාෂා පරිවර්තකයෙකු ගෙන්වා ගන්න."

"උවමනා නෑ. මට පුළුවනි ඉංග්‍රීසි තේරුම් ගන්න සහ කථාකරන්න"

"ඒක ලොකු පහසුවක්" ලෙස්ට්‍රේඩ් කීය. "භාෂා පරිවර්තකයෙකු හරහා කටයුතු කරන්න මං හරි අකමැතියි. මං ඔබට මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. ඒ තමයි; මේ ප්‍රශ්න කිරීම සිදු කෙරෙන්නේ රාජකාරි මට්ටමෙන් බව. ඔබ කියන සෑම ප්‍රකාශයක්ම ලිඛිතව සටහන් වෙනවා. ඒවා ඔබට විරුද්ධව සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට, ඉඩ තිබෙන බව මා මතක් කළ යුතුයි. ඒක පැහැදිලිද?"

"ඉතාම පැහැදිලියි" තරුණයා කීය. "ඔබ මාව අත් අඩංගුවට ගන්නද සූදානම් වෙන්නෙ?"

"එහෙම දෙයක් තවමත් නැහැ. ඔබට පුළුවනි ඕනෑම වෙලාවක මෙතැනින් පිටවී යන්න. නමුත් මේ මරණයට ඔබ වගකිවයුතු බව පෙනී ගියොත්, ඕනෑම මොහොතක ඔබ පොලිස් අත්අඩංගුවට පත්වීමටත් ඉඩ තියෙනවා"

"මට තේරෙනවා"

"කරුණාකර ඇවිත් අපට මුහුණදාලා මේ මේසෙ ළඟ වාඩිවෙන්න. මම තමයි ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ජී. ලෙස්ට්‍රේඩ්. මගේ දකුණු පැත්තේ ඉන්නේ පෞද්ගලික රහස් පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහතා. මේ ඔහුගේ මිත්‍ර වොට්සන් දොස්තර මහතා. එයාලා ඇවිත් ඉන්නේ මගේ පරීක්ෂක කටයුතුවලට සහාය වෙන්න"

තරුණයා තවමත් හිඳගත්තේ නැත. ඔහු උස මහත හැඩිදැඩි පුද්ගලයෙකු බව මම කලින් සඳහන් කළෙමි. බෙනඩික් මහතා වැනි වයස්ගත දුර්වල අයෙකු සමග පොර බැදුවා නම්, ඔහු පරාජය කිරීම මෙවැන්නෙකුට දුෂ්කර කටයුත්තක් නොවේ.

"සිල්වෙස්ට්‍රෝ වැලෙන්ටිනෝ කියන්නෙ ඔබද?"

"ඔව්"

"ඔබ එංගලන්තයේ පදිංචියට ඇවිත් දැන් කොච්චර කාලයක් වෙනවද?"

"අවුරුදු හතරකට ටිකක් වැඩියි"

"ඒ කාලෙ ඉඳලම ඔබ ඇන්තනි බෙනඩික් මහත්තයාව හඳුනනවා?"

"මං එංගලන්තයට එන්න කලින් ඉඳන් ඔහුව හඳුනනවා. මගේ පවුලේ ඥාතීන් හැම දෙනෙකුම වගේ ඉන්නේ ඉතාලියේ. ඔහු අවුරුදු ගණනාවක සිට මගේ පවුලේ මිත්‍රයෙක්"

"ඔබේ රැකියාව මොකක්ද?"

මෙවෙලේ ලෙස්ට්‍රේඩ්ගේ ප්‍රශ්න ඇසීමට හෝම්ස් බාධා කළේය.

"මගේ හිතවත් ලෙස්ට්‍රේඩ්. ඔබ අහන්නේ බැලූ බැල්මට පෙනෙන පැහැදිලි කාරණයක්. වැලෙන්ටිනෝ මහත්මයා රැකියාව කරන්නේ මුද්‍රණ ක්ෂේත්‍රයේ. ඔහුගේ මහපටැඟිල්ල මත සහ නියපොතුවලට යටින් ඇති තීන්තවලින් පෙනෙන්නෙ නැද්ද, ඔහු අකුරු අමුණන්නෙකු බව. ඔබේ රැකියාව ඒක නේද මහත්මයා?"

ඉතාලි ජාතිකයාගේ මුහුණට එය සත්‍යයක් බව පෙන්වන සිනාවක් නැගෙද්දී, ලෙස්ට්‍රේඩ්ගේ මුහුණ රතු විය.

"ඔව් මහත්මයා ඒක ඇත්ත. මම එංගලන්තයට ආව දවසෙ ඉඳල රැකියාව කරන්නෙ අකුරු අමුණන්නෙකු හැටියට. ඒ ඉතාලි ජාතිකයන්ට අයත් ගොඩොල්ෆින් වීදියේ පිහිටි මුද්‍රණාලයක"

"කුමක්ද ඒ ආයතනය?"

"බාතොලමියෝ සහ බොවෙටා මුද්‍රණ සමාගම"

"ඔබ නිතර නිතර බෙනඩික් මහත්මයා හමුවෙන්න ආවද?"

"ඒ කාලයේදී නම් මං ඔහු හමුවෙන්න ආවේ සති දෙකකට වරක්. මෑතකදී නම් ළඟ ළඟම ආවා"

"ඔබේ ඒ පිළිවෙළ වෙනස් වුණේ ඇයි?"

"ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මං කැමති නෑ"

ලෙස්ට්‍රේඩ් නළල රැළි කර ගත්තේ මවිතය ප්‍රකාශ කරමිනි. "ඊයේ රාත්‍රි ඔබ මේ ගෙදරට ඇවිත් ගිය බව අපට දැනගන්න ලැබුණා. ඒක ඇත්තද?"

"ඔව්"

"පිටවී යන මොහොතේ බෙනඩික් මහතා සහ ඔබ අතර ආරවුලක් ඇතිවූ බවයි අපට අසන්නට ලැබුණේ........"

"ඒක ආරවුලක් හැටියට හඳුන්වන්න බෑ. ඒක යම් කරුණක් ගැන අප දෙදෙනාට එකඟත්වයට පත්වීමට නොහැකිවීමක්"

"එහෙම නොහැකි වුණේ කුමන කාරණය ගැනද?"

"ඒක ඔබට පැවසීම මං ප්‍රතික්ෂේප කරනවා"

"ඔබ කැමති මගේ ප්‍රශ්නවලට පිළිතුරු නොදී සිටීමට නම්, මට නෑ ඒකට කළ හැකි දෙයක්" ලෙස්ට්‍රේඩ් කීය. "ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතුමයි කියා ඔබට බල කරන්න මට පුළුවන් කමක් නෑ. හොඳයි. එකඟත්වයකට එන්න බැරිවුණාම ඔබ ගෙදරින් පිටවෙලා ගියා?"

"ඔව්"

"ඊළඟට මොනවද ඔබ කළේ?"

"මං දුම්රිය පොළෙන් යූස්ටන් වෙත යන 9.32 දුම්රිය අල්ලා ගත්තා. හෙන්රියටා වීදියේ මගේ නිවසට යද්දි රෑ එකොළහ පමණ වෙන්න ඇති"

"ඔබ ඩෝවෙස්ටර් දුම්රිය පොළේ, දුම්රියේ, යූස්ටන් දුම්රිය පොළේ දුටු කවුරුන් හෝ ඉන්නවද? එහෙමත් නැත්නම් හෙන්රියටා වීදියේ නිවසට ඇවිද යද්දී දුටු අඳුනන කෙනෙක්?"

"මා අඳුනන කිසිම කෙනෙකු මට හමුවුණේ නෑ" තරුණයා කීය. "නිවස පැත්තෙ කෙනෙකු මා දකින්න ඉඩ තිබුණා, අඩු ගණනේ හැන්දෑවෙ හයට හතට වත් මා එහි ගියා නම්"

"ඔබට කියන්න තියෙන්නේ එපමණද?"

"ඔව් මහත්මයා. මගේ රැකියාවේ වැඩ අතරමග නවත්වලයි මං ආවේ. ඒ නිසා මං වහාම ආපසු යා යුතුයි"

"මට අහන්න තියෙන්නේ තවත් ප්‍රශ්න කිහිපයක් පමණයි" ලෙස්ට්‍රේඩ් කීය. "බෙනඩික් මහත්මයාගේ සේවකයා වන සයිරස් බොටම්ලි සමග ඔබේ තියන මිත්‍ර සම්බන්ධය මොකක්ද?"

"කිසිම මිත්‍ර-සම්බන්ධයක් නෑ. මං ගෙදරට ඇවිත් සීනුව නාද කළාම, ඔහු තමයි දොර ඇරලා මාව ඇතුළට ගත්තේ. සමහරදාට මට පිටවී යාමට ඉඩ සලසන්නේත් ඔහු. සමහර අවස්ථාවලදී, ඊයෙ රෑ වගේ බෙනඩික් මහත්තයාත් ඒ කටයුත්ත කළා. ඔහුගේ නියෝගවලට අනුව කෑම බීමවලින් මට සංග්‍රහ කිරීම බොටම්ලි කරල තියෙනවා. ඒ ඇරෙන්න ඔහු සමග විශේෂ හැඳුනුම්කමක් හෝ හිතවත් කමක් මට නෑ"

"ඔබ සාන්ත මරියා දෙව් මැඳුරේ මයිකල් ජෝසප් පියතුමන්ව අඳුනනවද?"

"මගේ ඇඳුනුම් කමක් නෑ. දෙව්මැඳුරේ ප්‍රධානියා ඒ පියතුමා බව මං දන්නවා. අපි කතාබහ කරද්දී ඔහු ගැන, බෙනඩික් මහත්තයා නොයෙක් වාරවල මට කියල තියෙනවා"

"මට ඔබෙන් අහන්න තියෙන වැදගත්ම ප්‍රශ්නය මේකයි" ලෙස්ට්‍රේඩ් කීවේ අවධාරණාත්මක හඬෙනි. "ඒකට පිළිතුරු දීමත් ඔබ ප්‍රතික්ෂේප කරාවිද මම දන්නේ නෑ. ඔබ නිතර නිතර මෙහේ ඇවිත් බෙනඩික් මහත්තයා සමග කතාබහ - සාකච්ඡා කළා. ඒ මොනවා ගැනද?"

"මහත්මයා. මගේ පරම්පරාවෙම අය කරන ව්‍යාපාරය කලාකෘති විකිණීම. මගේ අම්මාගේ තාත්තා, එනම් මගේ සීයා වූ ෆ්‍රෙඩරිකෝ වැලෙන්ටිනෝ පටන්ගත් ව්‍යාපාරය තමා, අද දක්වා දියුණුවෙලා තියෙන්නේ. අපේ ප්‍රධාන ආයතනය තිබෙන්නේ රෝම නගරයේ. ෆ්ලෝරන්ස්, වෙනිස් හා නේපල්ස් නගරවල අපේ ශාඛා තියෙනවා. දැන් ඒවා පවත්වාගෙන යන්නේ මගේ මාමාවරුන්. විසින්. බෙනඩික් මහත්මයාට අපේ පවුල හඳුනාගැනීමට ලැබුණේ, කලාකෘති මිලට ගන්න රෝමයට පැමිණීමෙන්. ඔහුට උවමනා වුණු කලාකෘති ලබාදෙන්න බොහෝවිට අතරමැදියෙකු හැටියට කටයුතු කළේ මම."

"ඔබ ඔහුගෙන් මුදල් භාරගෙන, ඒවාට හරියන්න කලාකෘති ගෙනැත් දුන්නා?"

"ඔව්"

"ඔබ ඒ සඳහා ගාස්තුවකුත් අය කළා?"

"මං කළේ පවුලේ ව්‍යාපාරයකට සම්බන්ධ කටයුත්තක් නිසා මුදලක් භාරගන්න මං කැමතිවුණේ නෑ. නමුත් මගේ මහන්සිය වෙනුවෙන් මුදලක් ගන්න කියා බෙනඩික් මහත්මයා බල කළා"

මිනිත්තු කිහිපයකට පසු ලෙස්ට්‍රේඩ් කඩදාසි කිහිපයක් තරුණයා ඉදිරියට තල්ලු කළේය.

"මේක කියවලා බලල අත්සන් කරන්න. හෝම්ස් මහත්මයා. ඔබට මොකුත් ප්‍රශ්න තිබෙනවාද?"

හෝම්ස් හිස සොලවා හැඟවූයේ තමාට ප්‍රශ්න නොමැති බවයි.

"එහෙනම් ඔබට යන්න පුළුවනි." ලෙස්ට්‍රේඩ් කීය. "ඔබෙන් මීළඟට ප්‍රශ්න කරද්දී, මීට වඩා විවෘතව අපට සහයෝගය දෙන්න කියලා මං ඔබෙන් ඉල්ලා හිටිනවා"

"ඔබ කියන්නේ මගෙන් තව තවත් ප්‍රශ්න කරනවා කියලද?"

"ඒ ගැන කිසිම සැකයක් නෑ"

ලෙස්ට්‍රේඩ්ගේ එම පිළිතුරත් සමගම තරුණයා අසුනෙන් නැගිට්ටේය. මීළඟට ඔහු සූදානම් වූයේ පිටවී යාමටයි. මෙපමණ වේලාවක් සම්පූර්ණයෙන්ම නිහඬව බලා සිටි ෂර්ලොක් හෝම්ස්

මේ මොහොතේ තරුණයා ඇමතීය. තම නම සහ බේකර් වීදියේ ලිපිනය මුද්‍රිත කාඩ්පත ඔහු තරුණයාට ඉදිරිපත් කළේය.

"වැලෙන්ටිනෝ මහත්මයා, මොහොතක් ඉන්න. නුදුරු අනාගතයේදී ඔබට මගේ සේවය අවශ්‍ය වීමට ඉඩ තියෙනවා" කී හෝම්ස් කාඩ්පතේ යමක් කුරුටු ගෑවේය. "හෙට උදේ දහය වුණත් මට පහසුයි, ඔබට අපහසුවක් නැත්නම්"

මගේ මිත්‍රයාගේ එම කටයුත්තෙන් තරුණයා පුදුමයට පත්වූ බව පෙනිණ. කාඩ්පත අතට ගෙන එයට නෙත් යොමුකළ ඔහු, මීළඟට හිස පහත් කොට හෝම්ස්ට ආචාර කළේය. අනතුරුව තරුණයා එතැනින් පිටවී ගියේ "හෙට උදේ ඔබ හමුවීමට මං නොවරදවාම එන්නම්" කියමිනි.

තරුණයා පිටවී ගිය පසු එතැන මිනිත්තු කිහිපයක් යනතුරු නිහඬතාවයක් පැවතිණ.

"හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීවේ නිහඬතාවය බිඳිමිනි. "හෙට උදේ දහය වෙන කොට ඔය මිනිහා ඉන්නේ පොලිස් අත් අඩංගුවේ"

"එතකොට ඔබ හිතන්නේ අපරාධකාරයා ඔහු කියලයි?"

"ඇත්තෙන්ම ඔව්. තව ටිකෙන් මං ඔහුව මෙතැනදීම අත් අඩංගුවට ගන්නවා"

"ඒකට ප්‍රමාණවත් තරම් සාක්ෂි ඔබ ළඟ තියෙනවද? හෝම්ස් විමසුවේය.

"ප්‍රමාණවත් තරම් සාක්ෂි?" ලෙස්ට්‍රේඩ් විමසුවේ උපහාසාත්මක සිනාවක්ද සමගය. "ඔහුට විරුද්ධව සාක්ෂි තියෙනවා උවමනාවටත් වැඩිය. අපි දන්නවා බෙනඩික් වෙනුවෙන් අතරමැදියා හැටියට කටයුතු කළේ මේ තරුණයා බව. කලාකෘති සඳහා මුදල් විශාල ප්‍රමාණවලින් හුවමාරු වෙන්න ඇති. එහෙම දෙයක් වෙනකොට, වංචා කිරීම් සහ වරදවා වටහාගැනීම් වෙන්න තියෙන ඉඩකඩ වැඩියි.

වැලෙන්ටිනෝ ඉතාලි ජාතිකයෙක්. බෙනඩික් මරාදැමූ ආයුධයත් ඉතාලියේ බොහොම ජනප්‍රිය, එංගලන්තයේ එතරම් දක්නට නොලැබෙන ආයුධයක්. ඔබම කිව්වා මේ බෙරෙටා රිවෝල්වරය නිෂ්පාදනය කරන්නේත් ඉතාලියේ බව.

ඊළඟට ඔබම කිව්වා බෙනඩික්ට ලැබුණු මුද්‍රිත පත්‍රිකාව, අතින් අකුරු ඇමිණු මුද්‍රණාලයක කළ, විදේශිකයකු සම්බන්ධ යයි සැක

හිතෙන එකක් බව. වැලෙන්ටිනෝ මුද්‍රණාලයක අකුරු අමුණන කෙනෙක්.

ඔහු නිතර මෙහේ ආවගිය කෙනෙක්. ඊයේ රාත්‍රි මෙහේ ආව බව ඔහුම පිළිගත්තා. දෙදෙනා වෙන්වී ගියේ කිසියම් ප්‍රශ්නයක් ගැන එකඟතාවයකට එන්න බැරිව. මට හිතෙනවා බොටම්ලිත් මොහුට හවුල් කියලා. පොලිස් භටයන් දෙදෙනාට මැදිවෙලා තරුණයා ගේ ඇතුළට එද්දි, බොටම්ලිගේ මුහුණ මොන වගේද කියල ඔබ දුටුවද?"

"නැහැ" හෝම්ස් කීය.

"ඒක නේ හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීවේ අවඥාවෙන් සිනාසෙමිනි. "ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අපේ නිරීක්ෂණ දුර්වලයි කියල, ඔබ සහ වොට්සන් මහත්මයා නැවත නැවතත් කියනවා. නමුත් නිරීක්ෂණය අත්‍යවශ්‍ය තැනක, ඔබ ඒක හරිහැටි කරල නැහැ. වැලෙන්ටිනෝ මෙහාට ගෙන එන හැටි දුටුවාම බොටම්ලිගේ මුහුණ එල්ලා වැටුණේ, අවතාරය දුටු හැම්ලට් කුමාරයාගේ මුහුණ වගේ"

"ඔබට හොඳටම විශ්වාසයි අපරාධකාරයා ඔහු බව?" හෝම්ස් ඇසීය.

"ඒ ගැන කිසිම සැකයක් නෑ හෝම්ස් මහත්මයා. බෙනඩික් ඝාතනය කළේ ඉතාලිකාරයා නොවෙයි නම් වෙන කවුද? ඇසින් දුටු සාක්ෂි නැති බව ඇත්තයි. නමුත් ඔහු අපරාධකාරයා බව, වක්‍ර සාක්ෂි මගින් ඔප්පුවෙනවා"

"ලෙස්ට්‍රේඩ්. ඔබ කියන කාරණා බොහොමයකට මට පුළුවනි එකඟ වෙන්න" හෝම්ස් කීය. "නමුත් මට නොපැහැදිලි ඒ වගේම මගේ හිතේ සැක උපදවන තැන් දෙකක් තියෙනවා"

"මොනවද ඒ තැන්?"

"එයින් පළමුවැනි එක: ඔබ කිව්වා දෙදෙනා අතර ආරවුලක් ඇතිවෙන්න ඇත්තේ, කලාකෘති ගනුදෙනුවේදී තරුණයා කළ, මුදල් වංචාවක් නිසා විය හැකියි කියල. ඒක සිදුවෙන්න ඇත්තේ කොහොම කියලද ඔබ හිතන්නෙ?"

"හෝම්ස් මහත්මයා. ඒක හරිම සරලයි. මේක ඔබ හොඳින්ම දන්නා දෙයක්. සැබෑ කලාකෘති අනුකරණය කරමින්, මෑත කාලයේ ව්‍යාජ ලෙස කළ පිටපත් කිරීම් විකිණීම ගැන, අපි හැමෝම දන්නවා. මයිකල් ආන්ජෙලෝගේ චිත්‍ර විදියටම වංචනික ලෙස

සැකසූ, තෙල් සායම් චිත්‍ර කොයි තරම් තිබෙනවද? පෞරාණික පිළිමවලින් අච්චු හදලා නිර්මාණය කරන, වංචනික පිළිමත් ඒ වගේමයි. සැකයක් නෑ. තරුණයා බෙනඩික්ගෙන් විශාල මුදල් ප්‍රමාණ අරගෙන, වංචනික ලෙස සැකසූ පිටපත් ගෙනත් දෙන්න ඇති. ඒවා අහුවුණාම තමා ප්‍රශ්න මතුවෙන්න ඇත්තේ"

"හොඳයි. ඒ ගැන මම මේ වෙලාවෙ කිසිවක් කියන්නෙ නෑ" හෝම්ස් කීය. "පෞරාණික කලාකෘති පිළිබඳ විශේෂඥයෙකුට තමයි, ඒක තීරණය කරන්න හැකිවෙන්නෙ. ඔබේ පොලිස් භටයා අතේ තැපැල් කාර්යාලයට ශීඝ්‍රගාමී විදුලි පුවතක් යැවීම මං භාර කළා. ඒ රෝම කලාකෘති පිළිබඳ විශේෂඥයෙකුට - මහාචාර්ය රිකාඩෝ වින්සෙන්සෝට. ඔහු ලන්ඩන් විශ්ව විද්‍යාලයේ සේවය කරන ඉතාලි ජාතිකයෙක්. තව පැයක් ඇතුළත ඔහු මෙහේට ඒවි කියල මං විශ්වාස කරනවා. කලාකෘති අලෙවියෙදි වංචාවක් සිදුවෙලාද කියන කරුණ, අපට එතකොට දැනගන්න පුළුවනි."

"එතකොට ඔබේ හිතේ සැකයක් ඇති කළ දෙවැනි කරුණ මොකක්ද?"

"ඔව්. රහස් අංකය යොදලා දොර විවෘත කළ බොටම්ලි දුටුවා තම ස්වාමියා ලේව්ලක් මැද වැටී සිටි හැටි. ඊළඟට ඔහු මොකක්ද කළේ?" හෝම්ස් ඇසීය.

"ඔහු වහාම දුව ගිහින් කෝකියා සහ සේවිකාවන් දෙදෙනා අවදිකළා. ඊටපසු ඔවුන් කැඳවාගෙන වහාම ආපසු සුරක්ෂිතාගාරයට ආවා" ලෙස්ට්‍රේඩ් කීය.

"ඒකට කොයිතරම් වෙලාවක් ගතවෙන්න ඇත්ද?" හෝම්ස් ඇසීය.

"මිනිත්තු දෙකක් හෝ තුනක්"

"ඒ වෙලාවේ සුරක්ෂිතාගාරයේ දොර වහලද තිබුණේ?"

"වහල තිබුණේ නැහැ කියලයි මට හිතෙන්නේ" මම කීවෙමි.

ලෙස්ට්‍රේඩ් කිසිවක් කීවේ නැත.

"මටත් හිතෙන්නේ එහෙමයි" හෝම්ස් කීය. "අපරාධය සිදුකළ මිනීමරුවා සැඟවී බලාගෙන ඉන්න ඇත්තෙ ඒ මොහොත ළඟාවෙන තුරු. බොටම්ලි ඒ කටයුත්තට ගිය වහාම අපරාධකාරයා පලායන්න ඇති, මීටෙන් අතහැරුණු කුරුල්ලෙකු වගේ. එහෙම නේද?"

ලෙස්ට්‍රේඩ්ගෙන් එයට එක්වරම පිළිතුරක් නොලැබිණි.

"හොඳයි හෝම්ස් මහත්මයා. ඔබ කියන ඔය අපරාධකාරයා, සුරක්ෂිතාගාරයට ඇතුළුවුණේ කොයි වෙලාවෙද?"

"ඉතාම හොඳ ප්‍රශ්නයක් ලෙස්ට්‍රේඩ්. බෙනඩික් සහ තරුණයා සුරක්ෂිතාගාරයේ දොර ඇරගෙන එළියට ඇවිත්, මිදුලට බැහැල කතා බහ කළ බව බොටම්ලි අපට කිව්වා. ඔවුන් එහෙම එද්දි දොර වහගෙනද ආවෙ?"

"හරියටම කියන්න බෑ"

"අන්න හරි." හෝම්ස් කීය. "ඉස්තෝප්පුවේ ඉඳලා බිම් මහලට යන තරප්පු පෙළ වැටී තිබෙන්නෙ කොහෙන්ද? මල් වවා ඇති උද්‍යානය අයිනෙන්. සුරක්ෂිතාගාරයේ දොර තිබෙන බරාඳයට පිවිසෙන්න පෙර, ඒ හරියෙ තිබෙනවා යාර තුනක පමණ මල් පඳුරු වලින් ආවරණය වුණු තැනක්. කෙනෙකුට හැංගී ඉන්න මෙතැන හොඳටම ප්‍රමාණවත්. බෙනඩික් මහතා තරුණයා සමග පිටවෙලා යද්දි, දොර විවෘතව තිබුණා මිනිත්තු දෙකකට. හොර තක්කඩියෙකුට සුරක්ෂිතාගාරයට රිංගන්න මේ කාලය ප්‍රමාණවත්ද?"

"ඔව්" මම කීවෙමි.

"හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "ඔබේ තර්කය නිවැරැදි බව මම පිළිගන්නවා. නමුත් ඒ හොරා මොනවද අරගෙන ගියේ? එහෙම කිසිවක් ගෙනගිය බවට කිසිම සාක්ෂියක් නැහැ?"

"ඒ කාරණය හොඳින් දන්නෙ බෙනඩික් මහත්මයා පමණයි" මගේ මිත්‍රයා කීය. "අපි වුණත් සුරක්ෂිතාගාරය තුළ විමසිලිමත්ව බැලුවෙ නැහැනෙ.........."

හෝම්ස්ගේ කතාව අවසන් කිරීමට පෙර එතැනට ආ බොටම්ලි, කිසිවෙකු අප හමුවීමට පැමිණ ඇති බැව් දැනුම් දුන්නේය. විසිත්ත කාමරයට ගිය අපට දකින්නට ලැබුණේ, සම්පූර්ණයෙන්ම තට්ටය පෑදුණු, උපැස් යුගළක් පැළඳි වයස්ගත මහත්මයෙකි.

"මහාචාර්ය වින්සෙන්සෝ." හෝම්ස් කීය. "ඔබේ පැමිණීම ගැන ඔබට අනේක වාරයක් ස්තුතියි. මං ඔබට ඉක්මනට යන්න දෙන්නම්"

"ඔබට සහාය වීමට ලැබීම මට සතුටක් හෝම්ස් මහත්මයා" අමුත්තා පිළිතුරු දුන්නේය.

මීළඟ පැය දෙකක පමණ කාලය ගතවූයේ, මහාචාර්යවරයා සිදුකළ සූක්ෂම පරීක්ෂාව සඳහාය. කලාකෘති සැබෑ ඒවාද නැද්ද

යන කරුණටද, ඒවාට ගෙවා තිබූ මිල ගණන් ගැනද, ඔහු විශේෂ අවධානයක් යොමු කළේය. ඈන්තනි බෙනඩික් මහතා සකස්කර තිබූ සවිස්තර නාමාවලි, පිටුවෙන් පිටුව පෙරළා බලමින්, ඒවායේ සඳහන් විස්තර සමග පුරාවස්තු සසඳා බලමින්, මහාචාර්යතුමා කාලය ගත කළේ කිසිදු හදිසියක් නොමැති විලසිනි. මා පමණක් නොව ලෙස්ට්‍රේඩ්ද මේ වනවිට සිටියේ අපමණ විඩාවකට පත්වය.

"මෙතැන තිබෙන කලාකෘති හැම එකක්ම සැබෑ ඒවා බව, මට සහතික කරන්න පුළුවනි" මහාචාර්ය වින්සෙන්සෝ අන්තිමේදී කීය. "ප්‍රතිමා, චිත්‍ර ආභරණ ආදි හැම එකක්ම සැබෑ පෞරාණික ඒවා. මේවා එකතු කළ මහත්මයා මෙම භාණ්ඩ ගැන විශේෂඥයකු විය යුතුයි. එහෙම නොවෙන්නෙ මේ විදියේ තෝරාගැනීමක් කරන්න අපහසුයි. මට කවදාවත් ඈන්තනි බෙනඩික් මහත්මයා හමුවෙලා නැහැ. නමුත් ඔහු මේ ක්ෂේත්‍රයේ විශාරදයෙකු බව මං අහල තියෙනවා.

කොහොම වුණත් කාරණා දෙකක් ගැන ඔබේ අවධානය යොමු කරන්න මං කැමතියි. එක් එක් භාණ්ඩයට ඔහු ගෙවූ මුදල් ප්‍රමාණය හා එය මිලට ගත් දිනය, මේ පොත්වල සටහන් කර තිබෙනවා. සමහර භාණ්ඩවලට ඔහු ගෙවූ මුදල් ප්‍රමාණ නම් හොඳටම වැඩි බවයි මගේ අදහස. එහෙම කිරීමට හේතුවක් මට හිතාගන්න අමාරුයි.

අනික් කාරණය මේකයි. ඔහුගේ ආභරණ නාමාවලියේ අංක 17, 21, 22, 35 යන භාණ්ඩ දැන් ඒ තැන්වල නැහැ."

"නැහැ?"

"ඔව් මහත්මයා. කැබිනෙට්ටුවේ පහතින් ඇති ලාච්චුවල දමා තිබී, ඒ ආභරණ ප්‍රදර්ශනයට යොදාගත් කුඩා වීදුරු පෙට්ටි මට හමුවුණා. මේ බලන්න. නාමාවලිය අනුව මේවායේ තිබී ඇත්තේ නිල්මැණික්, මරකතමැණික් සහ රතුකැට ඇල්លූ රිදී සහ රන් ආභරණ හතරක්"

"ඒ කියන්නේ හොරා ඒව අරගෙන ගිහින්?"

"එහෙම විය යුතුයි" මහාචාර්යවරයා කීය.

"බොහොම පහසුවෙන් කලිසම් සාක්කුවක ගෙන යා හැකි දෙයක් වීම ඊට ප්‍රධාන හේතුව. ප්‍රසිද්ධියක් නොලබා රහසේ විකිණීමට හැකිවීම අනික් හේතුව" හෝම්ස් කීය.

"මට කිව හැක්කේ එපමණයි මහත්වරුනි" කී මහාචාර්යතුමා අපෙන් සමුගත්තේය.

ලෙස්ට්‍රේඩ් ද සූදානම් වූයේ පිටවී යාමටයි. එහෙත් හෝම්ස්ගේ ඉල්ලීම අනුව, යළිත් වරක් සේවක සයිරස් බොටම්ලි එතැනට කැඳවන ලදී. එබැවින් තවදුරටත් එහි රැඳී සිටීමට පොලිස් නිලධරයා එකඟ විය.

"ඔබේ ස්වාමියා හැමවිටම ප්‍රතිකාර ගත්තේ දොස්තර බ්‍රයන් හන්ට්ගෙන්මද?"

"ඔව් මහත්මයා. පහුගිය අවුරුදු පහළොවක පමණ කාලයක්. අපේ මහත්මයා ගැන බැලුවේ හන්ට් දොස්තර මහත්මයා"

"ඔබේ ස්වාමියා වෙනත් වෛද්‍යවරයෙකුගෙන් කවදා හෝ ප්‍රතිකාර ලැබූ බවක් ඔබට දැනගන්න ලැබී තියෙනවද?"

"ඔව්. එතුමා මට ඒ ගැන කිව්වා. මාස එකහමාරකට හෝ දෙකකට කලින් ලන්ඩනයේ හාර්ලි වීදියේ වෛද්‍යවරයෙකු හමුවීමට ඔහු ගියා"

"ඔබ දන්නවාද ඔහුගේ නම?"

"එතුමා මට නමක් නම් කිව්වෙ නෑ"

"බෙනඩික් මහතාගේ චරිත ස්වභාවය, ගතිගුණ මොන වගේ කියලද ඔබ විස්තර කරන්නේ?" හෝම්ස් විමසුවේය. "උදාහරණයක් වශයෙන්, ඔහු සතුටෙන් විනෝදයෙන් කාලය ගත කළ කෙනෙක්ද? නිතරම සේන්තියෙන් සිටි, කිසිවෙකු රුස්සන්නේ නැති ආකාරයෙන් හිටි කෙනෙක්ද? කිසිම කතාබහක් නොමැති ශෝකාකුල මුහුණකින්, නිතර බුම්මාගෙන සිටි කෙනෙක්ද? මොන වගේද?"

"මං මෙහේට ආව කාලෙ ඉඳන් මෑතක් වන තුරු, ඔහුගේ ස්වභාවයේ වෙනසක් වුණේ නෑ" බොටම්ලි කීය. "ඔහු නිතර විහිළු තහළුවට බර, නිතර සිනාමුහුණෙන් හිටි කෙනෙක්. තදින්ම ආගමට කැපවුණත්, ජීවිතය සතුටෙන් හා විනෝදයෙන් ගතකළ කෙනෙක්."

"හුඟක් මත්පැන් බිව්වාද? ඒ මොන මත්පැන් වර්ගයද?"

"ඒ කාලේ අධික වශයෙන් මත්පැන් බිව්වේ නෑ. උත්සව අවස්ථාවලදී ෂැම්පේන් හෝ ෂෙරි ස්වල්පයක් බිව්වා. මිතුරන් සමග එකතුවී කතා බහ කරන කොට බීර ස්වල්පයක් බිව්වා. එපමණයි.

එදා ඉඳන් මෑතක් වන තුරුම, ඔහුගේ ප්‍රීතිමත් ස්වභාවයේ වෙනසක් තිබුණේ නැහැ කියලයි මං ඔබට කලින් කිව්වේ. ඒ

වෙනස ඇති වුණේ මාස දෙකකට පමණ පෙර බව මට මතකයි. මත්පැන් පානයේ වෙනසක් ඇතිවුණෙත් ඒ කාලයේ"

"ඒ කාලයේ ඔහු හමුවීමට ඔබ නාඳුනන කෙනෙක් ආවද?" හෝම්ස් ඇසීය. "එහෙමත් නැත්නම් ඔහු අලුත් මිතුරන් සමග ආශ්‍රයට වැටුණද?"

"ඒ ගැන නම් මට නිශ්චිතව කියන්න අමාරුයි මහත්මයා" බොටම්ලි කීය. "මාසයකට විතර කලින් තමයි ඔහු ඩෝවෙස්ටර් රාත්‍රි සමාජ ශාලාවට යන්න එන්න පටන් ගත්තේ. කලින් ඔහු සමග යුද පෙරමුණේ ගත කළ මිත්‍රයෙකුත් ඔහුට හමුවී තිබුණා"

"ඒ මිතුරාගේ නම ඔබ සමග කිව්වද?"

"ඒ මිතුරා කීපවාරයක් මෙහෙත් ආවා. ඔහුගේ නම ටොම්ලින්සන් කියලයි මට මතක. ඔහු අධික වශයෙන් මත්පැන් පානය කළ කෙනෙක්. ඔහු බිව්වේ රම්. මිතුරා සමග එකතුවෙලා මහත්මයා මත්පැන් පානය වැඩියෙන් කළා. කෑම ගැන සැලකීමක් දැක්වීමත් අත් හැරියා"

සාකච්ඡාව අවසන් කළ හෝම්ස් අපට පිටත්ව යාම සඳහා වේලාව පැමිණ ඇති බැව් කීය.

IV

අපගේ බලාපොරොත්තුව වූයේ වැලෙන්ටීනෝ තරුණයා පසුවදා බේකර් වීදියේ අපගේ නිවහනට පැමිණෙනු දැකීමය. කලින්දා හැන්දෑවේ ආපසු ලන්ඩන් නගරයට පැමිණි පසු හෝම්ස්ගේ තිබුණේ තිහඬ පිළිවෙතකි. මුලින් තම පිගන්මැටි පයිප්පය සුගන්ධවත් දුම්කොළ පුරවාගත් ඔහු, දිගින් දිගටම කල්පනා කළේ තම සටහන් පොත බලමිනි. අනතුරුව ඔහු බන්සන් දාහකය දල්වාගෙන රසායනික පරීක්ෂණ කිහිපයක නිරත විය. එය පැය කිහිපයක් ගතවෙන කටයුත්තක් බැව් මම තේරුම් ගතිමි. එබැවින් මම නින්දට ගියෙමි.

පසුවදා උදෑසන ආහාරය නිම කළ වහාම ඔහු නිවසින් පිටවී ගියේ, උදේ දහයට පෙර ආපසු එන බව සහතික කරමිනි. කියූ ආකාරයෙන්ම දහයට මිනිත්තු දහයක් තිබියදී හෝම්ස් ආපසු ආවේය. ඔහුගේ දෙනෙත් දීප්තියෙන් බැබළුණු අතර, අතේ කඩදාසි ගොන්නක් තිබිණි.

"වැලෙන්ටිනෝ උදේ දහයට මෙහේට ඒවිද කියල වොට්සන්ට සැක ඇති?"

"ඒක තමයි මාත් මේ කල්පනා කළේ. ඔහු මෙහේට ඒවි කියල ඔබට ඔය තරම් විශ්වාස ඇයි?"

"මං ඔහුට දුන්නු කාඩ්පතේ, අනෙක් පැත්තේ කෙටි පණිවුඩයක් ලිව්වා" හෝම්ස් කීය. "ඔහු මෙහේට පැමිණීමට පොළඹවා ගන්න මං හිතන්නේ ඒක ප්‍රමාණවත් වේවි"

ඔහු කථාකරද්දීම අපේ ඉදිරි දොරේ සීනුව නාද වෙනු මට ඇසිණ. මීළඟට හඩ්සන් මහත්මිය දොර විවෘත කොට, අමුත්තාට නිවස තුළට පැමිණීමට ඉඩහැරී ආකාරයත් ඇසිණ. මිනිත්තුවක් ගතවෙද්දී අපේ දොර ඇරගෙන ඇතුළුවූයේ සිල්වෙස්ට්‍රෝ වැලෙන්ටිනෝ තරුණ මහතාය.

"මට මෙහේ එන්නම සිද්ධවුණා" ඔහු කීවේ හෝම්ස්ගේ සංඥාව අනුව අසුනක හිඳ ගනිමිනි. "මට දුන් කාඩ්පතේ ඔබ ලියල තිබුණා........

"ඔබ මා හමුවීමට නොපැමිණියොත් ඔබට

පෝරකයට යාමට සිදුවනු නියතයි"

මෙහෙම පණිවුඩයක් මගේ ජීවිතේටම මට ලැබිල නෑ. මගේ ජීවිතේ තිබෙන්නේ ඒ තරමට බරපතළ අවදානමකද මහත්මයා?"

"වැලෙන්ටිනෝ මහත්මයා" හෝම්ස් කීය. "ඔබ ඉන්නේ ඉතාමත් අවදානම් භයානක ඉරණමකට මුහුණ දීලයි. ඒක මොන තරම් බරපතළද කියන කාරණය, ඔබට තවමත් වැටහිලා නැහැ වගෙයි. ඒ හින්දා ඔබ ඉන්න තත්ත්වය, ඔබට පැහැදිලි කර දෙන්න මං උත්සාහ කරන්නම්.

බෙනඩික් මහත්මයා හිසට වැදුණු වෙඩි පහරකින් මියගියා. ඔහු මියගිය දිනයේ රාත්‍රියේ ඔබට ඔහු හමුවුණා. ඒ ඔහු ජීවිතක්ෂයට පත්වුණු කාමරය තුළ. එදා රෑ ඔබ දෙදෙනා කතාබහක යෙදී සිටි බව පොලීසිය දන්නා කරුණක්. එදා රෑ ඔබ දෙදෙනා අතර මතභේදයක් ඇතිවුණු බවත් අසන්නට ලැබුණා. ඔහු මුදල් ඉතා විශාල ප්‍රමාණ වලින් ඔබට ගෙවා ඇති බවත් දැනගන්න ලැබුණා. සාමාන්‍ය පොලිස් සේවයට මේ කාරණා ටික හොඳටම ඇති.

මිනීමැරුමක් හමුවුණාම, ඒකෙ චෝදනාව කාගේ හරි හිස් මුදුනට පටවලා, අපරාධ නඩුවක් ගොතු කිරීම පොලීසියේ සිරිතක්. මගේ මිත්‍ර ලෙස්ට්‍රේඩ් ඒ වැඩේට හරිම දක්ෂයි. ඔහු ඉන්නේ එහෙම

දෙයක් කරන්නට නොඉවසිල්ලෙන්. නමුත් ඔබ නිර්දෝෂ බව ඔප්පු කරන්න මොනවද ඔබට තිබෙන සාක්ෂි? ඔබේ හෘද සාක්ෂිය පමණයි. නමුත් ඒක, කාටවත් පෙනෙන, කාටවත් ඇහෙන එක්ක නෙමෙයි........"

හෝම්ස් මෙසේ කියද්දී, තරුණයා ක්‍රම ක්‍රමයෙන් සුදුමැලි වී ගිය ආකාරය මම දුටුවෙමි. ඔහු තවත් මොහොතකින් ක්ලාන්ත වී බිම ඇද වැටෙතැයි මට සිතිණි. මම වහාම වතුර පිරවූ වීදුරුවක් අතට ගෙන ඔහුගේ දෙතොලට තැබීමි. ඒ සමගම ඔහුගේ ටයිපටිය ලිහිල් කළෙමි. ඔහු වතුර උගුරු කිහිපයක්ම බිව්වේය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" ඔහු කීය. "කාරණා ඔය තරම් බරපතළ බවක් මට හීනෙකින් වත් හිතුණෙ නෑ. දැන් මං මොකද කරන්නෙ?"

"මං කියන දේට හොඳින් කන් දෙන්න" හෝම්ස් කීය. "ඊළඟට කාරණා කිසිවක් හංගන්නෙ නැතුව මට සත්‍යය හෙළි කරන්න. මගේ කතාව මං මේ විදියට පටන්ගන්නම්. මට හොඳටම විශ්වාසයි ඔබ ඔබේ තාත්තාව මරා දැම්මේ නැති බව........!"

හෝම්ස්ගේ මෙම ප්‍රකාශය තරුණයා තුළ ඇති කළ වෙනස, අප කිසිසේත් බලාපොරොත්තු වූ එකක් නොවීය. ඔහුගේ යටිගිරියෙන් නැඟුණු භයානක ශබ්දයක් සමගම, ඔහු පුටුවෙන් ඉදිරියට විසිවී, මුනින් අතට මහ පොළොව මත ඇද වැටිණි. වතුර වීදුරුව ඔහුගේ අතෙන් මා ඉවත් කර ගත්තේ ඊට මොහොතකට පෙරය. "හෝම්ස්!" මට කෑ ගැසිණි. "ඔහුට ඉතා දරුණු විදියේ සිහි විසඥවීමක් ඇතිවුණේ!"

මම එතැනට පැන ඔහු පැත්තට හැරවීමි. ඒ දිව ගිලී හුස්ම හිරවීම වළක්වනු පිණිසය. අනතුරුව සියලුම උඩ ඇඳුම් ලිහිල්කොට මුහුණට වතුර ඉස්සෙමි. සැල් වොලටයිල් ස්වල්පයක් නාසයට අල්ලා මඳ වේලාවක් ගතවෙද්දී ඔහු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්විය. හඩ්සන් මහත්මිය ගෙන ආ උණු කෝපි කෝප්පය පානය කළ ඔහු සිය කථාව ඇරඹීය.

"දෙවියනේ! ඔබ...... ඔබ කොහොමද...... බෙනඩික් මහත්මයා මගේ...... මගේ තාත්තා බව දැනගත්තේ......?" තරුණයා විමසුවේ ගොත ගසමිනි. "ඔබට හැමදෙයක්ම දැනගන්න ලැබිල වගෙයි. ඒ නිසා ඒක එහෙම නොවෙයි කියන්න මං උත්සාහ කරන්නෙ නෑ"

"මං ඒ බව තේරුම් ගත්තේ ඔබ දෙදෙනාගේ කන් පෙතිවලින්" හෝම්ස් කීය.

"මගේ මිත්‍ර දොස්තර වොට්සන් දන්නවා, කන්පෙතිවල සුවිශේෂත්වය ගැන මං කුඩා පොත් පිංචක් පවා ලියා ඇති බව. ඥාතිත්වය තහවුරු කිරීමට ඉතාම ප්‍රයෝජනවත් අංගයක් තමා කන්පෙත්ත. ඔබගේ මවගේ කන්පෙත්ත වෙනුවට, ඔබේ පියාගේ කන්පෙත්ත ඔබට උරුම වීම මට විශාල පහසුවක් වුණා. එහි පහළ කොටස සහ ඇන්ටිට්‍රෙගසය මේ තරම් දිගට පිහිටි කන්පෙති, මීට පෙර මං දැක ඇත්තේ වරක් හෝ දෙවරක් පමණයි. මෑතකදීම මං එය දුටුවේ එදා මෘත ශරීරාගාරයේදී, ඇන්තනි බෙනඩික් මහතාගේ සිරුර පරීක්ෂා කරද්දී. එයට අතිශයින්ම සමාන, එහි කැඩපතක පිළිබිඹුවක් වැනි කන්පෙත්තක් මං ඔබේ දුටුවා. එය අහඹු සිදුවීමක් විය නොහැකි බව මං තේරුම් ගත්තා. ඉන්පසු කාරණා ගණනාවක් එකින් එක ගැළපෙන්න පටන් ගත්තේ, ජිග්සෝ ප්‍රහේලිකාවක කොටස් එකට සම්බන්ධ වෙනවා වගේ."

"ඔබ දන්නේ මොනවාද, නොදන්නේ මොනවාද කියා මං දන්නේ නෑ මහත්මයා" තරුණයා කීය.

"අන්න ඒ කාරණය නිසාම ඔබේ කතන්දරය ඔබම කියනවා නම් මං වඩා කැමතියි" හෝම්ස් කීය. "නොපැහැදිලි තැනක් තිබුණොත් මං විමසන්නම්"

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" තරුණයා කීය. "මට මේ කථාව අහන්න ලැබුණේ මගේ මාමා කෙනෙකුගෙන්. මගේ පියා වූ බෙනඩික් මහත්මයා, කලා නිර්මාණවලට දැඩි ආශාවක් දැක්වූ කෙනෙක්ලු. ඔහුගේ පියා සෑහෙන තරම් ධනවතෙකු වුණු නිසා, විනෝදාංශයක් ලෙස, මගේ පියා කුඩා තෙල් සායම් චිත්‍ර එකතු කර තිබෙන්නේ තරුණ කාලයේ ඉඳලමයි. ඒවා මිලට ගැනීමට ඔහු ඒ කාලයේ සිටම ඉතාලියට ඇවිත් ගිහින් තියෙනවා. මගේ සීයා වූ ෆ්‍රෙඩරිකෝ වැලෙන්ටිනෝගේ පුරාණ කලා නිර්මාණ අලෙවිසල තමා ඒ කාලයේ රෝමයේ තිබූ ප්‍රමුඛතම අලෙවිසල වෙලා තිබෙන්නේ.

මගේ පියාට මගේ මව වූ මරියානා හමුවී තිබෙන්නේ එහෙම ආ ගමනකදී. ඒ හමුවීම ප්‍රේම සම්බන්ධයකට හැරුණත් ඒකට, මගේ අම්මාගේ දෙමාපියන් කැමැති වී නැහැ. ඔවුනට උවමනා වෙලා තියෙන්නේ මගේ අම්මා, ඉතාලියේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ තරුණයෙකුට විවාහ කර දෙන්න. නමුත් ඇය මගේ තාත්තා ගැන තිබූ කැමැත්ත, කිසිම ආකාරයකින් වෙනස් කරන්න කැමති වෙලා නැහැ. නමුත් ඇගේ සොහොයුරන්ගේ මැදිහත්වීම මත අම්මාට

හැකිවුණාලු තාත්තා සමග අතිනත ගන්න. ඔවුන් දෙමව්පියන්ට රහසේ ෆ්ලොරන්ස් නගරයේ පදිංචියට ගිහින් තියෙනවා. ඒ 1844 වසරේදී.

මං උපත ලැබුවේ 1845 දී මගේ වයස අවුරුදු අටක් නවයක් වෙද්දී තමයි ක්‍රිමියන් යුද්ධය ඇරඹුණේ. මේ කාලය වෙනකොට මගේ අම්මා හිටියේ දෙවැනි දරු ප්‍රසූතිය ළංවෙලාලු. මේ අතරේ තාත්තාට සිදුවුණාලු එංගලන්තය වෙනුවෙන් ක්‍රිමියානු යුද්ධය සඳහා සටන් පෙරමුණට යන්න. යුද සේවය අනිවාර්ය කර තිබීම නිසා, සටන් පෙරමුණට නොගොස් සිටීමට තාත්තාට හැකියාවක් තිබී නැහැ. ඒ නිසා ඔහු මොකක්ද කළේ? අම්මා සහ මා ආපසු රෝම නගරයට කැඳවාගෙන ගිහින් අප ඇගේ සොහොයුරන් සමග නැවැත්තුවා.

යුද්ධයේදී තාත්තා රුසියානු හමුදාවල සිරකරුවෙකු වුණු බව ඉතාලියට ආරංචි වුණා. යුද්ධය අවසන් වෙලා සිරෙන් නිදහස් වී ඔහු ආපසු ආවේ ඉතාලියට. නමුත් ඔහුට අහන්නට ලැබුණේ කුමක්ද? සැමියා නොමැතිව ශෝකයෙන් කල්ගත කළ අම්මා දරු ප්‍රසූතියේදී මියගිහින්. අතිශය කලකිරීමට පත් තාත්තා, ආපසු එංගලන්තයට ආවේ තනියම. මා ඒ වනවිට ඉතාලියේ අධ්‍යාපනය ලබමින්, ඒ රටේ ජීවිතයට හැඩගැසී සිටියා. ඒ නිසා මා මේ රටට කැඳවාගෙන එන්න ඔහු කැමතිවුණේ නැතිලු. අපේ පවුලේ ව්‍යාපාරය මීළඟට භාරවුණේ, කාලෝ, පීට්‍රෝ සහ ෆ්‍රැන්කෝ නම් මගේ මාමලා තුන්දෙනාට. මගේ අනාගතය ගැන හිතලා පසුව පවුලේ ව්‍යාපාරයට මා සම්බන්ධ කරගැනීමේ අරමුණෙන්, මගේ වාසගම බෙනඩික් වෙනුවට වැලෙන්ටිනෝ ලෙස වෙනස් කරගෙන තිබුණේ ඔවුන්.

මං දිගටම හැදුණේ වැඩුණේ මගේ මාමලාගේ දරුවන් සමග. ඒ වුණත් තාත්තා මා බලන්න දිගින් දිගටම ඉතාලියට ආවා. මගේ මාමලාට මගේ වියදම් වෙනුවෙන් මුදල් ලබා දෙන්නත් ඔහු අතපසු කළේ නෑ. මගේ අම්මාගේ මරණයෙන් ඇතිවුණු ශෝකය නිසා, තාත්තා යළිත් කවදාවත් විවාහ වුණෙත් නෑ.

මං හැදී වැඩී තරුණයෙකු බවට පත් වෙද්දී, මගේ හිත ගියේ මුද්‍රණ කර්මාන්තයට. ඉතාලි ජාතිකයන්ට අයත් ලන්ඩනයේ මුද්‍රණ ආයතනයක රැකියාවට ආවෙත් තාත්තාගේ උවමනාවට. ඔහුගේ බලාපොරොත්තුව වුණේ, මං මුද්‍රණ ශිල්පය හොඳින් ඉගෙන ගත් පසු මාව මුද්‍රණාලයක හිමිකරුවෙකු කරන්නයි."

"එතකොට මේ පත්‍රිකා මුද්‍රණය කළේ ඔබ නේද?" හෝම්ස් විමසුවේ "ඔලිව් මල්" නමින් බෙනඩික් මහතා වෙත එවා තිබූ පත්‍රිකා කිහිපයක් තරුණයා වෙත ඉදිරිපත් කරමිනි.

"ඔව් මහත්මයා, මං තමයි. නමුත් ඒ මගේ තාත්තාගේ ඉල්ලීම නිසා. නමුත් ඔබට මේවා ලැබුණේ කොහොමද?"

"මට ඒවා ලබා දුන්නේ ඔබේ තාත්තාගේ හිතවතෙකු වූ ජෝසප් පියතුමා. බෙනඩික් මහත්මයා ඒවා පියතුමා අතට දීල තියෙනවා. එතුමා හිතල තිබුණේ මේවා, ජීවිත අවදානමක් ඇති කරන කප්පම් කල්ලියක ඒවා කියලා."

"ඔය පත්‍රිකා මුද්‍රණයට හේතුවත් මගේ කතන්දරයට ඇතුළත් වෙනවා" තරුණයා කීය. "තාත්තාගේ අසනීපවලට හැමදාමත් ප්‍රතිකාර කළේ හන්ට් නම් වෛද්‍යවරයා. දැනට· මාස දෙකකට පමණ පෙර සිට තාත්තා දරුණු හිස කැක්කුමකින් පෙළෙන්නට පටන් ගත්තා. හන්ට් මහත්මයා ප්‍රතිකාර කළත් තාත්තාට එයින් සුවයක් ලැබුණේ නැහැ. දින කිහිපයක් ගතවෙද්දී තාත්තාගේ ඇස්වල පෙනීම අඩුවෙන්න ගත්තා. හිසේ කැක්කුමට අමතරව මුහුණ පුරා ඇතිවුණේ, ඉදිකටුවලින් අනිනවාක් වැනි පිලිස්සෙනවාක් වැනි, වේදනාකාරී තත්ත්වයක්. මෙය මොළය ඇතුළත කුමක් හරි බරපතළ රෝගයක් වීමට ඉඩ ඇතැයි, හන්ට් දොස්තර මහත්මයා සැක කරල තිබුණා. ඔහු තමයි තාත්තාට ලියුමක් දී තිබුණේ, හාර්ලි වීදියේ විශේෂඥ වෛද්‍යවරයෙකු හමුවෙන්නට. මෙය මොළයේ කොටස් ගණනාවකට පැතිරුණු, සුව කළ නොහැකි ගෙඩියක් බව විශේෂඥ වෛද්‍යවරයා සොයාගෙන තිබුණා.

තාත්තා සමග ක්‍රිමියා යුද්ධයේදී යුද හමුදාවේ සේවය කොට, රුසියාවේ යුද හිරකරුවෙකු වූ තාත්තාගේ මිතුරෙකුත්, මෙම රෝගයට කලින් ගොදුරු වී තිබුණා. ඔහු මියගියේ අප්‍රමාණ ලෙස දුක් විඳීමෙන් බව තාත්තා කිව්වා. ඒ ආකාරයට දුක් විඳීමට තමන් කොහොමටවත් කැමති නැති බවත් තාත්තා කීවා. යුද සිරකරුවන් ලෙස සිටියදී ඔවුනට කන්නට දුන් විෂ මිශ්‍ර ආහාර නිසා, මිතුරාටත් තමාටත් මෙම රෝගය වැළඳෙන්නට ඇති බවයි, තාත්තාගේ මතය වුණේ.

ඔහු තමන්ගේ දේපොළ වලින් හරි අඩක් මා නමට ලිව්වා. අනික් අඩ ලිව්වේ රෝමානු කතෝලික පල්ලියට. වැඩි පමා නොවී තමන් දිවි නසාගන්නා බව තාත්තා මා සමග කිහිප වාරයක්ම කිව්වා. මං ඒකට විරුද්ධ වුණා. මං කිව්වේ අප ඇමරිකාවට ගොස් ශල්‍ය

කර්මයක් හෝ කරගෙන, ජීවත් වීමට උත්සාහ කළ යුතු බව. මොළයේ සැත්කමක් කර, එහි කොටසක් කපා ඉවත් කළ පසු, ජීවත්වී වැඩක් නොමැති බවයි ඔහු කිව්වේ. ජීවිතය බේරුණත් සදාකාලික ආබාධිත තත්ත්වයෙන් සිටීමට ඔහු කැමති වුණේ නෑ.

සිය දිවි නසා ගැනීම, කිසි සමාවක් නොලැබෙන දරුණු පාපයක් ලෙසයි, අපේ ආගම සලකන්නේ. ඉතින් තමා දිවිනසා ගත්තොත්, තමන් දෙව්මැඳුරේ නමට ලියන දේපොළ, එයට නොලැබී රජයට හිමි වේවි කියල තාත්තාගේ හිතේ සැකයක් තිබුණා.

ඔහු මේ ගැන වැඩිදුර කල්පනා කර ඒකට විසඳුම මට කිව්වා. ඒ තමාගේ මරණයට හේතුව, කප්පම් කල්ලියක් විසින් ඝාතනය කිරීම මිස වෙනත් හේතුවක් නොවන බව, අනික් අයට ඒත්තු ගැන්වීමට ඔහුට උවමනා වුණා. මා ලවා අර පත්‍රිකා මුද්‍රණය කරවා ගත්තේ ඒ අරමුණෙන්.

එදා රාත්‍රි මාව ඔහුගේ නිවසට කැඳවලා, දේපළවල අඩක් මා නමට ලියූ ලියවිල්ල මා අතට දුන්නා. ඔහුගේ ඉවසිය නොහැකි හිස කැක්කුම සහ මුහුණේ පිලිස්සෙන්නාක් වැනි වේදනාව, ඒ මොහොතේ ඇතිවුණා. දේපළ ලිවීමේ කටයුතු සියල්ල අවසන් නිසා එදා රෑම දිවි නසාගන්නා බව ඔහු කිව්වා. මා ඊට විරුද්ධ වුණා. ඒකයි අප අතර ඇතිවුණු මතභේදය. නමුත් එදා රෑම ඔහු මේ දේ කරගනීවි කියා මං හිතුවේ නෑ........" කී තරුණයා තම පියා ගැන ශෝකයෙන් ඉකි ගසමින් හැඬීමට පටන්ගත්තේ කුඩා දරුවෙකු විලසිනි.

V

ඇන්තනි බෙනඩික් මහතාගේ දේපළෙන් අඩක් ඩෝචෙස්ටර්හි සාන්ත මරියා දෙව්මැඳුරටද අනෙක් අඩ සිල්වෙස්ට්‍රෝ වැලෙන්ටිනෝ මහතාටද, මියගිය තැනැත්තාගේ අන්තිම කැමැති පත්‍රය අනුව හිමිවූ බව පුවත්පත්වල පළවිණි. බෙනඩික් මහතා ඝාතනය කළ නාඳුනන මිනීමරුවා රටින් පැනගොස් ඇතැයි, තවත් පුවත්පත්වල පළවිය.

සුරක්ෂිතාගාරයෙන් අතුරුදන්වූ මැණික් එබ්බවූ රන්රිදී ආභරණ සියල්ල තම පියා අවසන් දිනයේ තමාට තෑගි කළ බැව් වැලෙන්ටිනෝ තරුණයා අපට පැවසුවේය.

"මේක සිය දිවි නසාගැනීමක් බව මං නිශ්චිතව දැන ගත්තේ කොහොමද?" හෝම්ස් ඇසුවේ එදා රාත්‍රි අප නිවසට පැමිණි ලෙස්ට්‍රේඩ් ගෙනි.

"මට හිතාගන්න අමාරුයි හෝම්ස් මහත්තයා"

"රිවෝල්වරයක් වැනි ගිනි අවියක් පාවිච්චියේදි එක්තරා වැදගත් සිදුවීමක් වෙනවා." හෝම්ස් කීය. "ඒ තමයි වෙඩි බෙහෙත් ගිනි ගනිද්දී පිටවෙන රසායනික ද්‍රව්‍ය රැසක්, වෙඩිල්ල තැබූ පුද්ගලයාගේ අත මත තැන්පත් වීම. එය සොයා ගැනීමට ආම්ලික දියරයකින් පෙඟවූ කපු පුළුන්වලින් ඒ තැන් කිහිපයක් පිස දමා ගත යුතුයි. ඒ දබරැඟිල්ල, මහපටැඟිල්ල සහ මැදඟිල්ල හා ඒ අවට ප්‍රදේශය. මං ඒ කටයුත්ත සිදුකළ බව ඔබ දකින්න ඇති. මං ඒ පුළුන් කැබලි වල තිබූ රසායනික ද්‍රව්‍ය විශ්ලේෂණය කළා. මා සිතූ අයුරින්ම එහි තිබුණේ, පොටෑසියම් සල්ෆේට් හා සල්ෆයිඩ් ඒ වගේම පොටෑසියම් කාබනේට්. වෙඩිතැබීම සිදුකර තිබෙන්නේ තමා විසින්ම බව ඒකෙන් මට පැහැදිලි වුණා."

"මට නොපැහැදිලි තවත් තැනක් තියෙනවා හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "වැලෙන්ටිනෝ තරුණයා තමන්ගේ පුත්‍රයා බව ලොවට හෙළිකරන්න බෙනඩික් මහත්මයා කැමති නොවුණෙ ඇයි?"

"ලෙස්ට්‍රේඩ්. ඒක නම් මටත් තේරුම් ගන්න අමාරු කාරණයක්. තරුණයා කියූ කථාව අනුව මට නිකමට හිතුණේ මෙහෙම දෙයක්. බෙනඩික් සමග මරියානා වැලෙන්ටිනෝ මෙනෙවියගේ විවාහය නීත්‍යානුකූලව සිදුවුණේ නැහැ කියලයි මට හිතෙන්නේ. ඒ නිසා තම පුත්‍රයා එංගලන්තයට කැඳවාගෙන ඒමටත්, අනික් අයට හඳුන්වාදීමටත් ඔහු පසුබට වෙන්න ඇති"

මෙම අභිරහස විසඳූ ආකාරය හා එහි සත්‍යය තවත් අවුරුදු පනහකටවත් ලොවට හෙළි නොකළ යුතු යයි හෝම්ස් පැවසීය. ඔහුගේ එම නියෝගය නිසා මෙම තොරතුරු මගේ අතිශය රහසිගත ලිපි ගොනුවේ තැන්පත් කිරීමට මම තීරණය කළෙමි.

බ්‍රික්ස්ටන් අභිරහස

මා ඉතා ක්‍රියාශීලීව ලේඛන කලාවේ යෙදෙමින් සිටි අවධියේ පුවත්පත් හා සඟරා මගින් ප්‍රසිද්ධ කෙරුණු ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණ ගැන මගේ පාඨකයෝ හොඳින් දනිති. ගණනින් හැටක් පමණ වූ ඒ පරීක්ෂණවලට අමතරව මගේ මිත්‍රයා යෙදුණු තවත් පරීක්ෂණ රැසකි. නමුත් මේ සමහරක් බ්‍රිතාන්‍යයේ මෙන්ම යුරෝපයේ සුප්‍රකට පවුල්වලට අදාළ කතන්දරය. ඒ නිසා ඒවා කිසිසේත් ප්‍රසිද්ධ නොකළ යුතු බව, හෝම්ස් සැමවිටම අවධාරණය කළේය. ඒවා "අතිශය රහසිගත" නම් ලිපිගොනුවකට වෙන් කොට මගේ ට්‍රන්ක පෙට්ටියේ අඩියේ තැන්පත් කර තැබීමට, මම එකල තීරණය කළෙමි. දරු මල්ලන් නොසිටි මා වයස්ගත වෙද්දී මට කාගේ පිළිසරණක්ද? පළමුවැනි පංතියේ වැඩිහිටි නිවාසයකට ගෙවීමට මා අත විශාල මුදලක් නොවීය. මේ රහසිගත ලේඛන පසුව හෝ ඇමරිකානු ලේඛකයකුට විකුණා, සෑහෙන මුදලක් උපයා ගැනීම මගේ එකම අරමුණ විය. ඒ කාලය වන විට මගේ මිත්‍රයා ඊට විරුද්ධ නොවනු ඇත. මේ කථාන්තර නිසි පරිදි සම්පූර්ණ කර තැබීම අත්‍යවශ්‍ය වූයේ එබැවිනි.

එදා 1888 වසරේ සරත් ඍතුවේ උණුසුම් දිනයකි. බේකර් වීථියේ අපේ නිවහනේ සිටි අපි උදේ ආහාරය අවසන් කරමින් සිටියෙමු.

"විශ්වාසෙට ගන්න වොට්සන්" මගේ මිත්‍රයා කීවේ කෝපි කෝප්පය අවසන් කොට මේසය මත තබා, තම පිගන් මැටි පයිප්පයට දුම්කොළ පුරවමිනි. "අද හොඳ දීප්තිමත් දවසක්. අද දවස ගේ ඇතුළට වෙලා නාස්තිකර දැමීම අපරාධයක්. අපි යමු ඇවිදින්න. රීජන්ට් උද්‍යානය හරහා ඇවිද ගිහින්, ජලාශය වටේ රවුමකුත් ගිහින් එමු. රීජන්ට් උද්‍යානය වගේම ජලාශයේ ඉවුරත් අලංකාර මල්වලින් පිරිල ඇති. සොබාදහමේ සුන්දරත්වය රසවිඳින්න, අද වගේ දවසක් උදාවෙන්නෙ කලාතුරකින්"

"ඔබේ කතාව ඇත්ත හෝම්ස්. එහෙම නම් අපි අව්ව තවත් තද වෙන්න කලින් පිටත් වෙමු" මා කීවේ උදේ අහරින් හිස් වූ දීසි

ඉවත් කරගෙන යාමට පැමිණි හඩ්සන් මහත්මියට ඉඩ දී පුටුව පිටුපසට ගනිමිනි.

"හෝම්ස් මහත්මයා" ඇය මගේ මිත්‍රයා ඇමතුවේ පැමිණි කටයුත්ත මඳකට නවත්වමිනි. "ඔබ හමුවෙන්න තරුණ කාන්තාවක් ඇවිත් ඉන්නවා. ඔබ උදේ ආහාරය ගනිමින් සිටින බව මං ඇයට කිව්වා. එය අවසන් කරන තුරු ඇය පහළ සාලයේ රැඳී ඉන්නවා"

"ඔබට ස්තූතියි හඩ්සන් මහත්මිය" හෝම්ස් කීවේ වඩාත් සතුටට පත්වෙමිනි. උද්‍යානයේ සක්මනට වඩා අනුග්‍රාහයකුට සවන්දීම මගේ මිත්‍රයා ප්‍රිය කළ බැව් මම දැන සිටියෙමි.

"දවසේ වැඩ කටයුතු මේ තරම් උදෑසනින්ම අරඹන්න ඇයට හැකිවෙලා තියෙනවා. එහෙම නම් ඇය රැකියාවක යෙදෙන තැනැත්තියක වෙන්න බැහැ. පවුලේ වැඩ රාජකාරි බහුල විවාහක තැනැත්තියක කියා හිතන්නත් අමාරුයි. කොහොම වුණත්...... මම දැන් සූදානම් ඇය හමුවෙන්න"

තරුණිය අප හමුවට පැමිණ හෝම්ස් ගේ ඉල්ලීමට අනුව අසුන් ගත්තාය. වයසින් අවුරුදු විසි පහ නොඉක්මවූ ඇය සැරසී සිටියේ චාම් ඇඳුමකිනි. එහෙත් ඇගේ මුහුණ රූමත් එකක් බව මම දුටුවෙමි. ඇගේ අතේ මඟුල් මුද්දක් නොතිබූ නිසා, මෙය විවාහය සම්බන්ධ ගැටලුවක් විය නොහැකි යයි මම අනුමාන කළෙමි.

"මාව හමුවීමට කැමතිවීම ගැන ඔබට ස්තූතියි මහත්මයා" ඇය කතාව ඇරඹුවාය. "මගේ නම රෙබෙකා ක්ලාක්. මං ඔබ හමුවෙන්න ආවෙ, මගේ මොළයට වධ දෙන මහා ගැටලුවක් නිරාකරණය කරගන්න. සමහර විට ඒක ප්‍රහේලිකාකාර විධියේ, සම්පූර්ණයෙන්ම අහඹු සිදුවීමක් වෙන්නත් පුළුවන්. කොහොම වුණත් මේ වෙලාවෙ මට ඔබේ උපදෙස් අත්‍යවශ්‍යයයි. මට කන්දෙන්න කැමති වීමෙන් පෙනෙන්නේ, ඔබ ඉතාම කාරුණික කෙනෙකු බව. මං ඒ ගැන හුඟක් කෘතඥ වෙනවා."

"ඔබට කැමති තරමක් කාලය ගන්නට කමක් නෑ. සිදුවුණු හැම දෙයක්ම ඒ අනුපිළිවෙළට මට කියන්න." හෝම්ස් කීවේ තම හාන්සි පුටුවේ වැතිරී දෙනෙත් අඩවන් කරගනිමිනි.

"මහත්මයා. මගේ තාත්තා මියගිහින් බව මා ඔබට මුලින්ම කිව යුතුයි. ඔහු රැකියාව කළේ මුද්‍රණ යන්ත්‍ර අලුත් වැඩියා කරන්නකු ලෙස. පුවත්පත් මුද්‍රණය කරන ආයතනවලට ඔහුගේ සේවය

නැතුවම බැරිවුණු බව අම්මා කියනවා මං අහල තියෙනවා. ඒ නිසා ලොකු මුදලක් උපයාගත්තත් ඔහු ගෙව්වේ අව්වේකී ජීවිතයක්. තාත්තා හෘදයාබාධයකින් මිය යද්දී මට වයස අවුරුදු අටයි.

තාත්තාගේ මරණයෙන් අවුරුදු දෙකකට පස්සේ අම්මා යළිත් විවාහ වුණා. ඒ ජේකබ් බට්ලර් මහත්මයා සමග. ඔහු ඉඩම් සහ ගෙවල් විකුණන බ්‍රෝකර් කෙනෙක්. අප පදිංචිව ඉන්නේ බ්‍රික්ස්ටන් වල.

අපේ ගෙදරට අල්ලපු ගෙදර මිලට ගත්තේ ෆ්‍රැන්ක් හැරිස් නම් මහත්මයෙක්. හැරිස් මහත්තයා තම නිවසේ ඉදිරිපස කොටස වෙළඳසලක් බවට හරවා තිබෙනවා. ඔහු අලෙවි කරන්නේ අරුමෝසම් බඩු සහ පෞරාණික බඩු. ඊට අමතරව ඔහු ආභරණ උගස් ගැනීමේ කටයුත්තත් කරනවා. මේ කටයුතු වලින් ඔහු විශාල ධනවතෙකු බවට පත්වී ඇතැයි ඔබ හිතාවි. නමුත් ඒ බවක් අපට පෙනෙන්නේ නෑ. ඔහු කරන ව්‍යාපාර ගැන තවත් කතාවක් මට කලකට පෙර අහන්න ලැබුණා. ප්‍රංශයේ සිට එංගලන්තයට බෝට්ටුවලින් හොරෙන් ගෙන එන වයින් සහ දුම්කොළ, ඔහු හොර රහසේ බෙදාහරින බවටයි ඒ ආරංචිය. ඒ සඳහා කටයුතුවලට ඔහු ප්‍රංශයටත් ඕලන්දයටත් නිතර සංචාරය කළාලු.

කොහොම වුණත් ඔහු විවාහ කරගත්තේ ප්‍රංශ ජාතික තරුණියක්. විවාහයට පෙර ඇගේ නම එමිලි ඩුබොයි. ඇය ප්‍රංශයේ වයින් අලෙවි කරන ආයතනයක රැකියාව කර තිබෙනවා. ඒ නිසා ඇයට ඉතා හොඳින් ඉංග්‍රීසි භාෂාව කතාකරන්න හැකියාව තිබුණා. විවාහ වී එංගලන්තයට පැමිණි පසු, ඇය මගේ මිතුරියක බවට පත්වුණා. රූමතියක් නොවුණත් ඇය ප්‍රියමනාප තැනැත්තියක්. මඳක් තරබාරු සිරුරක් තිබුණත්, බරපතළ රෝග වලින් පෙළෙන බවක් ඇය මට කවදාවත් කියා නැහැ. ඇගේ සැමියා වන හැරිස් මහත්මයා සහ මගේ බාප්පා වන බට්ලර් මහත්මයා ගජ මිතුරන්. ඔවුන් දෙදෙනා මත්පැන් පානය සඳහා අවන්හල්වලට එකට යන බව මා දන්නවා.

මාසයකට පමණ කලින් හරිම කණගාටුදායක සිදුවීමක් වුණා. එමිලි හැරිස් මහත්මිය හෘදයාබාධයකින් හදිසියේම මිය ගියා. ඇගේ සැමියා විවාහයට පසු ව්‍යාපාරික කටයුතු සඳහා, දින ගණන් සංචාරවල යෙදෙන්නේ නෑ. ඒ බව මට කිව්වෙත් එමිලි. නමුත් ඇය මියගිය දවසේ ඔහු දින කිහිපයක් බැහැරක ගිහින් ඉඳලයි

ආපහු ආවේ. ඔවුනට දරුවන් හෝ සේවක සේවිකාවන් කිසිවෙකු නැහැ. හිතන්න මහත්මයා. ඇය හෘදයාබාධයකින් ඇගේ නිදන කාමරයේ මිය යද්දී, ඊට බිත්තියකින් මෙහා පැත්තේ මා සිටියා. ඇයට පිහිට වීමට මට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ කරුණ මගේ හිතේ ඇති කළේ දැඩි කම්පනයක්. අප දෙදෙනා අතර තිබුණේ සමීප මිත්‍රත්වයක් කියන්න පුළුවනි. ඇගේ දෙමව්පියන්ට තිබුණු අගහිගකම් ගැන පවා එමිලි මා සමග කියා තිබුණා."

"ඇය ඔබේ ගමේ හෝ ලන්ඩනයේ වෛද්‍යවරයෙකුගෙන් කුමන හෝ රෝගයකට ප්‍රතිකාර ලැබුවද?" හෝම්ස් විමසීය.

"ඇය ඒ බවක් කිසි විටෙකත් මා සමග කියා නැහැ. අන්න ඒ නිසයි මේ මරණය මගේ සිතේ සැකයක් ඇති කළේ."

"නමුත් ඇගේ සැමියා ගෙදර එන විට ඇය මියගිහින්?"

"ඔව් මහත්මයා. මළසිරුර හමුවුණේ ඔහුට"

"ඇගේ මරණයෙන් පසු ඔහු කාලය ගතකළේ දැඩි කම්පාවකට පත්වෙලාද?" හෝම්ස් විමසීය.

"මං ඔබට කියන්න සූදානම් වුණේ අන්න ඒ කාරණය තමා" ක්ලාක් මෙනෙවිය කීවාය. "ඔහු කණගාටුවෙන් කාලය ගත කරන්න ඇති දින දෙකක් නැත්නම් තුනක්. ඊට පසු ඔහුගේ ස්වභාවය වෙනස් වුණා. ඔහු වෙනදාටත් වඩා අපේ නිවසට යන්න එන්න පටන් ගත්තා. ඒ මගේ බාප්පා හමුවීමට. විහිළු තහළු කරමින් සිනාසෙමින් ඔහු කාලය ගත කළේ සතුටින්. ඒ බව අපේ ගෙදර සේවිකාවට පවා පෙනුණා. ඊට පස්සෙ තමයි ......" කී ක්ලාක් මෙනෙවිය මඳක් නිහඬ වූවාය.

"ඇයි? ඊට පස්සෙ මොකක්ද සිදුවුණේ?" අපි දෙදෙනාම විමසුවෙමු.

"...... මං කියන්න හැදුවේ ...... හැරිස් මහත්මයා මා සමග කුළුපග වෙන්න උත්සාහ කළා. ඔහු මා වෙත අවධානය යොමු කරන්න පටන් ගත්තා......"

මොහොතක් නිහඬව සිටි ඇය කථාව යළිත් ඇරඹුවාය. "....... කිසිම ආකාරයකින් මං ඔහුව ධෛර්යමත් කළේ නෑ. ඔහුගේ බිරිඳ මගේ ළඟ මිතුරියක වූ බව ඇත්තයි. නමුත් මේ මිනිහා ගැන මගේ හිතේ කිසිම ආකාරයක කැමැත්තක් හෝ පැහැදීමක් ඇති කරගන්න මට හැකිවුණේ නැහැ. මගේ හිතේ ඔහු ගැන තිබුණේ පිළිකුලක්

කිව්වොත් නිවැරදියි. අන්තිමේදී ඔහු හිත ධෛර්යමත් කරගන්න ඇති. ඔහු මට ආදරය ප්‍රකාශ කරලා විවාහ යෝජනාවක් කළා. මේ පුද්ගලයා සමග විවාහ වෙන්න? ඒ ගැන සිතද්දීත් මගේ ඇඟ කිළිපොළා ගියා."

"ඔබ මොකද කළේ?"

"මං කලබල වුණේ නෑ." ඇය කීවාය. "ඔහුගේ යෝජනාව ගැන මගේ ස්තුතිය ප්‍රකාශ කළා. ඊළඟට මං එය ප්‍රතික්ෂේප කරන බව ඔහුට කිව්වා. ඒ ඔහුගේ හිත නොරිදෙන ආකාරයට. තමන් මේ යෝජනාව ගැන ඉක්මන් වුණා වැඩියි කිව් ඔහු, තවදුරටත් මේ ගැන කල්පනා කරන මෙන් මගෙන් ඉල්ලා හිටියා"

"ඒ ගැන ඔබේ බාප්පා මොකද කිව්වේ?"

"ඒ යෝජනාව මා ප්‍රතික්ෂේප කළ බව ඇහුවාම, බාප්පා බොහොම කෝපයට පත්වුණා." ඇය කීවාය. "ඔහු කිව්වේ මේ වගේ ධනවත් ව්‍යාපාරිකයෙකුගේ බිරිඳ වෙන්න ලැබෙනවා නම්, ඒක මොන තරම් වාසනාවක්ද කියලයි. රජයේ සේවකයෙකු සමග විවාහ වුණොත්, හිඟන පඩියකින් ජීවත් වෙන්න මට සිදුවෙන බවයි, බාප්පා නැවත නැවතත් කිව්වේ. සමහර විට ඒකෙ ඇත්තක් තිබෙන්නත් පුළුවනි. නමුත් මට නම් හිතුණේ වෙනත් දෙයක්.

අප පදිංචිව සිටින නිවස තාත්තා ලියා තිබෙන්නේ මගේ නමට. නමුත් අම්මා ජීවත්ව ඉන්න තුරු ඒක කිසිවෙකුට විකුණන්න මට අයිතියක් නෑ. මගේ බාප්පා ඔහුගේ ප්‍රාණ මිත්‍ර හැරිස් මහත්මයා සමග, රහස් ගිවිසුමක් ඇති බවට මට කිසිම සැකයක් නෑ. මං හැරිස් මහත්මයා සමග විවාහ වෙලා ඒ ගෙදර පදිංචියට ගියොත්, බාප්පාගේ ලොකු ප්‍රශ්නයක් විසඳෙනවා. අපේ ගෙදර අයිතිය තනිව ලබා ගන්න බාප්පාගේ බලාපොරොත්තුව ඇති......."

"හොඳයි ක්ලාක් මෙනෙවිය" හෝම්ස් කීවේ මෙතෙක් වේලා වසාගෙන සිටි දෙනෙත් විවෘත කරමිනි. "මට මෙන්න මේ කාරණය පැහැදිලිව කියන්න. එමිලි හැරිස්ගේ මරණය සිදුවුණේ හෘදයාබාධයකින් කියල ඔබ කිව්වනේ. ඒක එහෙම නෙමෙයි; මේ මරණය ගැන සැකයි කියල, කාට හරි සැකයක් මතුවෙලාද?"

"එහෙමමත් නැහැ මහත්මයා" ඇය කීවාය. "එය හදිසි මරණයක් නිසා පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වුණා. එය සිදුකර තිබුණේ වුඩ්බ්‍රෝ රෝහලේදී. අපේ සාමාන්‍ය වෛද්‍යවරයා දොස්තර මයිකල් බෙවන්. ඒ දිනවල ඔහු ඉතාලියේ නිවාඩුවක් ගත

කිරීමට ගිහින් හිටියේ. ඒ නිසා පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර තිබුණේ දොස්තර ගේබ්‍රියෙල් තොම්සන් මහතා විසින්. මරණයට හේතුව හෘදයාබාධයක් බවට කිසිම සැකයක් නැති බවයි ඔහු කියා තිබුණේ."

"මගේ හිතවත් නෝනා. මේ අහන්න" හෝම්ස් කීය. "ඔබ මුහුණ දී තිබෙන කණගාටුදායක තත්ත්වය ගැන මටත් හිතට අමාරුයි. නමුත් මං රහස් පරීක්ෂකයකු පමණයි. ඔබ ඔය ප්‍රශ්නයෙන් ගළවාගන්න, මට කළ හැකි දෙයක් නෑ. ඔහු මැදිවියේ කෙනෙකු වුණත් ඔබ වැනි තරුණ කාන්තාවක වෙත, ඔහුගේ සිත ඇදී යාමේ පුදුමයක් නෑ. විශේෂයෙන්ම ඔහු දැන් කණවැන්දුම් අයෙකු නිසා. කොහොම වුණත් ඔහුව ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් තියෙනවා."

"ඒ වුණත් මං කියන දේත් අහන්න හෝම්ස් මහත්තයා. ඉතාම පුදුමාකාර, ඒ වගේම ඉතා අසාමාන්‍ය සිදුවීමකටත්, මං මුහුණ දුන්නා. ඒක අහඹු සිදුවීමක් බව ඇත්තයි.

මේක සිදුවුණේ එමිලි මියයන්න සතියකට කලින්. එක දවසක් දවල් කෑම පහුවෙලා පැයකට විතර පස්සේ මං ගෙදරින් එළියට බැස්සා. මට දකින්න ලැබුණේ සේදූ ඇඳුම් කට්ටලයක් එමිලි රෙදි වැලේ වැනූ හැටි. ඒක පිරිමියෙකුගේ කලිසමක්, කබායක් සහ කමිසයක්. ඒ අළුපාට ඇඳුම්, මළගෙදරකට ඇඳගෙන යාමට සුදුසු ඒවා. එම ඇඳුම් සෝදා පිරිසිදු කොට මැද තබන්න කියා ඇගේ සැමියා කිව්වාලු. අපේ ඒ කතාබහ කෙරුණේ අපේ ඉඩම් දෙක වෙන්කිරීමට තිබෙන කෙටි තාප්පයට උඩින්. ඊළඟට මට ඒ ඇඳුම් කට්ටලය දකින්න ලැබුණේ, සතියකට පසු ඇගේ සැමියා එය හැඳ සිටියදී. ඔහු එමිලිගේ අවමඟුල සඳහා බ්‍රික්ස්ටන් සුසාන භූමියට ඇවිත් සිටියේ ඒ ඇඳුමෙන් සැරසිලා. දෙවියනේ! ඇය ඒ සූදානම් කරල තිබුණේ ඇගේ අවමඟුලට ඇඳුම්."

"ඒක සම්පූර්ණයෙන්ම අහඹු සිදුවීමක් වෙන්න පුළුවනි" හෝම්ස් කීය. "ඒ වුණත්....... ක්ලාක් මෙනෙවිය මං තීරණය කළා, ඔබේ ගැටලුව විසඳීම භාරගන්න. මේකෙ අසාමාන්‍ය ලක්ෂණ තිබෙනවා කියන කරුණත්, අපට බැහැර කරන්න බෑ. මං මගේ මිත්‍රයා එක්ක රීජන්ට් උද්‍යානයට ඇවිදින්න යන්නයි සූදානම් වුණේ. එහෙම නම් අපි එන්නම් ඔබ සමග. වොට්සන්, ලොකු කුලීරියක් නවත්වා ගන්න කියල හඩ්සන් මහත්මියට කියන්න"

"නැහැ හෝම්ස් මහත්මයා" තරුණිය කීවාය. "ඔබ දෙදෙනා නාඳුනන අය නිසා මං එහෙම යන එක හොඳ නෑ. මේ ලන්ඩන් නගර මධ්‍යයේ වගේ නෙමෙයි. අපි පදිංචි හරියේ ගෑනු බලාගෙන ඉන්නෙ මොකක් හරි කටකතාවක් හදන්න. මං තනිවම පිටත්වෙන්නම්. අපි බ්‍රික්ස්ටන්වල අවන්හලක හමුවෙමු. නගරයේ මහ වීදියේ තැපැල් කාර්යාලය අසලම තියෙනවා රොබින්සන් අවන්හල. ඔබ එනතුරු මං එතැන රැඳී ඉන්නම්"

"නමුත් අපට උවමනා කරන්නේ ඔබේ සහ හැරිස් මහත්මයාගේ නිවාස බලාගැනීමට" හෝම්ස් කීය. "ඊළඟට ඔහු හමුවීමටත් මං බලාපොරොත්තු වෙනවා. අද ඔබේ බාප්පා ගෙදර ඉන්නවද?"

"අද බාප්පා ගෙදර නැහැ. ඔහු ව්‍යාපාරික කටයුත්තක් සඳහා බැහැර ගිහින්. ඒ නිසා, ඔබට අපේ නිවස තුළට එන්න කියා ඇරයුම් කිරීමටත් අපහසුයි මහත්මයා. ඒ ගැන මට සමාවෙන්න"

"මට ඒක තේරුම් ගන්න පුළුවනි." හෝම්ස් කීය. "මට කියන්න ඔබේ නිවසේ අංකය"

"අංක 340 මහවීදිය"

"එතකොට හැරිස් මහතාගේ?"

"අංක 342"

"හරි. ඔබ අවන්හලේ රැඳී ඉන්න උවමනා නැහැ. කෙළින්ම ගෙදර යන්න" හෝම්ස් කීය. "මට ඔබෙන් විමසිය යුතු තවත් කාරණා කිහිපයක් තිබෙන්න පුළුවනි. ඒවා මට ඉදිරිපත් කරන්න හැකිවෙන්නේ, හැරිස් මහත්මයා සහ වෛද්‍ය තොම්සන් හමුවුණාට පස්සෙ. ඒ නිසා ඔබ රොබින්සන් අවන්හලට පැමිණිය යුතු වෙලාව, මං කොළයක සටහන් කරගෙන ඇවිත් ඔබේ ලියුම් පෙට්ටියට දමන්නම්. ඒ ගැන විමසිල්ලෙන් ඉන්න"

"ඔබට බොහොම ස්තුතියි හෝම්ස් මහත්මයා" කියූ තරුණිය අපෙන් සමුගෙන පිටවී ගියාය. අපි තවත් පැය භාගයකට පසු පිටත් වී ගියෙමු.

කුලී රියක නැඟී අපි බ්‍රික්ස්ටන් වෙත ගියෙමු. මහවීදියේ අංක 342 දරන ස්ථානය සොයාගැනීම අපහසු වූයේ නැත.

"ෆ්‍රෑන්ක් හැරිස්
පෞරාණික බඩු හා අරුමෝසම් බඩු අලෙවි සල
ආභරණ උකසට ගැනීම ද කරනු ලැබේ."

යතුවෙන් සඳහන් කර තිබූ දැන්වීම් පුවරුව අපි ඈත සිටම දුටුවෙමු.

"අපි මුලින්ම හැරිස් හමුවෙලා බලමු" හෝම්ස් කීය.

විවෘතව තිබූ දොරෙන් අපි ඇතුළුවූයෙමු. එය අඳුරු අවලක්ෂණ තැනක් විය. නිතර පිරිසිදු නොකිරීම නිසාදෝ එහි දුගඳක් ද පැවතිණ. බාල වර්ගයේ බිත්ති ඔරලෝසු කිහිපයක්, බිත්තිවල එල්ලා තිබූ අතර, විදෙස් රටවලින් ආ අරුමෝසම් බඩු රාක්ක මත තබා තිබිණ. මිල අධික ගනයට අයත් නොවන, මැණික් ඇල්លූ ආභරණ, වීදුරු අල්මාරියක ප්‍රදර්ශනයට තබා තිබූ සැටි මම දුටුවෙමි.

හොඳින් හැඳ පැළඳ ගත් මහත්වරුන් දෙදෙනෙකු ඔහුගේ සාප්පුවට පිවිසෙන අයුරු, එහි හිමිකරු දකින්නට ඇත. සිනාවක් මුවට නඟා ගත් ඔහු ඉදිරියට ආවේ දැත් පිරිමදිමිනි.

"සුභ උදෑසනක් මහත්වරුනි" ඔහු කීයේ ප්‍රසන්න හඬකිනි. "ඔබ වෙනුවෙන් මොනවද මට කරන්න පුළුවන්?"

"මං පෞරාණික බඩු එකතු කරන කෙනෙක්" හෝම්ස් කීවේ සැහැල්ලු අයුරෙනි. "අපි මේ ළඟින් ඇවිද ගෙන ගියා. එතකොටයි අපි ඔබේ සාප්පුව දුටුවේ. මගේ හිතට අල්ලන මොනවා හරි තියේවිද බලන්නයි මං නිකං ගොඩවුණේ"

"මමත් පෞරාණික බඩු එකතු කරන කෙනෙක් මහත්මයා" හැරිස් කීය. "එහෙම කෙනෙකුට උදව් කරන්න මාත් හරි කැමතියි. පෞරාණික බඩු ඉතා විශාල ප්‍රමාණයක් අප ළඟ නැති බව ඇත්තයි. ඒ වුණත් සාමාන්‍යයෙන් ලන්ඩන් නගරයේ වුණත් හමු නොවන, දුර්ලභ කෞතුක භාණ්ඩ මා ළඟ තියෙන්න පුළුවනි."

"ඔබ කොහොමද එහෙම දේවල් හොයාගන්නෙ?" මම ඇසීමි.

"අපේ යටත්විජිතවල රැකියාව කරලා විශ්‍රාම අරගෙන, ආපහු එංගලන්තයට එන නිලධාරි ඉන්නවා නේ" හැරිස් කීය. "ඔවුන් ළඟ තමයි ඉතාම හොඳ කෞතුක භාණ්ඩ, අරුමෝසම් බඩු තියෙන්නේ. ඔවුන් වයස්ගත වෙලා මියගියාම, ළමයින්ට ඒවල වටිනාකමක් නෑ. එයාල පත්තරවල දැන්වීම් දාල ඒ බඩු විකුණා දමනවා. මං එහෙම තැන්වලට ගිහින් බඩු මිලට ගන්නවා"

"ඒ විදියට ඔබට ළඟදිම ලැබුණු බඩු මොනවද?"

"ඔබ අහල තියෙනවා නේද මේජර් කොලින් ඩේවිඩ්සන් ගැන?" හැරිස් විමසීය. "ඔහු ඉන්දියාවෙ රඳවා තිබෙන අපේ යුද හමුදාවෙ

සේවය කළේ. අන්තිමට ඉඳල තියෙන්නෙ බොම්බායෙ කාලතුවක්කු හමුදා කඳවුරේ. මේ බලන්න ඔහු ඉන්දියාවෙන් ගෙනැත් තිබුණු බඩු. හොඳම බඩු සමහරක් ඉතාම ඉක්මනින් විකිණුණා. බලන්න ඔබ කැමති මොනවා හරි තියෙනවද කියල"

"ඉන්දියන් බඩු නම් මා ළඟ හුඟක් තියෙනවා" හෝම්ස් කීය.

"අප්‍රිකාවෙන් ආව බඩුත් මා ළඟ තියෙනවා." හැරිස් කීය. "මේ තියෙන්නෙ දකුණු අප්‍රිකාවෙ ඉඳල එද්දි කර්නල් සිසිල් මෝගන් අරගෙන ආව බඩු. ඔහු සේවය කරල තියෙන්නෙ මැෆ්කිං වල, පාබල හමුදාව භාරව මගෙ හිතේ. ඔහුගේ මරණයෙන් පස්සෙ බඩු හුඟක් වෙන්දේසි කෙරුණා.

බලන්න මේ කළුවර ලීයෙන් හදල තියෙන පුටුව. ඕනෑම මහත්මයෙකුගේ කන්තෝරු කාමරයට මේක අපූරුම බඩුවක්. තව තියෙනවා වෙස් මුහුණු. ඊළඟට මේ බලන්න සූලු යුද භටයෙකුගේ යුද්ධ ඇඳුම් කට්ටලය; පළිහ, හෙල්ල, මාල, කඩුව ආදී හැමදෙයක්ම තියෙනවා. ඉතාම අලංකාර බඩු"

"ඔව්. මේ බඩු ඉතා අලංකාර වටිනා ඒවා බවට නම් කිසිම සැකයක් නෑ" හෝම්ස් කීවේ හිස සොලවා එකඟත්වය පළකරමිනි. "ඒ වුණත් මා ළඟ තියෙන එකතුවට, මේවා එච්චරම ගැලපෙන්නේ නෑ. කෝ....... තව ටිකක් බලමු" කී හෝම්ස් සාප්පුව තුළ එහා මෙහා ඇවිද්දේය.

ඔහු උත්සාහ දැරුවේ හැරිස්ට එරෙහිව කිසියම් හෝඩුවාවක් සොයා ගැනීමට බැව් මම තේරුම් ගතිමි.

"මහත්මයා. මගේ ගෙදර තියෙන්නේ මීට හැතැක්ම දෙකක් විතර දුර තැනක" හෝම්ස් කීය. "යම් විදියකින් මං ඔය කළුවර ලී පුටුව මිලට ගත්තොත්, ඒක ප්‍රවාහණය කර දෙන්න ඔබට පුළුවන්ද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා" හැරිස් කීවේ අප්‍රමාණ සතුටකිනි. "පුටු වැනි බර බඩු ගෙන යෑම අපට නිතරම පැවරෙන වගකීමක්. මා ළඟ තියෙනවා ඒ වැඩේට සුදුසු ඉඩකඩ තිබෙන අත් කරත්තයක්."

"එහෙම නම් පහසුයි" හෝම්ස් කීය. "මං මිලට ගතයුතු බඩු ගැන තවදුරටත් කල්පනා කරල ඔබ හමුවෙන්න එන්නම්. ඔබට පුළුවන්ද මේ බඩු කිහිපයකට ඔබ බලාපොරොත්තුවෙන මිල මට ලියා දෙන්න. එකක් කළුවර පුටුව. ඊළඟට අර හෙල්ල සහ පළිහ. මං කල්පනා කරල බලල ඔබ හමුවෙන්න යළිත් එන්නම්"

හැරිස් මහතා එම බඩුවල මිල ගණන් ලියාදුන් පසු අපි එතැනින් පිටවී ආවෙමු.

"හෝම්ස්. මොනවද ඔබට සොයා ගැනීමට හැකිවුණේ?" මා විමසුවේ අප සෑහෙන දුරක් ඉදිරියට ඇවිද ආ පසුව ය.

"ක්ලාක් මෙනෙවිය අපට ඉදිරිපත් කළ ගැටලුව ගැන නම්, ඒ හැටි දෙයක් සොයා ගත්තා කියන්න අමාරුයි. නමුත් අර සූලු ජාතිකයන්ගේ අවි ආයුධ කට්ටලය ගැන නම්......."

"ඔව්. ඒ ගැන ඔබ මොනවද දුටුවෙ?"

"සූලු ජාතිකයන් වගේම දකුණු අප්‍රිකාවෙ අනික් වනචාරීන් ළඟ නිසැකවම දකින්න ලැබෙන ආයුධය තමයි, "නොබ්කෙරි" යනුවෙන් හඳුන්වන හෙල්ල. ඒක තිබුණා. නමුත් ඒකෙ ඉදිරිපස කොටස තිබුණෙ නෑ"

"ඒ කිව්වෙ?"

"ඒ හෙල්ල ඉදිරි කෙළවරට සාමාන්‍යයෙන් සවිකර තිබෙන්නෙ මුවහත්, තියුණු උලක් සහිත කිණිස්සක්. ඒක උවමනා විටකදි ගළවා වෙන්කරගන්න පුළුවන් විදියටයි ඔවුන් එය සකස් කරන්නෙ. මේක එංගලන්තයට ගෙනාව හමුදා නිලධරයා, ඒ කොටස නැතුව හෙල්ල පමණක් මෙහේ ගෙනාවා කියල හිතන්න අමාරුයි"

"හෝම්ස්. ඒ වුණත් අපි දන්නවානේ. හැරිස් මහත්මිය මිය ගියේ ආයුධයකින් සිදුකළ තුවාලයකින් නෙමෙයි කියල" මම හෝම්ස්ගේ අදහසට විරුද්ධත්වය ප්‍රකාශ කළෙමි.

"ඔව්. ඒකත් හරි තමා" හෝම්ස් කීය. "සමහරවිට මා කළ ඒ නිරීක්ෂණයේ වැදගත් කමක් නැතුවත් ඇති, ඔබ කියන්න වගේ. දැන් අපට දෙපැත්තකට ගමන් කරන්න සිදුවෙනවා වොට්සන්. මං බලාපොරොත්තු වෙනවා හැරිස් මහතා සහ මහත්මිය ගැන විමසීම් කීපයක් කරන්න යන්න. ඔබට පුළුවන්ද ගිහිං දොස්තර ගේබ්‍රියෙල් තොම්සන් හමුවෙන්න?"

"මට මෙහෙමත් හිතෙනවා හෝම්ස්" මම කීවෙමි. "ඔවුන් සාමාන්‍යයෙන් ප්‍රතිකාර ගන්නා දොස්තර බෙවන් නිවාඩු යනතුරු ඉඳලා, හැරිස් මොකක් හරි කපටි කෛරාටික කමක් කළාද දන්නෙ නෑ. කවුද දන්නෙ. සමහර විට වැඩ බලන්න ඉන්න දොස්තර තොම්සන්, හුඟක් වයස්ගත, මත්පැන්වලට ඇබ්බැහි වුණු කෙනෙක් වෙන්න පුළුවනි. එහෙම කෙනෙක් රවටා ගැනීම බොහොම පහසුයිනෙ"

"ඉතාම හොඳ උපකල්පනයක් වොට්සන්. කොහොම වුණත් ඔබ ගිහින් ඔහු හමුවෙලා බලන එක තමා වඩා හොඳ."

මම කඳු පාර දිගේ ඉහළට ඇවිද ගියෙමි. ගමේ සරුසාර ව්‍යාපාරිකයන්ගේ නිවාස පිහිටා තිබුණේ, පාර කෙළවර තිබූ ක්‍රොම්වෙල් චතුරශ්‍රයේ බැව් මට පෙනී ගියේය. දොස්තර ගේබ්‍රියල් තොම්සන්ගේ ශල්‍යාගාරය මෙන්ම නිවාසය ද වූයේ, තරමක් විශාල නවීන නිවසක් බැව් මම දුටුවෙමි. මගේ ආගන්තුක පත ඔහු වෙත යවා වැඩි වේලාවක් බලා සිටීමට මට සිදු නොවීය.

"ඔබ හමුවෙන්න ලැබීම ගැන මට බොහොම සතුටුයි දොස්තර වොට්සන්" ඔහු කීවේ අතට අතදී මා පිළිගනිමිනි. මා ඔහු ගැන කර තිබූ උපකල්පනය වැරදි බැව් ඔහු දුටු වහාම මට පෙනී ගියේය. මැදිවියට ළංවෙමින් සිටි ඔහු, ශක්තිමත් නිරෝගී පුද්ගලයකු බැව් බැලූ බැල්මට පෙනිණ. මත්පැනට ඇබ්බැහි වූ අසාර්ථක අකාර්යක්ෂම වෛද්‍යවරයකුගේ පෙනුමක් ඔහු තුළ නොවීය.

"ඔබ පැමිණි කාරණය ගැන කතාබහ කරන අතරේ, ඔබ කැමතිද තේ ටිකක් බොන්න?"

ඔහුගේ එම ඇරයුමට ස්තුතිකොට ඊට එකඟ වී, මා පැමිණි කාරණය ගැන බොරුවක් ගෙතුවෙමි.

"මෑතකදී මියගිය එමිලි හැරිස් මහත්මිය ගැන විමසීමක් කරන්නයි මං ආවෙ. ඇය මගේ බිරිඳගේ දුරස්ථ ඥාතිවරියක්. එමිලිගේ හදිසි මරණය ගැන ඔබේ අදහස විමසා බලන්න කියා ඔවුන් කරදර කරනවා"

"එමිලි හැරිස් ගේ මරණය සම්බන්ධ කාරණා මට හොඳට මතකයි" වෛද්‍ය තොම්සන් කීය. "මම ඇයවත් ඇගේ සැමියාවත් දැන හඳුනන්නේ නැහැ. ඒ මොකද ඔවුන් දොස්තර මයිකල් බෙවන් ගෙන් ප්‍රතිකාර ගන්නා අය.

බෙවන් සහ මම අවුරුදු හත අටක ඉඳල යොදා ගත් වැඩ පිළිවෙළක් තියෙනවා. ඔහු තුන් මාසයක නිවාඩුවක් ගන්නේ අවුරුද්දේ මේ කාලයට. එතකොට ඔහුගේ රෝගීනට ප්‍රතිකාර කිරීම මං භාරගන්නවා. මගේ තුන් මාසේ නිවාඩුව මං පටන්ගන්නේ දෙසැම්බර් අන්තිමේ. ඒ කාලයට මගේ රෝගීන්ව බෙවන් භාරගන්නවා.

ඔවුන්ගේ කැඳවීම අනුව මං ගිහින් බලනකොට, හැරිස් මහත්මිය මියගිහින් දින කීපයක් ගතවෙලා. අවාසනාවකට වගේ ඇගේ සැමියා ඒ දිනවල ගෙදරින් බැහැර ගිහිං ඉඳල තියෙන්නේ. ගෙදර

ආවම දකින්න ලැබුණු දෙයින්, ඒ අසරණයා දැඩි කම්පාවකට පත්වෙලා හිටියා. මං ඇගේ මරණය සහතික කරලා, පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා මළසිරුර බ්‍රික්ස්ටන් මධ්‍යම රෝහලට ගෙනයන්න නියම කළා. එය සිදුකළේ දොස්තර ජෝජ් ක්‍රිසි සහ මම. මරණය ගැන අපට කිසිම සැකයක් ඇතිවුණේ නැහැ. දිගු කලක සිට ඇගේ හදවතේ තදබල ආබාධයක් තිබිල තියෙනවා. අකාර්යක්ෂම බවට පත්ව තිබූ හදවත, අක්‍රිය වූ බව දැක්වෙන සියලුම සලකුණු එහි තිබුණා"

"ඔබ එහෙම කියනවා නම්, මට ඒ ගැන කිසිම සැකයක් නෑ දොස්තර තොම්සන්. ඔබේ වටිනා කාලය මා වෙනුවෙන් යෙදවීම ගැන, මං ඔබට ස්තුතිවන්ත වෙනවා." ඔහුගෙන් සමු ගනිමින් මම පැවසුවෙමි. ආපසු පැමිණි මම හෝම්ස්ට සියල්ල විස්තර කළෙමි.

"කොහොම වුණත් මගේ හිතට නම් සැකයි වොට්සන්" හෝම්ස් කීය. "බලන්න මෙතැන තිබෙන අහඹු සිදුවීම් ප්‍රමාණය. හැරිස් මහත්මයා විවාහයට පසු, දින කීපයක රාජකාරි කටයුත්තක් සඳහා කවදාවත් ගිහින් නෑ. නමුත් ඔහු එහෙම ගිය මුල්ම අවස්ථාවෙම ඇය මියගියා. ඊළඟට පවුලේ වෛද්‍යවරයා නිවාඩුවකට විදේශ ගතවෙලා ඉඳිද්දිමයි, ඇය මේ බරපතළ රෝග තත්ත්වයට ගොදුරු වුණේ. නමුත් ඇගේ මිතුරිය ක්ලාක් මෙනෙවිය කියන්නේ, හැරිස් මහත්මිය තමන්ට තිබූ අසනීපයක් ගැන, කවදාවත් මතක් නොකළ බව......."

"ගැහැනුන්ගේ හැටි එහෙම තමයි හෝම්ස්. තමන්ට තියෙන අසනීප ගැන ගෑනු අල්ලපු ගෙදර මිතුරියකට එක වචනයක් කියන්නෙ නෑ තමයි. නමුත් තමන්ගෙ සැමියා රැකියාව ඉවරවෙලා ගෙදර ආව වෙලාවෙ ඉඳල, අතන රිදෙනවා මෙතන රිදෙනවා කියල, අට අනූවක් රෝග ගැන පැමිණිලි. මං මේව ගැන දන්නේ වෛද්‍යවරයෙකු හැටියට පමණක් නෙමෙයි. විවාහ ජීවිතයක් ගත කළ කෙනෙකු හැටියටත්"

ඊට මගේ මිත්‍රයා දුන් පිළිතුර වූයේ හඬනගා සිනාසීමයි.

"ඒ කොහොම වුණත් වොට්සන් මගේ හිතේ තියෙන්නෙ සැකයක්"

"පශ්චාත් මරණ පරීක්ෂණය කළේ පළපුරුදු උගත් වෛද්‍යවරු දෙදෙනෙක්" මම කීවෙමි. "මරණයට හේතුව දිගු කලක් තිස්සේ

රෝගීව තිබූ හදවතක්, ක්ෂණිකව ආබාධයකට ලක්වීම. ඒ බව ඔවුන්ට සීයට සීයක් සහතිකයි. පරණ බඩු විකුණන නුගත් වෙළෙන්දෙකුට පුළුවන්ද මේ වගේ උගත් වෛද්‍යවරුන් නොමග යවන්න? චෝහාරික වෛද්‍ය විද්‍යාව දැන් හුගක් දියුණුයි. ඔබ ඒ කාරණාව හොඳට දන්නවා නෙ. ඔහු ඇයව ඝාතනය කළා නම්, ඒක සිදු කළ ආකාරය හංගන්න ඔහුට හැකිවෙන්නෙ නෑ"

"ඔබේ කතාවෙත් ලොකු ඇත්තක් තියෙනවා වොට්සන්. කොහොම වුණත් මීළඟට අපට තියෙන්නෙ ක්ලාක් මෙනෙවිය හමුවෙලා කතාබහ කරන්න. ඒ ගැන මතක් කරලා අපි ඇගේ ගෙදර ලියුම් පෙට්ටියට ලියුම් කැබැල්ලක් දාමු. ඊළඟට යමු රොබින්සන් අවන්හලට"

දහවල් ආහාරය සඳහා අසුන් වෙන්කරගෙන අපි බලා සිටියෙමු. ක්ලාක් මෙනෙවිය නොපමාව රොබින්සන් අවන්හලට පැමිණියාය. ඇගේ රුව් අරුවිකම් විමසා හෝම්ස් විසින් දහවල් කෑම ඇණවුම් කරන ලදී. ඉන්පසු ඔහු කෙළින්ම මාතෘකාවට බැස්සේය.

"ක්ලාක් මෙනෙවිය. මං කැමතියි හැරිස් මහත්මයා සහ මහත්මිය දෙදෙනා ගෙවිවේ මොන වගේ ජීවිතයක්ද කියන එක දැනගන්න." හෝම්ස් විමසීය. "ඒ කියන්නේ ඒ දෙදෙනා බොහොම ආදරයෙන් කාලය ගතකළ බවක්ද ඔබට අහන්න ලැබුණේ? එහෙමත් නැත්නම් ඔවුන් අතර අඬදබර තිබුණද?"

"මං ඔබට කලිනුත් කිව්වා වගේ, ඔහු වයින් සහ දුම්කොළ හොරෙන් ගෙන ඒමේ ව්‍යාපාරයක යෙදිලයි ඉන්නේ" ඇය කීවාය. "ඒකෙන් ඔහුට හොඳ ආදායමක් තියෙනවා. නමුත් ඔහු ඒ මුදල් යොදවන්නේ අශ්ව රේස්වල ඔට්ටු ඇල්ලීමට බව, ඇය මා සමග කියා තිබෙනවා. මගේ බාප්පත් රේස් කාරයෙක්. දෙදෙනා අතර මිත්‍රත්වය ඇඩිවී තිබෙන්නෙත් ඒ නිසා. ප්‍රංශ ජාතික අය අපට වඩා ලස්සනට ඇඳීමට කැමති අය බව ඔබ දන්නවානෙ. ඇයත් ඒ වගෙයි. ඇයට යාමට ඒ තරම් ගමන් බිමන් තිබුණේ නෑ. නමුත් ඇයට අලංකාර, වටිනා ඇඳුම් පැළඳුම් නිතර උවමනා වුණා. ඒවාට ප්‍රමාණවත් තරම් මුදල් සැමියාගෙන් නොලැබුණු බව, එමිලි මා එක්ක නිතර කිව්වා. ඒ සම්බන්ධයෙන් වෙන්න ඇති, ඒ දෙදෙනා අතර ඇතිවුණු සණ්ඩු සරුවල් මට අහන්න ලැබිල තියෙනවා."

"ඇගේ ඇඳුම් මැහීම කළේ කවුද කියල ඔබට කියල තියෙනවද?"

"ඇත්තෙන්ම ඔව්. ඒ තමයි මේ පළාතේ ඉන්න හොඳම මැහුම්කාරිය ඩොරිස් කෙන්ට් මහත්මිය. ඇගේ මැහුම් ආයතනය තියෙන්නේ මේ පාරෙමයි. මෙතැන ඉඳලා යාර දෙසීයක් පමණ දුරින් ශාන්ත ලූක් දෙව්මැඳුර ඉදිරිපිට."

"මං කැමතියි තවත් එක කාරණයක් ඔබෙන් දැනගන්න" හෝම්ස් කීය.

"ඔහු ලී බඩු ප්‍රවාහණයට අත් කරත්තයක් යොදා ගන්නා බව හැරිස් මහත්මයා මට කිව්වා. ඔහු ඒක නවත්වා තියෙන්නෙ කොහේද කියල ඔබ දන්නවද?"

"ඔව් මහත්මයා. අශ්වයිනට ලාඩම් ගහන සහ සුළු සුළු වෙදකම් කරන විටේකර් නම් කෙනෙක් ඉන්නවා. ඒ අපේ ගෙවල් ළඟින්ම වැටී ඇති හැනෝවර් පටුමගේ. විටේකර්ගේ කම්හල් බිම හුගක් ඉඩ කඩ තියෙන තැනක්. ඒකෙ මඩුවක තමයි හැරිස් මහත්මයාගෙ අත් කරත්තය තබා තිබෙන්නේ. කුලී අශ්ව කරත්තයකට ලොකු මුදලක් ගෙවන්න වෙනවානෙ. ඒ නිසා ඔහු ඒ අත් කරත්තයේ බඩු අරගෙන යන හැටි මං දැකල තියෙනවා"

කෑම ගන්නා අතරේ හෝම්ස් ක්ලාක් මෙනෙවියගෙන් තවත් ප්‍රශ්න කිහිපයක්ම ඇසුවේය. ඇය ඒවාට නොපැකිළව පිළිතුරු දුන්නාය. ඒ ප්‍රදේශයේ ළමා පාසලක ගුරු සහායිකාවක තනතුරකට තමා අයදුම් කර, සම්මුඛ පරීක්ෂණයට ගිය බවත්, ඇය කීවාය.

ආහාර ගනිමින් අපි එතැන දීර්ඝ වේලාවක් ගත නොකෙළෙමු. පරීක්ෂණයේ ඉතිරි වැඩකටයුතුවල යෙදීමට මගේ මිත්‍රයා සිටියේ නොඉවසිල්ලෙනි. එබැවින් අපි ඇයගෙන් සමුගත්තෙමු.

"ක්ලාක් මෙනෙවිය. අපි තවමත් ඉන්නේ මේ පරීක්ෂණයේ මුල් අවදියේ. ඒ නිසා මට වැඩිදුර යමක් කියන්න අමාරුයි. ඔබේ ඉල්ලීම අනුව කළ හැකි යමක් තියේවි කියා මට තිකමට හිතෙනවා. අවශ්‍ය වුණොත් හෙට දවසේ මං ඔබව සම්බන්ධ කරගන්නම්."

ඇය අප දෙදෙනාටම අතට අතදී ආචාර කොට ස්තුති කළාය. ඇය පිටවී යනතුරු බලාසිට අපි අවන්හලෙන් එළියට ආවෙමු.

"වොට්සන්. අපි මීළඟට යා යුතුයි හැරිස් මහත්මිය ඇගේ ඇඳුම් මස්සවා ගත් ආයතනයට. ඔබට මතකද ඒ නම?...... හරි ...... ඩොරිස් කෙන්ට් මහත්මිය...... ලූක් දෙව්මැඳුර ඉදිරිපිට කියල නේද කිව්වෙ?"

අපට තිබූ කාල වේලාව අනුව පමාවිය නොහැකි බව කී හෝම්ස් කුලීරියක යාමට තීරණය කළේය. තරමක් විශාල නවීන ගොඩනැඟිල්ලක පිහිටා තිබූ එය, ඉහළ පෙළේ තැනක් බැව් දුටුවෙමු. "කෙන්ට් - කාන්තා ඇඳුම් මෝස්තර ආයතනය" නම් අලංකාර නාම පුවරුවෙන්ම එහි ස්වභාවය වටහා ගත හැකි විය.

කාන්තා ඇඳුම් නිර්මාණය කරන තැනකට මහත්වරුන් දෙදෙනෙකු ගේ පැමිණීම ඔවුනට දුර්ලභ සිදුවීමක් වූවා නොඅනුමානය. කෙසේ වෙතත් එහි හිමිකාරිය වූ කෙන්ට් මහත්මිය, අපගේ ඉල්ලීම අනුව ඉදිරියට පැමිණියාය. ආඩම්බරකාරියක ලෙස පෙනුණු මේ මැදිවයස ඉක්මවූ කාන්තාවගේ මුහුණට නැඟුණේ, ගැටලුවකට මුහුණ දුන් ලකුණුය.

"මේ කෙන්ට් මහත්මියද?" හෝම්ස් විමසුවේ හිස නමා ආචාර කරමිනි. "ළඟදී මියගිය එමිලි හැරිස් මහත්මියගේ දේපළ පිළිබඳ කටයුතු - ණයතුරුස් පියවීම භාරවෙලා තියෙන්නෙ අපටයි. ඔබගේ ආයතනයට ඇයගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණයක් තිබෙනවාද, එහෙනම් ඒ කොපමණද කියා දැනගන්න අප කැමැතියි"

මේ හඳුන්වා දීමෙන් කෙන්ට් මහත්මියගේ මුහුණේ තිබූ සැරපරුෂ බැල්ම මැකී ගියේය.

"මහත්වරුනි. කරුණාකරල එන්න මගේ කාර්යාලයට. මේ කාරණා එතැනදී සාකච්ඡා කිරීම වඩාත් පහසුයි" ඇය කීවේ සිනාමුසු මුහුණෙනි.

කාර්යාලය ලෙස වෙන්කර තිබූ කොටස එතරම් ඉඩකඩ තිබූ තැනක් නොවීය. එහෙත් රාක්කවල හා මේසය උඩ තිබූ ඇගේ ගනුදෙනු පොත් අනුව, සාකච්ඡාව සඳහා සුදුසුම තැන මෙතැන බැව් අපට වැටහිණ. අප අසුන්ගත් වහාම කෙන්ට් මහත්මිය කථාව ඇරඹුවාය.

"එමිලි හැරිස් මහත්මිය හදිසියේම මියගිය බව අහන්න ලැබුණාම, මං පත්වුණේ ඇඩි කම්පනයකට. ඇය මගේ අනුග්‍රාහිකාවක් වුණා පමණක් නෙමෙයි; මගේ මිතුරියක ද වුණා. මේ තරම් තරුණ කාලෙ ඔය විදියට මියගියා කිව්වාම...... දෙවියන් වහන්සේ තීරණය කරන දේවල් ගැන අපි මොනවා කරන්නද?"

"ඔබ කියූ දේ හරි." හෝම්ස් කීවේ ඇය දිග සුසුමක් හෙළා ළය සැහැල්ලු කරගත් පසුය. "අපි කැමතියි දැනගන්න. ඇය මොනවද

මෑතදී ඇණවුම් කළ ඇඳුම් පැළඳුම්; ඒවාට අය විය යුතු මුදල කොපමණද යන කරුණු"

"ඇය අන්තිමට ගවොමක් මැසීමට ඇණවුම් කළේ ගිම්හාන සාතුව සඳහා. ඒකෙ "ෆිටෝන්" ඒකටත් ඇවිත් බලලා සතුටුවෙලා මැහුම සම්පූර්ණ කරන්න කිව්වා. කලින් ඒවාටත් එක්ක ඇය ගෙවිය යුතු මුළු මුදල පවුම් 7 යි සිලිං 12 යි. මේ බලන්න මගේ ගනුදෙනු පොතේ ඇගේ නම ඉදිරියෙන් එය සටහන්ව ඇති හැටි"

"කෝ බලන්න" කී හෝම්ස් ඔහු දෙසට හැර වූ පොත තමා වෙත ළංකර ගත්තේය. හැරිස් මහත්මිය වෙනුවෙන් වෙන් කළ පිටුව වෙත මගේ දෙනෙත් ද යොමු කළෙමි. ඇය අවුරුද්ද පුරා සෑම මාසයකම අලුත් ඇඳුමක් හෝ දෙකක් මස්සවා ගෙන ඇති බැව් අපි දුටුවෙමු. ඇගේ සිතේ එකම සතුට වන්නට ඇත්තේ, අලුත් ඇඳුම් තමා සතුකර ගැනීම වන්නට ඇතැයි මට සිතිණ.

"මෙහෙම මුදලක් ගෙවීමට ඇති බව, ඔබ හැරිස් මහත්මයාට මතක් කළාද?"

"අවමඟුලේ කටයුතු ඉවරවෙලා සති දෙකක් පමණ යනතුරු, මං කිසිවක් කිව්වේ නෑ. ඊට පස්සේ තමයි මේ ගැන මං ඔහුට මතක් කළේ. එහෙම කිව්වාම ඔහුට තරහ ගියා"

"මොනවා?"

"ඔව් මහත්මයා. ඔහු හරි අකරුණාවන්ත පුද්ගලයෙක්. තමන්ගෙ බිරිඳ බොහොම තැන්වලට ණයවෙලා ඇති බව ඔහු කිව්වා. මේ ඇණවුම් කර තිබෙන්නේ ඔහුගේ අවසරය නැතුව නිසා, ණය ගෙවීම ගැන හුඟක් කල්පනා කරල බලන්න වෙනවා කිව්වා. ඔහු කථා කළේ තමන්ගේ මියගිය බිරිඳට බොහොම අගෞරව වෙන පිළිවෙළට."

- "මෙහි තිබෙන කරුණු කිහිපයක් සටහන් කර ගැනීමට මට සිදුවෙනවා කෙන්ට් මහත්මිය." හෝම්ස් කීය. "ඒ ගැන ඔබේ විරුද්ධත්වයක් නැහැ නේද? මේ ගෙවීම් ඉක්මනින් අවසන් කිරීමට අපි සම්පූර්ණ උත්සාහය යොදනවා."

"ඔබට ස්තුතියි මහත්මයා" ඇය කීවාය. මීළඟට ඇයගෙන් සමුගෙන අපි පිටත්වී ආවෙමු.

"හැරිස් මහත්මිය ඇගේ ඇඳුම් පැළඳුම් වලට අධික ලෙස වියහියදම් කරල වගෙයි. එහෙම නේද හෝම්ස්?" මා ඇසුවේ අප මහාමාර්ගයට පිවිසි පසුවය.

"ඒ වගේ තමයි පෙනෙන්නෙ. කොහොම වුණත් අපි ගිහින් ඇයවත් දැක ගත්තොත් තමයි මේ විමසීම සම්පූර්ණ වෙන්නෙ!" මගේ මිත්‍රයා කිවේ මා මවිතයට පත් කරමිනි. "අපි යමු සොහොන් බිමට"

දෙව්මැඳුරට අයත් සොහොන් බිම සුපුරුදු ලෙස ගේට්ටුවකින් වසා තිබිණ. අපි සොහොන් පල්ලාගෙන් විමසා බැලුවෙමු. හැරිස් මහත්මිය මිහිදන් කරනු ලැබුවේ, සොහොන් බිමේ ඈත කෙළවරේ බැව් ඔහු පැවසීය. මීළඟට අප සමග පැමිණි ඔහු එතැන පෙන්වා දුන්නේය. සිමෙන්තියෙන් ඉදිකළ ඵලකයක් මත, තොරතුරු සටහන්ව තිබිණි. ඇය උපන් හා මියගිය දිනයන් සමග සුපුරුදු ලෙස දේව ධර්ම පාඨයක් එහි විය.

සොහොන පෙන්වා දුන් එහි භාරකරු අප එහි සිටියදී ආපසු ගියේය. සටහන් පොත අතට ගත් හෝම්ස් ඵලකයේ වූ කරුණු සටහන් කරගත්තේය.

"දැන් ඉතින් ආපහු බේකර් වීදියට යමු වොට්සන්. මේක පයිප්ප දෙකක් හෝ තුනක් බොමින් කල්පනා කළ යුතු ගැටලුවක්"

අපේ නිවහනට පැමිණි පසු ඔහු කළේ, පයිප්පය ද දල්වා ගෙන තම සුවපහසු හාන්සි පුටුවේ දිගාවීමය.

ආපසු නිවහනට පැමිණි පසු, මම සීනුව නාදකොට තේ ඇණවුම් කළෙමි.

"හෝම්ස් මට පෙනෙන්නෙ මෙහෙමයි. ඔබේ උපකල්පනය අනුව ඔබ හිතන්නේ, හැරිස් මිනීමැරුමක් කරල කියල නේ. නමුත් ඔහු ඒක කරල තියෙන්නේ කාටවත් අල්ලා ගන්න බැරි විදියට. ඔහුට විරුද්ධව නඩු පවරන්න බැරි විදියට. මං කියන දේ නිවැරදිද?"

තම පයිප්පයට දුම්කොළ පුරවාගෙන, හෝම්ස් කල්පනා කරමින් සිටියේ නොනවත්වාම දුම් ගුළි පිටකරමිනි. මගේ ප්‍රශ්නයට එක්වරම ඔහුගෙන් පිළිතුරක් නොලැබිණි. "මේක හැම අතටම පැටළුණු මහා ගැටලුවක්. නමුත් ඒ අවුල ලිහාගන්න පුළුවන් ක්‍රමයකුත් තියෙන්න ඕන"

දවසේ වැඩ කටයුතුවලින් විඩාපත් වී සිටි මම, තේ කෝප්ප දෙකක්ම පානය කළෙමි. එහෙත් තේ පෝච්චිය දෙසවත් නොබැලූ මගේ මිත්‍රයා එක දිගට පැයක පමණ කාලයක් නිහඬව කල්පනා කළේය. අන්තිමේදී ඔහු මා ඇමතුවේය.

"මෙහෙමයි වොට්සන්. මේ ප්‍රශ්නය විසඳාගත හැකි ක්‍රම තුනක් ගැන විතරයි මට හිතන්න පුළුවන්. හෙට අපට පුළුවනි එයින් එකක් අත්හදා බලන්න. ඔබ එනවද මා සමග යන්න?"

මා බලාපොරොත්තු වූයේ පසුදා උදෑසනින්ම පිටත් වී යාමටයි. එහෙත් මගේ මිත්‍රයාගේ අදහස වූයේ අනෙකකි.

"නෑ වොට්සන්. අපි දවල් කෑමෙන් පස්සෙ පිටත් වුණා නම් ඇති. මට කරන්න තියෙන සමහර පරීක්ෂණ සඳහා, වඩාත් යෝග්‍ය වෙන්නෙ දීප්තිමත් ඉරු එළිය නෙමෙයි; මඳ අඳුර."

එදා අපර භාගයේ අපි කුලීරියක නැගී බ්‍රික්ස්ටන් වෙත ගියෙමු. එහි මහ මඟ අසල වූ තරමක් ලොකු ගොඩනැගිල්ලක් ඔහු පෙන්වා සිටියේය. "බ්‍රික්ස්ටන්හි විද්‍යාත්මක හා සංස්කෘතික ආයතනය" ඔහු කීය. "ගිය අවුරුද්දේ ඔවුන් මාව කැඳෙව්වා ඔවුන්ගේ වාර්ෂික විද්‍යාත්මක දේශනයට. අපරාධ පරීක්ෂණයේදී යොදා ගත යුතු නිරීක්ෂණ හා උපකල්පන යන මාතෘකාවෙනුයි මං ඒ දේශනය කළේ. මං හිතන්නේ ඔවුන්ගේ පුස්තකාලය හා කියවීම් ශාලාව පරිහරණය කරන්න ඔවුන් ගෙන් මට අවසර ලැබේවි.

හෝම්ස්ට අවශ්‍ය වී තිබුණේ කිසිවෙකු හවුල් කර නොගෙන, තම පරීක්ෂණය නිහඬව කිරීමටයි. එහෙත් ඔහු දුටු විගස ආයතනයේ ලේකම්වරයා කථාකළේ ඇඩි උද්‍යෝගයකිනි.

"ඔබ දකින්න ලැබීමත් ලොකු සතුටක් හෝම්ස් මහත්මයා. ඔබ වගේ කෙනෙකුට අපේ සම්පූර්ණ සහයෝගය දෙන්න අපි ඕනෑම වෙලාවක සූදානම්. මේ පැත්තෙන් එන්න" ඔහු අප කැඳවාගෙන ගියේ ගොඩනැගිල්ලේ පිටුපස කොටසේ වූ පුස්තකාලය වෙතයි. "හෝම්ස් මහත්මයා. ඔබ මොකක් හරි අපරාධ පරීක්ෂණයක යෙදෙනවද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා," හෝම්ස් කීය. "නමුත් මේ වෙලාවෙ ඒ ගැන තොරතුරු නිදහසේ ඔබට කියන්න මට හැකියාවක් නෑ. දැනට මට උවමනා කරන්නේ පහුගිය කාලයේ පුවත්පත්වල පළවුණු අවමඟුල් දැන්වීම් සෝදිසි කරන්න"

"අනේ දෙවියනේ!" ලේකම්වරයා කීය. "එහෙනම් ඔබ හොයන්නේ මිනීමැරුමක් ගැන වෙන්න ඇති"

"එහෙම වෙන්නත් පුළුවනි. නොවෙන්නත් පුළුවනි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "දැනට මම මේ කරන්නේ සමීක්ෂණයක් කියන්න පුළුවනි"

"මට තේරෙනවා. මට තේරෙනවා. මෙන්න මෙතැන තියෙනවා ටයිම්ස් පුවත්පතේ පසුගිය කලාප. ඔබට පුළුවනි අවුරුදු ගණනක් ආ පස්සට වුණත් ගිහින් බලන්න" ඔහු පැවසුවේ ආරක්ෂිත ලෙස බැඳ තිබූ පුවත්පත් රාක්ක පෙන්වමිනි.

මෑත කාලයේ පුවත්පත් වෙළුම අතට ගත් මගේ මිත්‍රයා එය පෙරළා බැලීමට පටන් ගත්තේ අසුනක හිඳගනිමිනි. ලේකම්වරයා එතැනින් ඉවත්ව නොගොස් ඒ අසල රැඳී සිටියේය. ඒ මගේ මිත්‍රයාගෙන් අපරාධ පරීක්ෂණය ගැන ආරංචියක් ලබා ගැනීමේ අරමුණෙන් විය යුතුයි. පුවත්පත් සෝදිසිය තමනට නිදහසේ කර ගැනීමට ඉඩ දෙන මෙන් හෝම්ස් ඉල්ලා සිටියේ නැත. ඔහු ඒ වෙනුවට කළේ ලේකම්වරයා සාමාන්‍ය කතාබහකට අල්ලා ගැනීමයි.

"පරණ පත්තරවල අවමගුල් දැන්වීම් පිටු පෙරළා බලන්න නම්, කවුරුවත්ම එන්නෙ නැතුව ඇති මං හිතන්නෙ?" හෝම්ස් ඇසීය.

"ඒ තරම් පිරිසක් එන්නෙ නැති බව නම් ඇත්තයි මහත්මයා. ඒ වුණත් නොවරදවාම එන කෙනෙක් ඉන්නවා. ඒ තමයි නගරයේ වෙළඳසලක් අයිති ෆ්‍රැන්ක් හැරිස් මහත්මයා. එයාට අයිති පෞරාණික සහ අරුමෝසම් බඩු වෙළඳසලක් තියෙනවානෙ. ඔහු බලාගෙන ඉන්නෙ ඒ විධියෙ බඩු අයිති කෙනෙකුගේ අවමගුල් දැන්වීම දකින්න. එහෙම එකක් දැක්ක ගමන් වහාම ගිහින් ඒ පවුලේ ඥාතීන් හමුවෙනවා. මියගිය පුද්ගලයාගෙ පෞරාණික බඩුවලට මිල ගණන් ඉදිරිපත් කරලා, ඒව මිලට ගන්නේ අනික් කාටත් කලින්. ඒකත් හරි අපූරු රස්සාව"

"ඇත්ත තේන්නම්" හෝම්ස් කීවේ අමුත්තක් නොපෙන්වා හිස සොලවමිනි. හැරිස්ගේ නම එක්වරම අනපේක්ෂිත ලෙස අසන්නට ලැබුණු කල, මගේ සිතේ ඇතිවූයේ චකිතයකි.

"අප යන මාර්ගයේම ඔහු අපට ඉදිරියෙන්!" මම කැලඹුණු බවක් නොපෙන්වා මගේ මුහුණ සඟවා ගතිමි. අන්තිමේදී ලේකම්වරයා එතැනින් ඉවත්ව ගියේය.

හිස ඔසවා බැලූ මට දකින්නට ලැබුණේ හැරිස් මහත්මිය මියගිය මාසයේ අවමගුල් දැන්වීම්, හෝම්ස් පරීක්ෂා කරමින් සිටි ආකාරයයි. ඔහුගේ ඒ සෝදිසියේ අරමුණ කුමක් දැයි මට සිතා ගැනීමට නොහැකි විය.

"ඇයි හෝම්ස්, හැරිස් මහත්මියගෙ මරණය සිදුවුණු දිනය අපි දන්නවනේ" මම කීවෙමි. "හැරිස් වගේ සුළු වෙළෙන්දෙක් එයාගෙ

බිරිඳගේ අවමගුල් දැන්වීම ටයිම්ස් වගේ ඉහළ පෙළේ පුවත්පතක පළ කරාවි කියල හිතන්න අමාරුයි නේද?"

"ඔබ කියන කාරණාවක් ඇත්ත තමයි වොට්සන්. නෑ මං මේ අවමගුල් දැන්වීම් කියවලා බැලුවෙ, මේ පළාතෙ තවත් කවුරු හරි මියගිහින් තියෙනවද කියල...... ඔහුට අරුමෝසම් බඩු මිලට ගන්න පුළුවන් විදියට කවුරු, හරි වයසක කෙනෙක්....... ආ මේ ඉන්නෙ....... එඩ්විනා ඈෂ්ලි ආර්යාව...... ශ්‍රීමත් විලියම් ඈෂ්ලිගේ ඥාති දියණිය. හැබැයි එච්චර වයස නැහැ. ඇය මියගිහින් තියෙන්නේ වයස අවුරුදු හතළිස් දෙකේදි. මරණයට හේතුව මෙකෙ සඳහන් වෙලා නැහැ. ඔවුන් පදිංචි මන්දිරය තියෙන්නෙත් බ්‍රික්ස්ටන් කන්දේ"

ඔහු කියවමින් සිටි අවමගුල් දැන්වීම වෙත මගේ අවධානය යොමු කළෙමි. "ඇය මිය ගිහින් තියෙන්නේ හැරිස් මහත්මිය මියයන්න දින කිහිපයකට කලින්. මං හිතන්නෙ නෑ මේ ඉහළ පෙළේ පවුලක් සමග, හැරිස් පවුලෙ කිසිම සම්බන්ධ කමක් ආශ්‍රයක් තිබුණා කියල. ශ්‍රීමත් විලියම්ල ආදිපාදවරු සමගත් ඥාති සම්බන්ධකම් තියෙන අයනේ"

"කවුද දන්නෙ වොට්සන්. මොකක් හරි සම්බන්ධකමක් තිබෙන්න ඉඩ තියෙනවා. අපි ආපහු සොහොන් පිට්ටනියට යමු."

අපි සොහොන් පිටියේ ඉදිරියට ඇවිද ගියෙමු. හිරු බැස යාමත් සමග ඇඳිරි වැටීම ඉක්මන් වී තිබිණ. ඈෂ්ලි පවුලට අයත් සොහොන් ගැබ ඉතා විශාල එකක් විය. එබැවින් එය සොයාගැනීමද අපට අපහසු නොවිණි. සොහොන් ගර්භයට පිවිසීමට තිබූ දොරටුව අවහිර කර තිබුණේ ලෝකඩ ගේට්ටුවකිනි. කාලයත් සමග එය කොළ පැහැයට හැරී තිබිණ. කබා සාක්කුවෙන් තම කාචය අතට ගත් මගේ මිත්‍රයා, පහත් වී එම ගේට්ටුවේ අගුළ පරීක්ෂාවට ලක් කළේය. අන්තිමේදී ඔහු කෙළින් සිට ගනිද්දී ඔහුගේ මුහුණේ මතුවූයේ තෘප්තියට පත් සලකුණුය.

"අගුළ වටේටම සීරීම් සලකුණු. මං බලාපොරොත්තු වුණු විදියමයි"

"ඒ කියන්නේ සොහොන් ගැබට පිට කෙනෙක් හොරෙන් ඇතුළුවෙලාද? ඒ මොන උවමනාවකටද?"

"ඈෂ්ලි ආර්යාවත් හැරිස්, මහත්මියත් දෙදෙනාම එකම වයසේ අය" හෝම්ස් කීය. "ශරීරයේ පෙනුමෙනුත් සෑහෙන තරම් සමාන කමක් තියෙන්න ඇති. මේ කපටි මිනිහා හැරිස්, මෘත ශරීර දෙක

මාරු කරලා. මළ සිරුර හඳුනාගැනීම ඇගේ ඥාතියෙකු විසින් අත්‍යවශ්‍යයෙන්ම කළයුතු කටයුත්තක්. ඒක හදිසි මරණ පරීක්ෂකවරයා කරන නියෝගයක්. නමුත් හැරිස් මහත්මිය ගේ ඥාතීන් ඉන්නේ ප්‍රංශයේ. ඒ කිසිම කෙනෙකුට දැනුම් දීමක් කෙරුණෙත් නෑ. ඒ නිසා ඔවුනට එන්න ලැබුණෙත් නෑ. ඉතින් මියගිය තැනැත්තියගේ සැමියා තමයි මළසිරුර හඳුනාගෙන, මේ එමිලි ඩුබොයි හැරිස් මහත්මිය බව සහතික කළේ. නමුත් පශ්චාත් මරණ පරීක්ෂණය කළේ ඇයට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා වුණා නම් හැම දෙයක්ම හෙළිවෙනවා. ඒ නිසා ඒ සුපුරුදු පවුලේ වෛද්‍යවරයා නිවාඩු යනතුරු හැරිස් බලා සිටියා. පශ්චාත් මරණ පරීක්ෂණය කළේ ඇයට කවදාවත් ප්‍රතිකාර කර නොතිබුණු ගේබ්‍රියල් තොම්සන්"

"සැබෑ හැරිස් මහත්මියගේ මළසිරුරට ඔහු මොකක් කළාද දන්නෙ නෑ"

"මට නම් හිතෙන්නේ එය ඇත්තෙ එඩ්විනා ඈෂ්ලි ආර්යාවගේ මිනීපෙට්ටියේ. ඒකට කාරණා දෙකක් තියෙනවා. එකක් අල්ලපු වත්තේ හිටියේ හැරිස් මහත්මියගේ මිතුරිය - ක්ලාක් මෙනෙවිය. තවත් අසල්වාසීනුත් ඉන්නවා. හැරිස් තමන්ගෙ වත්තෙ පිටුපස ලොකු වළක් හාරලා ඇගේ මළසිරුර වළ දැම්මා කියල හිතමු. ඔහුගේ ඒ කැණීම් වෙත කාගෙ හරි අවධානය යොමුවෙන්න ඉඩ තියෙනවා. විශේෂයෙන්ම වෙනත් ගෙදරක උඩු මහලට එය පෙනෙන්න පුළුවනි. අනික මළසිරුරක් සැඟවීමට සොහොන් ගර්භයකට වඩා හොඳ තැනක් කොයින්ද?

මේක ක්ෂණික කෝපය නිසා සිදු කළ ඝාතනයක් නෙමෙයි වොට්සන්. ඔහු මෙය සැලසුම් කරන්න ඇත්තෙ හුඟ කාලයක ඉඳල. පවුලේ වෛද්‍යවරයා ඔහුගේ වාර්ෂික නිවාඩුව ගන්නෙ එකම කාලයක. ඊළඟට මේක ජනාකීර්ණ පළාතක්. එමිලි හැරිස්ගේ වයසේම කාන්තාවක්, ස්වාභාවික හේතූන් නිසා මරණයට පත්වන තුරුයි, ඔහු බලාගෙන ඉන්න ඇත්තෙ. ඊට පස්සෙ බිරිඳ ඝාතනය කරලා, ඇගේ මළසිරුර රාත්‍රියේම සොහොන් පිටියට ගෙන යනවා. කොහොමද? අත් කරත්තයේ පටවලා. ඊළඟට ඈෂ්ලි ආර්යාවගේ මිනිය කරත්තයෙන් ගෙදර අරගෙන එන්නෙ, තම බිරිඳගේ මළ සිරුර එහි තැන්පත් කරලා.

මරණය සිදුවුණ දිනය හා වෙලාව ගැන යමක් නිශ්චිතව කීම වෛද්‍යවරයාට අපහසු වෙන්න, ඔහු රහසේම ගෙදරින් පිටවී ගිහින්, ආපහු එන්නෙ දින දෙක තුනකින්. එතකොටයි ඔහු කියන්නේ තමන් නැති අතරේ බිරිඳ මියගොස් ඇති බව.

අපි ආපසු හැරුණෙමු. සොහොන් බිම මායිමේ වවා තිබූ විලෝ තුරු සෙවණේ කිසිවෙකු අප දෙස බලා සිටියා යයි මට සිතිණ. ඒ ගැන මගේ මිත්‍රයාගේ අවධානය යොමු කිරීමට ඔහුගේ කබා අතෙන් ඇද ඒ දෙස බැලීමි. එවිට එතැන කිසිවෙකු නොවීය. අඩ අඳුරේ මා දුටු ඡායාව කුමක්ද? සමහර විට ඒ තම ඥාතියෙකු ගේ සොහොන වෙත ගෞරවය පුද කිරීමට පැමිණි අයෙකු විය හැක.

"සොහොන් පිටියේ එක මායිමක් ගෝඩන් උද්‍යානය" හෝම්ස් කීය. "බලන්න ඒ පැත්තෙන් එන කෙනෙකුට එන්න තවත් ගේට්ටුවක් තියෙනවා. තාර දමාපු පාරක් නොමැති නිසා වැඩිය පාවිච්චියට ගන්නෙ නෑ වගෙයි. ඒ පැත්තෙ පොළොව වල් බිහිවෙලා. අපි යමු ඒ පැත්තෙන්. ඒ වුණත් වොට්සන් පරෙස්සමෙන්........ බිම තිබෙන හෝඩුවාවන් උඩින් අඩිය තියන්න එපා"

"මොනවද බිම තියෙන්නෙ?"

"මේ අඳුරේ නම් මොකුත්ම දකින්න අමාරුයි. ෂෑ ලන්තෑරුම අරගෙන එන්න මට මතක්වුණේ නැහැනෙ."

"මේ කිට්ටුව මල්ශාලා කීපයක් තියෙනවා" මම කීවෙමි. "ඔවුන් ළඟ නම් හොඳ ලන්තෑරුම් ඇති. එකක් ඉල්ලා ගන්න බැරි වෙන එකක් නෑ"

"වොට්සන් ඔතන ඔහොමම ඉන්න. මං ගිහින් එකක් ඉල්ලාගෙන එන්නම්"

මිනිත්තු කිහිපයකින් මගේ මිත්‍රයා එතැනට පැමිණියේ ජයග්‍රාහී ලීලාවෙනි. දීප්තිමත් එළියක් විහිදූ ලොකු ලන්තෑරුමක් ඔහු අතේ විය.

"මේ බලන්න වොට්සන්. මේ රෝද දෙකක සලකුණු. මොනවද ඔබට මේ ගැන කියන්න පුළුවන්?"

"අත් කරත්තයක සලකුණු!"

"හරියට හරි වොට්සන්. ඔබට හඳුනාගන්න පුළුවන්ද කරත්තය මෙතැනට ආව සලකුණු සහ පිටවී ගිය සලකුණු? අන්න හරි. මං ඔබට කලින් කියල දීල තියෙනවා ඒක. කරත්තය ඇවිත්

තියෙන්නෙත් ලොකු බරක් පටවාගෙන. පිටවී ගිහින් තියෙන්නෙත් ඒ වගේම බරක් පටවාගෙන. රෝද සලකුණු පස තුළට කැපී ඇති ආකාරයෙන් අපට පුළුවනි ඒක තේරුම් ගන්න. දැන් යමු සොහොන් ගැබ තියෙන තැන කැලෑරෝද ළඟට.

මෙතැන ඔහුගේ පා සලකුණු හුඟක් ගැඹුරට වැදිලා; එක පිට එක කිහිපවාරයක්ම. මොකක්ද ඒකෙන් ඔබ තේරුම් ගත්තෙ?"

"කළ කටයුත්ත මොකක් වුණත්, එය බාන්න සහ පටවන්න ඔහු ලොකු මහන්සියක් දරල තියෙන බවයි මං හිතන්නෙ" මම කීවෙමි.

"විශිෂ්ටයි වොට්සන්. අන්ධකාර වෙලාවෙ මළසිරුරු බාන එක සහ පටවන එක ඔහුට සෑහෙන්න අමාරු වෙන්න ඇති."

තම කබා සාක්කුවෙන් ටේප් පටියක් ගත් හෝම්ස් රෝද සලකුණු දෙක අතර දුර ප්‍රමාණය මැන සටහන් කර ගත්තේය. ඊට අමතරව එහි තිබූ අඩි සටහන්වල චිත්‍රයක් සහ ප්‍රමාණ ද ලකුණු කර ගත්තේය.

"දැන් ඉතින් මං කැමතියි, මේ අත් කරත්තය නවත්වා තිබෙන විටේකර්ගේ වැඩ පොළට ගිහින් එය පරීක්ෂාකර බලන්න" හෝම්ස් කීය. "මේ ලන්තෑරුම ආපහු භාරදීල යමු"

"හෝම්ස් අපි යන ගමන් ක්ලාක් මෙනෙවිය හමුවෙලා යමු"

"ඒ මොකටද?"

"අපේ පරීක්ෂණය ඉතා සාර්ථක ලෙස අවසන්වෙමින් තිබෙන බව ඇයට දැනුම් දෙමු. ඒ කාරණය ඉක්මනින් දන්වා සිටින එක ඇයට සැනසීමක් වේවි. ඇය ගැටලුවලට තනිව මුහුණදෙන කෙනෙක් නේ"

"ඔබේ කැමැත්තක් වොට්සන්. නමුත් අපි හොයාගත් තොරතුරු ගැන වත් හැරිස් ගැන වත්, කිසිවක් හෙළිකරන්න එපා. මං යනවා විටේකර්ගේ වැඩපොළට. පැය භාගයකින් අපි එතැනට හැරෙන පාර ළඟදි හමුවෙමු"

එසේ හමුවන බවට පොරොන්දු වී මම ක්ලාක් මෙනෙවිය පදිංචිව සිටි නිවස දෙසට පිටත්වී ගියෙමි. විද්‍යාත්මක හා සංස්කෘතික ආයතනය පසු කරද්දී මට ඉස්සරහට හමුවූයේ, එම ආයතනයේ ලේකම්වරයායි. ඔහු දවසේ වැඩ කටයුතු අවසන් කොට තම නිවස බලා ආපසු යමින් සිටියේය.

"ආ....... වොට්සන් මහත්මයා .... කොහොමද ඔබ දෙදෙනාගේ පරීක්ෂණය සාර්ථකද?"

"ඔව්....... තරමක් දුරට" මම කීවෙමි. "තවත් ටිකක් තියෙනවා සම්පූර්ණ කරන්න"

"අහන්නත් සතුටුයි" ඔහු කීය. "ෂර්ලොක් හෝම්ස් මහත්තයා මෙහේ ඇවිත් පරීක්ෂණයක් කරන බව, මං හම්බවුණු හැමෝටම කිව්වා. කවුරුත් හාර හාර විස්තර අහනවා.

මං ඔබට කිව්ව නේද අර හැරිස් කියල මහත්තයෙක් ගැන? අර පෞරාණික බඩු, අරුමෝසම් බඩු වෙළෙන්දා? එයා අද තමන්ගේ සාප්පුව කලින්ම වහලා, පත්තරවල අවමඟුල් දැන්වීම් බලන්න ආවා. පරණ පත්තර වෙනදා තබන තැන නැතුව, මේසය උඩ මොකද කියලා ඔහු විමසුවා. මං කිව්වා මිනීමැරුමක් ගැන පරීක්ෂණයකට සුප්‍රසිද්ධ ෂර්ලොක් හෝම්ස් මහත්තයා මෙහේ ඇවිත්; ඔහු තමයි පුවත්පත් පෙරළා බැලුවෙ කියලා.

ඊළඟට ඔහු අහනවා ඔබ දෙදෙනා කොහේටද ගියේ; මිනීමැරුමට ලක්වෙලා තියෙන්නෙ කවුද; අපරාධකාරයා කවුරුත් කියලද ඔබ දෙදෙනා අනුමාන කරන්නෙ? ආදී ප්‍රශ්න. මට කියන්න පුළුවන් වුණේ ඔබ දෙදෙනා සොහොන් පිට්ටනිය පැත්තට ගිය බව විතරයි......."

මෙය ඇසූ මම දැඩි තැතිගැනීමකට පත්වීමි. අප නොදැනුවත්වම අපරාධකාරයා, අප පසු පස පැමිණ ඇත! එක මිනියක් මැරූ ඔහුට, තවත් දෙදෙනෙකු මරා දැමීම අපහසු නොවේ. ලේකම්වරයා ගැන අමතක කර දමා වහාම ආපසු හැරුණෙමි. මීළඟට මා කළේ හෝම්ස් යන බව පැවසූ දිශාවට දිව යාමයි. විටේකර්ගේ වැඩපොළට යා හැකි ආකාරය, මඟදී හමුවූ දෙතුන් දෙනෙකු ගෙන් විමසුවෙමි. ඒ අනුව එම ස්ථානය සොයා ගැනීම අපහසු වූයේ නැත.

එහි දොර අඩක් විවෘතව තිබූ බව ඈතදීම දුටුවෙමි. මා පැමිණි දෙසට පිටුපස හරවා ගෙන, දොරේ විවෘත අඩ අසල සිටගෙන සිටියේ කවරෙක්ද? දකුණු අතේ තිබූ රිවෝල්වරය පිටුපසට කරගෙන අඩක් විවෘත දොරට ළංවී සිටියේ, අපරාධකරුවා වූ ෆ්‍රැන්ක් හැරිස්ය!

මගේ රිවෝල්වරය ගෙන ඒම මට අමතක වීම, මොන තරම් අවාසනාවක්ද? වැඩපොළ ඇතුළත සිටින්නේ නිසැකවම හෝම්ස් විය යුතු ය. ඔහු හැරිස්ගේ අත් කරත්තය සෝදිසි කරමින් සිටිනවා විය යුතුය. හෝම්ස් සිටිනවා ඇත්තේ හැරිස්ට ඉලක්කය තිවැරදිව

ගැනීමට අපහසු තැනක විය හැක. තම කටයුතු අවසන් කළ වහාම, මගේ මිත්‍රයා එතැනින් පිටවීම සඳහා දොර අසලට පැමිණෙනු ඇත. ගිනිඅවිය හෝම්ස් දෙසට එල්ල කොට වෙඩි තැබීමට, හැරිස්ට ගතවනු ඇත්තේ එක් ක්ෂණයක් පමණි!

මම ශබ්දයක් නොනැඟෙන සේ හැරිස් වෙතට ළංවීමි. මට කළ හැක්කේ කුමක්ද? මා අතේ තිබූ එකම ආයුධය එක් කෙළවරක් වක් වූ සැරයටිය පමණි. මම සැරයටිය ඉහළටම එසෙව්වෙමි. මීළඟට මගේ සම්පූර්ණ ශක්තිය යොදා, පිස්තෝලය අල්ලාගෙන සිටි හැරිස්ගේ අතට මරු පහරක් එල්ල කළෙමි. ගිනි අවිය බිම වැටී විසිවී යද්දී, හැරිස්ගේ මුවෙන් මර හඬක් නැඟිණ.

මීළඟට මම ඔහු වෙත කඩා පැන්නෙමි. ඒ ඔහු බිම පෙරලා ගැනීමේ අරමුණෙනි. එහෙත් එය සාර්ථක නොවීය. ඔහුගේ එක් අතක් මට අසුවුණ ද ඔහු අත ගසා දමා ඉවතට පැන්නේය.

"වොට්සන්! අල්ල ගන්න ඕකව! පැනල යන්න දෙන්න එපා!"

හෝම්ස් කෑගසනු ඇසිණ. හැරිස් පැන දුවද්දී අපි ඔහු ලුහුබැඳ ගියෙමු. අපට වඩා තරුණ වයසේ සිටි ඔහුට අපෙන් ගැලවී පැනයාම අපහසු නොවීය.

"මේ කළුවරේ ඔහුව කොහොමටවත් අල්ලා ගන්න අමාරුයි" මගේ මිත්‍රයා කීවේ හතිදමමින් නවතිමිනි. "ඔහු මේ පළාතේ පාරවල් සහ සැඟවිය හැකි තැන් හොඳට දන්නවා ඇති. ඔහු අල්ලාගන්නා කොටස පොලීසියට ඉතිරි කරමු. අපට දැන් තියෙන්නේ මීළඟට කළ යුතු රාජකාරි ගැන අවධානය යොමු කරන්නයි"

එමිලි හැරිස් මහත්මියගේ මරණය සැකසහිත බවත්, එඩ්විනා ඈෂ්ලි මෙනෙවියගේ මෘත ශරීරය සොරකම් කර ඇතැයි තමා සැක කරන බවත්, හෝම්ස් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත දන්වා යැව්වේය. ඒ මගින් එම මළසිරුරු යළි ගොඩගැනීමට නියෝගයක්, පළාතේ මහේස්ත්‍රාත් මගින් ලබාගැනීමට පොලීසියට හැකිවිය.

දින කිහිපයකට පසු එක් සැඳෑවක, බ්‍රික්ස්ටන් සුසාන භූමියේ, ඈෂ්ලි පවුලේ සොහොන් ගර්භය අසලට, කිහිප දෙනෙක් පැමිණ සිටියහ. ඈෂ්ලි පවුල නියෝජනය කරමින් ජෝන් බිෂොප් නම් මහත්මයෙකු, හැරිස් පවුලේ වෛද්‍යවරයා වූ දොස්තර මයිකල් බෙවන්, සොහොන් බිම භාර නිලධරයා, ලෙස්ට්‍රේඩ් සහ පොලිස් භටයන් තිදෙනෙකු සමග අපි එක්වූයෙමු.

සොහොන් බිම භාර නිලධරයා තම අත තිබූ යතුරු කැරැල්ලෙන්, ඈෂ්ලි පවුලේ සොහාන් ගැබට ඇතුළුවන ගේට්ටුව විවෘත කළේය. කම්කරුවන් සිව්දෙනෙකු විසින් ඈෂ්ලි මෙනෙවියගේ මිනීපෙට්ටිය ඉවතට ගන්නා ලදී. ප්‍රධානියාගේ නියමයෙන් ඔවුහු එහි සවිකර තිබූ ඇණ ගලවා විවෘත කොට, පියන පසෙකින් තැබූහ. එහි තිබුණේ මඳක් විරූපී වී ගිය, මැදිවියට ළං වූ කාන්තාවකගේ මළ සිරුරකි. කවුරුත් එතැනට ළං වී නෙත් යොමු කළහ. මිනී පෙට්ටියේ ඇතුළත සරසා තිබූ සුදුපාට සිල්ක් රෙද්දේ ලේ පැල්ලම් දක්නට ලැබිණ. පෙට්ටියේ එක් කෙළවරක තිබූ යමක් හෝම්ස් අතට ගත්තේය.

"මේ තමයි සුලු යුද්ධ භටයන්ගේ භයානක ආයුධයක - එනම් "නොබ්කෙරී" හෙල්ලේ ඉදිරි කොටස. මේක නොමැතිව ආයුධයේ අනෙක් කොටස අපට හමුවුණා එක්තරා මහත්මයෙකුගේ නිවසේ තිබිලා"

"පොලිස් පරීක්ෂක මහත්මයා" දොස්තර බෙවන් කීය. "මට පුළුවනි මේ තැනැත්තිය හඳුනාගන්න. නොයෙක් අසනීප සඳහා මා ඇයට වරින්වර ප්‍රතිකාර කර තිබෙනවා. ඇය තමයි බ්‍රික්ස්ටන් මහ වීදියේ එමිලි හැරිස් මහත්මිය"

"ඔබට ස්තූතියි දොස්තර මහත්මයා" කියූ ලෙස්ට්‍රේඩ් තම සටහන් පොත අතට ගෙන යමක් ලියූවේය. මීළඟට ඔහුගේ නියෝගය නිකුත් කළේ සොහොන් බිම භාර නිලධරයා වෙතයි.

"මීළඟට අපේ අවධානය යොමු කරන්නේ හැරිස් මහත්මිය භූමදාන කළා කියන ස්ථානය වෙතයි. ඇගේ සිරුර ගොඩට ගැනීමට මං උසාවියේ අවසර ලබාගෙන තියෙනවා. දැන් ඔබට පුළුවනි හැරිස් පවුලේ මිනීවළ හාරා ඒ මිනීපෙට්ටිය ගොඩට ගන්න. ඒ මිනී දෙකටම ඉන්ක්වෙස්ට් විභාග යළිත් පවත්වන්න කියලා අපි උසාවියෙන් නියෝගයක් ලබාගමු.

"ඉන්ක්වෙස්ට් විභාග යළිත් පවත්වන්න?" ජෝන් බිෂොප් මහතා කීවේ ඇඩි කැලඹීමකට පත් ස්වරයෙනි. "ඒකට අපට කොහොමටවත් එකඟ වෙන්න බැහැ මහත්මයා. එඩ්විනා ඈෂ්ලි ආර්යාව මියගියේ ස්වාභාවික හේතූන් නිසා. ඈෂ්ලි පවුල මුළු එංගලන්තයේම සුප්‍රසිද්ධ ප්‍රභූ පවුලක්. මිනීමරුවෙකු ඔහුගේ කටයුත්තට, ඈෂ්ලි පවුලේ මළ සිරුරක් යොදාගත්තා කියන කරුණ පවුලට විශාල නින්දාවක්. මෙය ප්‍රසිද්ධියට පත් නොකර සමථයකට පත් කර ගැනීමට ඔබ එකඟ විය යුතුයි."

"එතකොට අපරාධකාරයා මේ කාරණය තමාගේ වාසියට යොදා ගන්න ඉඩ තියෙනවා. මෙය උසාවියට ඉදිරියට ගෙන නොගොස් අපි කොහොමද ඔහුට දඬුවම් ලබා දෙන්නේ?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"මට පැය හතළිස් අටක කාලයක් ලබා දෙන්න" හෝම්ස් කීවේ ප්‍රශ්නයට මැදිහත් වෙමිනි. "අපි බලමු මේ කටයුත්ත සම්පූර්ණයෙන්ම රහසිගතව විසඳා ගැනීමට හැකිවේවිද කියලා."

කෙසේ වෙතත් ප්‍රශ්නය නොසිතූ ආකාරයට පහසුවෙන්ම විසඳිණි. අනෙක් මළසිරුර ගොඩට ගත් විට එය ඈෂ්ලි ආර්යාවගේ බැව් ජෝන් බිෂොප් මහතා විසින් හඳුනාගන්නා ලදී. තමාට ගැලවීමට මඟක් නොමැති බැව් අපරාධකාරයාට වැටහෙන්නට ඇත. මුලින් පලා යාමට තැත්කළත්, ඔහු-එදා රාත්‍රියේ තේම්ස් ගඟට පැන සිය දිවි හානි කරගත්තේය.

ඉන්ක්වෙස්ට් විභාග රහසේම පවත්වන්නට ඇති බවට සැක නැත. ශ්‍රීමත් විලියම් ඈෂ්ලි ගේ ඉල්ලීමක් අනුව, රාජ්‍යාරක්ෂක ලේකම් ශ්‍රීමත් ස්පෙන්සර් වෝල්පෝල් වෙතින්, හෝම්ස්ට ලිපියක් ලැබිණි. ඉදිරියට කළ යුතු දෑ ගැන හෝම්ස් ලෙස්ට්‍රේඩ්ට උපදෙස් දුන්නේ ඒ අනුවය. මේ අපරාධය ගැන කිසිදු තොරතුරක් පුවත්පත්වල පළ නොවිණි. තම මව සමග අප හමුවීමට පැමිණි රෙබෙකා ක්ලාක් මෙනෙවිය, හෝම්ස් වෙත තම ස්තුතිය පුද කළාය. අවුරුදු පනහක කාලයකට මේ පරීක්ෂණය පාඨකයා වෙත ඉදිරිපත් නොකළ යුතු බවට, මගේ මිත්‍රයා මා වෙත දැනුම් දුන්නේය. එබැවින් මෙම කථාව මම මගේ අතිශය රහසිගත ලිපිගොනුවේ තැන්පත් කරමි.

ආගන්තුකයා

I

"උණ හෙම්බිරිස්සාව කියන්නේ බොහොම අප්‍රසන්න දෙයක් බව ඇත්තයි" ෂර්ලොක් හෝම්ස් කීය. "ඒ වුණත් ඔබ හිතන ආකාරය නිවැරදියි වොට්සන්. ඔබේ බිරිඳගේ උදව්වෙන් දරුවාට ඉක්මනින් සුවය ලැබේවි"

"මාත් ප්‍රාර්ථනා කරන්නෙ ඒ දේම තමයි" මම පිළිතුරු දුන්නෙමි. ඒ වහාම මගේ දෙනෙත් ඔහු දෙසට හරවා මා බලා සිටියේ අතිශයින්ම විස්මයට පත්වය. තේ කෝප්පය මුවට ළං කරමින් සිටි මම, වහාම එය ආපසු මේසය උඩින් තැබීමි.

"හරි පුදුමාකාරයි හෝම්ස්!" මට කෑගැසිණි. "මගේ හිතේ ඇතුළෙම තිබෙන සිතිවිලිත් එළියට ගන්න ඔබ සමත් වෙලා. දෙවියන්ගෙ නාමෙන් කියන්න; ඔබ කොහොමද මේව දැන ගත්තෙ? දරුවා අසනීපයෙන් ඉන්නා බව ඇත්ත. නමුත් ඔබට ඒ ගැන එක වචනයක් කිව්වෙ නෑ කියල මට දිවුරන්න පුළුවනි. මං මෙහේට ආව එකෙන් ඔබට හිතාගන්න පුළුවනි, මගේ බිරිඳ ගෙදරින් පිටව ගිහින් බව. නමුත් ඇය ගියේ කොහේද, ඒ මොන උවමනාවකටද කියන එක, මං ඔබට කිව්වෙ නෑ. ඒ ගැන කිසිම හෝඩුවාවක් ඔබට ලැබෙන විධියට මං හැසිරුණෙත් නෑ"

මේ කතාබහ ඇතිවූයේ 1890 වසරේ නොවැම්බර් මාසයේ අවසන් සතියේ දවසකය. ශීත සෘතුවේ අනුකම්පා විරහිත ප්‍රබල ප්‍රහාරයක් ලන්ඩනයට එල්ල වී තිබිණි. නොනැවතී ගලා ආ මීදුමෙන් වීදි වැසී ගියේය. ගෑස් ලාම්පුවලින් විහිදුණු ආලෝකය පවා ඝන මීදුම මගින් ගිල දැමූ ආකාරයක් දිස්විය. වීදිවලට පා තැබූ කිහිප දෙනා පවා ඇවිද ගියේ අවතාර විලසිනි. මුහුණු හා හිස් මුදුන් ආවරණය කරගෙන, ඔවුන් පදික වේදිකා මතින් ඇවිද ගියේ මුහුණු පහතට යොමු කරගෙනය. අශ්ව කරත්ත වේගයෙන් ගමන් කළේ අශ්ව ගාල් වෙත යාමට උන්ගේ තිබූ නොඉවසිල්ල පෙන්වමිනි.

විසිත්ත කාමරයේ ගිනිඋදුන ඉදිරිපිටට වී එහි උණුසුම ලබමින් සිටීමට හැකිවීම ගැන මගේ සිතේ තිබුණේ සතුටකි. හෝම්ස්ගේ පයිප්පයට එදා යොදා තිබූ දුම්කොළ තිකුත් කළේ සුගන්ධයකි.

දින කිහිපයක් ගත කිරීම සඳහා මා බේකර් වීදියේ නිවහනට පැමිණෙන බව සඳහන් කොට, මා එවූ විදුලි පුවත මගේ මිත්‍රයාට ලැබී තිබිණ. එම දින කිහිපයේදී මගේ රෝගීන් ගැන බැලීම හිතවත් වෛද්‍ය ඇන්ස්ට්‍රුදර්ට පැවරීමට මට හැකිවිය.

මගේ හිතවත් මිත්‍රයා සම්පූර්ණ සුවය ලබන තුරු, ඔහු බලා ගැනීමට ද මට උවමනා වී තිබිණි. තමා මරණාසන්නව පණ අදිමින් සිටින බව කුරිරු සතුරෙකුට පෙන්වීමට, හෝම්ස්ට උවමනා වී තිබිණි. ඒ සඳහා ඔහු කළේ, සම්පූර්ණ දින තුනක් සහ රාත්‍රී තුනක් කිසිදු කෑමක් බීමක් නොගෙන, වතුර බිඳුවක් හෝ නොබී නිරාහාරව සිටීමයි. ඔහුගේ උපාය සාර්ථක විය. අපරාධකරු ස්කොට්ලන්ඩ්යාඩ් හි පරීක්ෂක මෝටන්ට අල්ලා දීමට හෝම්ස්ට හැකිවිය. එසේ වුවත් වතුර බිඳක් හෝ නොබී මේ අයුරින් දින තුනක් නිරාහාරව සිටීම, ඔහුගේ සෞඛ්‍යයට එල්ල කළේ දරුණු පහරකි. එබැවින් ඔහු සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත්වන තුරු, හෝම්ස් වෙත දැඩි අවධානයක් යොමු කිරීම යෙහෙකැයි මම කල්පනා කළෙමි.

තම පරණ පිටකබායකින් සැරසී සිටි මගේ මිත්‍රයා හාන්සි පුටුවේ වැතිරී, තම දෙපා ගිනි උදුන දෙසට දිගු කරගෙන සිටියේය. එක් වරක් පැමිණ කේක් හා විස්කෝතු සහිත බන්දේසිය මේසය උඩින් තැබූ හඩසන් මහත්මිය, ඊළඟ වාරයේ තේ පෝච්චිය, කිරි ජෝගුව හා සීනි ගෙන ආවාය.

හෝම්ස් මා උණුසුම් ලෙස පිළිගත්තේය. මගේ පුපුරුදු අසුන ඔහු ඉදිරිපිටට ගෙන හිඳ ගත්තෙමි. මට දැනුණේ දීර්ඝ නින්දක, දීර්ඝ සිහිනයක් දැක අවදි වූ අයෙකුට දැනෙන පුදුමයට පත් හැඟීමකි. අග්‍රා නිධානයේ මුතු විකුණා ලැබුණු මුදලින්, කෙන්සිංටන්හි නිවසක් මිලට ගෙන, මේරි සමග විවාහ වී ගතකළ කාලය අවුරුදු දෙකකි. එම ගෙවී ගිය දෙවසර දැන් මට දැනුණේ සිහිනයක් විලසිනි. හෝම්ස් සමග එක්වී, අභිරහස් විසඳමින් අපරාධකරුවන් ලුහුබැඳයාමට, මගේ සිතේ කවදත් කැමැත්තක් තිබිණි. මා විසින් කළ යුතුව තිබුණේ විවාහ නොවී මගේ මිත්‍රයා සමග අපරාධ පරීක්ෂණ කටයුතුවල නිරත වීමයි.

"වොට්සන්. ඔබ මං දිහා බලන්නේ හරියට විජ්ජාකාරයෙකු දිහා බලන විදියට" හෝම්ස් කීවේ සිනාවක් ද සමගය. "එඩ්ගා ඇලන් පෝගෙ ප්‍රබන්ධ කියවීම, ඔබ අත්හැර දැමුවා කියලයි මට මතක"

"ඔබ අදහස් කරන්නේ ඩූපින් නම් රහස් පරීක්ෂකයා සිටින කථාද?"

"ඩූපින්ට වෙනත් කෙනෙකුගේ සිත ඇතුළෙ තිබෙන දේ කියවීමට හැකියාවක් තිබුණ නේ." හෝම්ස් කීය. "ඔවුන් සමග කතාබහ කරන්න උවමනා නෑ. ඔවුන්ගේ හැසිරීම හොඳට නිරීක්ෂණය කරනවා. ඇහිබැමක සෙලවීමක් වුණත් ඔහුට ප්‍රමාණවත්. ඒකෙන් හිත ඇතුළෙ තිබෙන දේවල් ඇදල ගන්නවා. ඔය ක්‍රියාවලියෙන් ඒ කාලෙ නම් මමත් විස්මයට පත්වුණා. ඒ වුණාට ඒක ගැන මගේ එච්චර පැහැදීමක් තිබුණෙ නෑ"

"ඒ ක්‍රමය හදාරන්න මං උනන්දු නොවුණු එකේ පාඩුවට තමයි මං දැන් මුහුණ දෙන්නෙ" මම කීවෙමි. "හෝම්ස්. ඔබට කවදාවත් හමුවෙලාවත් නැති කුඩා දරුවෙකු, අසනීපයෙන් ඉන්න බව ඔබ කියන්නෙ කොහොමද? මං කේක් සහ විස්කෝතු අනුභව කරන ආකාරයෙන්ද?"

"ඒක විතරක් නෙමෙයි. තවත් හුඟක් දේවල් කියන්න මට පුළුවනි." ඔහු කීය. "ඔබ දැන් ආවෙ හෝල්බෝන් ගුවන් පාලම ළඟ ඉඳල බව මට කියන්න පුළුවනි. ඔබ ගෙදරින් පිටවෙලා තියෙන්නෙ හරි කලබලයෙන්. එහෙම වුණත් අල්ලගන්න හිතාගෙන ආව දුම්රිය වැරදුණා. ඒකට හේතුව බාග වෙලාවට මේ දවස්වල ඔබේ ගෙදර වැඩට සේවිකාවක් නොහිටීම වෙන්නත් පුළුවනි."

"නෑ හෝම්ස්" මට කෑ ගැසිණ. "මට ඕක භාරගන්න බෑ"

"ඒ කියන්නෙ මගේ නිගමන වැරදිද?"

"නැහැ. නැහැ. ඔබ කියූ හැමදෙයක්ම නිවැරදියි. ඒ වුණත් කොහොමද.......?"

"ඒක බොහොම සරලයි වොට්සන්. ඒක නිරීක්ෂණය සහ ඒ මගින් නිගමනයන්ට එළඹීම. මං ඒක තේරුම් කරල දුන්නොත් ඔබ කියාවි: මේක හරි සුළු දෙයක් නේ. පුංචි ළමයෙකුට වුණත් පුළුවන් වැඩක් කියල"

"ඒ වුණත් ඔබ එය පැහැදිලි කර දිය යුතුමයි"

"මාව දකින්න එන්න තරම් ඔබ කාරුණික වුණා නේ. ඒ හින්දා ඔබේ නියෝගයට කීකරු වෙන්න ඕන කියලයි මට හිතෙන්නෙ." හෝම්ස් කීවේ ඇනුමක් අරිමිනි. "ඔබ මෙහේට එන්න හේතුවුණු

කාරණා වලින් අපි පටන්ගමු. මගේ මතකය නිවැරදි නම්....... අපි මේ ළංවෙන්නෙ ඔබේ විවාහයේ දෙවැනි සංවත්සරයට. එහෙම නේද?"

"හරියට, හරි හෝම්ස්. ඒ දිනය අනිද්දා"

"ඒ කියන්නේ මේක සාමාන්‍යයෙන් නම්, ඔබේ බිරිඳගෙන් ඔබ ඈත් ඈත්වෙලා ඉන්න යොදාගන්නා කාලයක් නෙමෙයි. ඔබ ඈත් ස්වල්ප වෙලාවකට පෙර මා එක්ක කිව්වා, දින කිහිපයක්ම මෙහේ නවාතැන් ගන්නා බව. ඒ කියන්නෙ ඔබේ බිරිඳ, දින කිහිපයක් ඔබෙන් ඈත්වෙලා ඉන්න තීරණය කරලා. ඇයි? මොකක් හරි නොවැළැක්විය හැකි බරපතළ ප්‍රශ්නයක් නිසා විය යුතුයි. මට මතකයි ඔබේ බිරිඳ ඒ දවස්වල මා එක්ක කියූ දෙයක්. ඇය ඉන්දියාවෙ ඉඳල එංගලන්තයට ආව කාලෙ, මේරිට නෑදෑයො යාළුවො කිසි කෙනෙක් මේ රටේ හිටියෙ නැහැ. සිසිල් ෆොරස්ටර් මහත්මිය තමයි මේරිට රැකියාවක් දුන්නෙ - ඒ තමන්ගෙ ළදරු පුතාට උගන්වන්න, ළදරු ගුරුවරියක් හැටියට. ඒ කාලෙදි නේද ඔබට ඇයව හමුවුණේ? ෆොරස්ටර් මහත්මිය තමන්ට උවමනා වෙලාවෙදි පිහිට වුණු සැබෑ මිත්‍රයෙකු බව මේරි කිව්වා. ඔවුන් දෙදෙනා අතර දිගටම සමීප මිත්‍රත්වයක් තිබුණු බව, මට හිතාගන්න අමාරු නෑ"

"ඔබ කියූ දේ සම්පූර්ණ ඇත්ත"

"එතකොට මේ වෙලාවෙ ඔබේ බිරිඳව ඔබ වෙතින් ඉවතට කැඳවාගන්නවා නම්, ඒ වෙන කවුද ෆොරස්ටර් මහත්මිය මිස? එවැනි හදිසි කැඳවීමකට හේතුව මොකක්ද කියල මං කල්පනා කළා. එතකොට එක්වරම මගේ හිතට ආවෙ මොකක්ද දන්නවද? මේ අසාමාන්‍ය අධික ශීතල සමග, කුඩා දරුවෙකු ගොදුරු විය හැකි රෝගය උණ සෙම්ප්‍රතිශ්‍යා රෝගයක්. ඒ වගේ තත්ත්වයකට පත්වුණු දරුවෙකුට, තමන්ගේ සෙනෙහෙබර ගුරුතුමිය තමා ළඟට එනවා තරම් වෙන සතුටක් කොයින්ද?"

"ඔව් ඔහුගේ නම රිචඩ්. වයස අවුරුදු නවයයි" මම කීවෙමි. "ඒ වුණත් ඔබ කොහොමද වෙනත් බරපතළ තත්ත්වයක් නැතුව, මේක සෙම්ප්‍රතිශ්‍යාව කියල කිව්වෙ?"

"එහෙම බරපතළ තත්ත්වයක් වුණා නම් ඔබ මෙහේ එන්නෙ නෑ වොට්සන්. ඔබ වෛද්‍යවරයෙකු හැටියට ඒ ගෙදරම රැඳී ඉඳගෙන ප්‍රතිකාර කරනවා"

"ඔබ තර්කානුකූලව කාරණා එකින් එක තේරුම් ගත් හැටි ඉතාමත් අලංකාරයි" මම කීවෙමි. "නමුත් හරියටම ඒ මොහොතෙදි මගේ සිතිවිලි තිබුණෙ ඔවුන් ගැන කියන කරුණ, ඔබ කොහොමද තේරුම් ගත්තෙ?"

"මගේ හිතවත් වොට්සන්. මං මෙහෙම කියනවට මට සමාවෙන්න. මට ඔබව පෙනෙන්නෙ, විවෘතව තිබෙන පොතක් වගෙයි. ඔබේ සෑම චලනයක් සමගම ඔබ පිටුවක් පෙරළනවා. ඔබ පුටුවේ හිඳගෙන තේ කෝප්පය තොල ගාමින් හිටියා. ඒ අතර ඔබේ දෙනෙත් යොමුවුණේ ඔය මේසය මත තිබෙන පුවත්පතට. එහි සිරස්තල දෙස බැල්මක් හෙළූ ඔබ, ඊළඟ මොහොතෙ පුවත්පත අනෙක් පැත්ත හරවලා තැබුවා. ඇයි? බාග වෙලාවට ඒ දින කිහිපයකට පෙර, කිංස්ක්‍රොස් දුම්රිය පොළේ ඇතිවුණු දුම්රිය අනතුර ඔබට සිහිවුණු නිසා. ඒ ගැන පරීක්ෂණය පැවැත්වී සිදුවුණු මරණ ගැන, අද පුවත්පතේ සඳහන් වෙලා තියෙනවා. මඳ වේලාවකට කලින් බිරිඳ දුම්රිය පොළට ගෙන ගිහිං ආව කෙනෙකු, කියවන්න කැමැති වෙන පුවතක් නෙමෙයි ඒක."

"ඇත්තෙන්ම ඔව්. ඒ ප්‍රවෘත්තිය කියවූ වහාම මට මතක්වුණේ, මගේ බිරිඳ මේ මොහොතෙ දුම්රියෙන් ගමන් කරන බව" මම එකඟ වූයෙමි. "නමුත් දරුවගෙ අසනීපය?"

"පුවත්පතෙන් පස්සෙ ඔබේ අවධානය යොමුවුණේ, මේසය ළඟ බිම තියෙන බුමුතුරුණ දෙසට." හෝම්ස් කීය. "ඒක දැකලා ඔබේ දෙතොලට සිනා රැල්ලක් නැගුණු හැටි, මං පැහැදිලිවම දුටුවා. ඒ දවස්වල ඔබ මෙහේ ඉඳිද්දී ඔබ රෝගීන් බලන්න යද්දි ගෙන යන වෛද්‍ය බෑගය, හැමවිටම තියන්නෙ ඔය බුමුතුරුණ මත ඔතනමයි. එතකොට ඔබට මතක්වුණේ බිරිඳ ගිය කාරණය"

"මේව ඔක්කොම අනුමාන කිරීම් හෝම්ස්." මම කීවෙමි. "උදාහරණයක් වශයෙන් ඔබ කිව්වා, හෝල්බෝන් ගුවන්පාලම ගැන. ඒකම කියලා ඔබ කොහොමද නිශ්චය කරන්නේ? ඇයි වෙනිං ඕනෑම දුම්රිය පොළක් වෙන්න බැරි?"

"ඔබ දන්නවානේ වොට්සන්. අනුමාන කිරීම් වලට මං කොහොමටවත් එකඟ නෑ. යම් යම් සිද්ධීන් රාශියක් සාක්ෂි මගින් අපට පෙන්වලා දුන්නාම, ඒවා එකට සම්බන්ධ කරන්න උපකල්පන අවශ්‍ය වෙනවා. ඒවා අනුමාන කිරීම් හැටියට හඳුන්වන්න බෑ. ෆොරස්ටර් මහත්මිය ජීවත්වෙන්නේ කැම්බර්වෙල්වල. ලන්ඩනයේ සිට වැතම් සහ ඩෝවර් බලා යන

දුම්රිය බොහොමයක්, හෝල්බෝන් ගුවන්පාලම දුම්රිය පොළෙන් ගමන් අරඹනවා. ඔබේ සූට්කේසය ඔබ දොර ළඟ තියල නො ආවත්, මගේ නිගමනවලට පැමිණීම අරඹන්න සුදුසුම තැන හෝල්බෝන්. මං මේ ඉන්න තැනට පැහැදිලිවම ඔබේ සූට්කේසයේ අලවා ඇති ලේබලය පෙනෙනවා. ඒ හෝල්බෝන්හි ගමන් බඩු තබා යන කාර්යාලයේ ලේබලය බව මට හඳුනාගත හැකියි."

"එතකොට ඉතිරි දේවල්?"

"ඔබේ ගෙදර වැඩට සේවිකාවක් නොමැති බව සහ, ඔබ කලබලයෙන් ගෙදරින් පිටත් වී ආ බවද? කලබලය වැඩි කම නිසා ඔබට අත්වැසුම් පළඳින්න අමතක වුණා. ඔබේ වම් කමිස අතේ ඇතුළු පැත්තේ තිබෙනවා, කළු සපත්තු පොලිෂ් තැවරීම නිසා ඇතිවුණු පැල්ලමක්. ඒකට හේතුව ඔබේ සපත්තු ඔබම ඔප දමා ගැනීම. කලබලය නිසා ඔබ ඒක කළේ නොසැලකිලිමත් අයුරෙන්......."

"මගේ කබාය භාරගත්තේ හඩ්සන් මහත්මිය. ඇයට මගේ අත්වැසුම් භාරදුන්නා වෙන්න බැරිද?"

"බැහැ. ඒ මොකද මං ඔබ සමග අතට අත දෙද්දී, ඔබේ දකුණතේ තිබුණේ ඇඩි ශීතලක්. ඇඳුම් වලින් සහ අනික් සෑම දෙයකින්මත් පිළිවෙළක් නොමැති කම පෙනුණා."

"ඔබ කියූ හැම දෙයක්ම නිවැරදි බව මං පිළිගන්නවා." මම කීවෙමි. "නමුත් එක දෙයක් නම් මට කොහොමටවත් හිතාගන්න බෑ. මගේ බිරිඳ යන්න හිතාහිටි දුම්රිය වැරදුණු බව ඔබ කොහොමද කිව්වෙ?"

"වොට්සන්. ඔබ මේ ගෙදර මේ කාමරයට ඇතුළුවුණු මොහොතෙම, ඔබේ ඇඳුම්වලින් හැමුවා එක්තරා සුවඳක්. ඒ කෝපි සුවඳ. එහෙම සුවඳක් ඇඳුම් වලට කාවදින්න පුළුවන්, ඔබ මඳ වේලාවකට පෙර කෝපි අවන්හලකට පිවිසී, එහි මිනිත්තු කිහිපයක් ගතකළා නම් පමණයි.

ඊළඟට මේකත් හිතන්න. ඔබ මෙහේ ඇවිත් මා එක්ක තේ බොන්න සැලසුම් කරගෙනයි හිටියේ. එහෙම තිබියදීත් ඇයි ඔබ හදිසියේ කෝපි බිව්වෙ? ඒකෙන් මට ගත හැකිවුණු නිගමනය මොකක්ද? ඔබේ බිරිඳ යායුතු දුම්රිය වැරදුණා. ඉතින් හිතුවාට වැඩි කාලයක් ඔබට දුම්රිය පොළේ රැඳෙන්න සිදුවුණා. ඒ ඇගේ මීළඟ දුම්රිය වෙලාව ළංවෙන තුරු. ඔබ මොකද කළේ? ඔබේ සූට්කේසය

ගමන්බඩු රඳවාගන්නා කාර්යාලයට භාරදීල, ඇය එක්ක කෝපි අවන්හලට ගියා. ඔබ ගියේ බ්‍රසීලියා කෝපිහලටද? එයාලගෙ කෝපි ඉතාම ප්‍රණීත බව මට අහන්න ලැබුණා."

මට සිනාව නවතා ගත නොහැකි විය. "හෝම්ස්" මම කීවෙමි. "නිරීක්ෂණ මගින් නිගමනවලට එන්න ඔබට තිබෙන ශක්තිය තවමත් තියෙනවා, කිසිම අඩුවක් නැතුව. ඔබ දින තුනක් නිරාහාරව සිටියා කියල, ඔබේ ඒ දක්ෂකම් කොහොමටවත් අඩුවෙලා නෑ......."

"....... බොහොම සරල දේවල් වොට්සන්. කොහොම වුණත්......." හෝම්ස් කථාව නැවැත්වූයේ, තරප්පු පෙළ නැග එන අමුත්තෙකුගේ පියවර හඬ ඇසීමෙනි.

"....... මට වැරදීමක් නොවෙයි නම්" ඔහු කීය. "අපට මේ ලැබෙන්න යන්නේ සිත් ඇදගන්නා සුලු රහස් පරීක්ෂණයක්."

හඩ්සන් මහත්මිය මෙවර පැමිණියේ අමුත්තෙකු ද කැඳවාගෙන ය. ඔහු අපේ විසිත්ත කාමරය තුළට පා තැබුවේ, රඟදැක්මකට සූදානම් වන නළුවෙකු වේදිකාවට පිවිසෙන ආකාරයටයි.

උසින් අඩි හයක් පමණ වූ උස් සිහින් සිරුරක් තිබූ ඔහුගේ, වයස අවුරුදු තිස් පහක් පමණ වන්නට ඇතැයි මම අනුමාන කළෙමි. රැවුළ සම්පූර්ණයෙන්ම මුඩුකොට තිබීම නිසාදෝ, මුහුණේ තිබුණේ සුදුමැලි පෙනුමකි. "ටේල් - කෝට්" නමින් හඳුන්වනු ලබන, දිගින් වැඩි කළු කබායක් හැඳ සිටි ඔහුගේ කලිසමද, ඉතා වටිනා රෙද්දකින් මසා තිබූ බැව් බැලූ බැල්මට පෙනිණ. සුදු පැහැති අත්වැසුම් ජෝඩුව එක් අතක තිබූ අතර, අනෙක් අතේ රිදී විල්ලක් සහිත සැරයටියක් විය. කළු පැහැති කෙස්වැටිය දිගින් මඳක් වැඩිවූ අතර, පුළුල් නළල් තලයෙන් පැවසුණේ මේ තැනැත්තා බුද්ධිමතෙකු බවයි. හඩ්සන් මහත්මිය අමුත්තාගේ ආගන්තුක කාඩ්පත හෝම්ස් වෙත භාරදුන්නාය. ඔහු ඊට ප්‍රතිචාර දක්වන තුරු අමුත්තා නිහඬව බලා සිටියේය.

"ඔස්කා ලැංකැස්ටර් මහත්මයා" හෝම්ස් කීය. "කරුණාකරල හිඳගන්න"

"කලින් වෙලාවක් වෙන්කර නොගෙන, මේ ආකාරයට පැමිණීම ගැන මට සමාවෙන්න මහත්මයා" අමුත්තා කීය. "මම පදිංචිවෙලා ඉන්නෙ කිංස්ටන්වල. අද මම ලන්ඩනයට ආවෙ වෙනත් උවමනාවකට. ඒ ගමන් මේ කිට්ටුව තිබෙන මගේ සමාජ ශාලාවට ගොඩවුණා. එතැනදී මට මගේ නීතිඥයා අහම්බෙන්

හමුවුණා. ඔහු දීර්ඝ කාලයක සිට මගේ හිතවතෙක්. මං මුහුණ දී ඇති ප්‍රශ්නය මං ඔහුට විස්තර කළා. එතකොට ඔහු තමයි කිව්වේ ඔබ හමුවෙලා ගැටලුව ඉදිරිපත් කරන්නට."

"ඔබේ ගැටලුවට අවධානය යොමුකිරීම මං සතුටෙන් භාරගන්නම් මහත්මයා" හෝම්ස් කීය.

"එතකොට මේ මහත්මයා?" අමුත්තා විමසුවේ මා දෙසට හැරෙමිනි.

"මේ දොස්තර ජෝන් වොට්සන්. මගේ සමීපම උපදේශකයා. මා වෙත දැනුම් දිය යුතු සෑම කරුණක්ම, ඔහු ඉදිරියේ පැවසීමේ වරදක් නෑ. ඒ මොකද පරීක්ෂණ කටයුතුවල අප දෙදෙනා යෙදෙන්නේ එකට."

"බොහොම හොඳයි. මගේ නම ඔස්කා ලැංකැස්ටර්. වෘත්තියෙන් මම කලාකෘති අලෙවි කරන්නෙක්. මගේ කලාගාරය තිබෙන්නේ ස්ටැන්මෝ උද්‍යානයේ. ඒ ලැංකැස්ටර් සහ ග්‍රීන්වුඩ් කලාගාරය. අපි මේ ව්‍යාපාරයේ හවුලේ යෙදිල ඉන්නෙ දැන් අවුරුදු හයක පමණ සිට. අපි විශේෂත්වයක් දක්වන්නේ 17 වැනි 18 වැනි ශතවර්ෂවල චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණවලට. නමුත් මේ 19 වැනි සියවසේ මුල් භාගයේ චිත්‍ර ශිල්පීන්ගේ සිතුවමුත් අපි මිලදී ගන්නවා, අලෙවි කරනවා. ගේන්ස්බ්‍රෝ රෙනෝල්ඩ්ස්, කොන්ස්ටබල් හා රූසෝ යන නම් ඔබට අහල හුරුපුරුදු ඇති. ඒවට තමයි මේ කාලෙ වැඩිම ඉල්ලුමක් තියෙන්නේ. අපේ ව්‍යාපාරය දියුණු වෙන බව අහන්න ලැබිලා, තවත් කලාගාර රැසක් අප සිටින ප්‍රදේශයේම, හතු පිපෙන්නා වගේ විවෘත වෙලා. නමුත් අපේ ව්‍යාපාර කටයුතු සාර්ථකව කෙරීගෙන යනවා. ගතවුණු අවුරුදු කිහිපයේදි අපි යහපත් කීර්ති නාමයක් ගොඩ නගා ගෙන තියෙනවා. ඒ, සිතුවම්වල විශ්වාසනීයත්වයත්, ඒවාට අය කරන මිලේ සාධාරණත්වයත් නිසා. මේ රටේ ඉහළම ප්‍රභූවරුන්ගේ මන්දිරවල අප අලෙවි කළ සිතුවම් දකින්න ලැබෙනවා."

"එතකොට ඔබේ හවුල්කරුවා ග්‍රීන්වුඩ් මහත්මයා?"

"ඔව්. සිඩ්නි ග්‍රීන්වුඩ්. වයසින් මට වඩා තරමක් වැඩිවුණත්, අපි දෙන්නා සමාන අයිතිය ඇති හවුල්කරුවෝ. කලාකෘති මිලදී ගැනීමේදී ඔහු මටත් වඩා බොහොම පරෙස්සම් වන කෙනෙක්. හොඳයි. මං මුහුණ දී ඇති ගැටලුව ගැන දැන් මං ඔබට කියන්නම්"

"ඔව් මහත්මයා. ඔබේ සම්පූර්ණ විස්තරයම අපට කියන්න" හෝම්ස් කීවේ දෑත්වල ඇඟිලි තුඩු එකට ළං කරගෙන දෙනෙත් පියා ගනිමිනි.

"මහත්මයා. මං පදිංචි නිවසේ නම හැව්ලොක් ලොජ්. දැන් සති දෙකක පමණ කාලයක ඉඳන්, කවුරුන් හෝ මා ගැන නැත්නම් මගේ නිවස ගැන, සෝදිසියෙන් ඉන්නා බව මට පෙනී ගියා. මගේ නිවස සහ තවත් ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුගේම නිවාස පිහිටා තිබෙන්නේ, එම ප්‍රදේශයේ තිබෙන උද්‍යානය පෙනෙන තෙක් මානයේ. උඩුමහලේ මගේ කාමරයේ ජනේලයකට පෙනෙනවා උද්‍යානයේ එක් කෙළවරක්.

පහුගිය අඟහරුවාදා උදේ මට දකින්න ලැබුණා කලින් මා දැක නැති දර්ශනයක්. ඒ තමයි දෙපා මඳක් ඈත් කරගෙන නැගිට සිටිමින්, මගේ නිවස දෙසම බලාගෙන සිටි පුද්ගලයෙකු. ඔහු දෑත් එකට පටලවාගෙන නිශ්චලව සිටියේ එකම ඉරියව්වකින්. මගේ අවධානය ඒ පැත්තට වඩාත් යොමුවුණෙත් ඒ නිශ්චල බව නිසයි. ඔහු සිටියේ හුඟක් ඈතින් නිසා, ඔහුගේ මුහුණ පැහැදිලිව දැක ගැනීමට මට හැකියාවක් තිබුණේ නෑ. නමුත් ඔහු හැඳගෙන සිටියේ තරමක් දිගින් වැඩි කබායක්. ඒ නිසා මට හිතෙනවා ඔහු විදේශිකයෙකුදෝ කියල. ගිය අවුරුද්දේ මං ඇමරිකාවට ගියා. මේ අමුත්තාගේ ඇඳුමේ ඇමරිකානු බවක් මට සනිටුහන් වුණේ ඒ නිසයි. අනෙක් කාරණය ඔහු හිසේ පැළඳගෙන හිටි කැප් තොප්පිය. බේස්බෝල් ක්‍රීඩකයන් පළඳින කැප් තොප්පියට සමාන පෙනුමක් තිබෙන, මේ වර්ගයේ තොප්පි එංගලන්තයේ, විශේෂයෙන්ම නගරබදව දකින්න ලැබෙනවා අඩුයි.

මගේ අවධානය ඇදී ගියේ ඔන්න ඔය කරුණු වලටයි. අනික් කාරණය; ඔහු මොනම හෝ ආකාරයක සෙලවීමක් නැතිව පඹයකු මෙන් එතැන හිටි හැටි. මට දිවුරන්න පුළුවනි. එතැන පඹයෙකු සවිකර තිබුණා නම්; ඊට වඩා මොකක් හරි සෙලවීමක් අප දකිනවා. ඒ වෙලාවේ මඳ වැස්සක් පතිත වෙමිනුයි තිබුණේ. පිට්ටනිය හරහා වේගයෙන් හැමූ සුළඟෙත්, වැහිපොද හැමතැනකම පැතිරුණා. ඒ වුණත් ඒක ඔහුට දැනුණු බවක් වත් මට පෙනුණේ නෑ. මගේ ජනේලය දිහාවට හැරිලා, ඔහුගේ ඇස්දෙක ගල්වෙලා වගෙයි. ඒවායේ තිබුණේ මාව සිදුරු කරන්න හදනවා

වගේ බැල්මක්. මං මිනිත්තුවක් හෝ ඊට වැඩි කාලයක් ඒ දිහා බලාගෙන හිටියා. ඊළඟට උදේ ආහාරය සඳහා මං පහළ තට්ටුවට බැස්සා. කෑම කන්න කලින් මං කුස්සියේ වැඩ කරන සේවකයාට කිව්වා, මගේ කාමරයේ ජනේලයෙන් බලන්න කියලා. ඔහු ඇවිත් කිව්වේ පිට්ටනිය දිහා කිසිවෙකු නොමැති බව"

"ඉතාම අසාමාන්‍ය සිදුවීමක්" හෝම්ස් කීය. "නමුත් හැව්ලොක් ලොජ් මන්දිරය ඉතා විශිෂ්ට නිර්මාණයක්, ඉදිකිරීමක් බවට සැකයක් නෑ. මේ රටට ආ විදේශිකයකුට උවමනා වෙලා ඇති, මේ මැඳුර සෝදිසිකර එහි අලංකාර බව නරඹන්න"

"මාත් හිතට ගත්තෙ එහෙම තමයි. නමුත් මට ඔහු දෙවැනි වාරයටත් දකින්න ලැබුණා. මේ සැරේ මං හිටියේ ලන්ඩනයේ. මං මගේ බිරිඳ සමග නාට්‍යයක් නරඹන්න වෙම්බ්ලි නෘත්‍ය ශාලාවට ගියා. අපි එළියට බහිනකොටම මට ඔහු දකින්න ලැබුණා. කොහේද? වීදියෙ අනෙක් පැත්තේ. හෝම්ස් මහත්තයා. නෘත්‍ය ශාලාවෙන් පිටවුණු සෙනග ගමන් කළේ ප්‍රධාන පාර දෙසට. ඔවුන් ගමන් කළේ ගඟක් ගලනවා වගේ. ඒ අතරේ ඔහු නොසෙල්වී නැගිට හිටියේ ගල් කණුවක් වගේ. ඔහු හැඳගෙන සිටියේ එම කබායමයි; එම තොප්පියමයි. සමහරවිට ඔහු අඳුනාගැනීම මට අපහසු වෙන්නත් ඉඩ තිබුණා. ඒ මොකද ඔහු නැගිට සිටියේ වීදි ලාම්පුවේ එළිය, පදික වේදිකාවට වැටෙන තැනම. මං හිතන්නේ ඔහු හිතාමතාම එහෙම හිටියේ. ඒ මොකද ඔහුගේ මුහුණ තිබුණේ හෙවණැල්ලකින් වැහිලා. ඔහුගේම හිස් මුදුනේ හෙවණැල්ල මුහුණට වැටී තිබුණා. ඒ නිසා මට එය හරිහැටි දැකගන්න පුළුවන් වුණේ නෑ."

"නමුත් ඔබට හොඳටම විශ්වාසයි, මේ එම පුද්ගලයාමයි කියලා?"

"කිසිම සැකයක් නෑ. මේ ඔහුමයි"

"ඔබේ බිරිඳ දුටුවාද ඔහුව?"

"නැහැ. මං ඒ ගැන ඒ වෙලාවෙ ඇයට කිව්වෙ නෑ. ඒ මොකද ඇය එයින් කලබල වෙන්න ඉඩ තිබුණු නිසා. කුලීරියක් අප වෙනුවෙන් නවත්වාගෙන හිටි නිසා අපි වහාම පිටත් වී ගියා."

"මේක හරිම සිත් ඇදගන්නා කරුණක්" හෝම්ස් කීය. "මේ විදියට තමාව ප්‍රදර්ශනය කිරීමේ තේරුම මොකක්ද? එක් වරක් ඔහු ඉන්නවා පිට්ටනියක. ඊළඟට ඉන්නේ දැල්වෙන ගෑස්පහනක ආලෝකය යට. එක අතකින් තමන්ව ප්‍රදර්ශනය කරන්න සෑම

උත්සාහයක්ම ගන්නවා. අනික් අතට ඔහු ඔබට ළංවෙන්න කිසිම උත්සාහයක් දරන්නේ නෑ."

"ඔහු මාව හමුවුණා" ලැංකැස්ටර් මහතා පිළිතුරු දුන්නේය. "මගේ සහකරුවා ග්‍රීන්වුඩ් එදා කලාගාරයේ රැඳී හිටියේ යම් කටයුත්තක යෙදෙමින්. මං එහි ඉඳීමේ අවශ්‍යතාවයක් තිබුණේ නෑ. ඉතින් මං වෙනදාට වඩා හුඟක් කලින් ආපසු නිවස බලා ආවා. එතකොට හවස තුන වුණෙත් නෑ. මං එහෙම ආ එක හොඳයි. මට දකින්න ලැබුණා අර තක්කඩියාව.

හිස පහත් කරගෙන ඔහු මගේ ගෙදර ඉස්සරහ දොරටුව පැත්තටයි ආවෙ. මං ඔහුට අභියෝග කළා.

"තමුසෙ කවුද? මොන උවමනාවකටද මෙහේට එන්නෙ?"

එක්වරම ඔහු මං සිටි පැත්තට දුවගෙන එන්න පටන්ගත්තා. මං හිතුවේ ඔහු එහෙම ආවේ, මට පහර දෙන අරමුණෙන් කියලා. මගේ අතේ තිබුණු සැරයටිය මං ඉහළට එසෙව්වේ මගේ ආරක්ෂාවට.

නමුත් ඔහු ඇවිත් තිබුණේ පහර දීමකට නෙමෙයි. ඔහු කෙළින්ම මා සිටි තැනටම ආවා. ඔහුගේ මුහුණ හොඳින් දැකගන්න මට හැකිවුණේ මුල්වරට. ඔහුගේ ඇස් තද දුඹුරු පාටයි. දකුණු කම්මුලේ භයානක කැළලක්. ඒක මුණිස්සමක් වැදීමෙන් මෑතකදී ඇතිවුණු එකක්. ඔහු මත්පැන් බොමින් ඉඳල තියෙන්නේ. මට ආවා මත්පැන් ගඳ. මට එක වචනයක් කිව්වෙ නෑ. ඒ වෙනුවට ඔහු කළේ සාක්කුවකින් එළියට ගත්තා ලියුමක්. ඒක මා අතට දුන්නා. ඊළඟට මං ඔහුව නවත්වන්න කලින් ඔහු පැනල දිව්වා"

"එතකොට ලියුම?" හෝම්ස් ඇසීය.

"මේ තියෙන්නේ ඒක"

ලැංකැස්ටර් මහතා හතරට නමා තිබූ, ප්‍රමාණයෙන් ලොකු සුදු කඩදාසියක් ඉදිරිපත් කළේය. හෝම්ස් එය විවෘත කළේ පරෙස්සමිනි. මීළඟට ඔහු තම ප්‍රබල උත්තල කාචය මගෙන් ඉල්ලා ගත්තේය.

"මේක ලියුම් කවරයක දමල තිබුණෙ නැද්ද?"

"නැහැ"

"ඒක ඉතාමත් වැදගත් කරුණක්. නමුත් අපි බලමු......."

කඩදාසියේ තිබුණේ පැහැදිලිව ලොකු අකුරෙන් ලියා තිබූ වචන කිහිපයක් පමණි.

සාන්ත මේරි දෙව්මැඳුර ළඟට එන්න.
හෙට දහවල් දොළහට.

"කඩදාසිය එංගලන්තයේ නිෂ්පාදිත එකක්" හෝම්ස් කීය. "අමුත්තා එහෙම නොවුණත්. ඔහු ලිවීමට යොදාගෙන තියෙන්නේ කැපිටල් අකුරු. ඒ මොකක් නිසා කියලද වොට්සන් ඔබ හිතන්නේ?"

"තමන්ගේ අත් අකුරු හඳුනාගැනීමට නොහැකිවෙන්න"

"ඔව් ඒක වෙන්නත් පුළුවනි. මේ පුද්ගලයා මීට කලින් ලැංකැස්ටර් මහත්මයාට ලියා නැති නිසාත්, යළිත් ලියාවි කියා හිතන්න අමාරු නිසාත්, අත් අකුරුවල වැදගත් කමක් නැහැ කියා කෙනෙකුට හිතෙන්න පුළුවන්. මහත්මයා. මේ ලියුම ඔබ අතට දෙද්දී කඩදාසිය මේ ආකාරයෙන් නමලද තිබුණෙ?"

"මට මතක විදියට නැහැ. පසුව ඒක නැමුවෙ මම"

"මේක දැන් ටිකෙන් ටික පැහැදිලි වෙනවා" හෝම්ස් කීය. "එතකොට ඔහු මේ කියන සාන්ත මේරි දෙව්මැඳුර තියෙන්නේ කිංස්ටන් වලද?"

"ඔව්. ඒක තියෙන්නේ ඇනස්ලි පටුමගේ. මගේ ගෙදර ඉඳන් මිනිත්තු කිහිපයකින් පයින් යා හැකි දුර"

"ඔහුගේ මේ හැසිරීමත් ගැටලු සහගතයි" හෝම්ස් කීය. "ඔහුට උවමනා වෙලා තියෙනවා ඔබ සමග කතාකරන්න. ඔහු මේ ලියමන ඔබේ අතට දෙනවා. ඒ වුණත් කිසිදෙයක් කතා කරන්නෙ නෑ. එක වචනයක්වත් කියන්නෙ නෑ"

"ඔහුට උවමනා වෙලා තියෙන්නෙ, තනිවම මා සමග කතාකරන්න කියලයි මට හිතෙන්නෙ. තවත් මිනිත්තු කිහිපයක් ගතවෙන්න ඇති. මගේ බිරිඳ මේරියත් ගෙදරින් එළියට ආවා. ඇය කෑම කාමරයේ ඉඳගෙන, ගෙදරට එන පාර දිහා බලාගෙන ඉඳල තියෙනවා. සිදුවුණු දේ ඇයට දකින්න ලැබුණා.

"ඒ කවුද?" ඇය ඇසුවා.

"මං දන්නෙ නෑ"

"ඒ මිනිහට මොනවද උවමනා වෙලා තියෙන්නෙ?" ඇය ඇසුවා.

මට ලැබුණු මේ ලියුම මං ඇයට පෙන්නුවා.

"මේ මුදල් උවමනා වෙලා ඉන්න කෙනෙක්" ඇය කිව්වා. "දැන් මොහොතකට කලින්, මං ජනේලයෙන් ඔය මිනිහව දුටුවා. මහ

රස්තියාදුකාරයෙක් වගේ මිනිහෙක්. ගිය සතියෙ ගමේ පිට්ටනියෙ අභිගුණ්ඨිකයො වගේ මිනිසුන් ගැවසුණා. මේ මිනිහත් ඔවුන්ගෙන් කෙනෙකු වෙන්න ඇති. ඔයා යන්න එපා ඔස්කා"

"ඔයා ඒ ගැන හිත අවුල් කරගන්න එපා." මං ඇයට කිව්වා. "ඒ මිනිහා හමුවෙන්න මගේ බලාපොරොත්තුවක් නෑ"

"බිරිඳට එහෙම කියා සැනසුවට, ඔබ නියමිත වෙලාවට දෙව් මැඳුරට ගියා?"

"ඔව්. ඒක තමයි මං කළේ" ලැංකැස්ටර් කීය. "ඒ වගේම මං රිවෝල්වරයකුත් අරගෙන ගියා. මේ දෙව්මැඳුරට ඒ තරම් ලොකු සෙනගක් එන්නෙ නෑ. අනික ඒ හරියෙ තියෙන්නෙ ඇඩ් ශීතලක්. පැයකට වැඩි කාලයක්, දෙව්මැඳුර ඉදිරිපිට එහා මෙහා ඇවිදිමින් මං කාලය ගත කළා. ඔහුව දකින්න ලැබුණෙ නෑ. අන්තිමේදි මං ගෙදර ආවා. ඊට පස්සෙ මට ඔහුව දකින්න ලැබුණෙත් නෑ. කොහොම නමුත් මේ මිනිහාව මගේ හිතෙන් ඉවත් කරන්න මට අමාරුයි"

"මේ පුද්ගලයා ඔබව හඳුනන කෙනෙකු වෙන්න ඇති?" හෝම්ස් කීය.

"ඔව් හෝම්ස් මහත්මයා. මේ කතන්දරයේ ගැඹුරට හිතා බැලුවොත්, මං හිතන්නේ මං දන්නවා ඔහු කවුද කියලා. නමුත් ඔබ කොහොමද එවැනි නිගමනයකට ආවෙ? මට ඒක තේරුම් ගන්න අමාරුයි."

"ඔබේ කතාව ඇහුවාම ඒ කරුණ ඉතාම පැහැදිලියි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔබ ඔහුව දැකල තියෙන්නේ තුන්වරක් පමණයි. ඔබ හමුවෙන්න ඔහු වෙලාවක් යොදා ගත්තා. නමුත් ආවෙ නෑ. ඔහුගෙන් ඔබේ ජීවිතයට අනතුරක් ඇති බවක් කියවුණාද? නැහැ. ඒත් ඔබ ඔහු හමුවෙන්න ගියේ රිවෝල්වරයකුත් අරගෙන. අර සුවිශේෂ තොප්පියේ වැදගත්කම මොකක්ද? ඔබ ඒ කාරණය අපට කිව්වෙ නෑ"

"මං දන්නවා ඔහු කවුද කියලා. ඔහුට උවමනා වෙලා තියෙන්නේ, මොකක්ද කියන එකත් මං දන්නවා. ඔහු මගේ පිටුපස එංගලන්තයට ඇවිත්. මා භීතියට පත්කරන කාරණය ඒකයි."

"ඇමෙරිකාවෙන්?"

"ඔව්"

"ලැංකැස්ටර් මහත්මයා. ඔබේ කතන්දරය බොහොම සිත් ඇදගන්නා එකක්. ඔබ අපට කිව්වා අවුරුද්දකට කලින් ඔබ

ඇමරිකාවට ගිය බව. මේ මිනිහා හමුවුණේ එහේදිද? මං හිතන්නේ මේ සිද්ධියේ සම්පූර්ණ ඉතිහාසය ඔබ අපට කිව යුතුයි"

"ඇමරිකාවේදි මට ඔහු හමුවුණේ නෑ. නමුත් මට එහේ යන්නට සිදුවුණේ ඔහු නිසා"

"එහෙම නම් මගේ පයිප්පය දුම්කොළ වලින් පුරවා ගන්නවා. ඒ ගැන ඔබේ විරුද්ධත්වයක් නැහැ නේද? කලාකෘති වෙළෙන්දෙක් කියන්නේ, සාමාන්‍යයෙන් සතුරන් ඇති කරගන්නා කෙනෙකු නෙමෙයි. නමුත් ඔබ නම් කරගෙන තිබෙන්නේ ඒකෙ අනික් පැත්ත. අපව කැඳවාගෙන යන්න, අත්ලන්තික් සාගරයේ අනෙක් පැත්තට. එහේදි ඔබ කළ මේ අපූරු ගනුදෙනුව මොකක්ද කියලා අපට කියන්න"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. මගේ හතුරාගේ නම නෝමන් ඔනිල්. මං දෙවියන් වහන්සේගෙන් අහන්නේ, ඇයි මේ නම මට අහන්න සැලැස්සුවේ කියලයි"

හෝම්ස් පුටුව අසල බිම තිබූ පර්සියානු පාවහන අතට ගත්තේය. මීළඟට එහි අසුරා තිබූ දුම්කොළ වලින් තම පිගන් මැටි පයිප්පයේ කෝව පිරවීමට පටන්ගත්තේය. ඒ අතර ඔස්කා ලැංකැස්ටර් මහතා හොඳ හුස්මක් ඉහළට ගත්තේය. ඉන්පසු ඔහු අපට හෙළිකළ කථාන්තරය මෙයයි.

II

"අවුරුදු එකහමාරකට කලින් ලන්ඩනයේදී, එක්තරා සුවිශේෂ මහත්මයෙකුට මාව හඳුන්වාදෙනු ලැබුවා. ඇමරිකානු ජාතිකයෙකු වුණු ඔහුගේ නම රැන්ඩොල්ෆ් හැරිසන්. ඔහු ලන්ඩනයට ළඟාවෙලා තිබුණේ යුරෝපයේ කළ දීර්ඝ සංචාරයකින් පසු. එක්සත් ජනපදයේ නැගෙනහිර වෙරළබඩ පදිංචිකරුවෙකු වන ඔහු සැලකෙන්නේ, බොස්ටනයේ ප්‍රභූවරයෙකු ලෙසයි. මුලින් ඔහු ධනය උපයාගෙන තිබුණේ ගල් අඟුරු පතල් වලින්. ඒ මුදල් ඔහු ආයෝජනය කර තිබුණා, දුම්රිය ධාවන සමාගම්වල සහ දුරකතන පහසුකම් ලබාදෙන සමාගම්වල. ඔහු කෝටිපතියෙකු වෙලා තිබෙන්නේ ඒ මාර්ගයෙන්. ළමා කාලයේ සහ තරුණ කාලයේ ඔහුගේ ආශාව වෙලා තියෙන්නේ චිත්‍රශිල්පියෙකු වීමටලු. වෘත්තියෙන් එවැනි තත්ත්වයක් ලබන්න බැරිවුණත්, කලා නිර්මාණ

ක්ෂේත්‍රයට ඔහුගේ තිබුණු ආශාව අඩුවුණේ නෑ. ඒ නිසයි ඔහු ඉතාලියේ රෝමයට සහ ෆ්ලොරන්ස් නගරයටත් පැරීසියටත් ගිහින් තිබුණේ. ඒ තැන්වල කලාගාර හා කෞතුකාගාර වලට සංචාරය කරමින් කලා කෘති නැරඹූ ඔහු, අන්තිමට ඒ කටයුත්තට ලන්ඩනයට ආවා.

බොහොමයක් කෝටිපති ඇමරිකානුවන්ගේ තිබෙනවා වගේ ඔහුගේත් තිබුණා අරමුණක්. ඒ කියන්නේ තමන්ගේ නම පවතින විදියේ වැඩක් කරන්න. ඒ සඳහා ඔහු හිතාගෙන තිබුණේ, ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ ප්‍රදර්ශනය කිරීම සඳහා කලාගාරයක් ඉදිකරන්න. බොස්ටනයෙන් විශාල ඉඩමක් මිලට ගත් ඔහු, එහි ඉදිකිරීමේ වැඩ කටයුතු අරඹා තිබුණා. ඔහු එය නම් කර තිබුණේ මයිකල් ආන්ජෙලෝ කලාගාරය නමින්. ඔහුගේ යුරෝපා සංචාරයේ අරමුණ වී තිබුණෙත්, මෙම කලාගාරයේ ප්‍රදර්ශනයට කලාකෘති මිලට ගන්න.

හැරිසන් මහත්මයා ඉතාම පුදුමාකාර මනුස්සයෙක් බවයි මට දකින්න ලැබුණේ. වයසින් අවුරුදු හතළිහක් හෝ හතළිස්පහක් වයසැති ඔහුගේ, ඇඳුම් පැළඳුම් ටිකක් පරණ මෝස්තරයට. මුහුණ පුරා වැවුණු කළු රැවුලත්, එක් ඇසකට පමණක් පැළඳි උපැසත් ගෙන ආවේ දාර්ශනික පෙනුමක්. ඉංග්‍රීසි භාෂාවට අමතරව ඔහු ප්‍රංශ හා ඉතාලි භාෂා ව්‍යක්ත ලෙස දැන හිටියා. ඒ සමගම ස්පාඤ්ඤ හා ග්‍රීක් භාෂාත් යම් පමණකට දැනගෙන හිටියා. පසුගිය ශතවර්ෂවල සිටි චිත්‍ර ශිල්පීන් ගැන, ඔවුන්ගේ නිර්මාණ හා ඔවුන්ගේ කලා සම්ප්‍රදායන් ගැන, හැරිසන් මහත්මයාට තිබුණේ විශේෂඥ දැනුමක්.

රැන්ඩොල්ෆ් හැරිසන් මහත්මයා ස්ටැන්මෝ උද්‍යානයේ පිහිටි අපේ කලාගාරයට එන්න කැමැත්ත පළකළාම, මගේ හිතේ ඇතිවුණේ උතුරා යන සන්තෝෂයක්. අපේ එකතුවේ චිත්‍ර ඔහුට පෙන්වමින් ග්‍රීන්වුඩ් සහ මම පැය ගණනක් ගතකළා. අපි මෑතකදී මිලට ගත් ගෝයා, වින්සන්ට් වැන්ගෝ, ෆ්රැගොනාඩ් සහ රෙනෝල්ඩ්ස්ගේ චිත්‍ර දැකලා ඔහු පුදුමයට පත්වුණා. නමුත් අපේ එකතුවේ තිබූ මුදුන් මල්කඩ වුණේ රෙම්බ්‍රාන්ට් ගේ චිත්‍ර. ඔහුගේ මැඩෝනා ඔෆ් ද පිල්ග්‍රිම්ස්, සස්කියා ඉන් අ ෆෙදර් හැට් හා නයිට්වොච් දැකලා ඔහු අමන්දානන්දයට පත්වුණා. මේ අතරේ

ගේබ්‍රියෙල් රොසෙට්ගේ හා බොටිෂෙලිගේ චිත්‍රය බැගිනුත් ඔහු තෝරා ගත්තා. අපෙන් මිලදී ගන්නා කලාකෘති, ඔහුගේ කලාගාරයේ හොඳින් ආලෝකමත් කරන විශේෂ තැනක, ප්‍රදර්ශනය කරන බවට ඔහු පොරොන්දු වුණා. අපි එකිනෙකාගෙන් සමුගත්තේ බොහොම සුහද මිත්‍රශීලී හැඟීමෙන්. ඔහුට අලෙවි කළ චිත්‍ර වලින් ඉතා විශාල මුදලක් අපට ලැබුණු බවත් කිව යුතුයි. ග්‍රීන්වුඩ් කියූ විදියට එය අපේ ජීවිතයට කළ හොඳම වෙළඳාම.

දැන් ඉතින් අපට ඉතිරිවෙලා තිබුණේ මේ චිත්‍ර බොස්ටන් වෙත යැවීම පමණයි. ඒවා ඉතාම හොඳින් ඇසිරුවේ සෑහෙන මුදලක් වියදම් කරමින්. ඊළඟට ඒවා ශක්තිමත් දැව පෙට්ටියක අසුරලා "බ්‍රයිට්ස්ටාර්" නෞකා සමාගමට අයත් නැවකින්, ලිවර්පූල් සිට එක්සත් ජනපදය බලා යවන්න භාරදුන්නා. කලින් අපේ බලාපොරොත්තුව තිබුණේ, මේ පෙට්ටිය කෙළින්ම බොස්ටන් වෙත යවන්නයි. එතැනට යාත්‍රා කළ "ක්වීන් බියට්‍රිස්" නෞකාව අපට මඟ හැරුණේ පැය ගණනක ප්‍රමාදයක් නිසා. ඒක නිසා ඒ පෙට්ටිය නිව්යෝක් වෙත යැවුණේ, එස්. එස් කාපේතියා නෞකාවෙන්. මුලින් අපට සිදුවුණු ප්‍රමාදය නිසා අන්තිමේදී හරි අවාසනාවන්ත සිදුවීමක් වුණා.

නිව්යෝක්හි අපේ නියෝජිතයා වුණේ ඇන්ඩ්රූ යෝක් නම් තරුණයෙක්. ඔහු ඉතාම දක්ෂ ක්‍රියාශීලී බුද්ධිමත් කෙනෙක්. කලාකෘති සහිත පෙට්ටිය නිව්යෝක් වරායේදී භාරගත් ඔහු ඒක දුම්රියට පටවා ගත්තේ, ඇල්බනි - බොස්ටන් දුම්රිය මාර්ගයේ සැතපුම් එකසිය අනූවක ගමනකින්, බොස්ටන් වෙත ළඟාවීමට. නමුත් අවාසනාවක මහත! ඒ කලාකෘති බොස්ටන් වෙත කවදාවත් ළඟාවුණේ නෑ.

මම මේ කියන කාලයේ බොස්ටන් අවට භයානක මංකොල්ල කල්ලි කීපයක් ක්‍රියාත්මක වුණා. උන් මුලින් අයර්ලන්තයේ ඉඳල එක්සත් ජනපදයට සංක්‍රමණය වුණු අය. උන්ට තිබුණා "කොෆී කප්ස්" "සිල්ව ගන්ස්" "මේපල් සිරප්" වැනි අපූරු නම්. මොවුන්ගේ බිහිසුණු ක්‍රියා නවත්වලා නීතිය ආරක්ෂා කරන්න, පොලීසියට හැකියාවක් තිබුණේ නෑ. මං කියූ කල්ලි වැඩියෙන්ම ක්‍රියාත්මක වුණේ බොස්ටනයට දකුණෙන් වාල්ස්ටවුන් හා සමර්ස්විල් ප්‍රදේශයේ. මේ පැත්තේ සිටි භයානකම ඒ වගේම ක්‍රියාශීලී

මංකොල්ලකාරයන් වුණේ, "රතු කැප් කල්ලිය" (Red Cap Gang). RCG යනුවෙන් කෙටියෙන් හැඳින්වුණු මොවුන්ගේ, නායකයන් දෙදෙනෙක් හිටියා. ඒ නිවුන් සොහොයුරන් දෙදෙනෙකු වුණු ෂෝන් ඕනීල් සහ තෝමස් ඕනීල්. මගේ කථාන්තරයට වැදගත් වෙන්නේ මේ යක්ෂයින් දෙදෙනා නිසා, මං උන් ගැන මට පුළුවන් තරම් හොඳින් විස්තර කරන්නම්.

මේ දෙන්නා උපතෙදි එක සමානව ඉන්න ඇති. නමුත් හැදී වැඩී තරුණ වයසට එද්දී පෙනුමේ සුළු වෙනස්කම් ඇතිවෙලා. දෙන්නාම උසින් අඩි හයක් පමණ. දෙදෙනාටම තිබුණේ හැඩිදැඩි ශරීර. තෝමස්ට ශක්තිමත් මාංශපේශි මනාව වැඩුණු සිරුරක් තිබුණත්, ඔහු ෂෝන් තරම් කඩවසම් වූයේ නැහැ. දෙදෙනාගේම දකුණු අත්වල මැණික් කටුවේ, කඟවේනාගේ රූපය පච්ච කොටා තිබුණලු. එකෙක් අනෙකාගෙන් වෙන්කරන්න බැරි තරමට සමීප බැඳීමක් තිබුණලු. මේක ඉතින් සාමාන්‍යයෙන්, නිවුන් සොහොයුරන් හෝ සොහොයුරියන් අතර තිබෙන බැඳීමක් නේ. දරුණු මංකොල්ලකාරයන් වුණත් ඔවුන්ගේ ඒ බැඳීමේ වෙනසක් තිබුණේ නෑ. ඔවුන් දෙදෙනා හැමවිටම රතු පාට කැප් තොප්පි පැළඳ හිටියා. ඒකෙනුයි ඔවුන්ගේ කල්ලියට රතු කැප් කල්ලිය කියන නම වැටුණේ.

මේකෙ හිටි අනෙක් කිහිප දෙනෙකු ගැනත් මං සඳහන් කරන්නම්. එයින් දරුණුම මිනීමරුවා තමයි "පිස්සු බලු ඩර්වින්" ඔහු වෙඩි තියන්න පටන් ගත්තාම ඉවක් බවක් නැතුව වෙඩි තියන නිසා තමයි ඒ නම ලැබිලා තියෙන්නෙ; හරියට පිස්සු බල්ලෙක් මිනිසුන්ව හපන්න පටන් ගත්තාම, හමුවෙන ඕනම කෙනෙක් හපනවා වගේ. තවත් එකෙක් හිටියා දැළි පිහි ඩගී කියලා. ඌ මේ කල්ලියට බැඳෙන්න කලින්, දැළි පිහියක් අරගෙන දුම්රියේ යමින්, මගීන් එම ආයුධයෙන් කපමින් මගීන්ගේ ආභරණ හා මුදල් මංකොල්ල කෑ එකෙක්. තවත් එකෙක් හැඳින්වුණේ "පච්ච ජොනී" හෙවත් අවතාරය යන නමින්. කලින් කඩසාප්පු බිඳ බඩු හොරකම් කරගෙන අවතාරයක් වගේ නොපෙනී යන නිසාලු, ජොනතන් ප්‍රිව්ස් පැට්‍රික්ට ඒ නම ලැබිල තියෙන්නේ.

ඔවුන් හැම ආකාරයකම අපරාධවල යෙදුණා. බැංකු බිඳීම, මහමඟ මංකොල්ලකෑම්, කර්මාන්තශාලා හා ව්‍යාපාරිකයන්ගෙන්

කප්පම් ගැනීම්, කුලියට මිනීමැරීම් සහ ළමයින් පැහැරගෙන ගිහින් කප්පම් ඉල්ලීම් ආදී හැම දෙයක්ම. මෙම පුද්ගලයන් මුළු සමාජයටම ශාපයක්, පිළිලයක් වුණා. ඒ බව තේරුම් නොගත් සුළු කොටසකුත් බොස්ටන්හි වාසය කළා. ඒ තමයි මේ සමාජ ක්‍රමයට විරුද්ධ වුණු පීඩිත පංතිය. රතු කැප් කල්ලිය කියන්නේ ඕනෑම දෙයක් කිරීමට හැකි, එහෙත් නීතියෙන් අල්ලාගන්න කවදාවත් හැකිවෙන්නෙ නැති අය කියලා විශ්වාසයකුත් තිබුණා.

රතු කැප් කල්ලිය ගැන මං කවදාවත් අහල තිබුණෙත් නෑ. ඒ නිසා ඔවුන්ගෙ වැඩ ගැන දැන හිටියෙත් නෑ. මං යැවූ චිත්‍ර සහිත පෙට්ටිය නිව්යෝක් නගරයෙන් බොස්ටන් බලා ගෙනියන්න සිදුවුණු දවස්වලම, තවත් දෙයක් සිදුවීමට නියමිතව තිබුණාලු. ඒ තමයි ඇමරිකානු මුදල් නෝට්ටු සමාගමේ සිට බොස්ටන් නගරයේ මැසචුසෙට්ස් හි නැෂනල් ඇන්ඩ් ග්‍රීන්ඩ්ලේස් බැංකුවට අයිති විශාල මුදල් ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම. ඒ ඩොලර් ලක්ෂ දෙකක මුදලක්. එය ගෙන යෑමට නියමිතව තිබුණෙත්, මෙම දුම්රිය මාර්ගයේ යන විශේෂ දුම්රියකමයි. සමහරු කියන්නේ මෙතන මොළකාරයා වුණේ ෂෝන් ඕනීල් කියලයි. තවත් සමහරු කියන්නේ සැලසුම් කිරීමට කවදත් අති දක්ෂයා නෝමන් ඕනීල් මේකත් සැලසුම් කළා කියලයි. කොහොම හරි ඔවුන්ගෙ සැලසුම වුණේ, දුම්රිය බොස්ටන් වෙත ළඟාවෙන්න කලින් එය අතරමගදී නවත්වලා, ඇවැන්ත මුදල් තොගය පැහැර ගැනීම.

මේ කාලය වෙනකොට එක්සත් ජනපදයේ නැගෙනහිර වෙරළ පැත්තේ ජනපදවල, දුම්රිය මංකොල්ලකෑම් ඒ තරම් අහන්න ලැබුණු දෙයක් නෙමෙයි. ඒවා බහුල වශයෙන් සිදුවුණේ බටහිර වෙරළබඩ කැලිෆෝනියාවෙ සහ ඇරිසෝනාවෙ. ඒ නිසා දුම්රියේ තැපැල් ප්‍රවාහණ මැදිරියේ ගමන් කළේ, ගිනි අවි රැගත් එක් ආරක්ෂකයකු පමණයි. බැංකු නෝට්ටු ඔක්කොම ගෙන ගියේ, මැදිරියට පැටවූ යකඩ සේප්පුවක් තුළ. අප කාගේත් පුදුමාකාර අවාසනාවකට සිතුවම් ඇසිරූ පෙට්ටිය තිබුණෙත් එම මැදිරියේමයි.

දුම්රිය නිව්යෝක්හි ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් දුම්රිය පොළෙන් පිටත් වෙද්දී, අපේ නියෝජිතයා වුණු ඇන්ඩ්‍රූ යෝක් එම දුම්රියේම දෙවැනි පංතියේ මැදිරියක ගමන් කළා. තමන්ට පැවරුණු රාජකාරිය හොඳින් කිරීමට සිතාගත් ඔහුට හැකිවුණා, තැපැල් ප්‍රවාහණ මැදිරියට යාබද මැදිරියක අසුන් ගන්න.

මංකොල්ලය සඳහා හොර කල්ලිය සැලසුම් කරගෙන තිබුණේ පිට්ස්ෆීල්ඩ් නගරයට ඉතාම සමීප තැනක්. මෙතැනදී දුම්රිය කනෙක්ටිකට් ගංගාව හරහා යාමට පෙර, ඉතාම තියුණු කඳු බෑවුමක ඉහළට නගින්න තියෙනවා. මේකෙ තියෙනවා දුම්රිය උමගක් අඩි දෙදාහක් දුරට. දුම්රිය සේවයේ රෙගුලාසි අනුව දුම්රියේ ඉංජිනේරුවාට, අනිවාර්යයෙන් කළ යුතු කටයුත්තක් පැවරී තිබුණා. ඒ තමයි, උමගෙන් එළියට එද්දී දුම්රියේ තිරිංග පරීක්ෂා කොට, ඒ ගැන අවධානයෙන් සිටීම. ෂෝන්, නෝමන් සොයුරන් දෙදෙනා හිටියේ දුම්රිය උමග අවසාන වන තැන කඳු මුදුනේ. සෙමින් ගමන් කළ දුම්රියේ මැදිරියක වහළට පැන ගැනීම ඔවුනට අමාරුවුණේ නෑ. එතැනින් ඉදිරියට ඇවිද ගිය ඔවුන් අන්තිමට පිවිසුණේ දුම්රිය එන්ජිමට. ගිනිඅවි දිගු කරගෙන එතැනට ආව මංකොල්ලකාරයින් දුටු දුම්රියේ රියදුරා සහ තිරිංගකරු, අතිශය පුදුමයට පත්වුණා.

මේ හරියට ටිකක් ඉදිරියෙන් තිබුණා පයින් ගස්වලින් සැදුණු කැලෑබද පෙදෙසක්. තමන්ගේ අපරාධය සිදුකිරීමට එතන ආවරණය ලැබුණා. ඩගී, ඩර්වින් ජොනි ඇතුළු පිරිස, අවි ආයුධ අතැතිව අශ්වයින් පිටේ මෙතැන බලා හිටියා. ඉදිකිරීම් සඳහා ගල් පර්වත පුපුරවා හරින තැනකින්, හොරකම් කරගෙන ආ ඩයිනමයිට් වලින්, ඔවුන් සන්නද්ධවෙලයි හිටියේ. දුම්රිය කැලෑබද හරියට ආවාම ෂෝන් රියැදුරාගෙ හිසට පහර දුන්නේ, ඔහු ළඟ තිබූ රිවෝල්වරයේ මිටෙන්. රියැදුරාට එයින් සිහිනැති වුණා. මේ අතරේ නෝමන් තමන් ළඟ තිබූ ලණුවකින් දුම්රියේ තිරිංගකරු ලීවරයකට බැඳ ඇමුවා. මේ සමගම මඟ නැවතුණු දුම්රියට නගින්න, කල්ලියේ අනික් සාමාජිකයන් ප්‍රමාද වුණේ නෑ. දුම්රියෙන් එළියට නොඑන ලෙස මගීන්ට තර්ජනය කළ ඔවුන් ගියේ, තැපැල් භාණ්ඩ ප්‍රවාහණ මැදිරියට. එහි දොරවල් කඩා විවෘත කිරීමට, ඔවුන් එහි දොරවල් අසල ඩයිනමයිට් සවිකළා.

හැමදෙයක්ම බලාගෙන හිටි අපේ නියෝජිත ඇන්ඩ්‍රූ යෝක්ට, සිදුවන්නට යන දේ වැටහුණා. මංකොල්ලකාරයන්ගේ ඉලක්කය වී තිබෙන්නේ වටිනා තෙල් සායම් සිතුවම් නොව, වෙනත් දෙයක් බව ඔහු අනුමාන කරන්න ඇති. නමුත් නොදැනුවත් කමින් හොරුන් මේ සිතුවම් අරගෙන ගියත්, ඒවායින් ඔවුනට ප්‍රයෝජනයක් ලැබෙන්නේ නෑ. ඒ මොකද කිසිකෙනෙක් ඒවා ඔවුන්ගෙන් මිලට ගන්නෙ නැති නිසා.

යෝක් ගේ තීරණය වුණේ වහාම දුම්රියෙන් බැහැල ගිහින් මංකොල්ලකාරයන්ට මේ කාරණය දැනුම් දෙන්න. උන්ගේ අණට කීකරුවෙලා අනික් අය තමන්ගේ අසුන්වල වෙව්ළමින් සිටිද්දී ඇන්ඩ්රූ යෝක් දුම්රියෙන් බැස්සා. ඒ අනික් අයගේ විරෝධය හා ආයාචනා මැද. නමුත් ඔහුට වැඩිදුරක් යන්න ලැබුණේ නැහැ. ෂෝන් ඕනිල් එල්ල කළ වෙඩිපහරවල් තුනක් බඩට වැදී, ඇන්ඩ්රූ යෝක් මිය ගියේ ලේ විලක් මැද.

එකම ආරක්ෂක භටයා සිටියේ තැපැල් ප්‍රවාහණ මැදිරිය ඇතුළේ බව මං ඔබට කිව්වා. වෙඩි ශබ්ද ඔහුට ඇහෙන්න ඇති. මැදිරියට ඩයිනමයිට් සවි කළ අපරාධකාරයන්ගේ ශබ්දයත් ඔහුට ඇහෙන්න ඇති. ඔවුන් තර්ජනය කළා නම්, ඔහු දොර විවෘත කරන්න ඉඩ තිබුණද? ඒක අපට කවදාවත් දැනගන්න ලැබෙන්නේ නෑ. මොහොතකට පසු භයානක ආකාරයේ පිපිරීමක් සිදුවුණේ පළාතම දෙදරවමින්. මැදිරියේ පැත්තක්ම සුනුවිසුනු වී ගියා. ආරක්ෂක භටයා එක් ක්ෂණයකින්ම මියගියා. මුදල් තැන්පත් කර තිබූ යකඩ සේප්පුව එළියට දිස්වුණා.

එය විවෘත කරන්න උවමනා වුණේ පුපුරන ද්‍රව්‍ය තවත් ස්වල්පයක් පමණයි. ඔවුනට ලැබී තිබුණු ආරංචිය වැරදි බව කල්ලියට දකින්න ලැබුණේ එවිටයි. සේප්පුව තුළ දමා ග්‍රින්ඩ්ලේස් බැංකුව වෙත යවා තිබුණේ, ඩොලර් දෙලක්ෂයක් නොව ඩොලර් දෙදාහයි. ඔවුන් හිතුවාට වඩා බොහොම අඩු මුදලක්.

කොහොම වුණත් ජයග්‍රාහී හඬක් නංවමින් ඔවුන් එතැනින් පිටවී ගියා. අසරණ මනුෂ්‍යයින් දෙදෙනෙකු ඝාතනය කිරීම ගැන ඔවුන්ගේ හිත්වල දුකක් තිබුණේ නෑ. උන් ගත් මුදල මෙන් සිය ගුණයකට වඩා වටිනා පුරාණ චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර රාශියක් සුනු විසුනු වී ගිය බව උන් දැනහිටියේ නැහැ. මේ කලාකෘති විනාශය එංගලන්තයට පමණක් නොමෙයි; මුළු මහත් කලා ලෝකයටම විශාල පාඩුවක්. තමන්ගේ ජීවිතයට වඩා, තමන්ට භාරවුණු රාජකාරිය උතුම් කොට සැලකූ අභීත තරුණයෙක්, එදා ජීවිතක්ෂයට පත්වුණා. ඒ වුණත් ලැජ්ජාවෙන් වුණත් මම පිළිගන්න කරුණක් තියෙනවා. ඒ තමයි යෝක් තරුණයාගෙ මරණයටත් වැඩිය මගේ සිතේ දුකක් ඇති කළේ චිත්‍රවලට සිදුවුණු විනාශය බව.

මමත් මගේ මිත්‍ර ග්‍රීන්වුඩ් දෙදෙනාම, මෙම භයානක අපරාධය හා විනාශය ගැන අහලා පත්වුණේ දැඩි කම්පාවකට.

අපරාධකාරයින් මේවා විනාශ නොකර හොරකම් කරගෙන ගියා නම්, අපට මේ වගේ හිතේ අමාරුවක් ඇතිවෙන්නේ නෑ. ඒ මොකද උන් කීයකට හරි මේවා විකුණා දමනවා. ඊළඟට චිත්‍රවල අගය තේරුම් ගන්නා කවුරුන් හෝ මේවා මිලට ගෙන, අන්තිමේදී කෞතුකාගාර වෙත එනවා. නමුත් දැන් ඒ කිසිවක් නෑ. සුළු මුදලක් සඳහා උන් කළ විනාශයක තරම! සමහරෙක් අවුරුදු සිය ගණනකට පෙර ජීවත්වුණු චිත්‍රශිල්පීන්. සමහරුන්ට ඊට ටිකක් මෑත කාලයේ ජීවත්වුණු අය. කොහොම වුණත් ඒවට අත්වුණු විනාශය මුදලෙන් මිල කරන්න බෑ. මේකෙන් අප දෙදෙනා පත්වුණු දැඩි කම්පාව වචනයෙන් විස්තර කරන්න බෑ. චිත්‍ර යැවීම සඳහා මෙම ක්‍රමය තෝරා ගැනිම ගැන අපි අපටම දොස් පවරාගත්තා.

ඊළඟට මේකෙ මූල්‍යමය පැත්ත. සිතුවම් ඔහු වෙත එවීම සඳහා හැරිසන් මහත්මයා විශාල මුදලක් අත්තිකාරම් ලෙස ගෙවූ බව ඇත්තයි. නමුත් අප ඇතිකරගත් ගිවිසුමේ හැටියට, සිතුවම් සියල්ල ඔහුගේ අතට ලැබෙනතුරු, ඒවා ගැන වගකීම අපේ අතේ. ඒවා සම්පූර්ණයෙන්ම තමන්ට ලැබුණාට පසු තමයි ඔහු මුදල් ගෙවන්නේ. වාසනාවකට වගේ අපි ලන්ඩනයේ ලොයිඩ්ස් ආයතනයෙන් රක්ෂණයක් ලබා තිබුණා. එහෙම නොවෙන්න අපට සිදුවෙන්නේ දරාගන්න බැරි පාඩුවක්. අප සම්පූර්ණයෙන්ම බංකොළොත් වී යන්න ඉඩ තිබුණා. ඊළඟට අපේ නියෝජිතයා වුණු අර තරුණයා - ඇන්ඩ්රූ යෝක්. ඔහුව අමතක කර දමන්නත් අපට හැකියාවක් නෑ. ඔහුගේ පවුල ගැන සිතිය යුතුව තිබුණා. ඒ ඔහුගේ බිරිඳ සහ කුඩා පුත්‍රයා ගැන.

මේ වගේ විසඳා ගත යුතු කාරණා රාශියක් තිබුණා. ඒ හින්දයි මම ඇමරිකාවට යන්න තීරණය කළේ. එංගලන්තයෙන් පිටත්වෙලා මං මුලින්ම ගියේ නිව්යෝක් වෙත

මං හැමදේටම කලින් ගියේ ඇන්ඩ්රූ යෝක් ගේ බිරිඳ හා දරුවා සොයාගෙන. ඔහුගේ පුත්‍රයා අවුරුදු නවයක දරුවෙක්. ඒ තරම් සුන්දර සුරතල් දරුවෙක් මං කවදාවත් දැකල නෑ. සෑහෙන වන්දි මුදලක් අපෙන් ඇයට හිමිවෙන බව, මං යෝක් මහත්මියට දැනුම් දුන්නා.

ඊළඟට මං ගියේ බොස්ටන් වෙත. මං ගියා රැන්ඩොල්ෆ් හැරිසන් මහත්මයා හමුවෙන්න. මට දකින්න ලැබුණේ මට කිසිසේත් අදහාගන්න බැරි තරම්, ශ්‍රේෂ්ඨ නිර්මාණයක් වුණු

කලාගාරයක්. එය නිර්මාණය කර තිබුණේ සුප්‍රකට ප්‍රංශ ගෘහ නිර්මාණ ශිල්පියෙකු වුණු චාල්ස් ෂැපුවී. එයට යොදාගෙන තිබුණේ ප්‍රංශයේ රජ මාලිගයක ආකෘතිය. එය වටා විහිදුණු උද්‍යානය අක්කර තිහක පමණ පෙදෙසකට විහිදුණා. එහි තිබුණු සුන්දර දේවල් ඔබට විස්තර කරන්න ගියොත්, ඒකට දින ගණනක් ගතවේවි. නමුත් එහිදී මට දකින්න ලැබුණු බ්‍රොන්සිනෝගේ, වැන්ඩයික්ගේ ෆ්රැගොනාඩ්, ගෝයා සහ පෝල් සෙසාන්ගේ සිතුවම් දැකලා, මා මුසපත්වුණු බව කිවයුතුයි. මේ සිතුවම් සඳහා හැරිසන් මහත්මයා මොන තරම් ධනස්කන්ධයක් වියදම් කරන්න ඇතිද කියලා මං පුදුමයට පත්වුණා.

එදා රාත්‍රී මා වෙනුවෙන් ඔහු පැවැත් වූ භෝජන සංග්‍රහයෙදි, මං එක් වැදගත් කාරණයක් ගැන ඔහුට සිහිපත් කළා. ඒ තමයි ඇන්ඩ්‍රූ යෝක් තරුණයාගේ බිරිඳ සහ දරුවා වෙත, අප යම් පිහිටක් විය යුතු බව. මගේ තෑග්ගට අමතරව ඔහුගෙනුත් විශාල මුදලක් පරිත්‍යාග කරන්න ඔහු කැමති වුණා.

ඊළඟට මං ඔහුගේ අවධානය යොමු කළේ මේ විනාශය සිදුකළ අපරාධකරුවන් වෙත. මනුෂ්‍යයින් දෙදෙනෙකු අමු අමුවේ ඝාතනය කරමින්, මේ විනාශය කළ රතු කැප් කල්ලිය ගැන, බොස්ටන් පොලීසිය මොනවද කරල තිබුණේ? කල්ලියේ එකම සාමාජිකයෙකු වත් අත්අඩංගුවට ගන්න ඔවුනට හැකිවෙලා තිබුණෙ නෑ. ඒකට හේතුව අපරාධකරුවන්ගෙන් මුදල් ගත් දූෂිත පොලිස් නිලධාරීන්, බොස්ටන් පොලිස් සේවයේ හිටියා. අපට බැරිද මේ අපරාධකාරයන් ගැන නිවැරදි ඔත්තුවක් සපයන කෙනෙකුට, විශාල මුදලක් තෑගි වශයෙන් දෙන්න? ඒ සමගම අපි මේ කටයුත්ත පෞද්ගලික රහස් පරීක්ෂක ආයතනයකට භාර දිය යුතුයි. එතකොට නිදහසේ ගැවසෙන අපරාධකරුවන් අල්ලා ගැනීමට, අපෙනුත් යම් සේවයක් සැලසුණා, යුතුකමක් ඉටුවුණා වෙනවා. අහිමි වූ ජීවිත හා දේපළ වෙනුවෙන් ඒක අපි කළ යුතුම දෙයක් බව මං හැරිසන් මහත්මයාට කිව්වා.

"ලැංකැස්ටර් මහත්මයා. ඔබ කියන දේ හරියටම හරි. මං ඒකට සම්පූර්ණයෙන්ම එකඟයි. මං ඒකෙ පෙරමුණ අරගෙන ක්‍රියාකරන්නම්" ඔහු කිව්වේ අප්‍රමාණ සතුටකින්. "මේකෙ අවසානයක් දැකලා මිසක් මං පස්ස බලන්නෙ නෑ. රැන්ඩොල්ෆ්

ජෝන් හැරිසන් කියන්නේ, මෙවැනි අපරාධවලට නිශ්ශබ්ද වෙන මිනිහෙකු නොවෙන බව, මං ඔය පාහර බල්ලන්ට උගන්වනවා"

හැරිසන් මහත්මයා සාමාන්‍යයෙන් මේ විදියට කතා කරන කෙනෙක් නෙමෙයි. නමුත් එදා රාත්‍රී මේ වෙනකොට අපි ඉතා අනර්ඝ ප්‍රංශ වයින් බෝතල් කීපයක් හිස්කරලයි හිටියේ.

පෞද්ගලික රහස් පරීක්ෂකයා වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තුව, තමන් සම්පූර්ණයෙන්ම දරන බව ඔහු තදින්ම කියා හිටියා. ඒකට මට හවුල්වීමට අවස්ථාවක් ඔහු දුන්නේ නෑ. අන්තිමේදී මේක මාත් හවුල්විය යුතු කටයුත්තක් බව මං අවධාරණය කළා. නිවැරදි ඔත්තු සපයන්නන් සඳහා දෙන තෑගි මුදලට පරිත්‍යාග කරන්න මට අවස්ථාවක් දුන්නා. මේ ගැන එකගත්වයකට ආවාම අපි අතට අතදී එය තහවුරු කළා. මේ කටයුතු සැලසුම් කරලා යම් සාර්ථකත්වයකට පත්වෙනතුරු වත්, මා ඇමරිකාවේ රැඳී සිටිය යුතු බව හැරිසන් මහත්මයා කිව්වා. ඒ ආරාධනය මං භාරගත්තේ සතුටෙන්. කුඩා කාලයේ සිටම මං කලාවට ඇඩිව ආදරය කළ කෙනෙක්. ඉතින් හැරිසන් මහත්මයාගේ කලාගාරයේ කලාකෘති නරඹමින් මාස ගණනක් වුණත් ඇමරිකාවේ ගත කිරීමට මට හැකියාව තිබුණා.

ඇත්ත කියනවා නම් කාරණා කටයුතු සිදුවෙන්න පටන්ගත්තෙ හිතුවටත් වඩා වේගයෙන්. හැරිසන් මහත්මයා සම්බන්ධ වුණේ රහස් පරීක්ෂක කටයුතු ගැන සුප්‍රකට පිංකටන් ආයතනයට. එතැනින් ඔහුට ලැබුණා ටෙඩ් මැක්ඩොනල් නම් රහස් පරීක්ෂකයෙක්. ඒ සඳහා මාව කැඳවීමක් කළේ නෑ. හැරිසන් කියන්නේ, තමන්ට උවමනා දේ තමන්ට අවශ්‍ය පිළිවෙළට තමා විසින්ම කරගන්නා කෙනෙක්. ඒ වගේම ටෙඩ් මැක්ඩොනල්ටත් හොඳ කීර්ති නාමයක් ලැබිල තිබුණා. තමන්ට භාරදුන්නු වැඩක් සම්පූර්ණයෙන්ම අවසන් කරන තුරු, මහන්සි අරින්න වත් නවත්වන කෙනෙක් නෙමෙයි මැක්ඩොනල්. ඒ සමගම හැරිසන් මහත්මයා ඇමරිකානු පුවත්පත් ගණනාවක දැන්වීම් පළ කරල තිබුණා. මේ ඒ පුවත්පතක පිටපතක්" එසේ කී ලැංකැස්ටර් මහතා දුර්වර්ණ වූ පුවත්පත් පිටුවක් හෝම්ස් අතට දුන්නේය. එය "බොස්ටන් ඩේලි මේල්" නම් පුවත්පත බව දුටුවෙමි.

"ඩොලර් 500 ක ත්‍යාගයක්.

පසුගියදා බොස්ටන් නගර සමීපයේ කැලෑබද පෙදෙසකදී ඩයිනමයිට් යොදා දුම්රියක මැදිරියක් පුපුරුවා හළ රතු කැප් කල්ලිය ගැන ආරංචියක් දිය හැකි අය වෙතයි.

දෙදෙනෙකුට මරු කැඳවමින් මෙම පිපිරීම සිදු කිරීමට සම්බන්ධ අයෙකු හෝ අයවළුන් ගැන නිවැරදි ඔත්තුවක් සපයන කෙනෙකුට, ඩොලර් 500 ක ත්‍යාගයක් දෙනු ලැබේ. මෙම තෑග්ග ප්‍රදානය කරන්නේ බොස්ටන්හි පදිංචි රැන්ඩොල්ෆ්. ජේ. හැරිසන් සහ එංගලන්තයේ කිංස්ටන්හි පදිංචි ඔස්කා ලැංකැස්ටර් යන අය විසිනි. ඔබ දන්නා තොරතුරු පිංකටන් ආයතනයට හෝ..........."

මේකට සම්පූර්ණයෙන්ම වියදම් කළේ හැරිසන් මහත්මයා. නමුත් ත්‍යාගය සඳහා හවුලේ වියදම් දරන්නන් ලෙස මගේ නම හා ලිපිනයත් සඳහන් කර තිබුණා. ඒක දුටුවාම මගේ හිතේ ඇතිවුණේ සතුටක්.

ඊළඟ සති කිහිපයෙන් කොටසක් මම බොස්ටන් නගරයේත් අනෙක් කොටස නිව්යෝක් නගරයේත් ගත කළා. මෙහිදී මම මෙට්‍රොපොලිටන් කලා කෞතුකාගාරය නැරඹුවා. ඊට පසු ඇන්ඩ්රූ යෝක්ගේ බිරිඳ හා දරුවා දැකීමට ගියා. මේ අතරෙදි තමයි හැරිසන් මහත්මයාගෙන් මට විදුලි පුවතක් ලැබුණේ. අප දුන් ත්‍යාගයේ විශාලත්වය නිසා, එල ප්‍රයෝජන ලැබීමට පටන් අරගෙන ඇති බැව් ඔහු සඳහන් කළා. මැක්ඩොනල්ට රතු කැප් කල්ලිය ගැන ඔත්තුවක් ලැබිලා; උන් අල්ලා ගැනීමට ඔහු එළා ඇති දැල ක්‍රමයෙන් තද කිරීමට පටන් අරගෙන ඇති බව ඔහු කියා තිබුණා.

මං වහාම ආපසු ගිහින් බොස්ටන්හි හෝටලයක නවාතැන් ගත්තා. සිදුවී ඇත්තේ මොනවද කියන එක මට රැන්ඩොල්ෆ් හැරිසන්ගෙන් අහන්න ලැබුණේ එක් හැන්දෑවක.

ඔත්තුව ලැබිලා තිබුණේ දකුණු බොස්ටන්හි තැබෑරුමක අයිතිකරුගෙන්. ඒක යහපත් පුරවැසියන් පදිංචි ප්‍රදේශයක් නෙමෙයි. වැඩිපුරම සිටියේ අයර්ලන්ත සංක්‍රමණිකයන්. චාල්ස් ගංගාව කිට්ටුව පිහිටා තිබුණා ප්‍රමාණයෙන් විශාල, තට්ටු තුනකින්

සමන්විත, අපවිත්‍ර තට්ටු නිවාසයක්. ඒ ළඟ ඔනිල් සොහොයුරන් ලැගුම් ගෙන සිටියලු. මේක නානකාමරවල අපද්‍රව්‍ය කොරිඩෝ තුළින් උතුරා ගිය, දුර්ගන්ධය තදින්ම හැමූ තැනක්ලු. එම දුගඳ පාලනය කර තැබීමට, ගොඩනැගිල්ලේ තැනින් තැන ගල් අඟුරු යෙදූ කුඩා ගිනිගොඩවල් දල්වා තිබුණලු. බඩගින්නේ හා ලෙඩ රෝග වලින් පීඩිතව කෑගැසූ ළමයින්ගේ, බාගෙට සිහිවිකල් වී විලාප නැගූ ගැහැනුන්ගේ සහ මත්පැනින් වෙරිවී සණ්ඩු සරුවල් කළ පිරිමින්ගේ කෑගැසීම් නිසා, රෑ දවල් දෙකේම මෙතැන පැවතුණේ මහා ඝෝෂාවක්ලු. මෙයට පිටුපසින් එමෙන්ම ගොඩනැගිල්ලට යාබදව, ඇවවලින් සහ ගඩොල් වලින් ඉදිකළ කොටසකුත් තිබුණා. ඒක සම්පූර්ණයෙන්ම රතු කැප් කල්ලියේ පදිංචිය සඳහා වෙන්වී තිබුණා.

ඔවුන් දුම්රිය මංකොල්ලයෙන් ලබාගත් මුදල් සියල්ලම වගේ, මත්පැන් සඳහා සහ සූදු කෙළීමට වියදම් කොට අවසන් වෙලා. එදා හැන්දෑවෙ ඔවුන් ගිනි උදුනක උණුසුම ලබමින්, මත්පැන් පානය කරමින්, සුපුරුදු ලෙස යෙදී හිටියෙ සූදුවෙ. පොලීසිය තමන්ව අල්ලාගන්න එයිද කියා ඔත්තු බලන්න, ඔවුන් කිසිවෙකු යොදවා තිබුණෙ නෑ. තමන් දුම්රිය පුපුරවා ඩොලර් දෙදාහක් කොල්ලකෑම ගැන සෙවීම, දැන් බොස්ටන් පොලීසිය අත්හැර දමා ඇති බව ඔවුන් දැන සිටියා. පිංකටන් ආයතනයේ ආයුධ වලින් සන්නද්ධ දහ පහළොස් දෙනෙකු, මෙතැනට කඩා වදීවි කියන භයක් ඔවුනට තිබුණෙ නෑ.

පිංකටන් කණ්ඩායමට ඔවුන්ගේ ප්‍රධානියා වුණු ටෙඩ් මැක්ඩොනල් ගෙන් ලැබුණු අණ "හැකිතරමක් අපරාධකාරයන් පණපිටින් අල්ලා ගනිමු" යන්නයි. ඒකට එක් හේතුවක් වුණේ වෙඩි හුවමාරුවක් සිදුවුණොත් යාබද තට්ටු නිවාසයේ ජීවත්වුණු අසරණයන් ඒකට මැදිවී, ජීවිත හානි සිදුවීමට ඇති අවදානම. අනික් හේතුව වුණේ මේ අපරාධකාරයන් උසාවියක් හමුවට ගෙනිහිං නිසි දඬුවම් ලබාදීමට, හැරිසන්ගේ තිබුණු බලාපොරොත්තුව. ඒ නිසා මැක්ඩොනල් මහජන ඇමතුම් උපකරණයක් අතට ගෙන "යටත්වෙන්න!" කියලා කල්ලියේ අයට ඇනුම් දුන්නා.

සටනක් නොමැතිව රතු කැප් කල්ලියේ මැරයන් යටත් වේවි කියලා මැක්ඩොනල් හිතුවා නම්, ඒක ඔහුට සිදුවුණු ලොකු වැරදීමක්. කල්ලියේ ලැගුම්හල තුළින් පිටතට වෙඩි ප්‍රහාර එල්ල

වෙන්න පටන් ගත්තේ වර්ෂාවක් වගේ. ඊයම් මූණිස්සම් නොනැවතී ගලා ආවේ බිත්තිවල සාදා තිබූ සිදුරුවලින්. ඒ වගේම පිංකටන් භටයන් නවීන රයිෆල්වලින් වෙඩි තබද්දී, රතු කැප් කල්ලියත් සෑහෙන තරම් අසරණ වුණා. දැවවලින් ඉදිකළ බිත්ති සුනුවිසුනු වී යද්දී ඔවුනට හැංගෙන්න තැන් තිබුණෙ නෑ.

පැය ගණනකින් පසු සටන අවසන් වුණා. පිංකටන් භටයන් සිව්දෙනෙකු අවසන් හුස්ම හෙළා තිබුණා. මැක්ඩොනල්ටත් තුවාල සිදුවෙලා. ඔවුන්ගේ තවත් කිහිප දෙනෙකුටත් බරපතළ තුවාල.

ටෙඩ් මැක්ඩොනල්ට ඔත්තුව ලැබී තිබුණේ, එදා රතු කැප් කල්ලියේ හැම දෙනෙකුම ලැගුම් හලේ සිටින බවට.ඔවුනට පැන දුවන්න ක්‍රමයක් තිබුණෙත් නෑ. තව දුරටත් වෙඩි ප්‍රහාර නොආව නිසා නිගමනය වුණේ, කල්ලියේ හැමදෙනෙකුම ජීවිතක්ෂයට පත්වී අවසන් යන්න. ලැගුම්හල තුළට කඩා වැදුණු පිංකටන් භටයන් දුටුවේ, ඔවුන් සෑහෙන තරම් දුරට නිවැරදි බව. වෙඩි බෙහෙත් දුමෙන් පිරුණු කාමරවල, වෙඩි පහරෙන් සුනුවිසුනු වූ මළසිරුරු තිබුණා. ගණන් බැලුවාම කල්ලියේ එක් කෙනෙකු අඩුයි. ෂෝන් ඕනීල්ගේ මළසිරුර හමුවුණා. නමුත් තෝමන් ඕනීල්ගේ යයි ස්ථිර කළ හැකි මළ සිරුරක් හමුවුණේ නෑ. ඔහු මෙතැනින් පැනගොස් ඇති බව අන්තිමේදී හෙළිවුණා. නිවසේ ලෑල්ලක් ගලවාගෙන ඔහු පැන ගොස් තිබුණා. ඒ කසළ ද්‍රව්‍ය ගඟට ගෙනයාම සඳහා ඉදිකර තිබූ කාණුවකට වැදී, එය ඇතුළෙන් බඩගා යෑමෙන්. පිංකටන් භටයන් ගඟ දක්වා ගියත් ප්‍රයෝජනයක් වුණේ නෑ. මේ වනවිට අඳුරු වැටී තිබුණු නිසා, අවට සෝදිසිකර බැලීමෙන් වැඩක් නොවෙන බව ඔවුන් දැන හිටියා. රතු කැප් කල්ලියේ එක් කෙනෙකු හැර, අනික් හැමදෙනෙකුම විනාශයි. බේරී පැනගත්ත එකා කල්ලියේ නායකයන් දෙදෙනාගෙන් එකෙක්.

එදා රාත්‍රී මගේ හෝටලයට ආව රැන්ඩොල්ෆ් හැරිසන් මට කී කතන්දරය එයයි. නමුත් කතාව එතැනින් අවසාන වෙන්නෙ නෑ.

මම තවත් සතියක් බොස්ටන් නගරයේ රැඳී හිටියා. මං හිතාගෙන හිටියේ, තෝමන් ඕනීල් ප්‍රමාද වෙලා හරි අල්ලගන්න, පිංකටන් භටයන්ට හැකිවේවි කියලයි. මං ඒ දේ තදින්ම අපේක්ෂා කළා.

ඒකට හේතු වුණේ මෙන්න මේ කරුණ. මොවුන් ගැන ඔත්තුවක් ලබාදෙන්න කියලා පුවත්පත්වල පළ කළ දැන්වීමෙ

මගේ නමත් සඳහන් වුණා. හැරිසන් ඒකෙදි මහජනයාට නිවේදනය කළේ, හරි ඔත්තුවක් දෙන අයට පිරිනමන තෑග්ගට, මමත් හවුල් වෙන බව.

ඒ වෙලාවෙ නම් ඒක මගේ හිතේ ඇති කළේ ලොකු සතුටක්. රටේ මහජනයා වෙනුවෙන් සේවයක් සැලසෙන එකකට, එතැනදී මගෙන් දායකත්වයක් ඇතිබව ප්‍රසිද්ධ වීම නිසා. නමුත් ඒක නිසා දැන් මගේ හිතේ ඇතිවුණේ භීතියක්.

නිවුන් අපරාධකාරයන් දෙදෙනෙකුගෙන් එකෙකුගේ ඝාතනයට මාත් හවුල්වෙලා. පණ බේරාගත් එකා මගෙන් පළිගැනීමට හොඳටම ඉඩ ඇති බව මං තේරුම් ගත්තා. විශේෂයෙන්ම උන්ගේ මිත්‍රයන් සහ සහචරයන් ගැවසුණු බොස්ටන්වල. මං රාත්‍රී කාලයේ හෝටලයෙන් එළියට බැස්සේ නෑ. දවල් කාලයෙදි වුණත් මං ගියේ සාමකාමී කියල මට හිතුණු පැතිවලට පමණයි.

තෝමන් ඕනීල් අල්ලාගන්න පොලීසියටවත් පිංකටන්ලටවත් හැකිවුණේ නෑ. ඔහු අතුරුදන්වුණේ කිසිම සලකුණක් නොමැතිව. එතකොට කාගේත් කතාබහට ලක්වුණේ මෙහෙම දෙයක්. සටනේදී ලැබූ බරපතළ තුවාල නිසා ලේ ගලා යාමෙන්, තෝමන් ඕනීල් මියගියාද? තුවාල ලැබූ ඔහු ගඟෙන් පිහිනා යාමට ගොස් දියේ ගිලුණා වෙන්නත් පුළුවනි. එහෙම දෙයක් නිසැකවම සිදුවෙන්න ඇති කියලා, හැරිසන් මහත්මයා හිත හදාගෙන තිබුණා. ඒ බව ඔහු කිව්වෙ, මා එක්සත් ජනපදයෙන් පිටවී එන්න කලින් ඔහුගේ නිවසෙදි, අන්තිම වරට හමුවුණු වෙලාවෙ. කොහොම වුණත් රැන්ඩොල්ෆ් හැරිසන් කියන්නේ පරාජය භාරගන්න සූදානම් කෙනෙකු නොවෙයි. ඒ බව මං මුල ඉඳලම දැන හිටියා.

ආපසු එංගලන්තයට ඒම සඳහා මං සූදානම් වුණා. මං කුටියක් වෙන්කරවා ගත්තෙ, කැනඩා නැව් සමාගමට අයත් වුණු "ඩියුක් ඔෆ් ග්ලෝස්ටර්" නෞකාවේ. ඇන්ඩෲ යෝක් මහත්මියට සහ ඇගේ පුත්‍රයාට ආයුබෝවන් කියල එන්න බැරිවීම ගැන මගේ හිතේ ඇතිවුණේ කණගාටුවක්. නමුත් යළිත් වරක් නිව්යෝක් වෙත යන්න තරම් වෙලාවක් මට තිබුණෙ නෑ. මං හෝටලයෙන් පිටවෙලා ජැටියට ආවා. ග්ලොස්ටර් නෞකාවට පිවිසීමට තරප්පු පෙළ දිගේ යද්දී, මට අහන්න ලැබුණා ඒ ආරංචිය. එදා පුවත්පත්

වල මුල් පිටුවේ සිරස්තලය කියමින් කෑගැසුවේ පත්තර විකිණූ කොලුවෝ.

"තමන්ගේ නිවස අසල මල් උයනේ සක්මන් කරමින් සිටි රැන්ඩොල්ෆ් හැරිසන්, නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වෙලා!"

මං පත්තරයක් මිලදී ගත්තෙ වෙවුළන ඇතින්. කලින් දා හවස සිදුවී තිබුණු දේ මං කියෙව්වේ ඇඩි කම්පනයකින්. රතු කැප් තොප්පියක් පැළඳ සිටි තරුණයෙක්, වෙඩි තැබීම සිදුවුණු තැන ඉඳලා පැන ගිය බව, දකින්න ලැබුණු අය කියා තිබුණා. අපරාධකාරයා සෙවීමේ කටයුතු මේ වෙන කොටත් පටන් අරගෙන. ඒ මොකද හැරිසන් වැනි ප්‍රභූ පංතියේ කෙනෙකු මේ ආකාරයට ඝාතනය වීම, බොස්ටන් නගරයේ ප්‍රධානීන්ට විශාල අපකීර්තියක්. ටෙඩ් මැක්ඩොනල් මේ පරීක්ෂණ සඳහා තම සහයෝගයත් පොලීසියට ලබාදෙන බව පත්තරයේ සඳහන් වුණා.

දෛවයේ සරදමක හැටි කියන කරුණ මට යළිත් තහවුරු වුණා. හැරිසන් සහ මැක්ඩොනල් අතරේ දින කිහිපයකට පෙර ආරවුලක් ඇතිවුණා. රතු කැප් කල්ලිය සම්පූර්ණයෙන් විනාශ කිරීම සඳහා පිංකටන් ආයතනයට විශාල මුදලක් ගෙවීමට, මුලදීම හැරිසන් එකඟ වී තිබුණා. නමුත් අන්තිමේදී මුදල සම්පූර්ණයෙන්ම ගෙවීම හැරිසන් ප්‍රතික්ෂේප කර තිබුණා. ඔහු කියා තිබුණේ අන්තිම වෙලාවේ අතුරුදන්වුණු පුද්ගලයාගේ ශරීරය, මියගොස් හෝ පණපිටින් තමාට භාරදෙන තුරු, රාජකාරිය අවසන් නොමැති බවයි. ඒ පුද්ගලයාගේ ශරීරය තවමත් පණපිටින් බව දැන් කාටත් ඔප්පු වුණා. හැරිසන් ඝාතනය කළ අපරාධකාරයා කවුද යන එක ගැන සැකයක්, කාගේවත් හිත්වල ඇතිවුණේ නෑ.

පුවත්පත කියවලා අවසන් කළ මම කෙළින්ම ගියේ, නෞකාවේ මට වෙන්ව තිබුණු කුටියට. හැන්දෑවේ හය වෙනතුරු මං ඒකෙන් එළියට ආවෙ නෑ. "ඩියුක් ඔෆ් ග්ලොස්ටර්" නෞකාව උස් හඬින් නළා ශබ්දයක් නංවලා, බොස්ටන් වරායෙන් පිටත්වුණා. එතකොටයි මං කාමරයෙන් පිටවෙලා නැව් තට්ටුව මතට ආවෙ. බැස යන හිරුගේ ගින්දර වැනි එළියෙන් බොස්ටන් නගරය නොපෙනී යන හැටි, මං බලාගෙන හිටියේ අප්‍රමාණ සැනසීමකින්.

ඉතින් මහත්වරුනි, මට අහිමිවුණු මහා නිධානයක් වැනි තෙල්සායම් චිත්‍ර ගැනත්, මගේ ඇමරිකා සංචාරය ගැනත් කතාව ඒකයි. මේක සිදුවෙලා දැන් අවුරුද්දකටත් වැඩියි. මේ කතන්දරය මං මගේ හවුල්කාරයා සිඩ්නි ග්‍රීන්වුඩ්ටත් මගේ බිරිඳටත් කිව්වා. ඒ ඇරෙන්න වෙන කාටවත් මෙච්චර කාලයකට කියල නෑ. අර අද්භූත අමුත්තා - කැප් තොප්පියක් පැළඳගෙන මගේ නිවස සමීපයට ආ පුද්ගලයා දකින තුරු මං හිතාගෙන හිටියේ, මේ කතාව කාටවත් යළි කියන්න නොලැබේවා කියලයි" ඔස්කා ලැංකැස්ටර් තම කථාව අවසන් කළේය.

හෝම්ස් තම පයිප්පය අවසන් කර තිබුණේ, කථාව අවසානයට බොහෝ වෙලාවකට පෙරය. තම ඇඟිලි තුඩු එකිනෙකට සමීප කරගෙන සිටි මගේ මිත්‍රයාගේ මුහුණේ දිස්වූයේ, මෙම කතන්දරය බැරෑරුම් අයුරින් සිතට ගත් ආකාරයකි. සෑහෙන වේලාවක් යනතුරු එතැන තිබුණේ ඇඩි නිහඬතාවයකි. අන්තිමේදී මගේ මිත්‍රයා තම ප්‍රශ්නය ඉදිරිපත් කළේය.

"ඔබ හමුවෙන්න ආ අමුත්තා පැළඳ හිටියෙත්, රතු කැප් කල්ලියේ අයගෙ වර්ගයේ කැප් තොප්පියක්ද?"

"හෝම්ස් මහත්මයා, මං හිතුවා ඔබ ඔය ප්‍රශ්නය ඉදිරිපත් කරාවි කියලා" අමුත්තා කීය. "ඒ කැප් තොප්පියත් රතුපාට තමයි. නමුත් ඒක වෙනස් මෝස්තරයක කැප් තොප්පියක්. මේක බොහොම දුරට සමාන වෙන්නේ බේස් බෝල් ක්‍රීඩකයන් පළඳින කැප් තොප්පියට"

"නමුත් ඔබ තදින්ම විශ්වාස කරනවා, මේ මිනිහා තෝමස් ඔනීල් බව? ඔබ හිතන්නේ ඔහු පළිගැනීමට ඔබ සොයාගෙන එංගලන්තයට ආවා කියලද?"

"මේක තේරුම් කරන්න පුළුවන් වෙනත් විධියක් ඔබට පෙනෙනවාද?" අමුත්තා විමසුවේය.

"තේරුම් කළ හැකි විධි නම්" හෝම්ස් කීය. "වැඩිදුර කල්පනා නොකර මේ මොහොතෙම, මට කියන්න පුළුවනි දුසිම් බාගයක්. කොහොම වුණත් ඔබ කියන්න වගේ අත්ලාන්තික් සාගරය තරණය කර මේ ඇවිත් ඉන්නේ, ඔබ කියන තෝමස් ඔනීල් වෙන්න පුළුවනි. නමුත් කෙනෙකු අහන්න පුළුවනි, ඇයි මේ ගමන එන්න ඔහු අවුරුද්දකට වැඩි කාලයක් ගත්තෙ කියලා. ඊළඟට සාන්ත මේරි

දෙව්මැඳුරේදී ඔහු හමුවෙන්න කියලා ඇරයුම් කළේ ඇයි? ඔහුගේ අරමුණ ඔබ මරාදැමීම නම්, ඇයි ඒ මොහොතෙම රිවෝල්වරය ඇදල අරගෙන ඒක නොකළෙ? අනික් කාරණය තමා හමුවීමට තැනක් වෙලාවක් යොදාගත්තට ඇයි ඔහු ආවෙ නැත්තෙ?"

"මං හිතන්නේ ඔහුගේ අරමුණ වෙලා තියෙන්නේ, මාව භයෙන් ත්‍රස්ත කිරීම"

"ඒක සාර්ථක වෙලාද?"

"ඇත්තෙන්ම ඔව්" ලැංකැස්ටර් මහතා කීය. "හෝම්ස් මහත්මයා, එතකොට ඔබ කියන්නෙ මට උදව්කළ හැකි ආකාරයක් ඔබට පෙනෙන්නෙ නැහැ කියලද?"

"මේ මොහොතෙ නම් ඒ හැටි දෙයක් මට කළ හැකියි කියා මං කියන්නෙ නෑ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔබේ මේ අනවශ්‍ය ආගන්තුකයා කවුද කියන එක හොයාගන්න, ඔහු කිසිම හෝඩුවාවක් ඉතිරි කරල නෑ. ඔහු ඉන්න තැනක් සොයා ගත හැකි ලකුණකුත් නෑ. අනික් අතට යම් විදියකින් ඔහු ආපසු ආවොත් මට පුළුවන් වේවි ඔබට උදව් කරන්න."

"එතකොට මොකක්ද ඔබ මට දෙන උපදේශය?"

"ලැංකැස්ටර් මහත්මයා. මට පුළුවනි මෙන්න මේ කාරණය විශ්වාසයෙන් කියන්න. ඔබට හිරිහැරයක් කිරීමේ අදහසක් ඔහුගේ ළඟ නෑ. ඒ නිසා සිතේ සැනසිල්ලෙන් ගෙදර යන්න. මට කියන්න තියෙන්නෙ එච්චරයි"

එහෙත් හෝම්ස්ගේ උපදේශය වැරැදී ගියේය. ලැංකැස්ටර් මහතා ගැන ඔත්තු බලමින් සිටි අමුත්තා මීළඟට වෙනස් ආකාරයක ප්‍රහාරයක් එල්ල කළේය.

III

විදුලි පුවත අප වෙත ලැබුණේ පසුවදා උදෑසන අප දෙදෙනා උදේ තේ පානය කරමින් සිටියදීය.

"ඊයෙ රෑ යළිත් වරක් ඔනිල් ආවා. මගේ සේප්පුව කඩා ඇත. පොලීසිය කැඳවීමි. ඔබටත් පැමිණිය හැකිද?"

ඔස්කා ලැංකැස්ටර්

"වොට්සන් - ඔබ මොනවද ඒ ගැන කියන්නෙ?" හෝම්ස් විමසුවේය.

"මේ තරම් ඉක්මනට ඔහු ආපසු ඒවි කියල ඔබ හිතුවෙ නැහැ නේද?"

"මං හිතුවෙ නෑ කියන්න බෑ වොට්සන්. මේ වගේ දෙයක් සිද්ධවේවි කියල මං විශ්වාස කළා. මේ අනවශ්‍ය ආගන්තුකයා ගේ උනන්දුව මුල ඉඳලම තිබුණේ හැව්ලොක් ලොජ් මැඳුර වෙතයි. නැතුව ඒකෙ අයිතිකාරයා ගැන නොවෙයි"

"එහෙම නම් ගෙවල් බිඳුමක් සිද්ධවෙන බව ඔබ දැන හිටියද?" මම ඇසීමි. "එහෙම එකේ ඔබට තිබුණා ලැංකැස්ටර්ට ඒ ගැන අනතුරු ඇඟවීමක් කර තබන්න"

"මං ඒ වෙලාවෙ ඔහුට කියූ දේ ඔබට මතකද වොට්සන්? "ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව, ඊට වඩා ඉදිරියට යන්න මට හැකියාවක් නෑ." නමුත් දැන් තත්ත්වය වෙනස් වෙනවා. මේ අනවශ්‍ය ආගන්තුකයා දැන් අපට උදව් වෙන්න තීරණය කරලා. ඔහු ගෙට ඇතුළුවෙන්න ඇත්තෙ ජනේලයක් කඩාගෙන. මල් උයන, මිදුල හරහා ඔහු ඇවිදගෙන යන්න ඇති; මල් පාත්තියකට පා තබන්න ඇති; අඩි සලකුණු වදින විදියට කලාළයක් උඩින් ඇවිදගෙන යන්න ඇති. අඩුම වශයෙන් මේවායින් අපට දැනගන්න හැකිවේවි ඔහුගේ උස සහ බර; ඊට අමතරව ඔහු ඇවිදින කොට කොර ගැසීමක් තිබෙනවාද යන කරුණු. ආභරණ මොනවා හරි ඔහු සොරකම් කරගත්තා නම්, ඒවා විකිණීමට ඔහුට සිද්ධවෙනවා. යම් ආකාරයක හෝඩුවාවන් කීපයක් වත් ඔහු ඉතිරිකර ගිහින් ඇති. කිංස්ටන් කියන්නේ දුම්රිය කිහිපයකම යන්න පුළුවන් තැනක් නේ. ඔබ එනවද මා එක්ක යන්න?"

"ඇත්තෙන්ම ඔව් හෝම්ස්"

අප හැව්ලොක් ලොජ් මැඳුර වෙත ළඟාවන විට, උදේ එකොළහට ළංවී තිබිණ. මෙම දැකුම්කලු මැඳුර මට එක්වරම සිහිකළේ දැවැන්ත රන් ආභරණ මංජුසාවකි. ඒ තැන මිල කළ නොහැකි සිතුවම් එකතු කරන්නෙකුටම ගැළපෙන තැනක් විය. ජෝර්ජ් රාජ යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය අනුව ඉදිකොට තිබූ මෙම මැඳුර, අලංකාර උද්‍යානයක් මැද පිහිටා තිබිණි. ගෙමිදුලේ එක් පැත්තක ඉතාලි මෝස්තරයට සැකසූ වතුර මලක් විය.

අප සඳහා දොර විවෘත කරන ලද්දේ, අලංකාර ලෙස හැඳ පැළඳගෙන, එහෙත් ළතැවෙන මුහුණෙන් සිටි මැදිවියේ සේවකයෙකු විසිනි. බිත්ති සැරසිලි හා සිතුවම් එල්ලා තිබූ

කොරිඩෝවක් මැදින්, ඔහු අප කැඳවාගෙන ගියේ විසිත්ත කාමරය වෙතයි. මේ වනවිට පොලීසිය පැමිණ පරීක්ෂා කොට පිටව ගිය බව අපට අසන්නට ලැබිණ. හොඳින් හැඳ පැළඳ ගෙන සිටි ගෙහිමියා, තම බිරිඳ සමග කතා බහ කරමින් සිටි ආකාරය අපි දුටුවෙමු. විශාල අලාභ හානියක් සිදුවූ අයුරක් ඔහු වෙතින් නම් දිස් නොවීය. කෙසේ වෙතත් අප දුටු වහාම ඔහු අසුනෙන් නැගිට්ටේය.

"හෝ හෝ! ඔබ ආව එහෙනම්. හෝම්ස් මහත්මයා. ඔබ ඊයේ නේද මට කිව්වෙ තෝමස් ඕනිල් කියා මං හිතන මිනිහගෙන් භයවෙන්න දෙයක් නැහැ කියල? ඒ වුණාට ඔහු ඊයෙ රෑ ජනේලයක් කඩාගෙන ගෙට ඇතුළුවෙලා. ඔහුට මගේ යකඩ සේප්පුවෙන් ගන්න හැකිවෙලා තියෙන්නේ, පවුම් පනහක් සහ රන් ආභරණයක් පමණයි. මගේ බිරිඳ තදින්ම නින්ද නොයන කෙනෙකුවීම හොඳට ගියා. එහෙම නොවෙන්න හොරා ඊළඟට මොනවා කරන්න හිටියද කියල කවුද දන්නෙ?"

ඔහු අසල හිඳගෙන සිටි කාන්තාව වෙත මගේ අවධානය යොමු කළෙමි. ශරීර ප්‍රමාණයෙන් ඒ තරම් උස - මහත නොවූවත්, ඇය රූමතියක වූවාය. ඇගේ වයස අවුරුදු තිහක් පමණ විය යුතු යයි මම අනුමාන කළෙමි. ඇගේ මුහුණේ දක්නට ලැබුණේ බුද්ධිමත් එමෙන්ම ආත්ම විශ්වාසයෙන් අඩු නොවූ එඩිතර බවකි. ඒ ගැන මම පැහැදුණෙමි. ඇගේ රත්වන් පැහැති දිගු කෙස් වැටිය එකතු කොට හිසේ පිටුපස වන්නට "කොණ්ඩයක්" බැඳ තිබිණි. ඇගේ දෙනෙත් දීප්තිමත් නිල් පැහැයකින් බැබළුණු අතර, පිරුණු තොල් සඟල ඕනෑම මොහොතක සිනාවීමට සූදානමින් තිබිණ. වාම් අත්දිගු හැට්ටයකින් සැරසී සිටි ඇගේ ගෙල වටා, අලංකාර මුතු දෙපොටක් දුටුවෙමි. මගේ ආදරණීය බිරිඳ මේරි සිහිගන්වන යම් යම් ලක්ෂණ මේ කාන්තාව සතුවද ඇතැයි මට එක්වරම සිතිණි. තම ස්වාමිපුරුෂයා වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමට, මෙම කාන්තාව තුළ කැපවීමක් මෙන්ම උද්‍යෝගයක් ඇතැයි යන කරුණ, ඇය වචනයක් හෝ කථා කිරීමට පෙර මම තේරුම් ගත්තෙමි.

"මේ මගේ බිරිඳ මේරියන්" සැමියා ඇය හඳුන්වා දුන්නේය.

"ඔබ වෙන්නැති ෂර්ලොක් හෝම්ස් මහත්මයා? ඔබට විදුලි පුවතක් යවන්න; ඔබ ඉක්මනින් පැමිණේවි කියල මමයි ඔස්කාට කිව්වෙ. ඉක්මනින් ඒම ගැන ඔබට ස්තුතියි"

"සිත් අවුල් කරවන සිදුවීමකට, ඔබ ඊයෙ රෑ මුහුණදුන් බව මට අහන්න ලැබුණා........?" හෝම්ස් කීය.

"......... ඔව් මහත්මයා." ඇය කීවාය. "මගේ සැමියා මේ දැන් ඔබට කියුවා වගේමයි. පුංචි ශබ්දයක් ඇසී ඊයෙ රෑ මට ඇහැරුණා. මං වෙලාව බැලුවා. එතකොට තුනයි විස්සයි. ඔස්කාට තදින්ම නින්ද ගිහින් තිබුණු නිසා මං ඔහුව අවදි කළේ නෑ. ඒ මොකද මට හිතුණේ ඒ ශබ්දය නැගෙන්න ඇත්තේ, රාත්‍රියේ ගැවසෙන බකමූණකු හෝ වවුලෙකුගේ අත්තටු, ජනෙල් වීදුරුවක වැදීමෙන් වෙන්න ඇති කියලා. සම්පූර්ණයෙන්ම පිරුණු හඳේ එළිය, ජනෙල් වීදුරුවෙන් කාමරය තුළට වැටී තිබුණා. මීළඟට මට තවත් ශබ්දයක් ඇසුණා. ඒක ඇහුණේ ගේ ඇතුළෙන්. එතකොටයි මං තේරුම් ගත්තේ කලින් මගේ සිතට නැගුණු සිතිවිල්ල වැරදි බව. මං ඇඳෙන් නැගිටලා ඩ්‍රෙසිං ගවොමක් හැඳගෙන පහළ තට්ටුවට බැස්සා."

"ඔයා කරලා තියෙන්නේ මහ මෝඩ වැඩක්" ලැංකැස්ටර් කීය. "ඔයාට අනතුරක් සිදුවෙන්න ඉඩ තිබුණා"

"එහෙම දෙයකට ඇති ඉඩක් ගැන මට ඒ වෙලාවෙ හිතුණෙ නෑ. ඇත්තම කියනවා නම්, මේ ශබ්දය එන්න ඇත්තේ ගෙට ඇතුළුවුණු හොරෙකුගෙන් කියලා, මට නිකමටවත් හිතුණෙ නෑ. සමහරවිට ඒ වින්සන්ට් හෝ ඔහුගේ බිරිඳ නැත්නම් පීටර් විය යුතුයි කියලයි මට හිතුණේ. ඔයා දන්නවානේ ඒ කොල්ලා පීටර් ගැන මගේ කිසිම විශ්වාසයක් නැති බව. මං මේ විසිත්ත කාමරය දිහා හොඳින් බැලුවා. කිසිදෙයක් අවුල් වී නෑ. මොකක් හරි හේතුවක් නිසා මාව ඊළඟට යැවුණේ කන්තෝරු කාමරයට"

"ඔබේ අතේ ලන්තෑරුමක් තිබුණද?" හෝම්ස් විමසීය.

"නැහැ මහත්මයා." ඇය කීවාය. "හඳ එළිය හොඳටම ප්‍රමාණවත් වුණා. මං දොර විවෘත කළා. ජනේලය ළඟම බිම මං ඔහුව දුටුවා. ඔහුත් මා දකින්න ඇත්තෙ ඒ මොහොතෙමයි. අපි දෙන්නා එකිනෙකාගේ මුහුණු බලාගෙන ගල්ගැසී බලාසිටියා. මුලදී මට කෑගැහුණෙ නෑ. ඊළඟට ඔහු ඉක්මනින්ම ජනේලයෙන් නොපෙනී ගියා. පහළ තණබිස්ස මතට ඔහු වැටුණු ශබ්දය මට ඇහුණා. මගේ උගුරෙන් විලාපයක් නැගුණේ ඒ වෙලාවෙයි"

"අපි තව ටිකකින් ඔබේ යකඩ සේප්පුව සහ කන්තෝරු කාමරය සෝදිසි කර බලමු" හෝම්ස් කීය. "ඊට කලින් මට මේක

කියන්න. ඔබ ඇමරිකානු කාන්තාවක බව ඔබේ ඉංග්‍රීසි උච්චාරණයෙන් මං තේරුම් ගත්තා. ඔබ දෙදෙනා විවාහ වෙලා හුගක් කල්ද?"

"ඔස්කා සහ මං විවාහ වෙලා දැන් අවුරුදු එකහමාරක් පමණ වෙනවා"

"මට මේරියන් හමුවුණේ කොහොමද කියන එක, මං ඔබට කලින් කිව යුතුව තිබුණා හෝම්ස් මහත්මයා" ලැංකැස්ටර් කීය. "ඒක සම්බන්ධ වෙන්නේ, ඊයෙ මං ඔබට කියූ කතන්දරයට. මේ ප්‍රශ්නයට ඒක වැදගත් වෙන එකක් නැහැ කියල හිතලයි මං ඒක නොකීවෙ."

"හැමදේකම තියෙනවා වැදගත් කමක්" හෝම්ස් කීය. "සමහර වෙලාවට මුලදී කිසිම වැදගත් කමක් නැහැ වගේ පෙනෙන කරුණු අන්තිමේදී අතිශයින්ම වැදගත් වෙනවා"

"අප දෙදෙනා මුලින්ම හමුවුණේ "ඩියුක් ඔෆ් ග්ලොස්ටර්" නෞකාවෙදි." මේරියන් ලැංකැස්ටර් මහත්මිය කතාව ඇරඹුවාය.

"ඒ නැව බොස්ටන් වරායෙන් පිටත්වෙලා, නැගෙනහිර දෙසට යාත්‍රා කරන්න පටන් අරගෙන දෙවැනි දවසෙ. මං යාත්‍රා කළේ තනියම. එහෙම කිව්වාට මගේ තනියට හා ආරක්ෂාවට ගැහැනු ළමයෙකුත්, නැවේ මගේ කුටියට යාබද කුටියේ මා කැඳවාගෙන ගියා. පිටත්වුණු දා හැන්දෑවෙමත් පසුවදා උදේ තේ පානය වෙලාවෙත්, මට ඔස්කා දකින්න ලැබුණා. නමුත් ඔහු සමග මිත්‍රකමක් ඇතිකරගන්න මට උවමනාවක් තිබුණෙ නෑ. දෙවැනි දවසෙ දහවල් ආහාරය සඳහා භෝජනාගාරයේ අප දෙදෙනාට අසුන් පැනවී තිබුණෙ එකළඟ. සේවකයෙකු අප ළඟින් පෝට්වයින් වීදුරුව බැගින් තබා ගියා. ගැඹුරු කල්පනාවකට වැටී සිටි ඔහුගේ අතක් වැදී, වයින් වීදුරුව පෙරළුණා. මගේ අලුත්ම ඇඳුම වයින් වලින් පෙඟී දුර්වර්ණ වුණා. ඒ වෙලාවේ මගේ සිතේ තරහක් ඇතිවුණා. නමුත් ඔහු ඒ ගැන කම්පා වී සමාව ඉල්ලා ආයාචනය කළ පිළිවෙළට මගේ තරහ නිවී ගියා. ඒ සමගම අප දෙදෙනා අතර ඇතිවුණු කතාබහ තමා හිතවත්කමකට හැරුණේ"

"මේරියන් නොහිටින්න අත්ලාන්තික් සාගරය හරහා කළ ගමන මං කොහොම කරන්නද කියලා මට හිතාගන්නවත් බෑ" ලැංකැස්ටර් මහතා කීවේ කථාවේ ඉතිරි කොටස කීමට පටන් ගනිමිනි.

"මහා භයංකර විධියට රැන්ඩොල්ෆ් හැරිසන් ජීවිතක්ෂයට පත්වුණාම, මගේ මොළය සම්පූර්ණයෙන්ම අවුල් වුණා. වටිනා සිතුවම් විනාශ වී කැලැඹීමටත් කම්පාවටත් පත්ව හිටි මම, මේ ඝාතනයෙන් පිස්සු නොවැටුණා විතරයි. තද හිස කැක්කුමක් සැදී උණ රෝගයෙන්ද පෙළුණු මගේ දැත් දෙපා දිගින් දිගටම වෙව්ළුවා. මගේ අසහනය ගැන විමසූ මේරියන්ට මං කතන්දරය කිව්වා. ඉන්පසු ඇය හැමවිටමත් කියුවේ මගේ හිත සනසන දේවල්. ඒකෙන් මගේ හිතට දැනුණු සැනසීම හා සතුට අප්‍රමාණයි. මට තිබුණු ලෙඩ රෝග සියල්ල හිරු දුටු පිණි වගේ වාෂ්ප වී ගියා. මගේ හිතේ ඇය ගැන ඇතිවුණේ දැඩි ආදරයක්. එය මෝරා වැඩීමට කිසිම බාධාවක් තිබුණේ නැහැ. අන්තිමේදී අපේ නැව එංගලන්තයට ළඟාවෙන විට, එක් කාරණයක් මං සාක්ෂාත් කරගත්තා. ඒ තමයි, මගේ ජීවිතයේ ඉදිරි කොටස ගෙන යාමට මං කැමතිම ආකාරයේ සහකාරිය මං තෝරාගෙන අවසන් බව."

"එතකොට ඔබට එංගලන්තයට එන්න හිතුණේ කුමක් නිසාද?" හෝම්ස් විමසුවේ ලැංකැස්ටර් මහත්මිය දෙසට හැරෙමිනි.

"හෝම්ස් මහත්මයා. මං මුලින් චිකාගෝ නගරයේදී විවාහ වුණු කෙනෙක්" ඇය කීවාය. "නමුත් ඒ විවාහය තිබුණේ ඉතාම කෙටි කාලයයි. මගේ ඒ සැමියා ධනවත් දේපළ වෙළඳාම් කරුවෙක්. ඒ වගේම කඩවසම්. විශ්ව විද්‍යාලයෙන් ඉහළටම අධ්‍යාපනයක් ලැබූ ඔහු, සමාජයේ ගෞරවයට පාත්‍රවුණු කෙනෙක්. නමුත් ඔහු කිසි දවසක මට කරුණාවක් දැක්වූ කෙනෙකු නොමෙයි. අධික ලෙස කෝපයට පත්වුණු ඔහු මට පහර දුන් අවස්ථා තිබුණා. ඒ හින්දම මගේ ජීවිතයේ ආරක්ෂාව ගැන මගේ හිතේ භයක් ඇතිවුණා. අපේ විවාහ ජීවිතයේ අන්තිම මාස කිහිපයේ, ඔහු මට ගෙදරින් එළියට බහින්න ඉඩ දුන්නෙ නෑ. ඒ මං විඳින දුක ගැන මගේ මිතුරියන් සමග කියාවි කියන සැකය නිසා. නමුත් අන්තිමේදී මොකද වුණේ. ක්ෂණික කෝපයෙන් වියරුවී, මගේ සැමියා විසින් පහකර දමනු ලැබූ ඔහුගේම ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක් සැමියාගෙන් පළිගත්තා. ඔහු මගේ සැමියාට වෙඩි තබා මරා දමා, තමන්ගේ ජීවිතයත් හානිකර ගත්තා.

එයින් මං පත්වුණේ තවත් අසරණ තත්ත්වයකට. අපට අයිතිව තිබුණු ගෙවල් සහ ඉඩම් සියල්ල ඔහු ලියා තිබුණේ, ඔහුගේ සොහොයුරියන් සිව්දෙනා නමට. මා සතුව තිබුණේ මුල් කාලයේ මට ලැබී මා ඉතිරි කරගත් මුදල් ස්වල්පයක් පමණයි. ඇමරිකාවේ

රැඳී සිටිමින් රැකියාවක් කිරීමට උගත් කමක්වත්, ව්‍යාපාරයක් කිරීමට දැනුමක් හෝ දේපළක් වත් මට තිබුණේ නෑ. මා ගැන සොයා බලන්න ඥාතීන් වත් හිටියේ නෑ. ඉතින් මං තීරණය කළා එංගලන්තයට ඇවිත් ජීවිතය අලුතෙන් අරඹන්න." කී ඇය තම සැමියාගේ අතින් අල්ලාගෙන කථාව සම්පූර්ණ කළාය. "කොහොම වුණත් මං හිතුවේ නෑ, මගේ ජීවිතයේ මට කවදාවත් නොලැබුණු සතුට හා වාසනාව, මේ තරම් ඉක්මනට මාව හොයාගෙන ඒවි කියලා"

"ඔබේ තනියට කැඳවාගෙන ආ ගැහැනු ළමයෙකු ගැන ඔබ කලින් කිව්වා. ඇය කවුද?" හෝම්ස් විමසුවේය.

"ඇය මං කලින් හඳුනන කෙනෙකු නෙමෙයි. මං ඇයව බඳවා ගත්තේ පුවත්පතක පළකළ දැන්වීමක් මගින්. මේ රටට පැමිණි වහාම ඇගේ රැකියාව අවසන් කර ආපසු යවන්න මට හැකිවුණා"

"දැන් ඉතින් අපි ඔබේ කන්තෝරු කාමරය පරීක්ෂා කර බලමු" හෝම්ස් කීවේ හිඳ සිටි තැනින් නැගිටිමිනි. "අපි බලමු හොරා ඉතිරි කර ගිහින් තියෙන්නේ මොනවද කියලා?"

නමුත් අප එතැනින් පිටවීමට පෙර තවත් කාන්තාවක් එතැනට පැමිණියාය. ඇය සේවිකාවක නොව, මේ ගෙදර පවුලේ තැනැත්තියක බැව් මම වටහා ගතිමි. අළු පැහැති පරණ ඇඳුමකින් සැරසී සිටි ඇගේ මුවේ, සිනාමුසු බවක් නොවීය. ඇගේ පෙනුම මේරියන් ලැංකැස්ටර්ට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් විය. නමුත් ගෙහිමියාගේ කොණ්ඩයේ හා දෙනෙත්වල පැහැයටත් මුහුණුවරටත් සමාන කමක්, මම මේ අලුත් කාන්තාව තුළ දුටුවෙමි. එබැවින් ඇය ගෙහිමියාගේ සොහොයුරියක විය යුතු යයි නිශ්චය කළෙමි.

"දැන් මොකක්ද කරන්න හදන්නෙ?" ඇය විමසුවේ ආචාරශීලී බවකින් තොරවය. "ඉස්සර වෙලා පොලිස් කාරයො ආවා. ඔවුන් මගෙන් ඇහුවේ මට කොහොමටවත් පිළිතුරු දෙන්න බැරි විකාර ප්‍රශ්න. ඒක මදිවෙලාද? අපේ පෞද්ගලික දේවල් අපි මුළු ලෝකෙටම දැනුම් දෙන්න ඕනෙද?"

"අයිලීන්. මේ තමයි ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මං ඔබට කිව්වෙ, ඊයෙ මං ඔහු හමුවෙන්න ගියා කියල"

"මොකක්ද ඒකෙන් ඇතිවුණු ප්‍රයෝජනේ?" ඇය විමසුවේ උපහාසාත්මක සිනාවක් මුවගට නගා ගනිමිනි. "මෙයා කිව්ව නේද ඔස්කා, එයාට කළ හැකි කිසිම දෙයක් නැහැ කියලා? ඒ උපදෙස්

නම් අපූරුයි. තව ටිකෙන් අප හැම දෙනෙකුම ඇඳේ නිදාගෙන ඉඳිද්දීම මරා දමන්න ඉඩ තිබුණා"

"මේ මගේ අක්කා අයිලින්" ලැංකැස්ටර් කීවේ සමාව අයදින ස්වරයකිනි. "මේ දවස්වල ටිකක් අසනීපෙන් ඉන්නෙ"

"ඔබත් පදිංචි මේ ගෙදරමද?" හෝම්ස් ඇයගෙන් විමසීය.

"අපොයි ඔව්" ඇය කීවාය. "අනික් අයගේ ඇහැට නොපෙනී, මට පාඩුවේ ඉන්න පුළුවන් කාමරයක්, මට ලැබිලා තියෙනවා සොල්දරයේ. අනික් අයත් ඒ පිළිවෙළට කැමති බවයි මට නම් පෙනෙන්නෙ. මමත් පවුලේ කෙනෙකු තමයි. ඒ වුණාට ගෙදර වැඩ කාරයන්ට කතා කරන තාලෙට මට කතා කළත් ප්‍රශ්නයක් නෑ"

"එහෙම කියන එක අසාධාරණයි නේ අක්කා" මේරියන් මහත්මිය කීවාය.

"ඔබට පුළුවන්ද මේ ගෙදර සිටින පදිංචිකරුවන් ගණන මට කියන්න" හෝම්ස් ඉල්ලා සිටියේ ලැංකැස්ටර් මහතා දෙසට හැරෙමිනි.

"මායි මේරියනුයි ඇරෙන්න උඩුමහලේ ඉන්නවා අයිලීන්" ලැංකැස්ටර් මහතා කීය. "ඔබව මෙතැනට කැඳවාගෙන ආව වින්සන්ට් ඉන්නවා. ඔහු තමයි ප්‍රධාන මෙහෙකරු වගේම, හැම වැඩක්ම අපට කරදෙන පුද්ගලයා. ඔහුගේ බිරිඳ තමයි කුස්සියේ වැඩ සහ ගෙදර පවිත්‍රතාවය ගැන සොයා බලන්නේ. ඔවුන්ගේ පදිංචිය පහළ තට්ටුවේ. තවත් ඉන්නවා අලුතෙන් අපට ලැබුණු ඉලන්දාරියෙක්. ඒ වින්සන්ට් මහත්මියගේ බෑනා - පීටර්. මෑතකදී අයර්ලන්තයෙන් මෙහේට ආ ඔහු, කුස්සියේ වැඩකටයුතුවලට උදව් වෙනවා. ඒ වගේම අපේ පණිවුඩ රැගෙන එහෙ මෙහෙ යන්නෙත් ඔහු ම යි. එතැනින් ගියාම තවත් ඉන්නේ: මුළුතැන් ගෙයි සේවිකාව මිලී - ඇය වයස්ගත කාන්තාවක්. මගේ බිරිඳට උදව්වෙන තරුණිය - ග්ලැඩිස්. මීට අමතරව අශ්ව කරත්තයේ රියැදුරා සහ අශ්වයන් බලාගන්නා සේවකයා ඉන්නවා. නමුත් ඔවුන් පදිංචි ගම්මානයේ."

"සෑහෙන තරම් ලොකු සේවක මණ්ඩලයක්" හෝම්ස් කීය. "කොහොම වුණත් දැන් අපි සේප්පුව පරීක්ෂා කර බලමු"

අයිලීන් ලැංකැස්ටර් මෙනෙවිය ඇය සිටි තැනම රැඳී සිටියාය. අපි සියලු දෙනා විසිත්ත කාමරයෙන් පිටවී, බරාඳයක ගමන්කොට කන්තෝරු කාමරය වෙත ළඟාවූයෙමු. ප්‍රමාණයෙන් විශාල වූ, සිතුවම් වලින් සහ අලංකාර තිර රෙදි වලින් වර්ණවත් වූ, කාමරය

ගැන විස්තර කිරීමට මම බලාපොරොත්තු නොවෙමි. අපේ කථාවට අදාළ යකඩ සේප්පුව තිබුණේ කාමරයේ මුල්ලකය. අතිශයින්ම ශක්තිමත් එකක් බැව් පෙනුණු එය තවමත් විවෘතව තිබිණි.

"ඔබ මේක දකිනකොට තිබුණෙ මේ විදියටද?" හෝම්ස් විමසීය.

"පොලීසිය මෙය සෝදිසි කළා" ලැංකැස්ටර් කීය. "ඔබ එනතුරු මේක ඒ විදියටම තබන එක වඩා හොඳයි කියා මට සිතුණා"

"ඉතාම නිවැරදියි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මේකෙ අගුළ කැඩූ බවක් පෙනෙන්නෙ නෑ. එය ඇරල තියෙන්නෙ යතුරකින්"

"මේකට තියෙන්නෙ එක යතුරයි. ඒක හැමවිටම තියෙන්නෙ මා ළඟ" ගෙහිමියා කීය. "මෙහේ පදිංචියට ආ දිනවලම මේරියන්ට සිතුණා මේකට වෙනම යතුරක් ඇය ළඟ තියෙනවා නම් හොඳයි කියලා. ඒ මොකද ඇය ආභරණ තියන්නෙ මේ සේප්පුව තුළ. මාස හයකට විතර කලින් මං වින්සන්ට කිව්වා මේකට අමතර යතුරක් හදවන්න කියලා. කලාකෘති වෙන්දේසි වලට මං රටේ වෙනත් නගරවලට යනවා. සමහර වෙලාවට යුරෝපයටත් යනවා. අමතර යතුර ඒ වෙලාවලදි ඇයට ප්‍රයෝජනවත් වුණා."

"ඒ යතුර මා අතින් නැතිවුණා" මෙසේ කීවේ අප පිටිපස කාමරයට පැමිණි මේරියන් ලැංකැස්ටර් මහත්මියයි.

"ඒ කොයි කාලෙද?"

"මට ඒක හරියටම කියන්න බෑ හෝම්ස් මහත්තයා" ඇය කීවාය. "සමහරවිට ඒ මාසෙකට විතර කලින්....... නැත්නම් ඊටත් කලින්ද මං දන්නෙ නෑ. ඔස්කායි මමයි මේ කාරණය ගැන සාකච්ඡා කළා. සති කිහිපයකට කලින් අපට උවමනා වුණා සේප්පුව ඇරගන්න. නමුත් මගේ යතුර සොයාගන්න බැරිවුණා. අන්තිම වරට මං මේ සේප්පුව විවෘත කළේ මගේ උපන්දිනය දවසේ. ඒ කියන්නෙ අගෝස්තු මාසයේ. ඒක මට ස්ථිරයි. ඊට පස්සෙ යතුරට මොකක් වුණාද? මට ඒක හිතාගන්නවත් බෑ. සාමාන්‍යයෙන් නම් මං නොසැලකිලිමත් කෙනෙකු නෙමෙයි"

"යතුර කවුරු හරි හොරකම් කළාවත්ද?"

"යතුර මං හැමවිටම කියල තිබුණේ එකම තැනක. ඒ මගේ ඇඳ ළඟ තිබෙන ලාච්චුවේ. යතුර මේ ගෙදරින් පිට නොගිය බව නම් මට හොඳටම විශ්වාසයි"

"ඔබ දෙදෙනා හැරුණු විට ඔය කියන ලාච්චුව ළඟට යන්න එන්නෙ කවුද?"

"සේවක සේවිකාවන් විතරයි"

"යතුරක් නැතිවුණු නිසා මේ සේප්පුව අයින් කරලා, වෙනත් එකක් ගන්න ඔබ හිතුවෙ නැද්ද?" හෝම්ස් විමසුවේ ගෙහිමියා ගෙනි.

"ඒක කරන්න ඕන දෙයක් කියල මගේ හිතේ තිබුණා" ඔහු කීය. "නමුත් අනික් අතට මට හිතුණා ඒක අත්‍යවශ්‍ය නොවන වැඩක් කියල. ඒ මොකද මගේ බිරිඳගේ අතින් යතුර වැටෙන්න ඇත්තෙ ගමේ කොහේ හරි, නැත්නම් උද්‍යානයේ කියල හිතමු. නමුත් ඒක අහුලා ගත්ත කෙනෙකුට හිතාගන්න අමාරුයි, මේකෙන් අරින්න පුළුවන් මොකක්ද කියල. අනික් අතට මගේ බිරිඳගේ ඇඳුම් හෝ බඩු අතරට යතුර අස්ථාන ගත වෙලා නම් ඒකෙන් ප්‍රශ්නයක් නෑ. ඒ මොකද එහෙම නම්, ඒක වැරැදි කෙනෙකු අතට පත් නොවන නිසා. කොහොම වුණත් ඊයෙ රෑ සේප්පුව ඇරීමට යොදා ගත්තෙ මගේ බිරිඳ ළඟ තිබුණු අමතර යතුරම ද කියලා විශ්වාසෙට කියන්න අමාරුයි. ඒ මොකද අමතර යතුරක් කප්පවන්න ගිය වෙලාවෙ වින්සන්ට හැකියාව තිබුණා, තවත් අමතර යතුරක් කප්පවා ගන්න"

"ඔහු ඔබ ළඟ සේවය කරන්න වෙලා දැන් කොච්චර කල්ද?"

"අවුරුදු හයයි"

"කියන්න තරම් මොකක් හරි ලොකු වැරැද්දක් ඔහුගේ තියෙනවාද?"

"මොකුත්ම නෑ"

"එතකොට මේ අලුතෙන් එකතුවුණු තරුණයා - පීටර් කොහොමද? ඔබේ බිරිඳ නම් කියන්නේ ඔහු ගැන ඇයට විශ්වාසයක් නැහැ කියලයි"

"ඔව් ඒක ඇත්ත. මගේ බිරිඳ පීටර්ගේ පිළිවෙළට අකමැති වෙන්න එක හේතුවක්, ඔහුගේ ගරු සරුවක් නොමැති කම. අනික ඇයට දකින්න ලැබී තිබුණා, ඔහුගේ කපටිකම් වරක් හෝ දෙවරක්. නමුත් ඔහු වංචනිකයෙකු බව පෙන්වන සිදුවීම් නම් නැහැ. අපි පීටර් රැකියාවට ගත්තේ වින්සන්ට් මහත්මියගේ ඉල්ලීම නිසා. රැකියාවක් නොමැතිව සිටි ඔහුට පිහිටවෙන මෙන් ඇය ඉල්ලා හිටියා"

තම උත්තල කාචය අතට ගත් හෝම්ස් එය ආධාරයෙන් සේප්පුවේ අගුළ පරීක්ෂා කළේය. ඒ සඳහා සෑහෙන වේලාවක් ගත කළ ඔහු, මීළඟ ප්‍රශ්නය යොමු කළේද ලැංකැස්ටර් මහතා වෙතයි.

"ඔබ කිව්වා රන් ආභරණ වගයකුත් සොරකම් කර ඇති බව. ඒ ඔබේ බිරිඳට අයත් ඒවාද?"

"නැහැ. ඇත්තෙන්ම ඒක මගේ අම්මාට අයිතිව තිබූ ආභරණයක්. අම්මා ටික කලකට පෙර මියගියා. නිල් මැණික් කිහිපයක් මල් පොකුරු තුනක ආකාරයෙන් සකසා තිබුණේ රත්රන් මාලයක. ඒක විකුණා මුදලක් ලබා ගන්න හොරාට හැකිවේවි. මට නම් ඒක හුඟක්ම වටින්නෙ පෞද්ගලික සිහිවටනයක් හැටියටයි. ඇය මේ ගෙදර අප සමගයි ජීවත්වුණේ. මාස කිහිපයකට කලින් හදිසියේ........"

ලැංකැස්ටර් මහතා එතැනින් ඉදිරියට කථාකරගත නොහැකිව කතාව නැවැත්විය. එයට හේතුව මව සිහිවීමෙන් ඇතිවූ ශෝකය බැව් මම තේරුම් ගතිමි. ඔහු වෙතට ළං වූ ලැංකැස්ටර් මහත්මිය සැමියාගේ ඇතින්ම අල්ලා ගත්තේ සෙනෙහෙබර ආකාරයෙනි. ඔහුට කිසිවක් කීමට නොහැකි බව දුටු ඇය, සැමියා කීමට උත්සාහ කළ දේ සම්පූර්ණ කළාය.

"......... ගෙදරදී සිදුවුණු හදිසි අනතුරකට මුහුණ දීමට ඇයට සිදුවුණා. ඇගේ කාමරයේ ගෑස් උදුන නිවී ගොස්, දිගටම ගෑස් කාන්දු වීම නිසා ඇය හුස්ම හිරවීමෙන් මිය ගියා"

"ඇය හුඟක් වයස් ගතව සිටියද?"

"ඇයට හැත්තෑ හතරයි. හැමවිටම කාමරයේ ජනේල තදින් වසා තැබීමටයි ඇයට උවමනා වී තිබුණේ. ග්‍රීෂ්ම සෘතුවේ පවා ඒක වෙනස් කළේ නෑ. එහෙම නොවෙන්න ඇයට ජීවිතය බේරගන්න තිබුණා."

සේප්පුව අත්හැර ජනේලය ළඟට ගිය හෝම්ස් ජනෙල් පඩිය, ජනේලයේ රාමුව හා පියන් පරීක්ෂා කළේය.

"ජනෙල් පියන පිටතින් ආයුධයක් දමලයි විවෘත කරල තියෙන්නෙ" හෝම්ස් තමාටම කියාගත්තේ පරීක්ෂාව සිදුකරන අතරතුරය. "ඇවයේ පතුරු ගැලවී ගිහින් තියෙනවා. ලැංකැස්ටර් මහත්මියට ඇසුණු ශබ්දය ඒකයි."

ඉන්පසු හෝම්ස් කථා කළේ ගෙහිමියාටය. "මං කැමතියි ඔබේ සේවකයා වින්සන්ට් සමග කතාකරන්න. ඊට පස්සේ මං ගෙමිදුලේ

සහ උද්‍යානයේ ඇවිද පරීක්ෂා කර බලන්නම්. ඒකෙන් නම් යමක් හොයාගන්න හැකිවේවි කියා මං හිතන්නේ නෑ. ඒ මොකද පොලීසිය ඇවිත් සෝදිසි කරල ගියා නම්, ලබාගන්න තියෙන සුළු හෝඩුවාවක් වුණත්, ඔවුන්ගේ සපත්තු වලට පෑගී පොඩිවී ඇති. ඔවුන්ගේ පරීක්ෂණය යොමුවී තිබෙන්නේ කුමන දිශාවකටද කියා ඔවුන් කියුවාද?"

"ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ ලෙස්ට්‍රේඩ් මහත්මයායි මෙහි පැමිණියේ........"

"මොනවා ලෙස්ට්‍රේඩ්?"

"ඔව්. හෝම්ස් මහත්මයා. ඔහු ගැන ඔබේ තියෙන අදහස මොකක් වුණත්, ලෙස්ට්‍රේඩ් මහත්මයා දක්ෂයෙකු බවයි මට පෙනුණේ. ඔහු මේ වෙන කොටත් වැදගත් කරුණක් හොයාගෙන. කිංස්ටන් දුම්රියපොළෙන් ලන්ඩන්බ්‍රිජ් දුම්රියපොළට යන පළමුවැනි දුම්රිය තියෙන්නේ උදේ පහට. ඇමරිකානු උච්චාරණය තියන මිනිහෙක් ඒකෙ ගමන් කරල තියෙනවා. ඔහුගේ දකුණු කම්මුලේ තිබුණු කැපුම් තුවාලයේ කැළල සහ, ඔහු හැඳ පැළඳ ගෙන සිටි ආකාරය අනුව, ඒ කවුද කියන එක ගැන සැකයක් නෑ. ඒ තමයි මගේ ගෙදර ළඟ කරකැවෙමින් ඔත්තු බැලූ පුද්ගලයා"

"මේකට සම්බන්ධ වී ඉන්න රහස් පරීක්ෂකයා ලෙස්ට්‍රේඩ් නම් ඔහු ඉතාම ඉක්මනින් නිශ්චිත නිගමනයකට පැමිණෙනවා. ඒ බව මට සහතික කර කියන්න පුළුවනි. ඔබට සුභ දවසක් ලැංකැස්ටර් මහත්මයා. ඔබ හමුවීම අපට සතුටක් ලැංකැස්ටර් මහත්මිය. එන්න වොට්සන්. අපි මේ පැත්තෙන් යමු. අපේ රාජකාරි මෙතැනින් අවසන් වෙන්නෙ නෑ........"

කොරිඩෝව දිගේ ආපසු ගොස්, අපි යළිත් වරක් ඉදිරිපස දොරටුවට ළඟාවූයෙමු. වින්සන්ට් අප එනතුරු එතැන බලා සිටියේය. මේ නිවසේ සිදුවූ සාමාන්‍ය කටයුතුවලට අපෙන් සිදුවූ බාධාව නිසාදෝ, ඔහු සිටියේ සතුටු මුහුණකින් නොවේ. අත්‍යවශ්‍යම වචන කිහිපය පමණක් කටින් පිටකරන පුද්ගලයෙකු වූ වින්සන්ට්, හෝම්ස්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේ හැකි තරම් කෙටියෙනි.

"ඔබ මේ මැදුරේ සේවය කරන්න පටන්ගෙන කොච්චර කල්ද?"

"අවුරුදු හයයි"

"ඔබේ බිරිඳ කොහෙන්ද?"

"අයර්ලන්තයේ - ඩබ්ලින්"

"ඔබ මෙහේ රැකියාවට ආව කාලයට වඩා, මෑත කාලයේ මෙහේ හුඟක් වෙනස්කම් සිදුවෙලාද?" හෝම්ස් විමසීය.

"ඔව් මහත්මයා. මියගිය ලැංකැස්ටර් මහත්මියගේ පිළිවෙළ එක විදියක්. ඇය යමක් හිතුවොත් හිතුවාමයි. ඒක වෙනස් කරන්න කාටවත් බෑ. ඇයගේ හිතට අල්ලන්නේ නැති යමක් තිබුණා නම්, ඇය ඒක කෙළින්ම මූණටම කිව්වා. මේරියන් තරුණ නෝනා ඒකෙ සම්පූර්ණ අනික් පැත්ත. ඇයගෙ පිළිවෙළ හැම තිස්සෙම බොහොම ප්‍රියමනාපයි. මගේ බිරිඳ නම් කියන්නේ, ඒ වගේ අලුත් වෙනසක් ලැබීම සතුටට කරුණක් කියලයි."

"ලැංකැස්ටර් මහත්මයා විවාහ වුණු එක ඔබට ලොකු සතුටක් වුණාද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. අප්‍රමාණ සතුටක් වුණා. ඒ වගේම පුදුමයටත් පත්වුණා"

"පුදුමයට?"

"මට අයිති නැති දේවල් මං කතාකරන එකත් වැරැදියි. මං එහෙම කිව්වෙ මොකද දන්නවද? වෙනදාට එතුමා තමන්ගෙ අම්මගෙයි අක්කගෙයි වැඩ කටයුතු ගැන හොයා බලමින් හිටියා. ඒ මිසක් තමන්ගේ විවාහයක් ගැන හිතුවෙ වත් නෑ. මේරියන් නෝනා හදිසියේම මෙහේට ආවාම, අපට දැනුණේ ලොකු වෙනසක්"

"වයස්ගත ලැංකැස්ටර් මහත්මිය මියගිය අවස්ථාව ඔබට මතකද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. ඒ මරණයට යම් ප්‍රමාණයකට මාත් වැරැදිකාරයෙක්ද කියලා, වෙලාවකට මට හිතෙනවා. කාමරය ඇතුළට සීතල සුළං එන එකට, වයස්ගත ලොකු නෝනා දැක්වූයේ හරි භයක්. ඒ හින්දා ඇගේ ඉල්ලීම අනුව දොරවල් යට, ජනේල අයිනේ තිබුණු පුංචි පුංචි සිදුරු, හැම එකක්ම මං අවහිර කළා."

"ඉතින්?"

"ඒ හේතුව නිසා කාන්දුවුණු ගෑස්වලට එළියට යන්න විදියක් තිබුණෙ නෑ. පහුවදා උදේ ග්ලැඩිස් - මෙහෙකාරියට තමයි මරණය දකින්න ලැබුණෙ. කාමරය ගෑස්වලින් පිරී තිබුණා. ඇත්තෙන්ම මහා භයංකර සිදුවීමක්"

"ඔබේ ඥාති පුත්‍රයා පීටර්, ඒ සිදුවීම වෙනකොට මේ ගෙදර රැකියාවට ඇවිත්ද?"

"ඔහු ඇවිත් සතියයි ගතවී තිබුණේ. ඉතාම අශුභ විධියේ ආරම්භයක්"

"ඔහුත් ඩබ්ලින් නගරයෙන්මද?"

"ඔව් මහත්මයා. කිසිම රැකියාවක් නැතිව, ඔහු අන්තිම අසරණ අඩියට වැටිලා හිටියේ. නමුත් මෙහෙම තැනක රැකියාව කරන්න ඕන පිළිවෙළ ගැන, ඔහු තවමත් හරි හැටි තේරුම් අරගෙන නැහැ. විශේෂයෙන්ම නිවසේ ස්වාමියාට, ස්වාමිදූවට ඕන හැටි, ගරු සරු කළයුතු හැටි ගැන ඔහුට තේරුමක් නෑ. ඔහු නරක ඉලන්දාරියෙක් නෙමෙයි. කල් යද්දි මේව ඉගෙන ගනීවි"

"ඔබට ස්තුතියි වින්සන්ට්"

"ඔබටත් එසේමයි මහත්මයා. ඔබේ කබාය සහ අත්වැසුම් මා ළඟ........"

"කමක් නෑ වින්සන්ට්. මං මල්උයනේ ටිකක් ඇවිදලා එන්නයි හිතුවේ."

බේකර් වීදියේ ඝන මීදුම අප පිටුපස පැමිණ නැති නිසා, එළිමහනේ ඇවිදින්නට මගේ මිත්‍රයාට සිතෙන්නට ඇත.

"මේක හරි අපූරු සිදුවීමක් කියල ඔබට හිතෙන්නෙ නැද්ද වොට්සන්?" ඔහු විමසුවේ මල්උයන දෙසට පා නගමිනි.

"පවුම් පනහක මුදලක් සහ පරණ මාලයක් විතරයි අරගෙන තියෙන්නෙ" මම කීවෙමි. "ඔබේ බුද්ධියට අභියෝග කරන්න තරම් දෙයක් මෙතැන තියෙනවා කියල මට නම් හිතෙන්නෙ නෑ"

"මෙතැන වඩාත්ම සිත් ඇද ගන්නා කාරණය ඒ පරණ මාලය. ඔබට මේ ගැන මොකක් හරි අදහසක් තියෙනවද?"

"මේ ගෙදරට ආව අනවශ්‍ය අමුත්තා නෝමන් ඕනීල්ද, එහෙම නැද්ද කියන එක උඩයි, හැම දෙයක්ම තීරණය වෙන්නෙ. එහෙම නේද හෝම්ස්." මම ඇසීමි.

"වොට්සන්. මට පෙනෙන හැටියට මෙන්න මේ හරියෙන් තමා අමුත්තා ගෙවත්තට ඇතුළුවෙලා තියෙන්නේ"

අප පැමිණ සිටියේ ගෙවත්ත අවසන් වී, ගමේ තණබිම ඇරඹෙන තැන පිහිටි පටුමග වෙතය. වැඩී තණකොළ කපා දමා නිසිලෙස පවත්වාගෙන ගිය ගෙවත්ත සහ ශීත කාලගුණය, හෝඩුවාවන් එකතුව සඳහා කදිම තෝතැන්නක් වී තිබිණි. පසුගිය විසිහතර පැය තුළ පැමිණි හා පිටවී ගිය සෑම දෙනෙකුගේම පා සටහන්, එතැන සලකුණු වී තිබෙනු දුටුවෙමු.

"මට වැරදීමක් නොමෙයි නම්, මෙතනින් ඇවිදගෙන ගිහින් තියෙන්නේ ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය.

"ඔබ කොහොමද එහෙම කියන්නේ?"

"එහෙම කියන්නෙද?" මගේ මිත්‍රයා විමසීය. "එක පියවරක දිග අනුව මට කියන්න පුළුවනි. මේ අඩි පහයි අඟල් හයක් උස - ඒ කියන්නේ ලෙස්ට්‍රේඩ්ට සමාන උසක පුද්ගලයෙකුගේ පා සටහන් කියල. ඔහුගේ සපත්තුවේ පා ඇඟිලි ප්‍රදේශය හතරැස් - තිසැකවම පොලිසියේ බූට් සපත්තු. මේ පා සටහන් ඔහුගේ බවට හොඳම සාක්ෂිය මං කියන්නද? ඒවා වැටී තියෙන්නේ සම්පූර්ණයෙන්ම වැරැදි දිශාවට. කිසිම දෙයක් හරියට නිරීක්ෂණය නොකොට, හෝඩුවාවත් නොපෙනී වැරදි පැත්තටම ඇවිද ගියොත්; ඒ වෙන කවුද ලෙස්ට්‍රේඩ් මිස? ගෙදරට· පැමිණෙන කෙනෙකුට පහසුවෙන්ම ඇවිත් යන්න පුළුවන්, දකුණු පැත්තේ තිබෙන ගේට්ටුවෙන්. ඒක තමා ඕනම කෙනෙකුට මුලින්ම හමුවෙන්නේ. කොහොම නමුත් අමුත්තා පැමිණ තියෙන්නේ අනෙක් පැත්තෙන්"

"හෝම්ස්. මට නම්, ගේට්ටු දෙකම පෙනෙන්නේ එකම ආකාරයට."

"ගේට්ටු දෙක හැම අතින්ම සමාන බව ඇත්තයි. නමුත් අර වතුර මල නිසා වම්පැත්තේ ගේට්ටුව එච්චර පහසුවෙන් දිස්වෙන්නේ නෑ. කාටවත් නොපෙනී ගෙදරට ඇතුළුවෙන්න ඔබ බලාපොරොත්තු වෙනවා නම්, ඔබ තෝරාගත යුත්තේ වම් පැත්තේ ගේට්ටුව. දැන් ඔබට පෙනෙනවා ඇති, ඒ පැත්තෙන් වැටී තිබෙන්නේ එකම පුද්ගලයෙකුගේ අඩි සටහන් පමණක් බව. හො හෝ! මේ මොකක්ද?"

පහතට නැමුණු හෝම්ස් බිම තිබූ යමක් අහුලාගෙන මට පෙන්වීය.

"ඇමරිකන් සිගරට්ටුවක් වොට්සන්. දුම්කොළ වල වැරදීමක් වෙන්න හැටියක් නෑ. මේ කිට්ටුවක සිගරට් අළු නොමැති බව ඔබට පෙනේවි"

"සිගරට් කොටයක් තිබෙනවා. නමුත් අළු නැත්තේ ඇයි?"

"ඔහුගේ අරමුණ වුණේ කාටවත් නොපෙනී සිටීම වුණාට, ඔහු වැඩි වේලාවක් මෙතැන හිටියෙ නැහැ. ඒකෙ වැදගත් කමක් ඔබට පෙනෙන්නෙ නැද්ද? එහෙම වුණත් ඔහු ඉක්මනින් ඇවිද ගිහින් තියෙනවා"

අපි අඩි සටහන් අනුව තණබිම් කඩ හරහා ඇවිද ගොස් කන්තෝරු කාමරයේ ජනේලය වෙත ළංවීමු.

"තමන් පරෙස්සම්ද කියල සැක හැර දැනගන්න, වතුරමල ළඟ මඳකට නවතින්න ඔහුට හැකියාව තිබුණා. නමුත් ඔහු එහෙම කරල නැහැ."

අප නිවස තුළ සිට පරීක්ෂා කළ ජනේලය, හෝම්ස් දැන් පිටත සිට පරීක්ෂා කළේය.

"ඔහු අසාමාන්‍ය ශරීර ශක්තියක් ඇති පුද්ගලයෙකු වගෙයි" ඔහු කීය.

"ජනේලය ඇරගැනීම ඔහුට එච්චර අමාරු වැඩක් වුණා කියල හිතන්න බැහැ" මම කීවෙමි.

"ඒක ඇත්ත වොට්සන්. නමුත් බලන්න ජනේලය තියෙන්නේ කොයිතරම් ඉහළින්ද කියල. තමන්ගේ වැඩේ ඉවර කළාට පස්සෙ ඔහු ජනේලයෙන් බිමට පැන්න තැන ඔබට දකින්න පුළුවනි. එතැන ඉතිරි කරල තියෙනවා පොළොවට ගැඹුරට වැදුණු පා සටහන් දෙකක්. ඉණිමඟක් හෝ පුටුවක් උදව් කරගත් බවට සලකුණක් නෑ. ඔහුට සිදුවුණා ආයුධයක ආධාරයෙන් ජනෙල් පියන ඇර ගන්නා තුරු, අනික් අතින් ජනෙල් පඩියේ එල්ලී සිටින්න. යකඩ සේප්පුව තිබුණු කාමරයේ ජනේලයම කඩා, ඔහු ඒකටම ඇතුළුවීම අහඹු සිදුවීමක්ද? ඒක අපි අපෙන්ම විමසලා බලන්න ඕන."

"කෙනෙකුට තමන්ව දැකීමට තිබෙන අවස්ථාව අඩු නිසා, ඔහු මෙතැනට ආවෙ ගේ පිටුපස ඉඳලා. ඊටපස්සේ ඔහු දුටු ජනෙල්වලින් එකක් අහඹු ලෙස තෝරාගන්න ඇති"

"සිදුවුණේ ඒ විදියට නම් ඔහු හරි වාසනාවන්තයි." කී හෝම්ස් තම පරීක්ෂාව නිම කළේය. "රන් මාලයකට මල් පොකුරු තුනක් විදියට සවිකළ, නිල්මැණික් සහිත සුවිශේෂ විධියට සැකසූ මාලයක් උකස් තබා තිබෙනවා විය හැකියි. එහෙම නම් ඒක හොයාගැනීම අමාරු වෙන්න බෑ. ඒක අපව කෙළින්ම හොරා දෙසට යොමු කරන්න ඉඩ තියෙනවා. අමුත්තා ලන්ඩන් බ්‍රිජ් දුම්රියපොළ දක්වා දුම්රියෙන් ගමන් කළ බවට ලෙස්ට්‍රේඩ් සහතික කරනවා. අප කළ යුත්තේත් ඒ දේමයි. අද දීප්තිමත් දවසක්. දුම්රිය පොළට ඒ හැටි දුරක් නෑ. අපට පුළුවනි ඇවිදගෙන යන්න."

අපි නිවසේ ඉදිරිපස මිදුල හරහා ඇවිද ගියෙමු. අපේ බලාපොරොත්තුව වූයේ අප මෙහි පැමිණි පාරට ළඟාවීමය. නමුත්

ඊට පෙර හැව්ලොක් ලොජ් මැඳුරේ ඉදිරි දොර විවෘත විය. එතුළින් එළියට පැමිණි කාන්තාවක් අප ඉදිරියේ නැවතුණාය. ඒ ලැංකැස්ටර් මහතාගේ සොයුරිය වූ අයිලීන් ලැංකැස්ටර් මෙනෙවියයි. මවිතයෙන් විවෘත කර ගත් දෙනෙත්වලින් සහ අවුල් වී සුළගේ පාවූ කෙස්වලින්, අපට එක් කරුණක් තේරුම් ගැනීමට හැකිවිය. එනම් ඇය සිටින්නේ කැලැඹුණු සිතකින් බවය.

"හෝම්ස් මහත්මයා!" ඇය උස් හඬින් අප ඇමතුවාය.

"ඔව්. ලැංකැස්ටර් මෙනෙවිය?"

"ගේ ඇතුළෙදී මං ඔබට කථා කළේ අකාරුණික විදියට. ඒකට මට සමාවෙන්න. නමුත් මං ඔබට කිව යුතුයි. දැන් මේ ගෙදර කිසිම දෙයක් ඔය මතුපිටින් පෙනෙනවා වගේ සුන්දර නෑ. මේ ගෙදරට ළඟාවෙලා තිබෙන ශාපයෙන් ඔබ අප බේරාගත යුතුයි. නැත්නම් අපි විනාසයි."

"ලැංකැස්ටර් මෙනෙවිය. ඔබ කතාකරන්නෙ ලොකු සිත් වේදනාවකින්?"

"අරකි තමයි මේ විනාශයට මුල" අයිලීන් මෙනෙවිය පැවසුවේ ආපසු හැරී නිවස දෙසට ඇඟිල්ල දිගු කරමිනි. "මේරියන් හේග්. ඒක තමයි පළමුවැනි කසාදෙන් ඇයට ලැබිල තියෙන නම. ඔස්කා හැමදාමත් හරිම අහිංසක සංවේදි කෙනෙක්. ළමා කාලයේ එයාට තිබුණු ස්වභාවයෙන් එයා තවමත් වෙනස් වෙලා නෑ. බොස්ටන් වලදි එයාට මුහුණ දෙන්න වුණු සිදුවීම්වලින් එයා පත්වුණේ හරි කම්පනයකට. මට හිතාගන්න පුළුවනි. ඔහු ඉන්න ඇත්තේ පිස්සු හැදුණු මිනිහෙක් වගේ. ඒ වෙලාවෙ තමයි එයාව සනසවන්න එයාව බලාගන්න, කවුරු හරි ඔස්කා ළඟින්ම ඉන්න ඕන වෙලාව. එංගලන්තයෙදි එහෙම දෙයක් වුණා නම්, ඔහුව බලාගන්න මායි අම්මයි ඉන්නවා. නැවේ ඒකට කිසි කෙනෙක් හිටියෙ නෑ. මේ යක්ෂ ගෑනි අසරණ ඔස්කාව රවටා ගත්තා. තමන් ළඟ කිසිම මුදලක් නැති, වැදගත් නෑ පරපුරක් තියා කිසිම ඥාතියෙකු නැති ඇය, අහසින් කඩා වැටුණු ගැහැනියක්. මට ඔක්කොටම වඩා ඉවසන්න බැරි ඇය, දික්කසාද වුණු ඇමරිකන් ගැහැනියක වීම. දවස් ගණනක් මුහුද මැද ගත කරද්දී ඒකිට වියන්න පුළුවන් වුණා දැලක්. ඒක මොන විදියකටවත් බේරිලා යන්න බැරි දැලක්. ඔහු ආපසු ගෙදර එනකොට ප්‍රමාද වැඩියි. අර ගෑනිව හිතෙන් අත් අරවන්න අපට බැරිවුණා."

"ඔබට හැකියාව තිබුණා ඔහු ගැන බලාගන්න?"

"සොහොයුරියක් හැටියට මං ඔහුට ආදරෙයි. මගේ අම්මත් එහෙමයි. මගේ අම්ම මියගියේ හදිසි අනතුරකින් කියල කොහොමටවත් හිතන්න එපා හෝම්ස් මහත්තයා. අපි වැදගත් පරම්පරාවක මිනිස්සු. මගේ තාත්තා ලන්ඩනයට සංක්‍රමණය වුණේ ලැංකෂයර් ප්‍රාන්තයෙන්. ඔහු තමයි ස්ටැන්මෝ උද්‍යානයේ චිත්‍ර අලෙවිකරන තැන පටන් ගත්තේ. අපේ අවාසනාවට අපි කුඩා කාලයේම ඔහු මිය ගියා. අපි මෙච්චර කල් ජීවත් වුණේ සමගියෙන් සහෝදරත්වයෙන්.

ඔස්කා කසාද බඳින එක ගැන අපේ විරුද්ධත්වයක් තිබුණෙ නෑ. ඔහුගේ සතුට තමයි අපේ සතුට වුණේ. නමුත් මේරියන් හේග් කසාද බැඳ ගන්න ඔහුට උවමනා බව කිව්වාම, අම්මා ඒකට හොඳටම විරුද්ධ වුණා. ඔහුගේ හිත වෙනස් කරන්න ඇයට හැකිවුණේ නෑ. ඒකෙන් ඇගේ හදවත බිඳුණා. මේරියන්ට උවමනා වුණේ ඔස්කාගෙ සල්ලි, තනතුර; ඒකෙන් ඇයට සමාජයේ හිමිවෙන තැන ආරක්ෂාව ආදිය විතරයි.

හෝම්ස් මහත්මයා. මගේ අම්මා ඇගේ ජීවිතය නැතිකරගත්තා. සිතේ ඇතිවුණු ලැජ්ජාව හා කලකිරීම නිසා ඇයට ජීවත් වෙන්න පුළුවන් කමක් තිබුණෙ නෑ. ඔය මගුලෙන් මාස හයක් ගතවෙද්දි කාමරයේ ගෑස් කරාමය ඇරගෙන අම්මා ජීවිතයෙන් සමුගත්තා."

"ඇය මෙහෙම දෙයක් කරන්න අදහස් කරන බව ඔබ එක්ක කියා තිබුණද?" හෝම්ස් විමසීය.

"එහෙම දෙයක් කියන්න උවමනා වුණේ නෑ. ඇගේ හිතේ තිබුණෙ මොකක්ද කියන එක මම දැනගෙන හිටියා. ඇය ඒ විදියට මරණයට පත්වෙලා ඔවුනට හමුවුණාම, මං පුදුමයට පත්වුණේ නෑ. හෝම්ස් මහත්මයා. ඔය ඇමරිකන් ගෑනි මේ ගෙදරට පා තැබුව දවසෙ ඉඳලා, මේ ගෙදරට ළඟාවුණේ අවාසනාව.

දැන් අලුත්ම වැඬේ ගෙදරට හොරු පැනපු එක. ඔවුන් අම්මගේ මාලයත් අරගෙන ගිහින්. ඇය අපට ඉතිරි කරල ගිහින් තිබුණු වටිනාම වස්තුව ඔය මාලෙ. ඔය හොරා මේ ගෙදරට ඇවිත් තියෙන්නෙ මල්ලිගෙන් පළිගන්න කියල මං හිතන්නෙ නෑ. ඒ හොරා ඇවිත් තියෙන්නෙ ඇය හමුවෙන්න නෙවෙයිද කියල, අපි කොහොමද දන්නෙ? බාග වෙලාවට ඒ ඇය හොයාගෙන ඇගේ පිටුපසින් ආව, ඇගේ පරණ මිත්‍රයෙක් වෙන්නත් පුළුවනි. හෝම්ස්

මහත්මයා, මට හිතෙන්නෙ මේක තමා පටන් ගැන්ම. මේ කසාදය පවතින තුරු, මේ ගැනි මේ ගෙදර ඉන්න තුරු අපි කිසි කෙනෙකුගෙ ජීවිත පරෙස්සම් නෑ."

"ඒ වුණාට ඔබේ සොහොයුරා නම් ඉන්නේ ලොකු සැනසීමකින් සතුටකින්" හෝම්ස් කීය. "අපි ඒක අමතක කරමු. මං මොන වගේ දෙයක් කළ යුතුයි කියලද ඔබ යෝජනා කරන්නෙ? අනික තමන්ගේ මවගේ හරි සොහොයුරියගේ හරි ආශිර්වාදය නොලැබුණත්, තමන් කැමති කෙනෙකු විවාහ කරගන්න පිරිමියෙකුට අයිතියක් තියෙනවා"

"ඔබට පුළුවනි ඇගේ යටගියාව සහ පෞද්ගලික තොරතුරු හොඳින් පරීක්ෂා කර බලන්න"

"ලැංකැස්ටර් මෙනෙවිය. ඒක මට අයිති වැඩක් නෙමෙයි"

අයිලීන් ලැංකැස්ටර් මෙනෙවිය ඇසි පිය නොහෙළා හෝම්ස් දෙස බලා සිටියාය. ඇගේ මුහුණේ පිළිබිඹු වූයේ ක්‍රෝධයයි. ඇගේ දෙනෙත්වලින් වෛරයේ ගිනි පුළිඟු පිටවූවා යයි මට සිතිණි. අන්තිමේදී ඇය කථා කළාය.

"හෝම්ස් මහත්මයා. ඔබ කළ පරීක්ෂණ ගැන ඔබේ හපන්කම් මං පොත පතෙන් කියවා තිබෙනවා. ඒවා අතිශයෝක්තියෙන් කළ විස්තර කියා මට හැමවිටම හිතුණා. ඔබ කොයිතරම් දක්ෂයෙක් වුණත්, මානුෂික හැඟීමක් නැති කෙනෙකු කියලයි මට එවිට හිතුණේ. ඒක සම්පූර්ණ සත්‍යයක් බව දැන් මට තේරෙනවා"

කථාව අවසන් කළ ඇය ආපසු හැරී නිවස තුළට ගියාය. ඇය ආපසු යන ආකාරය හෝම්ස් නිහඬව බලා සිටියේය.

"ගැහැනියක් ඒ තරම් කෝපයෙන් ඔබ ඉදිරියේ කතා කරනවා මං කවදාවත් දැකල නැහැ." මම කීවෙමි.

"හරිම අපූරුයි" මගේ මිත්‍රයා කීය. "මේ සිද්ධිවීම එන්න එන්නම සංකීර්ණ වෙනවා. ඒ වගේම හිතේ කුතුහලය වැඩි කරනවා. ඒ වගේම කාටත් ඉදිරියේදී යම් කිසි භයානක තත්ත්වයන්ට මුහුණ දීමට සිද්ධවෙන බව මට හොඳටම විශ්වාසයි"

IV

පසුවදා උදෑසන හෝම්ස් ප්‍රමාද වන තුරු නිදා ගත්තේය. මේරි මා වෙත එවා තිබූ ලිපියක් උදේ තැපෑලෙන් මා වෙත ලැබිණි.

කැම්බර්වෙල්හි ෆොරෙස්ටර් මහත්මියගේ නිවසේ හැම දෙයක්ම හොඳ අතට හැරී තිබිණි. නව හැවිරිදි රිචඩ් අසනීපයෙන් සුවය ලබමින් සිටින බව මේරි සඳහන් කළාය. තම පැරණි ගුරුතුමිය යළි පැමිණීම, රිචඩ්ගේ සතුටට හේතු වී තිබිණ. ෆොරස්ටර් මහත්මිය හැමවිටම මේරිට සැලකුවේ පැරණි සේවිකාවකට මෙන් නොව හිතවත් මිතුරියකට සලකන ආකාරයෙනි. එබැවින් මෙම නිවසේ කාලය ගතකිරීම සතුටක් බැව් මේරි පැවසුවාය.

ඇයට පිළිතුරක් ලිවීමේ අරමුණෙන් මා පෑන අතට ගත්තා පමණි. සීනුව නාද කරන හඬත් සමග මට අසන්නට ලැබුණේ කිහිප දෙනෙකු තරප්පුව නැග ඉහළට එන ශබ්දයයි. මේ මගේ මිත්‍රයාගේ රහස් පරීක්ෂක කටයුතුවලට සහාය වූ, බේකර් වීදියේ කොලු රැළ විය යුතුය යන්න මගේ නිගමනය විය.

"විගින්ස්!" මම කීවෙමි. "මොකද අද හදිසියෙම?" මා විමසුවේ විසිත්ත කාමරයට කඩාවැදී ජේළියට සිටගත් කොලු රැළේ නායකයාගෙනි.

"හදිසි උවමනාවක් හින්දා ඉක්මනට ඇවිත් හමුවෙන්න කියලා හෝම්ස් මහත්මයා පණිවුඩයක් එවල තිබුණා"

ශබ්දය ඇසී හෝම්ස් සිය කාමරයේ සිට විසිත්ත කාමරයට එද්දීම, හඩසන් මහත්මියද උඩුමහලට පැමිණියාය. කොලු රැළේ කරදරය විටෙක ඇය මුවින් නොබැණ ඉවසුවාය. එහෙත් මෙදින නම් ඇයට නිහඬව සිටීමට හැකි නොවන බැව් මම තේරුම් ගතිමි.

"හෝම්ස් මහත්මයා. මං ඔබට කලින්ුත් කියල තියෙනවා, මේක වැදගත් ගෙදරක්. වීදිවල රස්තියාදු වෙන කොල්ලන් මේ විදියට ගෙදරට කඩාවැදීම මට නම් තවත් ඉවසන්න බෑ. එයාල මොන මොන ලෙඩරෝග විෂබීජ ගෙවල් ඇතුළට ගෙනෙනවාද කියල දෙයියො තමයි දන්නෙ. ඊළඟට ගෙදරින් පිටවෙලා යද්දි, රිදී හැඳි ගැරුප්පු පිහි වගේ ඒවා, කීයක් අතුරුදන් වේවිද කියලා දෙයියොවත් දන්නෙ නෑ."

"මට සමාවෙන්න හඩසන් මහත්මිය" හෝම්ස් කීවේ මඳ සිනාවක්ද සමගය. "විගින්ස්! මං මීට කලින්ුත් කියල තියෙනවා නේ. ඔබේ හමුදාවම මේ විදියට ගේ ඇතුළට අරගෙන එන්න එපා. ඔබ පමණක් ආවාම හොඳටම ඇති. අනික් අය අවශ්‍ය වෙනවා නම් මං කියන්නම්."

මෙයට හිස නැමූ හඩසන් මහත්මිය එතැනින් පිටවී පහළ තට්ටුවට බැස්සාය.

"විගින්ස්. මේ සැරේ අපි හොයන්නේ ඇමරිකන් කාරයෙක්" මගේ මිත්‍රයා කීවේ දැඩි අවධානයකින් නෙත් යොමාගෙන සිටි කොලුවන් රංචුවටයි. "එයාගෙ වයස අවුරුදු තිස් පහක් විතර. සමහර වෙලාවට රතු කැප් තොප්පියක් පළඳිනවා. දකුණු කම්මුලේ තියෙනවා මෑතකදී සිදුවුණු තුවාලයකින් ඇතිවූ ලොකු කැළලක්. ඔහු ලන්ඩනයට අමුත්තෙක් කියල අපට හිතන්න පුළුවනි. ඊයේ ඔහු ලන්ඩන් බ්‍රිජ් දුම්රිය පොළේ දකින්න ලැබිල තියෙනවා. ගෙදරකින් හොරකම් කරගත්තු රන් ආභරණයක් ගැනයි, අපි ඔහුව හොයන්නේ. ඒක මල් පොකුරු තුනක හැඩයට නිල් මැණික් තුනක් ඇමිණූ රන් මාලයක්. සැකයක් නෑ ඔහු ඒක රන්බඩු උකස් ගන්නෙකුට විකුණලා මුදල් අරගෙන ඇති. මේ ගැන හොයලා බලන්න ඕන කොහේ කියලද ඔබට හිතෙන්නෙ?"

"ෆීල්ඩ් පටුමගේ හරි පිංචිං පටුමගේ යුදෙව් කඩේක ඇති" විගින්ස් කීය.

"ආදිපාද වීදියෙ" තවෙකෙක් කීය.

"ඔහු කොහේට ගියාද කියල අපට කියන්න අමාරුයි" හෝම්ස් කීය. "ඒ මොකද ඔහු මේ නගරයට අමුත්තෙකු නිසා. ඔහු ලන්ඩන්බ්‍රිජ් වෙත ළඟාවුණු නිසා, ඔහු නවාතැන් ගන්න ඇත්තෙ, ඒ කිට්ටුව නවාතැන් පොළක හෝ බෝඩිමක විය යුතුයි. මේ පුද්ගලයා ගැන තොරතුරක් හොයාගත් වහාම මට දැනුම් දෙන්න. මගේ ගාස්තු පරණ විදියටමයි. එක්කෙනෙකුට සිලිමක් ගණනේ. හරි තොරතුරක් හොයාගත් එක්කෙනාට පවුම් බාගයයි."

"හොඳමයි මහත්මයා" විගින්ස් කීවේ හිස නමා ආචාර කරමිනි. ඔහු දූන් සංඥාව අනුව සියල්ලෝම නිවසින් පිටවී ගියහ.

"ඔනීල් ගැන ආරංචියක් ලබාගන්න හැකිවේවි කියල ඔබට විශ්වාසයි වගේ?" මා කීවේ හෝම්ස් හාන්සි පුටුව මත වැතිරෙද්දීය.

"හැව්ලොක් ලොජ් එකට කඩාවැදුණු මිනිහ ගැන හොයාගන්න පුළුවන් වේවි කියල, මගේ විශ්වාසයක් තියෙනවා."

"ඔබ නොහිතුවට හෝම්ස්, ඔය උකස් කරුවන්ගෙන් ලෙස්ට්‍රේඩ් හොයල බලාවි ආභරණය ගැන"

"ඒක නම් මට සැකයි වොට්සන්. කොහොම වුණත් අද සම්පූර්ණ දවසම අප ඉදිරියේ තියෙනවා. මට උදේ කෑමත් වැරදුණා. ඒ නිසා අපි යන ගමන් සිම්සන්ගේ අවන්හලට ගොඩවැදිලා දවාලටත් එක්ක කමු. ඊට පස්සේ අප යායුතු තැනක් ගැන මගේ හිතේ තියෙනවා. ඒ තමයි ස්ටැන්මෝ උද්‍යානයේ පිහිටි ලැංකැස්ටර්-ග්‍රීන්වුඩ් කලාගාරය. සිඩ්නි ග්‍රීන්වුඩ් මහත්මයා හඳුනාගෙන ඉඳීමත් හොඳයි. ආරංචියක් අරගෙන විගින්ස් ආවොත් ඔහු එතැනට එවන්න කියල අපි හඩ්සන් මහත්මියට කියල යමු."

අපි නිවසින් පිටවී රීජන්ට් උද්‍යානය දෙසට ඇවිද ගියෙමු. එය ජනයා වීදිවලට හා උද්‍යානයට පිවිස ඔබ මොබ සැරිසැරූ දීප්තිමත් දිනයක් විය. මංසන්ධි කිහිපයකම වයලීන වාදනය කරමින්, මවුත් ඕගන පිඹිමින්, මුදලක් උපයා ගැනීමට උත්සාහ දැරූ දූප්පතුන් දක්නට ලැබිණ. ඒ සෑමදෙනෙකු වටේම සෑහෙන ප්‍රේක්ෂක පිරිසක් ද විය. සිම්සන්ගේ අවන්හලේදී අප වෙනුවෙන්, ඉතා ප්‍රණීත භෝජනයක් පිළිගැන්විණි. මගේ මිත්‍රයා ප්‍රීති ප්‍රමෝදයට පත්ව සිටියේය. අප හමුවේ ඇති ගැටලුව ගැන වචනයක් හෝ නොකී ඔහු, පසුගිය ශතවර්ෂ තුනක විසූ ප්‍රංශ හා ඕලන්ද චිත්‍ර ශිල්පීන් ගැන කථා කළේය. අද ඔහුගේ චිත්‍රවලට රසිකයන් පවුම් මිලියන ගණනින් ගෙවුවද, සුප්‍රකට ප්‍රංශ චිත්‍ර ශිල්පී ෆ්‍රැගොනාඩ් අන්ත දුගියකු ලෙස අගුපිලක මියගිය බව හෝම්ස් කීය. තෙල් සායම් සිතුවම් ගැනත්, විශිෂ්ට චිත්‍ර ශිල්පීන් ගැනත්, මගේ මිත්‍රයාට තිබූ දැනුම ගැන මම මවිතයට පත්වීමි.

"වොට්සන් ඔබට මතකද හැව්ලොක් ලොජ් මැදුරේ විසිත්ත කාමරයේ ප්‍රදර්ශනය කර තිබූ චිත්‍ර?"

"මට මතක නෑ"

"බොහොමයක් ඒවා රෙනොවා, සෙසාන් හා ජාක් ලුවි ඩේවිඩ් වැනි ප්‍රංශ චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර" හෝම්ස් කීය. "ඒ හැම එකක්ම අතිශයින්ම වර්ණවත් ප්‍රකාශන චිත්‍ර. ඒකෙන් තේරුම් ගන්න පුළුවනි, ඔස්කා ලැංකැස්ටර් වෛවර්ණ පරිසරයක් තුළ ජීවත්වෙන්න කැමති කෙනෙකු බව"

"ඒකට මට එකඟවෙන්න බෑ හෝම්ස්. අපි කොහොමද දන්නෙ, ගෙදර අලංකාර කරන්න චිත්‍ර තේරුවෙ ඔහු ද කියල. සමහරවිට ඔහුගේ මියගිය මව නැත්නම් බිරිඳ, ඒ චිත්‍ර තේරුවා වෙන්න පුළුවනි"

"ඔව්. ඔබේ මතයත් නිවැරදියි වොට්සන්. දැනුයි මට මතක් වෙන්නෙ බේකර් වීදියේ අපේ නිවහනේ බිත්ති සරසන චිත්‍ර ගැන. ඒවා තේරුවේ කවුරුන් කියලද ඔබ හිතන්නේ?"

"අපේ පොත් රාක්කයට උඩින් තිබෙන ගේන්ස්බ්‍රෝගේ චිත්‍රය - "උදැසන සක්මන" ඔබගේ තේරීමක්. ගිනි උදුනට ඉහළින් බිත්තියේ

තිබෙන ජෝන් මිලේගේ "වසන්ත සමය" චිත්‍රය හඩ්සන් මහත්මියගේ තේරීමක් කියලයි මට හිතෙන්නෙ."

"කොහොමටවත් නෑ වොට්සන්" ඔහු කීවේ උස් හඬින් සිනාසෙමිනි. "ඇය මේ ගෙදර මිලට ගනිද්දිත්, ඔය චිත්‍ර දෙක බිත්තිවල එල්ලා තිබුණලු" හෝම්ස් කීය. "මං විසිත්ත කාමරය තුළ වෙඩි තැබීම පුහුණු වෙද්දී අත් වැරදීමකින් "වසන්ත සමය" චිත්‍රයේ රාමුවට මූණිස්සමක් වැදිල ඒක විනාශ වුණා. හඩ්සන් මහත්මියට හොරෙන් අලුත් රාමුවක් දාල, මං ඒක අලුත්වැඩියා කළා." හෝම්ස් කීවේ දඟකාර අයුරෙන් සිනාසෙමිනි.

ස්ටැන්මෝ උද්‍යානයේ පිහිටි ලැංකැස්ටර් - ග්‍රීන්වුඩ් කලාගාරය වෙත අප පැමිණෙද්දී, සවස පහමාරට ළංවී තිබිණි. අප එයට ඇතුළුවෙද්දී යාබද කාමරයක, පිරිමි දෙදෙනෙකු තර්ක විතර්ක කරගත් හඬ අපට අසන්නට ලැබිණ. එයින් එක් කටහඬක් ඔස්කා ලැංකැස්ටර් මහතාගේ බැව් මම හඳුනාගතිමි.

"ඒ ගණන සාධාරණයි සිඩ්නි" ලැංකැස්ටර් කීය. "මට ඒ ගැන හොඳටම විශ්වාසයි. මේව පරණ වෙන වයින් වගේ. කාලය ගතවෙන්න වෙන්න මිල ඉහළ යනවා"

"ඔස්කා. ස්ටබ්ස්ගේ චිත්‍රවලට ඔය තරම් මුදලක් වියදම් කිරීම අපරාධයක්" අනෙකා කීය. "ඔහුගේ චිත්‍රවලට ඉල්ලුම දැන් හොඳටම අඩුයි.........."

අපි දොරට තට්ටු කොට ඔවුන්ගේ සාකච්ඡාවට බාධා කෙරුවෙමු. කතාබහ එක්වරම නැවතිණි. විවෘත වූ දොරෙන් එළියට ආවේ කොණ්ඩය සම්පූර්ණයෙන්ම සුදු පැහැති වූ වැඩිහිටි මහත්මයෙකි. වයසින් ඔහුට අවුරුදු හැටක් පමණ වන්නට ඇතැයි මම අනුමාන කළෙමි. රන්වන් උපැස් යුගළක් පැළඳ සිටි ඔහුගේ ඇතුළු කබාය හරහා රත්රන් දම්වැලක් තිබිණ. ඒ සමගම ලැංකැස්ටර් මහතා ද එළියට ආවේය.

"ආ ෂර්ලොක් හෝම්ස් මහත්මයා!" ඔහුට කියැවිණි. "මං ඔබට අද කියුවේ මේ මහත්තයා ගැන තමයි. ඔහු විශේෂඥ රහස් පරීක්ෂකයෙක්. මේ මගේ හවුල්කරු සිඩ්නි ග්‍රීන්වුඩ් මහත්මයා."

"හඳුනාගන්න ලැබීම සතුටක්" ඔහුට අතට අත දෙමින් අපි දෙදෙනා කීවෙමු.

"ඔබ මා හමුවෙන්න මෙහේට ඒවි කියල මං බලාපොරොත්තු වුණේ නැහැ හෝම්ස් මහත්තයා."

"ඒකට එක හේතුවක් වුණේ ඔබේ කලාගාරය නරඹන්න මං ආශාවෙන් හිටියෙ. අනික මට තියෙනවා ඔබෙන් ඇසිය යුතු ප්‍රශ්න කිහිපයක්. ඒ ඔබ බොස්ටන් වලදි යොදවා ගත් පිංකටන් ඒජන්සියේ අය ගැන"

"ඉතාම අවසනාවන්ත සිදුවීමක්" ග්‍රීන්වුඩ් පැවසුවේ දැඩි කලකිරුණු හැඟීමකිනි.

"ඒ චිත්‍ර විනාශවීමෙන් ඇතිවුණු පාඩුව, මගේ මරණය තෙක් මට දැනේවි. මේක තමයි මගේ ජීවිතයේ මං මුහුණ දුන් ඛේදජනකම සිදුවීම. චිත්‍ර අලෙවි කිරීම කියන්නේ ගෞරවනීය ව්‍යාපාරයක් මහත්මයා. අපි ගනුදෙනු කරන්නේ ඉහළම පෙළේ ප්‍රභූන් සහ වංශවතුන් සමග. මිනීමරුවොයි මංකොල්ලකාරයොයි මේකට ගෑවුණාම මොන තරම් ලැජ්ජාවක්ද.........."

ඔහුගේ කටහඬ නැවතී කට ඇරුණේ, විවෘත වුණු දොරෙන් වීදි ළමයෙකු කලාගාරයට පිවිසි බව දුටු විටයි. ඒ විගින්ස් බැව් දුටු වහාම මම හඳුනා ගතිමි.

"පලයන් එළියට! උඹලට විකුණන බඩු මෙහේ නෑ!" ග්‍රීන්වුඩ් කෑගැසුවේ විගින්ස්ටයි.

"කලබල වෙන්න එපා ග්‍රීන්වුඩ් මහත්මයා" හෝම්ස් කීය. "මං මේ ළමයව අඳුනනවා. ඔහු ආවෙ මාව හමුවෙන්න. ඇයි විගින්ස්. මොකක්ද ප්‍රශ්නෙ?"

"අපිට ඔහු හමුවුණා හෝම්ස් මහත්මයා. ඔබ හොයන්න කිව් මිනිහ හමුවුණා. මං තමයි එයාව ඉස්සර වෙලාම දැක්කෙ. අපි ගියේ පිංචිං පටුමගේ උකස් බඩු කඩේට. මේ මිනිහ ඒකෙ ඉඳල එළියට ආවා. මූණේ දකුණු පැත්තෙ දිග කැළලක් මේ විදියට........."

කී විගින්ස් එය තිබූ ආකාරය පෙන්වමින් තම මුහුණේ ඇඟිල්ලකින් ඉරක් ඇන්දේය.

"කෝ ඒ මිනිහ දැන්?" හෝම්ස් විමසුවේ නොඉවසිල්ලෙනි.

"අපි ඒ මිනිහ පිටුපසින් ගියා. එයා ගිය තැන වෙන්න ඇති, එයා නැවතිලා ඉන්න හෝටලේ."

"මොකක්ද ඒ තැන?"

"අපර් රිච්මන්ඩ් පාරෙ ගිහින් ඩවුඩ්ස්වෙල් මාවත පැත්තට හැරෙන්න ඕන. ඒකෙ ගියාම තමයි ක්ලිෆඩ් නෝනගෙ නේවාසිකාගාරය තියෙන්නෙ"

"අපි වහාම පිටත්වෙන්න ඕන" හෝම්ස් කීවේ කලාගාරයේ හිමිකරුවන් දෙසට හැරෙමිනි. "ඔබ මුහුණ දීල ඉන්න පැටළුණු අවුලේ, එක පොටක් දැන් තිබෙන්නේ අපට අහුවෙන මානයේ. ඒක අල්ලාගන්න පෙර අතුරුදන් වෙන්න පුළුවනි. ඒ නිසා........."

"හෝම්ස් මහත්මයා. මාත් එන්නද ඔබ සමග?" ලැංකැස්ටර් විමසුවේය.

"ලැංකැස්ටර් මහත්මයා. ඔබේ ආරක්ෂාව සඳහා........"

".......... ඔහුව හරිහැටි දැක්කෙ මමයි. ඔබේ ළමයි ඔහුව හරිහැටි හඳුනාගෙනද කියන එක, සහතික වශයෙන් කියන්න පුළුවන් මට. මේ යක්ෂයා මා හොයාගෙන ආවෙ මොකටද කියන එක, උගේ කටෙන්ම අහලා දැනගන්න උවමනා මටයි හෝම්ස් මහත්මයා"

"හරි හරි. අපට වාද කර කර ඉන්න. වෙලාවක් නෑ. වහාම පිටත්වෙමු"

ග්‍රීන්වුඩ් මහතා කට ඇරගෙන විමතියෙන් බලා සිටියදී අපි එතැනින් පිටවූයෙමු. ඒ ලැංකැස්ටර්, විගින්ස්, හෝම්ස් සහ මා ය. රෝද හතරේ ලොකු කුලීරියක් ඉක්මනින් අල්ලා ගැනීමට අපට හැකිවිණි. අප රිය ඇතුළේ හිඳ ගනිද්දී විගින්ස් කුලීරියේ රියැදුරා අසලට රිංගා ගත්තේය. ඔහු ඊට අකමැත්තෙන් එකඟ වූයේ හෝම්ස් කළ ඉල්ලීම අනුවය.

මේ වනවිට ඇඳිරි වැටී තිබිණ. ඒ සමගම අපට දැනුණේ දැඩි ශීතලකි. සාප්පු යන්නන් හා සංගීත කාරයන් ආපසු නිවෙස් බලා පිටවී යාම නිසා, යළිත් වරක් වීදි පාළුවට ගොස් තිබිණ.

අශ්ව කරත්තය අප ගෙන ගියේ වොන්ඩ්ස්වර්ත් පෙදෙසටයි. පටිනි පාලම හරහා අපි තේම්ස් ගඟෙන් එගොඩ වූයෙමු. තේම්ස් ගඟ දිගේ හමා ආ සුළඟේ තිබුණේ, සිරුරට පිහිතුඩුවලින් අනින්නාක් වැනි දැඩි ශීතලකි. අප රියට නැගුණු මොහොතේ සිට හෝම්ස් එක වචනයක්වත් කථා නොකෙළේය. අප ඉදිරියේ තිබූ අභියෝගය ගැන ඔහු කල්පනා කළාද? එසේත් නැත්නම් අපට මුහුණ දීමට තිබූ ඉරණම ඔහුට වැටහුණාද? ඒ කිසිවක් සිතාගැනීමට මට හැකියාවක් නොවීය.

පටිනි පාලමෙන් එගොඩ වූ පසු අප යා යුතු දිශාව ගැන, විගින්ස් කුලීරථ රියැදුරාට මඟ පෙන්වීමට උත්සාහ කළේය. ලෝවර් රිච්මන්ඩ් පාරෙන් අපර් රිච්මන්ඩ් පාරට පිවිසී, රොහැම්ටන් හරහා ප්‍රයරි පටුමඟ වෙත පැමිණියෙමු. ඩවුඩ්ස්වෙල් ක්ලෝස් නම් අතුරු

පාරේ මඳ දුරක් පැමිණි පසු, කුලී රිය ආපසු හරවා යැවීමට හෝම්ස් තීරණය කළේය. "ඉතිරි හරිය අපි පයින්ම යමු"

ක්ලිෆර්ඩ් මහත්මියගේ නේවාසිකාගාරය පිහිටා තිබුණේ ඩවුඩ්ස්වෙල් මාවතේ මැද හරියට වන්නටය. මෙය සෑහෙන තරම් වැදගතුන් ජීවත් වූ, ඇපල් සහ බීච් ගස් වවා තිබූ නිසංසල පෙදෙසක් බැව් අපි දුටුවෙමු. එහෙත් ක්ලිෆර්ඩ් මහත්මියගේ නිවස අවුරුදු හැට හැත්තෑවක් පැරණි, බොහෝ සෙයින් අබලන්ව තිබූ එකම නිවස විය. එය නවාතැන් සහ කෑම සඳහා සතියකට සිලිං දහය ගණනේ අය කරන, පහළ මැද පංතියේ අය සඳහා වූ නේවාසිකාගාරයකි. මෑතකදී පිරිසිදු නොකළ ජනේලවල නොපැහැදිලි ආලෝකයකි. විගින්ස් මෙතැන රඳවා ගිය සගයා වූයේ ජැක්ය. සීතලෙන් මිදීමට තම ඉරුණු කබාය හා සිරුර අතර, පරණ පුවත්පත් තට්ටු කීපයක් දමාගෙන සිටියද, ජැක් සීතලෙන් වෙවුළමින් සිටියේය. ලන්ඩනයේ වීදි ළමයි සීතලට පුරුදු වී සිටියහ. එහෙත් තේම්ස් ගඟේ සුළඟට විවෘතව පැය තුනකට කිට්ටු කාලයක් සිටීම, ජැක්ට දරාගන්නට අපහසු වන්නට ඇත.

"මොනවද ඔබට දකින්නට ලැබුණේ?" හෝම්ස් විමසීය.

"ඔහු මේ ගෙදරට ආවට පස්සෙ, පිටවෙලා ගියේ නැති බව නම් මට සහතිකයි" ජැක් කීය.

"මෙන්න ඔබ දෙදෙනාට මං දෙන්න පොරොන්දු වුණු මුදල" හෝම්ස් සාක්කුවෙන් ගත් කාසි කිහිපයක් විගින්ස්ගේ සහ ජැක්ගේ අත තැබීය. "මේකත් අරගෙන ඉක්මනට ආපහු යන්න"

ඔවුන් එතැනින් දිව ගිය පසු හෝම්ස් ඇමතුවේ ලැංකැස්ටර් මහතාටයි.

"මහත්මයා. දැන් අපි ප්‍රමාද නොවී මේ හෝටලයට ඇතුළුවෙලා උවමනා කරන මිනිහා හමුවිය යුතුයි. ලැංකැස්ටර් මහත්මයා. ඔබ පැමිණිය යුත්තේ අප දෙදෙනාට පිටුපසින්. ඔහු එක්වරම ආයුධයක් අතට ගෙන, බිහිසුණු ක්‍රියාවකට නැඹුරු වේවිද කියන කරුණ අපට කියන්න බෑ. කොහොම වුණත්, මෙහෙම දේකට එන බලාපොරොත්තුවක් අපේ තිබුණෙ නැහැනෙ. ඒ නිසා අපි ආවේ නිරායුධව. මේක අපි තීක්ෂණ නුවණින් කටයුතු කළ යුතු මොහොතක්. හරි යමු!"

අපි තිදෙනා හෝටලයට ඇතුළුවීමු. තරප්පු කිහිපයක් නැග ගිය පසු අප පා තැබුවේ ලොකු සාලයකටයි. ලී පුටුවකට වී නිදි කිරා

වැටෙමින් සිටි වයස්ගත මිනිහෙක්, අප දුටු වහාම අසුනෙන් නැගිට්ටේය.

"මහත්වරුනි, අපට පුළුවනි නවාතැන් ගන්නා අය සඳහා සුවපහසු කාමර. රසවත් ආහාර........."

"අපි ආවේ මෙහේ නවතින්න නෙමෙයි" හෝම්ස් කීය. "අපරාධයක් කරලා මෙහේ හැංගිලා ඉන්න ඇමරිකන් කාරයෙකු අල්ලා ගන්නයි අපි ආවේ. ඔහුගේ දකුණු කම්මුලේ තිබෙනවා ලොකු කැළලක්. පොලිස් අත් අඩංගුවට අහු නොවී බේරෙන්න ඔහේට උවමනා නම්, ඒ මිනිහා ඉන්නෙ මොන කාමරේද කියල අපට ඉක්මනට කියනවා"

"මෙහේ ඉන්නෙ එකම ඇමරිකන් කාරයයි. ඔබ ඔය කියන්නෙ නිව්යෝක් සිට ඇවිත් ඉන්න, බිල් ඕලියන්ස් මහත්මයා ගැන වෙන්න ඇති. දවසම එළියට ගිහිං ඉඳලා ඔහු ආපහු ආවෙ මීට ටික වෙලාවකට කලින්. ඊට පස්සෙ ඒ පැත්තෙන් කිසිම ශබ්දයක් ඇහුණෙ නෑ. මං හිතන්නෙ එයා නිදි ඇති. එයාගෙ කාමරය - කොරිඩෝවෙ අන්තිමේ දකුණු පැත්තේ කාමරය"

"කාමරයේ අංකය?"

"අංක දොළහ"

කොරිඩෝවේ තිබුණේ තද අඳුරු ස්වභාවයකි. ගෑස්පහන් දල්වා තිබුණත්, ගෑස් කරාම බාගෙට වසා දැමීම නිසා පහන්වලින් නිකුත්වූයේ දුර්වල ආලෝකයකි. කාමරවලට ඇතුළුවෙන දොරවල් එකිනෙකට ඉතා සමීපව පිහිටා තිබිණි. ඒ අනුව මෙම කාමරද ඉතා කුඩා ඒවා බැව් සිතාගැනීම අපට අපහසු නොවීය.

කොරිඩෝවේ කෙළවර තිබූ කාමර අංක දොළහ එක්වරම දුටුවෙමු. හෝම්ස් අත ඔසවා සූදානම් වූයේ දොරට තඩි බෑමටයි. දොර ළඟ සිට මීට මොළවා අත එසවූ ඔහු, එක්වරම බිම බලා අඩියක් පිටුපසට ගත්තේය. අඩ අඳුරේ කළු පැහැයට දිස්වූ ඝන දියරයක්, දොරට යටින් කොරිඩෝවට ගලා ආවේ ඉතා සෙමිනි. එය දුටු ලැංකැස්ටර්ට කෑ ගැසිණි. ඈත කොරිඩෝවේ සිට අප දෙස බලාසිටි සේවකයා වහා අප වෙත දුව ආවේය.

තවත් පමා නොවූ හෝම්ස් දොර විවෘත කිරීමට උත්සාහ කළේ, වේගයෙන් දොර වෙත කඩා පනිමිනි. කිසිදු සවි ශක්තියක් නොතිබූ අගුළ කැඩී ගොස් දොර විවෘත විණි. ලැංකැස්ටර් එළියේ

සිටියදී අපි දෙදෙනා කාමරය තුළට පිවිසුණෙමු. තරමක් ලොකු ජනෙල් කවුළුව සම්පූර්ණයෙන්ම විවෘතව තිබිණි. කාමරය මුළුමනින්ම අවුස්සා තිබූ බැව් අපට දැක ගත හැකි විය. කිසිදු වැදගැම්මක් නැතැයි මුලදී මා කියූ ගැටලුව, පත්වී තිබුණේ බරපතළ අඩියකටයි. මෙතරම් දිනක් අප කුතුහලයට පත් කළ, අප විසින් ලුහුබඳිනු ලැබූ ඒ මිනිසා, බිම වකුටු වී මියගොස් සිටියේ බෙල්ලේ පැත්තක ඇමිනුණු පිහියක් ද සහිතවය!

V

අප දෙදෙනාගේම මිත්‍රයෙකු වූ ජෝජ් ලෙස්ට්‍රේඩ් මෑත කාලයේදී මට හමුවිය. මා සමග කතා බහ කරමින් සැඳෑවක් ගත කිරීමට මගේ නිවසට පැමිණෙන මෙන්, මම ඔහුට ඇරයුම් කළෙමි. ඒ ඇරයුම පිළිගැනීමට තරම් ඔහු කාරුණික විය. සයිමන් හා බට්ලර් නම් බැංකු මංකොල්ලකරුවන් අත්අඩංගුවට ගැනීමට ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය කළ සටනේදී, ලෙස්ට්‍රේඩ්ද බරපතළ තුවාල ලැබුවේය. ඔහුගේ මුහුණේ වම්පසින් හිස්කබලට ඇතුළු වූ මුණිස්සමක්, මොළයේ ගෑවී නොගෑවී දකුණු පසින් පිටවී ගොස් තිබුණේ, පාර්ශ්වික කපාල අස්ථිය සුනුවිසුනු කරමිනි. ජීවත්වීමට තරම් ඔහු වාසනාවන්ත විය.

අප දෙදෙනා අතර ඇති වූ කතාබහේ ප්‍රධාන මාතෘකාව වූයේ ෂර්ලොක් හෝම්ස් බව ඇසුවොත්, මගේ පාඨකයන් පුදුමයට පත් නොවනු ඇත. හෝම්ස් යෙදුණු පරීක්ෂණවලදී මා නැවත නැවතත් ලෙස්ට්‍රේඩ් ගැන සඳහන් කර ඇත. බොහෝ තැන්වල මා ඔහු ගැන සඳහන් කළේ "මීයෙකු වැනි මුහුණක් ඇති" හෝ "උගුඩුවෙකුගේ පෙනුම ඇති" ආදී අකාරුණික වචන වලිනි. ලෙස්ට්‍රේඩ්ට තිබුණේ හොර තක්කඩියෙකුගේ පෙනුම මිස, පොලිස් නිලධරයකුට උරුම මුහුණ නොවේයයි, හෝම්ස් විටෙක පැවසීය. ස්කොට්ලන්ඩ්යාඩ් අපරාධ පරීක්ෂකයන් ගැන සලකද්දී ස්ටැන්ලි හොප්කින්ස් හැරුණු විට, අදක්ෂයන් අතර සිටි දක්ෂයා ලෙස්ට්‍රේඩ් බවද හෝම්ස් කීය.

කෙසේ වෙතත් පසුවදා උදයේ ක්ලිෆඩ් මහත්මියගේ නේවාසිකාගාරයට පොලීසියෙන් පැමිණියේ ලෙස්ට්‍රේඩ්ය.

මිනීමැරුම දක්නට ලැබුණු ඉක්මනින් අපි මුරසංචාරයේ යෙදුණු පොලිස් භටයෙකුගේ උදව්වෙන්, ඩවුඩ්ස්වෙල් මාවතට පොලිස්

ආරක්ෂාව ලබාගත්තෙමු. ඒ මගින් කිසිවෙකුට නිකරුණේ එහි පැමිණීමට නොහැකි විය.

"හෝම්ස් මහත්මයා. මං කිංස්ටන්වලට ගිය වෙලාවෙ ඒ අය කිව්වා, ඔබත් එහි පැමිණීමට නියමිතයි කියල." ලෙස්ට්‍රේඩ් කීය.

"මෙන්න මෙතැනදි අපි දෙන්න ආයෙම සැරයක් එකට හම්බවෙලා"

"මෙතැනදී නම් අපි දෙන්නාම ලුහුබැන්ද ඒ අවාසනාවන්තයාට, අන්තිමේදී මාරයා තමයි හම්බ වෙලා තියෙන්නෙ"

"හෝම්ස් මහත්මයාට කොහොමද ඔහුව මෙතැනදි හමුවුණේ?"

"ඒක බොහොම පහසු වුණා. ඔහු දුම්රියෙන් ලන්ඩන් බ්‍රිජ් දුම්රිය පොළට ආව බව ලෙස්ට්‍රේඩ් කියල තිබුණනේ. එතකොට මං මගේ ඔත්තුකාරයන් යෙදෙව්වෙ මේ අවට පරීක්ෂා කරන්න. පාරෙදිම මෙ මිනිහව දකින්න තරම්, උන් දෙන්නෙක් වාසනාවන්ත වෙලා තිබුණා."

"ඔබ ඔය ඔත්තුකාරයන් කියන්නේ, නිතරම පාරෙ ගැවසෙන තත්කඩි කොලුරැළ නේද? මම නම් ඔබට අවවාද කරන්නේ උන්ගෙන් සෑහෙන තරම් ඈත්වෙලා ඉන්න කියලයි. ඔබේ රාජකාරියක නොයෙදෙන වෙලාවට උන් කරන්නෙ, පදික වෙළෙන්දන්ගේ බඩු හොරකම් කිරීම සහ ගැට කැපීම. අර නිල් මැණික් ඇල්លූ මාලය ඔබට හමුවුණේ නැද්ද?"

"කාමරය සම්පූර්ණයෙන්ම සෝදිසි කරන්න මට වෙලාවක් ලැබුණෙ නෑ" හෝම්ස් කීය.

"එහෙම නම් ඒකත් පටන් ගන්න එකයි අපි කරන්න තියෙන්නෙ"

ඔහු කියූ අයුරින්ම පළමුවෙන් සිදු කෙරුණේ එම කටයුත්තය. ජනේලය විවෘත වූයේ පටු මාවතක් වැනි ඉඩකටය. එහා පැත්තෙන් වූ මායිම, කපරාරු නොකළ අපිරිසිදු ගඩොල් බිත්තියකි. කාමරයේ තිබූ ලී බඩු - ඇඳ, පුටුව, කණ්ණාඩි මේසය, මුහුණ සෝදන බේසම ආදී දේ, අබලන් එමෙන්ම බොහෝ පැරණි ඒවා බැව් දුටුවෙමු.

මීළඟට අපේ අවධානය යොමුවූයේ මෘත ශරීරය වෙතයි. ඔහුගේ කබාය, දණහිස් දක්වා දිගු එකක් විය. කමීසය බෙල්ල ළඟටම බොත්තම් දමා තිබූ අතර ඇතුළු කබාය ඉතා ගනකම් එකක්

විය. මේ සියල්ල ලෙයින් පෙඟී තිබිණි. පිහිතලය සම්පූර්ණයෙන්ම බෙල්ල තුළට කිඳා බැස තිබූ අතර, එළියේ දක්නට ලැබුණේ පිහියේ මිට පමණි. ශීර්ෂපෝෂී ධමනිය කැපී යන්නට ඇති බැව් පැහැදිලිව පෙනිණ. මරණය ක්ෂණිකව සිදුවන්නට ඇති බැව් ශල්‍ය වෛද්‍යවරයකු ලෙස මම තේරුම් ගත්තෙමි. ලෙස්ට්‍රේඩ් ඇමරිකානුවාගේ සාක්කු සෝදිසි කළේය. එහෙත් ඔහුට කිසිවක් හමු නොවීය.

මියගිය පුද්ගලයා වඩාත් හොඳින් දැක ගැනීමට දැන් මට අවස්ථාව සැලසිණ. ලැංකැස්ටර් පසුපස එංගලන්තයට ආ ඔහු වයස අවුරුදු හතළිහත් හතළිස්පහත් අතර වයසේ කෙනෙකි. හොඳින් වැඩුණු මාංශ පේශි සහිතව, හැඩිදැඩි සිරුරක් ඔහුට තිබිණි. කෙටියට කපා තිබූ කොණ්ඩය, තැනින් තැන පැසී සුදු පැහැයට හැරෙන්නට පටන් ගෙන ඇත. වඩාත්ම කැපී පෙනෙන සලකුණ වූයේ, ඔහුගේ මුහුණේ තිබූ තුවාල කැළලය. කටේ එක් කෙළවරක් අසලින් පටන් ගත් එය, වක්‍රාකාරව හකු ඇටයට උඩින් කම්මුල හරහා ගොස්, ඇසේ කෙළවරට ඉතා ළඟින් අවසන් විය. පළමු වාරයේ ඔහු මරණය පෙනි පෙනී දිවි ගළවාගෙන ඇත. දෙවැනි වාරයේ නම් ඔහුට එවැනි වාසනාවක් තිබී නැත.

"ඔස්කා ලැංකැස්ටර් මහත්මයා ලුහුබැන්ද මිනිහා මෙයා කියල අපට සහතික වෙන්න පුළුවන්ද?" ලෙස්ට්‍රේඩ් විමසුවේය.

"ඇත්තෙන්ම ඔව්. ලැංකැස්ටර් මොහුව හඳුනාගත්තා"

"ඔහු මෙතැනට ආවද?"

"ඔව්. බොහොම කෙටි වෙලාවකට. ඔහුට ඉක්මනින් පිටවෙලා යන්න සිදුවුණා" කී හෝම්ස් ගේ මුවට සිනා රැල්ලක් නැඟිණි.

සිරුර හඳුනාගැනීම සඳහා ලැංකැස්ටර් කාමරය තුළට කැඳවා ගැනීමට අපට හැකිවූයේ ඉතා අපහසුවෙනි. මෘත ශරීරය දුටු වහාම ඔහු ක්ලාන්ත විය. අන්තිමේදී අපහසුවෙන් ඔහු කුලීරියක නංවා කිංස්ටන් වෙත යැවීමට අපට සිදුවිය. බොස්ටන්හිදී රතු කැප් කල්ලියේ භීෂණයට මුහුණ දුන් මේ සංවේදී පුද්ගලයා, "ඩියුක් ඔෆ් ග්ලොස්ටර්" නෞකාවෙන් තනිවම ආපසු එන්නට පිටත් විය. එවිට ඔහු පත්වන්නට ඇති තත්ත්වය කෙබඳු වීද යන්න මට තේරුම් ගත හැකි විය. කලාකරුවෝ සැමවිටම ඉතා සංවේදී පුද්ගලයෝ වෙති. ඔහුගේ කලාගාරයේ ප්‍රදර්ශනය සඳහා තබා ඇති

චිත්‍ර නිර්මාණය කළ කලාකරුවන්ට මෙන්, ලැංකැස්ටර්ට ද තිබුණේ සංවේදී හදවතකි.

"හෝම්ස් මහත්තයා ඔබ දුටුවද මේ මේසය උඩ තිබෙන, අඩක් හිස්වුණු සිගරට් පැකට්ටුව?" ලෙස්ට්‍රේඩ් විමසීය.

"වර්ජිනියා කැප්ස්ටන්" හෝම්ස් කීය. "ඇමරිකාවේ නිෂ්පාදනය කෙරෙන ජනප්‍රියම සිගරට් වර්ගයක්. මේකෙ සිගරට් කොටයක් මට හමුවුණා, හැව්ලොක් ලොජ් නිවස අසල මල් උයනේ තිබිලා"

"මට නම් හිතෙන හැටියට සිදුවුණේ මෙයයි" ලෙස්ට්‍රේඩ් කීය. "ජනේලයෙන් කාමරයට කවුරු හරි ඇතුළු වෙලා තියෙන්නේ, මොහු කාමරය තුළ නොසිටි වෙලේ. ඔහු මොහුගේ බඩු බාහිරාදිය සහ ලියකියවිලි අවුස්සමින් සෝදිසියක් කළා. ඒ තැනැත්තා බලාපොරොත්තු නොවූ ලෙස, මොහු හිටිගමන්ම කාමරයට ඇතුළුවුණා. ඒකෙදි ඇතිවුණු සටනෙදි තමා මේ පුද්ගලයා මැරුම් කෑවෙ" ලෙස්ට්‍රේඩ් පැවසුවේ එවැනි උපකල්පනයක් ඉදිරිපත් කිරීමට තමාට හැකිවීම ගැන ප්‍රමෝදයට පත්වය.

"මම නම් හිතන හැටියට සිදු වුණේ එහෙම දෙයක් නොවෙයි" හෝම්ස් කීය. "ඔබට පෙනෙනවා ඇති, මොහු හුඟක් හැඩි දැඩි ශරීර ශක්තියෙන් පරිපූර්ණ අයෙකු බව. මොහු සමග පොර බදලා, සටන් කරලා බේරිලා යන එක лෙහෙසි වෙන්නෙ නෑ, දෙදෙනෙකු සිටියත්. කාමරය තුළ ගෑස් ලාම්පුවක් වත් ඉටිපන්දමක්වත් දැල්වුණේ නෑ. කාමරය තිබුණේ කළුවරේ. මිනිමරුවා කාමරය තුළ හැංගිලා ඉන්න ඇත්තේ, ඇරෙන දොරේ මුල්ලට වෙලා. මළ සිරුර බිම වැටී තිබුණු ආකාරයෙනුත්, පිහිය බෙල්ලේ ඇණී තිබූ ආකාරයෙනුත් මට පැහැදිලිවම එය කිව හැකියි. මරණීය පිහි පාර එල්ල වෙන තුරුත්, මේ පුද්ගලයා කිසි දෙයක් දැනගෙන ඉඳල නෑ. මේක මොහු කිංස්ටන් වල යෙදුණු කටයුතු නිසා එල්ල වුණු එකක් කියලයි මට හිතෙන්නෙ."

"කොහොම වුණත් අවසන් අරමුණ වෙන්න ඇත්තේ මංකොල්ල කෑම වෙන්න පුළුවනි" ලෙස්ට්‍රේඩ් කීය. "මැණික් ගල් ඇල්ලූ රන් මාලයක් සමග පවුම් පනහක්. ඒවා හම්බවුණේ නැහැ නේද?"

"මේ කිට්ටුව පවු මගක උකස් බඩු කරුවෙකු ළඟ සොයා බැලුවොත්, මාලය නම් සොයාගන්න හැකි වේවි කියල මට විශ්වාසයි. මගේ ඔත්තුකාරයන් මොහු පිටුපස ඇවිත් තියෙන්නේ ඒ

පැත්තෙ ඉඳලා. මොහු ඝාතනය කළ පුද්ගලයා මොහු ළඟ තිබුණු මුදල් අරගෙන යන්න ඇති. නමුත් කවුරුන් හෝ අපරාධය කළේ නම්, මොහුගේ මුදල් හෝ ආභරණය පැහැර ගැනීමේ අරමුණෙන් නෙමෙයි. ඒක මට හොඳටම විශ්වාසයි. මේ කාමරයෙන් අරගෙන ගිහින් තියෙන්නේ මොනවද කියලා, ඔබම කල්පනා කරල බලන්න. ලෙස්ට්‍රේඩ්. අපට මළසිරුරක් හමුවෙලා තියෙනවා. නමුත් ඒක හඳුනාගැනීමට කිසිම හෝඩුවාවක් නෑ. ඔහුගේ මුදල් පසුම්බිය නෑ. ඔහු ඇමරිකාවේ ඉඳල ආව කෙනෙක්. විදේශ ගමන් බලපත්‍රයක් හෝ හඳුනාගැනීමේ ලියවිලි කිසිවක් නෑ. ඔහු ඇමරිකාවෙන් එද්දී මොනවා හරි හඳුන්වාදීමේ ලියකියවිලි අරගෙන එන්න ඇති........ විශේෂයෙන්ම බැංකුවකට. එහෙම කිසිවක් අපට හමුවුණේ නෑ. ඔහු හෝටලයට දී තිබෙන නම මොකක්ද කියා ඔබ දන්නවද?" හෝම්ස් ඇසීය.

"නම දීල තියෙන්නේ බිල් ඔලියන්ස් ලෙස." ලෙස්ට්‍රේඩ් කීය. "ඒක බොරු නමක් වෙන්න පුළුවනි. ඒව මොනවා වුණත් අපි දන්නවා ඔහු කවුද කියල. ඔහු තමයි බොස්ටන් නගරයේ පදිංචිව හිටි නෝමන් ඕනීල්. ඔබ දුටුවා නේද ඔහුගේ මුහුණේ තිබෙන තුවාල කැළල. ඒක වෙඩි තැබීමකදී මුණිස්සමකින් සිදුවුණු එකක් බවට මට කිසිම සැකයක් නෑ. ඒකත් නැහැ කියලද හෝම්ස් මහත්මයා කියන්නේ?"

"වොට්සන් ඒ ගැන ඔබේ අදහස මොකක්ද?" මගේ මිත්‍රයා ඇසීය.

"ලෙස්ට්‍රේඩ්ගෙ ඒ කතාව සීයට සීයක් නිවැරදියි" මම කීවෙමි. "මං ඇෆ්ගනිස්ථානෙදි මේ වගේ තුවාල අප්‍රමාණව දැකල තියෙනවා. මේක හොඳ වෙලා තියෙන ආකාරය අනුව මට කිව හැකියි; මේක අවුරුදු එකහමාරක පමණ කාලයකට පෙර සිදුවුණු එකක්"

"ලැංකැස්ටර් මට කියූ දේට ඒක අකුරටම ගැළපෙනවා" ලෙස්ට්‍රේඩ් කීවේ ජයග්‍රාහී ලීලාවෙනි. "බොස්ටන් වල ඔවුන්ගේ නවාතැනේ වුණු සටනෙදි, ෂෝන් ඕනීල් මැරුම් කෑවා. ඒ ඔහුගේ අනික් සහචරයනුත් සමග. නෝමන් ඕනීල් පමණක් ජීවිතය ගලවා ගත්තේ බරපතළ තුවාල ලබලා. දැඩි වෛරයෙන් සිටින ඔහුට පළිගන්න උවමනා වී තිබුණේ දෙදෙනෙකුගෙන් පමණයි.

ඇමරිකාවේදි හැරිසන්ගෙන් පළිය ගත්තා. ඊළගට එංගලන්තයට ආවා, ඉතුරු එක්කෙනාගෙන් පළිය ගන්න. ඒක සක්සුදක් සේ පැහැදිළියි.

"ඒක එහෙමයි කියල අපි මොහොතකට හිතමු" හෝම්ස් කීය. "එතකොට මේ පුද්ගලයා, එනම් තෝමස් ඕනීල්ව ඝාතනය කළේ කවුරුන් කියලද ඔබ හිතන්නේ? ඒ මොන අරමුණකින්ද?"

"ඒ ගැන අපේ සැකය යොමු වෙන්නේ ඔස්කා ලැංකැස්ටර් වෙතටමයි" ලෙස්ට්‍රේඩ් කීය. "මිනීමැරීමේ අරමුණ ආත්මාරක්ෂාව සලසා ගැනීම"

"ඒක නම් කොහොමටවත් වෙන්න බෑ ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "මේ මිනීමැරුම මේ නේවාසිකාගාරයේ සිදුවෙන වෙලාවෙ, සහ ඊටත් පැය දෙකකට පමණ කලින් ඉඳල, ලැංකැස්ටර් හිටියෙ අපිත් එක්ක. ඒ මෙතැනට හැතැක්ම තුන හතරක් දුරින් ඔහුගේ කලාගාරයේ. ඔහු කෙනෙකු යොදවලා මේ දේ කරාද කියන එක මට කියන්න බෑ. නමුත් මේ මියගිය පුද්ගලයා මේ හෝටලයේ ඉන්නා බව, අපි කවුරුවත් දැනගෙන හිටියේ නෑ. ඒක අපිට දැනගන්න ලැබුණෙත් අන්තිම මොහොතේ.

තවත් එක් කරුණක් වෙත ඔබේ අවධානය යොමු කරන්න මං කැමතියි ලෙස්ට්‍රේඩ්. මොහුගේ ඇඳ මත තිබී මට සිගරට් අසුරණ කේස් එකක් හමුවුණා. මේක බොහෝ දුරට මේ පුද්ගලයාගෙ විය යුතුයි, මිනීමරුවාගේ නෙමෙයි නම්. මේ බලන්න. ඔබට පෙනෙනවා ඇති මේකෙ කොටා ඇති අකුරු E. M. මේක තිබුණෙ ඔහුගේ පොරෝනයට යටවෙලා. ඒ නිසා වෙන්නැති අපරාධකාරයටත් ඒක හමුනොවුණෙ."

ලෙස්ට්‍රේඩ් මඳ වේලාවක් කල්පනා කළේය. ඔහු පිළිතුරු දුන්නේ ඉන්පසුවය. "හෝම්ස් මහත්මයා. ඕක කාරණා දෙකක් නිසා වෙන්න පුළුවනි. පළමු වැනි එක තෝමස් ඕනීල් හොරෙක්. මේ සිගරට් කේස් එක ඔහු කාගෙන් හරි හොරකම් කළ එකක් වෙන්න පුළුවනි. දෙවැනි කාරණාව ඕනීල්ට ලන්ඩනයේ උදව්කාරයෙකු හිටියා වෙන්නත් පුළුවනි. තමන්ගේ පළිගැනීමේ කටයුත්තට උදව් ගන්න, ඕනීල් එහෙම කෙනෙකු බඳවා ගත්තා. දෙදෙනා අතර ඇතිවුණු ආරවුලක් නිසා අනිකා ඕනීල්ට පිහියෙන් ඇන්නා. එහෙම වෙන්න බැරිද?"

"හොඳයි අපි බලමුකෝ. මෙතන ඉඳගෙන ඔය කාරණාව සාකච්ඡා කිරීමෙන් ප්‍රයෝජනයක් වෙන්නෙ නෑ. අපි බලමු හෝටලයේ අයිතිකාරියට කියන්න තියෙන්නෙ මොනවද කියල"

ක්ලිෆඩ් මහත්මිය වයස හැත්තෑවක් පමණ වූ, මඳක් කුදු ගැසුණු දුර්වල තැනැත්තියක වූවාය. මේ මිනීමැරුම නිසා තම නේවාසිකාගාරයට ප්‍රශ්නයක් ඇතිවේ දැයි බියෙන් දෝ, ඇය භීතියට පත්ව සිටියාය.

"කාමරය උවමනා කරන්නෙ සතියකට පමණයි කියල ඔහු කිව්වා" ක්ලිෆඩ් මහත්මිය පැවසුවාය. "එයා ලන්ඩනයට ආව පළමුවැනි වතාවලු. ඇමරිකාවෙන් කිව්වා. පාරවල් හොයාගන්න එක ගැනවත් කිසිම වැටහීමක් එයාට නොතිබුණු බව මට පෙනුණා. ආව හැටියෙම මගෙන් ඇහුවෙ කිංස්ටන් වලට යන්නෙ කොහොමද කියලයි. මං ඉතින් යන හැටි ඔහුට කියල දුන්නා. එතකොට කියනවා; එහේ ඉන්නවා මට හම්බවෙන්න උවමනා කරන කෙනෙක්. එයා මට ගෙවිය යුතු ණයක් තියෙනවා. මං බලාපොරොත්තු වෙන්නේ ඒක ඉල්ල ගන්න. ඒ වැඩේට හෙට ගියාම ඇති"

ඔහු කතා කරපු පිළිවෙළට මට තේරුණා, මේ නම් හොඳ වැඩකට වෙන්න බෑ කියල. මොකක් හරි කරදරයක් වේ දෝ කියල මට නිකමට හිතුණා. ඒ වුණත් මෙහේට ඇවිත් දොරට තට්ටු කරන හැම මිනිහෙකුම, සැකයි කියල මං කොහොමද ආපහු හරවල යවන්නෙ? එහෙම වුණොත් මට ජීවත් වෙන්න ක්‍රමයක් නැති වෙනවා. ඒ මිනිහගෙ මූහුණෙ තිබුණු කැළල දුටුවාම, ඒ වෙලාවෙ මගේ ඇඟ හිරිවැටිල ගියා. ඒක ගැන හිතල මේ මිනිහව ගන්න බෑ කියන්න, ඒ වෙලාවෙ මට නොහිතුණු හැටි. ඒක මගේ අවාසනාව"

තම දෑතින් මූහුණ බදාගෙන ශෝකයෙන් සුසුම් හෙළමින් සිටි ඇය හැරදමා ඒමට අපි සූදානම් වූයෙමු. ලෙස්ට්‍රේඩ් අපෙන් සමුගෙන පිටවී ගියේය.

"වොට්සන්. මගේ දත්ත එකතු කිරීම බොහොම දුරට සම්පූර්ණයි" හෝම්ස් කීවේ ලෙස්ට්‍රේඩ් පිටවී යනතුරු මඳ වේලාවක් බලා සිටීමෙන් අනතුරුවය. "මට තවත් බලන්න උවමනා එක තැනක් තියෙනවා"

නේවාසිකාගාරයේ ඉදිරි දොරටුවෙන් පිටවූ අපි ඩවුඩ්ස්වෙල් මාවතට පිවිසුණෙමු. එය දිගේ, යාර කිහිපයක් ඉදිරියට ගොස්

නිවාස අතරින් වූ පටු මගක් දිගේ යළිත් නේවාසිකාගාරයේ පිටුපස කෙළවර දෙසට ගමන් කළෙමු. කුණු කසළ වලින් පිරී තිබූ එය අවසන් වූයේ, ඇමරිකානු ජාතිකයා ඝාතනය වූ කාමරයේ ජනේලය අසලිනි. ඝාතකයා ජනේලයට නැගීමට උදව් කරගත්තා යයි සිතිය හැකි උස ලෑලි පෙට්ටියක්, තවමත් ජනේලය අසල විය. ජනේලය ඇතුළතින් අගුළු දමා නොතිබුණා වුණත් එය පිටත සිට විවෘත කර ගැනීම පහසු කරුණක් බව, අව්වට ඇද ගැසී තිබූ ජනෙල් පියන්වලින් පෙනිණ.

"තමන් බිල් ඕලියන්ස් කියල හඳුන්වා දුන් ඇමරිකානු ජාතිකයා ලැගුම් ගෙන සිටි තැන, අපරාධකාරයා කොහොම හරි සොයාගෙන තියෙනවා" හෝම්ස් කීය. "ඔහු ප්‍රධාන පාරෙන් ඇවිත් ඊළඟට මේ පටුමග දිගේ ඇවිත්, ජනේලයට නගින්න ක්‍රමයකුත් සොයාගෙන; කළුවර වැටුණු වෙලාවෙ කාමරයටත් ඇතුළුවෙලා; මේ තරම් දෙයක් කළත් ඔහු ගිහින් තියෙන්නේ, තමන් ගැන කිසිදු සලකුණක් ඉතිරි නොකර"

"මරණය සිදු කළ ආයුධය?"

"ඒක ටිකක් මිල වැඩි එකක්. නමුත් මස් කපන ආයුධ විකුණන හොඳ වෙළඳ සලකින් ඕනෑම කෙනෙකුට මිලට ගන්න පුළුවනි"

"ඔහුගේ පා සටහන්?"

"කිසිවක් නෑ!"

"ඒක හරි පුදුමයක් නේ හෝම්ස්?"

"පා සටහන් තියෙන්න ඇති එළියේ. ඊයෙ රෑ මෙතනට ආව ගිය මිනිස්සුන්ගේ පාවහන් අඩිවලින් ඒ ඔක්කොම මැකිලා!"

VI

අපි උදෑසනින්ම බේකර් වීදියෙන් පිටත් වී ගියෙමු. එතරම් පමා නොවී කිංස්ටන්හි "හැව්ලොක් ලොජ්" මැඳුර වෙත ළඟාවීමට අපට හැකිවිය. දොර විවෘත කරන ලද්දේ කුස්සියේ සේවය කළ පීටර් නම් කොලු ගැටයා විසිනි.

"ඔබේ මහත්තය ඉන්නවද?"

"ඔබ කවුරු කියල කියන්නද?"

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. ඔබේ හාම්පුතා අප එනතුරු බලාගෙන ඇත්තෙ"

මගේ මිත්‍රයාගේ කටහඬ ඇසී, ඔස්කා ලැංකැස්ටර් මහතා අප සිටි තැනට ඉක්මනින් පැමිණියේය.

"සමාවෙන්න හෝම්ස් මහත්මයා. මොකද පීටර් වින්සන්ට පේන්න නැත්තෙ? ආ ඔහු ඇත්තෙ උඩුමහලෙ. වින්සන්ට් මහත්මිය එක්ක මගේ සොහොයුරිය නැවීමට උදව් වෙනවා ඇති."

ලැංකැස්ටර් මහතා ඔහුට සුපුරුදු ලෙස අලංකාර ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටි බැව් මම දුටුවෙමි. එහෙත් සිතේ ඇතිවී තිබූ කැලඹීම නිසා දෝ, හරිහැටි නින්දක් නොලැබූ බව ඔහුගේ මුහුණෙන් දිස්විය.

"මං එවූ විදුලි පුවත ඔබට ලැබුණද?" හෝම්ස් විමසුවේය.

"ඔව්. නමුත් මං ඔබට එවූ විදුලි පුවත, ඔබට ලැබිල නැහැ වගෙයි පෙනෙන්නෙ." ලැංකැස්ටර් මහතා කීය. "ඔබේ සේවය අපට තවදුරටත් අවශ්‍ය නොවෙන බව මං ඒකෙ පැහැදිලිව සඳහන් කළා"

"ඔබේ විදුලි පුවතත් මට ලැබුණා"

"එහෙනම් ඔබ මෙහේ ආවෙ ඇයි?"

"ඔබ මුලින්ම මා හමුවෙන්න ආවෙ ඇයි ලැංකැස්ටර් මහත්මයා?" හෝම්ස් විමසුවේය. "ඔබ ආවෙ ඔබව බියෙන් ත්‍රස්ත කළ, ඔබට තර්ජනය කරන අයුරෙන් හැසිරුණු, ඇමරිකන් ජාතිකයෙකු නිසා. ඒ බොස්ටන් නගරයේ සිට මෙහේට ආ තෝමස් ඕනිල් කියලයි ඔබ විශ්වාස කළේ. එහෙම නේද? ඒකට අදාළ සත්‍ය තොරතුරු සියල්ලම මං හොයාගෙන අවසන්. බොහොම සතුටින් මං ඔබට ඒවා හෙළි කරන්නම්.

එච්චර විතරක් නෙමෙයි. ක්ලිෆඩ් මහත්මියගේ නේවාසිකාගාරයේදී මැරුම් කෑ පුද්ගලයා ගැන තොරතුරුත් මං දන්නවා. දැන් ඔබට මෙහෙම දෙයක් හිතෙනවා වෙන්නත් පුළුවනි. "ඔය කියන කාරණාවල ඇත්ත දැනගත්තා කියල මට ඇති ප්‍රයෝජනයක් නැහැ" කියල. එක කාරණයක් මං ඔබට කෙළින්ම කියන්නම්. ඔබේ සොයුරිය ඉක්මනින් මියයනවා දකින්න ඔබ කැමතිද? එහෙම නම් මගේ කාරණාවලට කන් නොදී, මාව මෙතැනින් පිටත්කර යවන්න. එහෙම නොවෙයි නම්, මං කැමතියි මං දන්නා සත්‍ය තොරතුරු හැම එකක්ම ඔබට හෙළි කරන්න"

ලැංකැස්ටර්ට තීරණයකට එළැඹීමට නොහැකිව අවුල් වුණු සිතෙන් කල්පනා කළ හැටි අපි දුටුවෙමු. අන්තිමේදී ඔහු තීරණයකට පැමිණියේය.

"හෝම්ස් මහත්මයා. එන්න විසිත්ත කාමරයට. ඇවිත් අසුන්ගන්න"

අප මෙහි පැමිණි මුල් වාරයේ හිඳගත්, නිවස ඇතුළත පිහිටි විසිත්ත කාමරය වෙතම පිවිසියෙමු.

"ලැංකැස්ටර් මහත්මයා" හෝම්ස් කීය. "මෙහෙත් හිඳගන්න කලින් මං කැමතියි ඔබේ සොහොයුරිය දකින්න. ඒ ඔබෙන් එයට අවසර ලැබෙනවා නම්......."

"මගේ සොයුරිය ඉන්නේ අමුත්තෙකු හමුවෙන්න තරම් සනීප තත්ත්වයක නෙමෙයි. ඇගේ ඇස්වල පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී ගිහින්. වචන දෙක තුනක් කතාකර ගැනීම පවා ඇයට අපහසුයි.

"ඇය සමග කතාබහ කරන්න මට උවමනාවක් නෑ. මට උවමනා කරන්නේ ඇගේ කාමරය දකින්න පමණයි. ඇය තවමත් කෑම බීම ප්‍රතික්ෂේප කරනවද?"

"දැන් ප්‍රශ්නය වෙලා තියෙන්නේ කෑම ප්‍රතික්ෂේප කිරීම නෙමෙයි. ඇයට ඝන ආහාර කෑමට ගන්න පුළුවන් කමක් නෑ. උණුසුම් සුප් ස්වල්පය බැගින් වරින් වර ඇය බොනවා. එච්චරයි"

"ඇයට කවුරු හරි වස දෙනවා කියල ඇය තවමත් විශ්වාස කරනවද?"

"ඇගේ අසනීපයට මුල් වුණේ ඒ කිසිම පදනමක් නැති විශ්වාසය තමා. හෝම්ස් මහත්මයා. මං ඔබට කලිනුත් කිව්වා වගේ ඇයට කෑමට බීමට දුන් සෑම කෑමකින්ම ස්වල්පය බැගින්, මං රස බලා තියෙනවා. ඒත් කවදාවත් මට කිසිම අසනීපයක් ඇතිවුණේ නෑ. මගේ හිස මතට ඇවිත් තියෙන්නේ, මොන අවාසනාවක්ද කියල මට තේරෙන්නෙ නෑ. ඔබ හමුවෙන්න එන්න කලින් මං හිටියේ සතුටෙන්"

අයිලීන් ලැංකැස්ටර් මෙනෙවිය සිටි සොල්දරයේ පිහිටි කාමරය වෙත අපි ගියෙමු. අප එහි පිවිසෙද්දී වින්සන්ට් එහි සිට පහළට බැස්සේ සුප් පිගානක් සහිත බන්දේසියක් අතැතිවය. තම ස්වාමියාගේ මුහුණ බැලූ ඔහු, තම හිස දෙපසට සෙලෙව්වේ කම්පාවෙනි. ඒ, රෝගියා යළිත් වරක් කෑම ප්‍රතික්ෂේප කළ බව හැඟවීමටයි. අපි කාමරයට ගියෙමු.

ලැංකැස්ටර් මෙනෙවියගේ පෙනුම දුටු මම අතිශය කම්පාවට පත්වීමි. මීට පෙර මා ඇය දුටුවේ කොපමණ කලකට පෙරද? ඒ

සතියක පමණ කාලයක් නොවේද? දැන් ඇයගේ සිරුර සම්පූර්ණයෙන්ම දිරාපත් වී තිබුණේ, ඇය ජීවත්ව සිටින ඇට සැකිල්ලක ස්වරූපයට ගෙන එමිනි. ඇයගේ දෙතොල් සමග මුහුණේ මාංශපේශි සියල්ල පිටිපසට ඇදී තිබුණේ, දත් හා ඉදිමුණු විදුරුමස් ප්‍රදර්ශනය කරමිනි. ඒ සමගම මුහුණේ සම ඉතාමත් තදින් ඇදී හිස් කබලට ඇලී තිබුණේ, ඇය මරණයට ඉතාමත් සමීප බව හඟවන ආකාරයෙනි. දෙනෙත් විවෘතව තිබුණද ඒවායින් කිසිවක් පෙනෙන බවක් නොපෙනිණ.

"ඇගේ නාන කාමරය තියෙන්නෙ යාබදවද?" හෝම්ස් විමසුවේය.

"ඔව්. නමුත් ඒකට ගෙන යන්න තරම් ඇය දුර්වල වැඩියි. ඇය ඉන්න ඇඳේම ඇයව සෝදන්නෙ මගේ බිරිඳ සහ වින්සන්ට් මහත්මිය විසින්" ලැංකැස්ටර් මහතා කීය.

කාමරයෙන් පිටවූ හෝම්ස් ගියේ යාබද නාන කාමරයටයි. මිනිත්තුවක් ගතවීමට පෙර ඔහු ආපසු පැමිණියේය.

"දැන් අපට පුළුවනි පහළ තට්ටුවට යන්න" හෝම්ස් කීය.

අපි පහළ තට්ටුවේ විසිත්ත කාමරය වෙත ගියෙමු. එහි දීප්තිමත්ව දැල්වුණු ගිනිඋදුනක උණුසුම ලබමින්, මේරියන් ලැංකැස්ටර් මහත්මිය පොතක් කියවමින් සිටියාය. අප එහි ඇතුළු වූ මොහොතේ අසුනෙන් නැගී සිටි ඇය, අප ඇමතුවේ පුදුමයට පත් විලසිනි.

"හෝම්ස් මහත්මයා, දොස්තර වොට්සන්! මේ මොහොතේ ඔබ දෙදෙනා දකින්න, මං කොහොමටවත් බලාපොරොත්තු වුණේ නෑ." මීළඟට තම සැමියා දෙස බැලූ ඇය කීවේ "ඔස්කා....... මං හිතුවා ඔයා......."

"අප කතාකරගත් විදියටම මං ඒ විදුලි පුවත යැව්වා මේරියන්. එහෙම වුණත් මෙහේට ඇවිත් අපිව හමුවෙන්න හෝම්ස් මහත්තයා තීරණයකට ඇවිත් හිටියලු"

"මගේ පැමිණීමෙන් වැඩක් නෑ කියල ඔබ තීරණය කළා මට පුදුමයි ලැංකැස්ටර් මහත්මිය" හෝම්ස් කීය.

"හෝම්ස් මහත්මයා. කිව්වට අමනාප වෙන්න එපා" ඇය කීවාය. "අපට පිහිට වෙන්න ඔබට හැකියාවක් නැහැ. ඒ කාරණය මං තේරුම් අරගෙන හුඟක් දවස්. අපේ ආරාධනයක් නැතුව මේ

ගෙදරට ඇවිත්, මුදල් සහ රන්බඩු හොරකම් කරගෙන ගිය මිනිහා දැන් මරණයට පත්වෙලා. පිහියෙන් ඇණලා ඔහුව මරා දැම්මෙ කවුද කියන එක දැනගන්න අපට උවමනාද? නැහැ! ඒ හොරා අපට තවත් කරදර කරන්නෙ නැහැ කියන එක අපට විශ්වාසයි. ඒ ටික හොඳටම ඇති. අසරණ අයිලීන් වෙනුවෙනුත් කළ හැකි යමක් ඔබට නැත්නම්, ඔබ තවදුරටත් මොකටද මෙහේ රැඳෙන්නෙ?"

"සමහර විට මං තවමත් ප්‍රමාද වැඩි නැතුවා වෙන්න පුළුවනි" හෝම්ස් කීය.

"ඒ මොකටද?"

"අයිලීන් මෙනෙවියගේ ජීවිතය බේරාගන්න"

"ජීවිතය බේරගන්න? ඒ කොහොමද?"

"ඔව්. ඇගේ ශරීරයට කෙනෙකු ක්‍රම ක්‍රමයෙන් ඇතුළු කරන විෂෙන්"

මේරියන් ලැංකැස්ටර් මහත්මියගේ කට බාගෙට ඇරිණි. ඇය දෙනෙත් දල්වා ගෙන මවිතයෙන් බලා සිටියාය.

"ඇයට වස දෙන කිසි කෙනෙක් නෑ" මේරියන් මහත්මිය කීවාය. "ඇගේ කෑම බීම හැමදෙයක්ම ඔස්කා කාල බීලම පරීක්ෂා කරල බලනවා. ඇගේ අසනීපය මොකක්ද කියලා වෛද්‍යවරු තීරණය කරල නෑ. නමුත් ඇයට තියෙන්නේ තවමත් වෛද්‍ය විද්‍යාවෙන් හඳුනාගෙන නැති, තේරුම් ගන්න බැරි අසනීපයක් කියන එකට, ඔවුන් කවුරුත් එකඟ වෙනවා"

"එහෙනම් එයාල හැමකෙනෙකුටම වැරදිලා" හෝම්ස් කීය. "මෙහෙන් ඉඳගන්න මට අවසරද? ඔබ දෙදෙනාට දැනුම් දිය යුතු කාරණා රාශියක්ම මගේ හිතේ තිබෙනවා. ඒවා එකින් එක සුවපහසු අසුනක හිඳගෙන කියන්න තියෙනවා නම් පහසුයි"

බිරිඳ රවාගෙන බලා සිටියත්, සැමියා හෝම්ස්ගේ ඉල්ලීමට එකඟ විය.

"බොහොම හොඳයි හෝම්ස් මහත්තයා. ඔහෙන් ඉඳගන්න. ඔබට කියන්න තියෙන කාරණා මං අහගෙන ඉන්නම්. හැබැයි එකක් මතක තියාගන්න. රැවටීමකින් මාව මුලාකරන්න උත්සාහ කරන්න එපා. ඔබ උත්සාහ කරන්නේ එහෙම දෙයක් කරන්න කියල මට තේරුණොත්? ඔව් එහෙම වුණොත් මං ඔබට නියෝග කරනවා වහාම මේ ගෙදරින් පිටවෙලා යන්න"

"මගේ අරමුණ ඔබ රැවටීම නොවෙයි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඒකෙ අනික් පැත්ත. සත්‍යය හෙළිකරදීම.

ලැංකැස්ටර් මහත්මයා. ඔබ මාව හමුවෙන්න මුලින්ම ආවෙ ඇයි? ඒ ඔබේ නීතිඥයා ඔබට දුන් උපදෙස් අනුව. කවදාවත් ඔබට හමුවී නොතිබුණු මිනිහෙකු ගෙන්, ඔබේ ජීවිතයට තර්ජනයක් ඇත කියන භය නිසා. එහෙම නේද?"

"ඔව්"

"මෙම සිද්ධියේ මට පෙනුණා ඉතාම පුදුමාකාර විධියේ අසාමාන්‍ය තැන්. මෙයින් ප්‍රධාන වශයෙන්ම මගේ අවධානය දිනාගත්තේ නෝමන් ඕනීල්, සැබැවින්ම ඒ ඔහු නම්! ඔහු ඔබ හොයාගෙන ලන්ඩනයට ඇවිත්, කිංස්ටන්හි ඔබේ නිවසට ආවා කියන කාරණය මට විශ්වාස කරන්න පුළුවනි. නිවුන් සොහොයුරන් එකිනෙකාට ආදරයෙන් ඉතාමත් සමීප අය. ඔහුගේ අයියා වුණු ෂෝන් ඕනීල්ගේ මරණයට ඔබත් යම් ප්‍රමාණයකින් වගකිවයුතු නිසා, ඒක තේරුම් ගන්න පුළුවනි. රතු කැප් කල්ලියේ විනාශයට වගකිවයුතු රැන්ඩොල්ෆ් හැරිසන්ගෙන්, ඔහු මේ වෙන කොටත් පළිය ගෙන අවසන්. ඔබ යොදාගත්තු පිංකටන් රහස් පරීක්ෂක කණ්ඩායම් නායකයාගේ නම මොකක්ද?"

"ටෙඩ් මැක්ඩොනල්"

"අන්න හරි. දැන් මට මේක කියන්න ලැංකැස්ටර් මහත්මයා. ඔබ පදිංචි නිවස හොයාගෙන, ඔබේ ළඟටම ආව නෝමන් ඕනීල්, ඇයි ඔබව එක්වරම මරා දැම්මෙ නැත්තෙ? ඔහුට පුළුවන්කම තිබුණා ඔබට වෙඩි තියන්න. එහෙම නැත්නම් නිරායුධ ඔබ වෙත කඩා පැනලා, තියුණු ආයුධයකින් අනින්න. ඕනෑම දරුණු ඝාතුරෙක් කරන්නෙ එවැනි දෙයක් නේද? ඔහු මේ එංගලන්තයට ඇවිත් ඉන්න බව, කිසි කෙනෙකු දන්නෙ නෑ. ඔහුට තිබුණා ආපහු ඇමරිකාවට යාම සඳහා නැවකට නගින්න බොහොම ඉක්මනින්; සමහරවිට ඔබේ මිනිය මිනීකාමරයකට ගෙනියන්නත් කලින්.

නමුත් ඔහු මොකක්ද කළේ? ඔහු කළේ ඒකෙ අනික් පැත්ත. ඔහු ඔබේ ගෙදර පෙනෙන තෙක් මානයේ තැනක නැගිට බලා හිටියා. ඒ කාටත් තමාව දැකගන්න පුළුවන් විදියට. ඔහු දාගෙන හිටී කැප් තොප්පියත්, සෙනඟ අතරේ හොඳින් කැපී පෙනෙන පැළඳීමක්. හරි පුදුමාකාර දේ, ඔහු යළිත් වරක් ඔබට පෙනෙන අයුරින් ආවා.

ඒ ඔබ බිරිඳ සමග වෙම්බ්ලි නෘත්‍ය ශාලාවෙන් පිටවෙද්දි. ඒක හරියට නිකං ඔබට අභියෝග කරනවා වගේ; පුළුවන් නම් පොලීසියට කියලා මාව හිරභාරයට ගන්නවා!" එහෙම නේද?"

"ඔහුට උවමනා වුණේ අපව භය කරන්න" ලැංකැස්ටර් මහත්මිය කීවාය.

"නමුත් තුන්වැනි වාරයේ ඔහු ආ ගමනෙදි ඔහුගේ අරමුණු වුණේ ඒක නෙමෙයි" හෝම්ස් කීය. "ඔහු ඔබේ ගෙදර ළඟටම ඇවිත් ඔබේ සැමියාගේ අතට ලියුමකුත් දුන්නා. ඒකෙන් ඉල්ලා හිටියා දවල් දොළහට දෙව් මැඳුරේදී තමන් හමුවෙන ලෙස"

"ඒ වුණාට ඔහු ආවෙ නෑ"

"සමහරවිට ඔහුගේ අරමුණ වෙන්න ඇත්තේ ඒක නෙමෙයි. ඔහු අවසන් වරට ඔබේ නිසංසල ජීවිතයට බාධා කළේ කොහොමද? ගෙට කඩාවැදිලා ඔබේ ආරක්ෂිත සේප්පුවෙන්, පවුම් පනහක් සහ රන් ආභරණයක් හොරකම් කරගෙන යෑමෙන්.

ඔන්න දැන් ඔහුගේ හැසිරීමේ ඉතාම සුවිශේෂ බවක් මට පෙනෙනවා. ඔබේ මේ ගෙදර ඒ පැත්තේ බිත්තියේ ජනේල ගණනාවක් තියෙනවා. නමුත් සේප්පුව තියෙන කාමරයේ ජනේලය මොකක්ද කියලා ඔහු ඉතාම නිවැරදිව දන්නවා. පුදුමය කියන්නේ ඔහු ඇමරිකාවෙන් පිටවෙන්න මාස ගණනකට කලින් ලැංකැස්ටර් මහත්මිය අතින් නැතිවුණු යතුරුත්, මේ මිනිහට හමුවෙලා. දැන් ඔහුගේ උනන්දුව තියෙන්නේ, සුළු මුදලක් හොරාගෙන පැනයන්න. ඒ මිසක් මිනීමැරීමට නෙමෙයි. ඔහු ඒ මොහොතෙ මේ ගෙදර ඇතුළත හිටියේ මහ රෑ. තරප්පු පෙළ නැගලා ඇවිත් ඔබ දෙදෙනා ඝාතනය කර පළිගන්න, ඔහුට හොඳටම පුළුවන්කම තිබුණා......."

"ඔහුගේ ශබ්දය ඇහිලා මට ඇහැරුණා නේ......."

"ඒක ඇත්තයි මහත්මිය. නමුත් ඒ වෙනකොට ඔහු සේප්පුව ඇරලා, වටිනා දේ ඉවත් කරගෙන. හොඳයි. කොහොම හරි දැන් ඔහු පැනයනවා ඔහුගේ නවාතැනට. එතකොට තමා සිදුවීම්වල විපර්යාසයක් වෙන්නේ. හැමදෙයක්ම උඩු යටිකුරු වෙනවා. මේ අපරාධකාරයා නෝමන් ඕනීල් කියලයි අපි තවමත් හිතන්නේ.

ඔන්න දැන් මතුවෙනවා තවත් ඝාතකයෙක්. ඔහු අපරාධවල යෙදීම හොඳට හුරුපුරුදු, බිහිසුණු මිනීමරුවෙකු විය යුතුයි කියලයි

මට හිතෙන්නේ. ඒ මොකද හැඩිදැඩි නෝමන් ඕනීල්ට පිහියෙන් ඇනීමට, මේ අලුත් ඝාතකයා සමත් වෙනවා. ඒ විතරක් නෙමෙයි. ඕනීල් ළඟ තිබුණු මුදල් සහ ඕනීල් හඳුනාගැනීමට හැකි ලිපි ලේඛන හැමදෙයක්ම, මේ අලුත් ඝාතකයා හොරකම් කරගෙන යනවා. නමුත් එක දෙයක් හැර. ඒක තමයි E. M. යන මුලකුරු කෙටූ වැඩකට නැති සිගරට් අසුරනය."

"හෝම්ස් මහත්මයා" ලැංකැස්ටර් මහත්මිය කීවාය. "ඔබ ඒ කතන්දරය මුල ඉඳලම අපට පැහැදිළි කළා. මතක් කර දුන්නා. මොකක්ද ඔබ ඒකෙන් බලාපොරොත්තු වෙන්නෙ?"

"මහත්මියනි. මියගිය පුද්ගලයා නෝමන් ඕනීල් කියල හිතුවොත්, මේ කතන්දරය කිසිම තේරුමක් නැති, අභූත, හිතාගන්න බැරි සිදුවීම් පෙළක් කියන්නයි මං උත්සාහ කළේ.

නමුත් මියගිය පුද්ගලයා නෝමන් ඕනීල් නෙමෙයි කියල මොහොතකට හිතමු. එහෙම හිතුවොත් එහෙම උපකල්පනයක් කළොත්, ඔන්න මේ කතන්දරයට හරි තේරුමක් එනවා. ඔහුට කතාකරන්න උවමනා වෙලා තියෙන්නේ ඔබේ ස්වාමිපුරුෂයාට නෙමෙයි"

"ඒක නම් හරි පිස්සු කතාවක් හෝම්ස් මහත්තයා. ඔහු ඒ ලියුම දුන්නේ මගේ සැමියාගේ අතට"

"ඒ වුණාට ඔහු දෙව් මැඳුරට ආවෙ නැහැනෙ. එහෙම නේද?" හෝම්ස් ඇසීය. "අපි මේ අද්භූත අමුත්තා ගේ තත්ත්වයට පත්වෙලා, ඔහු හිතන විදියට හිතමු. ඔහුට උවමනා වෙලා තියෙනවා, මේ ගෙදර ඉන්න කවුරු හරි, පෞද්ගලිකව රහසිගතව හමුවෙන්න. නමුත් ඒක බොහොම පහසු සරල වැඩකුත් නෙමෙයි. ඔබ දෙදෙනා හැරුණාම අයිලීන් මෙනෙවිය ඉන්නවා; සේවක සේවිකාවො රැසක් ඉන්නවා. ඒ නිසා ඔහු බොහොම ඈත ඉඳගෙන මේ ගෙදර නිරීක්ෂණය කරමිනුයි ඉන්නෙ. ඔන්න ඒ අතරෙ ඔහුගේ හිතට ආවා අපූරු අදහසක්.

ඔහු කඩදාසියක ලොකු කැපිටල් අකුරෙන් යම් පණිවුඩයක් ලියනවා. ඔහු මේ ගෙදරට ළංවෙන්නෙ ඒ කඩදාසිය අතේ තියාගෙන. ඒක ලියුම් කවරයක දමල නැහැ. කඩදාසිය නමලත් නැහැ. ඒ මොකද ඒක ලියුම් පෙට්ටියට දැමීමට, ඔහුගේ බලාපොරොත්තුවක් නැති නිසා. ඒ මොකද එහි අඩංගු පණිවිඩය

වැරැදි කෙනෙකු අතට පත්වීමත් අවදානම් නිසා. ඔහුට උවමනා වෙලා තිබුණේ අවශ්‍ය පුද්ගලයා දකින්න; ඒ පුද්ගලයා දකින්න ලැබුණාම කඩදාසිය ඉහළට ඔසවලා, ඒක පහසුවෙන් කියවාගන්න හැකි විදියට අල්ලාගෙන ඉන්න. කෑම කාමරයේ ජනෙල් වීදුරුව හරහා ඒක කියවා ගන්න පුළුවන්කම තිබුණා. එතකොට ගෙදර සීනුව නාදකරන්න උවමනාවක් නෑ. වැරදි පුද්ගලයා අතට පණිවුඩය ලැබෙන්නෙත් නෑ. ඒ පණිවුඩය දැනගන්නේ ඒ දෙදෙනා පමණයි. එතකොට ඔවුනට පුළුවනි පසුව අවශ්‍ය දේ සාකච්ඡා කරන්න.

නමුත් අවාසනාවකට සිදුවුණේ මොකක්ද? අර මනුස්සයා තමන්ගේ අවශ්‍යතාවය ඉටුකරගන්න මොහොතකට කලින් ලැංකැස්ටර් මහත්මයා එතැනට ආවා. එතකොට අර මිනිහා මොකක්ද කළේ? කඩදාසිය ඉහළට ඔසවලා එය දුන්නා ලැංකැස්ටර් මහත්මයා අතට.

දැන් අමුත්තා දන්නවා තමන්ගේ පණිවුඩය ලැබිය යුත්තා වෙත ලැබුණු බව. දැන් ඔහුගේ හිතට හොඳ ගැම්මක් ඇවිත්. ඔහු අඟවන්නේ මෙහෙම දෙයක්.

"නොවරදවාම ඇවිත් මාව හමුවෙන්න. නැත්නම් මං දන්න හැමදෙයක්ම ලැංකැස්ටර් මහත්මයාට කියනවා. මට පුළුවනි ඔහුව දෙව් මැඳුරෙදි හමුවෙන්න. මං කැමති ඕනෑම තැනකදි මට ඔහු හමුවෙන්න පුළුවනි. ඔබට ඒක කොහොමටවත් නවත්තන්න බෑ. කවදාවත් බෑ"

දෙව්මැඳුරෙදි හමුවෙන්න කියලා ඇනුම් දුන්නට, ඔහු එතැනට ගියේ නෑ. ඇයි? එතැනට ආවෙ අපේ අමුත්තාට උවමනා පුද්ගලයා නෙමෙයි. එතැනට ආවෙ ලැංකැස්ටර් මහත්මයා. කොහොම වුණත් තමන්ට අවශ්‍ය පුද්ගලයාට, තමන්ගේ පණිවුඩය දීමට හැකිවීම ගැන අපේ අමුත්තා සෑහීමට පත්වුණා."

"සාකච්ඡා කිරීමට ඔහුට උවමනා වුණේ මා සමග නොවෙයි නම් කා සමගද?" ලැංකැස්ටර් මහතා විමසුවේය.

"ඒ වෙලාවෙ ඔබත් එක්ක කෑම කන කාමරයෙ සිටියෙ කවුද?"

"මගේ බිරිඳ" කී ලැංකැස්ටර් නළල රැළි කළේය. මීළඟට ඔහු වෙනත් ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ, හෝම්ස් කථාකළ මාතෘකාව වෙනස් කිරීමට නොඉවසිල්ලෙනි.

"මේ මිනිහ තෝමස් ඕනීල් නෙමෙයි කියල ඔබ කියනවා. එහෙම නම් කවුද හෝම්ස් මහත්මයා මේ යක්ෂයා?"

"පිළිතුර බොහොම සරලයි මහත්මයා" හෝම්ස් කීය. "ඔහු තමයි පිංකටන්ගේ රහස් පරීක්ෂක ආයතනයේ මේ කටයුත්ත භාරගත් පුද්ගලයා - ටෙඩ් මැක්ඩොනල්. බොස්ටන් නගරයේදි රතු කැප් කල්ලිය සමග ඇතිවුණු බිහිසුණු සටනේදී මැක්ඩොනලුත් තුවාල ලැබුවා. දකුණු කම්මුලට වෙඩි පහරකින් දරුණු තුවාලයක් සිදුවෙලා. ඔහුට අවලක්ෂණ කැළලක් ලැබුණේ ඒ සටනෙන්. ඊට අමතරව ඔහුගේ දකුණු කලවටත් වෙඩි වැදිලා, ඌර්ධවස්ථිය බිඳිලා සෑහෙන කාලයක් ප්‍රතිකාර ලබාගන්න සිදුවුණා. ඒක මට ඇමරිකාවෙන් දැනගන්න ලැබුණා. අපි දන්නවා අන්තිමේදී ඔහුට රැන්ඩොල්ෆ් හැරිසන් සමගත් අමනාප වෙන්න සිදුවුණා. ඒ මොකද හැරිසන් මුලදී පොරොන්දු වුණු ප්‍රකාරව, මුදල් සියල්ල සටනින් පසුව නොගෙවූ නිසා. රහස් පරීක්ෂකයන් රාශියක් භයානක මිනිමරු කල්ලියක් සමග සටන් කළේ ජීවිත පරිත්‍යාගයෙන්. ඇත්තෙන්ම හතර දෙනෙකුට ජීවිත අහිමි වුණා. දෙදෙනෙකු සදාකාලික අබ්බගාතයන් බවට පත්වුණා. අපරාධකාරයින් ගෙන් එක් අයකු බේරුණ බව ඇත්තයි. නමුත් මුළු කල්ලියම සමූල ඝාතනය කොට අතුගා දැමූ පිංකටන් ඒජන්සියට හැරිසන් සැලකු පිළිවෙළ හරි නෑ.

හැරිසන් කළේ බරපතළ වැරැද්දක්. ඉතින් ටෙඩ් මැක්ඩොනල් අමනාපවීම පුදුමයක් නොවෙයි. හැරිසන් ඉක්මනින් මියගියේ නැත්නම්, අමාරුවෙන් හරි මේ ගැන සාධාරණයක් ඉටු කරවගන්න තිබුණා. ඒ හැරිසන් මියගියේ නැත්නම්. නමුත් හැරිසන්ගේ මරණය සමග රහස් පරීක්ෂක මැක්ඩොනල් මුහුණ දුන්නේ බරපතළ ප්‍රශ්නයකට.

සටනේදී ජීවිතය පූජා කළ තම සගයන් වෙනුවෙන් ඔවුන්ගේ පවුල්වලට ඔහු සාධාරණ වන්දි ගෙවිය යුතුව තිබුණා. ඊළඟට සදා කාලිකව අබ්බගාත වූ අය සමග, සෑහෙන කාලයකට රෝහල් ගතව ප්‍රතිකාර ගැනීමට සිදුවුණු අය. මේ නිසා තමයි ටෙඩ් මැක්ඩොනල් තීරණය කරන්න ඇත්තේ එංගලන්තයට එන්න. ඔහුගේ අරමුණ වුණේ ලැංකැස්ටර් මහත්මයාගෙන් මුදලක්. ඉල්ලා සිටීමද?"

"ඔහු සිටි කාමරයේ තිබී හමු වූ සිගරට් කොපුවේ තිබුණේ E. M. යන අකුරු" මම කීවෙමි. "ටෙඩ් කියල කෙටියෙන් පාවිච්චි කළාට ඔහුගේ සැබෑ නම එඩ්වඩ් වෙන්න ඇති"

"විශිෂ්ටයි මගේ හිතවත් වොට්සන්. ඔබ නිවැරදියි. දැන් ඔන්න කාරණා එකින් එක පෙළ ගැහෙනවා. එතකොට බොස්ටන් වලදී වෙඩි හුවමාරුවේදී බේරී පැනගිය, තෝමන් ඕනීල්ට මොකද වුණේ? මේ කාරණා හොයාගන්න මට ටිකක් කරදර වෙන්න සිදුවුණා. ඇත්තටම කරදර වුණේ මං නෙමෙයි. මගේ හිතවත් මිත්‍රයා - නිව්යෝක්හි පොලිස් බියුරෝව භාර රහස් පරීක්ෂක විල්සන් හාග්‍රීව් මහත්මයා. ඔහු බොස්ටන් වෙත ගිහින් දින කිහිපයක් වෙස් වළාගෙන ගතකරලා තමයි, මැසචුසෙට්ස් වලින් මට අවශ්‍යව තිබූ තොරතුරු හොයා ගත්තේ.

එදා සටනේදි වෙඩි වැදුණු තෝමන් ඕනීල්, කසළ ප්‍රවාහණ නළය දිගේ චාල්ස් ගංගාව වෙත ගිහින් පැනගිය බව ඇත්ත. නමුත් ඔහුගේ බඩට සහ මුහුණට වෙඩි වැදී තිබුණාලු. ජීවිතය ගළවා ගැනීමට ඔහු ගියේ කොහේටද?

ඕනීල් පවුලේ අම්මා තමයි වයස්ගත වෙරෝනිකා ඕනීල් මහත්මිය. ඇය අදටත් අයර්ලන්තයේ ඩබ්ලින් නගරයේ රැකියාවක් කරමින්, දුකසේ වුණත් වැදගත් විදියට ජීවත්වෙන කාන්තාවක්. ඔබ ඇයගෙන් විමසුවොත් කියාවි 1865 දී ඇයට උපන් පුතුන් දෙදෙනා ෂෝන් හා තෝමන් තරුණ වයසෙදි ඇමරිකාවට සංක්‍රමණය වුණු බව. ඊළඟට ඇයට හිටි එකම දියණිය ඇන්ජලීනාත්, අම්මාව අතහැර දමා ඇමරිකාවට ගිය බව කියාවි. ඇන්ජලීනා ගියේ ඇගේ ආදරණීය සොහොයුරන් ළඟට. නමුත් ඔවුන් රතු කැප් කල්ලියේ නායකයන් වූ භයානක මිනීමරුවන් බව ප්‍රසිද්ධියට පත්වුණා. තමන්ගේ පරෙස්සම ගැන හිතූ ඇන්ජලීනා මැසචුසෙට්ස්හි වැදගතුන් පදිංචි පෙදෙසක කුලී නිවාසයක අප්‍රසිද්ධව ජීවත්වෙන්න පටන් ගත්තා. ඇයට රැකියාවක් කිරීම අවශ්‍ය වුණේ නෑ. ඒ මොකද ඇගේ අයියලා දෙන්නා නංගීට උවමනාවටත් වැඩිය මුදල් ලබාදුන් නිසා. ඇය පිරිමියෙකු ලෙස වෙස් වළාගෙන රතු කැප් කල්ලියේ මංකොල්ල වලට සහභාගි වුණු බවටත් කතාවක් තියෙනවා. තවත් සමහරුන් හාග්‍රීව් සමග කිව්වාලු ඇන්ජලීනා ඉලක්කයට වෙඩි තැබීමට ශූරියක් කියල.

මං ඔබට කියමින් සිටියේ වෙඩි වැදී තුවාල ලැබූ තෝමන් ඕනීල් ගැන. එදා සටනින් පසු ඔහුට හැකිවුණා අමාරුවෙන්, තමන්ගේ ආදරණීය සොයුරිය වුණු ඇන්ජලීනාගේ නිවසට යාගන්න. ඔහු ලැබූ තුවාල පැසවා ඔඩු දිවීම නිසා, දින දෙක තුනකින් තෝමන් ඕනීල් අවසන් හුස්ම හෙළුවාලු"

"ඒ කෙල්ලට මොකද වුණේ හෝම්ස් මහත්මයා?" ලැංකැස්ටර් විමසීය.

"ඒ කෙල්ලට සිදුවුණේද? මහත්මයා. ඔබ ඇයව විවාහ කරගත්තා!"

මිනිත්තු කිහිපයක් යනතුරු එතැන පැතිර ගියේ ඇඩි නිශ්ශබ්දතාවයකි. මේරියන් ලැංකැස්ටර් භයානක ලෙස සුදුමැලි වී ගිය ආකාරය මම දුටුවෙමි. සැමියා සහ බිරිඳ මට සිහිකළේ ටුසෝඩ් මැතිණියගේ ඉටිරූප කෞතුකාගාරයේ ඉටිපිළිම දෙකකි.

"ලැංකැස්ටර් මහත්මිය" හෝම්ස් කීය. "ඔබ කියන්නේ මං කියූ දේවල් අමූලික බොරු කියලද?"

"බොරු නේන්නම්" ඇය කීවාය. "ඔය වගේ බහුබූත පට්ටපල් බොරු මං ජීවිතේට අහල නෑ." ඇය තම සැමියා දෙසට හැරවූයේ කඳුළින් පිරුණු දෙනෙතකි.

"ඔස්කා. මට මේ විදියට තවත් අපහාස කරන්න, ඔයා මේ මිනිහට ඉඩ දෙනවද? මිනීමරු කල්ලියකට, අපරාධකාරයින්ට මාව සම්බන්ධ කරලා ගෙතූ කතාවලට!"

"ඔය කතාවලින් ඔහු රැවටීමට ඔබට බැහැ ලැංකැස්ටර් මහත්මිය" හෝම්ස් කීය.

එය සැබෑවක් බැව් පෙනිණ. හෝම්ස් මෙම අතිශය පුදුමාකාර හෙළිදරව්ව කළ මොහොතේ සිට, ගෙහිමියා තම දෙනෙත් පුළුල්ව විවෘත කර ගෙන සිටියේය. ලැංකැස්ටර් මහතා තම බිරිඳ දෙස බලා සිටියේ, භයානක අවතාරයක් දෙස බලන විලසිනි. මට සිතුණේ ඔහුගේ සිතේ කොණක මේ ගැන කුඩා සැකයක් තිබෙන්නට ඇති බවයි. සියල්ල දිග හැරෙද්දී ඔහුට ඒ යථාර්ථය පිළිගන්නට සිදුවී ඇත.

"අනේ ඔස්කා....... මං කියන දේ අහන්න......." ඔහු වෙත නැඹුරු වූ ඇය ඔහුගේ අතකින් අල්ලා ගත්තත්, ඔහු එය ගසා දැම්මේය.

"මං ඉතිරි හරියත් කියන්නද?" හෝම්ස් විමසුවේය.

මේරියන් ලැංකැස්ටර් මෙතෙක් තම මුහුණ ආවරණය කරගෙන සිටි, තුනී වේල්පොට ඉරී ගියේ යයි මට සිතිණි. දැන් අපට දක්නට ලැබුණේ කෝපයේ ගින්න ඇවිළුණු රෞද්‍ර මුහුණකි.

"ඔව් ඔව්. තමුසෙට කියන්න තියෙන ඉතිරි හරියත් දැන් ඉතින් කියනවා!" ඇය ගිගිරුවාය.

"ඔබට ස්තූතියි මහත්මිය" කී හෝම්ස් ඇයට හිස නමා ආචාර කොට කතාව ඇරඹුවේය. "ඇගේ සොයුරන් දෙදෙනා මියගිහින් රතු කැප් කල්ලිය විනාශ වුණාම, ඇන්ජලීනා ඕනිල්ට මොකද වුණේ? ඇය ඇමරිකාවේ තනිවුණා. නිව්යෝක් සහ බොස්ටන් නගර දෙකේම පොලීසිවල අපරාධ පරීක්ෂණ අංශවලට, ඇයව උවමනා වී තිබුණා. තමන් දැඩිව ආදරය කළ සොයුරන් දෙදෙනා ඝාතනය කළ අය ගැන, ඇගේ හිතේ ඇතිවුණේ දැඩි වෛරයක්. ඇයට උවමනා වුණේ ඔවුන්ගෙන් පළිගන්න. පිරිමියකු ලෙස වෙස් වළාගත් ඇය මුලින්ම ගියේ, රැන්ඩොල්ෆ් හැරිසන් හොයාගෙන. ඔහු කර තිබූ ලොකුම මෝඩකම තමයි රතු කැප් කල්ලිය විනාශ කිරීමට තමන්ට හැකිවීම ගැන පුරසාරම් දෙඩවීම. ඔහුගේ ප්‍රකාශ පුවත්පත්වල පළවුණා. ගිනිඅවි පාවිච්චියට හොඳට පුරුදු වී සිටීම නිසා, ඔහුගෙන් පළිගැනීම ඇන්ජලීනාට අපහසු කටයුත්තක් වුණේ නෑ.

නමුත් කල්ලිය ගැන ඔත්තුවක් ඉල්ලා පළ කළ දැන්වීමේ තවත් නමක් තිබුණා. ඒ ඔස්කා ලැංකැස්ටර්. ඔහු ඉක්මනින් රටින් පිටවී යන බව ඇය දැන හිටියා. ඒ නිසයි ඇය කල්තබා කියුනාඩ් නාවික ගමන් කාර්යාලයට ගිහිං, "ඩියුක් ඔෆ් ග්ලොස්ටර්" නෞකාවේ කාන්තාවන් දෙදෙනෙකු සඳහා කුටි වෙන්කර ගත්තේ. ඒ මේරියන් හේග් යන නමින්.

හැරිසන් ඝාතනය කර පැය විසිහතරක් ඇතුළත ඇමරිකාවෙන් පිටවෙන්න ඇයට හැකිවුණා. ඇයගේ අරමුණ වෙන්න ඇත්තේ ලැංකැස්ටර් මහත්මයාගෙන් මුහුද මැදදී පළිගෙන, නෞකාව බ්‍රිතාන්‍යය වෙත පැමිණ පසුව තම මව්රට වූ අයර්ලන්තයට පැන ගැනීම වෙන්න ඇති. ලැංකැස්ටර් මහත්මයා සමග ඇය ප්‍රේම සබඳතාවක් ඇරඹුවේ ඒ අරමුණෙන්. නමුත් සිදුවුණේ වෙනත් දෙයක්. ඇගේ සිතේ ඔහු කෙරෙහි තිබූ වෛරය ආදරයකට පෙරළුණා. රෝගී වී, දැඩි මානසික කම්පාවකට ගොදුරු වී සිටි ඔහුට, ඇගේ ආදරය දිව්‍ය ඖෂධයක් වුණා. කිසිදා ආදර සබඳකමක්

නොතිබුණු ඔහු ආදරයෙන් අන්ධවුණා. නමුත් පළිගැනීමේ චේතනාවෙන් සිටි ඔබ, ඇයි ඒ අදහස අමතක කර ඔහු සමග සාමයෙන් දිවි ගෙවන්න තීරණය කළේ?" හෝම්ස් විමසුවේ ලැංකැස්ටර් මහත්මියගෙනි.

"ඔහු උතුම් ගතිගුණ ඇති දෙවියකු බඳු මිනිසෙකු යයි මට සිතුණා. ඔහු අතින් සිදුවුණු වරදට මං සිතෙන් සමාව දුන්නා" ඇය කීවාය.

"මං හිතුවෙත් ඒ දේමයි" හෝම්ස් කීය. "ආගමික ශාස්තෘන් වහන්සේලා දේශනා කර ඇති දේ, සැබෑවුණු තවත් අවස්ථාවක් මේක. "ඔබේ පරම සතුරාට වෛර කරනවා වෙනුවට, ඔහුට මෛත්‍රිය කිරීමෙන් ආදරය කිරීමෙන්, නොබිඳිය හැකි සාමයක් ඇතිකර හැකියි.

ටෙඩ් මැක්ඩොනල් බොස්ටන් සිට එංගලන්තය බලා නොආවා නම්, හැම දෙයක්ම ඉතා සාමකාමීව ගලා යන, ආදරයෙන් පිරුණු ලොවක් වෙන්න ඉඩ තිබුණා. ඕනිල් මෙනෙවිය දැන් කවුරු හැටියට ද ඉන්නේ, ඒ කොහේද කියන කාරණා මැක්ඩොනල් දැනගත්තේ කොහොමද? ඒ කරුණු අපි දන්නේ නෑ. නමුත් ඔහු දක්ෂ රහස් පරීක්ෂකයෙක්. ඒ නිසා ඔහුට ඒ කටයුත්ත කොහොමටවත් අමාරු වෙන්න නෑ. මේ ගෙදර අසල සිටගෙනත්, වෙම්බ්ලි නෘත්‍යශාලාව අසල දීත් ඔහු සංඥා කළේ ඔබට මිසක් ඔබේ සැමියාට නෙමෙයි. මේ කාලය වෙන කොට ඔබව අත් අඩංගුවට ගන්න ඔහුට උවමනාවක් නෑ. ඔහු එංගලන්තයට ආවේ, ඔහුට හිමිවිය යුතුව තිබූ විශාල මුදල ලබා ගන්න. ඒ මුදල් වලින් කළ යුතු වැඩ රාශියක් ඇමරිකාවේ ඉතිරිව තිබුණා, මං කලිනුත් කිව්වා වගේ. ඔබේ සැමියා කෝටිපතියෙකු බව ඔහුට දැනගන්න ලැබෙන්න ඇති. ඒ නිසයි ඔහු මුදල් මේ ආකාරයට ලබාගන්න හිතන්න ඇත්තෙ. ඔහුට හැකිවුණා ඔබව හමුවෙන්න. එහෙම නේද?"

"ඔව්"

"විශාල මුදලක් ඔහුට ගෙවන ලෙස ඔහු ඔබට බල කළා. ඒක මට හිතාගන්න පුළුවනි. ඒ මුදල ඔබ ඔහුට ගෙව්වා නම්, මැක්ඩොනල් ඒකත් අරගෙන ආපහු ඇමරිකාවට යන්න ඉඩ තිබුණා. ඔබේ සැමියා අතට අර කඩදාසිය දීමෙන් ඔහු ඇගෙව්වේ මොකක්ද? ඔබ ගැන රහස ඕනෑම මොහොතක ඔබේ සැමියාට හෙළිකිරීමට ඔහුට හැකියාව ඇති බව"

"ඔව්"

"හරි. මැක්ඩොනල් ටික දවසකට හරි නිහඬ කර තබන්න ඔහුට යමක් දිය යුතු වුණා. නමුත් වහාම ඔහු අතට ලබා දීමට විශාල මුදලක් ඔබ ළඟ තිබුණේ නෑ. ඒ නිසා ගෙවල් බිඳුමක් සිදුකෙරුණු බව පෙන්වීමට ඔබට සිදුවුණා. රාත්‍රියේ ඔබ පහළ තට්ටුවට බැස ආවා. ආලෝකයක් එල්ල කිරීම මඟින් ඔහු ඇතුළුවිය යුතු නිවැරදි ජනේලය ඔබ පෙන්නුවා. ජනේලයේ අගුළු ඇතුළතින් ඇරලා ඔහුට ඇතුළට ඒමට ඔබ ඉඩ සැලැස්සුවා. යකඩ සේප්පුවේ දෙවැනි යතුර ඔබ අතින් නැතිවුණේ නැහැ. ඒකෙන් ඔහුට සේප්පුව ඇර දුන්නා. මුදල් ප්‍රමාණවත් නොවූ නිසා වෙන්න ඇති, ඔබ නිල් මැණික් ඇල්லූ රත්මාලය ඔහුට දුන්නේ. නැතිනම් වයසක ලැංකැස්ටර් මහත්මිය සමග තිබුණු අසතුට නිසාද කියාත් මට කියන්න බැහැ.

කොහොම වුණත් ටෙඩ් මැක්ඩොනල් ලොකුම මෝඩ කමක් කළා. පවුම් පනහ ඔහුට දුන්නේ ගෙවීමේ පළමු කොටස හැටියට. නමුත් ඔහු ඉල්ලා සිටියේ ඊට වඩා අතිශයින් විශාල මුදලක්. ඒක ගෙවන බවට ඔබ පොරොන්දු වුණා. එය ගැනීමට මේ ගෙදරට නොඑන ලෙස ඔබ කිව්වා. එය ඔහුගේ නවාතැනට ගෙනත් දෙන බව ඔබ ඔහුට කියන්න ඇති?"

"ඔව්"

"ඔහු කළ ලොකුම මෝඩකම කියලා මං කිව්වේ ඒකයි. තමන් නැවතී සිටින නේවාසිකාගාරයේ නම සහ ලිපිනය ඔහු ඔබට හෙළිකළා. එංගලන්තයේ ප්‍රභූ පවුලක සිටුවරියක් වගේ, ඔබ කාලය ගත කළ හැටි දුටුවාම, මැක්ඩොනල්ට ඉතා වැදගත් කරුණක් අමතක වෙන්න ඇති. ඒ තමයි ඔබ ඇමරිකාවේදී කවුද කියන එක. මංකොල්ල කල්ලියක නායකයන් ආරක්ෂා කළ තැනැත්තියක බව.

එදා ඔබේ සැමියා ස්ටැන්මෝ උද්‍යානයේ කලාගාරයට යනතුරු ඔබ බලාගෙන හිටියා. ඊළඟට ඔබ ගෙදරින් ලිස්සලා ගියේ කාටත් නොපෙනෙන්න. ඔබට ඇමරිකාවේදී පුරුදු විදියට, පිරිමියෙකු ලෙස වෙස් වළාගෙන ඔබ යන්න ඇති කියලයි මං හිතන්නෙ?"

"ඔව්"

"ඊළඟට ඩවුඩ්ස්වෙල් මාවතේ නේවාසිකාගාරයට ඔබ ගියා. එයට යාබද අතුරු පාර දිගේ ගිහින් මැක්ඩොනල්ගේ කාමරයට ජනේලයෙන් ඇතුළුවෙලා, ඔහු එනතුරු සැඟවී බලා සිටියා. ඊළඟට ඔහු කාමරයට ආව වහාම ඔහු නිහඬ කළා. ආපහු එන්න

කලින් මැක්ඩොනල්ගේ අනන්‍යතාවය හෙළිවෙන ලියකියවිලි ඔක්කොම හොරකම් කරගෙන ඒමට ඔබ සමත් වුණා. ඔබට මග ඇරුණේ සිගරට් අසුරන කොපුව පමණයි."

"තවත් මොනව හරි තියෙනවද?" ලැංකැස්ටර් මහතා විමසුවේ කෙඳිරිලි හඬෙනි. ඔහු භයානක අයුරින් සුදුමැලි වී සිටියේය. ඔහු කොයි මොහොතක හෝ ක්ලාන්ත වී බිම ඇද වැටෙතැයි මට සිතිණි.

"ඇත්තෙන්ම ඔව් මහත්මයා" යයි හෝම්ස් පිළිතුරු දුන්නත් ඔහු හැරුණේ ලැංකැස්ටර් මහත්මිය දෙසටයි. "ඔබ ඔබේ සැමියාට මොන තරම් ආදරය කළත්, ඔහුගේ මව සහ සොයුරිය ගැන ඔබේ තිබුණේ ද්වේෂයක්. මේ ගෙදර, ඔහු රැස් කළ මුදල්, කලාකෘති, ආදී හැම දෙයක්ම තනිවම අයිති කරගන්නයි ඔබට උවමනා වුණේ. ඒ දෙදෙනා දිගු කාලයක් මෙලොව ජීවත්වුණොත්, ඔබේ සැලසුමට බාධාවක් වේවි කියල ඔබට හිතුණා........."

"ඔවුන් දෙදෙනා ඉතා දරුණු අයුරින් මට ද්වේෂ කළා හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "ඔවුන් උත්සාහ කළේ මගේ විවාහය කඩා කප්පල් කරලා මාව එළවා දමන්නයි. ඔවුන්ගේ සිත්වල මා කෙරෙහි තිබූ වෛරය දිනෙන් දින වැඩිවුණා. වන මෘගයකු පවා මිනිසෙකු වෙත කඩා පැන මරා දමන්නේ, ඔහු තමාගේ පැවැත්මට තර්ජනයක් බව දැක ආත්මාරක්ෂාව සලසා ගැනීමටයි. ඒකෙ වැරැද්දක් නෑ. මං කළෙත් ඒ දේ මයි"

"මගේ අම්මා?" ලැංකැස්ටර් කීවේ අමාරුවෙන් හුස්ම අල්ලමිනි.

"මට මුලින් අහන්න ලැබුණේ" හෝම්ස් කීය. "ගෑස්වලින් ඇල්වුණු උදුනේ ඇල්ල සුළං පහරින් නිවී ගොස්, ඉන්පසු කාන්දු වුණු ගෑස්වලින්, වයස්ගත මහත්මිය මියගිය බවයි. නමුත් ඒක කිසිසේත් සිදුවිය හැකි දෙයක් නොවෙයි. කාමරය තුළට සීතල සුළං හමා ආ හැකි සෑම කුඩා සිදුරක්ම, තමා වසා දැමූ බව වින්සන්ට් මා සමග කිව්වා. ඔබේ සොයුරිය සිතුවේ මව සිය දිවි නසාගත්තා කියලයි. නමුත් ඇත්තෙන්ම සිදුවුණේ මොකක්ද? මේරියන් ලැංකැස්ටර් මහත්මිය - ඔබේ බිරිඳ, රාත්‍රියේ ඔබේ මවගේ කාමරයට හොර රහසේ ඇතුළුවුණා. ඇය ගෑස් උදුනේ ගිනිසිළුවලට පිඹ නිවා දැම්මේ, දිගින් දිගටම ගෑස් කාන්දු වීමට ඉඩ තබමින්. ඒ මගින් වයස්ගත කාන්තාව මරු දුටුවා. දේපොළ තමා සතු කරගන්න සෑම උරුමකරුවෙකුම මිය යා යුතුව තිබුණා."

"එතකොට අයිලින්?"

"ඇය ගොදුරුවුණේ ඉතාම සෙමින් සිරුරට ඇතුළු කළ විෂ වර්ගයකට"

"ඒක වෙන්න බැහැනෙ හෝම්ස් මහත්මයා. ඇයට කෑමට දුන් හැමදෙයක්ම මං කාල බැලූ බව ඔබට කිව්වානේ"

"ඔව්. නමුත් ඔබේ සොයුරියගේ ශරීරයට විෂ ඇතුළු කිරීමට ඔබේ බිරිඳ යොදාගත්තේ වෙනත් ක්‍රමයක්. එය කුමක්ද කියා මං පෞද්ගලිකව ඔබට කියන්නම්. නමුත් ඒ ගැන විස්තර ඔබේ පාඨකයන්ට හෙළි කරන්න එපා කියල මං වොට්සන්ගෙන් ඉල්ලා හිටිනවා. ඒ මොකද මිනීමැරීමට අලුත් ක්‍රම සොයන අපරාධකාරයන්ට, අපි කුඩා හෝඩුවාවක්වත් දෙන්න හොඳ නෑ. අයිලීන් ලැංකැස්ටර් මෙනෙවියගෙනුත් නිදහස් වුණොත් හොඳයි කියලා, ඔබේ බිරිඳ තීරණය කරන්න ඇති"

"උඹ නම් මහා යක්ෂණියක්!" යයි කෑගැසූ ලැංකැස්ටර් මහතා තම බිරිඳගෙන් ඉවත්වූයේ පිළිකුලෙනි. "උඹ මගේ අම්මව මරලා. ඊළඟට මගේ අක්කවත්......."

"........ මගේ ආදරණීය ඔස්කා. හෝම්ස් මහත්මයා කියූ දේ නිවැරදියි. මගේ අනාගතයේ සුරක්ෂිත බවට තර්ජනයක් වුණේ ඔබේ මව සහ සොයුරිය. ඔවුන් දෙවියන් වෙත ළං කරනවා ඇරෙන්න මට වෙන විකල්පයක් තිබුණෙ නෑ........"

මෙසේ කී ලැංකැස්ටර් මහත්මිය මීළඟට හැරුණේ හෝම්ස් දෙසටයි.

"ඔබ බොහොම දක්ෂයෙකු බව මට අහන්න ලැබී තිබුණා ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මට නම් පෙනෙන්නේ ඔබ අති දක්ෂයෙක්. ඒ වගේම යක්ෂයෙක්. මේ තරමක් දේවල් ඔබ දැනගත්තේ කොහොමද කියල මට හිතාගන්නවත් බෑ. ඔබ දන්නා ප්‍රමාණය හොඳටම වැඩියි" මෙසේ කී මේරියන් ලැංකැස්ටර් මහත්මිය අසුනෙන් නැගිට්ටාය. මීළඟට අඩි කිහිපයක් පිටුපසට ගිය ඇය විසිත්ත කාමරයෙන් පිටවන දොරටුව සමීපයේ බිත්තියට හේත්තු වී අප දෙස බලාගෙන අප ඇමතුවාය.

"තමන් දන්නා ප්‍රමාණය වැඩි ඔබ වගේ අය අපට ප්‍රශ්නයක්. අපේ ඇමරිකාවෙ කතාවක් තියෙනවා; දැනුම බොහොම පුළුල් අයගේ ජීවිතය කෙටියි කියලා." මෙසේ කී ඇය තම අලංකාර ඇඳුම් කට්ටලයේ කබා සාක්කුවට අත දමා එළියට ගත්තේ ඇමරිකානු මෝස්තරයේ රිවෝල්වරයකි. අනතුරුව එය තත්පර

කිහිපයක් අපට ප්‍රදර්ශනය කොට ගිනි අවිය අප සිටි දෙසට එල්ල කළේ එක් ක්ෂණයකිනි.

"මහත්වරුනි. එක්කෙනෙක්වත් හෙල්ලෙන්න එපා! මේ අලංකාර ආයුධය මොකක්ද කියලා ඔබ දන්නවත් ඇති. මේක ඇමරිකාවේ ස්මිත් ඇන්ඩ් වෙසන් නවීන රිවෝල්වරය. මේක අපේ විශිෂ්ටතම ආයුධයක්. අපේ බොස්ටන් පළාතේ අපේ මැසචුසෙට්ස් වලමයි නිෂ්පාදනය කරන්නේ. හෝම්ස් මහත්තයා කිව්වා වගේ ඉලක්කයට වෙඩි තැබීම ගැන, මට ඉහළ කීර්ති නාමයක් ලැබිල තියෙනවා.

මේක මගේ අයියා නෝමන් ඕනීල් මැරෙන්න මොහොතකට කලින්, මගේ අතට දුන් ඔහුගේ ප්‍රියතම ආයුධය. ෂෝන් හා නෝමන් නම් වූ මගේ සොයුරන් විනාශ කළ සතුරන්ගෙන් පළිගන්නා බවට, මං මගේ අයියාගේ හිසේ අත තබා දිවුරුවා. ඔහු මගේ උකුළ මත හිස තබාගෙනයි ඒ වෙලාවේ සිටියේ. මගේ එක් අතකින් අල්ලාගෙන සිනාමුසු මුහුණින්, මගේ ඒ දිව්රුමට කන් දීගෙන මා දිහා බලා සිටි ඔහු ඊළඟට සදහටම දෙනෙත් පියා ගත්තා. ඔබට පෙනෙනවා ඇත්තේ ඔහු, මහා අපරාධකාරයෙකු විධියට. නමුත් මට ඔහු මගේ ආදරණීය අයියා.

අපට විනාශය ළඟා කළ සතුරන්ගෙන් දෙදෙනෙකු මා පරලෝකයට යවා අවසන්. ඔවුන්ගෙන් තවමත් ඉතිරිව ඉන්නේ මගේ ආදරණීය ඔස්කා විතරයි. ඔබ හා ආදරයෙන් වෙළී ඔබේ අතගත් දවසේ, මං තීරණය කළේ ඔබට සමාව දෙන්න. ජීවිතාන්තය තෙක් ආදරයෙන් ඔබ සමග දිවි ගෙවන්න. හෝම්ස් මහත්මයා. මගේ ඔස්කා සාන්තුවරයකු වැනි උසස් ගතිගුණ ඇති උතුම් මිනිසෙක්. ඔහුව සම්පූර්ණයෙන්ම මගේම කරගන්න, මට උවමනා වුණෙත් ඒ නිසයි. කවදා හරි ඔහු හෝ මා මියයන්න කලින් සත්‍යය හෙළි කරන්න මං බලාපොරොත්තු වුණා. පිංකටන් කාරයා මේ රටට ආවේ අප කාගේත් අවාසනාවට. එහෙම නොවෙන්න අපේ අවසානය මේ තරම් ඉක්මනට ළඟාවෙන්නේ නෑ.

වොට්සන් මහත්මයා, ඔබ තරුණ බිරිඳක සිටින විවාහකයෙකු බව මං අහල තියෙනවා. නමුත් ඔබ පමණක් නිදහස් කර, ඔබට පමණක් ජීවිත දානය දෙන්න මට හැකියාවක් නෑ. ඒ මොකද ඔබේ මිත්‍රයා නිසා, ඔබත් දැන් දන්න ප්‍රමාණය වැඩි නිසා. මගේ ආදරණීය ඔස්කා. ඔබට.........!" ඇයට කීමට හැකිවූයේ එපමණකි.

මරණ භයෙන් ගල්ගැසී, ඇය දෙස ඇසිපිය නොහෙළා බලාගෙන, අප ඒවේලේ සිටියේ දෙවියන් සිහි කරමිනි.

ඒ සමගම කොහෙන්දෝ එල්ල වූ දරුණු පහරකින් මේරියන් ලැංකැස්ටර් ඉදිරියට ඇදවැටුණේ මරහඬක් නංවමිනි. රිවෝල්වරය ඇගේ අතෙන් ගිලිහී ඉවතට විසි විය. එක් ක්ෂණයකින් ඉදිරියට පිනූ හෝම්ස් එය අහුළා ගෙන, ඇය දෙසටම එල්ල කළේය. මේ අතර ඇය වහා නැඟී සිටියත් ලැංකැස්ටර් මහතා තම බිරිඳ තදින් අල්ලා ගත්තේය.

දොරකඩ සිට පිටුපසින් තම ස්වාමිදූවට ගොල්ෆ් පිත්තකින් මරු පහරක් එල්ලකොට, අපේ ජීවිත බේරා ගත්තේ කවුද යන්න අපට දැක ගැනීමට හැකි වූයේ මිනිත්තු කිහිපයකට පසුවය. ඒ නිවසේ වැඩිහිටි සේවක විත්සන්ට්ය. ඔහු නොසිටින්නට අප තිදෙනා ඒ මොහොතේම පළපුරුදු අපරාධකාරිය අතින් ජීවිතක්ෂයට පත්වන්නට ඉඩ තිබිණ.

ඔබට පැවසීමට මා සතුව ඇත්තේ තවත් කරුණු ස්වල්පයක් පමණි.

ඇන්ජලීනා ඕනීල් හෙවත් මේරියන් ලැංකැස්ටර්ට එරෙහි නඩු විභාගය, ඕල්ඩ් බේලි අධිකරණයේ දී විභාගයට ගැනිණ. එහිදී ඇයට මරණ දඬුවම හිමිවුවත් පසුව එය ජීවිතාන්තය දක්වා හිරදඬුවමක් ලෙස වෙනස් කෙරිණි.

කෙතරම් ප්‍රතිකාර ලබා දුන්නද අයිලීන් ලැංකැස්ටර් සුවයක් නොලබාම මියගියාය. අතිශය කලකිරීමෙන් සිය දේපළ සියල්ල විකුණා දැමූ ඔස්කා ලැංකැස්ටර් මහතා, ස්විට්සර්ලන්තයේ ස්ථිර පදිංචිය සඳහා ගියේය. එහිදී ඔහු යළිත් වරක් විවාහ වූ බැව් පසුව අපට දැනගන්නට ලැබිණ.

* * *

වෛද්‍යවරුන්ගේ ඉල්ලීම පිට මා ලියන මේ කතන්දරය මගේ වැඩිමහල් දියණියට භාරදිය යුතුය. මගේ දූ දරුවෝ මුණුබුරු මිණිබිරියෝ මා දැකීමට වරින්වර මෙහි පැමිණෙති. දෙවැනි ට්‍රන්ක පෙට්ටියක තැන්පත් කිරීම සඳහා මා ලියන කථා එකතු කිරීමට ඔවුන් පටන්ගෙන ඇත. මෙය ඔවුන් අතට පත්වීම ඔවුන්ගේ අපමණ සතුටට හේතු වනු නොඅනුමානය.

සමාප්තයි.